භූරිදත්ත - වෙස්සන්තර ජාතක විවරණය

භූරිදත්ත - වෙස්සන්තර ජාතක විවරණය

ලයනල් ලොකුලියන
විසින් සැකැසිණි.

සංඥපනය

භූරිදත්ත වෙස්සන්තර විවරණයෙක් බොහෝ කලකට පෙරැ මුනිඳුස කුමාරතුංගයන් අතින් සැකැසුණේ යැ. එ වකට සිංහල සාහිත්‍ය පොත බැලුණේ අද එය බැලෙන අැසින් නොවැ ඒට ඉදුරා මැවෙනස් අැසෙකිනි. පුරාණ බණ පොත විවේචනය කිරීම එ වකට මහත් පාපයෙක් වී; වුව මනා වූයේ බණ පොතැ බුගැටළු පහදු ගැනීම යැ. කුමාරතුංගයන් ගේ පොතින් ඒ බව මනා වැ මැ ඉටු විය්‍යැ. එ හෙත් අද සිංහලය විද්‍යානුකූල පර්යේෂණයනට යොමු වූ හෙයින් දලක් වැසියන් ගේ අදහස් උදහස් අලුත් වූ මාර්ගයෙකැ ගමන් කරන්නට තැතක් දරන හෙයින් ද මේ පොත එළි දැක්කේ යැ. සිංහලය දන්නවුන් අතරැ උසස් තැනෙකැ වැජැඹෙන භූරිදත්ත වෙස්සන්තර ජාතක ඛ්‍යය අපඤ්ඤ පානි විවේචකයකු ගේ අැසට පෙනෙන පරිදි මහා ජනයා අතරට පත් වියැ යුතු හෙයින් මෙහි වූ දිගී ප්‍රස්තාවනාව එත්තේ යැ. ආධුනිකයනට එයින් විපුල ප්‍රයෝජන අත් වෙතියි සිතමු.

වඤ්ඤසේන පන්නිලයන් ගේ සහායය නොමැති වැ ගතක් කරන්නට බැරි තරම් යැ. අදිසියේ අප ගේ නවා තැනට ආ උන් අපට දුන් උදවුව නිසා නොවේ නම් මෙහි අැති ප්‍රස්තාවනාව ඔපමණ සාරවත් ලෙස නොලියැවෙන්නේ යැ. උනට අපේ සදු ආදරය හිමි වේ.

ප්‍රස්තාවනාව ලිවීමට උපකාර වූ සියලු මැ පොතෙහි කතෘෘනට හා ප්‍රකාශකයනට ද අප ගේ ඉමහත් කෙළෙහි ගුණය පුදමු.

ලයනල් ලොකුලියන

1955-4-28

ලක්ඤපතියේ, "පේම නිවසේ" දී යැ.

මේ තැත

ගුරු දෙව්

කුමරතුඹ මුනිදසුනට

පිදිණි.

පටුන

පිටුව

1. ප්‍රස්තාවනාව

i. අට්ඨවාවෙහි වග iii

ii. පාළි ජාතකවිඤ්ඤාථාව ... vi

iii. සිංහල පන් සිය පනස් ජාතක පොත xiii

iv. ජාතක කථාවෙහි ජන ප්‍රියත්වය ... xvii

v. භූරිදත්ත ජාතකය xx

vi. වෙස්සන්තර ජාතකය ... xxxvii

2. භූරිදත්ත ජාතකය

1. වර්තමාන කථාව 3

2. බ්‍රහ්මදත්ත කුමරු තපසට යෑම ... 4

3. බ්‍රහ්මදත්ත කුමරු රජ බවට පත් වීම 7

4. චිත්‍රශූලයා ගේ කථාව 9

5. සමුද්‍රජාවන් පිණිස නාග දූතයන් යෑම 13

6. භූරිදත්ත කුමාරෝත්පත්තිය ... 18

7. භූරිදත්ත කුමරු නාග භවනය කෙරෙහි කලකිරි සිල් රැකීම 21

8. තේසාද බ්‍රාහ්මණයා හා සෝමදත්තයා ද නාග භවනයෙහි වැසීම ... 25

9. තේසාද බ්‍රාහ්මණයා හා සෝමදත්තයා ද නැවැතැ මිනිස් ලොවට පැමිණීම 31

10. ආලම්බන මන්ත්‍රය 33

11. ආලම්බන–තේසාද හමුව ... 36

12. භූරිදත්ත දමනය 41

13. නා රජු නැවැවීම 44

14. සමුද්‍රජාවන් ගේ ශෝකය ... 46

15. බෑයන් භූරිදත්ත නා රජු සොයා යෑම 50
16. සුදර්ශන-ආලම්බන හමුව ... 53
17. ආලම්බන දමනය 56
18. බෝ සතාණන් නැවැතැ නාග භවනයට පැමිණීම 60
19. සුභග-තේසාද හමුව ... 62
20. කාණාරිට්ඨයන් ගේ බමුණු වැනුම—i. 66
21. ,, ,, ,, ii 69
22. බමුණු මත බිඳුම—i ... 73
23. ,, ,, —ii ... 77
24. ,, ,, —iii ... 81
25. ,, ,, —iv ... 85
26. සාගර බ්‍රහ්මදත්ත - නාග රාජ හමුව 88
27. සමෝධානය 92

3. වෙස්සන්තර ජාතකය.

1. වතීමාන කථාව 95
2. ඵුසති දේවිය ගේ කථාව ... 98
3. වෙසතුරු කුමරු බිහිවීම ... 101
4. වෙසතුරු රජු ගේ දානාධ්‍යාසයය ... 104
5. පණ්ඩර ඇතු දන් දීම ... 106
6. නුවර වාසින් කිපී වෙසතුරු රජු වංක-ගිරියට යැවීමට සම්මත කිරීම ... 109
7. මද්‍රී දේවිය ගේ හා ඵුසති දේවිය ගේ ද ශෝකය. සප්ත ශතක දානය ... 113
8. බෝ සතුන් නුවර හැරී යාම ... 116
9. මඟ දී දන්දීම. චේතිය රජයෙන් පැවැරීම 118
10. වෙසතුරු රජ පවුල තපස් රැකීම 112

11. ජූජක -අමිත්තතාපා අවුල ... 125
12. ජූජකයා ගේ වංකගිරි ගමන ... 129
13. ජූජකයා දරුවන් ඉල්ලීම ... 133
14. දරුවන් දැන් දීම 137
15. ජාලිය-කෘෂ්ණාජිනාවන් ජූජකයා සමඟ යැම 142
16. මද්‍රි දේවිය දරුවන් දැන් දුන් බව දැනැ ගැනීම 145
17. මද්‍රි දේවිය ගේ ශෝකය. දේවිය දැන් දීම 148
18. ශක්‍රයා වර් අටක් දීම. දරුවන් මුත්තණුවන් වෙතැ පැමිණීම ... 152
19. දරුවන් දස් බැවින් මිදීම. ජූජකයා ගේ මරණය 155
20. පිය-පුත් හමුව. පොකුරු වැස්ස 158
21. වෙසතුරු රජු නැඹැතැ ජයතුරා නුවරට පැමිණීම 161
22. සමෝධානය 136

4. ඝතිදක්ත ජාතක විවරණය 167–207
5. වෙස්සන්තර ජාතක විවරණය 211–249

1
ප්‍රස්තාවනාව

i

අට්ඨවාවෙහි වග

සිංහල **පන්සිය පනස් ජාතක පොත** මුලින් මෑ හා පුරා කැරැණි පොතෙක් නො වේ. එ හෙයින්, එයට පෙරැ, එහි ගුරු තනතුර දැරූ යම් කිසිවෙක් ඇත් නම් ඒ පිළිබඳ අප විසින් සලකා බැලියැ යුතු යැ. නො එ සේ වූ සිංහල **ජාතක පොතෙහි** නියම තොරතුරු දැනැ ගැනීම උගහට වෙයි. බොහෝ සිංහල සාහිත්‍ය පත පොත බිහි වූයේ **දඹදිව** වූ කිසි යම් ගතක් ඇසුරු කොටැ ගෙනැ යැ. **දඹදිව** සභ්‍යත්වයත් **දඹදිව** සිතුම් පැතුම්වුත් ඇතුළු නො වුණු එක ද පුරාතන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් සොයා ගැනීම උගහට යැ – අපේ ආගම, අපේ ජාතිය, අපේ සිරිත් විරිත් ඈ සියල්ල මෑ **දඹදිව** හා සම්බන්ධතා දක්වන බැවිනි.

කරුණු මෙසේ හෙයින්, සිංහල **පන්සිය පනස් ජාතක** පොතට ද අනෙක් සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන් මෙන් මෑ **දඹදිව** හා සම්බන්ධය ඇති හෙයින් එ මෑ පොත පිළිබඳ වැ සලකා බලන්නට පෙරැ එහි ගුරු තනතුරෙහි වූ **පාළි ජාතකට්ඨකථාව** ගැන අප විසින් යමක් දැනැ ගතැ යුතු යැ. එ හෙත් දැනට අප අතර ව්‍යවහාරයෙහි එන **පාළි ජාතකට්ඨකථාව** ද මුලින් මැ කැරැණු **ජාතකට්ඨකථාව** නො වන්නේ යැ. ඒ පිළිබඳ වැ වැඩි පුර කරුණු දත යුත්තේ වර්තමාන සිංහල **පන්සිය පනස් ජාතක** පොතෙහි ගුරු තැන එය ගත් හෙයින් මිස **පාළි ජාතකට්ඨකථාව** මුලින් මැ කැරැණක් හෙයින් නො වේ. **පාළි ජාතකට්ඨකථාව** ද ඇතුළත් **අට්ඨකථා** බුබඝෝෂ මාහිමියන් වහන්සේ විසින් කරන ලද බව ඉතිහාස නයින් පැනේ. ඊට පෙරැ තුබූ **හෙළ අට්ඨවා** අනුවැ ඒ සැපැයුණු බව පාළි අටුවාවලින් මැ පැවැසෙන්නේ යැ. මුලින්

තුබූ හෙළ අටුවා අතර මහ'ටුවාව හෙවත් මහා අට්ඨ-කථාව ප්‍රධාන ස්ථානයෙහි ගැනෙන්නේ යැ. 'පච්චරී' හෙවත් පත්තුරක් මතු හිඳු කරන ලදුයි පැවැසෙන මහා පච්චරී අටුවාව ද, කුරුන්දි වෙල්ලි විහාරයෙහි දී කරන ලද කුරුන්දි වෙල්ලි අටුවාව ද හෙළ'ටුවා අතරි ප්‍රධාන තැන් ගත්තා තවත් දෙකෙකි. දඹදිවින් ආ බුද්ධඝෝෂ ස්ථවිරයන් වහන්සේ විසින් තමන් ගේ අට්ඨකථා සම්පා-දනයෙහි දී මෙහි නම් සඳහන් හෙළ'ටුවා තුන හැර තුවත් අපි කථාවන් ප්‍රයෝජනයට ගත්තා ලද බව උන්-වහන්සේ ගේ මූ කෘතියෙහි එන්නේ යැ.

පාළි පොත ප්‍රචාරයට පැමිණි පසු හෙළ'ටුවා අභාවයට ගිය ද දහ වැනි ශත වර්ෂය දක්වා ඒ පැවැතුණ හැටි සිහිනීමට සාක්ෂ්‍ය ඇති. එ නම්, ඒ ශත වර්ෂයේ දී සම්පාදිත පස් වැනි කාශ්‍යප මහ රජ තුමන් ගේ ධම්පියා අටුවා කැට පදයෙහි ඒ පිළිබඳ වූ සඳහන් වීම යි. බුද්ධඝෝෂ මහා ස්ථවිරයන් වහන්සේ ගේ පාළි අටුවාවල අන්ධට්ඨ-කථා, සංඛේපට්ඨකථා යි තවත් අටුවා දෙකක් ගැන සඳහන් වීමෙන් වැටැහෙන්නේ හෙළ'ටුවා හැරෙන්නට පෙරි තවත් අටුවා තුබූ බවය. බුද්ධඝෝෂ ස්වාමීන් ගේ මූ කෘතියක් වූ විසුද්ධි මාර්ගයෙහි විනයට්ඨකථා, සුත්තන්තට්ඨකථා, මජ්ඣිමට්ඨකථා, සංයුත්තට්ඨ-කථා, අංගුත්තරට්ඨකථා හා අභිධම්මට්ඨකථා ද යනු සඳහන් වූ ඇති හෙයිනුත්, දීඝනිකායට ලියැවුණු සුමඞ්ගලවිලාසිනී නම් අට්ඨකථාවෙහි දීඝට්ඨකථාවක් ගැන සඳහන් වන හෙයිනුත්, ධම්මසඞ්ගණියට ලියැවුණු පාළි අටුවාව වන අත්ථසාලිනියෙහි ආගමට්ඨකථාවක් ගැන එන හෙයිනුත්, යටැ කියන ලද අට්ඨකථාවන් හැරෙන්නට ත්‍රි පිටක පාළියෙහි ඒ ඒ කොටසට වෙන වෙන මූ පැවැතුණු අටුවා බුදුගොස් හිමියනට පෙර වූ හැටි හැඟේ. එ සේ මූ මහාවංසය සැපෑයීමට උප-කාරක වූ පෝරාණට්ඨකථාවක් ගැන ද මහාවංශ-ටීකාවෙහි සඳහන් වන්නේ යැ. මේ කරුණු අනුව

බුදුඝොෂ හිමියනට පෙරාතු වැ තවත් බොහෝ අටුවා වූ බව ඔප්පු වන නමුත් ඒවා දැන් අභාවයට ගොස් ඇති. එසේ වූයේ බුදුඝොෂ හිමියන් ගෙන් පසු වූ **පාළි ජාතකඅට්ඨකථා** වඩා ප්‍රචාරයට පැමිණි හෙයිනි.

බුඛඝෝෂ හිමියනට කරන ගෞරවයක් වශයෙන් **පාළි අට්ඨකථා** සියල්ලෙක් මැ උන් වහන්සේ විසින් සම්පාදිත හැයි සැලැකුණ ද අපඤ්ඤ පාති විචාරකයන් විසින් එසේ නොකියැවෙන්නේ යැ. උන් වහන්සේ පටන් ගත් පාළි අට්ඨකථා කරණය ඉන් පසු වූ තවත් ආචාර්යයන් වහන්සේ විසින් සම්පූර්ණ කරන ලද හැයි සැක කළ හැකි යැ. මෙසේ ශඞ්කා උපදවන අපි කථාවත් ගෙන් එකෙකි **පාළි ජාතකට්ඨකථාව**. එහි වැනි විස්තර මින් පසුවැ එන්නේ යැ.

හෙළ'ටුවා අනුවැ බුදුඝොෂ හිමියන් තම අටුවා කළ ද උන් වහන්සේ දඹදිවින් ආ හෙයින් දැනට ඇති **පාළි අට්ඨකථාවන්හි ජම්බුද්වීපයෙහි** සභාවය ගබ් වැ ඇතිය හැයි සිතියැ හැකි. මුලින් මැ වූ **ත්‍රි පිටකයත්** මුල් අටුවාත් දඹදිවැ වූ හෙයින් ද **ජම්බුද්වීපික** සිතුම් පැතුම් හෙළ'ටුවාවෙහි ඇතුළත් වී, ඒ අනු වැ, අන් අටුවා ඇදුරන් විසින් සැපැයුණු ගතෙහි ද **ජම්බුද්වීපික** ශ්‍රුති සම්බන්ධයක් ඇති විය. සුතු යැ.

ii

පාළි ජාතකට්ඨකථාව

බුදුන් වහන්සේගේ පෙර විසූ කඳ පිළිවෙළ සම්බන්ධ වූ **ජාතකට්ඨකථාව** පාළි ත්‍රි පිටකයට අයත් බුද්දක නිකාය හා සම්බන්ධ වන්නේය. මතු බුදු බව පතන බෝ සත්ත්වයන් වහන්සේ නොයෙක් නොයෙක් ජාතීන්හි ඉපැදී කථා නායකයා වශයෙන් හෝ යම් කිසි ප්‍රවෘත්තියක් ඇසුරු දුටු පුද්ගලයකු වශයෙන් හෝ පිළිබිඹු වන කථාව **ජාතක කථා** නම් වෙයි. අප විසින් **ජාතකට්ඨකථා** නමින් හැඳින්වෙන්නේ ත්‍රි පිටකයෙහි සුත්ත පිටකයට අයත් බුද්දක නිකායෙහි ඇතුළත් **ජාතක** ගාථාවනට ලියූ අටුවා කථා එකතු කොට ලියැවුණු ග්‍රන්ථය යි. **ජාතක** කථාවන්හි ඇති ගාථා, ත්‍රි පිටකයෙහි අවුත්, එ වකට මහා ජනයා අතර පැවැති මුඛ පරම්පරා ගත කථා හා සම්බන්ධ වී, කථා නායකයා ගේ හෝ කථාවෙහැ වූ අන් කිසි පුද්ගලයකු ගේ හෝ මුව'ගැ රැඳෑවීමෙන් ජාතක කථා සෑදී ඇති බව පැනෙන්නේ යැ. මේ ගාථා බොහෝ විට මැ අවවාදාත්මක ගාථා වෙයි. ජාතක පොතෙහි ගඛ් වූ කථා එ වකට දඛ්දිවැ පැවැතෑ කථාවලට පමණක් නොවැ ඕශ්‍ව සාහිත්‍යයේ බොහෝ තැන්වලැ පැනෙන කථාවලට ද සම්බන්ධ යැ. සමහර කථා යුරෝපීයයන් අතරද ව්‍යවහාර වන ඒවා වෙයි. මුලින් මැ **ජාතක** කථා සකස් කළ කතීෘන්හු ඒ ඒ කථාවන්හි කථා නායකයන් ගේ හෝ අන් කිසිවකු ගේ හෝ මුව'ගැ **ජාතක** ගාථා රැඳැවූ හ. උපමා කථා හා දේව කථා ද වැනි කථා පමණක් නොවැ **රාමායන මහාභාරතාදි** කථා ද ජාතක කතීෘන් ගේ නැණැසට ලක් විය. අවසානැ කියැවුණු **රාමායන මහාභාරතාදි** කථා **ජාතක**

පොතට ඇතුළත් කැරි ගන්නා විට ඉතා සංක්ෂේප කොටැ ගන්නා ලද්දේයැ. උදාහරණයක් වශයෙන් **දසරථ ජාතකය** ගැන සලකා බලන කලැ එය **රාමායනයෙහි** සංක්ෂේපයක් බව වැටැහෙන්නේයැ.

බුඩාගමය සම්බන්ධ වූ පුරාණ ග්‍රන්ථයන්හි ජන සම්මත කථාවනට **ජාතක** යන නම නො වැහැරිණි. උදාහරණයක් නම්, **ඛුද්දක නිකායේ**[1] පෙනෙන **දිඝාවු** කුමාරයාගේ කථාවයැ. මෙහි **දිඝාවු** කුමරා බෝධි සත්ත්වයන් වහන්සේ යැ සි නො කියැවිණි. පසු කලෙකැ එයින් **ජාතක** කථාවෙක් තනා ගන්නා ලදි.

ජාතකට්ඨකථාවෙහි එන කථා කොටස් වශයෙන් සලකා බලන් හොත් එක් එක් කථාව කොටස් පහකට බෙදියැ හැකි.

1. **පච්චුප්පන්නවත්ථු**: ආරම්භක කථාව හෙවත් වර්තමාන කථාව. මෙහි බුදුන් වහන්සේ උන් වහන්සේ ධරමාන කාලයෙහි දී කවර කරුණක් අරභයා කවර තැනෙකැ දී භික්ෂූන් වහන්සේට ජාතක කථාව වදාළ සේක් ද සි කියැවෙන්නේයැ.
2. **අතීතවත්ථු**: මෙහි බෝධි සත්ව චරිතයක් නිරූපණය වන ගද්‍යමය කථා වස්තුවෙක් ඇත්තේ යැ.
3. **ගාථා**: මේවා අතීතවත්ථුවෙහි හෝ වර්තමාන කථාවෙහි අන්තර්ගත වන්නේයැ.
4. **වෙය්‍යාකරණ**: මේ එක් එක් ගාථාවෙහි එක් එක් පදයක් පාසා අර්ථ කියැවෙන අර්ථ කථායැ.
5. **සමෝධාන**: මේ අතීත වර්තමාන කථා ලයයෙහි සම්බන්ධය දක්වයි. අතීත කථාවෙහි එන පුද්ගලයෝ වර්තමානයෙහි කවර කවරහු වෙත් ද සි **සමෝධාන**යෙන් දක්වෙයි.

---

1. මහාවග්ගෙ–X. 2. 3–30 පිටු. (Oldenberg සංස්කරණය)

ජාතක කථා ගණනින් 547 ක් වෙයි. පන් සිය පනස-කට කිව්වු නිසා සිංහල පොත පන් සිය පනස් **ජාතකය** නම් වන්නේ යැ. **ජාතකට්ඨවණ්ණනා** නම් වූ පාළි පොත පුරාණ **ජාතකට්ඨකථා** නම් වූ ග්‍රන්ථයෙකැ අශ්‍රයෙන් ලියැවුණෙකි. මුඛ පරම්පරාගත කථා අනුව මේ **ජාතකට්ඨකථා** නම් ප්‍රකරණය ත්‍රි පිටක පාළියත් සමග මැ එකට අවුත් හෙළ බසට නැඟී, නැවැතැ **ජාතකට්ඨවණ්ණනා** කතෘන් විසින් පාළියට නගන ලද්දේ යැ. මුලින් ගාථා පමණක් මැ පාළියෙහි ආ නමුත් ඒ ගාථා සමග මැ කථාද පරම්පරාවෙන් ආ බව කියති. ගාථා මුල් තත්ත්වයෙන් මැ දිගට මැ පැවැතැ ආ නමුත් පසු කලෙකැ පොතෙහි ලියන තුරැ මුඛ පරම්පරාවෙන් මැ ආ හෙයින් කථාවල යම් යම් වෙනස් කම් සිදු වී ඇතැයි සිතියැ හැකියැ.

ජාතකට්ඨවණ්ණනාව පරම්පරා කථා අනුව **බුඛඝෝෂ**[1] ස්වාමීන් ගේ මැ කෘතියෙක් යැ යි කියැවෙන්නේ වී නමුදු, ප්‍රසිඛ පණ්ඩිත වරයෝ[2] උන් වහන්සේ ගේ කතෘත්වය පිළිබඳ වැ සැක පහළ කරති. මීට හේතුව නම් **ජාතකට්ඨවණ්ණනාවෙහි** භාෂාව හා ශෛලිය ද **බුඛඝෝෂ** ස්වාමීන් විසින් මැ ලියැවුණ හ සි නිසැක වැ මැ කියැ හැකි පොතෙහි භාෂාවට හා ශෛලියට ද වඩා වෙනස් වීම යැ.[3] **බුදුන් වහන්සේ** ගේ කාලයෙහි වූ **ආඛ්‍යාන** (කතන්දර) සාහිත්‍යයෙහි හා ශිෂ්ටාචාරයෙහි ද

---

1. ගන්ධවංසෙ (Journal of the Pali Text Society 1886)-59 පිට.

2. Buddhist Birth Stories - T. W. Rhys Davids - lviii පිට හා පසු වැ දබලන්නැ.

3. Buddhist Legends— E. W. Burlingame. Harvard Oriental Series, Vol. 28–49 පිට, 59 පිට හා පසු වැ දබලන්නැ.

නියම තත්ත්වය **ජාතක** කථාවලින් පැනෙති සි සැලැකියැ හැකි.[1] එ සේ ම බුදුන් වහන්සේ ගෙන් පෙරැ වූ කාලයෙහි තොරතුරු ද එයින් දැන්වෙති සි ද සිතියැ හැකි. සමහර ගාථා හා ගද්‍ය කථා කිහිපයෙක් ද ඉතාමත් ම පුරාතන කාලය හා සම්බන්ධ වැ ඇති. අනෙක් ගාථාවක් හෝ කථාවක් හෝ බුදුන් වහන්සේට පෙරැ වූ තවුසන් විසින් පැබැඳුණ හ සි සිතේ. පෙළෙහි එන ගාථාවන් ගෙන් බොහෝ ගණනක් ම ක්‍රිසතු වර්ෂයට පෙර 3 වැනි ශත වර්ෂයට පෙරැ වූ හ සි සිනිම උගහට යැ. ගද්‍ය කථා බොහෝ ගණනක් ම ක්‍රිස්තුත්පත්තියෙන් පසු වැ වූ බව නම් නියැක යැ.[2] මුලින් ම ලියැවුණු **ජාතකට්ඨකථා** ග්‍රන්ථය එක ම කතෘ කෙනකු ගේ නොවැ සංස්කාරකයන් බොහෝ දෙනකු ගේ කෘත්‍යයන් බව පැනෙන්නේ එහි නා නා තත්ත්වවලැ කථා ඇතුළත් වීමෙන් පමණක් නොවැ භාෂා තත්ත්වයෙහි අතිවිෂමතාවන් ගෙන් ද යැ. ආඛ්‍යානයකට (කතන්දරයකට) සරි ලන පරිදි ගාථා පිළියෙළ කර ගත්තා කාලයෙහි සමහර විටැ වරද ඇති තැන් කිහිපයක් ද ඇති වූ හ සි සිතියැ හැකි.[3]

ජාතකයන්හි අැති කථා වස්තු සත් කොටසකට බෙදියැ හැකි.

1. **උපමා කථා:** මේවාසින් ලෞකික නීති ශාස්ත්‍රය ඉගැන්වෙයි. ඒ අතරැ සෘෂි භාෂිතයෙහි මෙන් චරිත ශක්තිය විදහා පැමට ලියැවුණු කථා දුලීභ යැ. නියම බෞද්ධ තත්ත්වයෙහි වූ කථා ද අල්ප යැ.

---

1. i The Origin of the Indian Brahmi Alphabet–G. Buhler.–2nd Edition, Strassburg, 1898—6 පිට හා පසු වැ ද බලන්නැ.
   ii. Buddhist India—T. W. Rhys Davids. 201 පිට හා පසු වැ ද බලන්නැ.
2. A History of Indian Literature—M. Winternitz, Vol. II-121 පිට හා පසු වැ ද බලන්නැ.
3. A History of Indian Literature — M. Winternitz, Vol. II-121 පිට හා පසු වැ ද බලන්නැ.

2. **දේව කථා:** බුද්ධාගමය හා කිට්ටු වූ සම්බන්ධයක් නැති හින්දු කථා, යුරෝපීය ජන කථා ආදිය හා බොහෝ කොටැ සමාන වූ සතුන් පිළිබඳ කථා ද මින් ගැනේ. මෙයින් ඉතා මැ සුළු ප්‍රමාණයෙක් බෞද්ධ ලක්ෂණයෙන් යුක්ත වෙයි. එසේ නැත හොත් ඒවා බෞද්ධාරෝපනයෙකින් යුක්ත ව සිටි බව කිය හැකි. සුළු ප්‍රමාණයක් පමණක් මැ බෞද්ධ නිෂ්පාදන යැ යි සැලැකිය හැකි.

3. **කෙටි කථා:** මේවා බෞද්ධාදියෙනින් නොසැපැ-යුණු විනෝදාත්මක හා හාස්‍ය ජනක ද කථා වෙයි.

4. **නව කථා හා මහා කථා:** මෙහි සාහසයන් පිළිබඳ වූ දීර්ඝ කථා ද ඇතුළත් වන්නේ යැ. එක් එක් මහා කථාවෙහි කුඩා කථා සුළු ප්‍රමාණයක් හෝ බොහෝ ගණනෙක් හෝ වෙයි. මේවායේ කථා නායකයා වශයෙන් බෝධි සත්ත්වයන් වහන්සේ පෙනී සිටිනු හැර බෞද්ධ යැ යි කිය හැකි අන් කිසිවෙක් නැත්තේ යැ.

5. **චරිත කථා** හෙවත් ආදර්ශී කථා.

6. **ආපන කථා.**

7. **ධර්ම කථා:** මේවා සියල්ලෙක් මැ බෞද්ධ කථා යැ. එ හෙත් ඉන් බොහොමයෙක් මැ ඉන්දියානු සෘෂි කාව්‍යයෙහි ද ඇතුළත් වෙයි.

මෙ සේ හෙයින්, අපි කථා කොටස් අත් හැරි කලැ, ජාතක කථා වලින් අඩක් පමණ බෞද්ධ නිෂ්පාදන නොවන බව හැඟේ. මීට හේතුව සොයා ගැනීම එ පමණ අපහසු නොවේ. බෞද්ධ භික්ෂූහු නොයෙක් තරාතිරමේ අය වූහ. එසේ හෙයින් සේවකයන් කම් කරුවන් හා වෙළඳුන් ද පිළිබඳ ජන කථා දත් අය ඔවුනතර බොහෝ වූ බව ඇඳගියැ යුතු යැ. ක්ෂත්‍රියයන් පිළිබඳ පුරාණ කවි හා විරාජනා දත් අය ද ඔවුනතරැ වූහ. බ්‍රාහ්මණයන් ගේ හා වන වාසි ඍෂි වරයන් ගේ ද ආගමික ආඛ්‍යාන-යන් හා දේව කථා ද ඇසූ අය මොවුනතරැ සිටියෝ යැ.

ඔහු භික්ෂු භාවයට පැමිණි කලෑ ඔවුන් දන් කථා හැකි නාක් බුඩ ධර්මය හා සම්බන්ධ කොටෑ ගත් හ. මේ කරුණු නිසා මෑ ජාතක කථා ඉන්දියානු සාහිත්‍යයෙහි ඉතා උසස් තැනක් ගන්නේ යැ. ධර්ම දේශනාවෙහි නියුක්ත බෞද්ධ භික්ෂූහු තම්හ් හා තමන්ගේ බණ අසන්නවුන් ද සතුටු වනා සියල්ලක් මෑ ජාතක කථා හා සම්මිශ්‍රණය කළ හ. කථානත්ථියෙන් හා පිළිවෙළින් ද මෙන් මෑ ප්‍රමාණයෙන් ද ජාතක කථා විවිධාකාර වෙයි. මුද්‍රිත පිටක් හෝ පිටු හාගයක් තරම් වූ ඉතා කෙටි කථා සමහ මෑ වෙන මෑ ප්‍රසිද්ධ කළ හැකි විශාල පොතක් පමණ දික් වූ කථා ද ජාතක අතරේ වන්නේ යැ.[1]

සාහිත්‍යය හා කලාව ද[2] පිළිබඳ වෑ පමණක් නොවෑ සභ්‍යත්වය පිළිබඳ වෑ ද සලකා බැලුව හොත් ජාතක කථාවල අැති වටිනා කම අනල්පයැ. බුදුන් වහන්සේ ගේ කාලයෙහි සමාජ තත්ත්වය විදහා බැලීමට උපකාර වන සාහිත්‍ය ලිපි වගයෙන් ජාතක කථා සැලැකිල්ලට භාජන කරන්නට නොහැකි නුමුත්, ක්‍රිස්තු වර්ෂයෙන් පෙරැ හුන් වැනි ශත වර්ෂය පිළිබඳ වෑ ද, ඉදය කොවිඨාශයන් සම්බන්ධයෙන් සලකා බලන කලෑ ක්‍රිස්තු වර්ෂයෙන් පසු 5 වැනි 6 වැනි ශත වර්ෂ පිළිබඳ වෑ ද, ඒවා ප්‍රධාන ස්ථානයක් ගනී. එ සේ වී නමුත් ඉන්දියාවෙහි සමාජ තත්ත්වය ශත

---

1. History of Indian Literature—M. Winternitz, Vol- II 125 පිට හා පස්සු වෑ ද බලන්නෑ.

2. භාර්හුත් හා සාංචියෙහි ද අමරාවතියෙහි ගල් කිත්ති-වල හා අජන්තා ගල් ගුහාවල ද, ජාවාහි බොරෝබුදුර් ස්තූපයෙහි ද ජාතක පිළිබිඹු වන කෑවයම් දක්නට ලැබේ. අද ද ප්‍රතිමා ශිල්පය හා චිත්‍ර ශිල්පය ද පිළිබඳ වෑ ජාතක කථා ප්‍රමුඛ ස්ථානයක් ගනී. ඉන්දියානු වුත් එ සේ නොවූත් කලාවෙහි ජාතක උසස් තැනක් ගත්තේ යැ. චිත්‍රයෙන් පිළිබිඹු වන පුරාතන මෑ ඉන්දියානු කලා ශිල්පය ජාතක කථාවලට දුන් තැන ඉතා මෑ උසස් යැ.

වෙම් ගණනාවක් මෑ නොවෙනස්වැ පැවැතුණු හෙයින් ඉන් ඉතා අතීතයෙහිවූ සභාවය පිළිබඳ වැ කරුණු ද දත හැකි වෙතියි හඟිමු. අනෙකුත් ඉන්දියානු සාහිත්‍ය ග්‍රන්ථ ඉන්දියානු සභාත්වය පිළිබඳ කලාතුරෙකින් සඳහන් කැරී ඇත ද, ජාතක පොතෙහි එන කථා ඉන්දියානු ජීවිතය පිළිබිඹු කොටැ දක්වන කැඩපතක් වැනි වේ මෑ යැ.[1]

1. History of Indian Literature—M. Winternitz, Vol. II–155 පිට සහ පස්සු වැ ද බලන්නැ.

iii

සිංහල පන් සිය පනස් ජාතක පොත

සිංහල පන් සිය පනස් ජාතක පොත සිංහලයා හදරන මහා ජනයා ගේ ඔනෑ එපා කම් පිරිමසා ලන පිණිස කරන ලද, **පාළි ජාතකට්ඨවණ්ණනා**වෙහි පරිවර්තනයෙක් යැ යි කියා හැකි. සිංහල පොතෙහි කථාවල ශරීරය, සම්පාදනය හා පරිපාටියද, පාළි ජාතක කථාවට වඩා වෙනස් වේ නම් ඒ ඉතා සුළු වශයෙනි. මේ පිළිබඳ වෑ පාළි ජාතක පොත සම්බන්ධයෙන් යමක් කීවමු ද සිංහල පොත සම්බන්ධයෙනුත් එය මෑ කියා යුතු බැවින් එහි කථා පිළිවෙලෙහි විස්තර කිසිවක් මෙහි දී ප්‍රකාශ කිරීමට නො වෙහෙසමු. එක් එක් ජාතක කථාව, පාළියෙහි මෙන් පස් කොටසකට නො බෙදී, 1. **වර්තමාන** කථාව යැ, 2. **අතීත** කථාව යැ 3. **සමවධානය** හෙවත් **සම්බන්ධය** යැ යි තුන් කොටසකට බෙදියැ හැකි බව පමණක් පවසනු කැමැත්තමු. පොත් දෙකේ ඇති මහත් මෑ සාම්‍යය නිසා, වැඩියක් මෑ පාළි ජාතක විස්තරයෙහි දී කියැවුණු හෙයින්, මෙහි දී වන විස්තරය එපමණ දික් නො වන්නේ යැ. සිංහල රටට ගුරු වන අයුරු කථා දික් කොටු පරිවර්තනය කැරී ඇති හෙයින්, සිංහල **පන් සිය පනස් ජාතක පොතේ**, පාළියට වඩා විස්තර ඇත්තේ යැ.[1] එහෙයිනි සිංහල පොත ඔ පමණ විශාල වූයේ.

දඹදෙනි සාහිත්‍ය යුගයෙහි දී හෙවත් ක්‍රිස්තු වර්ෂ 1303 හා 1338[2] හා අතරෙ දී සිංහල **ජාතක පොත** කරන ලද හයි සිතිය හැකි. මේ යුගය පිළිබඳ ඉතිහාසාත්මක

1. බුඩ වංශය සහිත පන් සිය පනස් ජාතක පොත— ජිනාලංකාර යන්ත්‍රාලය, 1928- සංස්කරණය බලන්න.
2. සංඝතෙත්‍රාදය කථා – මාර්ටින් චික්‍රමසිංහ - 1932–53 පිට.

කරුණු සොයා ගැනීම අපහසු හෙයින්, ඓතිහාසික තත්ත්වය ගැනැ කීම උගහටයැ. මෙ කලැ රජ පරපුර පිළිබඳ වැ නිසැක සේ කරුණු දූනැ ගැනීම දුෂ්කර කාර්යයෙකි.[1] තුන් වැනි විජයබාහු (ක්‍රි. ව. 1232–1236) රජු ගේ දෙවු පුත් දෙ වැනි පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1236–1271) රජ දඹදෙණිය තම රාජ ධානිය කොටැ ගත්තේ, එ කලැ විසූ මහා පඬි වරයන් අතරැ 'කලි යුගයෙහි වූ සියලු සාහිත්‍යය මැ දත්තේ යැ' යන අරුතින් යුත් කලි කාල සාහිත්‍ය සර්ව්ඥ පණ්ඩිත යන නාමයෙන් ප්‍රසිඛ විය‍ැ. එ තුමා විසින් කැරුණු කවි සිඵම්ණෙන් පටන් ගත් සාහිත්‍ය උත්තනිය තවත් වටිනා සාහිත්‍ය ග්‍රන්ථයන් බිහි කිරීමෙන් සිංහලයට මහත් සේවයක් කළේ යැ. පන් සිය පනස් ජාතක පොත හා කවි සිඵම්ණ ද හැරෙන්නට දඹදෙනි කාලයෙහි ලියැවුණු තවත් සාහිත්‍ය කෘතිහු ද පහත සඳහන් වෙති. සිංහල විඟුඩි මාහීය හා නිස්සන්දේහ නම් විනය විනිච්ඡය ටීකා සන්නය (වත විනිස සන්නය) කවි සිඵම්ණි කතිා විසින් මැ ලියැවුණේ යැ. අනවමදර්ශීහු සිදත් සහරාව ලියූ හ. මයූරපාදයෝ සූජාවලිය ලියූ හ. ධර්මසේනයෝ සඛර්ම රත්නාවලිය සංග්‍රහ කළ හ. සකල විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතයෝ ථූපවංශය ප්‍රබන්ධ කළ හ. දෙව් රද දම් පසඟිනාවෝ දළදා සිරිත කළ හ. ශ්‍රී පරාක්‍රම විල් ගම්මුල තෙරහු සිංහල බෝධි වංශය කළ හ. තිසර සන්දේශය අප්‍රකට වූවකු අතින් කැරිණි. දෙ වැනි දේවරක්ඛිත ජය බාහු ධර්මකීර්ති තෙරහු නිකාය සංග්‍රහය කළෝ යැ. තුන් වැනි ධර්මකීර්ති ස්වාමි පාදයෝ සඛර්මාලංකාරය නිපැදූවූ හ. දඹදෙණි කාලයෙන් පටන් ගත් මේ සාහිත්‍ය යුගය කෝට්ටේ රාජ ධානිය කැරි ගත් ක්‍රි. ව. 1410 දී රජ කමට පැමිණි සය වැනි පරාක්‍රමබාහු රජු ගේ කාලය පටන් ගත් විටැ අවසන් විය‍ැ.

1. G. C. Mendis - Early History of Ceylon – Page 100.

පාළි ජාතකට්ඨකථාව මෙන් මෑ සිංහල පන්සිය පනස් ජාතක පොත ද එකකුගේ මෑ කෘතියෙක් නම් නොවේ මෑයැ.[1] ජාතක පොත සිංහලයට නැඟීම පිණිස එවකට සිටි පණ්ඩිතයන් එක් රැස් කැරැවූ විරසිංහ ප්‍රතිරාජයන් ගේ අමත්තෙත්සාහය නිසා පරාක්‍රම නම් අමැතියකුගේ අයැදීමෙන් මෙහි එක් එක් කොටස සිංහලයට නැඟුණේ යැ.[2]

මහාවංශය, ජාතක පොතේ පරිවර්තනය පිළිබඳ වෑ මෙ සේ පවසයි:-

"අථ සෝ, චෝලදේසියං නානාභාසාවිසාරදං
කක්කාගමධරං ථේරං මහාථේරං සුසඤ්ඤතං,

රාජා, රාජගරුට්ඨානේ ඨපෙත්වා, තස්ස සන්තිකේ,
ජාතකානි ච සබ්බානි සුත්වා සුත්වා නිරන්තරං,

උග්ගණ්හිත්වා, තදත්ථම්පි ධාරෙත්වා තදනන්තරං,
තානි සබ්බානි පඤ්ඤාසාධිකේ පඤ්චසතේ සුභේ

ජාතකේ, පාළිභාසාතෝ සීහලාය නිරුත්තියා
කමතෝ පරිවත්තෙත්වා, පිටකත්තයධාරිනං

මහාථේරානමජ්ඣම්හි සාවෙත්වා, පරිසෝධිය,
ලඞ්කායං පන සබ්බත්ථ ලේඛාපෙත්වා, පවත්තයි."[3]

"ඉක්බිත්තෙන් ඒ (සිවු වැනි පැරැකුම්බා) රජ තෙමේ, සොළී දෙසෙහි වැසි, නා නා භාෂා විශාරද වූ, තක්කාගම ධර වූ, මනා සේ හික්මුණු, එක් මහ තෙර කෙනකු රාජ ගුරු තනතුරෙහි තබවා, උන් වහන්සේ ගේ සමීපයෙහි

---

1. සංඝත්තෙෝදය කථා.- මංර්විත් වික්‍රමසිංහ විසින්- 1932-53 පිට.
2. බුද්ධ වංශය සඟත පන්සිය පනස් ජාතක පොත — ජිනාලංකාර යන්ත්‍රාලය- 1928- ජාතක පොතේ 2 වැනි පිට බලන්න.
3. චූලවංසය (හෙවත් මහාවංසය, ii කොටස) - 90 වැනි පරිච්ඡේදය, 80 - 84 ගාථා.

ජාතක සියල්ල මෑ අසමින්, නිරන්තරයෙන් උගෙනෑ, එහි අර්ථය ද ධරා, ඉන් අනතුරු වැ, ඒ සියලු ගුහවූ පන් සිය පනසක් ජාතක පාළි භාෂායෙන් සිංහල නිරුක්තියට (හෙවත් භාෂාවට) පෙරළා, පිටක ත්‍රය ධාරි වූ මහ තෙරුන් මධ්‍යයෙහි අස්වා, පිරිසුදු කැරැ, ලඞ්කාවෙහි සියලු මෑ සාහනයෙහි ලියවා, පැවැත්වූයේ යැ.

රජු ඇමැතියන් ගේ උපකාරයෙන් එ වකට සිටි පඬි වරුන් ගෙන්වා ගෙනෑ ජාතක කථා පාළියට නැගූ හයි සිතියැ හැකි. භාෂා විලාසය දෙසැ බලන කලැ මුළු පොත මැ එක මැ පරිවර්තකයකු ගේ නොවන බව සනූට වේ. පොතෙහි ඒ ඒ කොටසෙහි භාෂාව එකිනෙකට වෙනස් යැ. සුගම භාෂායෙන් ලියන ලද්දේ වී නමුදු සාමාන්‍ය ජනයාට රුචි වන පරිදි බොහොමයක් වචන යොදා ලියන ලද ජාතක පොතෙහි භාෂාව අමාවතුරෙහි පාරිඡ්ඡේදයටත් සංක්ෂේපයටත් බුත් සරණෙහි උදාරත්වයටත් හාත් පසින් මැ වෙනස් යැ. එහෙත් ජාතක පොත සාමාන්‍ය ජනයාට ලියන ලද්දක් හෙයින් එහි භාෂායෙහි ඇති දුර්ලභතාවන් ගැන උගත්හු චිත්ත සන්තාපයට නොපැමිණී යැ යුත්තා හ. මෙ සේ මැ මේ කාලයෙහි ලියැවුණු අනෙක් පොත්වලට වඩා මෙහි දෙමළ වචන ඇතුළත් බව ද සැලැකියැ යුත්තේ යැ.

iv

ජාතක කථාවෙහි ජන ප්‍රියත්වය

සිංහල **පන්සිය පනස් ජාතක** පොත බිහි වන්නටත් පෙරැ ජාතක වස්තූන් ජන ප්‍රිය වූ බව බුදුන් වහන්සේ ජීවමාන කාලයෙහි මැ '**ජාතක භාණක**' භික්ෂු කෙනකු සිටි බව **පපඤ්චසූදනී** නමැති **මජ්ඣිමනිකායට** ලියැවුණු අට්ඨවාවෙහි සඳහන් වීමෙන් දැනැ ගත හැකි යැ. **පපඤ්චසූදනිය** ලියැවෙන්නට ගත වෂී දසයකට පෙරැ වූ සිඬියක් ගැන බුදු ගොස් හිමියන් සඳහන් කරතුදු උන් වහන්සේ ඒ කරුණ දැනැ ගත්තෝ උන් වහන්සේ පොත් කරන්නට පෙරැ වූ ග්‍රන්ථයක් ආශ්‍රය-යෙන් හෙයින් උන් වහන්සේට පෙරත් ජාතක කථා ජන ප්‍රිය වූ බව සැලැකියැ හැකි යැ. **මහාවංශයෙහි** එන, **තුලාධාර** විහාර වාසි **මහාපදුම නම් ජාතක භාණක** ස්ථවිරයන් ගෙන් **ඉළනාග** රජතුමා **කපි ජාතකය** ඇසූ පුවත, ක්‍රිස්තු වෂීයෙන් දෙවැනි ශත වෂීයෙහි දී ද ජාතක කථා දේශනාව ජන ප්‍රිය වූ බවට නිදර්ශනයෙකි. මේ හැර **ජාතක භාණක** භික්ෂූන් ගැන **මනෝරථපූරණී** නම අඞ්ගුත්තර නිකායට ලියැවුණු පාළි අට්ඨවාවෙහි ද **සමෙමෝහවිනෝදනී** නම විභඞ්ගඨකථාවෙහි ද සඳහන් වන්නේ යැ.[1]

ජාතක කථා සිංහල **සාහිත්‍ය**යට නව පණක් පෙවූයේ **පන් සිය පනස් ජාතක** පොතින් පමණක් නො වේ. මතු විස්තර වන **වෙස්සන්තර ජාතක කාව්‍ය**ය වැනි ජන කාව්‍ය ද, **කව් සිළුමිණ, කුස ජාතක** කාව්‍යය වැනි ප්‍රේම කාව්‍ය ද, **අසදිස දූ කව** වැනි වීර කාව්‍ය ද **මුවදෙව් දූ වත, සස දූ වත, දහම් සොඬ දූ කව**

1. Early History of Buddhism in Ceylon – E. W. Adikaram– 30-31 පිටු බලන්නැ.

වැනි ධර්ම කාව්‍ය ද, **කාව්‍ය ශේඛරය** වැනි 'මහා' කාව්‍ය ද යනාදි කාව්‍ය රාශියෙක් මෑ ජාතක කථාවන් ගෙන් පෝෂ්‍ය වී ය. එ සේ මෑ ජාතක කථා සිංහල චිත්‍ර කලාවට ද මහඟු සේවයක් කෙළේ ය. **දුටුගැමුණු රජු, රුවන්වැලි සෑයෙහි** ගර්භය ඇතුළතැ නොයෙක් ජාතකයන් සිතුයම් කැරිවූ බවත්, වෙස්සන්තර ජාතකය විස්තර වැ සිතුයම් කැරැණු බවත්, **මහා-වංසයෙහි** ඒමෙන්, ක්‍රිස්තු වර්ෂයට පෙරැ තුන් වැනි ශත වර්ෂයෙහි ද ජාතක කථා ආශ්‍රය කොටැ චිත්‍ර කලාව පොහොසත් වූ බව පෙනෙයි. දැනුදු විහාර ගෙයෙහි, ජාතක කථා චිත්‍රයනට උසස් තැනෙක් ලැබෙන්නේ ය. පුරාණයෙහි කැරැණු විහාරාරාමයන්හි ද ජාතක වස්තු නිරූපණය විය. එ සේ මෑ පැරණි ගද්‍ය ග්‍රන්ථයන් ගෙන් බොහොමයකැ මෑ ජාතක කථාවන් ඇතුළත් වූයේ ය. ජාතක කථාවන් නැති වැ මෑ පුරාණ ග්‍රන්ථ කතෘ වරයනට තම කෘතීන් සම්පා-දනය කිරීම කළ නො හැකි වැඩෙක් මෑ විය. ජාතක කථාවන්හි ජන ප්‍රියත්වය පිළිබඳ වැ ජන ප්‍රිය විචාරකයකු විසින් කැරැණු විවේචනයෙකින් මෙ විස්තරය අවසන් කිරීම් වශයෙන් **මාර්ටින් වික්‍රම-සිංහයන් ජාතක පොත** පිළිබඳ වැ කියන දෑ මෙහි බහා ලීමෙන් පෙරැ කී කරැණු පැහැදිලි වැ සම්පිණ්-ඩනය වන්නේ ය.

"**ජාතක පොත** සිංහලයට නැතිමත් එය මහා ජනයා අතර පැතිර යෑමත් සාමාන්‍ය මහා ජනයාට බුඩ ධර්මය ඉගෙන ගැනීමට මහඟු අවස්ථාවක් සලසා දුන්නේ ය. ජාතක කථා රසවත් හෙයින් ඒවා නැවත නැවත ඇසීමට මිනිස්සු කැමති වූ හ. එම නිසා ධර්ම ඉගෙනීම මෙන් ම විනෝදයත් ඔවුනට අත් විය. සාමාන්‍ය මහා ජනයා කෙරෙහි පාපයට භය ඇති වීම ද ජාතක පොතින් කැරැණු දෙයෙකි. පසු කලෙක

මේ පොතෙහි එන ජාතක කථා සාමාන්‍ය ජනයාට විනෝදය හා ආගම භක්තිය ඇති කරවන වෙස්-සන්තර ජාතක කාව්‍යය ආදි කවි බිහි කැරිවීමට ද, ඉත්තිල ද කව ආදි උසස් තත්හි ලා ගිණිය හැකි කාව්‍යයන් නිපැදවීමට ද පොදුහාසත් විය. මෙසේ සාමාන්‍ය මහාජනයාට මෙන් ම උගත් පඬිවරයාට ද, ඉතිහාසඥයාට මෙන් ම පුරා විද්‍යාඥයාට ද එක සේ ප්‍රයෝජනවත් වන ජාතක පොත සිංහලය පවතිනා තෙක් සිංහල සමාජයෙන් නොඉවත්වනු නියත මය."[1]

1. සංඝතෙත්‍රාදය කථා – මාර්ටින් වික්‍රමසිංහ – 1932 – 55 පිට.

V

භූරිදත්ත ජාතකය

භූරිදත්ත ජාතකයෙහි හැඩ භූරු කම පිළිබඳ වැ යමක් විශේෂයෙන් නොකියැ යුත්තේ, එය ද අනෙක් ජාතක කථාවන් ගේ පිළිවෙළට මැ ලියැවී ඇති බැවිනි. අප විසින් මීට පෙරැ කියන ලද සෙයින්, මෙය අයිති වන්නේ, දැකී ජාතක හෙවත් "නව කථා" සඞ්ගැපය ගත් ජාතක කථාවනට යැ. සමහර අය සිංහල නව කථාව හා කෙටි කථාව ද යුරෝපීයයන් ගේ ග්‍රන්ථයන් ආශ්‍රිත වැ වර්තමානයෙහි දී බිහිවුණැ සි කියතුදු, සිංහල සාහිත්‍යය දෙස අපක්ෂ පාති වැ බලන අයට නියම සිංහල නව කතාව, හා කෙටි කථාව ද එමට පෙනෙන්නේ යැ. සමහර විවැ එ වැනි දැ විචාරකයන් කියන්නේ යුරෝපයෙන් ආ "ප්‍රේම කථා" වැනි දැ උසස් සිංහල සාහිත්‍යයෙහි නැති බැවිනුත් වර්තමානයෙහි එ වැනි කථා සිය දහස් ගණනින් එළි දකින හෙයිනුත් වන්නට ඇති. සිංහල ජාතක පොත දෙසැ බලන්නවුනට එහි ඒ දෙ වර්ගයේ මැ කථා එමට නිබෙනු පෙනේ. ජාතක පොතේ මුලින් මැ කෙටි කථා ද, අගට දැකී "නව කථා" ද ඇත්තේ යැ. අගැ වූ කථා දසය ඇත්තෙන් මැ වර්තමානයෙහි "නව කථා" නම් ලද දැ පරයන්නේ මැ යැ. භූරිදත්ත ජාතකය ද මෙ අගැ වූ ශ්‍රේෂ්ඨ "නව කථා" දශයට ඇතුළත් යැ. බොහෝ ජාතක කථාවන්හි මෙන් මැ මෙහි ද 'ආශ්චර්‍ය අද්භූත' ලක්ෂණ විද්‍යමාන වන්නේ යැ. "නව කථා" ලක්ෂණය සමග මැ වර්තමාන "සුරඞ්ගනා" (දේව) කථාවෙහි ලක්ෂණ ද භූරිදත්ත ජාතකයෙහි අන්තර්ගත වෙයි.

වෙස්සන්තර ජාතකය තරම් ජන ප්‍රිය නොවූව ද භූරිදත්ත ජාතකය ද වැදූ ගත් සැනක් ගත් බව පුරාණයෙහි වූ අව ද ඇත්තෙහි, භූරිදත්ත ජාතක

සන්නය ද ඇතුලත් වීමෙන් පැනේ. ඒ අට දෙ සන්නෙහි එන්නේ වඩා දික් වූ තේමිය, නිමි, සාම, විධුර, ඛණ්ඩහාල, භූරිදත්ත, මහාදේව, මහාජනක යන ජාතකයනට කැරැණු සන්නය යි. මේ ජාතක අටට ම වඩා ජන ප්‍රිය වූ **උම්මග්ග ජාතකයට** හා **වෙස්සන්තර ජාතකයට** ද කැරැණු සන්න ඒ එකතුවේ නැත්තේ යි. කෙසේ හෝ වේවා, **භූරිදත්ත ජාතකය** ජන ප්‍රිය වූ බවට එක් සාක්ෂ්‍යයෙක් එහි සන්නය ද අට දෙ සන්නෙහි ඇතුලත් වී තිබීම යි. මේ හැරි, **ජාතකට්ඨ-කථාව** අනුව **භූරිදත්ත ජාතක කථාව** සැකැසුණ හ යි කීම විනා, එයට ගුරු වූ අන්‍ය ප්‍රකට ග්‍රන්ථයක් ගැන කීම උගහට යි.

මෙහි වර්තමාන කථාවෙහි, එක් දවසෙකැ, දෙවිරම් අරමහි පෙහෙවස් සමාදන් වූ උපාසක වරුන් අමතා, බුදු රජහු ඔවුනට අවවාද කරති. ඔවුන් ගේ ශීලයෙහි ඇති උසස් කම සඳහන් කොටැ, ඔවුන් සේ මැ පෙරැ වුසු උත්තමයන් ද ගුරුවරයකු නැති වැ ද පෙහෙවස් වුසු නියාව කියති. පූර්ව කථාව දිව්‍ය නාගයන් සම්බන්ධ වැ වූවක් හෙයින් පුරාතන වුසු **නාග** ගෝත්‍රිකයන් ගේ කථාවක් ද සම්බන්ධ කොටැ ගෙනැ මෙය සකස් වූ හ සි සිතියැ හැකි. එසේ නැත හොත්, නයින් ඇදගිය මනුෂ්‍ය වර්යෙකැ අතරැ මේ කථාවෙහි මුල් කථාව පැවැතුණ හ සි හැඟෙන්නේ යැ. කථාව අවසාන වන්නේ සාමාන්‍යයෙන් අනෙක් කථාවන්හි වන සේ පූර්ව කථාවෙහි නායකයන් වර්තමානයෙහි වූවන් හා සම්බන්ධ කිරීමෙන් ගෙතුණු 'සමෝධානයෙන්' යැ.

භූරිදත්ත ජාතක අතීත කථාව කොටස් දෙකකට බෙදියැ හැකි. එහි මුල් කොටසේ **භූරිදත්ත** නා රජු පෙහෙවස් සමාදන් වූ අයුරු ද, දුර්ගුණ ඇති බමුණා අසන්නන් සිත් දුක් ඉපැදවෙන සේ අකෘතඥතායෙන් යුක්ත වැ බෝධි සත්ත්වයන් පෙළැවූ සැටි ද දැක්-වෙයි. කථාව රසවත් වන අයුරු මෙහි බොහෝ **ආශ්චර්‍ය අද්භුත** ද ඇතුලත් වන්නේ යැ. දෙවැන්න

මීට වඩා වෙනස් යැ. එහි වන්නේ බ්‍රාහ්මණයන් කෙරෙහි එල්ල කැරැඹූ ඉමහත් උපහාසයෙකි. කාණාරිට්ඨයන් ගේ අනුග්‍රහයෙන් බමුණා ගේ බමුණු කුලයෙහි උසස් බව පැවැසෙයි. එහෙත් **භූරිදත්ත** නාරජ, තමා ගේ කථාවෙහි දී බමුණා ගේ සියලු ඔද බිඳ ඔහු ලජ්ජාවට පත් කරන්නේ යැ.

අතීත කථාවෙහි, මුලින් මැ දඹ දිවැ මේ කථාව ලියැවුණු කාලයෙහි වූ සමාජ තත්ත්වය පිළිබඳ යම් කිසිවෙක් පිළිබිඹු වන්නේ යැ. **බ්‍රහ්මදත්ත** රජු තම පුතු හට යුව රජ තනතුරැ දුන් නමුත් "මා ගේ රාජ්‍යය හැර ගනිද්දෙ හෝ?" සි ඔහුට සැකයෙක් උපන. මෙයින් පෙනෙනුයේ තමා ගේ මැ පුතා කෙරෙන් වුව ද රාජ්‍යය පිළිබඳ බිය ඇති වීම සි. ජාතක කථාවන්හි සමහර තැනෙකැ දෙ වැනි බිසොවක ගේ පුතකු රාජ්‍යයට හිමි කම් කියවන කලැ, ඔටුන්න හිමි කුමරා පිටි වාහල් කරනු ලැබෙයි. (දේවධම්ම **ජාතකය** බලන්නැ). මේ ආදි නොයෙක් අයුරින් අපට හැඟෙනුයේ බාහිර උපද්‍රවයෙන් පමණක් නොවැ, සකීයයන් ගෙන් මැ, එ කලැ වූ (දෙලොස් යොදුන් ආදි සුළු) රාජ්‍යයනට බිය ඇති වූ බව යැ. **බරණැස් රජ** රජ කළේ දහැමිනි. එහෙත් හෙ තෙමෙ තම පුතා ගැන සැක කළේ යැ! (**කෙළ** දිවැ **සිරිසහබෝ** රජු ගේ චරිතය මෙ තැනැ දී අපට මතක් වෙයි). **බරණැස්** නුවරැ ප්‍රමාණය දෙලොස් යොදුනැ. එ හෙයින් නිතොරැ මැ සතුරැ උවදුරට ලක් වීමට තරම් ඒ කුඩා වියැ. සමහර විටැ පිය රජු බොහෝ කල් රජ කළ හොත් පුතුට මහලු කලැ රජ වන්නට වෙයි. එ විට රජකු විසින් වින්දු යුතු වූ මහත් වූ සම්පත පුතු විසින් කෙසේ විඳියැ හැකි ද? මහලු කලැ කිනම් පඤ්ච කාම සම්පත්තියෙක් ද? එ හෙයින් අසල් වැසි රජකු ගේ උදවුයෙන් හෝ, සේනාව තමා වෙතැ විශ්වාස කැරැ ගැනීමෙන් හෝ, පියා නැසියැ යුතු යැ. පියා ද හැකි තාක් කල් රජ සැප විඳියැ යුතු යැ මෙ සෙයින්

එ කලෑ වස්තු- බල-ප්‍රදේශ-පරිවාරාදි තෘෂ්ණාවත් නිසා, පිය පුත්ත්‍ර වුව ද එශකකාට නුරුස්නා සුදු වූ හ. (අජාසත් රජු ගෙන් පටන් ගත් පිතෘ ඝාතක රාජ පරම්පරාව ගැන ද සලකා බලනු යෙහේ).

එ වකෑ සමහර විට **නාග** ගෝත්‍රිකයන් අතරේ වූ සමාජ තත්ත්වයක් පිළිබඳ වෑ ද එක්තරා කරුණෙක් කථාව මූලෑ දී මෑ එළි වෙයි.

> "මළා වූ වල්ලභයන් ඇති එක් නාග මානවිකා- වක් අනෘ වූවන් ගේ සම්පත් හා යසස් ද බලා, කෙලෙස් නිසා නාග භවනයෙන් නික්මෑ....."

වල්ලභයා මැරුණු විටෑ නැවැතැ අලුත් ස්වාමියකු සරණ යෑම නො කළ හැකි වූ නිසා යැ, නාග මාන- විකාවට නාග භවනයෙන් පිට වන්නට සිදු වූයේ. දෙ වැනි පුරුෂයකු සොයා යෑම එ වකට **නාග** කුල- යෙහි සිරිත නො වූ බව අපට මෙයින් වැටැහේ.

හොර සිල් රැකීම අද මෙන් මෑ එ දා ද තුබුණු බව රාජ කුමාරයා තපස් රක්ෂා කිරීමෙන් පෙනේ. බලා- පොරොත්තු සුන් වූ විටෑ හොර සිල් ගත්නෝ අදත් එමට යැ. තම අදහස මුදුන් පමුණුවා ගන්නට බැරි වූ කලෑ සිල් රකින්නට යත්නෝ බෙහෙවි. අවසාන් ලැබුණු විටෑ ශීලය බිඳී යන්නේ යැ. (නො පෙනෙන්- නේ ද පුවත් පතින්, අද දු, එ වැනි සිල් බිඳෙන හැටි?) සිල් රැකි කුමරා ගේ සිල් පිරික්සුණු හැටි කදිම නො වැ! (දැනුදු එ සේ සිල් පිරික්සී පිරික්සුණන් සිල් සුන් බවට පත් වෙනී සි අසා ඇති). නාග මානවිකාව කුමරා ගේ සිල් පිරික්සූ ඉක්බිති '**සාගර** බ්‍රහ්මදත්- **තයෝ**' ද '**සමුද්‍රජා**යෝ' ද අසපුවෙහි ඇති වූ හ.

සමාජය දූෂිත වන සුරා පානය අපර දිගින් මෙ ලකට ආ හ සි අමද්‍යප ව්‍යාපාරික ගිහි පැවිදි දෙ පක්ෂයේ මෑ අය කියති. සුරාවෙහි ගුණාගුණ කෙ සේ වෙතත්, බුදු- නුවන් සලකන සේ අප **බුදුන්** බුදු වන්නට බොහෝ

කලකට පෙරැ **භූරිදත්ත ජාතකයෙහි** සිදු වීම මෙසේ වුව ද, මෙ ජාතක කථාව ලියැවුණු කාලයෙහි දී වත් උසස් මැ උත්සවයෙක් සුරා පානයෙන් තොර නො වූයේ යැ.

> "රජ්ජුරුවෝ බරණැස් නුවරට පැමිණ..... ප්‍රාසාදයෙහි මතු මහල් තලයෙහි ශ්‍රී යහන් මස්තකයෙහි හිඳැ සතියක් මුළුල්ලේ මහත් සේ සුරා පානය කොටැ....."

යනාදි විසින්, දැන් අපට යුරෝපීයයන් ගෙන් පුරුදු වූ සේ පැය කිහිපයෙකැ තුළැ කැරෙන උත්සවයෙකැ දී වන සුරා පානය මෙන් නො වැ, එ වකැ උසස් සමාජයේ "ශ්‍රී යහන් මස්තකයේ හිඳැ" සතියක් මැ සුරා පානය කැරැණු බව පැනේ. (**උම්මග්ග ජාතකයෙහි චූලනී බ්‍රහ්මදත්ත** රජ්ජුරුවෝ එක් සියයක් රජුන් මරවන්නට විෂ යොදා මහත් සුරා පානයක් පිළියෙළ කළ හ. බුදු දහම ඉතා මැ පිරිසුදු වැ තුබූ දුටු ගැමුණු රජු කලැ, දම්ළයන් 'මරා', 'ජය පානය' බොන විටැ, **ගෝඝඉම්බරයෝ** සාහසික වූ හ. ඉතා මැ අතීතයෙහි වූ සෘග් වේදයෙහි "මණ්ඩල" දශයෙන් එක් සම්පූර්ණ මණ්ඩලයෙක් මැ '**සෝම**' දෙවියාට හෙවත් සුරා දෙවියාට කැප විය.) දැන් අප කියන්නාක් මෙන් අලුතින් මේ **සිරි ලකට** 'දුෂ්ට වූ සුරා පානය' **යුරෝපයෙන්** ආ බව කියන්නකුට ඇත අතීතයෙහිද "ජය පානය" උසස් මැ තැනෙහි වැජැඹී බව **භූරිදත්ත ජාතක** කාරක කාලයෙහි සමාජ ප්‍රවෘත්තියෙන් මනා වැ ඔප්පු වන්නේ යැ.

හාස්‍යය ද මේ පොතෙහි ගබ්බී නැත්තේ නො වේ. රජ දරුවන් පොකුණේ කෙළනා කලැ ඝොරොවුවෙන් වැදි කැස්බා ගෙන් රජ දරුවෝ බිය පත් වූ හැ රාජ පුරුෂයෝ ඌ අල්ලා ගෙනැ රජු හට දැක්වූ හ. නොයෙක් අය ඔහුට නොයෙක් වධ නියම කරන්නට යෝජනා කළ හ. එ හෙත් උදක භීරුක වූ අමාත්‍යයා

ඔහු යමුනා නම් ගංගාවෙහි මහත් වූ සලා වැටුම්කට දම්මවන්නට නියම කළ යුතු යැ සි කී කලෑ, වත්මනෙහි "කැස්බ දියේ දන්නම, මියන්නම" සි ඇති ප්‍රස්තාව පිරුළෙහි වූ සේ, ඒ වධය හැරැ අනෙක් ඔනෑම වධයක් කරවන මෙත් කැස්බා කැමැත්ත දක්වී යැ. එ කලෑ, අපේ කැකිල්ලේ රජු මෙත් මෝඩ වූ බරණැස් රජුන් ද වූ බව, රජු කැස්බා දියේ දැමීමට මැ නියම කිරීමෙත්, ජාතක කතෘ රජුන් ගේ අනුවණ කම් ගැන රසවත් සේ හාස්‍යය හැරැ ගෙනෑ දෙමින් මහත් වූ උපහාසයක් කළේ යැ. කැස්බා ද "හොඳ විහිළුවක් කරන්නෙමෑ" සි නාග මානවකයන් හට අසූ වූ විටෑ, තමා බරණැස් රජු ගේ දූතයා බවත්, බරණැස් රජු දුව ඛෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවනට පාවා දෙන සේ කට යුතු සංවිධානයට තමා පැමිණි බවත් කියා, කරන ලද දැ අතිශයින් මෑ වමත්කාර ජනක යැ. ඉන් පසු සිදු වූ දැසින් සමහර විට අපට දැනෙන්නේ නාගයන් බරණැස් නුවර වාසිනට වඩා බලවත් වැ සිටි බව යැ. නාග මානවකයන් "රජ්ජුරුවන් ගේ යහනෙහි පා සතර වෙළා ගෙනෑ ඔස් මුදුනට මහත් වූ පෙණ ගබ් කොටෑ, තුඹින් ඔසට ඇනෑ ඇනෑ කට දල්වා සුස්ම සුස්මා" සිටි අයුරු කියවන්නනට කොපමණ ආස්වාදයක් ගෙනෑ දෙන්නේ ද?

ශීල සමාදානය වූ කලි, බුදු දහමෙහි, මිනිසා ගේ සිතෑ වූ නොඉක්මුණු ගති මැඩැ පියා නිවන් මගට ඇරැණු දෙරක් වැනි වූ නමුදු, පෙරැ වූවෝ (සමහර විටෑ අද වූවෝ ද), අනුන් ගෙන් වන කරදරයෙන් නිදහස් වීමට අනුන් සිල් රක්කවන්නට යැතූ හ. මෙහිදී මුළු ජීවිතය මැ ශීලයට ගත් කොටෑ පර ලොවෑ දී දෙව් සැප විඳීම ඔණ පොතේ වණිනා කැරැණෙත් සමහර විටෑ ප්‍රභූනට මහා ජනයා ගෙන් වන කරදරයෙන් පහසුයෙන් මිදීම සඳහා වන්නට ඇතැ සි සැක සිතේ. [පෙරැ ඵංගලන්තාදි රටවලෑ ඉරිදා දිනයෙහි වැඩ නැති හෙයින් සතියේ දිනවලෑ කම් හලෙහි වැඩ කළ කුඩාවුන් මහ

කරදරයක් වන්නට වූ විට උන් සුගති ගාමී කැරැවන්නට ඉරිදා පා සල් පහළ වී.] **සුරිදත්ත ජාතක** කාරකයා ද **සුරිදත්ත** කුමාරයන් ලවා සිල් රක්කවයි. උන් ගේ මහත් විෂ තේජස් ශීලය නිසා යට පත් වී අනුනට කරදරයක් නොවූවා පමණක් නොවැ **ශක්‍ර දේවේන්ද්‍ර-යන්** ගේ "අලඞ්කෘත වූ වෛජයන්ත ප්‍රාසාදය හා හාව භාව ලීලා කටාක්ෂ මඳ ස්මිතයෙන් යුක්ත වූ දිව්‍යාප්සරාවනුත් අති මනෝහර වූ ශක්‍ර සම්පත්තියත් දැකැ," **සුරිදත්ත** කුමාරයන් කෙරෙහි ඉමහත් තෘෂ්ණාවෙක් ද උපන්නේ යැ. උන් සිල් රැකුණේ මේ මහත් මැ තෘෂ්ණාව උඩ යැ. මදෑ සි දෙව් සැප පතා සිල් රැකීමෙන් පිණයව් නපුරු ගුණ යට පත් කැරැ ගන්වන්නා සේ බණ ඉගැන්වුණු හැටි! මතු මත්තේත් තෘෂ්ණාව මැ පෙරැ දුරි කොටැ සිල් රැකි නියාව "සැපයෙහි පිහිටියා වූ ඒ දේවතාවත් ගේ වෛජයන්ත ප්‍රාසාදාදි වූ මහත් වූ ඍද්ධිය ප්‍රාප්තිනා කොටැ පෙහෙවස් ඉටා තුඹස් මත්තේ වෙසෙමි" සි **සුරිදත්ත** කුමාරයන් නේසාද බමුණාට කී වචනයෙන් ස්ඵුට වන්නේ මැ යැ. [බුදුන් කලැ ද දෙව්ගනන් කැමැති වැ සිල් රැකැ කෙළවරැ රහත් බව ද ලැබුණු සැටි **නන්දකුමාර** වස්තුවෙහි එන්නේ යැ.] මෙ සේ මැ පිනෙහි අරුම දැක්වෙන සේ **නේසාද** බමුණා ගේ පින් පිරිහුණු නියාව දක්වන **ජාතක** කතා, බමුණා මහලු බවත් **සෝමදත්තයා** තරුණ බවත් නොමතක කරන සේ යැ. නා ලොවැ සැප විඳීමට තරම් දේහ ශක්තියෙක් බමුණාට නැති. එහෙත් තරුණ **සෝමදත්තයා** නොවේ උකටලී වූයේ. කියවන්නනට පිනෙහි වූ මා ඇති බව දන්වන්නට කතා ඉතා නියුණු බැවින් හා ඉතා සමථ බැවින් ද තම යෙදුම යෙදූ හැටි බලමු.

"නේසාද බ්‍රාහ්මණයා හවුරුද්දක් පමණ කල් නාග භවනයෙහි වැස, පින් මඳ හෙයින් උකටලී වැ මනුෂ්‍ය ලෝකයට යනු කැමැති වී යැ. සිත්

කඳු වූ නාග භවනය නරකයක් මෙන් ද, අලඞ්කෘත වූ ප්‍රාසාදය බඹනාගාරයක් මෙන් ද, සර්වාකාරයෙන් සැරැහුණා වූ නාග කන්‍යාවෝ යක්ෂණියන් මෙන් ද වැටැහුණේ ය.”

මේ කියවන භක්තිමත් බුදුනුවෝ කිසේ නම් පින් නොකැරැ හිඳිද්ද? පින් අඩු වූ විටැ දුක් වේ මැ යැ. සැප මැඳැ සිටිය ද සැපෙන් වැඩෙක් නැති. එහෙයින් ඔහු පින් මැ කරති. බැතිමතා සිත පැරී යෙයි මෙවැනි යෙදුමින්.

එක්කෝ **ජාතක** කතීා **නේසාද** චරිතයෙන් බමුණන් ගේ බලවත් කම දක්වන්නට යනයි. නැත හොත් අකෘතඥ භාවය දක්වන්නට වීයිය කරයි. එ සේත් නැත හොත් දෙක මැ කර යි. බමුණන් බලවත් වූ සේ මැ සැක කට යුතු බව ද මෙයින් දක්වෙයි. [දැනුදු **දඹදිව** නො බමුණේ බමුණන් බලවත් බවත් එ හෙත් විශ්වාස නො කට යුතු බවත් අනුන් හෙළා තමන් මැ දියුණුවට පත් වන බවත් කියති. මෙ අප ගේ කතින් මැ **දඹදිවැ** දී ඇසූ සැටි යි.] **සුරිදත්ත** නා රජුන් කොපමණ බලවත් වුව ද ඒ සියලු මැ බල **ආලම්බන**යා ගේ මන්ත්‍රයෙන් බිඳැ වැටේ. **නේසාද** බමුණා කෙරෙහි වූ බිය කෙතෙක් දැ යි කියන හොත් **සුරිදත්ත** නා රජහු බමුණා නාග භවනයට ගෙනැ ගොස් ඔහුට බොහෝ සැප සම්පත් පරිවාරාදිය දෙති. එ හෙත් මහලු බමුණාට වසරකට වඩා (තමා මහලු හෙයින් ඇ) ඒ සැප විඳින්නට නො හැකි විය. කොපමණ සැප දී බමුණා සතුටු කරවන්නට **සුරිදත්ත** නා රජුන් යැතුව ද ඉන් පලෙක් නො වී යැ. බමුණා ගේ බමුණු ගතිය ඉස් මතු වී යැ. හෙතෙමේ **සුරිදත්ත** නා රජුන් **ආලම්බනයාව** අල්ලා දී දුක් වින්දැවී යැ.

ක්ෂත්‍රියයන් බමුණනට හර සර දක්වනත් බමුණන් බමුණනට එ වැනි හර සරයක් නො දක්වන බව පෙන්වන්නට මෙන් **ආලම්බනයා** තපස්වී වේශයෙන් සිටී **සුදර්ශන** නා රජ්ජුරුවනට වාසි කී යැ. එ සේත් නැත

හොත් සුදශීන නා රජ්ජුරුවන් බමුණකු නොවූව ද තාපසයකු බැවින් බමුණු දහම පිළිපදින්නෙකි. එහෙයින් බමුණු දහම රක්නා ද තමන් හා සමයකු කොටැ සිතා ආලම්බනයා සුදශීන නා රජ්ජුරුවනට නිහර සර දක්වන අයුරු ජාතක කතෘ ගලපා ඇති සැටි සැබැවින් මෑ මනෝඥ යැ:

> "නිය සහිත කර්කශ වූ අඳුන් දිවි සම අඳනා වූ ජටා ධර වූ කිසි සැරැහීමක් නැත්තා වූ අඬ වූ තෝ මේ දැඟින් මධ්‍යයට අවුත් මෙසේ උග්‍ර වූ විෂ තේජස් ඇත්තා වූ මා ගේ මේ නා රජ්ජුරුවන් විෂ නැත්තේ යැ සි නිදු කොටැ කියන්නෙහි යැ....."

යනුවෙන් කැරෙන බමුණා ගේ අවඥ බස් කතෘ යෙදූ පරිදි අතිශයින් ම අව්‍යාකුල යැ. තමා ගේ වර්ණයේ ඩුවකුට නිහීන වැ තවෙකෙක් ආක්‍රෝශ පරිභව බණන්නේ මෙසේ යැ. **ආලම්බනයා** ද **සුදශීනයෝ** ද දෙදෙනා, නාග රාජයා ගේ ද මැඬි පැටවා ගේ ද සමථ ක්ෂම දක්වන්නාහු, එක සේ මැ බස් බෙණෙති. **ආලම්බනයා** **සුදශීනයනට** පර ලොවට වුව මනා දැ සපයා ගන්නට කියයි. **සුදශීනයෝ** ද එ වැනි මැ වචන **ආලම්බනයාට** කියති. මේ දෙදෙනා ගේ වාද විවාදය කතෘ නිරූපණය කළ අයුරු ඉතා මැත් මැ රසවත් යැ.

කතෘ ගේ භාව නිරූපණය සිත් ගන්නා සේ යෙදී ඇති තැන් බෙහෙවි. ඉන් ඉතා මැත් අගය කළ හැකි තැනෙක් නම් **භූරිදත්ත** නා රජ්ජුරුවන් ගේ පුවත් නොදත් සමුද්‍රජාවන් ඇඹූ සැටි සි:

> "සිස් වූ කැදැල්ලෙකැ දරු මළ ළිහිණියක් යම් සේ ශෝක දුඃඛයෙන් තැවේ ද, එ පරිද්දෙන් මැ **භූරිදත්ත** නම් වූ නා රජ්ජුරුවන් නොදක්නා මම බොහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවී නොසැනැහෙමි. තව ද දරු මළ ළිහිණියක් සිස් වූ කැදැල්ල දැකැ ඒ ඒ තැනැ දිවැ ඇවිදී ද, එ පරිද්දෙන් මැ

ඝටිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම ඒ ඒ තැනැ දිවැ ඇවිදිමි. තව ද දරු මළ සැවුඹු ධේනුවක් සිස් වූ කැලුල්ල දැකැ ශෝක දුඃඛයෙන් තැවේ ද, එ පරිද්දෙන් මැ **ඝටිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම බොහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවෙමි. නොසැනැහෙමි. තව ද පැන් සිඳී හිය මඩ වලෙහැ පිය වගුල සක්වා ළිහිණියක් මසුන් නැති වැ යම් සේ ශෝකගෙනැ ඉඳිද, එ පරිද්දෙන් **ඝටිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා මම බොහෝ කලක් ශෝකාග්නියෙන් පැළැහී සැනැසීමකට නොපැමිණෙමි. කඹුරන් ගේ උදුන යම් සේ අැතුළින් මැ දැ ද, පිටතින් නොදැ ද, එ පරිද්දෙන් මැ **ඝටිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම ශෝකාග්නියෙන් අැතුළින් මැ දමි.

මෙහි වූ උපමා ඉතා මැත් උචිත යැ. සිත් කා වදිනැ සුදු යැ. සමුද්‍රජාවන් තුළැ වූ ශෝකය මෙහි පැවැසුවාට වඩා කියවන්නාට දැනෙන්නට තව කවර අයුරෙකින් කියැ හැකි ද?

ඒ ළඟින් මැ එන නාග භවනයෙහි වූ තත්ත්වය නිරූපණය කැරෙන අයුරින්, කියවන්නා තුළැ, නියම තත්ත්වය විදහා පෙන්වන චිත්‍රයෙක් අැඳෙන්නේ යැ:

> "මෙ සේ **ඝටිදත්ත** නම් නා රජ්ජුරුවන් ගේ මැණියන් අඬන්නට පටන් ගත් කල්හි, උන් හා සමග අවශේෂයන් අැඹෙන් **ඝටිදත්ත** නම් නා රජ්ජුරුවන් ගේ මාලිගාව සමුද්‍ර ඝෝෂයක් මෙන් ඒක නිර්ඝෝෂ වියැ. එක ද සත්ත්වයෙක් සිටී සේ සිටැ පියන්නට ද අසමර්ථ වියැ. සියලු රාජ භවනය යුගාන්ත මාරුතයෙන් පැහැරී හෙළන ලද සල් වනයක් මෙන් වී යැ."

මේ කියවන විටැ කියවන්නාට බලා සිටින්නකුට සේ තම මනැස ඉදිරියේ චිත්‍රයක් නොනැගෙනු නොහැකි මැ යැ.

මේ කථාව 'නව කථා' සංරූපයක් ගත්තේ ද, වර්තමානයෙහි කැරෙන 'මතක බණකට' සමාන වූවක් සේ, අරිෂ්ට, සුභග යන දෙ බෑයන් මැණියන් අස් වසන නියාවෙන්, මෙය ප්‍රියයන් ගෙන් වෙන් වූ අවස්ථාවෙහි– දී බෞද්ධයකු විසින් සැලැකියැ යුත්ත හඟවන්නේ යැ.

"මැණියන් වහන්ස, ශෝක නො කළ මැනැවැ. ලෝකයෙහි සත්ත්වයෝ චුතී උත්පත්ති දෙක සහාව කොටැ ඇත්තා හ. මේ චුතී උත්පත්ති දෙකෙන් මිදුණා වූ එක ද සත්ත්වයෙක් නැත්තේ යැ. එ සේ හෙයින් නුඹ වහන්සේ ශෝක නො කළ මැනැවැ."

එ හෙත් **සමුද්‍රජාවෝ** බණ දනිතත් තමන් ලෞකික තත්ත්වය නො ඉක්මැවූ බව පවසති. කෙ තරම් සාහාවික වැ ද ඕ ඒ පවසන්නී:

"දරුවෙනි, ලෝකයෙහි සත්ත්වයෝ උපදිති, මියෙති. චුතී උත්පත්ති දෙකින් නො මිදුණු නියාව මමත් දනිමි. එ නෙකුදු වූවත් **සුදිදත්ත** නම් නා රජ්ජුරුවන් නො දක්නා වූ මම ශෝකයෙන් මඩනා ලදිමි. තව ද **සුදර්ශන** නම් නා රජ්ජුරුවෙනි, දැන් දැනැ ගනුව. ඉදින් අද මේ රාත්‍රියෙහි **සුදිදත්ත** නම් නා රජ්ජුරුවන් නුදුටුයෙම් නම්, මා දිවි නො තිබෙයි."

මෙයින් සමුද්‍රජාවන් ගේ ධර්ම ගරුත්වය ඇත්තාක් සේ මැ, ලෞකිකත්වය නො ඉක්මැ වූ බව ද පෙන්– වනු ඉතා මනා යැ. කතෘ බමුණනට කළ උපහාස නම් ඉමහති. මත්තෙහි **සුදිදත්ත** රජ්ජුරුවන් මුවින් බමුණන් මන් බිඳින්නට පෙරාතු වැ උන් ගේ මූඪ විශ්වාසයනට එල්ල වුණු පහර කොපමණ උවිත ද?

"එ කල්හි **නේසාද** බ්‍රාහ්මණයාත් **ආලම්බනයා** කුෂ්ට රෝගී වූවහු දැක සිතන්නේ 'ආලම්බනයා **සුදිදත්ත** නම් නා රජ්ජුරුවනට පිඩා කොටැ

ශ්වේත කුෂ්ඨයෙන් විරූපී වී යෑ. මම වූ කලී මට බොහෝ උපකාර කළා වූ ඒ භූරිදත්ත නම නා රජ්ජුරුවන් මාණික්‍යයෙහි ලෝභයෙන් ඒ අභිගුණ්ඨික බ්‍රාහ්මණයාට දුක්වීමි. ඒ අකුශල කර්මය මා කරා එන්නේ යෑ. යම තාක් ඒ පාපය මා කරා නො ඒ නම්, ඊට පළමු කොටෑ මම යමුනා නම ගංගාවට ගොස් පයාග තීර්ථයෙහි පාප ප්‍රවාහය කෙරෙමි'සි සිතා, ඒ යමුනාවට ගොස් 'මා විසින් භූරිදත්ත නම නාරජ්ජුරුවන් විෂයයෙහි මිත්‍ර ද්‍රෝහ කම් කරන ලද. ඒ අකුශල කර්මය සෝධා ශුඛ කොටෑ දියෙහි යවා පියමි' සි කියා යමුනා නම ගංගාවේ ගැලිහැලී ඉල්පෙමින් සිටියේ යෑ."

මෙ සේ ගැලෙමින් ඉල්පෙමින් සිටි නේසාදයාට සුභගයන් කළ දෑ හාස්‍ය රසයෙන් පරිපූර්ණ යෑ:

"එ සමයයෙහි සුභගයෝ.....නගුවින් ඔහු ගේ දෙ පය වෙළා ඇදූ ගෙනෑ, දිය යට ගිල්වා ආශ්වාස ප්‍රශ්වාසය නැති කොටෑ මදක් ලිහිල් කොළෝ යෑ. ඒ තෙමේ එ කල්හි ඉස එසැවී යෑ. නැවැතත් ඔහු ඇදූ දියෙහි ගැටුණ හ. මෙ සේ නොයෙක් වර ඒ සුභගයන් විසින් දියේ ගිල්වා පීඩාවට පමුණුවන ලද්දු වූ වැදි බමුණු ඉස ඔසොවා කියන්නේ, 'පාප ප්‍රවාහය කිරීමෙහි සමර්ථ යෑ සි ලෝ වැස්සන් විසින් දන්නා ලද පයාග නිර්ථයෙහි සිටියා වූ, මෙ බඳු වූ ජල ස්නානය කරන්නා වූ මේ යමුනා නම ගංගාවේ දිය යටෑ වැදූ කවර සත්ත්වයෙක් මා අනුභව කරන්නට අල්ලා ගත් දූ?'සි බැගෑ පත් වෑ කී යෑ."

මෙහි ගබ් වූ උපහාස රසය වර්ණනා විෂයාතික්‍රාන්ත යෑ. හාස්‍ය රසයත් සමඟ මෑ බමුණන් ගේ දහමෙහි ඇති නිස්සාරතාවට දුන් පහරක් වැන්නෑ මෙය.

බමුණන් තමන් ගේ උසස් කුලය වැනුව ද අනුන් ගෙන් පිඟට් ලබාගන්නට වුව මනා වූ විටැ බල්ලකුවත් වඩා පහත් බව ප්‍රකාශ කොටැ තමන් ගේ කාර්‍ය්‍ය කැරැ ගන්නා බව ජ ළඟට එන විස්තරයෙන් පෙනෙන්නේ යැ. ක්ෂත්‍රියයන් වණිනා කළ නේසාද බ්‍රාහ්මණයා කියන්නේ:

> "..... මෙ බඳු වූවන් ගේ දරු මුණුබුරු වැ සිටියා වූ කෙනෙක් බමුණන් ගේ දැසයකු දියේ ගලා මරන්නට සුදුසු නො වෙති. එ සේ හෙයින් තොප වැනි වූ උත්තමයනට මා මැරීම් කාරණ නො වෙයි කියා, සුභගයන් ගේ වංශය උසස් කෙරෙමින් වණිනා කොටැ තම හට ජීවිත දැනය ඉල්ලූයේ යැ."

බමුණන් ගේ කපට බවට අන් අය මුලා වන බව ජ ළඟට එන විස්තරය ප්‍රකාශ කරයි. යටහත් බැවින් බේරෙන්නට බැරි වූ විට "ධම්ය" දෙසා බිය ගන්වා බේරෙන්නට සිතී යැ නේසාදයා. එ හෙයින් නැවැතැ හෙතෙමේ කියන්නේ:

> "'සුභගයෙනි, මේ ලෝකයෙහි බ්‍රාහ්මණයෝ නම් ඍග් වේද ඇැ, යජුර් වේද යැ, සාම වේද යැ යි කියන ලද වේද ත්‍රයය හදාරා වේද මන්ත්‍ර පිරැවීමෙහි සමර්ථ ය හ. සියලු සත්ත්වයන් විසින් දෙන ලද්දා වූ දැනය පිළිගන්නට යෝග්‍ය බැවින් දක්ෂිණාර්හ ය හ. නිරන්තරයෙන් තිල තණ්ඩුල මුද්ගාදියෙන් හා ඝෘත සමිපාදියෙන් ගිනි දෙවියාට පූජා කරන්නා හ. එ සේ හෙයින් මේ තුන් කාරණයෙන් බ්‍රාහ්මණයෝ නො මැරිය යුත්තෝ යැ. තොප විසින් බමුණන් මරන්නට නො පිළිවන් වන්නේ යැ. නෙපිකුමක් කියවු ද? ඉදින් යමෙක් බමුණකු මැරූයේ වී නම්, ඒ තෙමේ නරකයෙහි ඉපැදී මහ දුක් අනුභව කරන්නේ යැ'යි කී යැ."

සුභගසෙට්ඨි සැකයට පැමිණියේ යැ. **නේඝාදඝා** ගේ ජීවිතය ගැලැවිණි. ආක්‍රෝෂ පරිභව බැණුම් වුව ද දිවි තොර නො කොට **සුභගසෙට්ඨි** සැකයෙන් මැ මහු නාග භවනයට ඇදුණු ගෙනැ ගියේ යැ.

මෙ තැන් පටන් වනුයේ බ්‍රාහ්මණ දෘෂ්ටි ඇති **කාණාරිට්ඨියන්** බ්‍රාහ්මණයන් ගේ උත්තම භාවය ප්‍රකාශ කරන්නා වූ පරිදි යි. බමුණන් කියන පරිදි නොයෙක් වාද ගෙනැ ඇරැ පා **කාණාරිට්ඨියෝ** බමුණන් ගේ උත්තම බව වැනූ හ. එහෙත් **භූරිදත්ත** කුමාරයෝ උන් ගේ සියලු වාද බිඳැ දැමමේ මිථ්‍යා වාදයෙකින් නො වැ තනී වාදයෙන් යැ. බමුණන් තමන් ගේ බව වැඩීම සඳහා කරන සියලු කුටෝපක්‍රම ද, කියන්නා වූ මෘෂා වාද ද, ඔවුන් ගේ අග්නි හෝමයෙහි හෙවත් ගිනි දෙවියන් පිදීමේ අර්ථ ශූන්‍ය භාවය ද ප්‍රකාශ කරන **භූරිදත්ත** කුමාරයෝ මෙ සේ කියන්නා හ:

> "මේ ලෝකයේ සමහර සත්ත්ව කෙනෙක් 'වත්නිය දේවතාවන් අතුරින් එක්තරා දේවතාවෙකැ' යි කියති. නුවණ නැති මිලේච්ඡ ජාති වූ සමහර සත්ත්ව කෙනෙක් 'ජලය දේවතාවෙකැ'යි කියති. මෙ සේ කියන්නා වූ ඒ සියලු සත්ත්වයෝ මෑ නැත්තක් විනා ඇත්තක් නො කියති. ගිනි දෙවියෙක් නොවන්නේ යැ. මෙ සේ අනිත්ද්‍රිය ප්‍රතිබද්ධ වූ අචේතස්ක වූ සියලු ලෝඝා වාසී සත්ත්වයාට බත් පිසීම ආදි වූ කම්මාන්ත කරන්නා වූ ගිනි දෙවියනට පූජා කොට අකුසල් කරන්නා වූ සත්ත්වයෝ ස්වර්ගී ලෝකයට යෙද්ද? එ සේ හෙයින් වහ්නි දේවතා යැයි කියන්නා වූ තොප ගේ බස බොරුවක් මැ, නො වන්නේ යැ."

ඔබ්බෙහු දහමට මෙසින් වැදෙන බලවත් පහර කුළු ගැන්වුණේ "සියලු ලෝක වාසි සත්ත්වයාට බත් පිසීම ආදි වූ කම්කටොළු කරන්නා වූ හිති දෙවියාට පූජා කොට" යන්නෙනි. හිති දෙවියා මිනිසා ගේ මෙහෙ කරුවා මිස ස්වාමියා නොවන බව ඔප්පු කළ අයුරු කොපමණ තර්ක-නුකූල ද?

බ්‍රහ්ම නිර්මිතියට පහර ගසන්නා වූ **භූරිදත්ත** කුමාරයෝ බ්‍රහ්මයා යහ පත් නම් ලොවැ සදා කාලික සැපත ඇති විය යුතු යැ සි ද, ලෝකයේ අධර්මිෂ්ඨතාවත් ඇති කළේත්, නිර්මාතෘවරයකු ඇත් නම්, ඔහු විසින් මැ නිසා, එ සේ ලෝකය මැවූ බ්‍රහ්මයා ද අධර්මිෂ්ඨ විය යුතු යැ සි කියන්නෝ:

> "තව ද **අරිට්ඨයෙනි**, ඉදින් මහා බ්‍රහ්මයා සියලු ලෝකයට ඉසුරුමත් වී නම්, ප්‍රජා නායක වී නම්, ප්‍රාණ ඝාතය, අදත්තාදානය, කාම මිථ්‍යාචාරය, මෘෂා වාදය, සුරා පානය, මායා, සාඨෙය්‍ය, ස්තම්භ, සාරම්භ, ඊර්ෂ්‍යා, මාත්සර්‍ය, මක්ඛ, පලාස, මානාතිමාන, මද, ප්‍රමාද, යන මේ අධර්මී හා එක් කොටැ ලෝ වැස්සන් කුමක් නිසා යෙදී ද? ඉදින් **අරිට්ඨයෙනි**, මහා බ්‍රහ්මයා තෙමේ මේ ලොව ඇති කළේ නම්, සියලු සත්ත්වයෝ බ්‍රහ්මයා නිසා ඇති වූ නම්, ඒ බ්‍රහ්මයා දශ කුශල ධර්මය ඇති වැ තිබියැ දී දශ අකුශල ධර්මයකුත් ඇති කෙළේ යැ. එ සේ හෙයින් ඔහු අධර්මිෂ්ඨ යැ සි කියම් හ....."

සි කී හ. නිර්මාණ වාදයට කතී‍ෘ එල්ල කළ පහරෙකැ මහත! එ පමණ පුරාණයේ දීත් ජාතක කතී‍ෘ තර්ක මනා සේ යෙදී යැ. අන්ධ භක්තියෙන් විනිර්මුක්තයන් පෙරැ කලැ ද වූ බවට මේ සාක්ෂ්‍ය යැ.

මුලින් මැ **භූරිදත්ත** කථාව ඇති වූ සමයයෙහි **කාම්බෝජ** රටැ වැසියන් ම්ලේච්ඡ වැ සිටින්නට ඇති. එ හෙයිනි **කාම්බෝජ** රාජ්‍ය වාසීන් ගේ ම්ලේච්ඡ භාවය පිළිබඳ මෙහි සඳහන් වැ ඇත්තේ. "ම්ලේච්ඡ වූ

කාම්බෝජ රාජ්‍ය වාසී වූ සත්ත්වයනුත් තොප ගේ බ්‍රහ්මයා මැවූහ යි සිතමි"යි භූරිදත්ත කුමාරයන් විසින් සඳහන් කැරිණි. නො එ සේ වැ එ වකට බෝඛයන් විසින් අබෝඛයන් මලේච්ඡ යැ යි සැලැකැණු හෙයින් ද්‍ය, ජාතක කාරක කාලයෙහි කාම්බෝජ වාසීන් අබෝඛ වැ සිටි හෙයින් ද්‍ය, කාම්බෝජ වාසීන් පිළිබඳ මෙ සඳහන මෙහි වූ හ යි සිතියැ හැකි.

බමුණන් ගේ බසෙහි "පූර්‍වාපර සන්ධියන් වත් හරියන් වත් නැති නියාව" ප්‍රකාශ කරන බෝධි සත්ත්වයෝ, යාචක බ්‍රාහ්මණයා සමුද්‍රයෙන් රැල අවුත් මුහුදු ඛත් වී යැ යි කිපි, මහා බ්‍රහ්මයා සමුද්‍ර ජලය අන්‍ය සත්ත්වයනට නිෂ්ප්‍රයෝජන වැ ලවණ රස වන්නට සාප කළ ද, සම්පූර්ණ කොටැ ගන්නා ලද වේද මන්ත්‍ර ඇති බමුණන් දහසක් දෙනා මන්ත්‍ර පිරුවමින් සිටියවුත් ගංගා ජලය ඇදූ ගෙනැ ගොස් නසා පී නමුදු ගංගා ජලය ලවණ රස නො කෙළේ එ වැන්නක් කැරැ ගන්නට ඔහු අසමර්‍ථ නිසා ද්‍ය යි මහත් මැ උපහාසයෙකින් කී හ. මෙ වැනි බමුණු දහමෙහි වන කිසි මැ වැඩකට නැති ද්‍ය එළි කොටැ කාණාරිට්ඨියන් නිහඬ වන සේත් නේසාදයා ගේ බොරුව විදහා පැනෙන සේත් භූරිදත්ත කතා "බ්‍රාහ්මණ ධර්‍ම හඬහක" කථාවක් බෝධි සත්ත්වයන් ගේ මුව'ගැ රැඳැවී යැ.

මෙ සේ උපහාසාත්මක වැ බමුණු දහමෙහි පහත් බව දැන්වුණ නමුදු බෝධි සත්ත්ව කෙනකුට සුදුසු වූ මෛත්‍රී ධර්‍මය භූරිදත්ත කුමාරයන් කෙරෙහි ඇති කැරැවන්නට කතා නො මතක නො කෙළේ යැ. ඒ බව පවසන කතා මෙ සේ ලියයි:

> "මහ බෝ සතාණෝ නේසාද බ්‍රාහ්මණයාට ආක්‍රෝශ පරිභව පමණකුත් කළ නො දී නාග භවනයෙන් පිටත් කොටැ මනුෂ්‍ය ලෝකයෙහි ලැවූ හ."

මෙ සේ සෑම ජාතක කථාවෙකැ පමණක් නොවැ බුද්ධ ධර්ම සම්බන්ධ වූ සෑම පොතෙකැ මැ වූ බෞද්ධත්වයේ සලකුණ වන මෛත්‍රිය මේ ජාතක කථාවෙහි දු ඇතුළත් කිරීම කතිෘ අමුතු වෙහෙසෙකින් කළ දෙයෙක් නොවැ නිතැනින් මැ සිදු වූවෙකි. මේ බෞඩ කථාවන්හි විශේෂ ලක්‍ෂණයෙකි.

කථාවසානයෙහි **සාගර** බ්‍රහ්මදත්ත රජු ගේ මුව'ගැ ලෙළ දෙන **කුරිදත්ත** කුමාරයන් ගේ යශෝශ්වර්‍ය පැවැසෙන වාං මාලාව කියැවෙන විට නාගයන් ක්‍ෂත්‍රිය ගෝත්‍රිකයන් බව හැඟෙන්නේ මැ යැ:

> "නළල් කෙළවරැ බඳනා ලද නළල් පටියෙන් මෙඝ මුඛය බබුළුවන්නාවූ විදුලියෙකින් මෙන් මුඛය බබුළුවන්නේ යැ. එ බඳු වූ මුඛය කා ගේ මුඛයෙක් ද? ඝියොවුරු බැඳැ, දුන්න හා ඊ දඹු අතට ගෙනැ, කඹුව උරයෙන් එල්ලා, යුද්ධ සන්නඬ වූ තරුණ පුරුෂයකු මෙන් මහත් වූ ශ්‍රී විභූතියත් බබළමින් එන්නා හ.
>
> .....
>
> .....ඝරහන ලද ජාම්බූනද ඝණීමය වූ මේ ධවලාතපත්‍රය කා ගේ ද? මෙ බඳු වූ ධවලාතප ත්‍රයෙන් සුසීරශ්මීන් වළක්වමින් මහත් වූ ශ්‍රී විභූතියෙන් දිලියෙමින් එන්නා වූ මූ කවුරු ද?.....
>
> .....
>
> රන් බුබුළින් ගැවැසී ගත්තා වූ මැණික්මය වූ කඹු මිටින් විසිතුරු වූ විදුලිය කළඹක් වැනි වූ කඹුව තිරිප්පු කොටැ පෂීත් මඛයේ බැසැ එති. තපස්වීන් වහන්ස, මෙ බඳු බඩිඟ පත්‍රයක් ගෙනැ යුද්ධයට නික්මුණු වරම් රජ දරුවක්හු මෙන් එන්නා වූ මූ තුමූ කෙ සේ වූ කෙනෙක් ද"?

මේ විස්තරය නිසා **කුරිදත්ත** ජාතක කථාවෙහි යට කියාව නාග ගෝත්‍රික ක්‍ෂත්‍රියයන් හා සම්බන්ධ වූ කථාවක් ආශ්‍රය කොටැ ගෙනැ වූ හ සි අනුමාන කළ හැක්කේ යැ.

V

වෙස්සන්තර ජාතකය

භූරිදත්ත වෙස්සන්තර ජාතක ද්වයය එකට සසඳා බලන කලෑ, **භූරිදත්ත ජාතකයෙහි** නොා පෑහෙන සුන්දර ලක්ෂණ **වෙස්සන්තර ජාතකයෙහි** පෑහෙයි. භාෂා විලාසය අතින් සලකා බැලුව ද **භූරිදත්ත කථා-වෙහි** නොා පෑහෙන ආකර්ෂණීයත්වයෙක් **වෙස්සන්තර කථාවෙහි** ඇති. **භූරිදත්ත ජාතකයෙහි** සමහර තැන් කියවන විටෑ සමහර විටෑ දිය ධර්ම දේශනාවක් අසා සිටින කලෑ ඇති හැඟීම ඇති වන්නට ද ඉඩ ඇත්-තේ යෑ. දීර්ඝ වූ වාක්‍යයන් ගෙන් වන විස්තර බොහෝ විටෑ ඒ වාක්‍යයන්හි දී මුලින් දැක්වුණු චිත්‍රය නොා මතක කරවන තරම් යෑ. වාක්‍ය දීර්ඝ වුව ද නොා මතක නොා-වන තරම් දර්ශනීය චිත්‍රයෙක් එයින් පිළිබිඹු වන්නේ නම් එහි දීර්ඝත්වයෙන් බාධාවෙක් නැති. එ හෙත් චිත්‍ර ජ චිත්‍ර නිර්මාණය කිරීමේ ශක්තිය එ වැනි දීර්ඝ වාක්‍යයෙකෑ නැත් නම්, පෙරෑ කී සේ, කතෘ විසින් අදහස් කෑරුණු චිත්‍ර වස්තුය කියවන්නා තුලෑ සපුරා නොා-නඟින්නට ඉඩ ඇති.

වෙස්සන්තර ජාතකය ජට ඉඳුරා වෙනස් වූ මහක් ගත්තේ යෑ. මේ ජාතකය කොා පමණ ජන ප්‍රිය වී ද යත් සිංහලයෙහි සාහිත්‍ය කෘතින් කිහිපයක් මෑ මෙහි කථා ශරීරය ප්‍රයෝජනයට ගත්තා පමණක් නොා වෑ, සාමාන්‍ය මහා ජනයා විසින් තමන් ගේ දින පතා කියැවීමට හා විනෝදයට ද එය යොදුණි. සිංහල **වෙස්සන්තර ජාතක කාව්‍යය** මුද්‍රණ යන්ත්‍රය මෙහි ආවාට පසු තිස් හතළිස් වරක් මෑ පැහෑරිණි. ගමේ ගොඩේ නිතරෑ මෑ බෑවහර කෑරෙන **වෙස්සන්තර ජාතක කාව්‍යය** මළගෙදරෙකදී

මිනිය සමඟ ඉන්නා අය එළිවන තුරු ගයති. පාළු කපන්–නට මේ තරම් ව්‍යවහාර වන අනෙක් ගැදියෙක් හෝ පැදියෙක් හෝ නැති. බුඩාගමයෙහි පැවැසෙන පරිදි වෙසතුරු දුව බෝ සතුන් ගේ බුදු වීමට පෙරැ මිනිස් අත් බවේ වූ අන්තිම ඉපැදීම යැ. **වෙස්සන්තර** රජු මරණින් මතු **තුෂිත** දිව්‍ය ලෝකයෙහි **සන්තුෂිත** නම් දෙව් රජු වැ උපන් හැටි යෙති. හෙතෙම එ තැනින් චුත වැ බුදු වන්නට මැ සුදුසු වැ **සිද්ධත්** කුමර වැ උපන්නේ යැ. මේ සේ ජාතක කථා අතුරින් ශ්‍රේෂ්ඨතම ස්ථානය මේ ජාතකයට ලැබීමට හේතුව අපට සොයා ගැනීම උගහට නො වේ. බෝ සතාණන් බුදු වන ජාතියට පළමු මිනිස් අත් බව‍ැ අවසාන වශයෙන් උපන් ජාතිය පිළිබඳ පුවත උසස් මැ තැනෙකැ වැජැඹීම පුදුමයෙක් නො වේ.

බුත් සරණ කළ **විද්‍යා චක්‍රවර්තීහු වෙස්සන්තර** කථාව වර්ණනා කළ හ. [මතු එන සැසැඳීම්වල දී ඒ පිළිබඳ තවත් විස්තර එයි.] පාළි **ජාතකට්ඨකථාව** සිංහලයට නැඟූ පරිවර්තකයා **බුත් සරණෙහි** එන කථාව එහැම පිටින් මැ වාගේ තමන් ගේ පරිවර්තනයෙහි ඇතුළත් කෙළේ යැ. **බුත් සරණෙහි** එන කථාවෙහි රස එ සේ මැ **වෙස්සන්තර ජාතක** කථාවෙහි ද බැහි යැ. **දහම් සරණ** අවසානයෙහි ද **වෙස්සන්තර** කථාව එයි. එය **විද්‍යාචක්‍රවර්තීහු** තුමූ මැ එහි ඇතුළත් කළෝ ද, එ සේ නැති වැ පසු කලෙකැ ලේඛකයන් විසින් ඇතුළත් කරන ලද දැයි නිගමනය කිරීම දුෂ්කර යැ. එ හෙත් එය එ සේ **දහම් සරණෙහි** ද ජමෙන් අපට පෙනෙනුයේ එහි ඇති ජන ප්‍රියතාවට වැදූ ගත් සාක්ෂ්‍යයෙකි. **වෙස්සන්තර** කථාවෙහි ඇති වර්ණන සුන්දරත්වය **ජාතක** පරිවර්තකයා ගේ සපත් කමෙක් යැ සි කියැ හැකි නො වේ. **බුත් සරණෙහි** එන වර්ණනාවන් හා සසඳා බලන විට එහි ගෞරවය හිමි විය යුත්තේ **විද්‍යාචක්‍රවර්තීනට** යැ. පරිවර්තකයා එ වකට ව්‍යවහාර–යෙහි තුබූ ජාතක කථාව සුන්දරත්වයෙන් අනූන වූ හෙයින්, සොර කම් කිරීමේ අදහසෙකින් නො ව,

පුරාණාවාසියන් කෙරෙහි ඇති කැරී ගත් භක්තියෙන් හා ගෞරවයෙන් ද එය තමන් ගේ පරිවර්තනයෙහි ඇතුළත් කෙළේය. **ජාතක අට්ඨවා** සිංහලයට නැගෙන කාලයෙහි දී සිංහලය පැවැතුණු තත්ත්වයෙන් මේ ජාතකයෙහි එන වර්ණනාවන් විද්‍යාවක්‍රවර්තීන් කළ සේ කිරීම උඟහට විය. එ හෙයිනුත් ව්‍යවහාරයෙහි ඇති රසවත් කථා එ සේ මැ යෙදීම පුරාණාවාසී වරයනට කැරෙන භක්ති ප්‍රණාමයක් ලෙස සැලැකුණු හෙයිනුත් බුත් සරණෙහි ඇති රසය මැ ගෙනැ ඇරැ පාමින් **ජාතක** පොතේ ඇතුළත් වුණු කථාව ද චූෂ්‍ය යැ.

විද්‍යාවක්‍රවර්තීහු ද තම නිර්මාණයෙහි දී ගුරු කොටැ ගත් පොතෙක් ඇති. පාළි **ජාතකඝනට** පුරාණ **කෙළි** ඇදුරෝ ගැට පද කළ හ. සමහර විටැ මේ ගැට පද කරන්නට ඒ ඇදුරනට ඔවුනට පෙරාතු වැ වූ හෙළ ටුවං උපකාර වන්නට ඇති. **වෙස්සන්තර ජාතකඝට** කළ ගැට පදය **වෙසතුරු දු සන්නෙ** යනුවෙන් ව්‍යවහාර වන්නේ යැ. මේ සන්නයෙන් **වෙස්සන්තර ජාතක** කථාව සම්පූර්ණයෙන් මැ අපට දැකැ ගන්නට නො හැකි. **ජාතකට්ඨකථාවෙහි** අා ගැටළු පමණක් ලිහා ඇති මේ ගැට පදයෙන් බුත් සරණ කතිෘෘනට ගුරු වූ පුරාණ **වෙස්සන්තර ජාතකයෙහි** භාෂා විලාශය හා ශෛලිය ද පෙනෙන්නේ යැ. [සැදැදීම පිණිස මෙහි ඒ ගැට පදයෙන් ගත් කොටස් අධෝ ලිපියෙහි එන්නේ යැ. එහි පෙළ මහාචාර්‍ය ඩී. ජ්. කෙව්ටි **ආරච්චින්** ගේ විශිෂ්ට නිර්මාණයක් වූ **වෙසතුරු දු සන්නෙට** කළ විස්තර කථාවෙන් ඇරැ ගෙනැ, ඒ අධෝලිපියෙහි බහා ලන ලද බව කෘතඥතා පූර්වක වැ මෙහි කතිෘෘහු සඳහන් කරති.]

වෙස්සන්තර කථාවෙහි සම්පූර්ණ විස්තරයෙක් මෙහි දී නො කැරෙන්නේ මැ යැ. සිංහලඝ කියවන්නට දත් අය විසින් පමණක් නො වැ සිංහලය අසන්නට තරම් කනැ සුවය ඇති අකුරු නො දත්තවුන් විසින් ද ඒ කථාව මනා වැ දන්නා ලද්දක් හෙයිනි.

ජාතක කථා ලියැවුණු කාලයෙහි පමණක් නොව බුදු දහමෙහි බලය බොහෝ කොටැ පිරිහී තුබූ කාලයත්හි ද පෙනෙන්නාක් මෙන් මැ, මේ ජාතක කථාවෙහි ද මූලික අදහස දැනයෙහි ඇති අනුසස් වර්ණනා කිරීම විය. බුදු බවට පත් වීමට වුව මනා කැරෙන ප්‍රධානතම කට යුත්ත දැන පාරමිතාව ය. මෙහි දී ද ඒ දැන පාරමිතාව වෙසෙසින් මැ වැනෙන්නේ ය. **භූරිදත්ත ජාතකයෙහි** වර්තමාන කථාවෙහි වූ පරිදි මැ ශීල සමාදානය පිළිබඳ ප්‍රවෘත්තියට ප්‍රධාන තැනෙක් ලැබෙයි. **භූරිදත්ත** කුමාරයෝ සිල් රකිති. උනට කොපමණ දුක් ගැහැට **ආලම්බනයා** ගෙන් ලැබුණ ද ඔහු කෝපයට පත් නො වෙති. කථාවෙන් වැඩි කොටසෙකැ මැ **භූරිදත්ත** කුමාරයන් ගේ ශීලයෙහි උත්කෘෂ්ටතාව පැනෙන්නේ ය. එ හෙත් **වෙස්සන්තර** කථාවෙහි දී වර්තමාන කථාවෙහි පැනෙන ප්‍රධාන කාරණය, එ නම් පොකුරැ වැසි වැසීම ප්‍රධානතම ස්ථානය නො ගනියි. අවසානයෙහි දී පොකුරැ වැසි ද නො වසින්නේ නො වේ. එ හෙත් කථාව කියැවූ කලැ පැනෙනුයේ මුල් තැන දැන පාරමිතාවට ලැබුණු සැටි යි.

දෙ පොතෙහි කතෘන් දෙ දෙනකු වෙති යි සිතන්නට ඉඩ ඇති කාරණ භාෂා විලාශය හා, පෙරැ කියැවුණු සේ අදහස් කැරැණු කරැණට මුල් තැන දෙන්නට **භූරිදත්ත ජාතකයට** හැකි වීමත්, **වෙස්සන්තර ජාතකය** පොකුරැ වැස්ස පිළිබඳ වැ ලියැවෙන්නට තිබුණු නමුත් දැන පාරමිතාව පිළිබඳ වැ ලියැවීමත් පමණෙක් නො වේ. **භූරිදත්ත ජාතකයෙහි** ප්‍රාරම්භයේ දී බුදුන් වහන්සේ විස්තර කැරැණු තරම බලමු:

භූරිදත්ත ජාතකය:

"ශාක්‍ය කුල ප්‍රධාන වූ තිලෝ ගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන් සේ....."

[මෙ පමණෙකි]

වෙස්සන්තර ජාතකය:

"කරුණාවට හේතු වූ, දහමට ලයැති, අසන්නවුන් කන්හි අමා නමන මධුර වූ ධර්ම දේශනා ඇති, බැලුබැලුවන් ඇස් නිවන මනහර රූ ඇති, සිතන්නවුන් සිත් නිවන මනෝඥ ගුණ ඇති, දෙව් බඹ මුදුන්හි කෙළනා පා පියුම් ඇති, ලෝක ස්වාමි වූ, අද්වය වාදි වූ, අතුල්‍ය වාදි වූ, අමෘත වාදි වූ, විනය වාදි වූ, විභජ්ජ වාදි වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්ම ලෝචන වූ, ධර්මාමෘත වූ, **ශාක්‍ය** සිංහ වූ, **ශාක්‍ය** කේතු වූ, **ශාක්‍ය**ාධිපති වූ, ශාක්‍ය කුල තිලක වූ, කරුණාමෞලි මාලාලඞ්කෘත වූ, සමන්ත භද්‍ර වූ, පර දුඃඛ දුඃඛිත වූ, අශරණ ශරණ ශරණාගත වජ්‍ර පඤ්ජර වූ, ත්‍රි භුවන චක්ෂු වූ, ජගදනඤ්ඤ ලෝචන වූ, දේවාතිදේව වූ, බ්‍රහ්මාතී බ්‍රහ්ම වූ, වන්දනීයාගිවන්දනීය වූ, පූජනීයාගිපූජනීය වූ, දශ බල ධාරි වූ, චතුර් වෛශාරද්‍ය විශාරද වූ, ද්වාත්‍රිංශද් වර මහා පුරුෂ ලක්ෂණාශීත්‍යනුව්‍යංජන ඛ්‍යාම ප්‍රභා කේතු මාලාලංකාරයෙන් විරාජමාන වූ, අල්පේච්ඡ වූ, සන්තුෂ්ට වූ, අසංසෘෂ්ට විහරණ ඇත්තා වූ, ආරබ්ධ වීර්‍ය වූ, වචන ක්ෂම වූ, පාප චෝදක වූ, ශික්ෂා කාමී වූ, ජිතේන්ද්‍රිය වූ, ජිත ක්ලේශ වූ, ශීල සම්පන්න වූ, සමාධි සම්පන්න වූ, විමුක්ති සම්පන්න වූ, සර්‍වාර්‍ථ සිද්ධි ප්‍රසව කර චින්තා මාණික්‍ය භද්‍ර ඝට කල්ප ද්‍රුමායමාන වූ, සසරට ප්‍රතිපක්ෂ වූ, නිවනට දෙර හළුවා වූ, සංසාරයට ඔණි පෙති පෙළක් බඳු වූ, අපායයට අකුල් හෙළූ, වියත් බව්හි අග තත්පත් වූ, මුළු සක්වළ සතුන් දුල්වුදුල්වූ ඇස්හි පෙනී යන්නා වූ, සිතුසිතූ සිත්හි ඇදී යන්නා වූ, ඇස් දුටු දිශාවට සියලු සම්පත් දී ලන්නා වූ, නි ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ....."

ආදියෙහි දී මෑ **ජාතක** කතා **විද්‍යාචක්‍රවර්ති**නට හර සර දක්වන්නට මෙන් උන් ගේ බස් වහර මෑ සුළුපයක් වෙනස් කොට, ගත් සැටි, බුත් සරණෙහි

අවසාන පරිච්ඡේදය වන **විශ්වන්තර ජාතක කථාව** පටන් ගත් අයුරු මෙහි සඳහන් කැරීමෙන් පැනෙන බැවින් එය මෙ තැනැ බහා ලමු:

> "...කරුණාවට හේ වූ, දහමට ළ ඇති, අසන්නන් කන්හි අමා නමන මධුර ධර්‍ම දේශනා ඇති, සිතන්-නන් සිත් නිවන මන හර ගුණ ඇති, දෙව් බඹුන් මුදුනෙහි කෙළනා පා පියුම් ඇති, ලෝක ස්වාමි වූ, ශාක්‍ය සිංහ වූ, පර දුඃඛ දුඃඛිත වූ, අනුශාසක වූ, අද්වය වාදී වූ, ධර්‍ම රාජන් වූ, සමන්ත භද්‍ර වූ, ෂඩභිඥ වූ, ළයට සැනැහිලි වූ, සසරට ප්‍රතිපක්ෂ වූ, නිවනට දෙර හළුවා වූ, සංඛ්‍යාවට හිණි පෙති පෙළ වූ, අපායයට අකුල් හෙළූ, වියත් කමින් අග තැන් පත් වූ, මුළු සත්වලු සතුන් ඇස්හි පැනී යන්නා වූ, සිතුසිතූ සිත්හි ඇදී යන්නා වූ, බැඳී යන්නා වූ, ඇවිලූ යන්නා වූ, ඇස ලූලූ දිසාවට සියලු සැපත් දී ලන්නා වූ, ඒ ස්වාමි දරුවාණන් වහන්සේ..."

ජාතක කතෘ **විඤ්ඤවක්‍රවර්ති**න් ගේ ප්‍රාරම්භය මැ වෙනස් කොටැ ගත්තේ වැනි පුර වචන යෙදීමෙනි. සමහර කෙනකුට මේ අනුන් ගෙන් සොර කම් කොටැ තමන් ගේ මෙන් මැ සි පෙන්වීමට දුරු දුර්ලූ ප්‍රයත්නයෙකැ සි කියන්නට ඉඩ ඇතත් අප සිතන අයුරු නම් මෙ තැනැ වූයේ අනෙකෙකි. බුද්ධාලම්බන ශ්‍රද්ධායෙන් පිරී ඉතිරී ගිය සිත් ඇති **ජාතක** කතෘ පෙරැ වූ ප්‍රාරම්භයට තව තවත් විශේෂණ පද යෙදී යැ; යොදූ තම හදෙහි වූ ඉමහත් භක්තිය ප්‍රකාශ කෙළේ යැ. මෙ සේ අප විසින් සිතියැ හැක්කේ, **ජාතක** පොත, කතෘ ගේ උසස් බවක් පෙන්වීමට නො වැ, ශ්‍රුදෙක් ශ්‍රද්ධායෙන් මැ කරන ලද්දක් හෙයිනි.

මතුවට පැනෙන වර්ණන චිත්‍රයන් ගෙන් වර්ණන සෞන්දර්‍යය අග තැන් පත් වන මේ කථාවෙහි **බුදුන් වහන්සේ** පිළිබඳ චිත්‍ර නිරූපණයක් නො කැරුණ ද,

උන් වහන්සේ කෙරෙහි වූ ගුණයන් සඳහන් කොටැ උන් වහන්සේ වණිනා කරන්නට ඉටා ගත් කතිෘ, **සුරිදත්ත** ජාතකයෙහි නො පැනුණු දිඬි විශේෂණයක් මේ ප්‍රාරම්භයෙහි දී යෙදුවේ **විද්‍යාවක්‍රවර්තින්** තුළැ වූ ශ්‍රඛාව, උන් ලියූ කථාව නැවැතැ ලියන විට ද්වි ගුණ ත්‍රි ගුණ වැ ඇ හෙයිනි. [මෙ වැන්නක් **උම්මග්ග ජාතකයෙහි** ද පැනෙන බව මෙහි දී සඳහන් කැරියැ සුත්තේ යැ.]

වර්තමාන කථාවෙහි එන යමා මහ පෙළහරෙහි විස්තර බෞඛ වූ කා ගටත් අමුත්තෙක් නො වෙයි. බොහෝ විහාර ස්ථානයන්හි වන චිත්‍ර අතර මෙය නිරූපණය කොටැ තිබෙනු දැකීම දුෂ්කර කාර්යයෙක් නො වේ. යමා මහ පෙළහර පා බුදුන් වහන්සේ විසින් නෑයන් තමන් වැන්දූවූ කලැ, "අකාල මේඝයක් නැඟි පොකුරැ වැස්සෙක් වටුයේ යැ." ඒ වැස්සෙහි විසිතුරැ පෙන්වන කතිෘ කියවන්නා ඇස් ඉදිරියෙහි චිත්‍රයක් සැපැයිම ඉතාමත් මැ ශ්‍රේෂ්ඨ නිර්මාපකයකු ගේ කෘතියෙකි:

> "ඒ වැස්සෙහි තඹ වත් දිය රැවූ දෙමින් පොළොවෙහි දිවෙයි. ඉන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැත්තන් සිරිරෙහි දිය බින්දුවෙකුදු නො වැටෙයි."

මේ විස්තරය බුත් සරණෙහි නො එත්තේ යැ. සිත්තරා ගේ තෙලි තුඹින් වත් ඒ වැස්සෙහි සිරිය මේ වචනයන් ගෙන් සැකෙවින් වුව ද ලියැවුණු සේ කළ හැක්කේ ද?

ඵුසති දේවිය **ශක්‍ර** භවනයෙන් චුත වන්නට පෙරැ **ශක්‍ර** දේවේන්ද්‍රයන් විසින් දෙන ලද වර දසය ඉල්ලන්නී, තොමෝ මැ අනාගතයෙහි ලැබෙන වර "දුවල් සිහිනයක්" මෙන් ඉදිරියෙහි මවා ගතු. එය විසිතුරැ කරන කතිෘ **ඵුසති** දේවිය සිතින් මවා ගත් අනාගත රූප ශ්‍රීය කා ගේත් සිත් ගන්නා සේ වණිනා කරයි:

"තව ද මා ගර්භිනී වූ කලැ, සම කොටැ ගැ යෙදූ දුනු මිටක් සේ මා ගේ මධ්‍ය ප්‍රදෙශය තුස් නොමහත් වේවා. මා ගේ පයෝධරයෝ දෙ දෙන හැම කල්හි මැ නොහි උඩ බලා සිටිත් වා. මා හිසැ නර නොනැගේ වා. සියලු සත්ත්වයනට ප්‍රිය වූ මන වඩන්නා වූ වණ්වත් වූ සියුම් සිවි ඇති වෙමි වා."*

විද්‍යාචක්‍රවර්තිහු ද මෙය මිට ඉතා කිවිටුවෙන් කීවෝ මෙ සේ යැ:

"මා ගර්භිනී වූ කලැ සම කොටැ ගහා යෙදූ දුනු මිටක් සෙයින් මා ගේ මධ්‍යමාඞ්ගය නො උස් නොමහත් වේවයි. දෙව් රජ, මා ගේ පයෝධරයෝ දෙ දෙන නොහි උඩ බලා සිටිත්වයි. මා හිසැ නර නොනැඟේවයි. වෙර දැලි නොහිඳේවයි..."

බෝධි සත්ව කෙනකුට බුදු වන ආත්මයෙහි දී මවු වන්නට විපස්සි නම් බුදුන් සමයයෙහි දී ප්‍රාර්ථනා කළ ඵුසති දේවිය ගේ ප්‍රාර්ථනාව විස්තර කැරීමෙහි දී, මඳු රටැ ඉපැදූ වෙසතුරැ රජුට මවු වන්නට සුදුසු වූ කාලයෙහි දී වුවද, මේ ජාතක කථාවෙහි ආදි කතීෘ තමන් ගේ වණ්න ශක්තිය ක්‍රියාවේ නොයොදා නොසිටීම දුෂ්කර කාර්යයෙක් විය.

බිසොවුන් පෙරහරින් රජ ළඟට බැසැ ගමන් කළ අයුරැ කතීෘ විද්‍යාචක්‍රවර්තීන් ගේ බස් වහරට ඉතා මැ සුළුපයක් වෙනස් වැ මෙ සේ වණ්නා කෙළේ යැ:

---

*වෙසතුරැ ද සන්නෙ:

"ඔබ උසුලනු වූ මං ගේ මධ්‍යමාඞ්ගය නෙං උස් වේ වයි. සම කොටැ ගැ යෙදූ දුනු මිටක් සෙයින් මධ්‍යමාඞ්ගයෙනුදු තුස මැ නොඋස් වේ වයි, නෙං මහත් වේවයි. දෙව් රජ, මං ගේ පයෝධර යුගළයෝ නෙං හෙත්වයි. පුල් පියුම් මහනා රන් හසුන් සෙයින් මුව පියුම් මහමින් උඩු බලං සිටිත්වයි..... මං ගේ හිසැ නර ද නෙං පැනේවයි."

"සඳට පළමු ගමන් ගත් තරු කැලක් මෙන් සැම මෙහෙ තැන් පෙරට මැ අවුත් පිරිවරා ගත් හ. එසේ මැ සිවැ සලන සුදු චාමර රන් චාමර රන් තල් වැට රිදී තල් වැටින් වසන්තයා සිය වෙසින් ආවමි සිතමි. සරසුන් විසින් ගත් සුදු සේ සසින් ඒ ද ඒ පුරය දෙව් පුරයක් වැ ගියේ යැ යි සිතමි. කිරි මුහුදු ඔද වැඩී දිවෙන රළ පඬකති සේ ඒ නුවර දිවැ සිටින අඟ සමූහයෙන් හා හස්තාලඞ්කාර-යෙන් සැරසී සිටින පළුත වැනි අැත් සමූහයෙන් හා රිදීමය වූ පස් වනක් පැහැයෙන් දිලියෙන ධජ පතාකාදියෙන් හා විසිතුරු වූ අැතුන් අසුන් ගොන් ආදීන් අදනා මන හර රථ පෙළින් හා සත් රුවන්-මය ධජ පතාකා පෙළින් හා රන් වන් කලස් පෙළින් හා ඒ නුවර බැලූබැලූවනට අමෘතාඤ්ජනයක් වැන්නැ යි සිතමි. ඒ සත් රුවන් මඩුයෙහි සිටැ නටන මන හර යොවුන් පත් සඟුන් නටා ගෙනැ එන කලැ දිව්‍ය සඟුන් කැඳවති යි සිතමි."

බුද්ධාගමය සම්බන්ධ බොහෝ කථාවලැ එක් වන් තැන් ඇති බවට නිදසුන් මේ කථාවෙන් ද පෙනෙන්නේ යැ. **වෙස්සන්තර** කුමරුන් උපන් දා මැ "කෛලාස කූටය සේ රිදී පර්වතයක් සේ අතිධවල වූ **පණ්ඩර** නම් මඟුලැත් පොව්වකු" දෙවියෝ තමන් ගේ අනුභාවයෙන් අැත් හලැ ලා ගිය හ. **සිද්ධත්ත** කුමරුන් බිහි වුණු වේලෙහි **කන්ථක** නම් අඟ පෝතකයා ද උපන්නේ යැ. මේ කථා අනුවැ ගිය **මහාවංශ** කතෘන්හු ගැමුණු කුමරුට **කඬොලැතු** සැපැයූ හ. **වෙස්සන්තර** කුමරුන් සමඟ එක දා කුමාර වරු සැට දහසක් උපන් හ. **උම්මග්ග** ජාතකයෙහි දී **මහෞෂධ** කුමාරයන් උපන් දා ද තවත් කුමරුවෝ උනට සහාය වීමට උපන් හ. **සිද්ධාර්ථ** කුමාරයන් සමඟ **ඡන්නයා** ද උපන්නේ යැ. මෙහි දී ද, **උම්මග්ග** ජාතකයෙහි දී ද, බුදු වන ආත්ම භාවයෙහි ද, බෝ සත්හු උපන් විට මැ කථා කරති. මේ සේ

වෙස්සන්තර ජාතකයෙහි ද වෙනත් බෞද්ධ කථාවන්හි එන සමාන අංශවයි අද්භූත කරුණු පැනෙන්නේ යැ. මේ කරුණු සිංහල ජාතක පරිවර්තකයන් වෙසෙසින් කළ දෙයෙක් නොවේ. පාළි බෞද්ධ කථාවන්හි ද මේ සම ලක්ෂණය පැනෙන්නේ යැ.

ජාතක පොතෙහි එන වර්ණනා **වෙස්සන්තර කාව්‍ය**යේත් බුත් **සරණෙහිත්** එන වර්ණනා සමහරක් හා සසඳා බැලුව හොත් වෙන තැනෙකැ නොලැබෙන තරම් වූ සුන්දර වර්ණනාවන් මේ කථාවෙහි එන බව පැනෙයි. **ජාතක** පොතෙහි එන අළි අතු සැරසූ සැටි කාව්‍යයෙහි එන විස්තරය හා සසඳා බලන විට කාව්‍ය කර්තෘ එය මහා ජනයාට ශ්‍රද්ධාව උපදවන ආකාරයෙන් ගැමි ජනයා ගේ භක්තිය කුළු ගන්වන සේ රචිත ආකාරය මනෝහර ලෙස දිස් වන්නේ යැ:

> "එ බස් අසූ මහ බෝ සතාණෝ..... අතු සරහවන්නාහු, ලක්ෂයක් වටනා රත් පලසෙකින් පිට සැදුවූ හ. ලක්ෂයක් වටනා මුතු දුල යැ. ලක්ෂයක් වටනා මිණි රැස් දම් පටල යැ. ලක්ෂයක් වටනා රන් දුල යැ. ලක්ෂයක් වටනා මැණික් දුල යැ. එහි බදනා මිණි දෙක දෙ ලක්ෂයක් වටෙන් යැ. කණීාභරණ දෙක දෙ ලක්ෂයක් වටනේ යැ. වටංසක තුන් තුන් ලක්ෂයක් වටනේ යැ. යට බඩ සැදූ පලස ලක්ෂයක් වටනේ යැ. කුඹ සැදූ ආභරණ දෙ ලක්ෂයක් අගනේ යැ. දෙ දළ සැදූ ආභරණ දෙ ලක්ෂයක් අගනේ යැ. පය සැදූ ආභරණ සාර ලක්ෂයෙකැ. වාලධිය සැදූ ආභරණ ලක්ෂයෙකැ. ගෙලෙහි මුතු දුල ලක්ෂයෙකැ. අතු නැහෙන හිණ ලක්ෂයෙකැ. අතු බත් කවන රන් කටාරය ලක්ෂයෙකැ. මෙසේ අතු සැදූ ආභරණ මැ සුවිසි ලක්ෂ අගනේ යැ. පිට මැණික යැ, මුදුනෙහි මැණික යැ, අකුස්සෙහි මැණික යැ, කණුවය වෙළන මුතු හරෙහි මැණික යැ යන මේ මැණික් සතර අනර්ඝ යැ.

"මෙ සේ අසීනකී සියලු ආභරණයෙන් ඇතු සඳ, ඇත් වෙදුන් ඇත් රැවියන් ඇතුළු වූ පන් සියයක් කුල වාසිත් ද, ඇතු නාවන කවන පොවන ඕ හට සියලු කළ මනා මෙහෙයට නිසි පරිවාර ජනයන් දී සිත් ගෙනැ, රන් කෙණ්ඩියෙන් අතැ පැන් වත් කොටැ, 'ඒකානතයෙන් ලොවුතුරා බුදු වෙම්ව' සි කියා ඇතු දන් දුන් හ."*

බුත් සරණ කතෘන් ගේ ප්‍රබන්ධය මැ ඉතා මදක් තැනින් තැනින් වෙනස් කොටැ **ජාතක** කතා විසින් ලියැවුණු මෙහි වූ ඇතු සැරිසූ සැටි කාව්‍යයෙහි විස්තර වුණේ සාමාන්‍ය ගැමි ජනයා කෙරෙහි තව තවත් ප්‍රසාදය ඉපැදෙන පරිදි යැ. ඒ විස්තරය කවියට නැඟුණේ මෙසේ යැ:

සඳමින් ඇතු සිවු සැට බරණින් තුව
ගෙනෙමින් මුතු දුල් බැඳැ ලා සහ තුට
බඳිමින් ඇතු ගත වසමින් රන් පට
සඳමින් බැඳි මුතු දූ පය සතරට

නත් වත් මුතු මිණි සඳමින් කර තල
ඉන් රන් බරණින් සැරිසු දෙකත් තල
රන් වත් මුතු මිණි ලවමින් වට කළ
උන් වත් සොඬ රන'බරණින් වට කළ

පිටැ දමමින් බැඳි මුතු දුල් ලක්ෂ ය
යටැ දමමින් බඳැ මුතු දුල් ලක්ෂ ය
සිටැ එ තැනැ මැ දණ දෙක මැ දෙ ලක්ෂ ය
වටැ දැලේ දුල් දෙක මැ දෙ ලක්ෂ ය

---

* මේ ඇත් වැනුම බුත් සරණෙහිත් මෙ සේ මැ දිර්ඝ වැ විස්තර වකුදු වෙසකුරු ද සන්නෙහි එන්නේ:

"සියලු ඇත් අලංකාරයෙන් සැදි ඒ පණ්ඩය නම් ඇත් රජහු දන'ග දිනි—"
යනු පමණි.

උන් වන් ඇතු ගත වට කළ ලක්ෂය
රන් වන් කඹය ද රිනද ලක්ෂය
මන් තොස් කළ ඒ දෙක මැ දෙ ලක්ෂය
උන් වන් ගතැ යුතු අකුස දෙ ලක්ෂය

පස්සා ගාතේ දෙක මැ දෙ ලක්ෂය
සොඬ සැරිසු ආබරණ දෙ ලක්ෂය
වල්ගේ සැරිසු 'බරණ දෙ ලක්ෂය
ඇතු බත් කන රත් කටාර ලක්ෂය

ඇතුට නැහෙන රත් හිණ ද දෙ ලක්ෂය
කුඹ තල සැරිසු මැණික් දෙ ලක්ෂය
පිට මැද සැරිසු මැණික් දෙ ලක්ෂය
දෙ කොන සැරිසු මිණි දෙක මැ දෙ ලක්ෂය

කරට බැඳපු මිණි දෙක මැ දෙ ලක්ෂය
සිරසට මුතු කුඩ දෙක මැ දෙ ලක්ෂය
කැරි බැඳි පලසේ රත් පට ලක්ෂය
කර එක ගණනින් සුවිසි ලක්ෂය

මිල නො කළැකි මහ සිවු මිණි 'බරණත්
සුවිසි ලක්ෂෙන් සැදු ආබරණත්
ඉඩ නො හැරි මැ සැරිසු ආබරණත්
නො ගෙනැ මැ දුන්නේ මේ ආබරණත්

පිරි තොස් වඩවන සවන් පිරෙන්නේ
දිරි ගස්වා ඇතු බිමට දමන්නේ
තරු රැස් ගණනක් පිරිවර යන්නේ
ගව වස්සකු මෙන් ඇතු දන් දුන්නේ

මේ විස්තරය අසන ගැමියා ගේ සිත ශ්‍රද්ධායෙන් හා භක්තියෙන් ද බෝධි සත්ත්වයන් ගේ දාන පාරමිතා-වෙහි ඇති මහත්ත්වය කෙරෙහි යොමු වී ආගමය කෙරෙහි ඉමහත් ලැදි බවෙකින් පිරී ඉතිරී යන්නේ යැ-ඇළී ඇතු පමණක් නො වැ ඔහු අබරණ ද පිරිවර ද

දන් දුන් සැටි විස්තර කරන කාව්‍යය තවත් දුරටත් බෝ සතුන් ගේ දාන පාරමිතාවෙහි ඇති ශ්‍රේෂ්ඨත්වය විදහා පෙන්වයි. ඒ විස්තරය අවසන් වන්නේ මෙ සේ යැ:

"පලන් මිණි ආබරණ සුවිසි ලක්ෂයක්
නො ගෙනැ මැ වෙරා
වෙදුන් ගොව්වන් බලන්නන් ඇතු
පන් සියක් පිරිවර කරා
රැවන් හිණ සහ වියන් වටැ තිර
සේ මැ කුඩ කොඩියෙන් සරා
නිවන් දක්නා ලෙසින් බුදු සිරි
පතා දන් දුනි වෙසතුරා

ජාතක පොතෙහි ශාස්ත්‍ර ශතක මහා දානය පිළිබඳ වැ පිළියෙළ කැරැවූ දැ විස්තර කැරෙන:

"ඇතුන් සත් සියයෙකැ, අසුන් සත් සියයෙකැ, රථ සත් සියයෙකැ, සත්‍රීන් සත් සියයෙකැ, දැසින් සත් සියයෙකැ, දැසයන් සත් සියයෙකැ යනාදි සියල්ලෙන් සත් සියය බැහින් ද, නානා ප්‍රකාර වූ ආහාර පානාදිය ද යන දියැ යුතු සියල්ල මැ....."

යන්න කාව්‍යයෙහි දී කවි දෙතිසෙකින් විස්තර විණි. මෙ සේ ජාතක පොතෙහි එන දැ ගැමියන් ගේ අදහසට සරි ලන පරිදි සකසා ඔවුන් සිතැ ප්‍රසාදය දනවන්නට කාව්‍ය කතිකා වැඩි කොටැ ලිවී යැ.

වෙස්සන්තර ජාතකය යන වචනය කියන් මැ අසන්නන් තුළැ නිතැනින් මැ **ඡූජකයා** ගේ ප්‍රවෘත්තිය නැඟී සිටින්නේ යැ. මේ කථාවෙහි **ඡූජක** බමුණා ගේ චරිතය සඳහන් කැරී තිබෙන අයුරැ කොපමණ චිත්තාකර්ෂණීය දැ යි කියන් හොත් ඒ ප්‍රවෘත්තිය නැවැතැ නැවැතත් කියන් මැ අලුත් බවෙකින් ඉදිරි පත් වන්නේ යැ. **ඡූජක** කථාවෙහි ඉතා මත් සිත් ගත්

තැනෙක් නම අමිත්තතාපා බැමිණියට අනෙක් බැමිණියන් බිණූ සැටි සි. එය **ජාතක** කථාවෙහි ද **බුත්සරණෙහි** ද **වෙස්සන්තර** කාව්‍යයෙහි ද එක හා සමාන වැ මැ රසවත් යැ.

ජාතක පොතෙහි එය මෙ සේ එයි:

"එ බස් ඇසූ බැමිණියෝ 'ජූජකයා ගේ හෘදයෙන් අෑ තොර කරම් හ' යි සම්මත කොටැ ගෙනැ, එක් දවසක් **අමිත්තතාපා** නම් බැමිණිය පැන් තොටැ දී දූකැ කියන්නාහු, 'එම්බල පව් කළ තැනැත්තිය, නී දත් හුණු තර මහල්ලකුට මෙහෙ කෙරෙහි ද? මේ කඩ දත් මහල්ලාට නී පාවා දුන් නි ගේ දෙ මවු පියෝ නිට සතුරු වන්නා හ. නී උනට සතුරු වන නියා යැ, අප්‍රිය වන නියා යැ. නී පින් නො කළ තැනැත්තියකැ. නි ගිය ජාතියෙහි නව වක් යාගයෙහි කපුටුවනට ලූ බත් පළමු කොටැ කෑයේ මහලූ කපුටුවෙක් වන. එ සේ හෙයින් වේ ද නී මේ නර මහල්ලාට අඹු වූයේ? යෙහෙළිය, මේ සේ වූ මේ ජර මහල්ලා හා එක් වැ පඤ්ච කාම විෂයයෙහි කවර නම් ඇල්මෙක් ඇද්ද? උඹ කටැ දත් දල්වා ගෙනැ සිනා සෙන වේලෙහි නී සිතට කවර නම් සමාධියෙක් ද? කිඹුල් පිටෙකැ සේ උගේ ශරීරයෙහි ගැටී කවර නම් සමාධියෙක් වේ ද? ගැරඬි සමක් වැනි ඇඟ රැළි ඇති කඩ දත් ඇති කෙළ තොලූ මහලූ බමුණා හා නී ගේ කවර නම් පඤ්ච කාම සම්පත්තියෙක් ද? සොඳුර, නී ගේ කෝමල වූ ශරීරය මිරිකා ඒ බමුණු කතාටුවාට මෙහෙ කොටැ දුක් නො ගෙනැ නි සේ වූ අභිරූප ළඳරු සැමියකු සොයා ගනැ' යි කී හ."

චිද්‍යාවක්‍රවර්තීහු එය මැ **බුත්සරණෙහි** මෙ සේ වනහි:

"එක් දවසක් අමිත්තතාපනා* නම් බැමිණිය තොටැ දී දූකැ, එ ගමැ සෙසු බැමිණියෝ කියන්නාහු,

---

* බුත්සරණෙහි එන්නේ මෙ නම්. එ හෙත් සමහර පිට පත්හි 'අමිත්තතාපං' ද වෙයි.

'පව් කිළිඳ, තෝ දත් හුණු නර මහල්ලකුට මෙහෙ කෙරෙයි ද? මේ කඩ දත් මහල්ලාට නී දුන් නී ගේ දෙ මවු පියෝ නිට සතුරු වත් හ. නී උනට අප්‍රිය වන නියා යැ. තෝ පින් නො කළ පැවැත්-තියක ඔන්දෙහි. නී ගිය ජාතියෙහි කවුඩුවනට පිඬු දුන් කලැ නී ලූ ඔත් කැයේ මහලූ කවුඩුවකු වනැ. එ සේ හෙයින් වද නී මේ නර මහල්ලාට අඹු වූයේ? යෙහෙළි, මෙ සේ වූ මේ ජර හම් මහල්ලා හා එක් වැ පඤ්ච කාම විෂයයෙහි කවර නම් ඇල්මෙක් ද? ඔහු කඩ දත් දල්වා ගෙනැ යෙන වේලෙහි නිට කවර නම් සමාධියෙක් ද? කිඹුල් පිටක් සේ කොර සැඩි වූ උගේ ශරීරයෙහි ගැවී කවර ආස්වාදයෙක් ද? සොඳුර, නී ගේ මොළොක් වූ ශරීරය මිරිකා ඒ බමුණු කනාටුවාට මෙහෙ කොටැ දුක් නො ගෙනැ, නී සේ වූ අඟිරූප වූ ළඳරු සැමියකු සොයා ගනැ'සි කී හ."*

---

* වෙසතුරු ද සන්නෙහි එන විස්තරය, පාළිය අනු වැ මෙයට වඩා දික් යැ:

ඒ ගම්හි ස්ත්‍රීහු දිය ගෙනෙනුවට කොයට ගියාහු ඒ අම්බත තැවිතියට කිවූ හ. ඒ මාගම්හු අතින් කිසිවක් නො කීව හ. කුහුල් ඇතියන් මෙන් පිරිවරා ගෙනැ අ හැව්වා හ. "මේ ලෙස ළඳුරිවූ නී යම් කෙනෙක් ජරාවෙන් දිරා ගිය මේ කඩ දත් මහල්ලාට දුන්හු ද නී ගේ ඒ මව සැතිරියකැයි හඟුම් හ. නී ගේ ඒ පියා සතුරෙකැයි හඟුම් හ. නී ගේ නෑයෝ රහසැ හිදැ අවැඩක් බැණැ ගත් වන් හු. නිට - නො හොබනක් කරම් හ-යි බැණැ ගත් වන් හු. මෙ සේ ළඳුරිවිය, මනා නො වන විසීමක් වෙයෙයි. යම් තෝ මහල්ලා ගේ ගෙයි වෙසෙයි ද, නී ගේ දිවියට වඩා මෙළේ උතුමැ. සිත් හන්නා ශෝභිතිය, මවු පිය දෙදෙන නිට අතින් සැමියකු නො ලද වන් හ යි හඟුමෝ. නී විසින් නවම් යාඟ නො මොනවට පුදන ලදු වන. ගිහි පුජා ද නී විසින් නො කරන ලද. හේ තෝ ලෙව්හි ශ්‍රමණ යැ යි කියන ලද බමුණන් ද බඹ සර රක්නවුන් ද, සිල්වතුන් ද බොහෝ අසූ පිරුවන් ද හැවූ යැ. මේ ඒ පාපයා ගේ ඵල වනැ.

[අනෙක් පිට බලන්න.]

බුත්සරණෙහි එන විස්තරය කියවන්නාට ජාතක පොතෙහි එන විස්තරය ඊට කොපමණ සමාන දැ යි වටහා ගැනීම ඉතා මැ පහසු යැ. මෙ කථාව බුත්-සරණින් ගත් හෙයින් යැ අනෙක් ජාතක කථාවන්හි නැති අනුපම සුන්දරත්වයෙක් මෙහි ඇත්තේ.

මේ විත්තිය මැ කවි පොතෙහි එන අයුරු බලමු:

"මෙ ලෙසින් අහනෝ එක් වෙති සොඳිනේ
කියති නොයෙක් මිහ බස් මේ ලෙසිනේ

'ත ම භිමියන් හට විපත දුකින්නේ
පෙම් ඇති වැ මැ ලද ලිය අහපන්නේ
කිමැ ඇවිදින් අප මැදැ නි ඉන්නේ
පෙම් ඇති රස මුසු බස් තෙපලන්නේ?

ලිල නැති වැ නිසරු වැ තෙපලන්නේ
මහල්ල නුඹ ගේ භිමි ද අසන්නේ?
වාල් තමාවක් ඇද්ද ඉතින්නේ
වාල් විඳින දුක මෙ නුඹ විඳින්නේ?

[li පිට හා සම්බන්ධ යි.]

.....නසින් විසින් බහන ලද්දේ දුස් නොං වෙයි. සැතින් පහරන ලද්දේ දුස් නොං වෙයි. යමන් නොමෝ යම් මහලු සැමියකු දකී ද, දුක් වූයේත් හේ මැ යැ. සැත් පහරට වැඩිත් හේ මැ යැ. ජරාංයෙන් දිරාං ගිය මහලු සැමියා සමඟ කෙළි නැත-නොං හොබී. කාම රති නැත-නොං හොබී. අංදි බිණිමුදු පසු වැ බිණිමුදු නැත - නොං හොබී. කඩ දත් විවර කොටැ සෙන්නඟ ගේ සිනාං ද නොං හොබී. යම් කලෙකැ ළදරැ ළදැරි දෙ දෙන රහසැ ඔදැ ඉප්ත වූ රහස් කියද්ද, එ සඳැ ඒ දෙ දෙනා ගේ ළය ඇසිරැ කළ යම් කිසි ශෝක කෙනෙක් ඇද්ද, ඒ හැම ශෝකයෝ නසිති. තෝ ළදැරියෙනි, රැ ඇතියඟ, පිරිමින් විසින් වෙසෙසින් පතන ලදුවඟ නැණී යං. නැයන් ගේ ගෙහි වස. මේ ජරාංයෙන් දිරැණු බමුණු නී පස් කම් නුණෙන් කෙ සේ සතුටු කෙරේ ද යි කී ඟ".

පෑසී ඉසත් නිකවත් සොඹු අෑකිලේ
ගෑසී කුදත් යන ගමනත් බසලේ
නිසී ද උගෙ වෙතෑ ඉඳිනට මෙ කලේ?
ගෑසී ද බොල නිගෙ දැසට පට ලේ?

කුදේ ගෑසී නෑඟිවින කලෑ වෙවුලා
තදේ කෑසිත් කෑසෑ කෑස පට අකුලා
සොඳේ මදන සැප විඳිනට මෙ කලා?
ළඳේ නිසරු නො කරන් අප සියලා

බඩ වක පිට වක සත් වැරවිල්ලා
දෙ පට කුදු ගැසී වකට කුදුල්ලා
ඉස සේ පුපුරුටි දත් කෑවි තොල්ලා
නිගෙ සෑම් බමුණා කුණු කෙළ තොල්ලා

පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ
පර මල් පිදුවා අෙ පල දුන්නේ?
නර මුල් අෑඟෑ අෑට කිඹුලෙක් වන්නේ
හෑම කල් මළ දු අෙ සැප වන්නේ

ගෑසී වකට කුදු ඉස සේ කුදු රළු
පෑසී නිකට දත් බොල්ලෑ කෙළ තොදු
චෑසී නිබෙන අෑස් බියකර ලන සුදු
නෑසී කුමට ඉඳෑ උගෙ ගෙයි එක් කොදු?

එක මඟෑ යන කල ඔබිනට ඇද්ෙ?
ආනන කලෑ උගෙ කට ගඳ නැද්ෙ?
නී සෑවී බමුණෙ මේ රටෑ නැද්ෙ?
ගෑට කෝනමකුට ඉඳෑ පල ඇද්ෙ?

අ ප මේ ගෑනුන් හැමට මෑ නින් දු
තොප එන්නේ මේ සිත් නපුරෙන් දු?
සෑ ප වින්දේ තා කොසි සැටියෙන් දු?
සි ප ගන්නේ තා කොසි විලසින් දු?

ලස්සෝ ඇත පිනට මෑ නො වෑ ලස්සෝ
නිස්සෝ ඇත පරසිදු නො වෑ වැස්සෝ
උස්සෝ ඇත ගොපුරට සින තොස්සෝ
ඔස්සෝ ඇත ඕ හට නැත සෙස්සෝ'"

බුත්සරණෙහි ආ කථා කවියා නියම සිංහල ගැමි බසින් රසවත් කළ සැටි අති මනෝඥ යැ. ඒ දු ලියූ කවි අද ද අද ඉන්නා ගැමියනට ඔවුන් ගේ මෑ බසින් ලියූ සේ යැ.

අම්බත්තතාපා බැමිණිය එ වදන් අසා රොස් වී ගෙ දොරට ආ සැටි තුන් පොතෙහි මෑ ආ අයුරු කැමරන විස්තරය ඉතාමත් මැ මිහිරි යැ. පෙරැ වූ විස්තරයේත් මතු වන්නෙහිත් ඇති වණ්ණන සුන්දරත්වය තුළැ ගබ් වූ හාස්‍ය රසය කියවන්නන් අසන්නන් සඳිඩහ-යෙහි මැ කා වැදී යන තරම් යැ.

ජාතක පොතෙහි එය මෙ සේ එයි:

> "මෙ සේ ඕ තමා හට පරිභව බණින්නා වූ ගැහැනුන් බලා හඬා වැලැපෑ මියුඹුහුරු ලා, පැනට ගෙනැ හිය කළය ගලැ ගසා බිඳැ පියා, අත පෙරවැ ගෙනැ ගෙට අවුත්, ජූජක නම් බමුණහු ගේ රවුල තරයේ අල්ලා ගෙනැ, බමුණු මාල්ලාට තතනමින්, බෙණෙමින්, දත් කමින්, 'බමුණු මාල්ල, තා සේ වූ කෙළ තොල්ලන් කෙරෙහි උන් විපාක අද මැ ලදිමි. යහ පත් සරණෙකැ යැ මා ආයේ! අද මේ ගමැ දූරියෝ එක් වැ ගෙනැ ලා මා හිසැ බොල් කෙළ ඔත් හ. පැන් තොටැ දී මට උන් නො කළ පරිභවයෙක් නැති. තා කෙරේ හිඳැ මෙ සේ වූ බස් අසන්නාට වඩා, කරැ වැල් ලා ගෙනැ මියැ යෑම යහ පතැ. සිරිඟි කා මියැ යෑම යහ පතැ. වහා පහාස් දුසයකු හෝ දුසියක හෝ ගෙනැ එව. නැත හොත් තා කෙරෙහි නො හිඳැ යෙමි'යි කීවා යැ."

මෙය මෙ සේ **බුත් සරණෙහි** එයි:

> "තමාට පරිභව බණින්නා වූ ගැහැනුන් බලා හඬා වැලැපෑ මියුඹු හුරු ලා, තමා පැනට ගෙන හිය කළය කැටෙකැ පැහැරැ බිඳැ පියා, අත පෙරවැ ගෙනැ, බමුණු මහල්ලාට තතනමින්, දත් කමින්

සාප කොටැ ද බෙණෙමින් ගෙට ගොස් 'බම්මණු මහල්ල, තා සේ වූ කෙළ තොල්ලන් කෙරෙහි උන් විපාක අද ලදිමි. යා පත් සරණෙකැ මා ආයේ. අද මෙ ගමැ සක් දුරියත් එක් වැ ගෙනැ මා හිස බොල් කෙළ ඔනා සේ මට උන් නො කී පරිභවයෙක් නැති. තා කෙරෙහි හිඳැ මෙ සේ වූ බස් අසන්නාට වඩා, කරැ වැල්ලා ගෙනැ මියැ යාම යහපතැ, සිරිඟ කා මියැ යැම යහ පතැ'සි කිව."

මෙය රසවත් ගැමි බසින් කාවෘ කතෘ මෙ සේ පවසයි:

"එ බසට ලජ්ජාවෙන් ළඳ — බැමිණී
අබ සැට ලාසක් පුපුරන — ලෙසිනී
වීළි වැදූ ඉවසා රොස් කොටැ — එසිනී
කළ ගෙඩි බිඳැ ගොස් තම ගෙට — වැදුණී

වෙවුලයි පුපුරයි දත් කයි රොස් — කොට
සුරයි කන් මුල් දෙක අැදූ තර — කොට
නැව් ලයි 'ගිය ගිය නැනැ රවටති — මට
අවුල යි දෙන්නේ මෙ තැනින් — යන්නට'

ක ලේ රැගෙනැ ගොස් ළඳ ලිය — ළි ද වා
ග ලේ ගසා බිඳැ වීළි වැදූ — සි ත වා
කැලේ වසන යක් අඟනක — ලෙ ස වා
එ ලේ අැවිත් අඬ දබරෙට එ — වි වා

මුණ රවා ගෙනැ ගොස් ගෙට — වැදි ලා
සුණ නුල අැදූ දමමින් — බිඳැ ලා
යහනේ උන් බමුණා බිමැ — පෙරැ ළා
බාන ලෙසට අල්ලා ගෙනැ — රැවූ ළා

'කන්සට පාරක් දෙමැ'යි — කියන්නී
'මම බොල තට දර දිය ද — අදින්නී'
කන්නට පැන්නා මෙන් — වැලඹින්නී
කන් කටුවට කරදර — තෙපලන්නී"

කාව්‍ය කතා **ජාතක** පොතේ හෝ බුත් **සරණේ** හෝ ඇති සැටියෙන් මෑ නොගෙනැ සාමාන්‍ය ගැමියාට වුව මනා අයුරු ග්‍රාම්‍ය ව්‍යවහාරයන් ද යෙදීමෙන් තමා ගේ කාව්‍යය කෙළේ යැ.

අමිත්තතාපා බැමිණිය මෙ සේ කීව ද පෙර දිගැ සිරිත වූයේ සැමියන් අතින් බිරියන් මෙහෙ නොගැනීම යැ. ඒ බව දක්වන **වෙස්සන්තර ජාතක** කථාකාරකයා **අමිත්තතාපා** බැමිණිය ගේ මුඛයෙහි මෙ වදන් තබයි:

> " 'අහෝ බ්‍රාහ්මණය, සැමියන් අතින් මෙහෙගන්නා කුලයෙකැ මා උපන්නේ නැති. නපුරු බස් නොකියා දුසියක හෝ දුසයකු හෝ ගෙන එව'යි කිවූ යැ."

විද්‍යාවක්‍රවර්තීන් ගේ කෘතියෙහි වූවාට වඩා ඉතා සල්ප වෙනසක් කොටැ, මහලු බමුණා කෝ **පමණ** අඹු සොඬ දැ යි **ජාතක** කතා පවසන්නේ ලෝකයෙහි සෑම කලෙකැ මැ මහලු පුරුෂයන් අඹු සොඬ බවත් උන් ගෙන් වෙන් වන්නට ඉතා මැත් නොකැමැති බවත් කියන්නාක් මෙන් යැ.

බමුණා වාලක් සොයන්නට යන්නට පෙර හෙ දෙරට දර දිය ආදිය සැපැයූ අයුරුත් බැමිණිය ගෙන් සමු ගත් අයුරුත් ඉතා මැ සිත් ගන්නා සුලු යැ:

> "බමුණු අඹුව කරන ගහට විඳැ ගත නොහී අෑ කෙරෙහි හසින් 'යහ පතැ සොඳුර, වහලක් ගෙනෙ–මි'සි ගිවිසැ, අඹුවට වලින් දර ගෙන' වුත් ගෙය පුරවා, දිය ඇදූ, වළන් පුරවා, ගෙය සිසාරා වැට කොටැ, ඇට බත් බුලත් තබා ලා, අෑ විසින් සපයා දුන් අන් සුනු ආදි මාඝෝපකරණ ද ගෙනැ, ගමනට සැරසී සිටැ, අඹුව පැදකුණු කොටැ තුන් විටක් වැඳැ ලා, පසු බැසැ, සතර තැනෙකැ බැසැ හෙව වැඳැ, අෑ කෙරෙහි කළ හසින් හැකිළැ හැකිළ

පාතැ බැසැ, සිපැ ගෙනැ, නිකට ගෙනැ සනහා, ඇට කියන්නේ, 'සොඳුර මම නො ලස් වැ එමි. තෙපි බිය නො වව'සි සමු ගෙනැ, වහන් සඟලක් පයැ ලා, කඹ මහල්ලක් ගෙනැ, කෙණ්ඩියෙකින් පැන් ගෙනැ, ගමනට ගත් උපකරණ පසිය කරට නඟා ගෙනැ, අඹු ළඳුරි කතුන් පෙරැළි-පෙරැළි සිටැ බලබලා....."

මේ විස්තරය කාව්‍ය කතෘ කී සැටි ඇත්තෙන් මැ සිත් ගන්නා සුලු යැ. බමුණා තම බමුණු උපකරණ හත් සැටි කවියෙහි වඩාත් විස්තර වැ එන්නේ ඒ විස්තරය ගැමියන් ගේ සිත් කා වැදී යන හෙයිනි:

"කියමින් යූජකයා බස් මෙ ලෙසට
නො යන ලෙසින් අත් දේකට වට පිට
දිය දර බත බුලතුත් සැම රැස් කොට
ගේ වටැ වැට කටු බඳිමින් තද කොට

වට පිට දර දිය ගෙට ලවමින්නේ
වට කැරැ වැව බැඳැ කටු අසුරන්නේ
කටු දෙර බැඳැ තද අගුලුත් ලන්නේ
'මට සිතැතොත් ළඳ ඉවත නො යන්නේ'

මෙ ලෙසට බමුණා සිත තෙපලන්නේ
එ බසට 'අැයි මොබ පමා කරන්නේ?
ලොබ කොටැ මා කී දේ විමසන්නේ'
'ඔබ මට යන්නට අවසර දෙන්නේ'

නො ලසින් නැඟි සිටැ එ බසට තුටු කොට
මෙ ලෙසින් සංඟා නිබු දේ රැස් කොට
නො ලසින් බලමින් ඇරැ ගෙනැ එළියට
මේ ලෙසින් සපයසි අඹු වැඩි ගමනට

අත් සුනු මුං සුනු දෙ කඩස් බැඳැ ගනී
තොස් වැ කඩා කටු පූ තනවා ගනී
රැස් කළ තම රෙදි ගණනක් ඇඳැ ගනී
අස් වැ ගොසින් වැඳැ යන්නට සමු ගනී

සම්මත මිරි වැනි දෙසකුත් පයැ ලන
වත් ගණ කොක්කනමක් කරැ ලා ගෙන
දුන් මන පත් කුඩයක් ඉහැ ලා ගෙන
ගිම සනසා යන වටා පතක් ගෙන

කුඩ මිට මැඳැ දිය ලබු එල්ලා ගෙන
බුදිනව දේ ඉන් වටැ පිට බැඳැ ගෙන
සැර යටියත් ඒ නිමිති පොතත් ගෙන
නිමයට යන ලෙස නික්මුණි මෙ ලෙසින

සිදුරැ නැති වැ සියලඟ බඳු පවවා
සොඳුරැ ළඳුන් සිඹැ සනසා තුටුවා
සොඳුරැ ළඳුන් ගේ දුන් දුරැ කැරිවා
වඳුරැ ලෙසින් නික්මුණි කුද අවවා

අත් සුනු ලා ගෙනැ පයි කඩැ රෙද්දේ
දිය ලබ එල්ලා කුඩ මිට මැද්දේ
ඉන් පිටැ ඇඳැ ලා කළු දැ රෙද්දේ
යන්නට නික්මුණි මහ ඉම මැද්දේ"

මෙ සේ කාව්‍ය කතෘ **ජාතක** කථා කතෘවරුන්ට වඩා විචිත්‍ර චිත්‍රයක් තම කව්යෙන් කියවන්නා හෝ අසන්නා හෝ ඉදිරියේ තැබී යැ.

එ කලැ **ළඳුජක** බමුණා මෙ කලැ **දේවදත්ත** සාමිවරයෝ යැ. දේවදත්තයන් කෙරෙහි වූයේ නුගුණ මැ යැ. එ හෙයින් උන් ගේ විරූප භාවය නැවැතැ නැවැතත් කියන්නට අදහස් කළ ජාතක කථා කාරයෝ **ජාලි** කුමාරයන් මුවෙහි ද බමුණා ගේ විකාර රූපය තැබූහ. **ජාතක** පරිවර්තකයා ද, **විද්‍යාවක්‍රවර්ත්තීහු** ද, කාව්‍ය කතෘ ද, **ළඳුජකයා** ගේ විරූප භාවය එක සේ කියන්නා හ. **ජාතක** පොතෙහි ඒ මෙසේ එසි:

"ඒ අවලක්ෂණ බමුණාට අප දන් නො දී අනෙක් බමුණකුට දෙන්නැ. මු ගේ පා බකල යැ, නිය පිරිති යැ, යටට හිලිහී ගිය පිණ්ඩික මාංස ඇත්තේ යැ, දික් වූ නොල් ඇත්තේ යැ, කෙල තොලු යැ, දත් බොලු යැ, බිදුණු නාසා ඇත්තේ යැ, තඹ

වත් දැළි රවුළු ඉස කේ ඇත්තේ යැ, බඩ මහත යැ, වමරැසි යැ, බලල් ඇස් වැනි ඇස් ඇත්තේ යැ, නැමුණු කත් කොරි යැ, ඇඟ රැළි ගැසුණේ යැ, කළු තල කැළැලින් ගැවැසුණු සිරුරු ඇත්තේ යැ, නැමුණු සිරුරු ඇත්තේ යැ, යන එන කලැ හඬ නැගෙන අසථි සන්ධීන් යුත් සිරුරු ඇත්තේ යැ, අමනුෂ්‍යයෙකැ, නොහොත් මිනිස් වෙසින් ආ යක්ෂයෙකැ. මෙසේ අවලක්ෂණ වූ වකුට අපනොදෙත්නැ."

බුත්සරණෙහි එන විස්තරය මෙසේ යැ:

"මෙ අවලක්ෂණ බමුණාට අප නොදී අනෙකක් හට දෙන්නේ. උහු ගේ හිසැ කේ තඹ වනැ, පිඟැසියැ, වමරැසි යැ, බුත් නාසා යැ, කන් රොඹු යැ, දත් බොදු යැ, ඇඟ රැළි යැ, පිටින් වකැ, බඹින් උසැ, බඩ මහතැ, පා බකල යැ, නිය පිරිති යැ. මෙ සේ අවලක්ෂණ වූ යකුට අප නොදෙත්නේ." *

---

* වෙසකුරැඳ සන්නෙහි ජංලි කුමරං බමුණං ගේ අවලක්ෂණ විස්තර කරන්නේ මෙසේ යැ:

"බකල පං ඇතියේ යැ, කුණු නිය ඇතියේ යැ, එ මතු නෙං වෙහි, එලෙස මස් පිඬු ඇතියේ යැ, මුව පියං සිපිනං උඩු තොල් ඇතියේ යැ, වඟ තොලු යැ, (–කෙළ වැගිරෙන මුව ඇතියෙහියේ හි–); උඟරැ දළ මෙන් තිකුත් දළ ඇතියේ යැ, බුත් වක් නංසං ඇතියේ යැ, සැලක් බදු උදර ඇතියේ යැ, බුත් පිවි ඇට ඇතියේ යැ. වැළි දු කියමි: ඉදි බැලුම් නැතියේ යැ (–වමරැසි යැ හි සේ හි–); ලෙංහෙං වත් තඹ දැළි ඇතියේ හි (–රිලවුන් බදු කෙස් ඇතියේ යැ හි සේ හි–); රළු කොහෙ ඇති යේ යැ (–ඔදුබු යහුල් බදු කෙහෙ ඇතියේ යැ හි සේ හි–); ඒළියෙන් ගැවැසී ගිය වෙර සම් ඇතියේ යැ, කළු පැහැ තල කළුයෙන් වැසුණු වෙර ඇතියේ යැ, බලල් ඇස් බදු ඇස් ඇති හෙයින් පිතු ඇස් ඇතියේ යැ, කපිය පිට කදට යන තුන් තෙනෙකින් වකැ, විසුළු පං ඇතියේ යැ (–හඬන සද ඇතියේ යැ හි දු කියත්–); උස් මහත් පලඟ ඇතියේ යැ හි (මේ අවලෙංස් පිරිමිනි දෙස් සුතු); අදුන් දිවි සම් ධැරැයේ යැ; පිරිස්සන් නෙං මිනිසකු වැන්නැ; නෙං මිනිස් ගිය එළවනු යැ. ගිය එළවන මිනිසෙක් දෙහෝ, මස් ලේ බොජුන් කොංවැ ඇති යකෙක් දෙහෝ හි සලකමි....."

කාව්‍ය කර්තෘ එය මෑ මෙ සේ කියයි:

"දූත බැමම බැඳි රළු කම් බලවත්
බූත පිසස් මෙන් ගුණයක් නො මැ දත්
හිත වෙණ්ඩ මරුවකු මෙන් ගුගු රත්
ශ්‍රුතකෂ ගෙ සැටි අසනුය පිය කැත්

ඉස කෙස් පුපුරැවි තඹ රැවුලා යේ
පළල් නළල් අැනි තටිටොලුවා යේ
ඉහිලැ ඉසිරි සිටි ඉස් සොරියා යේ
පිරි කබ හිලි අැස් කඳුළු පුරා යේ

වැහෙන පිරෙන දිය එ කත් කුණා යේ
නාසැ දෙ පිටැ විටි සොඬු වගුරා යේ
නිකට උල් වැ සිටි මුඛ දුළුයා යේ
කෙළ තොලු බොල්ලැ දත් කැටියා යේ

බුලත් නො කා කට කිරි වවුලා යේ
පිටත් අැසිරි සිටි කත් කොරියා යේ
පිට තොල දත් කා බස වෙවුලා යේ
කැඹිත් තද වැ එන මුහ ගැටයා යේ

නහර ඉහිලැ සිටි අැට සැකිලා යේ
කිඹුල් පිටක් වැනි ගත රළුවා යේ
නිබදැ ඉහිලැ සිටි කොරල සමා යේ
බඩ වක පිට වක උදර මොටා යේ

රැදුරැ වියරැ ගුණ අව ගතියා යේ
අැඳි රෙදි කඳ වවැ දගර ගසා යේ
වේයන් කෑ දඹු වැනි කලවා යේ
දණ උතු වාදම දෙ පය කොරා යේ

නැඹුරැ වැ කොරලැති පය බකලා යේ
කෙණඬ ඉදිමී සිටි පය බරවා යේ
නිය පිරිත්ත අැනි පතුල් කුණා යේ
මෙ වැනි ලකුණු අැති එකා යකා යේ

මොහු හැරැ වෙන දත් ගත්තෝ නැද්දෙ?"

ජාතක කථා කාරයා **විද්‍යාවක්‍රවර්තීන්** අනුවැ මැ දෙ දරුවන් බමුණා දුකැ පැලෑ ගොස් සැඟෑවෙන කලැ ඇති වූ බිය මෙ සේ පවසයි:

> "දිවියන් දුකැ මරණ භයින් දිවෙන මුව පොල්ලන් දෙන්නකු සේ ඉඟි කැරි ලා ඉගිළැ, 'බමුණු දුනු බඳවා එන්නේ යැ' යි ආ පසු බලමින් දිවෙන්නාහු, පන් සල පිටි පස්සේ වැදූ භයින් එ තැනැ ද සිටැ ගත නොහී, වන ලැහැබකට වැදූ සැඟැවුණාහු යැ. බැලුබැලූ දිශායෙහි බමුණා දිවැ එන්නා සේ පෙනෙන්නේ යැ. එ තැනත් නොසිටැ 'අනේ නඟඹ, කුමක් කරමෝ දැ?'යි කියමින් කටු වැලින් හිරී ගෙනැ, අඬා දිවෙන්නාහු, සතරැස් පොකුණට වැදූ, 'අපි ඔවුනොවුන් සැඟැවුණු තැන් නොපාමි හ'යි බැණැ ගෙනැ, ඔවුනොවුන් ඇඟැ එල්බැ ගෙනැ, පොකුණැ කර වටක් දියට බැසැ, නෙළුම් පතින් හිස් වසා ගෙනැ, සැඟැවී සිටැ, කන් දී සොල්මන් අසඅසා, 'මැණියන් දැ, – ජයේ රැ දුටු සිනය නපුරැ යි– කී දැ යැ. මැණියෝ – පියාණන් හැරැ බැහැරකට නොයව–යි කිවු යැ. පියාණනට අප බලන්නට පාවා දී ගියෝ යැ. මැණියෝ අප වැලි කෙළිති යි සිතද්දෙ, මෙ වැනි දුක් වූ බව නොදනිද්දෙහෝ? මේ වන දෙවියෙනි, තෙපි අප දෙ දෙනා රැකැ, වහා දිවැ ගොස් මැණියනට කියවු. මැණියන් දුකැ උන් දැ පිටැ ඒ හඬා පියා, උන් දැ කීවා කරම් හ'යි මෙ සේ බැගෑ පත් වැ හඬ–හඬා වෙවුලමින් කර වටක් දියෙහි සැඟැවී සිටිය හ."

මෙකෝ පමණ බියකට පත් වන්නට ඉඩ තැබූව ද දෙ මවු පියනට කී කරැ වීම පෙරැ දිග උතුම් මැ ගුණ–යක් බව පෙන්වන **ජාතක** කථා කාරයා වෙස්සන්තර රජු **ජාලි** කුමාරයාට අඬ ගැසූ වේලෙහි දී **ජාලි** කුමාරයා ආ සැටි විස්තර කරයි:

"බුදු වන ජාතියෙහි රහල් කුමර වන මහ පින් ඇති ඒ ජාලි කුමාරයෝ පිය රජ්ජුරුවන් හඬ අසමින් 'බම්බණා මා දිවි ගනී වා, මා ගැනි කෙරේ වා, ම පියාණන් වහන්සේ හඬ ගෑ හඬ අසා මෙතා-සිටිමි'යි සිතා 'පියාණෙනි'යි කියමින් හිස වසා ගෙනැ සිටි තෙළුම් පත් දුනින් පිරා ගෙනැ දිවැ අවුත්, පියාණන් දකුණු පස ගෙනැ හඬන්නට වන් හ."

සූජකයා ගෙනැ යන දෙ දරුවෝ තමන් ඉදිරියේ දුටු දුටු දෑයට කථා කරති. ගස්, වැලි තලා, ගඟුල් හැලි, කුරුවි කෙවිල්ලන්, ලිය කින්නරාවන්, වන දෙවියන් ආදි සියල්ලනට මැ තමන් ගේ දුක කියා තමන් ගිය මහැ මැණියන් එවන්නට කියති. ඔවුන් ගේ ඒ කථාව ඇසුවන් සිත දුක් ගන්වන සුලු යැ:

"මන හර වූ මල් පිපී සිටුනා වෘක්ෂයෙනි, තොප හා පුරුදු වැ තොප මුල්හි වැලි කෙළෑ, අදින් වියෝ වූ අපි තොප වැඳැ සමු ගනුම් හ. පැහැ-යෙනුදුල වැලි තලාවෙනි, අප දිය කෙළනා මන හර ගඟුල් හැල්ලෙනි, තොප අතින් සමු ගෙනැ මෙහෙයට යෙම් හ. මියුරු ගී නගා හඬන කුරුවි කෙවිල්ලෙනි, අත් නල ගස-ගසා අප ඉදිරියේ නටා බස්නා ලිය කින්නරාවෙනි, අප ගේ මැණි-යනට අප වැඳැ සමු ගත් බව කියවු. අනේ මෙ වනැ දෙවියෙනි, අප හා පුරුදු ඇත්තෙනි, මැණියනට අප අතුල් පතුල් ඉදිමැ යා නොහෙන බව කියවු. අප විඳුනා සුව කියවු. අප ගේ අම්මා එතොත් මෙ මහ ඔස්සේ දුවවවු'සි කියා මෙ සේ හඬමින් වලපිමින්, 'කැටි වැ කෙළනා වන මෘග-යෙනි, සතරැස් පොකුණෙනි, අද තොප හෙන් වියෝ වූම හ' සි කියා සමු දී යෙමින් සිටිය හ."

අන් බොහෝ ජාතක කථාවන්හි මෙන් මැ මෙහි දී ද ක්‍රියෝ බෝධි සත්ත්වයනට උපකාර පිණිස ය එති. බොහෝතන්හි දී උන් ගේ මැ දුකෙකින් සැනැසීම

සඳහා ශක්‍රයෝ උපකාර කරති. [ගුත්තිල ජාතකය බලන්න.] මෙතැනැ දී ශක්‍රයෝ උපකාර වන්නෝ බුදු බව ලබා දීම සඳහා යැ. "දරුවන් දන් දෙන අතර බිසොව එතැනට ගියාහු නම් නපුරැ" යි සිතූ ශක්‍රයෝ දිව්‍ය පුත්‍රයන් තුන් දෙනකු සිංහ ව්‍යාඝ්‍ර වලස් වෙස් ගන්වා බිසොව ඉදිරියට මහ අවුරන්නට යවති. වෙන දු තමා ඉදිරියට දෙ දරුවෝ එති. එ දු උන් නොඅ බැව්නුත් පෙරැ රැ නපුරු සිහිනයක් දුටු බැව්නුත් උනට නපුරන් වුණ හ යි සිතූ බිසොව හඬා වැලැපෙති. ඒ වැලැපීමටත් වඩා කියවන්නා තුළැ නිතැතින් මැ ශෝක උපදවන්නේ වෙස්සන්තර රජු නොබැණැ සිටි විටැ දෙ දරුවනට සැබැවින් මැ නපුරන් වූ හ යි සැක කළ බිසොව ගේ හඬ ගැම යැ. එ සේ හඬා වැලැපැ, "පසළොස් ගවුවක් බද වනයේ සඳ පාතේ තුන් විටක් වට කොටැ බලා" ඇවිදුන් දරු-වන් නොදිටි "මඳු දේවි බළලකු ගත් කිකිළියක මෙන් වෙවුලා හඬා සි සත් නැති වැ හොත් හ." ඒ විස්තරය අසන සැදැහැවතා ගේ ළය කම්පා වන්නේ මැ යැ.

වෙස්සන්තර කථාවෙහි ඉතාමත් මැ සිත් අලවන චිත්‍රයන් නැගෙනුයේ යටැ විස්තර කැරැණු "ජූජක බමුණාට දරුවන් දන් දීමේ වගෙන්" යැ. ඒ චිත්‍රයනට සමාන වූවක් චතීමාන නව කථාවෙකැ හෝ පැරැණි ආඛ්‍යානයෙකැ හෝ දැකීම එ තරම් පහසු නොවේ. දුෂ්ට වූ දෙවිදත්හු ගේ පෙරැ සිරිත ද දුෂ්ට විය යුතු යැ. එ හෙයින් යැ ජූජකයා ගේ දුෂ්ට බවත් ඔහු ගේ විරූප බවත් ඔ තරම් වැනුණේ. බුදු වන කලැ වූ අනෙක් අය ගේ චරිතයන් ද ජාතක කථාවෙහි ආයේ බුදු වන කලැ වූවන් ගේ චරිතයනට අනුරූප වැ මැ යැ. මේ චරිත නිරූපණය වෙස්සන්තර ජාතකයට මැ සීමා වූවෙක් නොවේ. එය සැම ජාතක කථාවකට මැ පාහේ පොදු වූවෙකි.

පැණ නැඟියෑ යුතු නැත් ද ඇත්තේ යෑ. තමා මෑ දනට කැප වූවාට වරදෙක් නැති. එ හෙත් බුදු බව පිරීමට අනුන් දුකට පැමිණෙවීම නම් බෝ සත් ගුණයෙ කෑ සි නො සිතියෑ හැකි. ''අත්තා හි අත්ත-නෝ නාථෝ'' සි බුදුහු දෙසූ හ. මත්තෙහි එ වැනි බුදු කෙනකු වන, බුදු වන්නට සිර අධිෂ්ඨාන ඇති බෝධි සත්ත්ව කෙනකු වන, තමා නො වන, අනුන් වන, අඹු දරුවන් දුකට පත් කොටෑ බුදු බව පැතීම නම් යුක්තියෙක් හෝ සාධාරණ වූ කටෑ යුත්තෙක් හෝ නො වේ. මුදු ලෝ සත්නට මෙත් පැතියෑ යුතු යෑ සි බුදු දහමෙහි යෙසි. එ හෙයින් ''වෙසතුරු රජු ගේ මෙත තම දෙ දරුවන් කරා ද බිසොව කරා ද නො හියේ කුමක් හෙයින් ද?'' සි පැණයක් නැඟියෑ හැකි යෑ. ඇත්තෙන් මෑ බුදු මුවින් නම් ''වෙසතුරු රජු ගේ කැරෑම උසස් වූ බෝධි සත්ත්ව ධර්මයෙක් වී යෑ'' සි පැවැසුණ හ සි සිතා ගැනීම දුෂ්කර කාර්යයෙකි.

එ සේ මෑ තම අඹු දරුවන් ආදීන් පසෙකින් තබා ශත්ත ශතක මහා දානයෙහි දී ඇතුන් අසුන් දෙනුන් කෙ සේ වෙනත්, ස්ත්‍රීන් දාසීන් දාසයන් දන් දුන්නේ මනුෂ්‍යයනුත් බඩු බාහිරාදිය මෙන් සැලැකුණු හෙයින් ද? නැත හොත් ගව මහිෂාදීන් මෙන් සැලැකුණු හෙයින් ද?

වෙස්සන්තර ජාතක කථාවත් **ඡුදිදත්ත** ජාතක කථාවත් මුලින් මෑ අැති වුණු කාලයෙහි, **ඉන්ද්‍ර** දේවයා ඉතා උස් තැනෙක වැජඹුණු හෙයින්, සමහර විටෑ, **ඉන්ද්‍ර** දේවයාට උසස් තැනක් ලැබුණු අනෙක් බෞද්ධ කථාවන් මෙන් මෑ, මේ ජාතක කථාවන් අැති වීමට මූල ස්ථම්භ වූ කථා ද බුදුන් වහන්සේ ගේ කාලයට ඉතා පුරාණයෙහි පටන් පැවැතෑ ආ හ සි හඟිමු. **ඡුදිදත්ත** ජාතකයෙහි ද **ශක්‍ර** පුරයෙහි **වණ්ණාව** කැරෑණේ යෑ. ඡුදිදත්ත කුමාරයෝ සිල් රකින්නට සොමු වුණේ **ශක්‍ර** සම්පත්තිය දැකීමෙන් යෑ. බෞද්ධ පොත පතෙහි **ඉන්ද්‍ර** දේවයා වහරනු ලැබූයේ **ශක්‍ර** නමිනි. ඕහු

ඛමීයෙහි **ඉන්ද්‍රයා** කෙරෙහි වූ දුශ්චරිත **ශක්‍රයා** කෙරෙහි නො වී ය. අහල්‍යාව හා අනාචාරයෙහි හැසිරීමෙන් ඇඟ දහසක් යෝනි ලක්‍ෂණ ලැබූ **ඉන්ද්‍රයා**, පසු කලෙක ඒ යෝනි ලක්‍ෂණ නේත්‍ර බවට පෙරළා ගත්තේ ය. **ශක්‍රයා** කෙරෙහි වූයේ දහසක් නුවණැස් ය. දහසක් නුවණැස් ඇති **ශක්‍රයා** බොඬ **ජාතක**-කථාවන්හි, ලොව ගුණවතුන් හට දුකක් වූ කලා, තම පඬු ඇඹුල් සලසුන හුණු වීමෙන් ඒ දැනැ, ලොවට අවුත් ගුණවතුනට උපකාර කෙළේ ය. **කුස ජාතක**-යෙහි ආ **කුස** කුමාරයනට බිරියක් සොයා ගන්නට හෙ තෙමේ අඟට වංක මාණික්‍යයක් උන් උරැ පැලැඳැවී ය. **වෙසතුරු** රජුනට උපකාරයට ආයේත් **ශක්‍රයා** ය. මනෝ ප්‍රණිධානයෙහි මුල පිරීමෙහි දී මවූ තම කරින් ඔසොවා ගෙනැ සයුර පිහිනූ බෝසතුනට බුදු වීමේ මුල් සිත ඇති කැරැවූයේ ශුඛාවාස මහා බ්‍රහ්මයෙකි. බුදු වූ කලා දහම් නො දෙසා නිහඬ වැ උන් බුදුන් ගේ සිත තම සිතින් දැනැ දහම් දෙසන්නට බුදුන් උනන්දු කැරැවූයේ **සහම්පති** බ්‍රහ්මයා ය. "ඒ කථා ලියැවෙන කලැ එක්කෝ බඹ යැදුමට මුල් නැනෙක් වී, එසේ නැත, ඒ කථා මුලින් මැ ඇති කලෝ බමුණෝ ය. එසේත් නැත භික්‍ෂු භාවයට පත් බ්‍රාහ්මණයෝ තමන් මුලින් දත් බමුණු දහම් අමතක නො කරන්නට තරම් බමුණු මතෙහි පිහිටා සිටියෝ ය. **වෙසතුරු** ආදි කථා කළ අය එක්කෝ **ඉන්ද්‍ර** දේවයාට ගරු බුහුමන් දැක්වූ අය වූ හ. එසේ නැත **ඉන්ද්‍ර** දේවයාට යැදුම් කරන සමයයෙකැ දී මුලින් මැ ඒ කථා ව්‍යවහාරයට ආ ය. මෙහි බ්‍රහ්මයා ලෙස් නැන ගත්තේ **ඉන්ද්‍ර** දේවයා හෙවත් **ශක්‍රයා** ය. බුදු වන්නට වර දෙන්නේ **ශක්‍රයා** ය. "එ බැවින් වර අවත් ගනුව" සි **වෙසතුරු** තවුසනට **ශක්‍රයා** කීවෙන් වර ගන්නා බෝසත්හු මෙසේ කියති:

"..... මෙසින් චුතව ඇ ගොස් තුසි පුරයෙහි උපන්නෙම විශේෂ වූ දිව්‍යාත්ම භාවය ඇති වෙම් වා. ..... ඒ තුසි පුරයෙන් සැව මිනිස් අත් බවට පැමිණියෙම් නැවැතැ තුපදිම් වා, හෙවත් සර්ව්‍වඥතා ඥානයට පැමිණ, කෙළවර කිවන් දකිම් වා."

ජාතක කථා කාරයා ඊට පසු මෙ සේ කියයි:

"මෙ සේ ඒ දවස් වර දී **ශක්‍ර දේවේන්ද්‍ර** තෙමේ දෙව් ලොවට ම ගියේ යැ."

සර්ව්‍වඥතා ඥානයෙන් මතු බුදු වන බෝ සතුනට බුදු වන්නට වර **ශක්‍රයා** ගෙන් ලැබීම බුදුන් ගේ ඇති ශ්‍රේෂ්ඨත්වයට ගසන මහත් පහරක් සේ සිතිය හැකි. පුරාණයෙහි වූ **ඉන්ද්‍රාදි** දේවයන් ගේ කථා බුදු දහමට මේ අයුරින් ඇතුළත් කළෝ, **ශංකරාචාර්‍යයා** මෙන් ම "ප්‍රච්ඡන්න බෞද්ධ" වැ, නැවැතත් හිඳු ධර්මයට මුල් තැනක් දෙන්නට අදහස් කොළෝ යැ.

වහල් වෙළෙඳුම පැවැති කලෙකැ මැ **වෙස්සන්තර** කථාව ඇති වූ බව තව තවත් ඔප්පු කරන්නට මෙන් **ජාලි – කෘෂ්ණාජිනාවන්** ගේ වටනා කම, **වෙසතුරු** රජහු, නියම කොටැ මැ, උන් දන් දුන් හ. ඒ සේ මැ තමන් වහල් බව **ජාලි – කෘෂ්ණාජිනාවෝ** දන් හ. ඒ හෙයින් **ජාලි** කුමාරයෝ මෙසේ කීහු:

"බම්මණුන් ගේ ගැත්තෝත් රජ දරුවන් බැරි හිඳිද්ද?"

තමන් ගේ වටනා කම් පවසන්නා වූ ජාලි කුමාරයෝ මෙ සේ ද පැවැසූ හ:

"දේවයන් වහන්ස, මා දන් දෙන්නා වූ පියාණෝ නිස් දහසක් අගය කොට දුන් හ. නැඟණියන් දන් දෙන්නා වූ පියාණෝ අත් අස් ආදි සියල්-ලෙන් සියය සියය හා බරේ බර වස්තු අගය කොටැ දුන් හ."

දරුවන් දැන් දෙන කලු ඔවුන් තම සිතින් අස් කොටැ මැ දැන් දුන් දැයි සිතීම උගහට යැ. නැවැතත් දරුවන් හට ගැලැවී යන්නට ඉඩක් ඇති කැරැවීම අදහස් කොටැ ගෙනැ මෙන් යැ, උන් ගේ වටනා කම් මිල නියම වුණේ. එ සේ මැ වෙසතුරු රජු තව මැ ලොවුතුරා බවට නො පත් බව අභවනු වස් ජාතක කතීෘ මෙ සේ ද කියයි:

> "බෝධි සත්ත්වයෝ මද්‍රී දේවි හොත් විලස් බලා ළය සකියවා, 'මේ වෙනෙහි මා ගේ නැ කෙනෙක් නැත, තෙපි වනාන්තරයෙහි මළහු දැ?' සි කියා, සිත් කළඹා ශෝක පත් වැ, නුවණින් ශෝක දුරැ කොටැ, නෙළුම් පොකුණට ගොස් දිය ගෙන-'වුත්, සත් වසක් විසූ බ්‍රහ්ම චරියෙන් සත්‍ය ක්‍රියා කොටැ, බ්‍රහ්ම චරියෙහි ඇල්මක් නො කොටැ මද්‍රී දේවීන් හිස බර පිටැ තබා ගෙනැ, පියුමක් වැනි අත්ලෙන් ළය අත ගගා, මුහුණට දිය ඉසැ, අතින් ලෙහි දිය ගසා සිහන්නාහු, 'සිවි රටැ හෙවැ මියැ හියෝ නම් මහත් රජ පෙරහරින් දවන්නා හ. හුදෙකලා වැ මේ වෙනෙහි කුමක් කෙරෙම් දැ?'සි සිතා මහත් වූ ශෝකයෙන් තැවි-තැවී-හුන් හ-"

ජාතක කාරක කාලයෙහි ජාති මානය නො ඉක් මැ පැවැති බව:

> "සිවි රටැ හෙවැ මියැ හියෝ නම් මහත් රජ පෙරහරින් දවන්නා හ. හුදෙකලා වැ, මේ වෙනෙහි කුමක් කෙරෙම් දැ?'සි සිතා මහත් වූ ශෝකයෙන් තැවිතැවී හුන් හ"

යනුවෙන් පැවැසෙන්නේ යැ. ඒ ජාති වාදය තව තවත් තහවුරු කරන්නට මෙන් මෙ සේ ද එසි:

> "ඉක්බිත්තෙන් ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ සිතන්නේ, 'බෝධි සත්ත්වයෝ තමන් ගේ දරු මද දෙනා බමුණාට දන් දුන් හ. බිසොවුහුදු යම් කිසි ඕන පුරුෂයකුට දන් දුන හොත් නපුරැ'සි සිතා....."

එ සේ ම, **වෙසතුරු** රජුන් දන් දුන්නේ තමන් තුළ, නිතැතින් ම, හට ගත් දැන චේතනායෙකින් ද එ සේ නැත හොත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් කවරදුත් කරන "පින් දීමට" රැවැටී ද යනු තෝරා බේරා ගැනීම උඟහට යැ. එ කල, පූජකයෝ බමුණෝ යැ. දක්ෂිණාභියෝත් ඔහු යැ. දන් ලැබියැ යුත්තෝත් ඔහු යැ. එ හෙයින් අළි ඇතු දන් ඉල්ලන්නට ආවෝත් බමුණෝ යැ. බමුණන් ගේ ආශීර්වාදයට **වෙසතුරු රජහු** රැවැටුණේ ද? සි පැනයක් ද නැඟියැ හැකි යැ. ඇතු දන් ඉල්ලා බමුණන් ආ සැටි **ජාතක** පොතෙහි එන්නේ මෙ සේ යැ:

> "රජ්ජුරුවෝ දකුණු දිගැ වාසල් සමීපයෙහි සිටි බමුණන් අට දෙනා දැක, උන් දිශාවට ඇතු මෙහෙයූ හ. බමුණෝ අට දෙන අත් නහා සිටැ, **'ජයතු භවං වෙස්සන්තර මහාරාජ'** සි ආශීර්වාද කොටැ සිටියා හ. රජ්ජුරුවෝ 'මේ බමුණෝ මද දෙයක් නො ඉල්ලති සි' ඇතු ආසන්න කොටැ, 'බමුණෙනි, තොප කැමැත්තක් ගනුව' සි කී හ. එ කල, බමුණෝ කියන්නාහු, 'සියලු සත්වයනට මවු පියන් බඳු වූ රජ්ජුරුවෙනි, තොප නැඟි තෙල ඇතු අපට දන් දෙව' සි කී හ."

ඉතා සූක්ෂ්ම වැ බමුණනට දුන් පහරක් ද මෙහි එන බව සඳහන් කළ යුතු යැ. එය **ජාතක** කථා කාරයා මෙ සේ කී යැ:

> "ඉක්බිති ඒ බමුණෝ දකුණු දෙරැ දී ඇතු ලදින් ඇතු පිටැ නැඟි, මහා ජනාකීර්ණ වූ රාජ වීථියට බට හ. නුවර වාසී මහා ජනයෝ කියන්නාහු, 'එම්බා බ්‍රාහ්මණයෙනි, අප ගේ ඇතු නැඟී තෙපි කොහි ගෙනැ යෙවූ ද?' සි කීවාහු යැ. බමුණෝ කියන්නාහු, 'වෙස්සන්තර මහ රජහු විසින් අපට ඇත් දෙන ලද්දේ යැ. තෙපි කවරහු ද? කෙ සේ වළකවු දැ?' සි හස්ත විකාර මුඛ විකාරාදි උසුළු විසුළු කොටැ බැණැ ඇතු නැඟි ගෙනැ ගිය හ."

සෙනඟවයන් සතර දෙන ඉල්ලන්නට අා බමුණෝත් "පින්වත් වූ රජ්ජුරුවෙනි" යි ඉදිරියට අවුත් රජ්ජුරුවනට ආශීර්වාද කොටැ සිටිය හ. **ජූජක** බමුණා ද දරුවන් දන් ඉල්ලන්නට පෙරැ වෙසතුරු රජුන් සිත් ගත් හැටි මෙ සේ විස්තර වන්නේ යැ.

> "උන් පසු පස්සෙහි බමුණු අැවිත් බෝධි සත්වයන් දැකැ ස්තුති කොටැ අසන්නේ, 'ශ්‍රීමත්නි, තොප ශරීරයට සැප ද? මැසි මදුරුවන්, සිංහ ව්‍යඝ්‍රයන් යක්ෂ ප්‍රේතයන් ගෙන් දුක් නැද්ද? වන මුල් ඵලාඵල ලැබේ ද? තපසට අන්තරාය නැද්ද? දනට බාධා නැද්දැ?' යි අැසි යැ..... .....මහ බෝසතාණෝ 'තා අා කරුණු කිම් දැ?' යි බමුණා විචාළ හ. බමුණු කියන්නේ, 'මහා පුරුෂය, යම් සේ පඬුව මහා ගඞ්ගායෙහි ජල ස්කන්ධය කෙතෙක් දෙන අැද්ද බී පුවත් සදා මැ ක්ෂය නො වේ ද, එ මෙන් ශ්‍රද්ධා ජලයෙන් පිරුණා වූ, සියලු යාචකයන් ගේ සිත් පුරවන උත්තමයකු වූ නුඹ වහන්සේ ළඟට අනෙක් වැඩ කට යුත්තකට අායෙම් නො වමි. ඔබ ගේ දරු දෙ දෙනා ඉල්ලා අාමි' යි කී යැ."

බෝ සතාණන් මහා දුන සියල්ලක් මැ දුන්නේ බමුණනට බව ඔප්පු කරන්නට මෙන්, බමුණකු විසින් මිසැ මහා දුනයක් ගන්නට අන් අය නො සමත් බව පෙන්වන්නට **ශක්‍ර දේවේන්ද්‍රයා** දන් ඉල්ලා අායේන් බමුණු වෙසෙකින් යැ. හෙ තෙමේ ද:

> "රජ්ජුරුවෙනි, ඔබ ගේ සුව දුක් කෙ සේ ද? යැපෙන පමණ අාහාර ලැබේ ද? වන මුල් ඵලා ඵල ලැබේ ද? මැසි මදුරු අාදීන් ගෙන් උපද්‍රව නැද්දැ?" යි

අැසුයේ බමුණු දහමෙහි වූ සේ ක්ෂත්‍රියයන් ගේ සිත් ගන්නට පෙර වදන් කීමෙනි. බමුණන් දක්ෂිණාහී බව පැවැසෙතත්, ක්ෂත්‍රියයන් බලවත් වැ සිටි බව මැ

පැවැසුණේත්, බමුණන් විසින් යටහත් වැ ක්‍ෂත්‍රියයන් සිත් ගැනෙනා සේ කථා ලියැවුණේත්, සිද්ධාර්ථ කුමාරයන් උපත් ක්‍ෂත්‍රිය වංශය ආරක්‍ෂා කරන සේ වන්නට ඇත.

යටැ කී දෙස් මෙහි දැක්වුණේ **ජාතක** කථා කතීන්ගේ වත් බුද්ධ ධර්මයෙහි වත් දෙසක් දැක්වීම පිණිසැ නොවේ. ඒ අබෞද්ධ තත්ත්වයක් මෙ **ජාතක** කථාවලත් එ වැනි වෙනත් තතු අනෙක් සමහර කථාවලටත් ඇති වීමට හේතුවනම්, ඒ කථා මුලින් මැ ලියැවුණු කාලයෙහි ඇති වූ සමාජ තත්ත්වයන් ඒ ඒ කථාවනට ඇතුළත් වීම සි. මුලින් මැ දැන්වුණු සේ **ජාතක** කථා **ත්‍රි පිටකයේ** නොවෙයි. ඒ වැනි මැ කථා ලෝකයේ නානා රටවලැ නානා ජාතීන් අතරැ ව්‍යාප්ත වැ තුබූ බව ද පෙරැ සඳහන් විණි. **ජාතක** කථා පැරැණි ද, එ සේ නැත, එ වැනි වූ අනෙක් කථා පැරැණි දැ සි අපට තීරණයකට පැමිණෙන්නට නොහැකි යැ. අපට කිය හැක්කේ ඒ ඒ **ජාතක** කථාවත් මුලින් ලියැවුණු කාලයේ සමාජ චාරිත්‍ර චාරිත්‍ර ඒ ඒ කථාවන් හා මිශ්‍ර වූ බව පමණි. **වෙස්සන්තර** කථාව මුලින් මැ වූ කාලයෙහි ස්ත්‍රිය ගේ ද පවුලේ දූ දරුවන් ගේ ද තත්ත්වය පහත් තැනෙකැ තුබූ බව අඹු දරුවන් දන් දීමෙන් පැනේ. එ සේ මැ වහලුන් සිටි බව ද පෙරැ දැන්විණි. එ කලැ, අඹු දරුවන් ගත් පහත් තැන නිසාත් වහලුන් සිටි නිසාත් මේ කථාවෙහි අබෞද්ධ වූත් අමෛත්‍රී සහගත වූත් කරුණුවලට ප්‍රධාන තැනෙක් වූයේ යැ. ප්‍රදූමය කථාවෙහි එ වැන්නක් වීම නොවේ. ධර්මය උගතුන් විසින් ද මෙ වැනි **ජාතක** කථා ධර්ම කථා අතරැ උසස් තන්හි තැබීම යැ. සැකෙවින් කියතොත් මුළු **ජාතක** පොතින් මැ **බුදුන්** වහන්සේ විසින් ඉදුරා මැ දෙසන ලද අනාත්ම වාදයට ඉමහත් පහරෙක් වැදෙන්නේ යැ. ජාතියෙන් ජාතියට යන්නා වූ ප්‍රද්ගලයකු නැති යැ සි දේශනා කරන්නා වූ **බුදුන්** වහන්සේ මැ "**වෙස්සන්තර** රජ්ජුරුවෝ නම්

නි ලෝ ගුරු සමෘස් සම්බුදු රජ වූ මම මෑ වේ දැ" යි තමන් වහන්සේ දක්වා වදුළ සේකැ. එ වැන්නස් බුදුන් වහන්සේ විසින් කියන ලද්දේ යැ යි බුඩිමස් ආගමය දත් බෞඩයන් විසින් නම් සිතනු නොලැබෙන්නේ මැ යැ.

යටැ කියන ලද දුර්ලභ කම් පැනෙනුයේ බුඩාගමය දෙස නැණැසින් බැලූ විට යැ. එහෙත් සාහිත්‍ය ග්‍රන්ථයස් දෙස බලන අැසෙකින් **වෙස්සන්තර ජාතකය** දෙස බලන්නා වූ අපි එහි අැති වර්ණන සෞන්දර්යයෙන් මත් වන්නමු. නැවැතැ නැවැතත් කියුව ද රස නො අඩු වන බසෙකින් ඒ ලියැවී අැති. **වෙස්සන්තර** කථාව ගැමි පැදියට නැඟී බහුතර ජනයා අතර ප්‍රචාරය වූයේත් **ජාතක** කථාවෙහි අැති ආකර්ෂණීයත්වය නිසා යැ. වර්තමාන නව කථාව යුරෝපයෙන් ආ හසි කියන්නෝ **වෙස්සන්තර** කථාව බලත් වා.

බට ඟිර නව කථාව අනුවැ ලියැවුණු උසස් යැ යි සම්මත ප්‍රේම කථාව ද, එසේ නැත හොත් සුගම සරල චිත්‍රයෙන් අසන්නත් කියවන්නත් හදු විසිවිද යන, බටඟිර නව කථා කාරයත් නව කථා ලියන්නට පෙරැ අැතිවූ **වෙස්සන්තර** කථාව වැනි දීර්ඝ වර්ණයේ ජාතක කථාව ද, **සිංහලයාට** වඩා ආනන්දය දනවන්නේ, **සිංහලයාට** පමණස් නො වැ **සිංහල** බස දන්නා කාටත් සිතෙහි වඩා ලා මැ ප්‍රීතියස් දනවන්නේ, යනු **වෙස්සන්තර ජාතකය** කියවන්නන් විසින් මැ නිරණය කැරැ ගත හැක්කේ යැ. හැම දෙයස් මැ බට ඟිරින් අවුත් අප ශිෂ්ට කළ හ සි කියන්නවුනට දවසැ දෙ වේලේ කියවන්නට දියැ යුතු හොඳ මැ පොත **වෙස්සන්තර ජාතකය** යැ යි අපි කියමු.

වෙස්සන්තර ජාතකයෙහි රසවත් බව ආයේ පරිවර්තකයා ගේ මැ සපත් කමෙකින් නොවැ **විද්‍යාවක්‍රවර්තින්** ගේ වර්ණන ශක්තිය හා රචන ශෛලිය ද නියා යැ සි හඟිමු. සිංහල **පන් සිය පනස් ජාතක පොත, විද්‍යාවක්‍රවර්තිනට** පෙරැ වූ හ සි සමගරුන් කියතුදු, **බුත් සරණෙහිත්, පන් සිය පනස් ජාතක පොතෙහිත්,** භාෂාව සසඳා බලන කලැ, **බුත් සරණ** දෙ වැනි පොතට පෙරාතු වැ, **සිංහලය** වඩා ශක්ති සම්පන්න වූත් සුබ නම්‍ය වූත් කාලයෙකැ ලියන ලද හ සි අපක්ෂ පාති විචාරකයනව කියැ හැක්කේ යැ.

විද්‍යාවක්‍රවර්තින්, පන් සිය පනස් ජාතක පොතින් වෙස්සන්තර ජාතකය ඇරැ ගෙන ලියන ලද හ සි සමහරුන් සිතතුදු, **ජාතක පොතෙහි** එන අනෙක් කථාවන්හි නැති සුන්දරත්වයකුත් ලාලිත්‍යයකුත් **වෙස්සන්තර ජාතකයෙහි** ඇති හෙයින් ඒ කීමෙහි සත්‍යතාවෙක් ඇද්ද? සි සැක කට යුත්තේ යැ. **පන් සිය පනස් ජාතක** යෙහි එන අනෙක් කථාවන්හි භාෂායෙහි ඇති දුර්වල කම් **වෙස්සන්තර ජාතකයෙහි** නො පෙනෙන්නේ යැ. මෙහි වූ වර්ණන සුන්දරත්වය ද වෙනත් තන්හි නැත්තේ යැ. භාෂා ප්‍රයෝග ද වඩා පැරණි යැ. එ හෙයින් අප විසින් බැසියැ යුතු නිගමනය වෙනස් වියැ යුතු යැ. **පන් සිය පනස් ජාතකය** ලියැවෙන්නට පෙරැ ද **ජාතක** කථා සිංහලයන් අතරැ ජන ප්‍රිය වූ බව මුලින් සඳහන් වුණේ යැ. වී ඇත්තේ මෙ සේ යැ— වඩා ජන ප්‍රිය වූ ජාතක කථාවන් අතරැ **වෙස්සන්තර ජාතකය** උසස් මැ තැනක් ගත් හෙයින්, **විද්‍යාවක්‍රවර්තිනු** "කරුණාවට හේ වූ, දහමට ළඟ ඇති, අසන්නන් කන්හි අමා නමන මධුර ධර්ම දේශනා ඇති,..... ඒ සවාමි දරුවන් වහන්සේ විසින් අතීත කාලයෙහි කළ දානමය ප්‍රණ්‍ය ක්‍රියායෙන් යුක්ත **විශ්වන්තර ජාතක කථාව**"* ගෙනැ හැරැ දක්වා "..... 'දෙව් ලොව

---

*බුත් සරණ.

ගිය ඒ මහතාණන් සරණ යෙමි' සි බුත් සරණ යා යුතු" * සි තම කෘතිය අවසන් කළෝ, ව්‍යවහාරයෙහි වූ වෙස්සන්තර ජාතක කථාව තමන් ගේ උසස් මැ ගතෙහි අවසානය, කියවන්නන් සිත්හිත් අසන්නන් කන්හිත් "අමා නමන" * සේ විශිෂ්ට චිත්‍රයක් කොටැ දක්වනු පිණිස යැ.

ලයනල් ලොකුලියන

55–4–12.

මොරටුවේ,
ලක්‍ෂපතියේ,
ක්ෂේත්‍රාරාම මහා විහාර පාරෙහි පිහිටි
අඬක 19 දරන "ප්‍රේම නිවසෙහි" දී
ලියැවුණේ යැ.

* බුත් සරණ්

2

භූරිදත්ත ජාතකය

භූරිදත්ත ජාතකය

1. වර්තමාන කථාව.

එක් සමයයෙක්හි ශාක්‍ය කුල ප්‍රිඛ්‍යාත වූ නී ලෝහුරු සමයක් සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර නිසා ජේතවන මහා විහාරයෙහි වාසය කරන සේක්, පෙහෙවස් විසූ උපාසක වරුන් අරභයා මේ ජාතකය වදාළ සේකැ.

2. කෙසේ දක්ෂත්? ඒ උපාසක වරු පොහෝ දවස් උදැසනැ මැ පෙහෙවස් ඉටා දන් දී, වළඳා ඉක්බිති, ගඳ දුම් මල් පහන් ආදිය ගත් අත් ඇති වැ ජේතවන විහාරයට ගොස් බණ අසන වේලෙහි එකත් පස් වැ හුන්නාහු යැ. එ කල්හි බුදු රජාණන් වහන්සේ ධර්ම සභා මණ්ඩපයට වැඩැ, පනවන ලද බුද්ධාසන මස්තකයෙහි, යුගඳුරු මුදුනෙහි සහස්‍ර රශ්මීන් බබලන්නා වූ බාලාර්ක මණ්ඩලය මෙන් නීල පීත ලෝහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර යැ යි කියන ලද ඡබ්බණ්ණ බුද්ධ රශ්මි මාලාවන් විහිදුවමින් දිලිහිදිලිහී වැඩැ හිඳැ භික්ෂු සඞ්ඝයා වහන්සේ බලා වදාළ සේකැ. භික්ෂූන් වහන්සේ ප්‍රධාන කොවැ ඇති සිවු වණක් පමණ් අතුරින් යම් කෙනකුන් අරභයා ධර්ම කථාවෙක් උපදී නම්, ඔවුන් හා සමග සම්බුදුරජාණන් වහන්සේ කථා කරන සේකැ. එ සේ හෙයින් "අද උපාසක වරුන් අරභයා පූර්ව චරිත ප්‍රතිසංයුක්ත වූ ධර්ම කථාවෙක් උපදනේ යැ" යි දැනැ, උපාසක වරුන් හා සමග කථා කරන සේක්, "උපාසක වරිනි, පෙහෙවස් විසූ දැ?" යි විචාරා, "එසේ යැ, ස්වාමීන් වහන් සැ" යි දැන්වූ කල්හි, "යහ පත උපාසක වරිනි, පෙහෙවස් වසන්නා වූ තොප හැම විසින් කළ සේ ඉතා යහ පත් වන්නේ යැ. එ තෙකුදු වුවත් තෙපි හැම මා බුදු වූ අවවාද දායක වූ

සම්භෘ කෙනකුත් ලැබෑ පෙහෙවස් වසන්නාහු වූ නම්, ඒ තෙමේ ආශ්චර්‍ය නො වන්නේ යැ. පුරාතනයෙහි නුවණැත්තෝ අවවාද දුයකවූ කිසිම් ආචාර්‍ය වර කෙනකුත් නැති වැ, මහත් වූ යසස් හැර පෙහෙවස් වුසුවෝ මැ වේ දැ"යි වදාරා, මුවින් නො බැණී වැඩ හුන් කල්හි, ඒ උපාසක වරුන් විසින්, "ස්වාමීනි, දැන් අප බොහෝ දෙනා පෙහෙවස් රක්‍ෂා කරන නියාව සියල්ලනට මැ ප්‍රකාශ යැ. අනිතයෙහි නුවණැත්තන් අවවාද දුයකවූ කිසි මැ ආචාර්‍ය වර කෙනකුත් නැති වැ සිව් බුදුන් කල්පනා කොටැ මහත් වූ යසස් හැර උපෝෂථ ශීලය රක්‍ෂා කළ නියාව භවාන්තර ප්‍රච්ඡන්න හෙයින් අප්‍රකාශ යැ. ඒ ප්‍රකාශ කොටැ වදාළ හොත් යෙහෙකැ"යි ආරාධිත වූවාහු ඉකුත් වත් දක්වා වදාළ සේකැ.

2. බ්‍රහ්මදත්ත කුමරු තපසට යෑම.

3. යටැ ගිය දවසැ **බරණැස්** නුවර **බ්‍රහ්මදත්ත** නම් රජ්ජුරු කෙනෙක් දහැමින් රාජ්‍යය කරන්නාහු, පුතණුවනට යුව රජ තනතුරු දී උන් ගේ මහත් වූ යස පිරිවර දැකැ, "මා ගේ රාජ්‍යය හැර ගනිත් දෙහෝ?"යි උපන්නා වූ සැකයෙන් "පුත තෙපි මේ නුවරින් නික්මැ යම් තැනෙක් තොපට අභිප්‍රාය වී නම්, එ තැන්හි වැස, මා ගේ ඇවැමෙන් අවුත් කුල සන්තක වූ රාජ්‍යය ගනුව"යි කී හ. ඒ රාජ කුමාරයෝ "යහ පත ස්වාමීනි"යි කියා පිය රජ්ජුරුවනට ප්‍රතිවචන දී වැඳැ සමූ ගෙනැ නුවරින් නික්මැ, ක්‍රමයෙන් යමුනා නම් ගංගාවට ගොස්, යමුනාවටත් සමුද්‍රයටත් පර්වතයටත් අතුරෙහි පන් සලක් කොටැ ගෙනැ, වන මුල් වන ඵලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නා හ.

4. එසමයයෙහි, සමුද්‍රයෙහි පිහිටියා වූ නාග භවනයෙහි වසන්නා වූ මලා වූ වල්ලභයන් ඇති එක් නාග මානවකාවක්, අභ්‍ය වූවන් ගේ සම්පත් හා යසස් ද බලා, කෙලෙස් නිසා නාග භවනයෙන් නික්මැ සමුද්‍ර තීරයෙහි අැවිදිනී, රාජ කුමාරයන් ගේ පියවර සටහන් දැකැ,

පදානුසාරයෙන් ගොස් ඒ පත් සල දුටුව. එ කල්හි රාජ කුමාරයෝ ඵලාඵලයට ගියා හ. ඒ නාග මානවිකා පත් සලට වැදුණා, දඹු මැස්සත් සෙසු තවුස් පිරිකරත් දැකැ සිතන්නී, "මේ එක් තපස්වී කෙනකුත් වසන තෙනක් වනැ. එ සේ හෙයින් ඒ තපස්වී සැදැහැයෙන් පැවිදි වූයේ දෙහෝ, නොහොත් රටින් නගන ලදු වැ පැවිදි වූයේ දෙහෝ යි පරීක්ෂා කෙරෙමි. ඉදින් සැදැහැයෙන් පැවිදි වූයේ නම්, නෛෂ්ක්‍රම්‍යයෙහි ආලය ඇත්තේ වී නම්, මා විසින් සරසන ලද යහන නො ඉවසයි. ඉදින් පඤ්ච කාමයෙහි ඇලුණේ වී නම්, සැදැහැයෙන් මහණ නුවූයේ නම්, මා ගේ යහනෙහි සැතැපෙයි. එ කල්හි, ඒ තපස්වීන් මට සවාමී කොටැ මෙහි මැ වෙසෙමි" යි සිතා, නාග භවනයට ගොස්, දිව මල් හා දිව සුවඳ ද ගෙන'වුත්, මල් යහන් සරහා පත් සල මුළුල්ලෙහි සුවඳ මල් තනා, සුවඳ මල් විසුරුවා, පත් සල සරහා, නාග භවනයට ගියා යැ.

5. රාජ කුමාරයෝ සවස් වේලෙහි අවුත් පත් සලට වන් තෙනැත්තෝ, ඒ ක්‍රියාව දැකැ, "මෙ යහන කවුරුන් විසින් සරහන ලද්දේ දෙහෝ?" යි සිතමින් ඵලාඵල අනුභව කොටැ, "මල් සුවඳත් ඉතා යහ පත් නියා යැ. ඒකාන්තයෙන් යහ පත් කොටැ යහනත් පණවන ලද්දේ යැ" යි සිතා, සැදැහැයෙන් පැවිදි නුවූ බැවින් සොමනසට පැමිණුණැ, සුවඳ මල් යහනේ වැදූ හොත් තැනැත්තෝ, කාමයෙන් මත් වැ නිදූ, දෙ වැනි දවස් ඖරැ නැඟි කල්හි නැඟී සිටැ, පත් සල නො හැමැදැ ඵලාඵලයට ගියා හ. එ කෙණෙහි නාග මානවිකා අවුත්, යමත් මිරිකී මලා-නික වූ මල් දැකැ, "මේ තාපසයෝ පඤ්ච කාමයෙහි ඇලුණාහු යැ. සැදැහැයෙන් පැවිදි නුවූහ. එ සේ හෙයින් මොවුන් වසඟ කොටැ ගන්නට පිළිවන් වන්නේ යැ" යි දැනැ, පරණ මල් ගෙනැ හැරී දමා, අලුත් මල් ගෙනැ අවුත් යහනත් සරහා පත් සලත් සරහා සක්මනැ මල් විසුරුවා නාග භවනයට ගියා යැ.

6. ඒ තපස්වීහු ඒ දවසුත් මල් යහනේ සැතැපී ඳ වැති දවස්, "මේ පන් සල කවර කෙනෙක් සරහද්දෝ?" යි සිතා, ඵලාඵලයට නො ගොස් පන් සලට නුදුරු තැනැ සැහැවී සිටියා හ. නාග මානවිකාත් බොහෝ සුවඳ මල් ගෙනැ අසපුවට ගියා යැ. රාජ කුමාරයෝ උතුම් වූ රූප ශ්‍රී ඇති නාග මානවිකාව දැකැ, පිළිබඳ වූ සිත් ඇති වැ, තමන් වහන්සේ නො දක්වා මැ සිටැ, ඒ නාග මානවිකාවත් පන් සලට වැදූ යහන සරසන්නට පටන් ගත් කල්හි, ගෙට වැදූ, "තෝ කවරෙහි දූ?" යි විචාළෝ යැ. "ස්වාමීනි, මම නාග මානවිකාවක්මි" යි කී කල්හි, "සස්වාමිකයෙහි ද අස්වාමිකයෙහි දූ?" යි විචාළෝ යැ. "ස්වාමීනි, මම අස්වාමිකයෙමි, වැන්දඹුයෙමි" යි කියා, "තෙපි වූ කලි කවර කෙනෙක් දූ?" යි විචාළි යැ. "මම බරණැස් රජ්ජුරුවන් ගේ පුත්‍ර වූ බ්‍රහ්මදත්ත කුමාරයෙමි" යි කියා, "තෝ වූ කලි නාග භවනය හැරැ කුමක් පිණිස ඇවිදිනෙහි දූ?" යි කිවූ යැ. "ස්වාමීනි, මම නාග භවනයෙහි සස්වාමික වූ නාග මානවිකාවන් ගේ යසස් බලා, කෙලෙස් නිසා උකටලී වැ එයින් නික්මැ වල්ලභයක්හු සොයමින් ඇවිදිමි" යි කිව. "මමත් සැදූහැයෙන් මහණ නො වීමි. ම පියාණන් වහන්සේ නුවරින් නෙරැ යූ හෙයින් මෙ තැනට අවුත් වෙසෙමි. තෝ සැකයක් නො කරව. මම නිට ස්වාමි වෙමි. දෙ දෙන මැ මෙ තෙනැ සමඟ වැ වසම් හ" යි රාජ කුමාරයෝ කී හ. ඒ නාග මානවිකා රාජ කුමාරයන් ගේ බස් අසා, "යහ පතැ" යි පිළිගෙනැ, ඒ තැන් පටන් ඔහු දෙ දෙන ඒ තැනැ වැ සමඟ වැ වුසූ හ.

7. ඒ නාග මානවිකා තමන් ගේ අනුභාවයෙන් මා ඇඟි වූ ගෙයක් මවා, මහාර්ඝ වූ පර්‍යඞ්කයක් ගෙන'වුත් යහන් පැනැවූ යැ. ඒ තැන් පටන් රාජ කුමාරයෝ වන මුල් වන ඵලාඵල අනුභව නො කොටැ දිව්‍ය වූ ආහාර පාන වර්‍ණය මැ අනුභව කළ හ. ඉක්බිත්තෙන්, කල් යාමෙකින් නාග මානවිකා දරු ගබස් ලැබැ, කුමාර

කෙනකුත් වැඳූ යෑ. ඒ කුමාරයාට සාගර බ්‍රහ්මදත්තයෝ යැ යි නම් තුබූ හ. ඒ රාජ කුමාරයන් පියවර නහා ඇවිදුනා කල්හි, නාග මානවිකා කුමාරිකාවක වැඳූ යෑ. ඒ කුමාරිකාවට සමුද්‍ර නීරයෙහි උපත් බැවින් සමුද්‍ර-ජාවෝ යි නම් තුබූ හ.

3. බ්‍රහ්මදත්ත කුමරු රජ බවට පත් වීම.

එ කල්හි බරණැස් නුවර වසන්නා වූ එක් වන චරකයෙක් එ තෙනට පැමිණ, සුව දුක් කථා කොටැ, ඒ රාජ කුමාරයන් අඳිනැ ගෙනැ කීප දවසක් එ තන්හි මැ වැසැ, "දේවයන් වහන්ස, මම නුඹ වහන්සේ මෙ තැනැ වසන නියාව රජ්ජුරුවන් වහන්සේට දන්වමි" යි කියා, එ තෙනින් නික්මැ නුවරට ගියේ යෑ. එ කල්හි රජ්ජුරුවෝ කාල ක්‍රියා කළ හ. අමාත්‍යයෝ රජ්ජුරුවනට කළ මනා ආදාහන කෘත්‍ය කොටැ, සත් වැනි දවස් කථා කරන්නාහු, "රාජ්‍යය නම් අරාජක වැ නො තිබෙන්නේ යැ. රාජ කුමාරයන් වහන්සේ වසන තෙනක් වත් ඇති නැති නියාවක් වත් නො දනුම් හ. පුස් රථය හැරී රජ්ජුරු කෙනකුත් ගනුම් හ" යි මන්ත්‍රණය කළ හ. එ කෙණෙහි වන චරකයා නුවරට පැමිණ, ඒ කථාව අසා, අමාත්‍යයන් සමීපයට ගොස් කියන්නේ, "මම රාජ කුමාරයන් වහන්සේ සමීපයේ තුන් සතර දවසක් වැසැ ආමි" යි කී යෑ. එ බස් අසා අමාත්‍යයෝ ඕ හට සත්කාර සම්මාන කොටැ, ඒ වන චරකයා මාහී නායක කෙරෙමින් කුමාරයන් වසන තෙනට ගොස්, කරන ලද පිළිසඳර කථා ඇති වැ, රජ්ජුරුවන් කලුරිය කළ නියාව කියා, "දේවයන් වහන්ස, රාජ්‍යය පිළිපැද්ද මැනැවැ" යි කී හ.

9. ඒ රාජ කුමාරයෝ "නාග මානවිකාවන් ගේ අභිප්‍රායය දනිමි" යි සිතා, ඇ කරා ගොස්, "සොඳුර, මා ගේ පියාණන් වහන්සේ ඉකුත් වූ සේකැ, අමාත්‍යයෝ මට දළ පුඹූ සේ සත් නංවන්නට ආ හ. යෙමු සොඳුර, දෙදෙන මැ දෙලොස් යොදුන් පමණ ඇති බරණැස් නුවරි

රාජ්‍යය ගනුම් හ. සොළොස් දහසක් පමණ පුරාඩ්‍ය-නාවනට ප්‍රධාන වන්නෙහි වේ දැ"සි කී හ. එ කල්හි නාග මානවිකාවෝ, "යන්නට නො පිළිවනැ"සි කිව. "කුමක් නිසා දැ?"සි කී කල්හි, "අපි උග්‍ර වූ විෂ තේජස් ඇත්තම හ. ක්‍රෝධ කෝපියම හ. සවල්ප මාත්‍ර වූත් ද්වේෂයට කිපෙන සුලු වම් හ. සපත්නී රෝෂය නම් ඉතා බැරිරැම් දෙයෙකැ. එ සේ හෙයින් මම් ඉදින් කිසිවක් දැකැ වත් අසා වත් කිපී බැලිම නම්, රඹු මිටක් මෙන් සියල්ලෝ මැ සුණු විසුණු වැ විසිරී යෙති. මේ කාරණ-යෙන් මා යන්නට නො පිළිවනැ"සි කිව.

10. රාජ කුමාරයෝ දෙ වැනි දවසුත් යාච්ඤා කොටැ කීවාහු යැ. ඉක්බිත්තෙන් ඒ නාග මානවිකා රාජ කුමාරයනට කියන්නී, "මම වූ කලි කිසි මැ කාරණයෙකින් නොයෙමි. මේ මා ගේ පුත්‍රයෝ නාග කුමාරයෝ නොවෙති. තොප නිසා උපන් හෙයින් මනුෂ්‍ය ජාති ඇත්තා හ. ඉදින් මා කෙරෙහි තොප ගේ ස්නේහයෙක් ඇත් නම්, මේ දරුවන් කෙරෙහි ඒ පෙම් කොටැ අප්‍රමාද වව. මේ දරුවෝ වූ කලි දිය කීඳු වපින් උපන් හ. එ සේ හෙයින් ඉතා සිවුමැළියෝ යැ. මාඝ-යෙහි ගෙනැ යන කලැ අවු සුළඟින් මිරිකී මියැ ගියෝ නම්, කාරණ නොවෙයි. එ සේ හෙයින් එක් ඔරුවක් කණවා පැන් පුරා මේ දරුවන් ඒ ඔරුයෙහි ලා දිය කෙළි කෙළවමින් ගෙනැ ගොස්, නුවරට ගිය කල්හි තොප ගේ ගෘහොද්‍යානයෙහි මැ පොකුණක් කණවා එහි හැම වේලෙහි මැ ජල ක්‍රීඩා කරවව. එ සේ කළ කල්හි මේ දරුවනට කිසි පීඩාවෙක් නොවන්නේ යැ"සි කීවා යැ. මෙ සේ ද කියා, රාජ කුමාරයන් වැඳැ පැදකුණු කොටැ, දරුවන් වැලැඳැ, සිඹැ සනහා ළෙහි හොවා ගෙනැ, ඉස් මුදුන සිඹැ රාජ කුමාරයනට පාවා දී, අඬා වැලැපැ, එ තන්හි මැ අතුරුදන් වැ නාග භවනයට ගියා යැ. ඒ රාජ කුමාරයෝත් දෙමිනසට පැමිණැ දැස කඳුළු පුරා ගෙනැ, පන් සලින් නිස්මැ දැසැ කඳුළු පිසැ, අමාත්‍ය-යන් කරා ගියෝ යැ.

11. එ කල්හි අමාත්‍යයෝ කුමාරයනට රාජ්‍යය පාවා දී, එ තන්හි දී මැ අභිෂේක කොටැ, "දේවයන් වහන්ස, අප ගේ නුවරට යම් හ"යි කී හ. "එ සේ වී නම් වහා ඔරුවක් කණවා, ගැලකට නගා පැන් පුරවා, දියැ පිටැ වණී ගණියෙන් යුක්ත වූ නොයෙක් මල් විසුරුවව. මා ගේ දරුවෝ දිය බිඳු වටින් උපන් හ. එ සේ හෙයින් දරුවෝ ඒ නැවින් දිය කෙළි කෙළිමින් සැප සේ යන්නෝ වෙත් දැ"යි කිවු සැ. අමාත්‍යයෝත් එ පරිද්දෙන් මැ කළ හ. රජ්ජුරුවෝ බරණැස් නුවරට පැමිණැ, සරහා පිළියෙළ කරන ලද නුවරට වැදැ, සොළොස් දහසක් පමණ පුර වනිතාවන් හා අමාත්‍යයන් ද විසින් පිරිවරන ලදු ව, ප්‍රාසාදයේ මතු මහල් තලයෙහි ශ්‍රී යහත් මසතකයේ හිඳැ, සතියක් මුළුල්ලෙහි මහත් වූ සුරා පානය කොටැ, දරුවන් කෙළනා පිණිස පොකුණු කැණැවූ හ. දරුවෝ එහි නිරන්තරයෙන් දිය කෙළි කෙළනා හ.

4. චිත්‍රගුලයා ගේ කථාව.

12. ඉක්බිත්තෙන් එක් දවසක්, පොකුණට සොඳුරාවුවෙන් පැන් වදනා කල්හි, එක් කැස්බෙක් පොකුණ ඇතුළට වැදැ, නික්මෙන්නට නිසි මඟක් නො දන්නේ, පොකුණු පත්ලේ වැදැ හෙවැ, දරුවන් කෙළනා කල්හි දියෙන් නැඟී ඉස් මැත් කොටැ, ඒ දරුවන් බලා, නැවැතැ දියෙහි මැ ගැලී හියේ සැ. රාජ කුමාර වරු කැස්බා දැකැ, හසින් ත්‍රාසයට වැ, පියාණන් සමීපයට ගොස්, "පියාණන් වහන්ස, පොකුණේ එක් යක්ෂයෙක් අප භය ගන්වන්නේ සැ"යි කී හ. එ බස් ඇසූ රජ්ජුරුවෝ, "යව ඔහු අල්ලව"යි රාජ පුරුෂයනට විධාන කොළෝ සැ. ඒ රාජ පුරුෂයෝ ගොස් දැලක් දමා කැස්බා බදා ගෙනැ රජ්ජුරුවනට දැක්වූ හ. කුමාර වරු ඔහු දැකැ, "පියාණන් වහන්ස, මේ යක්ෂයා සැ, මේ යක්ෂයා සැ"යි කියා අඬ ගැසූ හ. රජ්ජුරුවෝ පුත්‍ර ස්නේහයෙන් කැස්බාට කිපුණාහු, "මොහු හැරී ගෙනැ ගොස් වධ කොටැ මරව"යි නියෝග කළ හ.

13. [illegible]යමහර කෙනෙක් කියත්නෝ, "මේ රාජ ද්‍රෝහියා යෑ. එසේ හෙයින් මොහු වනෑ ලා මෝලින් කොටා සුණු කොටෑ දමන්නට වටනේ යෑ"යි කී හ. සමහර කෙනෙක් කියන්නාහු, "මොහු තුන් පාකයෙකින් පිසෑ කන්නට වටනේ යෑ"යි කී හ. සමහර කෙනෙක් කියන්නාහු, "අඟුරෙහි ලා පලහා අඟුරු මස් කන්නට වටනේ යෑ" යි කී හ. සමහර කෙනෙක්, "මොහු තමා ගේ ඉදුණු කබලින් පලහන්නට වටනේ යෑ"යි කී හ.

14. එ කල්හි උදක භීරුක වූ අමාත්‍යයෙක් කියන්නේ, "මොහු යමුනා නම් ගංගායෙහි මහත් වූ සළා වැටුම්-කට දමන්නට වටනේ යෑ. එ සේ කල්හි, මේ තෙමේ එහි මහත් විනාශයකට පැමිණෙන්නේ යෑ. මෝ හට මීට වඩනා වූ අනෙක් වධයෙක් නැතෑ"යි කී යෑ. එ කල්හි කැස්බා ඒ අමාත්‍යයා ගේ බස් අසා ඉදිබු කබලින් ඉස පිටත් කොටෑ, කියන්නේ, "එම්බා පින්වත් වූ පුරු-ෂය, මා විසින් තට කෙසේ වූ අපරාධයෙක් කරන ලද ද? මෙ බඳු වූ දුස් කම් කටුල්ලක් කුමක් නිසා මට නියෝග කෙරෙහි ද? මා විසින් පළමු මේ සියල්ලවුන් කි වධ ඉවසන්නට පිළිවනෑ. මේ තා විසින් කියන ලද්දා වූ වධය ඉතා චණ්ඩ යෑ. එ සේ හෙයින් ඒ වධය මම ඉවසා ගත නො හෙමි. මෙ බන්දක් මට නො කියව" යි කී යෑ. එ බස් අසා රජ්ජුරුවෝ, "මෝ හට ඒ ඒ වධ ඉවසන්නට පිළිවනෑ. මේ තා විසින් කියන ලද්දා වූ වධය ඉතා චණ්ඩ යෑ. ඒ වධය මෑ කරන්නට වටනේ යෑ" යි කියා, යමුනා නම් ගංගායෙහි සළා වැටුමට දැම්මූ යෑ.

15. ඒ කැස්බා එ සේ දමන ලද්දේ නාග භවනයට හියේ යෑ. එ කල්හි ඔහු ඒ ජල ප්‍රවාහයෙහි කෙළනා ඛාතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් ගේ පුත්‍ර වූ නාග මාන වකයෝ දැකා, "මේ කොල්ලා අල්ලව"යි කී හ. එ කල්හි කැස්බා සිතන්නේ, "මම බරණැස් රජ්ජුරුවන් වහන්-සේ අතින් මිදී, මෙ බඳු වූ චණ්ඩ පරුෂ වූ නසින් අතට පැමිණියෙමි. කවර උපායයෙකින් මුන් අතින් මිදී යෙම්

දෙහෝ?"යි සිතා, ඔහේම, "මේ උපායය යහ පත් වන්නේ යැ"යි බොරුවක් හොතා ගෙනැ කියන්නේ, "තෙපි හැම **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් වහන්සේ සතුනක වැ සිටැ කුමක් නිසා මෙ සේ කියවු ද? මම **චිත්‍රගුල** නම් කැස්බෙක්මි. **බරණැස්** රජ්ජුරුවන් වහන්සේ ගේ දූතයෙමි. **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් වහන්සේ සමීපයට මෙහෙවර ආමි. අප ගේ රජ්ජුරුවන් වහන්සේ **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් වහන්සේට තමන් වහන්සේ ගේ දූ කුමාරිකාවන් දෙනු කැමැති වැ මා එවූ සේකැ. ඒ නා රජ්ජුරුවන් වහන්සේට මා දක්වව"යි කිවු යැ.

16. ඒ නාග මානවකයෝ සතුටු වැ ඒ කැස්බා ඇරැ ගෙනැ, රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගොස් එ පවත් දන්වූහ. රජ්ජුරුවෝ, "ඔහු මෙසේ ගෙනෙව"යි සමීපයට ගෙන්වා, දැකැ නෝ සතුටු වූ සිත් ඇති වැ, "මෙ බඳු වූ ලාමක ශරීර ඇත්තා වූ සත්ත්වයෝ දූත මෙහෙවර කරන්නට අසමර්ථයෝ යැ"යි කී හ. එ බස් අසා කැස්බා කියන්නේ, "කිමෙක් ද රජ්ජුරුවන් වහන්ස, රජ දරුවන් ගේ දූතයෝ නම් තල් ගස් පොල් ගස් සේ උස් විය යුතු ද? ශරීර කුඩා වුවත් මහත් වුවත් ඒ පමණ නො වෙයි. හිය තැන කාසි සිඳ කිරීම මැ පමණ වන්නේ වෙයි. තව ද රජ්ජුරුවන් වහන්ස, අප ගේ රජ්ජුරුවන් වහන්සේ ගේ බොහෝ දූතයෝ වන්නා හ. ගොඩ දූත මෙහෙවර මනුෂ්‍යයෝ කෙරෙති. අවකාශයෙහි දූත මෙහෙවර පක්ෂීහු කෙරෙති. දියෙහි දූත මෙහෙවර මම කෙරෙමි. මම වූ කලි **චිත්‍රගුලයා** යැ යි නම් තනතුරු ලැබැ, රාජ වල්ලභ වැ සිටී කෙනෙක්මි. එ සේ හෙයින් මට නිදුකැ පරිභව නො කරව"යි කියා තමා ගේ ගුණ වර්ණනා කෙළේ යැ.

17. එකල්හි ඔහු අතින් **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවෝ විචාරන්නෝ, "කවර කාරණයෙකින් රජ්ජුරුවන් වහන්සේ තා එවූ සේක් ද?"යි විචාළෝ යැ. "මහ රජ්ජුරුවන් වහන්ස, අප ගේ රජ්ජුරුවන් වහන්සේ මට

කියන සේක්, 'සියලු දඹදිව රජ දරුවන් වහන්සේ හා සමඟ මා විසින් මිත්‍ර ධර්මය කරන ලදී. නොකෙළේ නම්, ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් හා සමඟ මැයැ. අප ගේ සමුද්‍රජා නම් දියණියත් පාවා දීමෙන් ඒ නා රජ්ජුරුවන් හා මිත්‍ර ධර්මය තර කොටගත්තට වුව මැනැවැ'යි කී සේකැ. එසේ හෙයින් දැන් ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්ස, මා හා සමඟ පළමුත් එවා නකත් දවස් නියම කොටැ රාජ කුමාරිකාවන් වහන්සේ පාවා ගත මැනැවැ"යි කීයැ. ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝ එ බසට සතුටු වැ, ඕ හට සත්කාර කොටැ, ඒ කැස්බා හා සමඟ නාග මානවකයන් සතර දෙනකු යවත්නෝ, "යව, රජ්ජුරුවන් ගේ බස් අසා දවස් නියම කොටැ ගෙනැ එව"යි කියා යැවූ සැ.

18. ඒ නාග මානවකයෝ සතර දෙන, "යහ පහ ස්වාමිනි"යි කියා කැස්බා අැරැ ගෙනැ නාග භවනයෙන් නික්මුණා හ. එ කල්හි කැස්බා යමුනාවටත් බරණැස් නුවරටත් අතරේ එක් පියුම් විලක් දැකැ, "එක් උපායයෙකින් පලා යෙමි"යි සිතා කියන්නේ, "පින්වත් වූ නාග මානවකයෙනි, අප ගේ රජ්ජුරුවන් වහන්සේත් උන් වහන්සේ ගේ දූ දරුවෝත් මා දියෙහි ඇවිදුනා තැනැත්තවූ රජ ගෙට හිය කලැ දැකැ ලා මැ 'අපට ඇඹුල උපුල නෙළුම් මල් දෙව. නෙළුඹල හා නෙළුම් දැලි දෙව'යි ඉල්ලන සේකැ. එසේ හෙයින් මම උන් වහන්සේ නිසා නෙළුම් මල් ආදිය කඩා ගන්නා කැමැත්තෙමි. මා මෙ තැනැ මැ හැරැ ලා නුදුටත් පෙරාතු කොටැ මැ තෙපි හැම රජ්ජුරුවන් ඉහන්සේ සමීපයට යව. එ තැන්හි දී මා දක්නෝ වේදැ?"යි කීයැ. ඒ නාග මානවකයෝ ඔහු ගේ බස් අසා අදහා, එ තැන්හි දී මැ කැස්බා විලට හැරැ පූ හ. ඒ කැස්බා එ තැන්හි මැ එක් තැනෙකැ සැඟැවිණ. නාග මානවකයෝත් ඔහු නො දැකැ, "රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගියේ වනැ"යි සිතා මානවක වේශයෙන් රජ්ජුරුවන් වහන්සේ සමීපයට හියා හ.

ඍ. සමුද්‍රජාවන් පිණිස නාග දූතයන් යෑම.

19. රජ්ජුරුවෝ පිළිසඳර කථා කොටැ, "මෙහාභි සිටැ අවු දෑ?" සි විචාළෝ යැ. "ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් සමීපයෙහි සිටැ ආමි හ, මහ රජ්ජුරුවන් වහන්ස" සි කී කල්හි, "කුමක් නිසා අවු දෑ?" සි කී හ. මහ රජ්ජුරුවන් වහන්ස, අපි උන් වහන්සේ ගේ දූතයම හ. ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ ගේ දැව දුක් විචාළ සේකැ. තව ද තමන් වහන්සේ ගේ නාග භවනයෙහි මුක්තා මාණික්‍යාදි යම් කිසි රත්නයෙක් ඇත් නම්, ඒ සියලු රත්නය මැ නුඹ වහන්සේට පඬුරු කොටැ දී එවන සේකැ. කැමැති සේක් ම නම් ඒ සියලු රත්නාදිය ගත මැනැවැ. නුඹ වහන් සේ ගේ දූ වූ සමුද්‍රජාවන් අප ගේ රජ්ජුරුවන් වහන්සේට පාද පරිචාරිකා කොටැ දුන මැනැවැ" සි කී හ. එ බස් අසා රජ්ජුරුවෝ කියන්නාහු, "අප විසින් කිසි කලෙකැත් නසින් හා විවාහයක් කළ විරූ නැති. අපි මනුෂ්‍ය ජාති ඇති වැ සිටැ තිරශ්චීනයත් හා සමඟ නුසුදුසු වූ විවාහ බන්ධනය කෙ සේ නම් කරමෝ දෑ?" සි කී හ.

20. එ බස් අසා නාග මානවකයෝ කියන්නෝ "ඉදින් නුඹ වහන්සේට ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ හා සමඟ සම්බන්ධය නුසුදුසු වී නම්, එ සේ කලැ කුමක් නිසා නුඹ වහන්සේ ගේ සේවක වූ චිත්‍රඟුල නම් කැස්බා, 'සමුද්‍රජා නම් රාජ කුමාරිකාවන් දෙමි' සි අප ගේ නා රජ්ජුරුවන් වහන්සේ සමීපයට දූත මෙහෙවර එවූ සේක් ද? එ සේ එවා ලා දැන් හිඳැ අප ගේ රජ්ජුරුවන් වහන්සේට පරිභව කරන්නා වූ නුඹ වහන්සේට කළ මනා කට යුතු අපි දනුම් හ. අප නසි නියාව නො දන්නා සේක් දෑ?" සි කියා රජ්ජුරුවන් භය ගැන්වූ හ. "තව ද, ජනේශ්වර වූ රජ්ජුරුවන් වහන්ස, ඒකාන්තයෙන් නුඹ වහන්සේ ගේ ජීවිතයත්

රාජ්‍යයක් හරන ලද මැයැ. මේ බඳු වූ මහානුභාව සම්පන්න නයින් කිපී කල්හි, නුඹ වහන්සේ බඳු අනුභාව රහිත වූ රජ දරුවෝ ජීවත් වැ ඇත නොහෙති. අතරතුරෙහි මැ විනාශයට පැමිණෙති. එසේ හෙයින් රජ්ජුරුවන් වහන්ස, මනුෂ්‍ය ජාති වැ සිටැ කිසි අනුභාව මහිමයක් නැති වැ මහානුභාව සම්පන්න වූ සෘද්ධිමත් වූ **චරුණ** නම් නා රජ්ජුරුවන් වහන්සේ ගේ ප්‍රිය පුත්‍ර වූ **යමුනා** නම් ගංගාව යටැ උපන්නා වූ **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් වහන්සේට කුමක් පිණිසැ නිතැ කොටැ කියන සේක් ද? එසේ කීව නුඹ වහන්සේට සුදුසු නොවෙයි"කී හ.

21. **ඉක්ඛිත්තෙන්** **බ්‍රහ්මදත්ත** රජ්ජුරුවෝ එ බස් අසා කියන්නෝ, "මහත් වූ යස පිරිවර ඇත්තා වූ **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවනට මම නින්ද කොටැ නොකියමි. **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවෝ පන් සියයක් යොදුන් පමණ ඇති නාග භවනයෙහි බොහෝ නයිනට නායකය හ. එසේ මහානුභාව සම්පන්න වැ සිටියේ වූ නමුත් සපි ජාති ඇති බැවින් මා ගේ දියණියනට නුසුදුස්සෝ යැ. **වේදේහ** රාජ පුත්‍රයාත් මා ගේ දියණියෝ **සමුද්‍රජා**වෝත් දෙදෙන මැ විශිෂ්ට වූ ජාති ඇත්තා හ. ඔහු දෙදෙන ඔවුනොවුන් හා සංවාසයට සුදුස්සෝ යැ. මණිඛුක භක්ෂණය කරන්නා වූ සර්පයනට මා ගේ දියණියෝ **සමුද්‍රජා**වෝ සුදුසු නොවෙති"යි කී හ.

22. එ කල්හි නාග මානවකයෝ ඒ **බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන් එ තැන්හි දී මැ නාසා වාතයෙන් මරනු කැමැති වත්, නැවැතැ, "අප දවස් නියම කරනු පිණිසැ එවූවනට මුන් මරා යාම සුදුසු නොවෙයි. ගොස් රජ්ජුරුවන් වහන්සේට කියා මුනට නියම දනුම් හ" යි සිතා එ තැන්හි මැ පොළෝ කිමිදී ගොස් නා ලොවට වැද, **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් විසින් "කිමෙක් ද දරුවෙනි, තොප විසින් රාජ කුමාරිකාවෝ ලබන ලදු දෑ?"යි විචාළ කල්හි, ඔහු සතර දෙනා

කිපි, "දේවයන් වහන්ස, අප නිෂ්කාරණයේ කුමක් පිණිස ඒ ඒ තෙනට යවන සේක් ද? ඉදින් මරනු කැමැති සේක් වී නම් මෙ තැන්හි දී මැ මරවා පුව මැනැවැ. ඒ රජ්ජුරුවෝ නුඹ වහන්සේට ආක්‍රෝෂ පරිභව බෙණෙති. තමන් ගේ දියණියන් ජාති මදයෙන් උසස් කොටැ කියති"යි ඒ රජ්ජුරුවන් කී දෙයත් නොකී දෙයත් කියා, නා රජ්ජුරුවනට කෝප ඉපැදුවූ හ.

23. එ කල්හි නා රජ්ජුරුවෝ තමන් ගේ පඤ්ච රැස් වන්නට විධාන කරන්නාහු, "මෙර පත්ලෙහි වසන්නාවූ කම්බලස්සතර නම් වූ මා ගේ මවු පසෙයෙහි නයින් හා අවශේෂ වූත් සතර දිග යැ සතර අනුදිග යැ යි අට දිග්හි වසන්නා වූ යම් පමණ මා කීවා කරන්නාවූ නාග පඤ්දෙන් ඇත් නම්, ඒ සියලු නාග පඤ්දට ගොස් කියව, වහා රැස් කරව"යි විධාන කළ හ. ඉක්බිත්තෙන් ඒ සියලු නාග පඤ්ත් මැවහ වහා රැස් වැ, නා රජ්ජුරුවන් සමීපයට අවුත්, "දේවයන් වහන්ස, කුමක් කරමෝ ද? කවරක්හු නාසා වාතයන් පැහැරි සසම කරමෝ ද"යි කී කල්හි, රාජ කුමාරිකාවන් කෙරෙහි පිළිබඳ වූ සිත් ඇති බැවින් උනට විනාශයක් නොකැමැති වැ කියන්නෝ, "බරණැස් නුවරට යව. ගොසින් තෙපි හැම දෙන කවුරුනටත් කිසිත් පීඩාවක් නොකරව"යි කී හ.

24. එ කල්හි නා රජ්ජුරුවනට නාගයෝ කියන්නෝ, "ඉදින් කිසි මනුෂ්‍යයකු නොමැරියැ යුත්තේ වී නම්, ඒ බරණැස් නුවරට ගොස් කුමක් කරමෝ ද?"යි කී හ. ඉක්බිත්තෙන් නා රජ්ජුරුවෝ නසිනට, "තෙපි හැමත් මේ මේ දේ කරව. මමත් මෙ නම් දෙයක් කෙරෙමි"යි කියන්නාහු, "ප්‍රාසාදයෙහිත් අවශේෂ මනුෂ්‍යයන් ගේ ගෙවලත් පොකුණෙහිත් විපියෙහිත් වැපී චතුෂ්කයෙහිත් වෘක්ෂයෙහිත් තෝරණයෙහිත් මහත් වූ ශරීර මවා ගෙනැ එලෙවු. මෙ පමණක් විනා කිසි සත්ව කෙනකුනට විනාශයක් නොකරවූ. තව ද මෙ සේ එලෙන්නා වූ තෙපි හැම ප්‍රාසාදග්‍රයෙහි වූ කලි ඇඳ පුටු යහන් වියන් උඩත්, ගබඩා ඇතුලෙහිත්,

පිටත්, පොකුණෙහි දිය පිටැත්, වීථි ආදියෙහි දැලවරැත් මධ්‍යයෙහිත් මහත් වූ ශරීර මවා ගෙනැ, මහත් වූ පෙණ කොටැ, කඹුරු සම් මඬනා කලක් මෙත් 'සූ සූ' යන අනුකරණ ශබ්ද පවත්වමින් එලෙවූ. මතාප හැම වූ කලි, බාල දරුවෝ යැ, වෘද්ධයෝ යැ, ගර්භිනීහු යැ, සම්බුද්ධාවෝ යැ, යන සතර පක්ෂයට නො දක්වවූ. මම්ත් සර්වඥයෙත් ධවල වූ මහත් වූ නාග ශරීරයක් මවා ගෙනැ ගොස් ඉතා මහත් වූ කෂී පුරය සත් දරණ පටෙකින් වට ලා ගෙනැ, මහත් වූ පෙණ ගර්භයෙකින් නුවර වසා ඒකාන්ධකාර කොටැ, කෂී පුර වාසීනට භය උපදවමින් 'සූ සූ' යන අනුකරණ ශබ්ද පවත්වා වැද හෝමි"යි කී හ.

25. ඒ නා රජ්ජුරුවන් ගේ බස් අසා, රතන නීල ශෙවිතාදි වූ නොයෙක් පැහැ ඇති නාග වෙස් මවා, මධ්‍යම රාත්‍රි වේලෙහි නුවරට වැද, ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් විසින් කියන ලද ක්‍රමයෙන් ඒ සියලු නාගයෝ කිසි කෙනකුටත් හිංසාවක් පීඩාවක් නො කොටැ, ප්‍රාසාදයෙහිත් සෙසු ගෙවලත් පොකුණෙහිත් වීථියෙහිත් සතර මං සන්ධියෙහිත් ගස් උඩත් නෝරණයෙහිත් මනුෂ්‍යයන් ගේ සංචාරයෙහිත් එලෙන්නට පටන් ගත් හ. දූත වැ ආවා වූ නාග මානවකයෝ සතර දෙන, රජ්ජුරුවන් ගේ යහනෙහි පා සතර වෙලා ගෙනැ, හිස් මුදුනට මහත් වූ පෙණ ගබ් කොවිැ, තුඩින් හිසට ඇනැ ඇනැ කට දල්වා සුස්මසුස්මා සිටියා හ. ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝත් පළමු තමන් කී සැටියේ මැ නුවර සත් දරණයෙකින් වෙලා, කළ කටක් වැසූ කලක් පරිද්දෙන් පෙණ ගර්භය ඉපැදූවූ හ. මහා ජනයෝ රාත්‍රි පිබිදී යම් යම් තෙනෙකැ අතත් වත් පයක් වත් දික් කළෝ නම්, ඒ ඒ තැනැ සපියත් පිටැ මැ අත පය තබා, "සපියෙකැ, සපියෙකැ"යි මුර හැ හ. යම් ගෙයෙකැ පහත් ඇවිළේ නම්, ඒ ගෙවලැ සත්‍රිහු පිබිදී උඩැ බලන්නාහු, ගෝනැස් ආදියෙහි එලෙන්නා වූ නයින් දැකැ බොහෝ දෙන එක පැහැරී අඬන්නව පටන් ගත් හ.

26. තව ද පාන් වැ ඝිය කල්හි නසින් ගේ ආශ්වාස ප්‍රශ්වාසයෙන් සියලු නුවරත් මාලිගාත් උපුටැ පියන කලක් මෙන් වූ කල්හි, ඝසින් ත්‍රසා වූ මනුෂ්‍යයෝ, "නා රජ්ජුරුවෙනි, කුමක් නිසා අප හැමට පීඩා කරවු දැ?"යි කිවු යැ. "තොප ගේ රජ්ජුරුවන් වහන්සේ 'දියණියන් දෙම් හ'යි ඛෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් සමීපයට දූතයන් යවා, නැවැතැ උන් වහන්සේ ගේ දූතයන් අවුත් 'දුන මැනැවැ'යි කී කල්හි, අප ගේ නා රජ්ජුරුවන් වහන්සේට ආක්‍රෝශ පරිභව කළ සේකැ. ඉදින් අප ගේ නා රජ්ජුරුවන් වහන්සේට දියණියන් දුන් සේක් වී නම් අැරි පියම් හ. නුදුන් සේක් වී නම් සියලු නුවරැ වාසින් ගේ දිවි නැත්තේ වේ දැ"යි කී කල්හි, "එ සේ වී නම්, අපට අවසර දුන මැනැවැ. අපි හැම ගොස් රජ්ජුරුවන් වහන්සේට යාච්ඤ්ඤා කරම් හ"යි කියා, යාච්ඤ්ඤා කොටැ අවසර ලැබැ ගෙනැ, මාලිගා දොරට ගොස් මහ හඬින් හැඬූ හ. රජ්ජුරුවන් ගේ බිසෝ වරුන් තමන් තමන් ගේ ගබඩාවලට වැද හෙවැ, "දියණියන් ඛෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවනට දුන මැනැවැ"යි එක පැහැරී අැඬූ හ. ඒ නාග මානවකයෝ සතර දෙනත් "දුන මැනැවැ"යි කියා රජ්ජුරුවන් ගේ ඝිස තමන් ගේ තුඩින් පැහැරී සිටිය හ.

27. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ වැද හොත් තෙනැත්තෝ මැ නුවරැ වාසින් හා බිසෝ වරුන් ද අඬන අඬන් අසා, නාග මානවකයන් සතර දෙනා විසින් භය ගැන්වූ බැවිනුත් මරණ භයින් භය පත් වැ, "මා ගේ දියණියන් සමුද්‍රජාවන් ඛෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවනට දෙමි දෙමි"යි තුන් විටක් කී හ. එ ඛස් අසා සියලු මැ නා රජ දරුවෝ ගව්වක් පමණ තැන් පසු බා ගෙනැ, දිව්‍ය පුරයක් මෙන් එක් නුවරක් මවා, ඒ නුවරැ සිටැ, "දියණියන් එවුව මැනවැ"යි පඬුරැ යැවූ හ.

6. භූරිදත්ත කුමාරෝත්පත්තිය.

28. රජ්ජුරුවෝ උන් ගෙනැ හිය පඬුරු ගෙනැ, "තෙපි හැම යව. මම දියණියන් අමාත්‍යයන් අතට පාවා දී එවමි"සි නාග මානවකයන් යවා, දියණියන් සමීපයට කැඳැවා, ප්‍රාසාදයේ මතු මහල් තලයට ගෙනැ ගොස් සිමැදුරු කවුළුව හැරි කියන්නෝ, "මැණියෙනි, මේ සරහා පිළියෙළ කරන ලද නුවර දුටුවා ද? ඒ නුවරැ එන් රජ්ජුරු කෙනකුනට අඟ මෙහෙයුන් වව. එ සේ හෙයින් තොප ඒ නුවරට යා යුතු යැ"සි හිවිස්සවා ඉස් සෝධා නාවා, සර්වාභරණයෙන් සරහා, මනා වැ සරහන ලද යානාවෙකැ හිඳුවා, අමාත්‍යයන් අතට පාවා දී යැවූ හ. එ කල්හි අමාත්‍යයෝ ද **සමුද්‍රජාවන්** **බෘහරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවනට පාවා දී බොහෝ සම්පත් ගෙනැ පෙරළා නුවරට මැ ආ හ. රාජ කුමාරිකාවන් ප්‍රාසාදයේ මතු මහල් තලයට ගෙනැ ගොස් සරහන ලද දිව යහනෙකැ සැතැප්පූ හ. එ කෙණෙහි මැ නාග මානවිකාවෝ කුරුන් කුදුන් වෙස් ගෙනැ මනුෂ්‍ය පරිවාරිකාවන් මෙන් පිරිවරා ගත් හ. රාජ කුමාරිකාවෝ දිව යහනේ හොත් පමණෙකින් මැ දිව පහස් විදැ නිදන්නට පටන් ගත් හ. **බෘහරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවෝ එ කල්හි **සමුද්‍රජාවන්** ගෙනැ නාග පෙත් හා එ තැන්හි මැ අන්තර්ධාන වැ නාග භවනයෙහි ඇතුළු වූ හ.

29. ඒ රාජ කුමාරිකාවෝ, පිබිදී, සරහන ලද දිව යහනත්, අන්‍ය වූ රන් රිදී මැණික්මය වූ ප්‍රාසාදාදියත්, උදාන පුෂ්කරිණීන් සරහන ලද දිව්‍ය පුරයක් වැනි වූ නාග භවනයත් දැකැ, කුරුන් කුදුන් ආදි වූ පරිවාර ස්ත්‍රීන් අතින් විචාරන්නාහු, "මේ නුවර ඉතා සැරැහී තිබෙන්නේ යැ. අප ගේ නුවර සේ නො වෙයි. මේ කා ගේ නුවරෙක් ද?"සි විචාළෝ යැ. එ කල්හි පරිවාර ස්ත්‍රීහු කියන්නෝ, "දේවීන් වහන්ස, නුඹ වහන්සේ ගේ සැමි පුත්‍රයාණන් වහන්සේ සනතක නුවරෙක්

වන්නේ යැ. මද පින් ඇත්තා වූ සත්ත්වයෝ මේ බදු සම්පත් නො ලබති. නුඹ වහන්සේ මහ පින් ඇති බැවින් මේ සා මහත් වූ ඓශ්වර්‍ය හා සම්පත් ද ලබන ලදැ"යි කී හ.

30. ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝත් ඉපත් සිය-යක් යොදුන් පමණ වූ නාග භවනයෙහි බෙර ලවන්නාහු, "යමෙක් සමුද්‍රජාවනට සර්ප වේශයක් දක්වූ නම් ඔහට රාජාඥ වන්නේ යැ"යි බෙර ලැවූ හ. එ සේ හෙයින් එකෙකුත් සමුද්‍රජාවනට සර්ප වේශයක් දක්වන්නට අසමර්ථ වී යැ. සමුද්‍රජාවෝ, "මනුෂ්‍ය ලෝකය යැ" යි යන සංඥයෙන් මෙ සේ ඒ නාග භවනයෙහි ඒ නා රජ්ජුරුවන් හා සතුටු වැ ප්‍රිය සංවාසයෙන් වූසූ හ.

31. ඉක්බිත්තෙන් ඒ සමුද්‍රජාවෝ මෑත භාගයෙහි ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් නිසා දරු ගැබක් ලැබැ පුතණුකෙනකුන් වැදූ යැ. ඒ කුමාරයනට ප්‍රිය වූ දැකුම් ඇති බැවින්, සුදර්ශන කුමාරයෝ යැ යි නම් තුබූ හ. නැවැතැ අනෙක් පුතණුකෙනකුන් වැදූ යැ. උනට දත්ත කුමාරයෝ යැ යි නම් තුබූ හ. ඒ කුමාරයෝ වනාහි බෝධි සත්ත්වයෝ යැ. නැවැතැ එක් පුතණුකෙනකුන් වැදූ යැ. උනට සුභග කුමා-රයෝ යැ යි නම් තුබූ හ. නැවැතැ එක් පුතණුකෙනකුන් වැදූ යැ. උනට අරිට්ඨ කුමාරයෝ යැ යි නම් තුබූ හ. මෙ සේ ඒ සමුද්‍රජාවෝ පුතුන් සතර දෙනකු වදත් නාග භවනය නියාව නො දන්නා හ.

32. ඉක්බිත්තෙන් එක් දවසක් අරිට්ඨ කුමාරයනට නාග මානවිකාවෝ කියන්නෝ, "තොප ගේ මෑණියෝ මනුෂ්‍ය ස්ත්‍රී යැ, නාග මානවිකාවක් නො වෙයි" කී හ. එ බස් අසා අරිට්ඨ කුමාරයෝ, "පරීක්ෂා කෙරෙ-මි"යි සිතා, එක් දවසක් කිරි බොමින් ඉඳැ සර්ප වේශයක් මවා, නහටින් මෑණියන් ගේ පිටි පතුලට ඇනැ ලූ යැ. එ කල්හි මෑණියෝ ඔහු ගේ සර්ප ශරීරය

දුකැ, ඇයින් ප්‍රයෝජනවැ, මහත් කොටැ අඬ ගසා, ඔහු බිමට දමන නැනැත්තෝ, නියෙන් ඔහු ගේ ඇස ඇනැ සිල් කළ හ. ඇසින් ලේ වැගිරෙන්නට පටන් ගත. රජ්ජුරුවෝ සමුද්‍රජාවන් අඬ ගැ අඬ අසා, "සමුද්‍රජාවෝ කුමක් නිසා අඬ ගැ දැ?"සි විචාරා, අභිචිඤ කුමාරයන් විසින් කරන ලද ක්‍රියාව අසා, "ගනුව, ඒ කොල්ලා අල්ලා ගෙනැ ජීවිත ක්ෂයයට පමුණුව"සි කියා නැති ගන්වමින් සමීපයට අවු යැ. එ කල්හි රාජ කුමාරිකාවෝ කුමාරයනට කිපි නියාව දුනැ, පුත්‍ර ස්නේහයෙන් කියන්නෝ, "දේවයන් වහන්ස, මා ගේ පුතණුවන් ගේ ඇස නැසි ගියේ යැ. උනට ක්ෂමා කළ මැනැවැ"සි කිවු යැ. රජ්ජුරුවෝ එ බස් අසා, "මුන් මෙ සේ කියන කලැ කුමක් කරන්නට පිළිවන් දැ"සි ඉවැසු යැ. එ දවස් "මේ නාග භවනය යැ"සි සමුද්‍රජාවෝ දත් හ. එ නැන් පවත් අභිචිඤ කුමාරයෝ කාණාභිචිඤ කුමාරයෝ යැ සි මෙ නමින් ප්‍රසිද්ධ වූ හ. දරුවෝ සතර දෙන ක්‍රමයෙන් වැඩි විය පැමිණැ විඳ ඛවට පැමිණියා හ.

33. ඉක්බිත්තෙන් ඒ සතර බැයනට පිය රජ්ජුරුවෝ යොදුන් සියයක් යොදුන් සියයක් පමණ කොටැ රාජ්‍යය දුන් හ. මහත් වූ යස පිරිවර වූයේ යැ. සොළොස් දහස් සොළොස් දහස් පමණ නාග කන්‍යාවෝ පිරිවර වූ හ. පිය රජ්ජුරුවනට යොදුන් සියයක් පමණ රාජ්‍යය වූයේ යැ. තුන් බැයෝ මසක් පාසා දෙ මවුපියන් දක්නට එන්නා හ. මහ බෝ සතාණෝ වූ කලි අඛ මසින් අඛ මසැ දෙ මවුපියන් දක්නට එන්නා හ. නාග භවනයෙහි උපන්නා වූ ප්‍රශ්නයෙක් ඇත් නම් මහ බෝ සතාණෝ මැ විසඳා කියන්නා හ. පිය රජ්ජුරුවන් හා සමඟ විරූපාක්ෂ නම් වරම් මහ රජ්ජුරුවන් සමීපයටත් උපස්ථානයට යන්නා හ. ඒ රජ්ජුරුවන් සමීපයෙහි උපන් ප්‍රශ්නයෙන් ඇත් නමුත් මහ බෝ සතාණෝ මැ විසඳා කියන්නා හ.

34. ඉක්බිත්තෙන් එක් දවසක් විරූපාක්ෂ නම වරම් මහ රජ්ජුරුවන් නාග පණිත් හා සමග තුයඤ්ජං-ශත් දිව්‍ය ලෝකයට ගොස් සක් දෙව රජ්ජුරුවන් පිරිවරා උන් කල්හි දෙවියන් අතරෙහි ප්‍රශ්නයෙක් උපන්නේ යැ. ඒ ප්‍රශ්නය කියන්නට සමර්ථ වූ එක ද කෙනෙක් නුවූ යැ. උතුම් වූ පඤ්ඤයට නැඹි හිඳැ මහා බෝධි සත්ත්වයෝ මැ ප්‍රශ්නය විසර්ජනය කළහ. එ කල්හි බෝධි සත්ත්වයනට ශක්‍ර දෙවෙන්ද්‍රයෝ දිව සුවඳ මල් ආදියෙන් පූජා කොටැ "දන්තයෙනි, තෙපි පොළොව හා සමාන වූ මහත් වූ විපුල වූ ප්‍රඥයෙන් යුක්ත වූ හ. එ සේ හෙයින් මෙ තැන් පටන් භූරිදත්ත නම් වේ ව"යි, භූරිදත්ත කුමාරයෝ යැ යි මහ බෝ සතාණනට නම් තුබූ හ.

7. භූරිදත්ත කුමරු නාග භවනය කෙරෙහි කලකිරී සිල් රැකීම.

35. එ තැන් පටන් මහ බෝ සතාණෝ ශක්‍ර දේවෙන්ද්‍රයනට උපස්ථානයට යන තැනැත්තෝ, අල-ඞ්කෘත වූ වෛජයන්ත ප්‍රාසාදය හා ඉතා සිත් කළු වූ හාව භාව ලීලා කටාක්ෂ මඳ ස්මිතයෙන් යුක්ත වූ දිව්‍යාප්සරාවනුත් අති මනෝහර වූ ශක්‍ර සම්පත්තියත් දැකැ, දිව්‍ය ලොකොත්පත්තියෙහි තෘෂ්ණාව කොටැ, "මට මේ මණ්ඩූක භක්ෂණය කරන්නා වූ ආත්ම භාවයෙන් ප්‍රයෝජන කිම් ද?"යි නාග භවනයට ගොස් දෙ මවු පියන් අතින් විචාරන්නාහු, "මැණියන් වහන්ස, පියාණන් වහන්ස, මම පෙහෙවස් රැකැ දිව්‍ය ලෝකයෙහි උපදනා කැමැත්තෙමි. එ හෙයින් මට පෙහෙවස් රක්ෂා කිරීමට අවසර දුන මැනැවැ" යි කී හ. එ බස් ඇසූ දෙ මවු පියෝ, "යහ පත පුත, පෙහෙවස් රකුව. පෙහෙවස් රක්ෂා කරන්නා වූ තෙපි මෙ තැනින් ඔබට නො ගොස් මේ නාග භවනයෙහි ශූන්‍ය විමානයෙකැ හිඳැ පෙහෙවස් රකුව. නාග භව-නයෙන් ඔබට හියා වූ නයින් හට ගුරුළන් හා මනුෂ්‍යාදීන්

ගෙන් මහත් වූ භය උපදනේ යැ',යි කී හ. මහ බෝ සතාණෝ "යහ පතැ"යි පිළිගෙනැ, ඒ නාග භවනයෙහි මැ ශුන්‍ය විමාන ආරාමොද්‍යානාදියෙහි වැසැ, පෙහෙවස් රක්‍ෂා කරන්නා හ.

36. එ කල්හි බෝසි සත්ත්වයන් ආතත විතතාදි වූ පඤ්චාඛ්‍යික තූසී ගත් අත් ඇති නාග කන්‍යාවෝ පිරිවරා ගන්නා හ. මහ බෝ සතාණෝ, "මෙහි වස්නා වූ මට උපෝෂථ කර්‍මය මසුනක ප්‍රාපත නොවන්නේ යැ. මනුෂ්‍ය පථයට ගොස් උපෝෂථ ශීලය රක්‍ෂා කෙරෙමි"යි සිතා, වළකති සි යන භයින් දෙමවු පියනට නොකියා මැ තමන් ගේ භාර්‍යා වූ නාග කන්‍යාවට කියා, "සොඳුර, මම මනුෂ්‍ය ලෝකයට ගොස් – යමුනා නම් ගං තෙරැ මහත් වූ නුග ගසෙක් ඇති, ඒ නුදුරැ තැනැ – තුඹසක් මත්තේ දරණ වැල ලා ගෙනැ චතුරඞ්ග සමන්නාගත වූ උපෝෂථ ශීලය ෂ්ටා වැදූ හෙවැ, පෙහෙවස් රක්‍ෂා කෙරෙමි. මා සියලු රාත්‍රියෙහි වැදූ හෙවැ පෙහෙවස් රක්‍ෂා කළ කල්හි, අරුණු නැඟෙන වේලෙහි තොප ගෙන් දස දෙනෙක් දස දෙනෙක් වාරයෙන් වාරයට තූසී භාණ්ඩ ගත් අත් ඇති වැ මා සමීපයට අවුත් මා ගඳින් මලින් පූජා නවා හී කියා කැඳැවා ගෙනැ නාග භවනයට එව"යි කියා, ඒ යමුනා නම් ගං තෙරැ පිහිටි නුග ගස සමීපයට ගොස් තුඹස මත්තෙහි දරණ වැල ලා ගෙනැ, "යමෙක් මා ගේ සම් මස් නහර ඇට ලේ කැමැත්තේ වී නම්, ඒ තෙමේ සම් ආදිය ගෙනැ යේව"යි කියා, සිවු අඟින් යුක්ත වූ පෙහෙවස් ඉටා, නඟුලිසක් පමණ ශරීරය මවා වැදූ හෙවැ, පෙහෙවස් රක්‍ෂා කළ හ. අරුණු නැඟෙමින් සිටියැ දී මැ නාග මානවිකාවෝ ගොස් මහ බෝ සතාණන් කී සැටියේ මැ පිළිපැදූ, නාග භවනයට ගෙනැ යන්නා හ. මෙ සේ මේ ප්‍රකාරයෙන් පෙහෙවස් රක්‍ෂා කරන්නා වූ ඒ බෝ සතාණනට බොහෝ කලෙක් ඉකුත් වූයේ යැ.

37. එ සමයයෙහි බරණැස් නුවර වහසල් දෙර ගම් වැසි වූ එක් බමුණෙක් සෝමදත්ත නම් පුතණු හා සමඟ වනයට ගොස්, උගුල් අටවීම යෑ, යතුරු දුනු තියීම යෑ, ය හුල් බැඳීම යෑ, මල එලීම යෑ, දුල් දැමීම යෑ යනාදියෙන් මුවන් මරමරා, මස් කඳින් ගෙන'වුත් විකොවෑ ජීවත් වන්නේ යැ. ඒ තෙමේ එක් දවසක් ගොයකු පමණකුත් නො ලැබෑ පුතාට කියන්නේ, "පුත සෝමදත්තයෙනි, ඉදින් සිස් අතින් ගියමු නම්, තොප ගේ මැණියෝ කිපෙති. එසේ හෙයින් යම් කිසිවක් අැරැ ගෙනෑ යම හ"යි කියා බෝධි සත්වයන් වැඳ හොත් තුඹසට අභිමුඛ වෑ ගොස්, පැන් බොන්නට යමුනාවට බස්නා වූ මුවන් ගේ පියවර සටහන් දැකෑ, "පුත, මුවන් යන්නා වූ මඟෙක් පෙනෙන්නේ යැ. එ සේ හෙයින් තෙපි ඉවත් වෑ ලා සිටුව. මම පැන් බොන්නට ආවා වූ මුවා විදිමි"යි දුන්න ගෙනෑ මුවන් ගේ ජම බලමින්. එක් ගසක් මුලෑ සිටියේ යැ. එ කල්හි එක් මුවෙක් සවස් වේලෙහි පැන් බොන්නට ආයේ යැ. වැදි බමුණා මුවා දැකෑ විද්දේ යැ. මුවා ශර ප්‍රහාරය ලදින් එ තන්හි නො වැටී ශර වේගයෙන් නැති ගන්වන ලද්දේ ලේ වගුරුවවගුරුවා දිවෑ ගත්තේ යැ. දෙ පුතු පියෝ ඔහු පස්සෙහි ලුහු බඳවා ගෙනෑ ගොස්, හුණු තැනෑ දී මැ සම ගසා මස් කොටෑ, මස් අැරැ ගෙනෑ, වනයෙන් නික්මෑ, හිරු අස්තයට යන වේලෙහි නාග්‍රෝධ වෘක්ෂය සමීපයට පැමිණෑ, "දැන් වේලා නො වෙයි. යන්නට නො පිළිවනැ. මෙ තැන්හි වසම හ"යි කියා මස් එක් තැනෙකැ තබා, ගස උඩ නැඟී වෙළෙප් අතුරෙහි වැදී හොත්තා හ.

38. බමුණා අලුයම් වේලෙහි පිබිදී, මුවන් ගේ අඬ අසන පිණිස කන තමා ලා වැදී හොත්තේ යැ. එ කෙණෙහි නාග මානවිකාවෝ අවුත් මහ බෝ සතාණන්ට මල් අස්නක් පැනැවූ හ. මහ බෝ සතාණෝ සපී වේශය අන්තර්ධාන කොටෑ, දිව්‍ය ශරීරයක් මවා,

සවිහරණයෙන් සැරිසරී ශක්‍ර දේවේන්ද්‍ර ලීලායෙන් පුෂ්පාසන මසහකයෙහි හුන්නාහු යැ. නාග මානවිකාවෝත් මහ බෝ සතාණන්ට සුවඳ මල් ආදියෙන් පූජා කොටැ, දිව බෙර ගසා නටන්නට ගී කියන්නටත් පටන් ගත්හ. එ කල්හි වැදි බමුණා ඒ භේරි තූයී ශබ්දය අසා, මේ තෙමේ කවරෙක් දෙහොත්?" යි, ඔහුගේ ප්‍රවෘත්තිය දනිම්හ"යි සිතා, "එම්බා පුතැ" යි කියාත් පුතා පොබයා ගත නොහී; "වත්නා ව. මේ තෙමේ හෝනේ මැ යැ. මේ මිරිකුණේ වනැ. මම මැ දෙමි"යි සිතා, වෘක්ෂයෙන් බැසැ, මහා බෝධි සත්ත්වයන් සමීපයට ගියේ යැ. නාග මානවිකාවෝ බමුණා දැකැ, තූයී භාණ්ඩයන් සමඟ පොලොව කිමිදැ නාග භවනයට මැ ගියාහු යැ. මහා බෝධි සත්ත්වයෝ එකලා වූහ.

39. එ කල්හි, බමුණා බෝධි සත්ත්වයන් සමීපයෙහි සිටැ විචාරන්නේ, "සුවඳ මල් ආදියෙන් පූජා කරන ලද මේ වන මධ්‍යයෙහි, රත් වූ ඇස් ඇති වැ, විශාල වූ වක්ෂස්ථල ඇති වැ උතුම් වූ රූප ශෝභායෙන් බබලන්නා වූ තෙපි කවුරැ ද? සවණී කේයූරාභරණයෙන් දුලන්නා වූ මනා වස්ත්‍ර අඳනා සත්හු දස දෙනෙක් තොප පිරිවරා තොපට නමස්කාර කොටැ සිටිති. ඔහු කවුරැ ද? තව ද දර්ශනීය වූ මහත් වූ බාහු ඇති මේ වන මධ්‍යයෙහි හිතෙල් වත් කළ වත්නි සකඹයක් මෙන් විශේෂයෙන් දිලියෙන්නා වූ ශරීර ඇති වැ, සියලු වනය ඒකාලෝක කොටැ බබුළුවමින්, මේ පුණ්‍යාසන මසහකයෙහි ඉඳිනා වූ තෙපි කෙසේ වූ කෙනෙක් ද? මහානුභාව සම්පන්න වූ එක්තරා දිව්‍ය පුත්‍ර කෙනෙක් ද? නොහොත් අනුභාව ඇති නාග රාජ කෙනෙක් ද? තොප ගේ සැබෑ රූපය මට තත් වූ පරිද්දෙන් කියව"යි කී හ.

40. එ බස් අසා මහ බෝ සතාණෝ, "ඉදින් 'මම ශක්‍රාදීන් අතුරින් එක්තරා එකෙකිමි'යි කීම නම්, මේ බමුණා මා කී බස් අදහන්නේ මැ යැ. එ තෙකුදු වුවත්

අද මා විසින් සැබෑ බසක් මෑ කියන්නට වටනේ යැ" යි සිතා තමන් නාග රාජ තියාව කියන්නාහු, "මම මහත් වූ සෘද්ධානුභාව ඇති උග්‍ර වූ විෂ තේජස් ඇත්තා වූ අන්‍ය සත්ත්ව කෙනකුත් විසින් මැඩෑ පැවැත්වියැ නො හැක්කා වූ නාග රාජයෙක්මි. ඉදින් මම කිපී, වසත්‍රාභරණ ධන ධාන්‍යාදීන් සමෘද්ධ වූ ජන පදයක් වී නමුත් දෙට කෙළෙමි නම්, මා ගේ දළ වැදූ ගත් පමණෙකින් පොළොව හා සමඟ සියලු ජන පදය භස්ම වන්නේ යැ. මා ගේ මෑණියෝ සමුද්‍රජා නම් බිසොවු යැ. මා ගේ පියාණෝ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝ යැ. මම මා ගේ බෑයන් සුදර්ශන නා රජ්ජුරුවනට මල් වැ සිටියෙමි. පත් සියයක් යොදුන් පමණ ඇති නාග භවනයෙහි දිව්‍ය නාග රාජයෝ මා භූරිදත්ත නම් නා රජ්ජුරුවෝ යැ යි දනිති" යි කී හ.

8. නේසාද බ්‍රාහ්මණයා හා සෝමදත්තයා ද නාග භවනයෙහි විසීම.

41. මෙ සේ ද කියා මහ බෝ සතාණෝ සිතන්නාහු, "මේ බමුණා වණ්ඩ යැ, පරුෂ යැ, අති ගුණහීනයක් හට කියා මා ගේ උපෝෂථ ශීලයට අන්තරාය කරන්නට නිසි යැ. එ සේ හෙයින් මොහු නාග භවනයට ගෙනැ ගොස් මහත් වූ යසස් දී, මා ගේ උපෝෂථ ශීලය බොහෝ කලක් පැවැත්වූයේ වී නම් යහ පත් වන්නේ යැ" යි සිතූ හ. ඉක්බිත්තෙන් මහ බෝ සතාණෝ මෙ සේ සිතා ඔහට කියන්නාහු, "බමුණ තට මහත් වූ යසස් දෙමි. සිත් කලු වූ නාග භවනයට චර. මා හා සමඟ නාග භවනයට යම් හ" යි කී හ. එ බස් අසා බමුණා කියන්නේ, "ස්වාමීනි, මා ගේ පුත්‍රයෙක් ඇත. ඔහු එතොත් යෙමි" යි කී යැ. එ කල්හි මහ බෝ සතාණෝ "යව බමුණ, තා ගේ පුත්‍රයා කැඳැවා ගෙනැ එව" යි කියා තමන් ගේ වාස ස්ථානය කියන්නාහු, "ඉතා ගැඹුරු වූ හැම කල්හි මෑ සරකැවෙන්නා වූ සලා වැටුම් ඇති භයානක වූ යම් මේ ගංගාවෙක්

දුටුයේ ම නම්, මෙ සත්පුරුෂ ශ්‍රමණ වූ මා ගේ දිවිහැර වූ වාස ස්ථානය වන්නේ යැ. තව ද බ්‍රාහ්මණය, උභය තීරයෙහි වන ළැහැප්වලැ වසන්නා වූ මොනරුන් හා කොස් ළිහිණියන් ද විසින් රැව් පිළිරැව් දෙන්නා වූ නිල් වූ ජල තලා ඇති යමුනා නම් ගංගාව මේ මධ්‍යයෙහි වැහෙන්නේ යැ. එ බඳු වූ යමුනා නම් ගංගායෙහි පිහිටියා වූ ආචාර ශීලයෙන් යුක්ත වූවත් වසන්නා වූ ශාන්ත වූ ක්ෂේම භූමියට තා අතීත වැ වැදූ වාසය කරව"යි කී හ. එ බස් ඇසූ බමුණා, ගොස් තමා ගේ පුත්‍රයාට එ පවත් කියා, ඔහු කැඳවා ගෙනැ ආයේ යැ. මහ බෝ සත්ත්වයාණෝ ඔවුන් දෙ දෙනා ම කැඳවා ගෙනැ, යමුනා නම් ගං තෙරට ගොස්, එ තැන්හි සිටැ කියන්නාහු, "බමුණ, තෝ තා ගේ පුත්‍රයා හා සමඟ අප ගේ නාග භවනයට පැමිණ, මා සන්තක වූ වස්තු කාම ක්ලේශ කාමයෙන් පුදන ලදු වැ, ඒ නාග භවනයෙහි සැප සේ වසව"යි කී හ. මෙ සේ කියා, මහ බෝ සත්ත්වයාණෝ දෙ පුතු පියන් තමන් ගේ අනුභාවයෙන් නාග භවනයට ගෙනැ හිය හ.

42. ඔවුන් දෙ දෙනාට ඒ නාග භවනයෙහි දී දිව්‍යාත්ම භාවය පහළ වූයේ යැ. එ කල්හි ඔවුනට මහ බෝ සත්ත්වයාණෝ මහත් වූ දිව්‍ය සම්පත් දී, සාර සියයක් සාර සියයක් නාග කන්‍යාවන් පාවා දුන් හ. ඔහු දෙ දෙන ඒ නාග භවනයෙහි වැසැ මහා සම්පත් අනුභව කළාහු යැ. මහ බෝ සත්ත්වයාණෝත් අප්‍රමාද වැ උපෝෂථ ශීලය රක්ෂා කරන්නාහු, දෙ පෝයෙන් දෙ පෝයෙහි දෙ මවු පියන් සම්පයට උපස්ථානයට ගොස් ධර්ම කථා කියන්නාහු, එ තැනැ සිටැ බමුණා සමීපයට ගොස් සුව දුක් විචාරා, "යමෙකින් තට ප්‍රයෝජන වී නම් ඒ මට කියව. උකටලී නො වැ සිත් අලවා වසව"යි කියා සෝමදත්තයා හාත් පිළිසඳර කථා කොටැ තමන් වසන තැනට යන්නා හ.

43. නේසාද බ්‍රාහ්මණයා හවුරුද්දක් පාසණ කල් නාග භවනයෙහි වැසැ, පින් මද හෙයින් උකටලි වැ මනුෂ්‍ය ලෝකයට සතු කැමැති වී යැ. සිත් කැලඹූ නාග භවනය නරකයක් මෙන් ද, අලඬකෘත වූ ප්‍රාසාදය බඹුනාගාරයක් මෙන් ද, සවිභරණයෙන් සැරසුණාවූ නාග කන්‍යාවෝ යක්ෂණියන් මෙන් ද වැටහුණාහු යැ. එ කල්හි ඒ බ්‍රාහ්මණයා සිතන්නේ, "මම උකටලී වීම්. සෝමදත්තයන් ගේ සිත් පරීක්ෂා කෙරෙමි" සි ඔහු සමීපයට ගොස් කියන්නේ, "කිමෙක්ද දරුව? උකටලී නොවී මේ නාග භවනයෙහි වසන්නෙහි දැ?" සි කී යැ. එ බස් අසා සෝමදත්තයා කියන්නේ, "කුමක් නිසා උකටලී වෙම් ද? මා උකටලී වූයේ නැත. පියාණන් වහන්ස, නුඹ වහන් සේ වූ කලී, මේ නාග භවනයෙහි කලකිරී ගිය සේක් දැ?" සි විචාළේ යැ. "එ සේ යැ පුතැ" සි කී කල්හි, "කුමක් නිසා දැ?" සි විචාළේ යැ. "තොප ගේ මෑණියන් හා මල් බැයන් ද නො දක්මෙනැ. චිරෝ පුත සෝමදත්තයෙනි, යම් හ" සි කී යැ. එ බස් අසා සෝමදත්තයා "නො යෙමි" සි කී යැ. නැවැතැ නැවැතැ පියාණන් ගේ යාචඤ්ඤයෙන් "යහ පතැ" සි හිඳිස්සේ යැ.

44. එ කල්හි නේසාද බ්‍රාහ්මණයා සිතන්නේ, "මා ගේ දරුවන් ගේ අභිප්‍රායයත් මම දනැ ගතිමි. ඉදින් මම භූරිදත්ත නම් නා රජ්ජුරුවනට 'මම නාග භවනයෙහි කලකිරී ගියෙමි'සි කීයේ වී නම්, මට වඩ-වඩා ලාබ යස පිරිවර දෙති. එ සේ කල්හි මා ගේ ගමන නො වන්නේ යැ. එක් උපායයෙකින් මැ ඒ නා රජ්ජුරුවන් ගේ සම්පත්තිය වණ්ණනා කොටැ, 'තෙපි මෙ බඳු වූ සම්පත් හැර කුමක් නිසා මනුෂ්‍ය ලෝකයට ගොස් පෙහෙවස් වසවු දැ?' සි විචාරා, සැඟී ලෝකෝත්තපත්තිය නිසා යැ'සි කී කල්හි, 'තෙපි වූ කලී මෙ බඳු සම්-පත් හැර සැඟී ලෝකෝත්තපත්තිය නිසා මනුෂ්‍ය ලෝකයට ගොස් පෙහෙවස් රක්ෂා කරවු ද? කිමෙක් ද, අපි අනුන් ගේ වාත්තියෙන් ජීවත් වමෝ ද? මමත් මනුෂ්‍ය ලෝක-යට ගොස් නැයන් දැකැ පැවිදි වැ මහණ දම් කෙරෙම්'සි

නා රජ්ජුරුවන් නිවිස්වා ගනිමි. එ කල්හි මට නාරජ්ජුරු-වෝ ගමන් අනුදනිති"යි සිතා එක් දවසක් මහා බෝධි සත්වයන් ගොස්, "කිමෙක් ද බමුණ, උකටලී නොවැ වෙසේ දැ?"යි විචාළ කල්හි, "නුඹ වහන්සේ සමීපයෙන් අපට දෙන වසතුයෙන් කිසි අඩුවෙක් නැතැ"යි කියා ගමන් පිළිබඳ කිසිවක් මැ නො කියා පළමු කොටැ ඒ මහ බෝ සතාණන් ගේ සම්පත් මෙසේ වර්ණනා කෙළේ යැ. "පින්වත් වූ කුරිදත්ත නම නා රජ්ජුරුවෙනි, තොප ගේ මේ නාග භවනයෙහි භාත්පසින් සියලු දිශා භාගයෙහි පෘථිවිය රන් රිදී මුතු මැණික් වැල්ලෙන් ගැවැසී ගත්තේ යැ. ඉතා සම තලා යැ. බොහෝ තුවරලා ගසින් සමන්විත යැ. රන් වන් වූ රතිඳු ගොවිවන් විසින් ගැවැසී ගත් උතුම් වූ නිල් පැහැ අැති හී තණ වනයෙන් ගැවැසී ගත්තේ යැ. සිත් කලු වූ වන ඝටයෙන් හොබනේ යැ. නවද සිත් කලු වූ හංසයන් විසින් 'ගද්ගද' ස්වරයෙන් නාද පවත්-වන ලද්දු වූ වගුළ පියුම් පෙත්තෙන් ගැවැසී ගත් ජල තලා අැති තොප ගේ කුශල සමෘද්ධියෙන් මනා වැ නිර්මිත වූ පුෂ්කරිණීහු නා නා ස්ථානයෙහි බබළන්නාහු සත්වයන් පිනවමින් සැදී සිටිය හ. තවද තොප වසන්නා වූ ප්‍රාසාදයෙහි අටැස් කොටැ කරන ලද වෛදූර්යමය වූ සියලු සතමහලයෝ වන්නා හ. ඒ වෛ-දූර්යමය වූ ටැඹින් දහසක් ටැම් අැති තොප වසන්නා වූ ප්‍රාසාදයෝ නාග කන්‍යාවන් විසින් පිරුණාහු විශේෂ-යෙන් බබළන්නා හ. තවද ඉතා විශාල වූ ශාන්ත වූ රම්‍ය වූ බොහෝ සැපයෙන් යුක්ත වූ එ බඳු වූ විමාන-යෙහි තොප ගේ දිව්‍ය වූ කුශලානුභාවයෙන් උපන්, යම් හෙයෙකින් දෙ දෙව් ලොවැ දෙවියනට අධිපති වූ **ශක්‍ර දේවේන්ද්‍රයන්** ගේ යසස් සමෘද්ධියක් වැනි වූ තොප ගේ මේ මහත් වූ ශ්‍රී සමෘද්ධිය වී ද, එ සේ හෙයින් තොප මේ රක්‍ෂා කරන්නා වූ උපෝෂථ ශීලයෙන් **ශක්‍ර දේවේන්ද්‍රයන්** ගේ වෛජයන්ත ප්‍රාසාදය හා මහත් වූ ශ්‍රී සමෘද්ධිය ද ප්‍රාර්ථනා කෙරෙති සි සිතමි" සි කී යැ.

45. එබස් අසා මහ බෝ සතාණෝ, "බමුණ, තෝ එ සේ නොකියව. ඒ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ ගේ යසස් බැලූ කලෑ අප ගේ යසස් මහ මෙර සමීපයෙහි තුබූ අබැටක් සේ වැටැහෙන්නේ යැ. අපි ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ ගේ සේවකයන් පමණකුත් නොවනමි හ" යි කියා, තවද කියන්නාහු, "බමුණ, අනුභාව සම්පන්න වූ ඒ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ ගේ යසස් නම්, තුන් සතර දවසෙකින් පස් දවසෙකින් මෙ තෙක්ලු යි කියා කියන්නා තබා, සිතින් සිතාත් නිමවා දක්කැ නොහැක්කේ යැ. ඒ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ තබා යම් සතර වරම් මහ රජ දරු කෙනෙක් උන් වහන්සේ පිරිවරත් නම්, ඒ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ නායක කොටැ පිරිවරා ඇවිදුනා වූ පඤ්චකාමය තමන් වශගයෙහි පවත්වන්නා වූ සතර වරම් මහ රජ දරුවන් ගේ යසසටත් අප තිරිසනුන් ගේ යසස සොළොස් වන කොටසයෙන් කොටසයකුත් නොඅගනේ වේ දැ?" යි කී හ. මෙසේ ද කියා, "ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේ ගේ විමානය තා ගේ වචන අසා සිහි කෙරෙමි. මම වූ ඝාලි වෛජයන්ත ප්‍රාසාදය ප්‍රාර්ථනා කරන්නෙමි උපෝෂථ ශීලය රක්ෂා කෙරෙමි" යි ඒ තමන් ගේ ප්‍රාර්ථනාව කියන්නාහු, "සැපයෙහි පිහිටියා වූ ඒ දේවතාවන් ගේ වෛජයන්ත ප්‍රාසාදාදි වූ මහත් වූ ශ්‍රී සමෘද්ධිය ප්‍රාර්ථනා කොටැ පෙහෙවස් ඉටා තුබිය මත්තේ වෙසෙමි" යි කී හ.

46. එ බස් අසා බමුණා, "දැන් මම අවසරයක් ලදිමි" යි සොම්නසට පැමිණෙ, ගමනට අවසර ඉල්ලන්නේ, "නා රජ්ජුරුවන් වහන්ස, මම මස් විකොටැ ජීවත්වනු සඳහා මුවන් පරීක්ෂා කොටැ ඇවිදුනෙමි, මා ගේ දරුවන් හා සමඟ මේ වනයට වනිමි. එසේ වනයට වත්නා වූ මා මළ බවත් උන් බවත් මා ගේ ඤාතියෝ නොදනිති. එසේ හෙයින් කෂ්ඩි රජ්ජුරුවන් ගේ දියණියන් ගේ පුත් වූ මහත් වූ යස පිරිවර ඇති කුරිදන්ත නම් නා රජ්ජුරුවෙනි, තොපට මම කියමි.

ඉදින් තෙපි අපට අවශ්‍ය දුන්නු නම්, අප ෝ නැයන් දුටුවෝ ය කී යෑ. ඉක්බිත්තෙන් මහ බෝ සතාණෝ කියන්නාහු "බ්‍රාහ්මණය, මෙ බඳු වූ වසතු කාම ස්ලේශ කාමයෙක් මනුෂ්‍ය ලෝකයෙහි සුලභ ෝ වන්නේ ය. ඒ සේ හෙයින් තෝ මා සම්පයෙහි ඇවැසි නම් ඒ සේ විසිම ඒකාන්තයෙන් මැ යහ පත් වන්නෝ ය. ඉදින් තෝ පඤ්ච කාමයෙන් පුදන ලදු වැ මා සම්පයෙහි වසන්නට නො කැමැත්තෙහි වී නම්, මම තට අවසර දෙමි. සැප සේ ගොස් තා ගේ නැයන් දැක සිත් සතුටු කරව" යි කී හ.

47. මෙ සේ කියා මහ බෝ සතාණෝ සිතන්නෝ, "මේ තෙමේ මා නිසා ජීවත් වේ නම්, මා පෙහෙවස් රක්‍ෂා කොටැ තුඹස මත්තේ වැදූ හෝනා නියාව කිසි කෙනකුනටත් නො කියන්නේ වේ ද? එ සේ හෙයින් මෝ හට ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නා වූ අනර්ඝ මැණික් දෙමි" යි සිතා, ඔ හට මැණික දෙන්නාහු, "එම්බා නේසාද බ්‍රාහ්මණය, යම් කිසිවෙක් මේ දිව්‍ය වූ මාණික්‍ය රත්නය ධරන්නේ වී නම් මේ මාණික්‍යානුභාවයෙන් ඒ තෙමේ වසතුවත් ගව මහිෂාදීන් හා දූ දරුවනුත්, අන්‍ය වූත් යම් කිසි ඓශ්වර්‍යයක් කැමැත්තේ වී නම් ඒ සියල්ලත් ලබන්නේ ය. රෝ දුක් නැති වැ සුඛිත මුදිත වන්නේ ය. එ බඳු වූ අනුභාව සම්පන්න වූ මේ මාණික්‍ය රත්නය ඇරී ගෙනැ ගොස් තා ගේ පුත්‍ර දාරාදීන් පෝෂ්‍යය කොටැ සැප සේ ජීවත් වව" යි කී හ. ඉක්බිත්තෙන් බමුණා කියන්නේ, "භූරිදත්ත නම් නා රජ්ජුරුවෙනි, තොප ගේ බස නිරවද්‍ය ය, සැබෑ මැ ය. එ බසට උත්තරයක් නොකියමි, සතුටු වෙමි. එ තෙකුදු වුවත් මම වූ කලි ජරාවට පැමිණියෙමි. එ සේ හෙයින් පැවිදි වෙමි. පඤ්ච කාමය ප්‍රාර්ථනා නො කෙරෙමි. එ සේ වූ මට මැණිකින් ප්‍රයෝජන කිම් ද?" යි කී ය.

9. තේසාද බ්‍රාහ්මණයා හා සෝමදත්තයා ද නැවැතැ මිනිස් ලොවට පැමිණි ම.

48. එඛස් අසා මහ බෝ සතාණෝ කියන්නාහු, "බමුණ, බ්‍රහ්ම චරියා වාසය නම් ඉතා දුෂ්කර දෙයෙකැ. එහි නොඇලුණ තැනැත්තවුට බ්‍රහ්ම චරියය භඞ්ග වන්නේ යැ. එ කල්හි ගිහි වූ තට සම්පත්තින් ප්‍රයෝජනයෙක් පෙනී ගියේ වී නම්, එ බඳු වූ අවස්ථායෙහි සැකයක් නැති වැ තෝ මා සමීපයට වර. එ කල්හි මම තට බොහෝ සම්පත් දෙන්නෙම් වේ දැ" යි කී හ. එඛස් අසා බමුණා කියන්නේ, "භූරිදත්ත නම් නා රජ්ජුරුවෙනි, තොප කී ඛස් සැබෑ මැ යැ. ජට මම උකහරයක් නොකියා සන්තුෂ්ට වෙමි. ඉදින් මට වසනුයෙන් ප්‍රයෝජනයක් පෙනී ගියේ වී නම්, එ දවස් තොප සමීපයට නැවැතත් එන්නෙම් වේ දැ" යි කී යැ. ඉක්බිත්තෙන් මහ බෝ සතාණෝ, ඒ බමුණා නාග භවනයෙහි වසන්නට අභිප්‍රායය නැති නියාව දුනැ, නාග මානවකයන් කැඳවා, "මේ බමුණන් ගෙනැ ගොස් මනුෂ්‍ය ලෝකයෙහි ලා පියව" යි කිවු යැ. එ බස් අසා නාග මානවකයෝ සතර දෙනෙක් බෝධි සත්ත්වයන් ගේ නියෝගයෙන් ඒ බමුණන් යමුනා නම් ගංගා-යෙන් උඩැ නහා බරණැස් නුවරට යන්නා වූ මාර්ග-යෙහි සිටුවූ යැ. මෙ සේ ඔවුන් දෙ දෙනා මාර්ගයෙහි සිටුවා, "තෙපි හැම යව" යි කියා නාග මානවකයෝ සතර දෙන නාග භවනයට පෙරළා ආවාහු යැ.

49. තේසාද බ්‍රාහ්මණයාත්, "පුත සෝමදත්ත-යෙනි, මෙතැනැ දී මුවකු විද්දම් හ, මෙතැන දී ඌරකු විද්දම් හ" යි පුත්‍රයාට කියන්නේ, අතර මහැ පොකුණක් දුකැ, "පුත සෝමදත්තයෙනි, නාම් හ" යි කී යැ. "යහ පත, පියාණන් වහන්සැ" යි කී කල්හි, දෙ දෙන මැ දිව්‍යාභරණ හා දිව්‍ය වස්ත්‍ර ද ගලවා අකුලා

පොදියක් කොටැ පොකුණු තෙර තබා දියට බැස නාන්නට පටන් ගත් හ. එ කෙණෙහි ඒ දිවැ වූ වසුදාරණ අනතඹාන වැ නාග භවනයට මැ හියේ යැ. පළමු ඔවුන් දෙ දෙනා නාග භවනයට යන දවස් ඇඳිරි ගෙනැ හිය කළු දැලි රෙදි දෙක මැ ඔවුන් දෙ දෙනාගේ හිණ වැලැඳැ ගත්තේ යැ. දුකු හි දඬු හා තෙප් හා මස් කපන කැති ආදිය ද ගත් අත් ඇති වැ පළමු පරිද්දෙන් මැ වැදි වෙසින් සිටියා හ. එ කල්හි සෝමදත්තයා, "පියාණන් වහන්ස, නුඹ වහන්සේ විසින් අපි නසන ලද්දමෝ වේ ද" සි හඬා වලපනට පටන් ගත. එ කල්හි පියා කියන්නේ, "පුත, තෙපි සැකයක් නො කරව. වලැ මුවෝ ඇත් නම්, වලින් මුවන් මරා ජීවත් වම හ" සි කියා පුතු අස්වැසි යැ.

50. සෝමදත්තයා ගේ මවු ඔවුන් දෙ දෙනා එන නියාව අසා පෙර මහට ගොස් කැඳවා ගෙනැ ගෙට අවුත්, බත් පැන් අනුභව කරවා සන්තර්පණය කළා යැ. වැදි බමුණු බත් අනුභව කොටැ නිදන්නට පටන් ගත්තේ යැ. එ කල්හි සෝමදත්තයා ගේ මවු පුතා අතින් විචාරන්නී, "පුත සෝමදත්තයෙනි, මෙ තෙක් කල් කොයි හියාහු දැ?" සි විචාළි යැ. "මැණියෙනි, භූරිදත්ත නා රජ්ජුරුවන් වහන්සේ විසින් නාග භවනයට ගෙනැ යන ලද්දමෝ, එහි බොහෝ දවසක් වැස කලකිරී ඔබැ සිටැ දැන් ආම හ" සි කීයැ. කිමෙක් ද, තොප විසින් යම් රත්නයෙක් නො ගෙනෙන ලද දැ?" සි කී කල්හි, "මැණියන් වහන්ස, නොගෙනාම හ" සි කීයැ. "කිමෙක් ද, තොපට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ විසින් කිසිවක් නො දෙන ලද දැ?" සි විචාළ කල්හි, "මැණියන් වහන්ස, භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ විසින් ම පියාණන් වහන්සේට කැමැති කැමැති වසතු සාදු දී ලන්නා වූ අනඝී වූ මාණික්‍යයෙක් දෙන ලද. මුන් වහන්සේ විසින් ඒ මැණික නො ගන්නා ලදැ" සි කීයැ. "කුමක් නිසා දැ?" සි විචාළ කල්හි, "'පැවිදි වෙමි' සි කියා මැණික නො ගත් සේකැ" සි කී යැ.

51. එ බස් අසා සෝමදත්තයා ගේ මවු, "මේ තෙක් කල් මුළුල්ලේ දරුවන් මට භාර කොටැ ලා ගොස් නාග භවනයේ වැසැ දැන් තෙපි පැවිදි වවු දැ?" සි කියා, ඒ බඳිනා සැන්දෙන් පිට මඛ්‍යයේ තලා, "කොල, දැහැට වූ බමුණ, 'පැවිදි වෙමි' සි කියා මාණික්‍ය රත්නය නො ගත්තා වූ නෝ එ සේ කලැ පැවිදි නො වී කුමක් නිසා දැන් මේ තෙනව අසි ද? මා ගේ ගෙන් නික්මෙව" සි කියා තැති ගැන්වූ යැ. එ කල්හි බමුණු කියන්නේ, "සොඳුර, තෙපි මට නො කිපෙව. වලැ මුවෝ අැත් නම්, ඒ මුවන් මරා මම තොපත් තොප ගේ දරුවන්ත් පෝෂ්‍යය කෙරෙමි" සි කියා, පුතු හා සමග වනයට ගොස්, පළමු පරිද්දෙන් මැ සතුන් මරා ජීවිකාවෘත්තිය කෙළේ යැ.

10. ආලම්බන මන්ත්‍රය.

52. එ සමයයෙහි, දක්‍ෂිණ මහා සමුද්‍රයෙහි දිස් හිඹුලේ වසන්නා වූ එස් ගරුඬ පක්‍ෂියෙක් පක්‍ෂ මාරුතයෙන් මුහුදු දිය දෙ බේ කොටැ, එස් නාග රාජයක්හු ගේ හිස ඩැහැ ගත්තේ යැ. එ සමයයෙහි ගරුඬයෝ නසින් අල්ලන්නට නො දනිති. පසු වැ පණ්ඩර නාග ජාතකයෙහි දී භූරිලෝ නසින් අල්ලන සේ දැනැ ගත්හ. ඒ ගරුඬ පක්‍ෂියා වූ කලි නාග රාජයා ගේ හිස ඩැහැ ගෙනැ, දෙ බේ වැ හිය දිය එස් වන්නට පළමු කොටැ මැ උඩ ඔසොවා, එල්ලා ගෙනැ, හිමාලය වන මසුනකයෙන් නික්මුණේ යැ.

53. එ කල්හි කසී රටැ වාසි වූ එස් බමුණෙක් ඍෂි ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වැ හිමාලය වන ප්‍රදේශයෙහි පන්සලක් කොටැ ගෙනැ වසන්නේ යැ. ඒ තපස්වීන් ගේ සත්මන් කෙළවරැ මහත් වූ නුග ගසෙක් අැති. තපස්වීහු ඒ නුග ගස මුලැ දිවා විහාර කොටැ වෙසෙති. එ කල්හි ගරුඬ රාජයා නුග ගසැ මත්තෙන් නාග රාජයා එල්ලා ගෙනැ යන්නේ යැ. නාග රාජයා එලෙන තැනැත්තේ, ගැලැවෙන පිණිස නඟුරින් නුග ගස

වෙලා ගත්තේ යැ. ගරුඩ පක්ෂියා ඔහු නුහ ගස වෙලා ගස් නියාව නො දැනැමැ මහත් වූ ශක්ති ඇති බැවින් ආකාශයෙහි පක්ෂ ප්‍රහාරය කොටැ නික්මුණේ යැ. නුහ ගස මුල් හා සමඟ උපුටැ පැනැ නැංගේ යැ. ගරුඩයා නා රජ්ජුරුවන් දික් භිඟුල් වනයට ගෙනැ ගොස් තුඩින් පැහැරි බඩ පලා නාග රුධිරය අනුභව කොටැ, ශරීරය සමුද්‍ර මසුකයෙහි හෙළුයේ යැ. නුහ ගස නාග රාජයා හා සමඟ සමුද්‍ර මසුකයෙහි වැටෙන්නේ, පවන් වැදූ ගෙනැ මහත් වූ ශබ්ද පැවැත්වූයේ යැ. එ කල්හි ගරුඩ රාජයා "මේ කවර ශබ්දයෙක් දෙහෝ?" සි තෙලෙ භිඟුලෙහි ඉඳැ යට බලන්නේ, නුහ ගස වැටෙන්නා දැකැ, "මේ නුහ ගස මා විසින් කො තැනෙකින් උපුටා ගෙනැ එන ලද්දේ දෙහෝ?" සි සිතා, "තාපසයන් ගේ සන්මන් කෙළවරැ සිටි මේ නුහ ගස වන්නේ යැ" සි තත්ත්ව හෙසින් දැනැ, "මේ නුහ ගස මේ තපස්වීන් වහන්සේට බොහෝ උපකාර වැ සිටියේ යැ. එ සේ හෙසින් මා විසින් අකුශලයෙක් රැස් කරන ලද්දේ දෙහෝ, නො හොත් රැස් නො කරන ලද්දේ දෙහෝ සි ඒ තපස්වීන් අතින් මැ විචාරා දනිමි" සි සිතා තරුණ මානවක වේශයක් මවා ගෙනැ ඒ තපස්වීන් සමීපයට ගියේ යැ.

54. එ කෙණෙහි තාපසයෝ ඒ නුහ ගස ඉදිරී ගිය තැන සම තලා කරන්නා හ. ගරුඩ රාජයා තාපසයන් වැඳැ එකත්පස් වැ ඉඳැ, නො දන්නා කෙනකුන් මෙන්, "ස්වාමීනි, මේ කුමක් පිහිටි තැනෙක් ද?" සි විචාළේ යැ. එ කෙණෙහි තාපසයෝ කියන්නෝ, "එක් ගරුඩ රාජයෙක් හොඳුරු පිණිස නයකු ගෙනැ යන්නේ, ඔහු නුහ ගස වෙළෙප නඟුටින් වෙලා ගත් කල්හි, තමා මහත් බල ඇති බැවින් දිවැ ගෙනැ ගියේ යැ. එ කල්හි මෙ තැන්හි සිටි නුහ ගස උපුටැ ගියේ යැ. මේ ඒ නුහ ගස උපුටැ ගිය තැනැ" සි කී හ. "කිමෙක් ද, ස්වාමීනි, ඒ ගුරුළාට අකුසල් වේ ද?" සි විචාළේ යැ. තපස්වී කියන්නේ, "ඉදින් ඒ තෙමේ නුහ ගස ඉදිරී

ලයකි යි නොදිනී නම්, එ බඳු වූ සිත් නැති බැවින් අකුසල් නොවෙයි" යි කී යැ. "ස්වාමිනි, නාග රාජයාට වූ කලි අකුසල් ඇද්ද, නැද්ද?" යි විචාළේ යැ. තපස්වී කියන්නේ, "ඒ නාග රාජයා, 'මේ ගස නසමි' යි වෙළා ගත්තේ නොවෙයි. තමා ගැලැවෙන පිණිසැ වෙළා ගත්තේ යැ. එ සේ හෙයින් ඕ හට අකුශලයෙක් නැතැ" යි කී යැ. ඒ ගරුඩ රාජයා තපස්වීනට සතුටු වැ, "ස්වාමිනි, මම ඒ ගරුඩ රාජයා වෙමි. නුඹ වහන්සේ ගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි විශේෂයෙන් සතුටු වීමි. නුඹ වහන්සේ වනයෙහි වසන සේකැ. මම සපියන් අල්ලන්නට සුදුසු වූ ආලම්බන මන්ත්‍රයක් දනිමි. මේ මන්ත්‍රය ඉතා අනඝ යැ. මම නුඹ වහන්සේට ඒ මන්ත්‍රය දෙමි. පිළිගත මැනවැ" යි කී යැ. තපස්වී, "මන්ත්‍රයෙන් ප්‍රයෝජන නැතැ" යි කී යැ. ගරුඩ රාජයා තපස්වීනට නැවැතැ නැවැතැ යාච්ඤා කොටැ ගිවිස්වා ගෙනැ මන්ත්‍රය දී ඖෂධයත් කියා ගියේ යැ.

55. එ කල්හි බරණැස් නුවර එක් දිළිඳු බමුණෙක් බොහෝ ණය ගෙනැ ණය දී ගත නොහී, ණය වැද්දන් විසින් තුඩැ වැකි බස් බණින ලද්දේ, ඉවසා ගත නොහී, "මට මෙහි විසීමෙන් ප්‍රයෝජන කිම් ද? වනයට වැදුමියැ යාම උතුමැ" යි සිතා, නුවරින් නික්මැ, ක්‍රමයෙන් අවුත් ඒ තපස්වීන් ගේ පන් සලට වැදුණ, තාපසයන් තමා ගේ මනා වූ වත් පිළිවෙත් ආදියෙන් සිත් ගෙනැ සිටියේ යැ. එ කල්හි තාපසයෝ "මේ බමුණා මට ඉතා උපකාරී යැ. එ සේ හෙයින් ගරුඩ රාජයා විසින් දෙන ලද දිව්‍ය මන්ත්‍රය මොහුට දෙමි" යි සිතා "බමුණ, මම ආලම්බන නම් මන්ත්‍රයක් දනිමි. ඒ මන්ත්‍රය තට දෙමි. නෝ ඒ මන්ත්‍රය ඇරැ ගනුව" යි කියා, "ස්වාමිනි, මට මන්ත්‍රයෙන් ප්‍රයෝජන නැත. නො කැමැත්තෙමි" යි කී කල්හි, නැවැතැ නැවැතැ නිමන්ත්‍රණය කොටැ ගිවිස්වා ගෙනැ, මන්ත්‍රය දුන්නාහු යැ. ඒ මන්ත්‍රයට සුදුසු වූ ඖෂධයත් මන්ත්‍ර විධිත් සියල්ල මැ කීහ. බමුණා, "මා විසින් ජීවත් වන්නට උපායයෙක් ලබන ලද" යි සතුටු වැ, කීප දවසක් එ නැන්හි මැ වැසැ "ස්වාමිනි, මට රුජා-

වෙක් පැහැරී පිඩා කරන්නේ යැ"යි ව්‍යාජයක් කියා ගෙනැ, තාපසයන් එසින් "පල" කියා හරන ලද්දේ, තපස්වීන් වැඳ ක්ෂමා කරවා ගෙනැ වනයෙන් නික්මැ ක්‍රමයෙන් යමුනා නම් ගං තෙරට පැමිණැ, ඒ මන්ත්‍රය පිරිවමින් මහ මාවතින් යන්නේ යැ.

56. එකල්හි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ පරිවාරිකා වූ දහසක් පමණ නාග මානවිකාවෝ ඊර්ෂ්‍යාසිඳිය කරන්නා වූ මාණික්‍ය රත්නය ගෙනැ, නාග භවනයෙන් නික්මැ, යමුනා නම් ගං තෙරැ වැලි ගොඩ මත්තෙහි තබා, මාණික්‍යාලෝකයෙන් සකල රාත්‍රියෙහි ජල ක්‍රීඩා කොටැ, අරුණෝද්ගමන වේලෙහි සවිහරණයෙන් සැරසී, මාණික්‍ය රත්නය පිරිවරා ගෙනැ තමනට මාණික්‍ය ශ්‍රී දක්වමින් උන් හ. බමුණාත් මන්ත්‍රය පිරිවමින් එ තැනට පැමිණියේ යැ. ඒ නාග මානවිකාවෝ මන්ත්‍රය පිරිවන අඬ අසා ලා මැ, "මොහු ගරුඩ රාජයෙක් විය යුතු යැ"යි භයින් ත්‍රාසත වැ, ඒ මාණික්‍ය රත්නය නො ගෙනැ පොළොව කිමිදී නාග භවනයට ගියා හ. බමුණා මාණික්‍ය රත්නය දැකැ, "දැන් මැ මා ගේ මන්ත්‍ර යෙහි ඵල සමෘද්ධියෙක් වී යැ"යි සතුටු සිත් ඇති වැ ඒ මාණික්‍ය රත්නය ගෙනැ නික්මුණේ යැ.

11. ආලම්බන-තේසාද භවුව.

57. එ කල්හි වැදි බමුණා සෝමදත්ත නම් තමා ගේ පුතු හා සමඟ මුවන් මරන පිණිස වනයට වැදී ඇවිදුනේ, ඔහු අතැ තුබූ මාණික්‍ය රත්නය දැකැ පුතුට කියන්නේ, "පුත, මේ මැණික අපට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ දුන් මැණික නො වේ ද?"යි කී යැ. "එසේ යැ පියාණන් වහන්ස, මේ ඒ මැණික යැ"යි කී යැ. "එසේ වී නම් මේ බමුණාට මේ මැණිකෙහි නුගුණ කියා මොහු වඤ්චා කොටැ මේ මාණික්‍ය රත්නය ගනුම හ"යි කී යැ. එ කල්හි සෝමදත්තයා කියන්නේ, "පියාණන් වහන්ස, නුඹ වහන්සේ පළමු භූරිදත්ත නා රජ්ජුරුවන් වහන්සේ මැණික දෙන ගමනේ නො ගත්

ලෙස්සෑ. දැන් වූ කලි, මේ බමුණා තුඹ වහන්සේ මෑ වඤ්චා කරන්නේ යෑ. මුවින් නො බැණෑ හුන මැනැවැ"සි කී යෑ. එ කල්හි නේසාද බ්‍රාහ්මණයා කියන්නේ, "වන්නා ව පුත, ඔහු ගේත් මා ගේත් වඤ්චා කරන්නට නිසි නො නිසි බව දන්නවා ද?"සි කියා, ආලම්බනයා හා සමඟ කථා කරන්නේ, "අහිවෘද්ධි කර වූ අභිමුතාපි සාදෘ දෙන්නා වූ සිත් කලු වූ රත්නයන් අතුරින් උතුම් වූ සර්වාකාරයෙන් සම්පූර්ණ වූ ලක්ෂණ සම්පන්න වූ මේ මැණික ඇරැ ගෙනෑ එන්නා වූ තොප කොයි දී මේ මැණික ලදද?"සි විචාළේ යෑ. ඉක්බිත්තෙන් එ බස් අසා ආලම්බනයා කියන්නේ, "බ්‍රාහ්මණය, මම අද උදෑසනැ මැ මහ මාවත යන්නෙමි, රත් වූ ඇස් ඇති දහසක් පමණ නාග මානවිකාවන් විසින් හාත්පසින් පිරිවරන ලද මේ මැණික ලැබිමි. මා දුකැ ඔහු හැම දෙන මැ නැති ගෙනැ, මේ මැණික හැරැ පලා ගියෝ යෑ"සි කී යෑ.

58. එ බස් අසා චැදි බමුණා ඔහු වංචා කරනු කැමැති වැ, මාණික්‍ය රත්නයෙහි අවර්ණ ප්‍රකාශ කොටැ තමා ගන්නා කැමැති වැ කියන්නේ, "යමෙක් මේ මාණික්‍ය රත්නයට උපචාර කරන්නට, තමා ගේ ජීවිතයක් මෙන් මැ මානය කරන්නට, පුදන්නට, මනා කොටැ තබන්නට, දන්නේ වී නම්, ඔහට මැ මේ මාණික්‍ය රත්නය මනා කොටැ උපචාර කිරීම්, පිදීම්, ධැරීම්, මානය කිරීම්, නිබීම්, වශයෙන් සම්භාවනා කරන ලද්දේ, සියලු ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නේ යෑ. තව ද මේ මාණික්‍ය රත්නය උපචාර විපන්න වූ සත්ත්වයා විසින් නිබීමෙන් වත් ධැරීමෙන් වත් නුනුවණින් නිරාදර වැ පරිහරණය කරන ලද්දේ වී නම්, ඔහට විනාශයට මෙය මැ සැහෙන්නේ යෑ. එ සේ හෙයින් මේ මාණික්‍ය රත්නයට උපචාර කොටැ සම්භාවනා කරන්නට සම්පූ වූ සත්ත්ව තෙමේ මේ මැණික ධරන්නට සුදුසු වන්නේ යෑ. අප ගේ ගෙයි බොහෝ මැණික් ඇත. එ සේ හෙයින් අපි මේ අනර්ඝ වූ මැණිකට කළ මනා විධි විධාන දනුම් හ. මම තට

මැණික් සියයක් දෙමි. නෝ ඒ ඇරී ගෙනැ මට මේ මාණික්‍ය රත්නය දෙව"සි කීයේ යැ. එ සේ කී පමණක් විනා, ඒ වැදි බමුණා ගේ ගෙයි එක රත්නයෙකුත් නැත්තේ යැ. ඒ බමුණා වූ කලි, ඒ මැණික කැමැති කැමැති වසකු සිඳ කොවැ දෙන නියාව දන්නේ යැ. එ සේ හෙයින් ඒ බමුණු සිතන්නේ, "ඉස් සෝධා නහා මැණිකට පැන් ඉසැ, 'මට මැණික් සියයක් දෙව' සි කියමි. එ කල්හි මේ මැණික තමා ගේ අනුභාවයෙන් මැණික් සියයක් දෙන්නේ යැ. මම ඒ මැණික් සියය මේ හට දෙමි"සි සිතා අතීත වැ, "මැණික් සියයක් ඇරී ගෙනැ මේ මැණික මට දී පියව"සි කීයේ යැ.

59. එ කල්හි **ආලම්බනඝා** කියන්නේ, "මේ මැණික ම ගෙන් කිසි කෙනකුන් විසින් ගව මහිෂාදි වසකුයෙන් වත් රන් රුවන් ආදියෙන් වත් විකිණී ගත යුතු නො වෙයි. මා ගේ මේ මැණික ලක්ඛණ සම්පන්න යැ. එ සේ හෙයින් කිසි වසකුවකට මිල කොටැ විකිණිය යුතු නො වෙයි" කී යැ. එ බස් අසා වැදි බමුණු කියන්නේ, "බමුණ, තා විසින් ගෙරි හරන් හා රන් රුවන් ආදියට මිල කොටැ මේ මැණික ඉදින් නො දියැ යුතු වී නම්, එ සේ කලැ මේ මැණික කවර වසකුවකට මිල කොටැ දියැ යුතු ද? ඒ මට කියව"සි කී යැ. එ පවත් අසා **ආලම්බනඝා** කියන්නේ, "බමුණ, යමෙක් තේජස් වූ අනෘ වූ සත්වයකු විසින් මැඩැ පැවැත්තැ නො හැක්කා වූ නාග රාජයකු වසන නැනක් මට කීයේ වී නම්, ඕ හට මම ප්‍රභා සමෘද්ධියෙන් බබළන්නා වූ මේ මැණික දෙමැ"සි කී යැ.

60. එ බස් අසා **නේසාද** බ්‍රාහ්මණයා කියන්නේ, "බ්‍රාහ්මණ වේශයෙන් ඇවිදිනා වූ තෝ පක්ෂීනට නායක වූ ගරුඩ රාජයෙක් ද? ගරුඩ රාජයකු හෙයින් වේ ද, ගෝචරයට සුදුසු වූ නයකු වසන නැන් විචාරන්නේ? තා ගුරුළකු විය යුතු යැ සි සිතමි"සි කී යැ. එ කල්හි **ආලම්බනඝා** කියන්නේ, "මම ගරුඩ රාජයෙක් නො වෙමි. ගරුඩ රාජයන් මා දුටු වීරූ වත් නැත. සර්පයන්

මදීනය කිරීම් ඇති **ආලම්බන** නම් වූ විෂ වෛද්‍යවාසී වූ බ්‍රාහ්මණයෙකැ යි ලෝ වැස්සෝ මා දනිති" යි කී යැ. එ බස් අසා වැදි බමුණා කියන්නේ, "**ආලම්බනය**, තා ගේ කවර බලයෙක් ඇද්ද? තා ගේ කවර ශිල්පයෙක් ඇද්ද? කවරකු උපසංහාර කොටැ එළැඹැ සර්පයන් කෙරෙහි නිරාදර වන්නෙහි ද?" යි කී යැ.

61. එ කල්හි **ආලම්බනයා** තමා ගේ ශක්තිය ප්‍රකාශ කොටැ කියන්නේ, "කෞශික ගෝත්‍ර ඇති, පැවිදි වූ බොහෝ කල් ඇති, වල්හි වසන්නා වූ එන් සෘෂි කෙනකුත් වහන්සේට ගරුඩ රාජයෙක් නිරුත්තර වූ උතුම් වූ විෂ මන්ත්‍රයක් කී යැ. භාවනාභියෝගයෙන් වඩන ලද සිත් ඇති හිමාලය පර්වත ප්‍රාන්තයෙහි වසන්නා වූ ඒ තපස්වීනට රෑ දුවල් නොපමා වැ සකස් කොටැ උපස්ථාන කෙළෙමි. එ කල්හි මා විසින් සිත් ගෙනැ අත් පා මෙහෙවර කරන ලද්දා වූ උතුම් වූ ශීල ව්‍රත සමාදානයෙන් හා බ්‍රහ්ම චර්යයෙන් යුක්ත වූ තපස්වීන් වහන්සේ නමන් වහන්සේ ගේ අභිප්‍රායයෙන් මැ, මා විසින් කරන ලද යාච්ඤාවක් නැති වැ, දිව්‍ය වූ **ආලම්බන** මන්ත්‍රයක් උගන්වා ඖෂධ කියා ඊට නිසි විධි විධාන **සත්** කී සේකැ. මම ඒ මන්ත්‍රය උපසංහාර කොටැ ඒ මන්ත්‍රානුභාවයෙන් සර්පයනට නොබෙමි. විෂ බාන්නට සමර්ථ වූ සත්ත්වයනට මම ආචාර්යයෙමි. ලෝකයෙහි **සත්ත්වයෝ ආලම්බන නම්** විෂ වෛද්‍යවාසී යැ සි මා දනිති" යි කී යැ.

62. එ බස් අසා **නේසාද** බමුණා සිතන්නේ, "මේ **ආලම්බනයා** යමෙක් මෝ හට නයකු දන්වූයේ වී නම්. ඕ හට මාණික්‍ය රත්නය දෙන්නේ යැ. එ සේ හෙයින් මෝ හට **සූරිදත්ත** නම් නා රජ්ජුරුවන් දක්වා මැණික ඇරැ ගනිමි" සි සිතා, ඉක්බිත්තෙන් පුතු හා සමඟ කථා කරන්නේ, "පුත **සෝමදත්තයෙනි**, මේ මැණික බමුණා අතින් ඇරැ ගනුමෝ ද? නොප සිතට් යහ පතැ සි වැටැහෙන්නේ නම් පරීක්ෂා කොටැ කියව. තමා කරා පැමිණි ස්ත්‍රී කාන්තාව දඹුයෙන් ගසා දුරු

කරන්නට කාරණ නොවන්නේ යැ. එසේ හෙයින් මේ අනඤ්ඤ වූ මැණික ඇරිගනුමෝ දැ?" යි කී යැ. එබස් අසා සෝමදත්තයා කියන්නේ, "බමුණාණන් වහන්ස, ඒ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ නාග භවනයට පැමිණියා වූ නුඹ වහන්සේට දිව්‍ය වූ වස්තු කාම ක්ලේශ කාමයෙන් සත්කාර සම්මාන කළ සේකැ. එසේ හෙයින් සත්පුරුෂ වූ නා රජ්ජුරුවන් වහන්සේට නුඹ වහන්සේ කුමක් නිසා මෝහයෙන් ද්‍රෝහ කරන්නට සිතන සේක් ද? ඉදින්, පියාණන් වහන්ස, නුඹ වහන්සේ වස්තු කැමැති සේක් වී නම්. භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ දෙන සේකැ. උන් වහන්සේ සමීපයට ගොස් ඉල්ලුව මැනැවැ, එ කල්හි නුඹ වහන්සේට උන් වහන්සේ බොහෝ වස්තු දෙන සේක් වේ ද" යි කී යැ.

63. එබස් අසා වැදි බමුණා කියන්නේ, "පුත, සෝමදත්තයෙනි, තෙපි ඉතා බාල යැ. එසේ හෙයින් ලෝක ව්‍යවහාර නොදනුව. මම මූ කළ හෙයින් සියලු ලෝක ප්‍රවෘත්ති දනිමි. යමෙක් අතට පැමිණියේ නම් වත්, භාජනයට පැමිණියේ නම් වත්, ඉදිරියෙහි තබන ලද්දේ වී නම් වත්, අනුභව කරන්නට උතුම් වන්නේ යැ. දුරු තුබූ දෙයින් ප්‍රයෝජන නැත. එසේ හෙයින්, පුත, සෝමදත්තයෙනි, තමා කරා පැමිණි ස්ත්‍රී කාන්තාව ගසා දුරු කරන්නාක් මෙන් හයත ප්‍රාප්ත වූ මේ මාණික්‍ය රත්නය ඇරි නොගෙනැ ඉවත් කොටැ පිම කාරණ නොවෙ" යි කී යැ. එ කල්හි සෝමදත්තයා කියන්නේ, "පියාණන් වහන්ස, යමෙක් මිත්‍ර ද්‍රෝහ කම කෙළේ වී නම්, ඒ සත්ත්ව තෙමේ රෞද්‍ර වූ නරකයෙහි පැසෙන්නේ යැ. තව ද මිත්‍ර ද්‍රෝහි වූ සත්ත්වයා ජීවත් වැ හින්දූ දී මැ පොළොව පැළී විවර වැ නරකයට ගෙනැ යන්නේ යැ. තව ද මිත්‍ර ද්‍රෝහි වූ, අසත්පුරුෂ ගුණ ඇති, තමා හට වන වැඩ නසන්නා වූ සත්ත්ව තෙමේ, ඉදින් ජීවත් වැ ඛුන්නේ වී නමුත්, බත් පැන් නොලැබැ වියැළී මනුෂ්‍ය ප්‍රේත වන්නේ යැ. එසේ

හෙයින් නුඹ වහන්සේ එ බඳු වූ මිත්‍ර ද්‍රෝහ කම් නොකළ මැනැවැ. ඉදින් වසඟ කැමැති සේක් වී නම් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේට වසඟ දෙන සේකැ. ඉදින් නුඹ වහන්සේ මා කීවා නොකොටැ අසත්පුරුෂ කම් කළ සේක් වී නම්, ඒ පාපය නොබෝ කලෙකින්මැ නුඹ වහන්සේට විපාක දේ යැයි සිතමි"යි කී යැ.

12. භූරිදත්ත දමනය.

64. එ බස් අසා බමුණා කියන්නේ, "පුත, සෝමදත්තශෙනි, තෙපි බාලයව. එසේ හෙයින් තොප දන්නා කාරියෙක් නැති. මම වූ කලී සියලු යහ පත නපුර දනිමි. මා කියන්නක් අසව. මේ ලෝකයෙහි බ්‍රාහ්මණයෝ නම් යම් කිසි අකුශල කර්මයක් කොටැ පියා යාඟ කර්මයෙන් පාප ප්‍රවාහය කොටැ පිරිසුදු වෙති. එ සේ හෙයින් අපිත් යාඟ කොටැ පියම හ. එ කල්හි කළා වූ අකුශල කර්මයෙන් මිදී යන්නමෝ වේ ද"යි කී යැ. එ කල්හි සෝමදත්තයා කියන්නේ, "පියාණන් වහන්ස, මෙ සේ පාප කාරී වූ මෙ ලෝ පර ලෝ නොදන්නා වූ නුඹ වහන්සේ හා සමඟ අද මම එක පියවරක් පමණකුත් නොයමි. එබැවින් දැන් මැ පලා යෙමි" යි කී යැ. මෙ සේ ද කියා නුවණැති මානවකයා පියාණන් සිතට තමා ගේ වචනය නංවා ගත නොහී, මහත් වූ ශබ්දයෙන් දේව තෝජක්ඛානය කොටැ, "මෙ බඳු වූ පාපකාරී වූ තැනැත්තන් හා සමඟ නොයෙමි"යි කියා, පියාණන් බල බලා සිටියැ දී මැ පලා ගොස්, හිමාලය වනයට වැදී පැවිදි වැ, පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේ යැ.

65. ඉක්බිත්තෙන් නේසාද බ්‍රාහ්මණයා, "සෝමදත්තයා තමා ගේ ගෙය හැරී කොසි යේ ද?"යි සිතමින් ආලම්බනයා සමීපයට ගොස්, ඔහු මදක් නොසතුටු

වූ සිත් ඇති තියාව දැක්කෑ, "ආලම්බනය, තෝ සැකයක් නොකරව. තට භූරිදත්ත නම් නා රජ්ජුරුවන් දක්වමි"යි කියා, ඔහු කැඳුවා ගෙනෑ, නා රජ්ජුරුවන් පෙහෙවස් රකුෂා කරන තැනට ගොස්, තුඹස මත්තේ දරණ වැල ලා ගෙනෑ වැදූ හොත්තා වූ නා රජ්ජුරුවන් දැක්කෑ, නුදුරු තැනෙක්කෑ සිටෑ අත දික් කොටෑ කියන්නේ, "එම්බා බමුණ, තෙල මහ නා රජ්ජුරුවන් අල්ලා ගෙනෑ තා ගේ මැණික මට දී පියව. තව ද යම් නා රජ්ජුරු කෙනකුන් ගේ රතිඳු ගොව්වන් පිටෑ පෑ සමාන වූ රතු වූ ඔස් ඇද්ද, මනා කොටෑ පොලන ලද පුලුන් පිඬක් වැනි වූ ධවල වූ ශරීර ඇද්ද, එබඳු වූ රූප ශෝභා ඇති මේ නා රජ්ජුරුවෝ තුඹස මත්තේ වැදූ හොඳිති. බමුණ, තෝ ඒ නා රජ්ජුරුවන් අල්ලා ගෙනෑ"යි කීයෑ.

66. එ සැල්හි මහ බෝ සතාණෝ ඇස දල්වා බලා, වැඳි බමුණා දැක්කෑ, "මේ තෙමේ මා ගේ උපෝෂථ ශීලයට අන්තරාය කරන්නේ යෑ"යි සිතා, මොහු නාග භවනයට ගෙනෑ ගොස් මහා සම්පත්තියෙහි පිහිටෑවිමි. මා විසින් දුන් මැණික එ දවස් නොගත්තේ යෑ. දැන් වූ කලි අහි ගුණ්ඩික බ්‍රාහ්මණයකු ගෙනෑ ආයේ යෑ. ඉදින් මම මේ මිත්‍ර ද්‍රෝහියාට කිපි හියෙමි වී නම්, මා ගේ ශීලය බණ්ඩ වන්නේ යෑ. මා විසින් පළමු චතුරඞ්ගයෙකින් යුක්ත වූ උපෝෂථ ශීලය ඉටන ලද. එ සේ හෙයින් ඒ තෙමේ සිටී තැනැ මැ සිටිව"යි, "ආලම්බනයා වූ කලි මා කඩ කඩ කොටෑ කපා නමුත්, අඟුරේ ලා පලහා නමුත්, උලෑ අවුණා නමුත්, ඕ හට මම කිපි විෂ ධූමයක් වත් විෂ වාතියක් වත් හැරී පිඬාවක් නොකෙරෙමි"යි සිතා, "ඉදින් මම මොවුන් දෙ දෙනා කිපි බලා පූයෙමි වී නම් විෂ තේජසින් රඹු මිටක් මෙන් සුනු විසුනු වන්නාහු යෑ. එ සේ සැල්හි මා ගේ උපෝෂථ ශීලය බිඳී යන්නේ යෑ"යි ඇස පියා ගෙනෑ, අධිෂ්ඨාන පාරමිතාව පෙරදැරි කොටෑ, දරණ වැල අස්සේ ඉස නඹා ගෙනෑ නිශ්චල වෑ වැදූ හොත්තාහු යෑ.

67. එ කල්හි නේසාද බ්‍රාහ්මණයාත්, "පින්වත් වූ ආලම්බනයෙ, මේ නා රජ්ජුරුවන් අල්ලා ගෙනැ මැණික මට දී පියව"යි කී යැ. ආලම්බනයා නා රජ්ජුරුවන් දැකැ ලා මැ සතුටු වූ සිත් ඇති වැ, මැණික කිසිවක් කොටැත් නො සිතා නිරාශ වැ "බමුණ, මේ මැණික අරැ ගනැ"යි කියා බමුණා අතට මැණික දැමුයේ යැ. ඒ මැණික ඔහු අසින් හිලිහි බිමැ වැටිණ. වැටුණු පමණෙකින් මැ පොළොවට වැදූ නාග භවනයට ගියේ යැ. වැදි බමුණා, මාණික්‍ය රත්නයෙනැ, භූරිදත්ත නම් නා රජ්ජුරුවන් හා මිත්‍ර ධර්මයෙනැ, පුත්‍රයා ගෙනැ යි තුනින් මැ පිරිහී සිතන්නේ, "කිසි පිහිටක් නැති වීමි. මා ගේ දරුවන් ගේ බස් නො ගිවිස්සෙමි" යි හඬමින් වලපිමින් තමා ගේ ගෙට ගියේ යැ.

68. **ආලම්බනයාත්** දිව්‍ය ඖෂධයෙන් තමා ගේ ශරීරය වසා ගෙනැ, මඳක් අනුභව කොටැ. ශරීරාභ්‍යන්තරයෙන් පරිභාවිත කොටැ, දිව්‍ය මන්ත්‍රය පිරුවමින් බෝධි සත්ත්වයන් කරා ගොස්, නහුට ඔසා අල්ලා ගෙනැ අැදූ, හිස තර කොටැ මිරිකමින් මුඛය අල්ලා ඖෂධ සපා බොධි සත්ත්වයන් ගේ මුඛයෙහි කෙළ වත් කෙළේ යැ. පවිත්‍ර ශීලී වූ නා රජ්ජුරුවෝ ශීල භේද භයින්, කිපී අැස දල්වාත් නො බැලූ හ. එ කල්හි අහි ගුණ්ඨික බ්‍රාහ්මණයා මහ බෝ සතාණන් ඖෂධයෙන් මත් කොටැ, නහුට අල්ලා ගෙනැ ඔසවා, හිස යටි කුරැ කොටැ සලා, අනුභව කළ ගොදුරු වමාරවා බිම දිගැ වැදූ හොවා සාල් බිස්සක් මිරිකන කලක් මෙත් දැතින් මැඩි යැ. එ කල්හි සකල ශරීරයෙහි අැවි සුණු විසුණු වැ යන්නාක් මෙත් වී යැ. නැවැතැ අහි ගුණ්ඨික බ්‍රාහ්මණයා නහුට අල්ලා ගෙනැ, රදවුන් පිළි අපුළන්නාක් මෙත් බිමැ අපුළා පී යැ. මහ බෝ සතාණෝ මෙ බඳු දුක් අනුභව කරන්නාහු කිසි විටෙකැත් බමුණාට නො කිපියෝ යැ.

13. නා රජු නැටැවීම.

69. මෙ සේ අහි ගුණ්ඨික බ්‍රාහ්මණයා මහ බෝ සතාණන් දුවිල කොටැ, වැලින් පෙට්ටියක් වියා ගෙනැ, මහ බෝ සතාණන් පෙට්ටියෙහි ලන්නට පටන් ගත. ශරීරය මහත් බැවින් ඒ පෙට්ටියේ නො වදනේ යැ. එ කල්හි බෝධි සත්ත්වයනට විළඹින් ඇනැ ඇනැ වදවා පෙළාව ඇරැ ගෙනැ එක් ගම-කට ගොස්, ගම මධ්‍යයෙහි පෙළාව තබා, "නසින් ගේ නැටුම් දක්නා කැමැති කෙනෙක් එත්ව" සි කියා හඬ ගැයේ යැ. එ කල්හි සියලු ගම් වැස්සෝ එ තැනට රැස් වූ හ. එ කෙණෙහි **ආලම්බනයා** "මහ නා රජ්ජුරුවෙනි, පෙළායෙන් නික්මෙව" සි කී යැ. එ කල්හි මහ බෝ සතාණෝ සිතන්නාහු, "අද මා පමිත් සතුටු කොටැ කෙළින්නට වටනේ යැ. එ සේ කල්හි **ආලම්බනයා** බොහෝ වස්තු ලැබැ සතුටු වැ මා හැරැ පියන්නේ යැ. එ සේ හෙයින් මේ අහි ගුණ්-ඨිකයා මා ලවා යමක් යමක් කරවනු කැමැත්තේ වී නම්, ඒ ඒ දෙය කෙරෙමි" සි සිතූ හ.

70. එ කල්හි අහි ගුණ්ඨිකයා නා රජ්ජුරුවන් පෙළා-යෙන් පිටත් කොටැ, "මහත් වෙව" සි කී යැ. මහ බෝ සතාණෝ එ බස් අසා මහත් වූ යැ. නැවැතැ "කුඩා වෙව" සි කී යැ. බෝධි සත්ත්වයෝ එ කල්හි කුඩා වූ යැ. නැවැතැ "වට වෙව" සි කී යැ. බෝධි සත්ත්වයෝ එ පරිද්දෙන් මැ කොළෝ යැ. "සතරැස් වැ, අටැස් වැ, සොළොසැස් වව" සි කී යැ. බෝධි සත්ත්වයෝ එ පරිද්දෙන් මැ කොළෝ යැ. නැවැතැ, "බිම හා සමඟ එකී යව" සි කී යැ. එ කල්හි බෝධි සත්ත්වයෝ කිසි කෙනකුනටත් නො පෙනෙන්නාක් මෙන් බිමැ අැලී හිඳෝ යැ. නැවැතැ, "පෙණ එකක් මවා ගනුව, දෙකක්, තුනක්, සතරක්, පසක්, සයක්, සතක්, අටක්, නවයක්, දසයක්, විස්සක්, තිසක්, සතළිසක්, පනසක් පෙණ මවා ගනුව" සි කී යැ.

එ කල්හි බෝ සතාණෝ පනසක් පෙණ මැවූ යැ. නැවැතැ "සියයක් පෙණ මවව" සි කී සැ. සියයක් පෙණ මැවූ යැ. නැවැතැ "උස් වැ යව. මිටි වැ යව. පෙනෙන්නා වූ ද, නො පෙනෙන්නා වූ ද, ශරීර ඇති වැ යව. පෙනෙන්නා වූ අසී ශරීර ඇති වැ යව. නිල් වැ යව. රත් වැ යව. සුදු වැ යව. මදට වත් වැ ගිනි දැල් හරැව. දිය කඳ හරැව. දුම් කඳ හරැව" සි කී කල්හි, මේ මේ ආකාරයෙන් ඒ අහි ගුණසික බ්‍රාහ්මණයා විසින් කී නො කී ආත්ම භාව මවා නැවුම් දක්වූ යැ.

71. ඒ දැකැ සමහර මනුෂ්‍ය කෙනෙක් කඳුළු බාරා බරා ගත නුහුණුවා හ. මනුෂ්‍යයෝ සතුටු වැ බොහෝ රත් රන් ද වස්ත්‍රාභරණාදිය ද දුන් හ. මෙ සේ ඒ බමුණා ඒ ගමින් ලක්ෂයක් පමණ වස්තු ලද්දේ යැ. ඒ අහි ගුණසික බ්‍රාහ්මණයා මහ බෝ සතාණන් අල්ලන ගමනේ දී, "ඒකාන්තයෙන් මැ දහසක් වස්තු ලැබැ මොහු හැරි පියමි" සි සිතූ තැනැත්තේ, එ තෙක් වස්තු ලැබැත් "මේ කුඩා ගම්වලැ දී ම විසින් මෙ තෙක් වස්තු ලබන ලද. නුවර වාසීනට නැවැවූ කල්හි කොපමණ බොහෝ වූ වස්තු නො ලැබේ ද?" සි වස්තු ලෝභයෙන් බෝධි සත්ත්වයන් හැරි නුදුයේ යැ.

72. ඒ බමුණා ඒ ගමැ දී මැ කුටුම්බ සණ්ඨාපනය කොටැ සත් රැවන්මය වූ පෙලාවක් කරවා, එහි මහ බෝ සතාණන් ලා ගෙනැ, සරහා පිළියෙළ කරන ලද සැප වූ යානාවකට නැඟි, මහ පෙරහරින් නික්මැ, බෝධි සත්ත්වයන් නුවරැ වාසල් දොරැ ගම සතර ප්‍රධාන කොටැ ඇති ඒ ඒ තැනැ මසක් පමණ කල් කෙළැවූයේ යැ. පසලොස් වක් දිනයේ වනාහි, "අද නුඹ වහන්සේට කෙළවම්" සි රජ්ජුරුවනට දන්වා යැවූයේ සැ. එ කල්හි රජ්ජුරුවෝ නුවරැ බෙර ලවා මහා ජනයා රැස් කැරැවූවෝ යැ. රාජාඩම්බරයෙහි මහා ජනයෝ ඇඳැ පිටැ ඇඳ තබා, මැසි පිටැ මැසි බැඳැ, නැවුම් බලන පිණිසැ ඒ මැසි ආදියට පැනැ නංගා හ.

14. සමුද්‍රජාවන් ගේ ශෝකය.

73. ඉක්බිත්තෙන් ආලම්බනයා විසින් මහ බෝ සතාණන් ඇල්ලූ දවස් මැ, බෝධි සත්ත්වයන් ගේ මෑණියෝ සිහිනයක් දක්නා තැනැත්තෝ, රත් ඇස් අැති කළු වූ පුරුෂයකු කඹුවක් ගෙනැ තමන් අත සපා, ලේ පෙරපෙරා ගෙනැ යන්නා දුට හ. මෙසේ දැකැ, **සමුද්‍රජාවෝ** හඬින් තැති ගෙනැ, නැඟිසිටැ, දකුණතැ අත ගා බලා සිහිනයක් නියාව දත්තු යැ. එ කල්හි **සමුද්‍රජාවනට** සිතෙන්නේ, "ම විසින් කකුශ වූ සිහිනයෙක් දක්නා ලද. එ සේ හෙයින් දරුවන් සතර දෙනාට වත්, **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් වහන්සේට වත්, මට වත්, උපද්‍රවයෙක් වියැ යුතු යැ" සි සිතිණ. එ තෙකුදු වුවත් මහ බෝ සතාණන් උදෙසා අධික කොටැ සිතිවිලි ගෙනැ ශෝක කළ හ. කුමක් නිසා ද යත්? "අවශේෂයෝ තමන් ගේ නාග භවනයෙහි වෙසෙති. මහා බෝධි සත්ත්වයෝ වූ කලි, සිල් රක්ෂා කිරීමෙහි බලවත් වූ අදහස් අැති බැවින් මනුෂ්‍ය ලෝකයට ගොස් පෙහෙවස් රක්ෂා කෙරෙති. එ සේ හෙයින් "මා ගේ පුතණුවන් අඟ ගුණඟිකයෙන් වත් ගරුඩයෙක් වත් අල්ලා ඇති දෙහෝ?" සි බෝධි සත්ත්වයන් ගැනැ මැ අධිකතර කොටැ සිතිවිලි කළ හ. ඉක්බිත්තෙන් දෙ පෝයක් ඉකුත් වූ කල්හි, මා ගේ පුතණුවෝ අඩ මසක් ඉකුත් වූ කලැ මා හැරැ වසන්නට පළමු අසමර්ථ වෙති. එ සේ හෙයින් ඒකාන්තයෙන් මැ උනට කිසි භයෙක් උපන්නේ වනැ" සි දෙමනස් වූ හ. තව ද මසක් ඉකුත් වූ කල්හි, **සමුද්‍රජාවන්** ගේ ඇසින් කඳුළු නො වැහිරෙන වේලෙක් නම් නැති. ළය වියැළි ගියේ යැ. හැඬීමෙන් දැස් රත් වැ ගියේ යැ.

74. **ඒ සමුද්‍රජාවෝ භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් ගැනැ ශෝක කෙරෙමින්, තමන් දකින්නට ආවා වූ ඒ **සුදර්ශන** නම් නා රජ්ජුරුවන් හා සමඟ

කිසි කථාවක් නොකළා ය. එකල්හි ඒ නාරජ්ජුරැවෝ සිතන්නෝ, "මා ගේ මෑණියන් වහන්සේ මා පෙරැ ආ කලැ සතුටු වන සේකැ. අද වූ කලි දෙමනසට පැමිණි සේකැ. මීට කාරණ කවරේ දෑ?" සි සිතා, ඉස්බිත්තෙන් මෑණියන් අතින් ඒ කාරණය විචාරන්නාහු මෙසේ කී හ: "මෑණියන් වහන්ස, පළමු නුඹ වහන්සේ දක්නට මා ආ කල්හි, මා හා සමඟ සතුටු වැ කථා කරන සේකැ. එසේ වූ නුඹ වහන්සේ මහත් යස පිරිවරින් සමෘද්ධ වැ ආවා වූ මා දැකැ දැන් කථා නොකරන සේකැ. දැන් නුඹ වහන්සේ ගේ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝත් ප්‍රසන්න නොවෙති. රන් කැඩ පතක් හා සමාන මුඛයත් කෘෂ්ණ වණ් වැ ගියේ යැ. තව ද මෑණියන් වහන්ස, අසින් මිරිකන ලද පද්මයෙක් යම් සේ මලානික වැ යේ ද, එමෙන් නුඹ වහන්සේත් මලානික වැ නිශ්ශෝභ වූ සේකැ. මෙබඳු වූ ශ්‍රී සමෘද්ධීන් නුඹ වහන්සේ දක්නා පිණිස ආවා වූ මා සමඟ පළමු පරිද්දෙන් සතුටු වැ කථා නොකරන්නේ කුමක් නිසා දෑ?" සි කිවු යැ. ඒ සමුද්‍රජාවෝ සුදර්ශන නම් නාරජ්ජුරැවන් විසින් මෙසේ කී කල්හි ද, බයක් බැණෑ නොනැංගා හ.

75. එකල්හි සුදර්ශන නම් නාරජ්ජුරැවෝ සිතන්නෝ, "කිසි කෙනකුන් විසින් ආක්‍රෝශ පරිභවයෙක් මුන් වහන්සේට කරන ලද්දේ දෙහෝ?" සි සිතා, ඉස්බිත්තෙන් එ පවත් විචාරන්නාහු, "මෑණියන් වහන්ස, පෙරැ නුඹ වහන්සේ, මා ආ කලැ සතුටු වැ සුව දුක් කථා කරන සේකැ. එසේ වූ නුඹ වහන්සේ දැන් මා හා කථා නොකරන සේකැ. නුඹ වහන්සේ ගේ මුඛයත් මලානික වැ ගියේ යැ. කිමෙක් ද, නුඹ වහන්සේට ආක්‍රෝශ පරිභව බිණීමෙන් පීඩාවක් කළ කෙනෙක් ඇද්ද? නොහොත් නුඹ වහන්සේ ගේ ශරීරයට බලවත් වූ වේදනාවෙක් ඇද්ද? ඒ මට නත් වූ පරිද්දෙන් කිව මැනැවැ" සි කිවු යැ. එ කල්හි නාරජ්ජුරැවනට සමුද්‍රජාවෝ

නමත් නො සතුටු වූ කාරණය කියන්නා හු, "පුත සුදර්ශනයෙනි, මිට මසෙකින් යටැ සුපිනයක් දක්නෙම, එක් කළු වූ රත් ඇස් ඇති පුරුෂයෙක් මා ගේ දකුණත කපා ගෙනැ ලේ පෙරපෙරා මා අඬ-ළින් සිටියැ දිමැ පලා ගියේ යැ. මම ඒ සුපිනය යම් දවසෙකැ දිටිමි නම්, එ දවස් පටන් අද දක්වා මැ මසක් දුතුරෙහි රාත්‍රි දිනයෙහි මා ගේ සිතට සැපයෙක් නම් නැත්තේ යැ"යි කිවු යැ.

76. මෙසේ ද කියා, "පුත, මා ගේ ප්‍රිය පුත්‍ර වූ තොප ගේ මලණුවන් නොදකිමි, උනට භයෙක් උපන්නේ වනැ සි සිතමි"යි කියා අඬන්නා වූ මැණියෝ මෙසේ කියා ඇඬූ හ. "මනා වූ හාව භාව ලීලා කටාක්ෂ මඳ සිතයෙන් යුක්තා වූ සර්වාභරණයන් පැලැන්ද වූ උතුම් වූ රූප ශෝභා ඇති සොළොස් දහසක් පමණ නාග මානවිකාවෝ යම් නා රජ්ජුරු කෙනකුන් පිරිවරා ඇවිදී සිත් ඇලැවූ ද, එසේ වූ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් අද මම නො දක්නෙම් වේ ද? තව ද පෙරැ සම් නා රජ්ජුරු කෙනකුන් උතුම් බඩිග පත්‍රයක් ධරන්නා වූ සුවර්ණාලංකාරයෙන් සැරැසුණු බැවින් සුපිපි කණිහිරි මල් වනයක් මෙන් බබළන්නා වූ නාග මානවකයෝ පිරිවරා ඇවිද්දෙ ද, එසේ වූ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් අද මම නො දක්නෙම් වේ ද? තව ද පුත සුදර්ශනයෙනි, එ බැවින් දැන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ මාලිගාවට ගොස් ධර්මයෙහි පිහිටියා වූ සිල්වත් වූ තොප ගේ බෑයන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් දකුම් හ"යි කියා සුදර්ශන නම් නා රජ්ජුරුවන් ගේත් තමන් ගේත් පණිත් හා සමග භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ මාලිගාවට ගියෝ යැ.

77. එ කල්හි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ බිසවු නාග මානවිකාවෝ බෝධි සත්ත්වයන් පෙහෙවස් රක්ෂා කරන්නා වූ තුඹස මත්තේ නො දැක, "මැණියන් වහන්සේ ගේ ගෙයි වනැ"යි නො සොයා නිශ්ශංක වැ වැඳ උන් හ. තව ද ඒ නාග මානවිකාවෝ "අප

ගේ **සමුද්‍රජාවන්** වහන්සේ පුතණුවන් නොදැකැ එන සේක් ල''සි අසා පෙර ගමන් කොටැ, ''ආර්‍යාවන් වහන්ස, නුඹ වහන්සේ ගේ පුතණුවන් වහන්සේ නොදක්නේ දැන් අදට මසෙකැ. මළ බවත් උන් බවත් නොදනුම් හ''සි මහ හඬින් හඬා දෙ පත්ලෙහි වැටී හුණ හ. එ කල්හි **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් ගේ මෑණියෝ යෙහෙළියන් හා සමඟ විපි මධ්‍යයෙහි දී අඩා වැලැපැ, ඔවුන් කෑදවා ගෙනැ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් ගේ ප්‍රාසාදයට් නැඟී, පුතණුවන් ගේ යහනත් සිංහාසනයත් බලා අඬන්නාහු මෙ සේ කියා ඇඬූ හ. ''සිස් වූ කැදැල්ලෙකැ දරැ මළ ළිහිණියක් යම් සේ බෙහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවේ ද, එ පරිද්දෙන් මැ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම බොහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවී නොසැනැහෙමි. තව ද දරැ මළ ළිහිණියක් සිස් වූ කැදැල්ල දැකැ ඒ ඒ තැනැ දිවැ ඇවිදී ද, එ පරිද්දෙන් මැ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම ඒ ඒ තැනැ දිවැ ඇවිදිමි. තව ද දරැ මළ කවුඩු ඩෙනුවක් සිස් වූ කැදැල්ල දැකැ බොහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවේ ද, එ පරිද්දෙන් මැ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම බොහෝ කලක් ශෝක දුඃඛයෙන් තැවෙමි. නොසැනැහෙමි. තව ද පැන් සිඳී ගිය මඩ වලෙකැ පිය වහුළ සත්වා ළිහිණියක් මසුන් නැති වැ යම් සේ ශෝක ගෙනැ ඉදී ද, එ පරිද්දෙන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම බොහෝ කලක් ශෝකාග්නියෙන් පැළැඟී සැනැඟීමකට නොපැමිණෙමි. කඹුරන් ගේ උදුන යම් සේ ඇතුළින් මැ දැ ද, පිටතින් නොදැ ද, එ පරිද්දෙන් මැ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් නොදක්නා වූ මම ශෝකාග්නියෙන් ඇතුළින් ම දැමී''සි කියා, මෙ සේ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන්

ගේ මැණියන් අඬන්නට පටන් ගත් කල්හි, උන් හා සමඟ අවශේෂයන් ඇඹිමෙන් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ මාලිගාව සමුද්‍ර ඝෝෂයක් මෙන් ඒක නිඝෝෂ විය. එක ද සත්ත්වයෙක් සිටි සේ සිටු පියන්නට ද අසමර්ථ විය. සියලු රාජ භවනය යුගාන්ත මාරුතයෙන් පැහැරී හෙළන ලද සල් වනයක් මෙන් වී ය.

15. බෑයන් භූරිදත්ත නා රජු සොයා යෑම.

78. එ කල්හි, අපිණ්ඩ යැ, සුභග යැ යන දෙ බෑයෝත් දෙ මවු පියනට උපස්ථානයට යන්නාහු, ඒ විලාප ශබ්දය අසා භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ මාලිගාවට වැදූ මැණියන් අස්වසන්නාහු, "මැණියන් වහන්ස, ශෝක නො කළ මැනැවැ. අස්වැසිලි ලද මැනැවැ. ලෝකයෙහි සත්ත්වයෝ චුතිය උත්පත්තිය දෙක ස්වභාව කොටැ ඇත්තා හ. මේ චුතිය උත්පත්තිය දෙකින් මිදුණා වූ එක ද සත්ත්වයෙක් නැත්තේ ය. එ සේ හෙයින් නුඹ වහන්සේ ශෝක නො කළ මැනැවැ" යි කී හ. එ බස් අසා සමුද්‍රජාවෝ කියන්නෝ, "දරුවෙනි, ලෝකයෙහි සත්ත්වයෝ උපදිති, මියෙති. චුතිය උත්පත්තිය දෙකින් නො මිදුණු නියාව මමත් දනිමි. එ තෙකුදු වුවත් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නො දක්නා වූ මම ශෝකයෙන් මඩනා ලදිමි. තව ද සුදර්ශන නම් නා රජ්ජුරුවෙනි, දැන් දැනැ ගනුව. ඉදින් අද මේ රාත්‍රියෙහි භූරිදත්ත නම් නා රජ්ජුරුවන් නුදුටුයෙම් නම්, මා දිවි නො තිබෙයි" යි කිවු ය. එ බස් අසා පුත්‍රයෝ කියන්නාහු, "මැණියන් වහන්ස, අස්වැසුණ මැනැවැ, ශෝක නො කළ මැනැවැ. බෑයාණන් වහන්සේ සොයා ඒ ඒ දිගැ ගොස් නො බෝ කලෙකින් උන් වහන්සේ මෙ තැනට ගෙනෙම් හ. තව ද ගිරි දුර්ග යැ, ගම් නියම් ගම් රාජ ධානි යැ, යන මේ සියලු තැනැ ඇවිදූ බෑයාණන් වහන්සේ දැකැ කැඳවා ගෙනැ එම් හ. දශ රාත්‍රියෙකින් මෙ පිටැ බෑයාණන් වහන්සේ ගෙන'වුත් පා ලන නියාව දුට මැනැවැ" යි කී හ.

ඉක්බිත්තෙන් සුදර්ශන නම් නා රජ්ජුරුවෝ සිතන්නෝ, "ඉදින් අපි තුන් දෙන මෑ එක් දිගකට ගියමෝ නම්, ප්‍රපඤ්ච වන්නේ යැ. එ සේ හෙයින් තුන් දෙන තුන් අතකට යන්නට වටනේ යැ. එක් කෙනකුන් දිව්‍ය ලෝකයටත්, එක් කෙනකුන් හිමාලය වනයටත්, එක් කෙනකුන් මනුෂ්‍ය ලෝකයටත් යා යුතු යැ. ඉදින් කාණාරිට්ඨයෝ මනුෂ්‍ය ලෝකයට ගියෝ නම්, යම තැනෙකැ දී භුරිදත්ත නම් නා රජ්ජුරුවන් දුටුහු නම්, ඒ ගමත් නියම ගමත් දවා අළු මිටක් කොටැ එසී, කකීශයෝ යැ, චණ්ඩ පරුෂයෝ යැ. එ සේ හෙයින් උන් මනුෂ්‍ය ලෝකයට යවන්නට නො පිළිවන් වන්නේ යැ"යි සිතා, "මල අරිෂ්ටයෙනි, තෙපි දිව්‍ය ලෝකයට යව. ඉදින් දේවතාවන් විසින් බණ අසනු කැමැති වැ භුරිදත්ත නම් නා රජ්ජුරුවෝ දිව්‍ය ලෝකයට මැ උන් කැඳවා ගෙනැ යන ලද්දෝ වූ නම්, ඒ දිව්‍ය ලෝකයෙන් උන් කැඳවා ගෙනැ එව"යි අරිෂ්ටයන් දිව්‍ය ලෝකයට යැවූ හ. සුභගයනට කියන්නෝ, "මල, සුභගයෙනි, තෙපි හිමාලය වනයට ගොස් පණ්ඩු මහා ගංගායෙහි භුරිදත්ත නම් නා රජ්ජුරුවන් පරීක්ෂා කොටැ එව" යි හිමාලය වනයට සුභගයන් යැවූ හ. තුමූ වනාහි මනුෂ්‍ය ලෝකයට යනු කැමැති වැ සිතන්නෝ, "ඉදින් මම මානවක වේශයෙකින් ගියෙම් වීම් නම්, මනුෂ්‍යයෝ මා දැකැ අැකිලෙති. මා විසින් තාපස වේශයෙකින් යන්නට වටනේ යැ: මනුෂ්‍යයනට වූ කලි ප්‍රව්‍රජිතයෝ ප්‍රියවන්නා හ. සිත් කලු වන්නා හ"යි සිතා ඒ සුදර්ශන නම් නා රජ්ජුරුවෝ තාපස වේශයක් මවා ගෙනැ මැණියන් වැඳැ නික්මුණා හ.

79. මහ බෝ සතාණනට වූ කලි අවිවිමුඛී නම් වෙන මවුන් නැඟණී කෙනෙක් ඇත. ඒ නැඟණියනට බෝධි සත්ත්වයන් කෙරෙහි බලවත් වූ ස්නේහය වන්නේ යැ. එ සේ හෙයින් ඒ වෙන මවුන් දරු වූ නැඟණියෝ සුදර්ශන නා රජ්ජුරුවන් දැකැ කියන්නෝ, "බෑයන් වහන්ස, ශෝකයෙන් බොහෝ සේ මිරිකෙමි.

මමත් නුඹ වහන්සේ හා යෙමි"යි කිවු යෑ. "මෑණියෙනි, මා හා සමඟ යන්නට නොපිළිවන. මම ප්‍රව්‍රජිත වේශයෙකින් යෙමි"යි කිවු යෑ. එසේ වී නම් මම කුඩා මැඩි පැටියක මෙන් නුඹ වහන්සේ ගේ දළ මඩුල්ල අස්සේ වැදූ හෙවෑ යෙමි"යි කිවු යෑ. "එසේ වී නම් එව"යි කී කල්හි, නාග මානවිකා තොමෝ මැඩි පැටියක වෙස් මවා ගෙනෑ, තපස්විත් ගේ ජවාව අස්සේ වැදූ හොත්තී යෑ.

80. **සුදර්ශන** නම් නා රජ්ජුරුවෝ, "මුලු පවත් විචාරා බලා පරීක්ෂා කොටෑ ගෙනෑ යෙමි"යි සිතා, බෝධි සත්ත්වයන් ගේ බිසෝ වරුන් අතින් බෝධි සත්ත්වයන් පෙහෙවස් රක්ෂා කළ තැන් විචාරා, පළමු කොටෑ ගොස් **ආලම්බනයා** විසින් බෝධි සත්ත්වයන් අල්ලා ගත් තැනෑ ලේ හා වැලින් පෙළාව කළ තැනුත් දුකෑ, "භූරිදත්ත නම් නා රජ්ජුරුවන් අහි ගුණ්ඨික බ්‍රාහ්මණයකු විසින් අල්ලා ගන්නා ලද්දේ වනෑ"යි දුනෑ, උපන්නා වූ බලවත් වූ ශෝක අැති වෑ, කඳුළු පිරුණා වූ දැසින් යුකත වෑ, **ආලම්බනයා** ගියා වූ මාර්ගයෙන් මෑ පළමු කොටෑ කෙළෑවූ ගමට ගොස් මනුෂ්‍යයන් අතින් විචාරන්නෝ "මෙ බඳු වූ නා රජ්ජුරු කෙනකුන් ගෙන'වුත් කිසිවෙක් මේ ගමෑ දී කෙළෑවූ දූ?"යි විචාළ හ. "අහි ගුණ්ඨික බ්‍රාහ්මණයකු විසින් මීට මසෙකින් මත්තේ මෙ ගමෑ දී කෙළවන ලදූ"යි කී කල්හි, "කිසිවක් ඔහු විසින් ලබන ලද දූ?"යි විචාලෝ යෑ. "එසේ යෑ, මෙ ගමින් ලක්ෂයක් වස්තු ලබන ලදූ"යි කී හ. "දැන් කොහි ගියෝ දූ?"යි විචාළ කල්හි, "අසුවල් ගමට ගියෝ යෑ"යි කී හ.

81. **ඒ සුදර්ශන** නම් නා රජ්ජුරුවන් එ තැන් පටන් විචාරමින් ක්‍රමයෙන් යන තැනැත්තෝ, රජ්ජුරුවන් ගේ මාලිගා දොරට ගියාහු යෑ. එ කෙණෙහි **ආලම්බනයාත්** ඉස්සෝධානහා, සකල ශරීරයෙහි සුවඳ විලෙවුන් ගල්වා, පට සඬක් හැඳ, රුවන් පෙළාව ගෙන්වා ගෙනෑ මාලිගා දොරට මෑ ගියේ යෑ. එ කල්හි මහා

ජනයෝ රැස් වූහ. රජ්ජුරුවනට ඉදිනා අසුන් පනවන ලදී. රජ්ජුරුවෝ මාලිගා ඇතුළේ මැ සිටැ කියන්නෝ, "මම දැන් එමි, නා රජ්ජුරුවන් අහි ගුණ්ඨික බ්‍රාහ්මණයාට කෙළවන්නව කියව" යි කියා යැවූ හ.

16. සුදර්ශන-ආලම්බන භවුව.

82. එ කල්හි ආලම්බනයා විසිතුරු ඇතිරියක් මත්තේ රුවන් පෙළාව නබා හැරී, "මෙහි එව නා රජ්ජුරුවෙනි" යි කී යැ. එ කෙණෙහි සුදර්ශන නම් නා රජ්ජුරුවෝ පිරිස් කෙළවරී සිටියා හ. මහ බෝ සතාණෝ පෙළායෙන් ඉස මැත් කොටැ ඒ සියලු පෂ්ත් බැලූ යැ. නාගයෝ නවන්නට පටන් ගත්නා අවස්ථායෙහි කාරණ දෙකෙකින් පෂ්ත් බලන්නාහු, ගරුඩයන්ගේ උපද්‍රවයක් වත් නැයන් වත් දක්නා පිණිස බලන්නා හ. ඒ නාගයෝ ගුරුළුන් දැකැ භයින් තැති ගෙනැ නො නවත්නා හ. නැයන් දැකැ ලජ්ජායෙන් නො නවත්නා හ. මහ බෝ සතාණෝ වූ කලි, පෙළායෙන් ඉස මැත් කොටැ ඒ සියලු පෂ්ත් අතරෙහි සිටියා වූ බැයන් සමීපයට ගියා හ. මහා ජනයෝ නා රජ්ජුරුවන් එන්නා දැකැ භයින් ත්‍රාසන වැ ඉවත් වැ ගියා හ. හුදෙකලා වැ සුදර්ශන නම් නා රජ්ජුරුවෝ සිටියා හ. මහ බෝ සතාණෝ, ගොස් ඒ තපස්වී නා රජ්ජුරුවන්ගේ පතුල් පිටැ හිස නබා ඇඹූ හ. මහ බෝ සතාණෝ අඬා වැලැපැ පෙරළා ගොස් පෙළාවට වන් හ.

83. ආලම්බනයා, "මේ නා රජ්ජුරුවන් විසින් තාපසයෝ දෂ්ට කරන ලද්දෝ වෙති. එසේ හෙයින් උන් අස්වසා ලමි" යි සිතා සමීපයට ගොස් කියත්තේ, "තපස්විනි, මා අතින් මිදුණා වූ මේ නා රජ්ජුරුවෝ ගොස් තොප ගේ දෙ පත්ලේ වැටී උන්නා හ. කිමෙක්ද, තොප දෂ්ට නො කොළෝ ද? ඉදින් තොප දෂ්ට කොවැ වූ නම් ඒකාන්තයෙන් විෂ බැම මට භාර වන්නේ යැ. තෙපි සැකයක් නො කරව, සැප සේ නො බා සිටුව" යි කී යැ.

84. එ බස් අසා සුදර්ශන නම් තපස්වී ආලම්බනයා සමඟ කථා කරනු කැමැති වැ කියන්නේ, "ආලම්බනය, නා ගේ මේ නා රජ්ජුරුවෝ, මට කිසි දුකක් කරන්නට අසමර්ථය හ. උන් තුමූ අද මා දෂ්ට කොටැ ගත නො හෙති. ලෝකයෙහි සර්පයන් අල්ලා කෙළවා අැවිදුනා වූ යම් පමණ අහි තුණ්ඩික බ්‍රාහ්මණ කෙනෙක් අැත්තෝ වූ නම් ඒ සියල්ලෝ මැ මට වැඩි නො වෙති. මම උන් අැමට මැ වැනිමි. මට වඩනා වූ අහි තුණ්ඩිකයෙක් මේ දඹදිව් තලයෙහි නැතැ"යි කී හ. එ කල්හි ආලම්බනයා "මූ තුමූ අසුවල් කෙනෙකැ"යි නො දනැ කිපි කියන්නේ, "තපස්වී වේශයෙන් අවුත් පණිත් මධ්‍යයෙහි සිටැ තමා හා සරියේ සමාන කොටැ වාසි කියන්නා වූ මේ තෙමේ කොබැ සිටැ අා එකෙක් ද? නුවණ නැති වියරු තුණු එකෙක් ද? මෙ තැනට රැස් වූ සියලු පණිත් මා කීවා අසත් වා. මා ගේ දෙමයෙක් නැති. මට නො කිපෙව. මම මේ නා රජ්ජුරුවන් ලවා මොහු දෂ්ට කරවමි" යි කී යැ. එ කල්හි සුදර්ශන නා රජ්ජුරුවෝ ඕ හට කියන්නාහු, "ආලම්බනය, තෝ මා නා රජ්ජුරුවන් ලවා දෂ්ට කරවූයෙහි වී නම්, මම මා ගේ මැණි පැටවා ලවා නා දෂ්ට කරවමි. මෙ තැනට රැස් වූ පණිත් හැම දෙන මැ මා කීවා අසත් වා. අප දෙ දෙනා ගේ මේ යුද්ධයෙන් පන් දහසක් වස්තු ඔට්ටු තිබියැ යුතු යැ. පැරැදි කෙනකුනට පන් දහසක් වස්තු දියැ යුතු යැ" යි කී හ. එ බස් අසා ආලම්බනයා කියන්නේ, "නාපසයෙනි, මම වූ කලි, ප්‍රසිද්ධ වැ ප්‍රභූ වැ සිටිමි. තෝ වූ කලි ඉතා දිළිඳු වැ සිටියෙහි යැ. එ සේ වූ තට අැප වන්නෝ කවුරු ද? ඔට්ටු තැබූ මිල දෙන්නෝ කවුරු ද? අැප හෝ ඔට්ටු හෝ කොයින් සොයවු ද? මා තිබියැ යුතු වූ පරදු වත් එ බඳු අැපයෙක් වත් අැත් නම් වහා තබමි. පන් දහසෙකින් මට ඔට්ටුව තිබියැ යුත්තේ යැ"යි කී යැ

85. සුදර්ශිනයෝ ඔහු ගේ බස් අසා, "අප දෙ දෙනා විසින් පත් දහසක් වසතු පරදු කොටැ තිබියැ යුතු යැ"යි කියා අතීත වැ රජ්ජුරුවන් ගේ මාලිගාවට නැඟි, මසිලඤ්ඤුවත් සාගර බ්‍රහ්මදත්ත නම් රජු සමීපයෙහි සිටැ කියන්නෝ, "මහ රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේට වැඩෙක් වේ වා. මා කිවා අසත් වා. කීර්තියෙන් යුක්ත වූ මහ රජ්ජුරුවන් වහන්ස, පත් දහසක් වසතුවට මට ඇප වුව මැනැවැ"යි කී හ. එ බස් ඇසූ සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සිතන්නෝ, "මේ තාපසයෝ බොහෝ සම්පත් මා අතින් ඉල්ලති. මීට කාරණ කිමෙක් දෙහෙ?"යි සිතා කියන්නෝ, "තපස්වීනි, කිමෙක් ද? තා අතින් පියාණන් වහන්සේ ඇරි ගෙනැ කෑ ණයෙක් ඇද්ද, නො හොත් තොප ගෙන් මා ඇරි ගෙනැ කෑ ණයෙක් ඇද්ද? අප ගේ දෙ පක්ෂයෙහි ඇත්තන් ගත් දුන් ණයක් නැති වැ තිබියැ දී කුමක් නිසා තෙපි මෙ සේ බොහෝ වසතු මා අතින් ඉල්ලවු දැ?" යි කී හ.

86. මෙ සේ කී කල්හි සුදර්ශින නම් නා රජ්ජුරුවෝ, "මේ ආලම්බනයා 'නා රජ්ජුරුවන් ඇරි ගෙනැ මා දෂ්ට කරවා ජය ගනිමි' යි කියයි. මම මා ගේ මැඩි පැටවා ගෙනැ බ්‍රාහ්මණයා දෂ්ට කරවා ජය ගනිමි"යි රජ්ජුරුවන්ට කියන්නෝ, "අගිවෘද්ධි කර වූ මහ රජ්ජුරුවන් වහන්ස, දැන් නුඹ වහන්සේ ක්ෂත්‍රිය සමූහයා පිරිවරා ඒ අප දෙ දෙනා ගේ යුද්ධය දක්නා පිණිස රාජාඩහණයට වැඩැ වදුල මැනැවැ. අප දෙ දෙනා ගේ යුද්ධයෙහි ඉදින් අහි ගුණ්ඩික බ්‍රාහ්මණයා පැරැදූ හියේ වී නම්, මට පත් දහසක් වසතු දෙන්නේ යැ. ඉදින් මම පැරැදූ හියේ වීම් නම්, මම ඕ හට පත් දහසක් දෙමි. එ සේ හෙයින් නුඹ වහන්සේ ගේ අතින් ඔවුටු තබන්නට බොහෝ වසතු ඉල්ලමි. නුඹ වහන්සේ නො ලස් වැ වහා දුන මැනැවැ. අප දෙ දෙනා ගේ යුද්ධය දක්නා පිණිස වැඩියැ මැනැවැ" යි කිවු යැ. රජ්ජුරුවෝ එබස් අසා, "එ සේ වී නම් යම් හ"යි කියා, තාපසයන් හා සමඟ නික්මුණා හ.

87. ඒ රජ්ජුරුවන් දැකැ ආලම්බනයා සිතන්නේ, "මේ තාපසයෝ ගිය ඇසිල්ලෙහි මැරජ්ජුරුවන් කැඳුවා අවු යැ. එසේ හෙයින් මුත් රාජ කුලූපග කෙනකුන් වියැ යුතු යැ"යි හය පත් වැ, ඒ තපස්විනට අනුවතීනය කොටැ කියන්නේ, "තාපසයෙනි, මා ගේ ශිල්ප විද්‍යා-යෙන් තෙපි ඉක්මැ නො පවතිවු. විෂ විද්‍යායෙන් තෙපි මහත් වැ සිටයවු. තොප හා සමාන කෙනෙක් නැත. එසේ වුවත් මා ගේ මහානුභාව සම්පන්න වූ මේ නා රජ්ජුරුවන් කිසිවක් කොටැත් නො සිතවු. උන් දිය බරණකු කොටැත් නො සිතා තිරාදර වැ පවත්නා හෙයින් එ පමණකට තොපට කාරණ කියමි"යි කී යැ. ඉක්බිත්තෙන් සුදශීනයෝ කියන්නෝ, "අහි ගුණ්ඨික බ්‍රාහ්මණය, මමත් විෂ විද්‍යායෙන් තා මැඩැ නො පවත්වමි. එ තෙකුදු වුවත් මේ විෂ නැත්තා වූ නා රජ්ජුරුවන් ඇරැ ගෙනැ ලෝක වාසි සත්වයන් අතීශයින් වඤ්චා කොටැ ඇවිදිනෙහි යැ. මේ නා රජ්ජුරුවන් විෂ නැති නියාව, මා දන්නා සේ මෙ ලෝ වැස්සෝ දනිත් නම්, තොපට අත් සුණු පමණකුත් නො ලැබෙන්නේ යැ. බමුණ, තට මුත් කෙළැවීමෙන් වසකු කොසින් ලැබේ ද? වසකුවෙකැ යන දෙයක් කැලැමැ නො ලබන්නෙහි වේ දැ"යි කිවු යැ.

17. ආලම්බන දමනය.

88. එ කල්හි ඒ තපස්විනට අහි ගුණ්ඨික බ්‍රාහ්මණයා කිපි කියන්නේ, "නිය සහිත වූ කකුශ වූ අඳුන් දිවි සම් අඳනා වූ ජටා ධර වූ කිසි සැරැහීමක් නැත්තා වූ අනි වූ තෝ මේ පණිත් මධ්‍යයව අවුත් මෙ සේ උග්‍ර වූ විෂ තේජස් ඇත්තා වූ මා ගේ මේ නා රජ්ජුරුවන් විෂ නැත්තේ යැ සි නින්ද කොටැ කියන්නෙහි යැ. එසේ වී නම් දැන් තෙපි උග්‍ර වූ විෂ තේජසින් සම්පුණී මේ නා රජ්ජුරුවන් සමීපයට ගොස්, උන් විෂ ඇති නැති නියාව පරීක්ෂා කොටැ බලව. ඉදින් තෝ ඒ නා රජ්-ජුරුවන් සමීපයට නිර්භය වැ ගියෙහි නම්, ඇසිල්-ලෙකින් ඒ නා රජ්ජුරුවන් තා අළු මිටක් මෙන්

කෙරෙති සි සිතමි" සි කී යැ. ඉස්බිත්තෙන් ඒ අහි ගුණ්ඩික බ්‍රාහ්මණයා හා සමඟ කෙළනා වූ සුදර්ශන නම් තපස්වීහු මෙ සේ කී හ. "අහි ගුණ්ඩිකය, ඉදින් ගැරඬියකු දිය බරණකු පණුවුල්ලකු පමණ වත් විෂ නැති රත් වූ හිස් ඇති මේ නාග රාජයා ගේ විෂයෙක් කිසිත් නැත්තේ යැ" සි කී හ.

89. එ කල්හි ආලම්බනයා සුදර්ශනයනට කියන්නේ, "තපස්විනි, 'මේ ලෝකයෙහි දුයකයෝ දන් දී සඟී ලෝකයට යන්නා හු යැ'සි කියා, නිඃක්ලේශි වූ කාය වාක් සංයමය ඇත්තා වූ තපස්වි වරයන් ගෙන් මා විසින් අසන ලද මැ යැ. එ සේ හෙයින් නොප විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයයෙහි දියැ යුතු කිසිවක් ඇත් නම්, ඒ සියල්ල ජීවත් වැ ඉන්දූ දී මැ දී පියව. මළ කලැ දන් දෙන්නට නො පිළිවන් වේ ද? මේ නාග රාජයා මහත් වූ ඍද්ධ්‍යානුභාව ඇත්තේ යැ. එ සේ හෙයින් ඔහු ලවා තා දෂ්ට කරවමි. එ තෙමේ තා විෂ තෙජසින් භෂ්ම කරන්නේ යැ"සි කී යැ. එ බස් ඇසූ සුදර්ශනයෝ කියන්නෝ, "'මේ ලෝකයෙහි දුයකයන් දන් දී සඟී ලෝකයට යන්නා හ' සි කාය වාක් සංයමය ඇත්තා වූ තපස්වි වරයන් ගෙන් මා විසිනුත් පළමු අසන ලද මැ යැ. එ සේ හෙයින් ඉදින් තා ගේ දියැ යුතු වසතුවෙක් ඇත් නම්, ජීවත් වැ හිත්දූ දී මැ දී පියව. මළ කලැ තට දන් දෙන්නට නො පිළිවන් වේ ද? මේ අච්චිමුඛී නම් මැඬි පැටි තොමෝ උග්‍ර වූ විෂ තේජසින් සම්පුර්ණ යැ. ඇය ලවා තා දෂ්ට කරවමි. ඕ තොමෝ තා දෂ්ට කොටැ භෂ්ම කරන්නී යැ. තව ද අච්චිමුඛී තොමෝ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ ගේ දූ වූ වෙන මවුන් දරැ වූ මා ගේ නැඟණියෝ යැ, උග්‍ර වූ විෂ තේජසින් යුක්ත-යෝ යැ. උන් ගේ විෂයෙහි උග්‍ර බව ඇසිල්ලෙකින් දක්නෙහි වේ ද?" සි කී හ.

90. මෙසේ ද කියා, "මැණියෙනි, මා ගේ ජටා අතුරින් නික්මැ අත්ලෙහි පිහිටාව"යි මහා ජනයා මද්ධ්‍යයෙහි දී මැ නැහැණියන් කැඳවා අත දිගු කොටැ දුයැ. එ කෙණෙහි අච්චිමුඛී නම් මැණි පැවි ඒ තපස්විත් බැණැවූ අඩ අසා, දළ මඩුවූ අස්සෙහි වැදී හොත් නැනැත්හි, තුන් විටෙකැ මැණි හඬ හඬා නික්මැ, දසරැයෙහි හිඳැ, පැනැ ගොස් අත්ලේ හිඳැ, විෂ බින්දු තුනක් තපස්විත් ගේ අත්ලෙහි හෙළා, නැවැතැ ඒ තපස්විත් ගේ දළ මඩුවූ අස්සට මැ වන. එ කල්හි සුදර්ශනයෝ විෂය අත්ලෙත් ගෙනැ සිටැ, "මේ ජන පදය විෂයෙන් මැ නස්තේ යැ" යි තුන් විටක් කිහ. උන් ගේ ශබ්දය දෙලොස් යොදුන් පමණ ඇති බරණැස් නුවර වසා සිටියේ යැ.

91. එ කල්හි රජ්ජුරුවෝ, "කුමක් නිසා ජන පදය නසී දැ?" යි විචාළෝ යැ. සුදර්ශනයෝ කියන්නෝ, "මහ රජ්ජුරුවන් වහන්ස, මේ විෂය ඉසැ පියන තැනක් නො දක්මි" යි කිවු යැ. "දරුව, පොළොව මහතැ. මේ පොළොයෙහි ඉසැ පියව" යි කී කල්හි, "නො පිළිවනැ, මහ රජ්ජුරුවන් වහන්සැ" යි කියා, රජ්ජුරුවන් ගේ බස් වළකා කියන්නා වූ සුදර්ශනයෝ, "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් අසා දන මැනැවැ. ඉදින් මම මේ විෂය බිමට දැමීම් නම්, බිමැ හට ගත්තා වූ තෘණ ලතා හා ඖෂධ වෘක්ෂයෝ සැකයක් නැති වැ ඒකාන්තයෙන් වියැළී යන්නා හ. එ සේ හෙයින් පොළොවට දමන්නට නො පිළිවනැ"යි කිවු යැ. එ බසට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කියන්නෝ, "එ සේ වී නම් දරුව, උඩැ ආකාශයට දමව" කී හ. එ බස් අසා සුදර්ශනයෝ "ආකාශයටත් දමන්නට නො පිළිවනැ"යි දක්වා කියන්නාහු "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් අසා වදුල මැනැවැ. ඉදින් මම මේ විෂය ආකාශයට දැමීම් නම්, සත් හවුරුද්දක් මුළුල්ලෙහි වැසි නො වස්නේ යැ. යටත්

පිරිසෙයින් ඉම බිත්දුවක් විවරත් ඕම නො වැටෙත්-නේ යැ" යි කිවු යැ. "එ සේ වී නම් මේ විෂය දියෙහි ඉසැ පියව"යි කී කල්හි, "දියෙහි ඉසැ පියන්නටත් නො පිළිවනැ" යි දන්වන්නා වූ සුදර්ශනයෝ, "බ්‍රහ්ම-දත්ත රජ්ජුරුවන් වහන්ස, මා කියන්නක් අසුව මැනැවැ. ඉදින් මේ විෂ බිත්දු තුන දියේ ඉසැ පුයෙම්-වීම් නම්, දියෙහි හට ගත්තා වූ මස් කැස්බන් ආදි වූ යම් පමණ ප්‍රාණී කෙනෙක් අැත් නම්, ඒ සියල්ලෝ මැ නසින්නාහු යැ. එ සේ හෙයින් දියටත් දමන්නට නො පිළිවනැ" යි කී හ.

92. එ කල්හි රජ්ජුරුවෝ සුදර්ශනයනට කියන්නෝ, "දරුව, අපි කිසිවක් නො දනුම හ. අප ගේ රට යම් සේ නො නසී නම්, ඒ නො නැසීමට සුදුසු උපායය තෙපි මැ දනුව" යි කී හ. එ බස් අසා සුදර්ශනයෝ කියන්නෝ, "මහ රජ්ජුරුවන් වහන්ස, මේ සාගරයෙහි පිළිවෙළින් වළවල් තුනක් කැණැ-වුව මැනැවැ" යි කී හ. රජ්ජුරුවෝත් එ පරිද්දෙන් මැ කැණැවූ යැ. සුදර්ශනයෝ මධ්‍යයේ වළ අනේක ප්‍රකාර වූ භෛෂජ්‍යයෙන් පිරැවූ යැ. දෙ වැනි වළ ගෝමයෙන් පිරැවූ යැ. තුන් වැනි වළ ඖෂධයෙන් පිරැවූ යැ. ඉක්බිත්තෙන් සුදර්ශනයෝ විෂ බිත්දු මධ්‍යයේ වළැලූහ. එ කෙණෙහි මැ දුම් නැගී ගිනි දැල් උඩ නැංගේ යැ. ඒ වහ්නි ජ්වාලාව ගොස් ගොම පිරූ වළ වැදී ඖෂධ නිමවා නිවී ගියේ යැ. ආලම්බනයා ඒ වළට හුදුරුවූ නැනැ සිටියේ යැ. එ කල්හි ඔහු ගේ ඇගේ විෂ උෂ්ණය වැදිරී ගෙනැ, සකල ශරීරයෙහි ජවිය ඉපිළැ ගෙනැ ගියේ යැ. එ කල්හි ඒ තෙමේ ශ්වේත කුෂ්ඨ ඇති එකක්ෂු මෙන් වී, මරණ භයින් භය පත් වැ, "නා රජ්ජුරුවන් හරිමි"යි කියා තුන් විටක් හඬ ගැ යැ. ඒ හඬ අසා මහා බෝ සතාණෝ රත්න පෙළායෙන් නික්මැ, සර්වාභරණයෙන් සැරැසුණා වූ දිව්‍යාත්ම භාවය-මවා ගෙනැ, ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන් සිටිය හ. සුදර්ශනයෝත් අබිමුඛව එ තැනැ මැ සිටිය හ.

18. බෝ සතාණන් නැවැතැ නාග භවනයට පැමිණීම.

93. ඉස්බිත්තෙන් සුදර්ශනයෝ රජ්ජුරුවනට කියන්නාහු, "මහ රජ්ජුරුවන් වහන්ස, අප අඳුනන සේක් ද? අපි කාගේ දරුවෝ දැ?" සි විචාළෝ යැ. "නො දනිමි" සි කී කල්හි, "අප වූ කලි නුඹ වහන්සේ නාඳුනන සේක් ද? කෂී රජ්ජුරුවන් ගේ දූ වූ **සමුද්‍රජාවන්** වහන්සේ ඛෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවනට දුන් නියාව දන්නා සේක් දැ?" සි විචාළෝ යැ. "එ සේ යැ දනිමි. උඹ මා ගේ බාල නැඟණියෝ වේ දැ" සි කිවු යැ. එ බස් අසා සුදර්ශනයෝ "අප **සමුද්‍රජාවන්** වහන්සේ ගේ දරුවෝ යැ. නුඹ වහන්සේ අප ගේ මසිලණුවන් වහන්සේ යැ" සි කිවු යැ. එ කල්හි රජ්ජුරුවෝ එ බස් අසා ඔවුන් තුන් දෙනා වැලැඳැ ගෙනැ, ඉස සිඹැ සනහා, අඬා වැලැපැ, ප්‍රාසාදයෙහි මතු මහල් තලයට ගෙනැ ගොස් මහත් වූ සත්කාර කොටැ, **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් හා සමඟ පිළිසඳර කථා කොටැ විචාරන්නාහු, "දරුව, තොප මේ බඳු වූ උග්‍ර විෂ තේජස් ඇති නැනැත්තවුන්, **ආලම්බනයා** කෙ සේ අල්ලා ගත්තේ දැ?" සි විචාළෝ යැ. මහ බෝ සතාණෝ ඒ සියලු ප්‍රවෘත්තිය විසතර හෙයින් කියා, "මහ රජ්ජුරුවන් වහන්ස, රජ දරුවන් වහන්සේ නම් මේ ක්‍රමයෙන් රාජ්‍යය කරන්නට වටනේ යැ" සි මසිල් රජ්ජුරුවනට ධර්ම දේශනා කළ හ.

94. එ කල්හි මසිලණුවනට සුදර්ශනයෝ කියන්නෝ, "මසිලණුවන් වහන්ස, මා ගේ මැණියන් වහන්සේ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් නො දැකැ, ශෝක දුක් ඉවසා පීඩිත වැ වසන සේකැ. එ සේ හෙයින් අප බැහැරැ කල් යවන්නට නො පිළිවනැ" සි කී හ. එ බස් අසා **සාගර බ්‍රහ්මදත්ත** රජ්ජුරුවෝ කියන්නාහු, "යහ පත දරුවෙනි, තෙපි හැම යව. මම වූ කලි මා ගේ නැඟණියන් දක්නා කැමැත්තෙමි. කෙ සේ

උන් දකිම් දැ?" යි විචාළෝ යැ. "මසිලණුවන් වහන්ස, අප ගේ මුත්තණුවන් වූ, කෂී රජ්ජුරුවන් වහන්සේ කොයි දැ?" යි, සුදර්ශනයන් කී කල්හි, "දරුව, මා ගේ නැගණියන් හැරි විසියැ නොහී ම පියාණන් වහන්සේ රාජ්‍යය හැරි පැවිදි වැ අසුවල් වන ළැහැබැ වසන සේකැ" යි කිවු යැ. එබස් අසා සුදර්ශනයෝ කියන්නෝ, "මසිලණුවන් වහන්ස, මා ගේ මැණියන් වහන්සේ නුඹ වහන්සේත් මුත්තණුවන් වහන්සේත් දක්නා කැමැති සේකැ. නුඹ වහන්සේ අසුවල් දවස් මා ගේ මුත්තණුවන් වහන්සේ සමීපයට වැඩියැ මැනැවැ. අපි හැම මැණියන් වහන්සේ හා කැටි වැ මා ගේ මුත්තණුවන් වහන්සේ ගේ පන් සලට එම හ. එ තැන්හි දී නුඹ වහන්සේ අප ගේ මැණියන් වහන්සේ දක්නා සේක් වේ දැ" යි මෙ සේ මසිලණුවනට දවස් නියම කොටැ මාලිගායෙන් බට හ. රජ්ජුරුවෝ බැණන් යවා හඬා වැලැපැ වැළැක්කාහු යැ. ඔහු තුන් දෙනාත් පොළොව කිමිදී නාග භවනයට ගිය හ.

95. මහ බෝ සතාණන් නාග භවනයට පැමිණි කල්හි, සියලු නාග භවනය මහ හඬින් ඒක කෝලාහල වී යැ. ඒ මහ බෝ සතාණෝ, මසක් මුළුල්ලෙහි පෙළාගේ වැදී හෙවැ බොහෝ පිඬිත වූ බැවින්, ගිලන් වැ වැදී හොත්තාහු යැ. මහ බෝ සතාණන් සමීපයට විචාරන්නට යන එන්නා වූ නසින් ගේ පමණෙක් නැති. මහ බෝ සතාණෝ ඒ නසින් හා සමග කථා කරන්නාහු, ආයාසයට පැමිණෙති. කාණාටිවිඨයෝ, දිව්‍ය ලෝකයට ගොස් මහ බෝ සතාණන් නො දැකැ, පළමු වැ නාග භවනයට අවු යැ. එ කල්හි "මේ තෙමේ වණ්ඩ යැ, ඵරුෂ යැ, නාග පෂීද වලකාලන්නට සමර්ථ යැ" යි මහ බෝ සතාණන් සැතැපුණු තැනැ දෙර කඩැ රකවලැ සිටැවූ හ.

19. සුභග-නේසාද හමුව.

96. **සුභගයෝත්** සියලු හිමාලය වනය පරීක්ෂා කොටැ, ඉක්බිත්තෙන් මහා සමුද්‍රයත් අවශේෂ ගංගා-වලුත් පරීක්ෂා කොටැ, **යමුනා නම්** ගංගාව පරීක්ෂා කෙරෙමින් එමින් සිටියා හ. එකල්හි **නේසාද** බ්‍රාහ්මණ-යාත් **ආලම්බනයා** කුම්ට රෝහී වූවහු දැක, සිතත්තේ, "**ආලම්බනයා භූරිදත්ත** නම් නා රජ්ජුරුවනට පිඬා කොටැ ශ්වේත කුම්භයෙන් විරූපි විය. මම වූ කලි මට බොහෝ උපකාර කළා වූ ඒ **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් මාණික්‍යයෙහි ලෝභයෙන් අහි ගුණ්ඨික බ්‍රාහ්මණයාට දක්වීමි. ඒ අකුශල කර්මය මා කරා එන්නේ යැ. යම් තාක් ඒ පාපය මා කරා නො ඒ නම්, ඊට පළමු කොටැ මම **යමුනා** නම් ගංගාවට ගොස්, **පයාග** තීර්ථයෙහි පාප ප්‍රවාහය කෙරෙමි" යි සිතා ඒ **යමුනා**වට ගොස් "මා විසින් **භූරිදත්ත** නම් නා රජ්ජුරුවන් විෂයයෙහි මිත්‍ර ද්‍රෝහ කම් කරන ලද. ඒ අකුශල කර්මය සෝධා ශුද්ධ කොටැ දියෙහි යවා පියමි" යි කියා, **යමුනා** නම් ගංගාවේ **පයාග** තීර්ථයෙහි ගැලිගැලි ඉල්පෙමින් සිටියේ යැ.

97. එ සමයයෙහි **සුභගයෝ** එ තැනට පැමිණි තැනැත්තෝ ඔහු ගේ ඒ වචනය අසා, "මේ පාපකාරි වූ පුරුෂයා ඒ සා මහත් වූ යස පිරිවර දුන්නා වූ මා ගේ බෑයන් වහන්සේ මැණිකක් නිසා **ආලම්බනයාට** දක්වන ලද. එසේ හෙයින් ඔහු ගේ දිවි නොදෙමි" යි නහරින් ඔහු ගේ දෙ පය වෙළා ඇදූ ගෙනැ, දිය යට හිල්වා ආශ්වාස ප්‍රශ්වාසය නැති කොටැ මදක් ලිහිල් කොළෝ යැ. ඒ තෙමේ එ කල්හි ඉස එසැවී යැ. නැවැතත් ඔහු ඇදූ දියෙහි ගැටුණු හ. මෙ සේ නොයෙක් වර ඒ **සුභගයන්** විසින් දියෙහි හිල්වා පිඬාවට පමුණුවන ලද්දා වූ වැදි බමුණු ඉස ඔසවා කියන්නේ "පාප ප්‍රවාහය කිරීමෙහි සමර්ථ යැ යි ලෝ වැස්සන් විසින් දන්නා ලද **පයාග** තීර්ථයෙහි සිටියා වූ, මෙ බඳු වූ, ජල ස්නානය කරන්නා වූ, මේ

යමුනා නම් ගංගාවේ දියයට වැදූ කවර සත්ත්වයෙක්, මා අනුභව කරන්නට අල්ලා ගත් දැ?" යි බැහැ පත් වැ කී යැ. එ කල්හි ඕ හට සුභගයෝ කියන්නාහු, "නේසාද බ්‍රාහ්මණය, ලෝකාධිපති වූ මහත් වූ යස පිරිවර ඇති යම් ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරු කෙනකුත් වහන්සේ බරණැස් නුවර හාත්පසින් වෙළා, මුදුනෙහි පෙණ ගහීයෙන් වසා, සියලු සත්ත්වයන් හට භය ඉපැදූවු සේක් ද, මම ඒ නාගාධිපති වූ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ ගේ පුත්‍රයෙමි. බමුණ, මා 'සුභග නම් නා රජ්ජුරුවෝ යැ' යි ලෝක වාසී සත්ත්වයෝ දනිති" යි කී හ.

98. එ කල්හි වැදි බමුණා සිතන්නේ, "මූ තුමූ භූරිදත්ත නම් නා රජ්ජුරුවන් ගේ බෑයෝ යැ. එ සේ හෙයින් මා ගේ දිවි නො තිබෙන්නේ යැ. මම මුන් ගේත් දෙ මවු පියන් ගේත් ඝණ කීමෙන් සිත මොළොක් කොටැ, මුන් ගෙන් මා ගේ ජීවිතය ඉල්ලා ගත්තෙම් වීම් නම් යහ පත් වන්නේ යැ" යි සිතා මෙ සේ කී යැ. "සුභගයෙනි, ඉදින් තෙපි දැඩිඋග්‍රශ්ක බැවින් අමර නම් වූ නාගයනට අධිපති වූ කෂී රජ්ජුරුවන් වහන්සේ ගේ දියණියන් ගේ පුත්‍ර වූහු නම්, තොප ගේ පියවූ ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවෝ මහේශාක්‍ය වූ දිව්‍ය නාග රාජයන් අතුරින් එක්තරා කෙනෙක් වූ නම්, තොප ගේ මෑණියෝ මනුෂ්‍ය ලෝකයෙහි කෂී කෝසල දෙ රටට අධිපති වූ කෂී රජ්ජුරුවන් වහන්සේ ගේ රූපාග්‍ර ප්‍රාප්ත වූ දියණී කෙනෙක් වූ නම්, මෙ බඳු වූවන් ගේ දරු මුනුබුරු වැ සිටියා වූ කෙනෙක් බමුණන් ගේ දැසඇකු දියෙහි ගලා මරන්නට සුදුසු නො වෙති. එ සේ හෙයින් තොප වැනි වූ උත්තමයනට මා මැරීම් කාරණ නො වේ" යි කියා සුභගයන් ගේ වංශය උසස් කෙරෙමින් වණීනා කොටැ, තම හට ජීවිත දනය ඉල්ලූයේ යැ.

99. එ කල්හි ඔ හට **සුභගසෙෂ්ඨ**, "කොල දුෂ්ට බමුණ, තෝ මා 'වඤ්චා කොටැ මිදෙමි' යි නො සිතව. තා ගේ දිවි නො දෙමි" යි කියා, ඔහු විසින් කළා වූ ක්‍රියාව ප්‍රකාශ කොටැ කියන්නාහු, "බ්‍රාහ්මණය, තෝ ගඟකට බඳ දී ගෙනැ සිටැ, පැන් බොන්නට **යමුනා** නම් ගංගාවට ආවා වූ එක් මුවකු විද යුයෙහි යැ. ඒ විදිනා ලද්දා වූ මුවා ශර වේගයෙන් තැති ගන්වන ලද්දේ, දුරට දිවැ ගෙනැ ගොස් එක් තැනෙකැ හුණුයේ යැ. එ සේ හුණුවා වූ මුවා දැකැ, අරණ්‍ය සඞ්ඛ්‍යාත වූ මහ වනයෙහි දී මස් කොටැ ඉගනැ, මස් කඳත් ඇරැ ගෙනැ, සවස් වේලෙහි හිරවුන් සහ සැල ළිහිණියන් ද විසින් රැවූ පිළිරැවූ දෙන ලද්දා වූ මිහිරි වූ කොවුල් හඬ ඇති ජල නිශ්‍රිත වූ භූමියෙහි හට ගත් බැවින් නිරන්තර-යෙන් නිලි ගෙනැ සිටුනා වූ රතිඳු ගොවිවන් විසින් ගැවැසී ගත්තා වූ රම්‍ය වූ ඒ තණ වනයෙන් යුක්ත වූ භූමි ප්‍රදෙශයක් ඇති, පරිණත ඵලයෙන් පිඟු වන් වූ සිය ගණන් අරළු සමූහයෙන් ගැවැසී ගත්තා වූ, නුඹ ගඟක් සමීපයට පැමිණියෙහි යැ. ඒ නුඹ ගඟ මුලැ සිටියා වූ, සෘද්ධියෙන් හා යස පරිවාරයෙන් දිලියෙන්-නා වූ අනුභාව ඇති නාග කන්‍යාවන් විසින් පිරිවරන ලද මා ගේ බෑයන් වහන්සේ හට ප්‍රකාශ වැ පෙනුණු සේකැ. එ කල්හි උන් වහන්සේ තා දැකැ, තමන් වහන්සේ ගේ අනුභාවයෙන් නාග භවනයට කැඳවා ගෙනැ ඉගාස්, වසතු කාම ක්ලෙශ කාමයෙන් පිනවා, මහාහෝ දවසක් උපස්ථාන කළ සේකැ. එ සේ උප-කාර වැ සිටියා වූ මා ගේ බෑයන් වහන්සේට තෝ නිෂ්කාරණයේ මිත්‍ර ද්‍රෝහ කම් කෙළෙහි යැ. ඒ හා විසින් කරන ලද්දා වූ මිත්‍ර ද්‍රෝහ සඞ්ඛ්‍යාත වූ පාප කර්මය දැන් මේ තැනට පැමිණැ සිටියේ යැ. එ සේ හෙයින් තා ගේ දිවි ගලවමි. වහා මැ කර දික් කොටැ ලව. බෑයන් වහන්සේට කළා වූ මිත්‍ර ද්‍රෝහය සිහි කරන්නා වූ මම තා හිස දැන් මේ තැනැ දී මැ කපා හෙළමි" යි කී හ.

100. එ කල්හි වැදි බමුණා සිතන්නේ, "මේ සුභගයෝ ඒකාන්තයෙන් මා ගේ දිවි නො නසති. එ සේ හෙයින් යම් කිසි උපායයක් කියා මුත් අතින් ගැලැවෙන්නට සුදුසු වන්නේ යැ" යි සිතා කාරණයක් කියන්නේ, "සුභගයෙනි, මේ ලෝකයෙහි බ්‍රාහ්මණයෝ නම් සඟි වේද යැ, යජුර් වේද යැ, සාම වේද යැ යි කියන ලද වේද ත්‍රයය හදාරා වේද මන්ත්‍ර පිරැවීමෙහි සමර්ථ ය හ. සියලු සත්ත්වයන් විසින් දෙන ලද්දා වූ දානය පිළිගන්නට යොග්‍ය බැවින් දක්ෂිණාර්හ ය හ. නිරන්තරයෙන් තිල තණ්ඩුල මුද්ගාදියෙන් හා ඝෘත සර්පිදියෙන් ගිනි දෙවියාට පූජා කරන්නා හ. එ සේ හෙයින් මේ තුන් කාරණයෙන් බ්‍රාහ්මණයෝ නො මැරිය යුත්තෝ යැ. නොප විසින් බමුණන් මරන්නට නො පිළිවන් වන්නේ යැ. තෙපි කුමක් කියවු ද? ඉදින් යමෙක් බමුණකු මැරැයේ වී නම්, ඒ තෙමේ නරකයෙහි ඉපැදී මහ දුක් අනුභව කරන්නේ යැ" යි කී යැ.

101. එ බස් අසා සුභගයෝ ශංඛයට පැමිණැ, "මොහු නාග භවනයට ගෙනැ ගොස් මල් බැයන් විවාරා, මෝ හට කළ මනා කාර්‍යය දන්නෙම් වේ ද?" යි සිතා, නාග භවනය වර්ණනා කරන්නාහු, මල් බැයන් වසන තැන් කියන්නාහු, "ධාතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ ගේ යම් පුරයෙක් යමුනා නම් ගංගායෙන් යටැ පිහිටියේ ද, යමුනාවට නුදුරු තැනැ පිහිටියා වූ හිමාලය වනය පැහැරැ සර්වාකාරයෙන් සර්ණීමය සුසිලෝකයන් මෙන් හැම කල්හි මැ බබළා ද, ඒ නාග භවනයෙහි පුරුෂ ශ්‍රේෂ්ඨ වූ මා ගේ සහෝදර වූ මල් බැයෝ වසන්නා හ. එහි වසන්නා වූ මල් බැයෝ මා විසින් තා එ තැනට ගෙනැ ගිය කලැ, යමක් කී නම්, බමුණ, තට එ දවස් උන් කීවෙක් වන්නේ වේ ද? ඉදින් තෝ සැබෑවක් කීයෙහි වී නම්, තා ගේ දිවි ඇත්. ඉදින් තෝ බොරු කීයෙහි වී නම් එ තැන්හි දී මැ තා ගේ හිස කපමි" යි මෙ සේ ඕ හට කියා බොටුව අල්ලා දමදමා ආක්‍රෝෂ පරිභව බැණැ, භය ගන්වමින් මහ බෝ සතාණන් වසන්නා වූ මාලිගා දෙරට ගෙනැ ගිය හ.

20. කාණාරිට්ඨයන් ගේ බමුණු වැනුම-i.

102. එකල්හි දෙරට්ට පාල වැ හුන්නා වූ කාණාරිට්ඨයෝ, මෙ සේ ආක්‍රෝශ පරිභව බැණැ බොටුව අල්ලා අදිමින් ගෙනෙන්නා වූ ඒ බ්‍රාහ්මණයා දැකැ, පෙර මඟට ගොස්, "සුභගයෙනි, නො මරව. බමුණෝ නම් මහා බ්‍රහ්මයා ගේ දරුවෝ යැ. ඉදින් මහා බ්‍රහ්මයා දන්නේ වී නම්, 'මා ගේ දරුවන් මරන්නට කාරණ කවරේ ද?" සි කිපී අප ගේ සියලු නාග භවනය නසා පියන්නේ යැ. ලෝකයෙහි බ්‍රාහ්මණයෝ නම් ශ්‍රේෂ්ඨ ය හ. මහත් වූ අනුභාව ඇත්තා හ. මම ඒ බමුණන් ගේ අනුභාව මහත්බව දනිමි" සි කී හ.

103. ඒ කාණාරිට්ඨයෝ නම්, අනතුරු භවයෙහි යාග කළා වූ බ්‍රාහ්මණයෙකැ. එ සේ හෙයින් මෙ සේ කියා, පළමු අතීත ජාතියෙහි තමා මිථ්‍යා දෘෂ්ටි වැ කළා වූ යාගයෙහි එල්බැ, බමුණා උසස් කොටැ සිතා ඒ මහා ජනයාට යාග කරන සුලු වැ, සුභගයන් හා නාග පණ්ඩිත ආමන්ත්‍රණය කොටැ, "මෙ සේ එව. යාග කාරක බ්‍රාහ්මණයන් ගේ ගුණ තොප හැමට වර්ණනා කෙරෙමි" සි කියා, යාගයෙහි ගුණ වර්ණනා කරන්නට පටන් ගෙනැ මෙ සේ කී හ. "සුභගයෙනි, මේ ලෝකයෙහි යාගයත් වේදයත් ලාමක නො වන්නේ යැ. මහානුභාව සම්පන්න වන්නේ යැ. ඒ වේදය හා යාගය ද අලාමක වූ බ්‍රාහ්මණයන් හා එක් වූ බැවින් බ්‍රාහ්මණයෝත් ලාමක නො වෙති, මහානුභාව සම්පන්නයෝ මැ යැ. එ සේ නිසැ නො කට යුතු වූ මහානුභාව සම්පන්න වූ බමුණනට නිසැ කරන්නා වූ සත්ව තෙමේ තමා ගේ සම්පත්තියත් සත්පුරුෂ ධර්මයත් පණ්ඩිතභවයත් හැරැ පියන්නේ යැ. එ සේ හෙයින් බමුණනට අගෞරව කිරීම් කාරණයෙන් නො වෙ" සි කී හ. මේ කාරණය කියන කාණාරිට්ඨයෝ, "මොහු විසින් භූරිදත්ත නම් නා රජ්ජුරුවන් විෂයයෙහි මිත්‍ර ද්‍රෝහ කම් කරන ලදැ" සි බමුණාට කිසි බයක් නො කියනු කැමැති වැ නාග පණ්ඩිත හා සුභගයන් හා අස්වසා කී හ.

104. ඉක්බිත්තෙන් කාණාරිට්ඨයෝ නැවැතත් සුභගසෙනට කාරණ කියන්නාහු, "සුභගසෙනි, මේ ලෝකය කවුරුන් විසින් මවන ලද්දේ දැ සි තෙපි දනු දැ?" සි විචාරා, "නො දනිමි" සි කී කල්හි "බ්‍රාහ්මණයන් ගේ මුත්තණුවන් වූ මහා බ්‍රහ්මයා විසින් මේ ලෝකය නිර්මිත කරන ලද" සි කී හ. "තව ද, මහා බ්‍රහ්මයා, බමුණන් ආදි වූ චතුර්ණ්‍යයත් මවා ආයි වූ බ්‍රාහ්මණයනට කියන්නේ, 'තෙපි හැම වේද මන්ත්‍ර හදාරව, අන් කිසිවක් නො කරව' සි සම්මත කෙළේ යැ. රජ දරුවනට කියන්නේ, 'තෙපි හැම පොළොව ජය ගෙනැ පෘථිවියට අනුශාසනය කරව, අන් කිසිවක් නො කරව' සි කී යැ. වෙළෙඳුනට කියන්නේ, 'තෙපි හැම කෘෂි වණිජ් ආදිය මැ කරව, අන් කිසිවක් නො කරව' සි කී යැ. ශූද්‍රයනට කියන්නේ 'තෙපි හැම ක්ෂත්‍රියාදි වූ තුන් පක්ෂයෙහි අැත්තනට අත් පා මෙහෙවර කොටැ උපස්ථාන කරව, අන් කිසිවක් නො කරව' සි විධාන කෙළේ යැ. එ තැන් පටන් වෙන වෙන මැ තමන් තමන් ගේ කුල ප්‍රදේශයට සුදුසු පරිද්දෙන් මහා බ්‍රහ්මයා විසින් කියන ලද ක්‍රමයෙන් මැ උත්තම වූ බ්‍රාහ්මණයෝ වෙද මන්ත්‍ර මැ හදාළ හ. රජ දරුවෝ පෘථිවීශ්වර වැ ප්‍රජා පරිපාලනය කොටැ පොළොව ජය ගත් හ. වෙළෙන්දෝ සි සැමෙන් හා සවලෙඳුම් කිරීමෙන් හා ජීවත් වූ හ. ශූද්‍රයෝ රජ දරුවන් ආදි වූ තුන් පක්ෂයෙහි අැත්තනට අත් පා මෙහෙවර කළ හ.

105. "මෙ සේ ඒ මහා බ්‍රහ්මයා විසින් ලෝක නිර්මාණය කරන්නා වූ අවස්ථායෙහි 'චතුර්ණ්‍යයන් අතුරින් බ්‍රාහ්මණයන් ශ්‍රේෂ්ඨ කොටැ තබන ලදැ' සි පූර්වාචාර්‍ය වරයෝ කියති. එ සේ හෙයින් බමුණෝ නම් මහත් ගුණ අැත්තා හ. යමෙක් මේ බමුණන් කෙරෙහි සිත පහදවා දන් දුන්නාහු වී නම් අන් තැනෙකැ ඕ හට ප්‍රතිසන්ධි වශයෙන් ග්‍රහණයෙක් නැත්තේ යැ, දිව්‍ය ලෝකයට මැ යන්නේ යැ" සි කියා බ්‍රාහ්මණ ධර්මයෙහි විපාකය කියන්නෝ, "සුභගසෙනි, ධෘතරාෂ්ට්‍ර නම් දිව්‍ය

රජ්ජුරුවෝ ද, වරුණ නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, කුවේර නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, සෝම නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, සුමන නම් දිව්‍ය රජ්ජුරුවෝ ද, වඤ්ඣ දිව්‍ය පුත්‍රයෝ ද, සූසී දිව්‍ය පුත්‍රයෝ ද, යන මේ සියලු දිව්‍ය රජ දරුවෝ අනේක ප්‍රකාර වූ යාග කොටැ නැවැතැ වේද මන්ත්‍ර හදාරන්නා වූ බ්‍රාහ්මණයන් සියලු වසඟ කාම ක්ලේශ කාමයෙන් ද පිනවා මෙ බඳු වූ දිව්‍ය ඓශ්වර්‍යයට පැමිණිය හ'' යි කී හ.

106. ''නව ද සුභගයෙනි, භයඞ්කර වූ සේනා ඇති ශක්ති සම්පන්න වූ සහස්‍රබාහු අර්ජුන නම් රජ්ජුරුවෝ පන් සියයක් දුනු වාඝන් ගේ අත් දහසෙකින් ඇදූ ලියැ යුතු වූ දුනු පන් සියයෙකැ බල ඇති දුන්න ඇදීමෙන් 'සහස්‍රබාහු අර්ජුන රජ්ජුරුවෝ' යැ යි මේ නමින් ප්‍රසිද්ධ වැ පොළෝ තෙලෙහි අසදෘශ වූ වික්‍රමයෙන් යුක්ත වූවාහු, රාජ්‍ය ශ්‍රී අනුභවය කළෝ ද, එ සේ වූ බාහු වික්‍රම ඇති සහස්‍රබාහු අර්ජුන රජ්ජුරුවෝ පවා එ සමයයෙහි බමුණන් වසඟ කාම ක්ලේශ කාමයෙන් පිනවා ඝිනි දෙවියාට පූජා කොටැ, බ්‍රාහ්මණ දූනයෙන් හා වඤ්ඣ පාරිචරියයෙන් ද දිව්‍ය ලෝකයෙහි උපන් හ. එ සේ හෙයින් මේ ලෝකයෙහි බ්‍රාහ්මණයෝ නම් සියල්ලනට ම ශ්‍රේෂ්ඨයෝ යැ'' යි කී හ.

107. නව ද ඒ කාණාරිට්ඨයෝ මත්තෙහිත් බ්‍රාහ්මණයන් ම වර්ණනා කොටැ කියන්නාහු, ''සුභගයෙනි, යම් පුරාතන ඔරණැස් රජ්ජුරු කෙනෙක් තමන් ගේ ශක්ති වූ පරිද්දෙන් ආහාර පාන වශයෙන් ප්‍රසන්න වූසින් ඇති වැ බ්‍රාහ්මණයන් අනුභව කැරැවූ ද, ඒ ඔරණැස් රජ්ජුරුවෝ බ්‍රාහ්මණ දූනය අනුමෝදන් වැ මහේශාක්‍ය වූ දිව්‍ය රාජන් වැ උපන් හ. මෙ සේ ඒ බ්‍රාහ්මණයෝ නම් අග්‍ර දක්ෂිණාර්හ වන්නා හ'' යි කියා, නැවැතැ සුභගයනට මත්තෙහි කාරණ ගෙනැ හැරැ දක්වා කියන්නා වූ කාණාරිට්ඨයෝ, ''සුභගයෙනි යටගිය දවසැ ඔරණැස් නුවර මුවලිඤ්ඤ නම් එක් රජ්ජුරු කෙනෙක් බමුණන් කැඳවා ගෙන්වා ගෙනැ සවඤ් මාඝිය

විචාළෝ යැ. එ කල්හි බමුණෝ ඒ රජ්ජුරුවනට කියන්නෝ, 'රජ්ජුරුවන් වහන්ස, බමුණනටත් බ්‍රාහ්මණ දේවතාවනටත් සත්කාර කළ මැනැවැ' යි කියා 'බ්‍රාහ්මණ දේවතාවා නම් කවරෙක් දෑ?' යි කී කල්හි 'ගිනි දෙවියා යැ. ඒ වහ්නි දේවතාවා අලුත් ගිතෙලින් පිනැවුව මැනැවැ' යි කී හ. එ බස් අසා මුවලිඳු නම් රජ්ජුරුවෝ, බ්‍රහ්ම ලෝක ප්‍රමාණ වූ දුරු සම්භාරයක් ලුවත් දවා භස්ම කරන හෙයින් බොහෝ භක්ෂණය කරන්නා වූ සවණී වණී වූ ශෝභා ඇති බැවින් අලාමක වූ ප්‍රභා ඇති, ගිනි දෙවියා එළ ගිතෙලින් පිනවන්නට සමර්ථ වූ හ. මෙ සේ ඒ රජ්ජුරුවෝ ගිනි දෙවියාට යාග විධි සඛ්‍යාත වූ පූජා කොවැ දිව්‍ය ලෝකයට ගියෝ වේ දෑ" යි කී හ.

108. "නව ද සුභගයෙනි, යට ගිය දවසැ දුදීප නම් එක් රජ්ජුරු කෙනෙක් පන් සියයක් හවුරුදු රාජ්‍ය ශ්‍රී අනුභව කොවැ, බ්‍රාහ්මණයනට සත්කාර කොවැ අපරියන්ත වූ රථ සේනාව හැරී පැවිදි වූ යැ. එ සේ වූ, දහස් හවුරුදු ජීවත් වන්නට නිසි වූ, මහානුභාව සම්පන්න වූ, ආරෝහ පරිණාහයෙන් හා උතුම් වූ රූප ශෝභායෙන් දයුක්ත වූ, ප්‍රමාණාතික්‍රාන්ත වූ සේනා වාහනාදිය ඇති ඒ දුදීප නම් රජ්ජුරුවෝ පවා බමුණනට පූජා කොවැ සවණී ලෝකයට ගියෝ යැ" යි කී හ.

21. කාණාරිට්ඨයන් ගේ බමුණු වැනුම–ii.

109. නැවැතැ අන්‍ය වූ උදාහරණයක් ගෙනැ හැරී දක්වා කියන්නා වූ කාණාරිට්ඨයෝ "නව ද සුභගයෙනි, යට ගිය දවසැ සාගර නම් එක් රජ්ජුරු කෙනෙක් මහා සමුද්‍රය අවසන් කොවැ ඇති මුළු දඹදිව ජය ගෙනැ, බමුණන් අතින් සවණී මාගීය විචාරා 'සවණීමය වූ යාග සභාමඟයක් ඉදු වුව මැනැවැ' යි කී කල්හි, පඟ ඝාතනය පිණිසැ සුන්දර වූ සවණීමය වූ මහත් වූ යාග සභාමඟයක්

ඉඳුවා, එහි මෘග පක්ෂි ආදීන් බැඳැ, ඔවුන් මරා පඟ ඝාතනය කොටැ, ගිනි දෙවියාටත් පූජා කොටැ, බ්‍රාහ්මණයනටත් පූජා කොටැ මහේශාක්‍ය වූ එක්තරා දිව්‍ය රාජයෙක් වැ උපන්නේ වේ දැ"යි කී හ.

110. "තව ද පින්වත් වූ සුභගයෙනි, පඤ්ච මහා ගංගාවත් සමුද්‍රයත් කවර කෙනකුන් විසින් කරන ලද්දේ දැ යි මතපි දනු දැ?"යි විචාරා, "මම කවුරුන් කළ බවත් නොදනිමි"යි කී කල්හි, "තොප දන්නේ කිමෙක්ද? තොප දන්නේ බමුණන් මරන සේ මැ වේ ද? අතීතයෙහි අඟ නම් වූ යටි පත්ලේ ලොම් ඇති බරණැස් රජ්ජුරුවෝ, බමුණන් අතින් දිව්‍ය ලෝකයට යන්නට මං විචාරා, ඔවුන් විසින්, 'හිමාලය වනයට වැද බමුණනට සත්කාර කොට ගිනි දෙවියාටත් පූජා කළ මැනැවැ'යි කී කල්හි, ප්‍රමාණාතික්‍රාන්ත වූ ගෙරි මීවුන් ඇරැ ගෙනැ හිමාලය වනයට වැද, බමුණනට සිවු පසයෙන් උපස්ථාන කිරීමෙන් සත්කාර කොටැ, ගින්නෙහි එළ ගිතෙල් වත්කොටැ, ගිනි දෙවියාට පූජා කොළෝ යැ. එ කල්හි, 'බමුණන් අනුභව කොටැ ඉතිරි කිරි හා දී හා, කුමක් කට යුතු දැ?'යි විචාළ කල්හි, 'දමා පියව' යි කී හ. ඒ කිරි දී දෙකින් මද මද කිරස් දැමූ තන්හි සුළු ගංගා වී යැ. බොහෝ කිරි දැමූ තැන් මහා ගංගා වී යැ. ඒ කිරි ගොස් යම් තැනෙකැ රැස් වැ මිදී සිටියේ වී නම්, ඒ මහා සමුද්‍රය නම් වී යැ. මෙ සේ අඟ රජ්ජුරුවෝ, මෙ බඳු සත්කාර කොටැ බමුණන් විසින් කියන ලද ක්‍රමයෙන් ගිනි දෙවියාට පූජා කොටැ ත්‍රයස්ත්‍රිංශත් දිව්‍ය ලෝකයට ගියෝ වේ දැ" යි මෙ සේ මේ අතීත කථාවත් ගෙනැ හැරැ දක්වා කී හ.

111. "තව ද, පින්වත් වූ සුභගයෙනි, දැන් ශක්‍ර දේවේන්ද්‍රයන් ගේ සේනා පති වූ මහත් වූ ඍද්ධිමත්භාව ඇති, මහත් වූ යශඃ පිරිවර ඇති, යම් දිව්‍ය පුත්‍රයෙක් ඇද්ද, ඒ දිව්‍ය පුත්‍රයාත් පෙරැ බරණැස් නුවර රජ වැ ඉපැදැ, බමුණන් අතින් සඟී මාණීය විචාරා, ඔවුන් විසින් හෝම යාගයෙන් 'තමන් ගේ පාප මල

ප්‍රවාහය කොටැ දිව්‍ය ලෝකයට යව'සි කී කල්හි, බමුණනට මහත් වූ සත්කාර සම්මාන කොටැ, ඔවුන් විසින් කියන ලද විධියෙන් හෝම යාග කොටැ, ඒ හෝම යාගයෙන් තමන් ගේ පාප මල ප්‍රවාහය කොටැ, ඒ බරණැස් රජ්ජුරුවෝත් දැන් මෙ ත්‍රයස්ත්‍රිංශත් දිව ලෝකයෙහි ශක්‍ර දේවේන්ද්‍රයනට සේනාපති වැ උපන් හ''සි මේ අතීත කථාවත් ගෙනැ හැරි දක්වා කී හ.

112. ''තව ද, සුභගයෙනි, යම් මේ මහා බ්‍රහ්මයකු විසින් මෙ ලොවත් පර ලොවත් භාගීරතී නම් වූ ගංගාවත් හිමාලය පර්වතයත් හිජ්ඣිකූට පර්වතයත් කරන ලද ද, ඒ මහා බ්‍රහ්මයාත් බ්‍රහ්මොත්පත්තියෙන් පූර්ව භාගයෙහි යම් කලෙකැ බ්‍රාහ්මණ මානවක වැ උපන්නේ ද, එ සමයයෙහි ගිනි දෙවියාට පූජා කෙළේ යැ. මෙ සේ ගිනි දෙවියාට පූජා කොටැ මහත් වූ ඍද්ධ්‍යානුභාව ඇති මහත් වූ යස පිරිවර ඇති බ්‍රහ්ම වැ ඉපැදුණ, මෙ ලොව පර ලොව ආදි වූ සියල්ල කෙළේ යැ. එ සේ හෙයින් මේ බමුණෝ නම් මහත් වූ මහිම ඇත්තාහු යැ''සි මේ අතීත කථාවත් ගෙනැ හැරි දක්වා කිවු යැ.

113. ''තව ද සුභග නම් නා රජ්ජුරුවන් වහන්ස, යවැ ගිය දවසැ බරණැස් නුවරැ එක් රජ්ජුරු කෙනෙක් බමුණන් අතින් දෙව් ලෝ යන්නට මං විචාරා, 'බමුණනට සත්කාර සම්මාන කළ මැනැවැ'සි කී කල්හි, බමුණනට මහ දන් දෙන්නට පටන් ගෙනැ, 'මා ගේ දනයෙහි කිමෙක් නැද්ද?' සි විචාරා, 'දේවයන් වහන්ස, සියල්ල මැ ඇති. බමුණනට ඉඳිනට අසුන් පමණක් නො සැහෙන්නේ යැ'සි කී කල්හි, උළින් බැඳැ ආසන කැරැවූ හ. එ සමයයෙහි උළින් බඳනා ලද ආසන පිහිණාවෝ බමුණන් ගේ අනුභාවයෙන් වැඩී, හිමාලය පර්වතය, හිජ්ඣිකූට පර්වතය, සුදර්ශන පර්වතය, නිසභ පර්වතය, කාකනේරු පර්වතය, යනාදි අනේකාකාර වූ පර්වත වැ ගියා හ. තව ද මේ පර්වතවලින් අන්‍ය වූත් මහත් වූත් යම් පර්වත කෙනෙක් ඇත් නම්, ඒ සියලු

පර්වතයෝත් බමුණන් ගේ අනුභාවයෙන් මෑ වූ හ. එසේ හෙයින් මේ සියලු පර්වතයෝ මෑ පෙරැ යාඟ කරන්නා වූ බමුණන් විසින් තමනට ආසන නිසා උළිත් බදවා පසු විෑ තමන් ගේ අනුභාවයෙන් වඩා පර්වත කරන ලද හ යි පුරාතන ආචාර්ය වරයෝ කියති''සි කී හ.

114. තවද, ඒ සුභග නම් නා රජ්ජුරුවනට කියන්නෝ, ''බෑයන් වහන්ස, නුඹ වහන්සේ මේ සමුද්‍රය කවර කාරණයෙකින් සමුද්‍රය වී ද, කවර කාරණයෙකින් නොපියෑ හැකි ලවණ ජලය වී ද? සි දන්නා සේක් ද?''සි විචාරා, ''නො දනිමි, අරිට්ඨයෙනි'' යි කී කල්හි, ඉක්බිත්තෙන් ඒ සුභගයනට, ''තෙපි බමුණන් මරන්නට මෑ දනුව. සමුද්‍රාදිය ඇති වූ නියාව නො දනුව. තොප නොදන්නා බැවින් මා ගෙන් අසව'' සි කියා සමුද්‍රෝත්පත්තිය කියන්නාහු, ''සුභගයෙනි, අනුන් වේද මන්ත්‍ර හදාරවන්නා වූ තමා විසිනුත් හැම වේලෙහි මෑ වේද මන්ත්‍ර පිරිවිම කරන්නා වූ තපෝ නිශ්‍රිත වූ බ්‍රාහ්මණයාට මේ ලෝකයෙහි සත්ත්වයෝ, 'යෝහි යෑ' සි කියති. එසේ වූ බමුණෙක් එක් දවසක්, 'පාප ප්‍රවාහ කෙරෙමි'සි කියා, ගොඩැ සිටෑ සමුද්‍රයෙන් පැන් ඇරැ ගෙනෑ තමා ගේ ඇඟට දම දමා ජල ස්නානය කරන්නේ යෑ. එ කල්හි ඒ බමුණා මෙසේ ජල ස්නානය කරන්නා මහ රැලෙක් අවුත් ගසා හෙළා සමුද්‍රයට හැරැ ගෙනෑ ගොස් මුහුදු බත් කෙළේ යෑ. ඒ කාරණය මහා බ්‍රහ්මයා අසා, 'සමුද්‍රය විසින් මා ගේ පුත්‍ර වූ බ්‍රාහ්මණයා ගසා මරන ලද්දේ යෑ' සි සමුද්‍රයට කිපී, 'සමුද්‍ර ජලය නොපියෑ හැකි ලවණ රස වේව'සි කියා සප්ත කෙළේ යෑ. ඒ කාරණයෙන් මේ සමුද්‍රය පැන් නොපියෑ හැකි වෑ ලවණ රස වියෑ.

115. ''එසේ හෙයින් මේ බමුණෝ නම්, මෙබඳු මහත් වූ අනුභාව මහිමයෙන් යුක්තයෝ යෑ'' සි කියා, නැවැනත් බමුණන් හා යාඟය ද උතුම් කොටැ කියන්නාහු, ''සුභගයෙනි, පෙරැ බමුණනට දන් දී ශක්‍ර භවනයට පැමිණියා වූ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේට කුශල

ක්ෂේත්‍ර වූ අග්‍ර දක්ෂිණේය්‍ය වූ බොහෝ බමුණෝ පොළෝ තෙලෙහි විද්‍යමාන වූහ. දැනුත් බ්‍රාහ්මණයෝ පූර්ව, දක්ෂිණ, පශ්චිම, උත්තර යැ සි කියන ලද සතර දික්හි විද්‍යමාන වන්නා හ. ඔහු ඒ වාසව සංඛ්‍යාත වූ ශක්‍ර දේවේන්ද්‍රයන් වහන්සේට මහත් වූ ප්‍රීති සොමනස් එළවන්නාහු යැ. එ සේ හෙයින් හැම කල්හි, බමුණෝ නම් අග්‍ර පුද්ගලයෝ යැ"සි බමුණන්ගේ යාගයත් වර්ණනා කොටැ කිවු යැ.

22. බමුණු මත බිඳුම-i.

116. ඒ කාණාරිට්ඨයන් ගේ සියලු කථා අසා, මහ බෝ සතාණන්ට ග්ලානොපස්ථානයට ආවා වූ බොහෝ නාගයෝ, "අැත්තක් මැ කියන්නේ යැ" සි මිථ්‍යා දෘෂ්ටි ගත්තා වූ ආකාරයට පැමිණියාහු යැ. එ කල්හි, මහ බෝ සතාණෝ ග්ලාන ශය්‍යායෙන් වැදී හොත් තැනැත්තෝ, ඒ කාණාරිට්ඨයන් ගේ සියලු කථා ප්‍රවෘත්තිය අැසූ හ. නාගයෝත් හොස් මහ බෝ සතාණන්ට එ පවත් දැන් වූ හ. ඉක්බිත්තෙත් මහ බෝ සතාණෝ සිතන්නෝ, "මේ කාණාරිට්ඨයෝ මිථ්‍යා මාර්ගය වර්ණනා කෙරෙති. එ සේ හෙයින් උන් ගේ වාදය බිඳැ, නාග පර්ෂත් සම්‍යක් දෘෂ්ටි කෙරෙමි"සි යහනින් නැඟී සිටැ, සව්භරණයෙන් සැරසී, ශක්‍ර දේවේන්ද්‍ර ලීලායෙන් ධර්මාසන මසකයෙහි වැඩැ හිඳැ, සියලු නාග පර්ෂත් රැස් කරවා, කාණාරිට්ඨයනුත් සමීපයට කැඳවා, "අරිට්ඨයෙනි, තෙපි නැත්තක් කියා ඉව්දයත් යාගයත් බ්‍රාහ්මණයනුත් වර්ණනා කරව. බ්‍රාහ්මණයන් ගේ වේද විධියෙන් යාග කිරීම නම් අනිෂ්ට යැ සි ලෝ වැස්සන් විසින් දන්නා ලද්දේ යැ. ඉන් සැඟී ලෝකොත්පත්තිය නො මැ එළැ-වෙන්නේ යැ. ඒ තොප ගේ වාදය අභූත නියාව බල-වා"සි කියා, යාග වාද භේදයට පටන් ගත්තාහු මෙ සේ කීවාහු යැ.

117. "මල කාණාරිට්ඨයෙනි, මේ වේද මන්ත්‍ර හැදෑරීම නම්, නුවණැත්තා වූ සත්ත්වයනට පරාජය සංඛ්‍යාත වූ අකුශල ග්‍රහණය වන්නේ යැ. අඥාන වූ සත්ත්වයනට ජය සඞ්ඛ්‍යාත වූ කුශල ග්‍රහණය වන්නේ යැ. මේ වේද මන්ත්‍ර නම් මිරිඟු ජලයක් වැන්නේ යැ. මහ අව්වෙහි පෙනෙන්නා වූ මිරිඟු ජලය දැකැ, මෘගයෝ, 'බොන්නට නිසි වූ ජලයෙකැ'යි යන සංඥයෙන් සමීපයට දිවෙති. මෘගයන් සමීපයට දිවුවත්, අවිද්‍යමාන වූ වස්තුව හෙයින් නැති වන්නේ යැ. එ පරිද්දෙන් මේ මැ වේද මන්ත්‍රයත් යථා ස්වභාව පරීක්ෂා නො කළ බැවින් ශක්ති නො දන්නා වූ අඥාන සත්ත්වයෝ භූත සංඥයෙන්, නිරවද්‍ය සංඥයෙන්, 'ඇත්තෙකැ, යහ පතැ'යි සිතා හදාරන්නා හ. මෙබඳු වූ වේද මන්ත්‍ර සංඛ්‍යාත වූ මායා කොට්ඨාසය නුවණැත්තා වූ පුරුෂයා වංචා කොටැ ගත නො හෙන්නේ යැ. නුවණැති සත්ත්වයෝ මේ වේද මන්ත්‍රය 'ඇත්තෙකැ'යි කියා වත් 'ඉෂ්ට යැ' යි කියා වත්, 'දිව්‍ය ලෝකෝත්පත්තියට මාර්ගයෙකැ'යි කියා වත් නො ගනිති. එ සේ හෙයින් 'සච්චාකාරයෙන් මැ වේද මන්ත්‍රය නම්, අසිවෘද්ධි කර වස්තුවෙක් නො වේ යැ' යි කියා මා කිවා අදහා ගනුව" යි කී හ.

118. "තව ද, අරිට්ඨයෙනි, තම හට වන අසිවෘද්ධි වැළැකීම කරන්නා වූ මිත්‍ර ද්‍රෝහි වූ ඒ සත්ත්වයා හට වේද මන්ත්‍රය පිහිට වන්නට අසමර්ථ වන්නේ යැ. කාය දුශ්චරිත වාග් දුශ්චරිත මනෝ දුශ්චරිත යැ යි කියන ලද ත්‍රිවිධ වූ දුශ්චරිතයෙන් සඤ්ඡන්න වූ හෙයින් අැති පාප කාරී වූ පුරුෂයා යම් සේ වත්තිය කෙතෙක් දවසක් පුරුදු කළත් මද ප්‍රමාදයෙකින් මැ සත්ත්වයා දහනය කෙරේ ද, එ පරිද්දෙන් මැ වේද මන්ත්‍රයත් කෙතෙක් දවසක් හදාරා පිරුවා වාචෝද්ගත කොටැ සිත්හි තබා පුරුදු කළත් ඉෂ්ට ඵල දායක නො වී, නරකාදි වූ සතර අපායයට පමුණුවන හෙයින් සත්ත්වයා පුරුදු කළා වූ වත්තිය මැ දහනය කරන්නාක් මෙත් වේද මන්ත්‍රයත් පුරුදු කළා වූ සත්ත්වයා රැකැ ගත නො හෙන්නේ යැ.

119. "නව ද, දෙ බල වූ දිවින් රස දැන්මෙහි සමර්ථ බැවින් 'ද්වි රසඤ්ඤූ' යන නම් ඇති අරිට්ඨසෙනි, ඉදින් මේ ලෝකයෙහි උපභෝග පරිභෝග වස්තු හා මුක්තා මාණිකාදි වූ දශ විධ රත්නයත් ද ඇති මනුෂ්‍යයෝ, තමන් ගේ යම් පමණ සම්පත්තියෙක් ඇත් නම්, එ පමණ වූ සම්පත් හා සමඟ දර හා ධන හා මිශ්‍ර කොටැ ඉදින් ගින්නෙහි ලා දැවූවාහු වී නම්, මෙ සේ බ්‍රහ්ම ලෝක ප්‍රමාණ වූ දුරැ සම්භාරය හා සමඟ ඒ සත්ත්වයන් විසින් දවනු පිණිසැ ගින්නෙහි ලන ලද්ද වූ සියලු වස්තු සම්භාරය දවා භස්ම කරන්නට සමර්ථ වූ අසදෘශ වූ තේජස් ඇති ඒ වහ්නිය තෘප්තියකට නො පැමිණෙන්නේ යැ. මෙ සේ තෘප්තියකට නො පැමිණියැ හැක්කා වූ ඒ වහ්නිය ගිතෙල් ආදිය වත් කිරීමෙන් තෘප්තියකට පමුණුවන්නට කවරෙක් සමර්ථ වෙත් ද? මල අරිට්ඨසෙනි, මෙ සේ අතෘප්තිකර වූ, සියලු ලොවැ ඇති වස්තු සාරය තාක් දවා භස්ම කරන්නට සමර්ථ හෙයින් බහු භක්ෂණ වූ, ඒ වහ්නිය පිනවා කවර නම් සත්ත්වයෙක් දිව්‍ය ලෝකයට යේ ද? එ සේ හෙයින් නොප කියන්නා වූ කථායෙහි මෙ බලව.

120. "නව ද අරිට්ඨසෙනි, යම් සේ කිරි විපරීත ස්වභාවයට පැමිණැ මිදී දෙවනු වැ වෙඩරැ නැතිමටත් පැමිණේ ද, එ පරිද්දෙන් මැ වහ්නියත් පෙරැලෙන්නා වූ ස්වභාව ඇත්තේ, ගිනි දඹු ගැටීමෙන් මෙරමා ගේ උත්සාහයෙන් මැ උපදනේ යැ. මෙ සේ අනුන් ගේ උත්සාහයෙන් උපන්නා වූ අචේතස්ක වූ වහ්නියට නෙපි ගිනි දෙවියා යැ යි කිවු යැ. මෙ සේ හෙයින් නොප කීයේ නැත්තෙක් මැ වේ ද? නව ද, අරිට්ඨසෙනි, වියැළි දඹුයෙහිත් අමු දඹුයෙහිත් ඇතුළේ තුබූ වහ්නිය ගිනි දඹු ගත් අත් ඇති පුරුෂයකු ගිනි දඹු ගවා ගිනි හෙළූ කල්හි මුත් සාමාන්‍යයෙන් බැලූ කලැ පිටින් සත්ත්වයනට නො පෙනෙන්නේ යැ. එ සේ හෙයින් ගිනි කැමැත්තා වූ පුරුෂයා ගේ ගිනි දඹු ගැටීම් ආදි වූ ක්‍රියාවක් නැති වැ තෙමේ තමා ගේ ස්වභාවයෙන් ගිනි නුපදනේ යැ. ඉදින් වහ්නිය

වියැළී දඬුයෙහිත් අඹු අඹුයෙහිත් ඇතුළේ තිබේ නම්, මේ ලෝකයෙහි වනයේ හට ගත්තා වූ සියලු වෘක්ෂ ලතා ආදිහු ඇතුළෙහි තුබූ ගින්නෙන් තැවී වියැළෙන්නා හ. අම්බ වැ නොසිරිනා හ. ඉදින් වියැළී වෘක්ෂ ලතාවෝ ඇත් නම්, ඒ සියලු වෘක්ෂ ලතාවෝ ඇතුළෙහි තුබූ ගින්නෙන් දිලිහී දැ හළම වන්නා හ.

121. "නව ද, අරිට්ඨයෙනි, මේ ලෝකයෙහි සත්ත්වයෙක් ප්‍රතාපවත් වූ ධුම ඝිබායෙන් යුක්ත වූ වහ්නි දේවතාවා දර හා තණ හා ගින්නේ ලීමෙන් අනුභව කරවන්නේ, ඉදින් කුසල් කරන්නේ වී නම්, අඟුරු බැලයෝත්, දුණු පැන් කඹාරා දුණු කරන්නා වූ දුණු කරුවෝත්, බත් පිසන්නා වූ අරක්කැමියෝත්, මිනී දවන්නා වූ සොහොන් ගොවුවෝ යැ සි කියන ලද සුඛුප්පුලිත්, බොහෝ සේ දර දවන හෙයින් කුසල් කරන්නාහු මැයැ. එසේ නොවී ඉදින් අඟුරු බැළ ආදි වූ සත්ත්වයෝ දර දැමීමෙන් කුසල් නොකෙරෙත් නම් මන්ත්‍ර හදාරන්නා වූ බ්‍රාහ්මණයෝත් ගිතෙල් තල තෙල් ආදිය හා උඳු මුං තල කලත් ආදිය හා ගින්නෙහි ලා දවා ගිනි දෙවියාට පූජා කිරීමෙන් කුසල් නොකරන්නාහු යැ. මේ ලෝකයෙහි අවශේෂ වූත් යම් කිසි සත්ත්ව කෙනෙක් ඇත් නම්, ඒ සියල්ලෝ මැ ධුම ඝිබාවක් කොටැ ඇති තේජස්වී වූ ගිනි දෙවියා දර ආදිය ලා දැවීමෙන් පිනවන්නාහු, ඒකාන්තයෙන් කුසල් නොකෙරෙත් මැ යැ.

122. "නව ද, අරිට්ඨයෙනි, තොප ගේ වාදයෙහි 'ලෝ වැස්සත් විසින් පිදියැ යුතු යැ' සි කියන ලද ගිනි දෙවියා අමනෝඥ වූ ගඳ ඇති, බොහෝ දෙනාට අප්‍රිය වූ, ප්‍රතිකූල ජුගුප්සා කට යුතු වූ, දුගඳ වූ, අහි කුණපාදි වූ යම් යම් කුණපයක්, දුගඳ බැවින් සත්ත්වයෝ දුරින් දුරු කෙරෙද්ද, එසේ වූ දුගඳ පිළිකුල් ගෙරි කුණු මිනී කුණු ආදි වූ සියලු කුණපය, මල අරිට්ඨයෙනි, කෙසේ නම් තොප විසින් ප්‍රශංසා කරන ලද ගිනි දෙවියා පිළිකුල් නැති වැ අනුභව කෙරේ ද? මේ

ලෝකයෙහි සමහර සත්ව කෙනෙක්, 'වහ්නිය දේවතාවන් අතුරින් එක්තරා දේවතාවෙකැ' සි කියති. නුවණ නැති මිලේච්ඡ ජාති වූ සමහර සත්ත්ව කෙනෙක් 'ජලය දේවතාවෙකැ' සි කියති. මෙ සේ කියන්නා වූ ඒ සියලු සත්ත්වයෝ මැ නැත්තක් විනා ඇත්තක් නො කියති. ගිනි දෙවියෙක් නො වන්නේ යැ. මෙ සේ අනින්ද්‍රිය ප්‍රතිබද්ධ වූ අචේතස්ක වූ සියලු ලෝක වාසි වූ සත්ත්වයාට බත් පිසීම ආදි වූ කර්මාන්ත කරන්නා වූ ගිනි දෙවියාට පූජා කොටැ අකුසල් කරන්නා වූ සත්ත්වයෝ කෙ සේ නම් සඟී ලෝකයට යෙද්ද? එ සේ හෙයින් වහ්නි දෙවතා ඇ සි කියන්නා වූ තොප ගේ බස බොරුක් මැ නො වන්නේ යැ.

23. බමුණු මත බිඳුම – ii.

123. "තව ද අරිට්ඨයෙනි, මේ ලෝකයෙහි ජීවිකාර්ථී වූ සමහර බමුණු කෙනෙක්, 'මහා බ්‍රහ්මයා සියලු ලෝක වාසී සත්ත්වයන් මැඩැ පවත්නේ යැ, සියලු ලෝකය ඔහු විසින් මවන ලද' සි කියති. නැවැතැ, එ මැ මහා බ්‍රහ්මයා ගිනි දෙවියාට පූජා කරන්නේ වී නම්, ඒ මහා බ්‍රහ්මයා සියල්ලවුන් මැඩැ පවත්වන්නේ වී නම්, තෙමේ තමා ගේ වශගයෙහි පවත්නේ වී නම්, සියලු ලොවත් ඔහු විසින් මවන ලද්දේ වී නම්, එ සේ කලැ කුමක් නිසා තෙමේ සවයම්භූ වැ සිටැ, අනෙක් කෙනකුන් විසින් නිර්මාණය නො කරන ලද්දේ, තමා විසින් මැ මවන ලද ගිනි දෙවියාට නමස්කාර කෙරේ ද? ඉදින් වැන්දේ නමුත් නො වැන්දේ නම් වන්නේ යැ. මෙයින් තොප කී නියාව යහ පත් නො වන්නේ යැ.

124. "තව ද, අරිට්ඨයෙනි, බමුණන් ගේ බස් නම්, සිනාවට යුතු වන්නේ යැ. නුවණැත්තන් ගේ සිතට චදනා බොරුක් නො වන්නේ යැ. සවිඤාණයෙන් අසතා වන්නේ යැ. ගිනි දෙවියාට පූජා කිරීමෙන් සඟී ලෝකෝත්පත්තිය නො වන්නේ යැ. මේ බඳු වූ මෘෂා

වාද තමනට ලාභ සත්කාර නිසා මේ බ්‍රාහ්මණයෝ පුරා-තනයෙහි ලොව පැතිරිවූ හ. නැවැතැ ඒ බ්‍රාහ්මණයෝ මෙ පමණෙකිනුත් ලාභ සත්කාර නොලබන හෙයින් සත්වයන් එක් කොටැ, යොදු, ප්‍රාණ වධයෙන් යුක්ත වූ තමන් ගේ ලබ්ධි ධර්‍ම සඛ්‍යාත වූ ශාන්ති ධර්‍මය යාග විධි සඛ්‍යාත වූ යාග ශාස්ත්‍රයෙකැයි, තමන් ගේ සව බුද්ධින් උපදවා ගොතා ගත් හ. එ සේ හෙයින් ප්‍රාණ වධ කොටැ, කරන්නා වූ යාගය නම්, දිව්‍ය ලෝකෝත්-පත්තියට මං නොවන හෙයින් බමුණන් ගේ බස් අසත්‍ය නියාව මේ කාරණයෙන් දනුව.

125. "තව ද, අජිට්ඨයෙනි, 'බ්‍රාහ්මණයෝ වේද මන්ත්‍රය හැදෑරීමෙන් හා රජ දරුවෝ පොළොව ජය ගැනීමෙන් හා වෙළෙඳහු කෘෂි වණිජ් ආදිය කිරීමෙන් ද, ශූද්‍රයෝ ක්ෂත්‍රියාදි චතුර්වර්ණයනට මෙහෙවර කිරීමෙන් ද, වෙන වෙන මැ තමන් තමන් ගේ කුල ප්‍රදේශයට සුදුසු වූ පරිද්දෙන් හා බ්‍රහ්මයා විසින් කියන ලද ක්‍රමයෙන් හා ඒ ඒ කාර්‍ය කිරීමට පැමිණියාහු යැ' යි බ්‍රාහ්මණයන් විසින් කියන ලද්ද වූ මේ වචනය ඉදින් සත්‍ය වී නම්, එ සේ කල්හි, පළමු වැ රාජ වංශයෙහි නුපන් පුරුෂයෙක් රාජ්‍යයක් නොලබන්නේ යැ. පළමු බ්‍රාහ්මණ වංශයෙහි නුපන් පුරුෂයෙක් වෙද මන්ත්‍ර නුගන්නේ යැ. වෙළෙඳුන් හැර අන්‍ය වූ සත්වයෙක් ගොවිතැනුත් නොකරන්-නේ යැ. ශූද්‍රයෝත් හැම කල්හිම අනුනට මෙහෙවර කිරීමෙත් නොමිදෙන්නාහු යැ. යම් හෙයෙකින් බමු-ණන් විසින් කියන ලද්ද වූ මේ වචනය අභූත ද, අසත්‍ය ද, හරයෙක් නැද්ද, එ සේ හෙයින් මේ බඹ ගැති වූ බමුණු කොල්ලෝ නැත්ත ඇති කොටැ, බොරු මැ කියන්නාහු යැ. නුවණ මඳ වූ සත්වයෝ බමුණන් ගේ ඒ අසත්‍ය වචන සත්‍ය වචන වශයෙන් අදහා ගනිති. කාරණාකාරණ දන්නා වූ නුවණැති සත්වයෝ බමු-ණන් ගේ වචන සදෙෂයැයි තමන් ගේ නුවණැසින් මැ දන්නා හ.

126. "තව ද, මලණ්ඩ අරිට්ඨයෙනි, රජ දරුවෝ වෙලෙඳුන් ගෙන් 'කරවුවර' යැ සි කියන ලද බදු අය පඬුරු ගන්නා හ. බ්‍රාහ්මණයෝ ආයුධ ගෙනැ සේවා-කම් කොටැ, අැවිදින්නාහු යැ. එ සේ හෙයින් මේ බ්‍රහ්-මයා විසින් තබන ලද මයිාදව බිඳැ අැලැලී වෙන් වැ විරුද්ධයට පැමිණියා වූ මෙ බඳු වූ ලොව තොප ගේ ඒ බ්‍රහ්මයා විසින් මවන ලද ලොවෙක් වී නම්, ඔහු තබා ලූ ප්‍රමාණ වෘත්තිය හැම දවස් මැ තුබුව මනා වේ ද? බ්‍රහ්ම නිර්මිතියක් නො වන හෙයින් ලොව මවන ලද දෙයෙක් නො වෙයි කියා දූනැ ගනුව. තව ද, අරිට්ඨ-යෙනි, ඉදින් යම් සත්ත්ව කෙනෙක් අන්‍ය සත්ත්වයන්හු මරා නිවන් දකිත් නම්, මරන ලද්දා වූ සත්ත්වයාත් සැඟී ලෝකයෙහි උපදී නම්, බමුණෙනි මැ බමුණන් මරත් වා! යම් කෙනෙක් බමුණන් ගේ වචනය අැත්තෙකැ සි අදහා ගනිත් නම්, බමුණෙනි ඒ තමන් ගේ බස් අදහා ගන්නා වූ උපස්ථායකයන් මැ මරත් වා! බමුණෙනි වූ කලි බමුණන් හා තමන් ගේ බස් අදහන උපස්ථායකයන් හා නො මරා අනේක ප්‍රකාර වූ තිරිසනුන් මරවති. එ සේ හෙයින් බමුණන් ගේ බස් බොරු නියාව මේ කාරණ-යෙනුත් දනුව. තව ද අරිට්ඨයෙනි, ගෙරි මීවුන් හූරන් ආදි වූ සත්ත්වයන් අතුරින් කිසි සත්ත්ව කෙනෙක් 'අප මරා පියව' සි, 'මැරූ කල්හි අපි හැම සැඟී ලෝකයට යෙම හ' සි මරන්නට යාච්ඤා කොටැ කියන්නා වූ කිසි මැ ප්‍රාණී කෙනෙක් නැත. එ තෙකුදු වූ වත් බ්‍රාහ්මණයෝ 'යාග විධියෙකැ' සි සලසා ගෙනැ ජීවත් වනු කැමැත්තා වූ මෘග පක්ෂි ආදි වූ සත්ත්වයන් සල්ව-සල්වා මරන්නා හ.

127. "තව ද, ඒ අඥාන වූ බ්‍රාහ්මණයෝ 'සත්ත්ව-යෙනි, යාග සභාමඟයෙහි ගව මහිෂාදීන් බැන්දූහු වී නම්, මේ යාගාවාටයෙහි මුක්තා මාණික්‍ය ශංඛ ශිලා ප්‍රවාල මසාරගල්ල රජත සුවණ්ණාදි යැ සි කියන ලද දශ විධ රත්-නය හා ශාලි වීරීහ්‍යාදි වූ සප්ත විධ ධාන්‍යය දූවූ නම්, තොප

හැමට පර ලෙව්හි දී මේ යාග සභාමඟයට කරන ලද සත්-කාර කැමැති කැමැති වසඟ සාධා දී ලත්තේ යැ. අජරාමර බවත් කරන්නේ යැ' යි විසිතුරු වූ කාරණ-යෙන් නොයෙයක් දෑ කියා, සත්ත්වයන් මිථ්‍යා දෘෂ්ටි ගන්-වන්නා හ. ඉදින් යාග සභාමඟයෙහි වත් ,අමු දඬුයෙහි වත් වියැළි දඬුයෙහි වත්, මුතු මැණික් රන් රිදී ධන ධාන්‍ය ඇත් නම්, යාග සභාමඟය දිව්‍ය ලෝකයෙහි දී ඉෂ්ටාපූර්ත ප්‍රසවය කෙරේ නම්, බ්‍රාහ්මණ සමූහයා වෙත් වෙත් වැ ගෙනැ තුමූ තුමූ මැ යාග කරන්නා හ. වසඟුව නිසාත් යාඥි ලෝකෝත්පත්තිය නිසාත් බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ ජාතියෙහි අන්‍ය වූ සත්ත්වයන් ලවා යාග නො කරන්නා හ. යම් හෙයෙකින් තමනට වසඟු කැමැති වැ අනුන් ලවා යාග කරවද්ද, එ සේ හෙයින් 'මේ බමුණෝ නම් අසත්‍ය වාදි සත්ත්ව කෙනෙකැ' යි දත යුත්තේ යැ. යාග සඤ්ඤා ස්වභාවයෙන් මැ නො වන්නා වූ කායික හෙයින් 'බමුණන් කියන්නා වූ ඔස් අසත්‍ය යැ' යි-මේ කාරණයෙනුත් දනැ ගනුව.

128. "ඉදින් ඒ බ්‍රහ්මයා සියලු ලෝක වාසීනට ඉසුරුමත් වැ නායක වැ සිටියේ වී නම් බොහෝ වූ සත්ත්වාඛ්‍ය වූ ප්‍රජාවට අධිපති වැ ලෝක නිර්මාණය කෙළේ වී නම්, සියලු ලෝක වාසී වූ සත්ත්වයනට කුමක් නිසා දුක් කෙරේ ද? බ්‍රහ්මයා විසින් මැ ලෝක නිර්මාණය කළ පසු, ලෝ වැස්සනට හැම කල්හි මැ සැප විඳු-වනවා මිසැ දුක් නොකළ මනා වේ ද? ලෝකයෙහි දුකත් සැපත් දෙක මැ ඇති හෙයින් බ්‍රහ්ම නිර්මිතියක් නොකළ නියාව මේ කාරණයෙනුත් දනුව. ඉදින් බ්‍රහ්මයා මැ ලෝක නිර්මාණය කොටැ දුක් සැප දෙක ඇති කෙළේ වී නම්, තොප ගේ බ්‍රහ්මයා හා සමාන වූ ලෝකය විනාශ කරන්නා වූ සොරෙක් නැතැ යි කියමි හ.

129. "නවද, අරිට්ඨයෙනි, ඉදින් මහා බ්‍රහ්මයා සියලු ලෝකයට ඉසුරුමත් වී නම්, ප්‍රජා නායක වී නම්, ප්‍රාණ ඝාතය, අදත්තාදානය, කාම මිථ්‍යාචාරය, මෘෂා වාදය, සුරා පානය, මායා, සාඨෙය්‍ය, සභාමඟ, සාරම්භ, ඊර්ෂ්‍යා, මාත්සර්‍ය,

මක්ඛ, පලාස, මානාතිමාන, මද, ප්‍රමාද යන මේ අධර්ම හා එක් කොටැ ලෝ වැස්සන් කුමක් නිසා යෙදී ද? ඉදින් අරිට්ඨයෙනි, මහා බ්‍රහ්මයා තෙමේ මේ ලොව ඇති කෙළේ නම්, සියලු සත්ත්වයෝ බ්‍රහ්මයා නිසා ඇති වූ නම්, ඒ බ්‍රහ්මයා දශ කුශල ධර්මය ඇති වැ තිබියැ දී දශ අකුශල ධර්මයකුත් ඇති කෙළේ යැ. එ සේ හෙයින් ඔහු අධර්මිෂ්ට ය හ සි කියම් හ. තව ද අරිට්ඨයෙනි, පණු පලඟැටියන් හා නයින් මඩුවන් හා මැසි මදුරුවන් හා ආදි වූ ක්ෂුද්‍ර පාණීන් මරා ලෝකයෙහි සත්ත්වයන් පිරිසුදු වෙති, නිවන් දකිති'' සි කියා මෙ සේ කියන්නා වූ අනාර්ය ස්වරූප ඇති මේ ධර්මයෝ කාම්බෝජ රාජ්‍ය වාසි වූ බොහෝ සත්ත්වයන් ගේ අසත්‍ය වචන සේ අසත්‍ය වන්නා හ. ඔවුන් විසින් 'අධර්මය ධර්මයෙකැ' සි විරුද්ධ කොටැ ගන්නා ලදි. එ සේ හෙයින් ඒ කාම්බෝජ රාජ්‍ය වාසි වූ සත්ත්වයනුත් තොප ගේ බ්‍රහ්මයා මැවූව සි සිතමි'' සි කී හැ.

24. බමුණු මත බිඳුම – iii.

130. මෙ සේ මහ බෝ සතාණෙෝ කාණාරිට්ඨයනට වේද මන්ත්‍රාදිය ඇත්තක් නො වන නියාව නොයෙක් පරිද්දෙන් කියා, නැවැතත් ''ප්‍රාණ ඝාතය කොටැ සඟි ලෝකෝත්පත්තිය වේ නම්, මහ වනයෙහි වියැළි දඬු–යෙහි වත් අමු දඬුයෙහි වත් මුතු මැණික් රන් රිදී ධන ධාන්‍යාදිය කොයින් ඇති වේ ද? මෙ සේ වස්තුව තමා අවිද්‍යමාන කලැ, දිව්‍ය ලෝකයෙහි දී කැමැති කැමැති වස්තු සාධා දී ලන්නටත් අජරාමර කරන්නටත් යාග සහම්භය කෙ සේ සමර්ථ වේ ද? එ සේ හෙයින් බමු–ණන් ගේ බස්නම් සඒ ප්‍රකාරයෙන් මැ අසත්‍ය වන්නේ යැ. තව ද අරිට්ඨයෙනි, මේ බමුණෝ නම් කෙරාටිකය හ, වඤ්චක ගුණ ඇත්තා හ, නිෂ්කරුණය හ. එ බඳු වූ ගුණ ඇති ඒ බමුණෝ අඥාන වූ ලෝ වැස්සන් වඤ්චිත කොටැ පොළඹවා ගෙනැ, 'සත්ත්වයෙනි, තෙපි ගිනි ඇරි ගෙනැ ගිනි දෙවියාටත් පූජා කරවු, අපටත්

වසතු දෙවු. මෙ සේ කරන ලද වහ්නි හෝමයෙන් හා සම්පත්ති දානයෙන් හා සියලු වසතු කාම ක්ලේශ කාමයන් ලැබෑ සුඛිත මුදිත වත්තේ යැ' සි මෙ සේ අනේක ප්‍රකාර වූ විසිතුරු කාරණයෙන් නොයෙක් දෑ කියා සත්ත්වයන් මිථ්‍යා දෘෂ්ටි ගන්වන්නා හ.

131. "තව ද, **අරිට්ඨයෙනි**, මේ බ්‍රාහ්මණයෝ රජ යුව රජ මහ ඇමැතියන් ගෙනැ ගිනි හල් ගෙට වැදී, ඒ යාග ශාලායෙහි දී රාජ රාජ මහාමාත්‍යාදිනට විසිතුරු වූ කාරණ කියා, ඔවුන් ගේ කෙස් හා දැළි රැවුළු හා අත් නියත් කපා, වේද මන්ත්‍රය නිසා මේ මේ දෑ කට යුතු යැ සි කියන්නාහු, වේදයෙන් ඒ රාජ රාජ මහාමාත්‍යාදින් සන්තක ධනය නොයෙක් පරිද්දෙන් නසන්නාහු යැ. තව ද, **අරිට්ඨයෙනි**, ඒ බ්‍රාහ්මණයෝ කපුටු සමූහයා විසින් තනි තැනෙකැ දී වටැ ලා ගත් බත මුහුණකු මෙන් බොහෝ දෙන එක් වැ එක් ප්‍රධාන පුරුෂයකු වටැ ලා ගෙනැ, අනේක ප්‍රකාර වූ කුහක කම කොටැ, යාග වණිනා කිරීමෙන් වඤ්චිත කොටැ, ඔහු සන්තක වූ අනේක ප්‍රකාර වූ උතුම් වූ රස මස වැළඳින් යුක්ත වූ භෝජනය අනුභව කොටැ, ඉක්බිත්තෙන් ඔහු ඉසැ තේ කපා මුඩු කොටැ ගිනි හල් ගෙයින් පිටත් කොටැ යාගාවාටයට ගෙනැ යන්නා හ. මෙ සේ ඒ ප්‍රධාන පුරුෂයා බොහෝ බමුණන් විසින් එක් වැ ගෙනැ තනි කොටැ වඤ්චිත කරන ලද්දාහු, නැවැතැ ඒ බමුණෝ ඒ ඒ වස්තුව හා එක් කොටැ ගෙනැ යෙදූ, නොයෙක් කාරණ කියා ඔහු සන්තක විද්‍යමාන වූ ධනය පැහැරී ගෙනැ ඔහු පළමු නුදුටු දිව්‍ය ලෝකය වණිනා කොටැ, 'ගිනි දෙවියාට පූජා කිරීමෙන් හා යාග කිරීමෙන් හා මෙ බඳු වූ දිව්‍ය ලෝකයෙහි ඉපැදී අජරාමර වෙති' සි කියා ඔහු ගේ සිත සතුටු කරන්නා හ.

132. "තව ද **අරිට්ඨයෙනි**, මේ බ්‍රාහ්මණයෝ රජ දරුවන් විසින්, 'මෙ තෙක් මෙ තෙක් අය පඬුරු ගනුව' සි නියෝග කරන ලද රාජ පුරුෂයන් මෙන් යාග කරන්නා වූ පුරුෂයා සන්තක වස්තුව නොයෙක්

කාරණ කියා යාග පිටැ මැ ලා පැහැරි ගන්නා හ. එ සේ හෙයින් මේ බමුණෝ තම නිබඳ කරවුවර ගන්නා වූ රාජ පුරුෂයන් හා උමං බිඳීම් මං පැහැරීම් ආදි වූ සොර කම් කොටැ ජීවත් වන්නා වූ සොරුන් හා සමානය හ. නො කළ මනා කාර්‍ය කරන හෙයින් වධයට නිසිය හ. යාග කරන්නවුන් සන්තක වස්තුව නොයෙක් පරිද්දෙන් පැහැරි ගෙන, යාග කොටැ, ඒ සත්ත්වයන් දිව්‍ය ලෝකයට නො පමුණුවා නරකාදි වූ සතර අපායයට පමුණුවන හෙයින් අසත්පුරුෂය හ. එ සේ හෙයින් මල, **අරිට්ඨසෙනි**, මේ ලෝකයෙහි මේ බඳු වූ අසත්පුරුෂ ගුණ ඇති පවිටු වූ සොර බමුණන් නො මරන කලැ මරන්නේ කවුරුන් ද?

133. "තව ද **අරිට්ඨසෙනි**, බමුණන් කියන්නා වූ මේ බොරුවකුත් අසා බලව. ඒ බ්‍රාහ්මණයෝ යාග ස්‍ථානයෙහි මහත් වූ කැල ලියක් හිඳුවා, 'මේ තෙමේ **ශක්‍ර** දේවේන්ද්‍රයන් ගේ දක්‍ෂිණ බාහුව යැ' සි කියා, ඒ කැල ලිය කපා පොලු ගසන්නා හ. ඉදින් 'කැල ලිය කැපීමෙන් **ශක්‍ර** දේවේන්ද්‍රයන් ගේ අත කැපි යන්නේ යැ' සි යන මේ බමුණන් ගේ වචනය සත්‍ය වී නම්, **ශක්‍ර** දේවේන්ද්‍රයෝ අත කොට වූ තැනැත්තෝ බාහු බලයෙන් අසුරයන් හා යුද්ධ කොටැ කෙ සේ නම් සටනින් ජය ගත්තු ද? එ සේ හෙයින් බමුණන් ගේ බස් බොරු නියාව සිතව. ඒ **ශක්‍ර** දේවේන්ද්‍රයෝ නුසුන්නා වූ බාහු ඇත්තා හ, අන්‍ය සත්ත්වයන් විසින් නසා ලිය නො හැක්කා හ, මහත් වූ උත්කෘෂ්ට වූ කුශලානුභාවයෙන් යුක්තය හ. එ සේ හෙයින් බමුණන් ගේ මේ වේද මන්ත්‍රයෝ නම්, ලෝකයෙහි දෘෂ්ට ප්‍රත්‍යක්‍ෂ වූ වඤ්චන කොට්ඨාසයෝ වන්නා හ. තුච්ඡ වූ වේද මන්ත්‍රයන් හා යුක්ත වූ බමුණෝත් නිෂ්ඵල වූ වචන ඇත්තාහු යැ.

134. "තව ද අපිට්ඨයෙනි, 'කාලගිරි පර්වතය හිමාලය පර්වතය ගිජ්ඣකූට පර්වතය සුදර්ශන පර්වතය නිසභ පර්වතය කාකනේරු පර්වතය යන මේ පර්වතයෝත් අන්‍ය වූ මහා පර්වතයෝත් යාග කරන්නා වූ බමුණන් විසින් ආසන වශයෙන් බඳවන ලද පර්වතයෝ යැ' යි යම් මේ වචනයක් කියවූ නම්, අප විසින් දක්නා ලද මේ පර්වතයෝ නිශ්චලය හ, ඒක ඝනය හ, ශෛලමය හ. උළින් බඳනා ලද ආසන සඞ්ඛ්‍යාත වූ පර්වතයෝ චලිතයෝ යැ, ඒක ඝන නොවෙති, ශෛලමය නොවෙති. එ සේ හෙයින් උළින් බඳනා ලද ආසනයෝ කල් යාමෙකින් පර්වතයෝ නොවන්නා හ. අය ලෝහ, තාම්‍ර ලෝහ, කාංස ලෝහ, වට්ට ලෝහ, හාරකූට ලෝහත් නොවන්නා හ. යාග කාරක බ්‍රාහ්මණයෝ යාග වර්ණනා කරන්නාහු, 'බරණැස් රජ්ජුරුවන් යාග කාරක බ්‍රාහ්මණයන් ඉදිනා පිණිස උළින් බඳනා ලද අසුන් බ්‍රාහ්මණයන් ගේ අනුභාවයෙන් ක්‍රමයෙන් වැඩී පර්වත වැ හියේ යැ' යි කී හ. තව ද, 'වේද මන්ත්‍ර හදාරන්නා වූ තපෝ නිශ්‍රිත වූ යාචක යෝගි වූ මන්ත්‍රයෙන් යුක්ත වූ බ්‍රාහ්මණයා සමුද්‍ර තීරයෙහි සිටැ අඟට පැන් දම-දමා නාන තැනැත්තවුන් සමුද්‍රයෙන් රැළ අවුත් ගසා ගෙනැ ගොස් මුහුදු බත් කෙළේ යැ' යි, 'එ බස් අසා මහා බ්‍රහ්මයා කිපි මා ගේ දරුවන් සමුද්‍රයෙන් නස්නට කාරණ කවරේ ද? එ සේ හෙයින් මේ සමුද්‍ර ජලය අන්‍ය සත්ත්වයනට නිෂ්ප්‍රයෝජන වැ ලවණ රස වේව යි කියා සස් කෙළේ යැ' යි බමුණන් කියන්නා වූ මේ වචනය ඉදින් සත්‍ය වී නම්, සම්පූර්ණ කොටැ ගන්නා ලද වේද මන්ත්‍ර ඇති බමුණන් දහසක් දෙනා මන්ත්‍ර පිරුවමින් සිටියවුන් ගංගා ජලය ඇදී ගෙනැ ගොස් නසා පියැ. ඒ බ්‍රාහ්මණයන් දහසක් දෙනා වැටුමෙහි කරකවා යටැ ගලා ජීවිත ක්ෂයයට පමුණුවන්නට සමර්ථ වූ ගංගා ජලය ලවණ රස නුවූයේ කුමක් නිසා ද? එසේ බමුණකු නසා පු හෙයින් සමුද්‍ර ජලය ලවණ රස වූයේ කුමක් නිසා ද? කිමෙක් ද, අතාප ගේ මහා බ්‍රහ්මයා ගංගායෙහි ජලය ලවණ රස

කොටැ ගන්නට අසමර්ථ ද? සමුද්‍ර ජලය මැ ලවණ රස කොටැ ගන්නට සමර්ථ ද? එ සේ හෙයින් බමුණන් ගේ බසෙහි පූර්‍වාපර සන්ධියක් වත් හරයක් වත් නැති නියාව මින් මැ දනුව. තව ද මනුෂ්‍ය ලෝකයෙහි ළිං පොකුණු කණන්නා වූ මනුෂ්‍යයෝ තමනට කුසල් නිසා ඒ ඒ තැනැ බොහෝ ළිං පොකුණු කණිති. ඒ ළිං පොකුණු ආදියෙහි බමුණෝ වැටී බෙහෙවින් සේ මියන්නා හ. එ සේ හෙයින් කළ ළිං පොකුණු ආදියෙහි ජලයත් ලවණ රස වූව මනා නො වේ ද?

25. බමුණු මත බිඳුම–iv.

135. "නව ද අපිවිඨයෙනි, 'ප්‍රථම කල්පයෙහි කවුරු කවුරුනට භාර්‍යා නම් වූ ද? එ සමයයෙහි ස්ත්‍රී ලිඟු නැත්තේ යැ. පසු වැ දව්‍යන්දව්‍ය සමාපත්ති වශයෙන් දෙ මවු පියෝ නම් වූ හ. එ සමයයෙහි සත්ත්වයෝ මනෝමය වැ උපන්නා හ. විකසය මැ මනුෂ්‍යයා ඉපැදෙවී යැ', යන මේ කාරණයෙනුත් ජාතියෙන් යටත් වූ කිසිවෙක් නම් නැත්තේ යැ. එ සමයයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි වූ චතුර්වර්ණ විභාගයෙකුත් නැත්තේ යැ. එ සේ හෙයින්, 'බ්‍රාහ්මණයෝ මැ ජාතියෙන් ශ්‍රේෂ්ඨයෝ යැ, අවශේෂයෝ ජාතියෙන් හීනයෝ යැ' සි යන යම් බසක් බමුණෝ කියත් නම් ඒ බස අභූත වන්නේ යැ.

136. "මෙ සේ ක්ෂත්‍රියාදි විභාගයක් නැති වැ පවත්නා වූ මේ ලෝකයෙහි, පුරාතන ප්‍රවෘත්තිය හැරැ පසු වැ තමන් විසින් සිතුසිතූ ලෙස කරන ලද ක්‍රියාවන් ගේ වශයෙන්, ක්ෂත්‍රිය බ්‍රාහ්මණයෙක් නම්, ලෝකයෙහි සම්භාවයෙන් නැත්තේ යැ. එ සේ හෙයින් සියලු බමුණෝ සිංහ ව්‍යාඝ්‍රාදි වූ තිරශ්චීනයනටත් වඩා හීනයෝ යැ. මේ බමුණන් ගේ මනුෂ්‍යත්වය නම් ගව මහිෂාදීන් මෙන් දත යුත්තේ යැ. කුමක් නිසා ද? ඒ බමුණන් නුවණ නැති බැවින්, 'ගෙරින් ගේ සටහන් අනෙකෙකැ, බමුණන් ගේ අනෙකෙකැ' සි ගෙරින් හා සමාන යැ. ජාතිය සම නො වන්නේ යැ. ප්‍රඥයෙන්

හා ශෞර්‍ය විර්‍යයෙන් පුරුෂත්වයක් නැති බැවින් මනුෂ්‍යයන් තබා තිරශ්චීන වූ සිංහාදීනටත් යටත් වැ සිටී හෙයින් බමුණෝ ගෙරිත් හා සමානයෝ මැ යැ.

137. "තව ද අරිට්ඨසෙනි, ඉදින් මහා බ්‍රහ්මයා දුන් බැවින්, රජ දරුවෝ මැ මුළු පොළොව ජය ගෙනැ තමන් හා එක් වැ ජීවත් වන්නා වූ අමාත්‍යයන් ගෙන් යුක්තයෝ නම්, තමන් කීවා කරන්නා වූ පණිත් ඇත්තෝ වී නම්, එ සේ කල්හි රජ්ජුරුවනට පණිත් හා සමඟ යුද්ධ කොටැ රාජ්‍යය දියැ යුතු නම් නොවෙයි. රජ්ජුරුවෝ තුමූ ඝුදෙකලා වැ මැ සතුරු සමූහයා ජය ගන්නාඝු යැ. එ සේ කල්හි යුද්ධයෙන් දුක් නැති බැවින් ඒ රජ්ජුරුවන් ගේ ප්‍රජාව නිරන්තරයෙන් සැප විඳිනා හ. යම් හෙයෙකින් 'රජ්ජුරුවෝ ඝුදෙකලා වැ මැ සතුරන් ජය ගනිති. උන් ගේ ප්‍රජාව යුද්ධ නොකොටැ නිරන්තරයෙන් සැප විඳිති' යි යන්නෙක් නැද්ද, එ සේ හෙයිනුත් බමුණන් ගේ බස් අසුන වන්නේ යැ.

138. "තව ද, අරිට්ඨසෙනි, 'රාජ නීතිය හා වේද මන්ත්‍රය ද තමන් ගේ ආඥයෙන් හා අභිප්‍රායය පරිද්දෙන් ද කට යුතු යැ' යි රජ දරුවන් හා බමුණන් විසින් ද පවත්වන ලද බැවින් අපියෙන් මේ දෙක මැ සම වන්නේ යැ. රාජ නීතියෙහි අපි රජ දරුවෝත් වේද මන්ත්‍රයෙහි අපි බමුණෝත් නිශ්චය කොටැ ගත නොහි, ආඥ වශයෙන් මැ ගන්නාඝු, ද්වි ප්‍රකාර වූ අපිය මැ වතුදු ක්ෂත්‍රිය ආදි වූ චතුර්වර්ණයෝ වූ හ. 'තමන් තමන් විසින් කරන ලද ක්‍රියා විභාගයෙන් මැ ඒ ඒ සත්ත්වයන් අතුරින් සමහර කෙනෙක් ක්ෂත්‍රිය වූ හ, සමහර කෙනෙක් බ්‍රාහ්මණ වූ හ, සමහර කෙනෙක් වෛශ්‍ය වූ හ. සමහර කෙනෙක් ශූද්‍ර වූ හ' යි මේ විභාගය නුවණැත්තෝ කියති. එ සේ හෙයින් 'බ්‍රාහ්මණයෝ මැ ශ්‍රේෂ්ඨයෝ යැ' යන මේ වචනය අසත්‍ය වන්නේ යැ.

139. "තව ද අරිට්ඨයෙනි, ඉදින් මහා බ්‍රහ්මයා විසින් බ්‍රාහ්මණයනට මෑ වේද මන්ත්‍රය දෙන ලද්දේ විනම්, සෙස්සනට නො දෙන ලද්දේ විනම්, චණ්ඩාල පුත්‍ර වූ මන්ත්‍ර පිරුවන තැනැත්තවු ගේ හිස සත් කඩක් වෑ නො පැලෙන්නේ ඇයි ද? යම් මහයෙකින් ඔහු ගේ හිස නො පැලේ ද, එ සේ හෙයින් මේ බමුණන් විසින් ආත්ම වධය පිණිසැ මන්ත්‍ර කරන ලද්දේ යැ. ඒ පුරාතන බමුණන් ගේ මුසා වාදී බව ප්‍රකාශ නො කරන්නාහු තමන් ගේ මෑ ගුණ විනාශ කරන්නෝ නම් වෙති. තව ද මේ වේද මන්ත්‍ර නම් මුසා වාදයෙන් මෑ සිතා කරන ලද්දේ යැ. ලාභයෙහි හිඳුවූ බ්‍රාහ්මණයන් 'විද්‍යමාන වසතුවෙකැ'යි උගන්නා ලද්දාවූ වේද මන්ත්‍රය මසකු හිටූ බිලියක් මෙන් ගලවා ලියැ නො හැක්කේ යැ. කාව්‍ය කාරක බ්‍රාහ්මණයෝ යම් කියනු කැමැත්තෝ වී නම්, ඒ දෙය බොරුයෙන් ගොතා බඳනා හ. එ සේ හෙයින් කාව්‍ය කාරක බ්‍රාහ්මණයන් ගේ බස් අනුවැ යන්නේ, ඒ අඥානයන් ගේ විපරීත ග්‍රහණයෙහි පිහිටි හෙයින්, අඥාන වූ සත්ත්වයා, තමන් තුවණ මඳ හෙයින් ඒ වේද මන්ත්‍රය 'ඇත්තෙකැ'යි අදහා ගන්නේ යැ. තව ද අරිට්ඨයෙනි, සිංහයන් ව්‍යාඝ්‍රයන් දිවියන් ආදි වූ ශක්ති සම්පන්න සත්ත්වයන් ගේ යම් පුරුෂත්වයෙක් ඇත් නම්, ඒ පුරුෂත්වය බමුණාට නැත්තේ යැ. ශක්තියෙන් යුක්ත ගැල් හිමයෙන් සැඟවී නො පෙනෙන්නා වූ මාහීයක් මෙන් දුනැ ගත නො හෙන්නේ යැ.

140. "තව ද අරිට්ඨයෙනි, රාජ නීතින් වේද මන්ත්‍රත් ශබ්දවී හෙයින් සමාන වන්නේ යැ. කුමක් නිසා ද? 'බ්‍රාහ්මණයෝ මෑ ශ්‍රෙෂ්ඨයෝ යැ, අන්‍ය වූ ක්ෂත්‍රියාදි වූවෝ හීනයෝ යැ'යි බමුණෝ කියන්නා හ. එ සේ හෙයින් ලාභ යැ, අලාභ යැ, අයස යැ, යසස යැ, නිඳු යැ, ප්‍රශංසා යැ, සුඛ යැ, දුඃඛ යැ, යන මේ අෂ්ට ලෝක ධර්ම ය ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි වූ චතුර්වර්ණයන් ගේ සාධාරණ ධර්මයෙකැ. අෂ්ට ලෝක ධර්මයෙන් විනිර්මුක්ත

වූ එක ද සත්ත්වයෙක් නම් නැත්තේ යැ. එ සේ හෙයින් බ්‍රාහ්මණයෝ සවී සාධාරණ වූ ලෝක ධර්මයෙන් නො මිදී සිටැ, 'අපි හැම ශ්‍රේෂ්ඨයම් හ'යි නැත්තක් කියන්නා හ.

141. "තව ද අරිට්ඨයෙනි, මේ මනුෂ්‍ය ලෝකයෙහි බොහෝ ගෘහයෝ ධන ධාන්‍යාදිය නිසා අනේක ප්‍රකාර වූ කර්මාන්තයන් කෙරෙද්ද, එ පරිද්දෙන් මැ පොළෝ තලයෙහි බොහෝ බ්‍රාහ්මණයෝත් කෘෂිගෝ රක්ෂණාදි වූ කර්මාන්ත බොහෝ සේ කරන්නා හ. එ සේ හෙයින් මේ බ්‍රාහ්මණයෝ ගොවින් හා සම වන්නා හ. තව ද නිරන්තරයෙන් කර්මාන්ත කිරීමෙහි උත්සාහවත් වැ පඤ්ච කාම කොට්ඨාසයෙන් යුක්ත වූවා හ. පොළෝ තලයෙහි විද්‍යමාන වූ කෘෂි ගෝ රක්ෂණාදි වූ සියලු කර්මාන්ත කරන්නාහු ද, එ සේ හෙයින්, මල, අරිට්ඨයෙනි, ඒ අඥාන වූ අන්ධ වූ මෝඝ වූ බ්‍රාහ්මණයෝ ධර්මයෙන් දුරින් දුරැ වන්නා හ. පුරාතන වූ බ්‍රාහ්මණ ධර්මය දැන් සුන්බයන් කෙරෙහි පෙනෙන්නේ යැ" යනාදීන් අඩෙෝත්තර පඤ්චකයෙහි කියන ලද ක්‍රමයෙන් මැ දත යුතු වෙයි.

142. මෙ සේ මහ බෝ සත්‍යාණෝ ඒ කාණාරිට්ඨයන් ගේ මිථ්‍යා වාදයන් බිඳැ, ඔවුන් තමන් ගේ වාදයෙහි පිහිටුවූ හ. ඒ මහ බෝ සත්‍යාණන් ගේ ධර්ම කථා අසා නාග පර්ෂත් සොම්නසට පැමිණියා හ. මහ බෝ සත්‍යාණෝ නේසාද බ්‍රාහ්මණයාට ආක්‍රෝශ පරිභව පමණකුත් කළ නො දී නාග භවනයෙන් පිටත් කොටැ මනුෂ්‍ය ලෝකයෙහි ලැවූ හ.

26. සාගර බ්‍රහ්මදත්ත–නාග රාජ හමුව.

143. තව ද සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මහ බෝ සත්‍යාණන් බොහෝ පර්ෂත් පිරිවරා මහත් වූ ශ්‍රී විභූතීන් හා උතුම් වූ රූප ශෝභායෙන් හා යුක්ත වැ එන නැනැත්තවුන් ඇදිනැ ගත නො හී, පිය රජ්ජුරුවන් අතින් විචාරන්නාහු, මෙ සේ විචාළ හ. "රාජ

තපස්වීන් වහන්ස, මහ බෙර, පණා බෙර, ඒහිඟු බෙර, ගැට බෙර, පටහ බෙර හා සක් සින්නම් ආදි වූ තේරි තූසී නාද භාණ්ඩයන් ද ගසමින් පිඹිමින් රාජෝත්තම වූ ඒ රජ්ජුරුවන් සතුටු කරවමින් ගසනා පිඹිනා අය ඉදිරියේ නික්මුණා හ. මොහු කවුරුන් ගේ ගසන්නෝ ද? පිඹින්නෝ ද? තව ද තපස්වීන් වහන්ස, නළල් කෙළවරැ බඳනා ලද නළල් පටියෙන් මෙඝ මුඛය බබුළුවන්නා වූ විදුලියෙකින් මෙත් මුඛය බබුළුවන්නේ යැ. එ බඳු වූ මුඛය කා ගේ මුඛයෙක් ද? ඝියොවුරු බැඳැ දුන්න හා ඊ දඹු හා අතට ගෙනැ, කඹුව උරයේ එල්ලා, යුද්ධ සන්නද්ධ වූ තරුණ පුරුෂයකු මෙන් මහත් වූ ශ්‍රී විභූතීන් බබළමින් එන්නා හ. මෙ බඳු වූ පින්වත් මහිම ගුණයෙන් යුක්ත වැ එන්නා වූ මූ කවුරු ද? උදුනෙහි ලන ලද කකියවන ලද චාමීකර සඛණීයක් වැනි වූ ද, ඇවිලෙන්නා වූ කිඟිර'හුරු රැසක් වැනි වූ ද ප්‍රභා සහිත වූ මුඛය ළඟිරු මඬලක් මෙන් බබළන්නේ යැ. මෙ බඳු වූ රූපශ්‍රීන් දිලියෙමින් එන්නා වූ මූ කෙ බඳු කෙනෙක් ද?

144. "තව ද තපස්වීන් වහන්ස, සිත් කලු වූ කුඩා ගෝනැසින් යුක්ත කොටැ සරහන ලද ජාම්බුනද සඛණීමය වූ මේ ඛවලාතප ත්‍රය කා ගේ ද? මෙ බඳු වූ, ඛවලාතප ත්‍රයෙන් සුසී රශ්මීන් වළක්වමින් මහත් වූ ශ්‍රී විභූතියෙන් දිලියෙමින් එන්නා වූ මූ කවුරු ද?

145. "තව ද තපස්වීන් වහන්ස, ඇකයෙහි රන් මිටි හිඳුවා ගෙනැ උතුම් වූ වල් විදුනාවක් ගෙනැ තෙලෙ එන්නා වූ උත්තම පුරුෂයා ගේ මසකයට අනවරතයෙන් සලන්නා හ. මෙ බඳු චාමර සල්වසල්වා එන්නා වූ මොහු කෙ සේ වූ කෙනෙක් ද? සවී රත්නයෙන් විචිත්‍ර වූ තපනීය සඛණියෙන් හා අනේක ප්‍රකාර වූ මාණික්‍යයෙන් ද කර්මාන්ත කරන ලද මිටි ඇති මෘදු වූ මොහර පිල් කලබක් සේ තෙලෙ එන්නා වූ මහා පුරුෂයා ගේ මුඛය දැලයෙහි සලන්නා හ. මෙ බඳු වූ මයුර පිච්ඡ කලාපයන් සල්වසල්වා එන්නා වූ මොහු කවුරු ද?

දිලිසෙන්නා වූ කිණිර'ඟුරු රැසක් හා සමාන වූ උදුනෙහි [illegible] ද චාම්කර ඔබඟිමය වූ සිත් කලු වූ කුණ්ඩලාභරණයෝ දෙ දෙන තෙලෙ එන්නා වූ මහෝත්තමයා ගේ මුඛය දෙ පසින් හොඹවන්නා හ. මෙ බඳු වූ මාණික්‍ය කුණ්ඩලාභරණයන් පැළඳැ ගෙනැ එන්නා වූ මොහු කවුරු ද?

146. එව්ද තපස්වීන් වහන්ස, සිනිඳු වූ මොළොක් වූ කෘෂ්ණ වර්ණ වූ කේශ කලාපය පවනින් පහරන ලද්දේ, නිල් වූ අහසින් නැඟි විදුලියක් වැනි වූ නළල් කෙළවර හොඹවන්නේ යැ. මෙ බඳු වූ කේශ කලාපයෙන් යුක්ත වැ එන්නා වූ මූ කවුරු ද? තව ද මේ එන්නා වූ පින්වතුන් ගේ දිගු පුළුල් නිල් නුවන් ඇති මුඛය විශේෂයෙන් හොඹනේ යැ. විශාල නේත්‍ර ඇති මොහු කවුරු ද? දිවි දළින් ඔප් නගන ලද රන් කැඩ පතක් හා සමාන වූ මේ පෙම් බර මුහුණ කා ගේ ද? තව ද මුඛයෙහි පිහිටියා වූ පිරිසුදු වූ සක් කැබැලි පඬුකුරියක් හා සමාන වූ ද, කොඳ කැකුළු හා සමාන වූ ද, හෙල් මැළි කැකුළු හා සමාන වූ ද, දන්ත පඬුරු සිහි කථා කරන්නා වූ මේ පින්වතුන් ගේ මුඛය හොඹවන්නා හ. මෙ බඳු වූ දන්ත පඬුරින් හොඹනා වූ මොහු කවුරු ද?

147. "ලාක්ෂා රසයෙන් පුරවන ලද රන් පියුම් ගබක් හා සමාන වූ සැප සේ වැඹුණා වූ මේ අතුල් තල පතුල් තල කා ගේ ද? බිම්බ ඵලයක් හා සමාන වූ අධර යුගළයෙන් යුක්ත වූ මේ උත්තම පුරුෂයා දිවා භාගයෙහි සූසී මණ්ඩලයක් මෙන් බබළමින් එන්නේ යැ. මෙ බඳු රන් පියුම් පෙති වැනි අතුල් පතුල් හා අධර පල්ලවයෙන් ශෝභාවත් වැ එන්නා වූ මූ කවුරු ද? වසන්ත කාලයෙහි හිමාලය වනයේ අග්‍ර සිටැ මූල දක්වා පැළි පිපී ගියා වූ මල් ඇති මහ සල් රුකක් මෙන් ධවල වූ උතුරු සළුවක් පොරොවා අසුර මර්දනය කොටැ ජය ගෙනැ එන්නා වූ ශක්‍ර දේවේන්ද්‍රයා මෙන් සියලු දිස් බබුළුවමින්

එන්නා හ. මෙ බඳු උතුරු සළුව පොරොවා එන්නා වූ මොහු කවුරු ද? රන් බුබුළින් ගැවැසී ගත්තා වූ මැණික්මය වූ කඹු මිටින් විසිතුරු වූ විදුලිය කලබක් වැනි වූ කඹුව තිරිප්පු කොටැ පමිත් මධ්‍යයේ බැසැ එති. තපස්විත් වහන්ස, මෙ බඳු බඩිග පත්‍රයක් ගෙනැ යුද්ධයට නික්මුණු වරම් රජ දරුවක්හු මෙත් එන්නා වූ මූ තුමූ කෙසේ වූ කෙනෙක් ද?

148. "තව ද තපස්විත් වහන්ස, රත් කම් කරන ලද සපත රත්නයෙන් විචිත්‍ර වූ මොනොවට නිමවන ලද විසිතුරු වූ කමීනත විශේෂ ඇති වහන් පසින් ගලවා නුඹ වහන්සේට නමස්කාර කොටැ සිටියා වූ මොහු කවුරු ද ?"යි විචාළා හ. මෙසේ **සාගර බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන් විසින් විචාරන ලද ඍද්ධිමත් වූ අඟිඟු ලාභී වූ නාපසයෝ, "පුත, මොහු **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් ගේ පුත්‍ර වූ තොප ගේ බෑණා වූ නා රජ්ජුරුවෝ යැ" යි කියන්නාහු, "ඍද්ධ්‍යනුභාව ඇති මහත් වූ යස පිරිවර ඇති මේ නා රජ්ජුරුවෝ නම් **ධෘතරාෂ්ට්‍ර** නම් නා රජ්ජුරුවන් නිසා **සමුද්‍රජා**වන් ගෙන් උපන්නා වූ තොප ගේ බෑනණු වූ නා රජ්ජුරුවෝ යැ" යි කී හ.

149. මෙ සේ දෙ දෙනා කථා කෙරෙමින් සිටියැ දී මැ නාග පමිත් අවුත් නාපසයන් ගේ දෙ පතුල් වැඳැ එකත් පස් වැ උන්නාහු යැ. **සමුද්‍රජා**වෝත් පිය රජ්ජුරුවනට නමස්කාර කොටැ අඬා වැලැපැ නාග පමිත් හා සමඟ නාග භවනයට ගියා හ. **සාගර බ්‍රහ්මදත්ත** රජ්ජුරුවෝත් රාජ තපස්විත් සමීපයෙහි කීප දවසක් වැසැ බරණැස් නුවරට ගියා හ. **සමුද්‍රජා**වෝ නාග භවනයේ දී මැ සවඟී සථ වූ හ. මහ බෝ සතාණෝ දිවි පමණින් සිල් රකුණා කොටැ, පෙහෙවස් වැසැ, ජීවිතාවසාන‍යෙහි නාග පමිත් හා සමඟ ගොස් සවඟී ලෝකයෙහි උපන්නා හ.

27. සමෝධානය

150. ශාස්තෘ වූ ත්‍රිලෝගුරු බුදු රජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනැ හැර දක්වා වදාරා, "උපාසක වරිනි, මෙ සේ පුරාතනයෙහි නුවණැත්තෝ අබුද්ධොත්පාද කාලයෙහිත් එ බඳු වූ නාග සම්පත්තිය හැර පෙහෙවස් විසුවෝ මැ වේ දැ" යි වදාරා, පූර්වාපර සන්ධි ගළපා මේ භූරිදත්ත ජාතකය නිමවා වදාළ සේකැ. "එ සමයයෙහි දෙ මවුපියෝ නම් දැන් සුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවී දෙයැ. නේසාද බ්‍රාහ්මණයා නම් දේවදත්ත ස්ථවිරයෝ යැ. සෝමදත්තයෝ නම් ආනන්ද ස්ථවිරයෝ යැ. අච්චිමුඛී නම් උත්පලවණ්ණී මහා ස්ථවිරී යැ. සුදර්ශනයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝ යැ. සුභගයෝ නම් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයෝ යැ. කාණාරිට්ඨයෝ නම් සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර යැ. එ සමයයෙහි ජීවිත පරිත්‍යාග කොටැ පෙහෙවස් ඉවා උපෝෂථ ශීලය රක්ෂා කළා වූ භූරිදත්ත නා රජ්ජුරුවෝ නම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම මැ වේ දැ" යි තමන් වහන්සේ දක්වා වදාළ සේකැ.

3

වෙස්සන්තර ජාතකය

වෙස්සන්තර ජාතකය

1. වර්තමාන කථාව.

තවද එක් සමයයෙක්හි කරුණාවට හේතු වූ, දහමට ලයැති, අසන්නවුන් කන්හි අමා නමන මධුර වූ ධර්ම-දේශනා ඇති, බැලුබැලුවන් අස් නිවන මන හර රූ ඇති, සිතන්නවුන් සිත් නිවන මනෝඥ ගුණ ඇති, දෙව් බඹ මුදුන්හි කෙළනා පා පියුම් ඇති, ලෝක ස්වාමි වූ, අද්වය වාදි වූ, අතුල්‍ය වාදි වූ, අමෘත වාදි වූ, විනය වාදි වූ, විඝජ්ජ වාදි වූ, ධර්මේශ්වර වූ, ධර්ම රාජ වූ, ධර්මාධිපති වූ, ධර්ම ලෝචන වූ, ධර්මාමෘත වූ, ශාක්‍ය සිංහ වූ, ශාක්‍ය කේතු වූ, ශාක්‍යාධිපති වූ, ශාක්‍ය කුල තිලක වූ, කරුණා මෞලි මාලාලඞ්කෘත වූ, සමන්ත භද්‍ර වූ, පර දුඃඛ දුඃඛිත වූ, අශරණ. ශරණ ශරණාගත වජ්‍ර පඤ්ජර වූ, ත්‍රිභුවන චන්ද්‍ර වූ, ජගදනන්ද ලෝචන වූ, දේවාතිදේව වූ, ශක්‍රාතිශක්‍ර වූ, බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, වන්දනීයාභිවන්දනීය වූ, පූජනීයාභිපූජනීය වූ, දශ බල ධාරි වූ, චතුර්වෛශාරද්‍ය විශාරද වූ, ද්වාත්‍රිංශද් වර මහා පුරුෂ ලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජන බ්‍යාම ප්‍රභා කේතු මාලා-ලඞ්කාරයෙන් විරාජමාන වූ, අල්පේච්ඡ වූ, සන්තුෂ්ට වූ, අසංසෘෂ්ට විහරණ ඇත්තා වූ, ආරබ්ධ වීර්‍ය වූ, වචන ක්ෂම වූ, පාප චෝදක වූ, ශික්ෂා කාමි වූ, ජිතේන්ද්‍රිය වූ, ජිත ක්ලේශ වූ, ශීල සම්පන්න වූ, සමාධි සම්පන්න වූ, විමුක්ති සම්පන්න වූ, සර්‍වඥ සිද්ධි ප්‍රසව කර විත්තා මාණික්‍ය භද්‍ර ෂට කල්ප ද්‍රැමායමාන වූ, සසරට ප්‍රතිපක්ෂ වූ. නිවනට දෙර හළුවා වූ, සංඛ්‍යාට හිණි පෙති පෙළක් බඳු වූ, අපායයට අකුල් හෙළූ, ත්‍රියත් ඛවිහි අග තත් පත් වූ, මුළු සක්වළැ සතුන් දැල්වුදැල්වූ ඇස්හි පෙනී යන්නා වූ, සිතුසිතූ සිත්හි ඇදී යන්නා වූ, ඇස් ඇර

දිශාවට සියලු සමපත් දී ලන්නා වූ, **සී** ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිසා **නිග්‍රෝධා-රාමයෙහි** වැඩ වසන සේක්, බන්ධු සමාගමයෙහි පොකුරු වැසි වැසීම අරභයා මේ **ජාතකය** වදාළ සේක.

2. **ඒ** කෙසේද යත්? ලෝක ස්වාමි වූ බුදු රජාණන් වහන්සේ පස් මරුන් බිඳ, සව් තේ ගෙවා දැනැ, **බරණැස ඉසිපතන** අරමහි දී දම්සක් පවත්වා, පිළිවෙළින් දනවු සැරි සරා වඩනා සේක්, **රජගහ** නුවරට වැඩ, හේමන්ත සෘතුව එහි ගත කොට, වසන්ත කාලය පැමිණි කල්හි, **උදායි** තෙරුන් විසින් ගාථා සැටෙකින් මාහී වණ්ණය කරන ලද්දේ, විසි දහසක් මහ රහතන් පිරිවරා, ඥති සංග්‍රහ පිණිස කිඹුල්වත් **පුර** නුවරට වැඩි සේක. එ කල **ශාක්‍ය** රජ දරුවෝ, "අප ගේ නැ උතුමාණන් දක්නමු යැ"සි රැස් වැ, භාග්‍යවතුන් වහන්සේට වැඩ වසන තැනක් විමසන්නාහු, "**නිග්‍රෝධ** නම් **ශාක්‍ය** රජ්ජුරුවන් ගේ උයන යහ පතැ" සි සලකා එහි ගඳ කිළි පිරිවෙන් සක්මන් මළු රාත්‍රි සථාන දිවා සථානාදිය කරවා, සුවඳ මල් ආදිය ගත් අත් ඇති වැ බුදුන් පෙර මගට යන්නාහු, සියලු අලංකාරයෙන් ශෝභමාන වූ නුවර වාසි වූ සොළොසැවිරිදි සිටු කුමරුවන් පන් සියයක් හා සිටු කුමාරිකාවන් පන්සියයක් හා පළමු කොට යැවූ හ. ඉක්බිති සොළොසැවිරිදි **ශාක්‍ය** කුමරුවන් පන් සියයක් කුමාරිකාවන් පන්සියයක් හා පිටත් කොට, ඔවුනට අනතුරු වැ තුමූ ද ගොස්, සුවඳ මල් සුවඳ සුඹු ආදියෙන් පූජා කෙරෙමින්, බුදු රජාණන් වහන්සේ වැඩම කරවා ගෙනැ **නිග්‍රෝධාරාමයට** ගියාහු යැ. බුදු රජාණෝ විසි දහසක් මහ රහතන් පිරිවරා පනවන ලද බුද්ධාසනයෙහි වැඩ හුන් සේක.

3. මාන ජාතික වූ අභිමානයෙන් යුත් **ඒ** ශාක්‍ය රජ දරුවෝ සිතන්නාහු, "**සිද්ධාර්ථ** කුමාරයෝ ඉතා බාලයහ, අප ගේ කනිටු සොහොවුරු හ, අප ගේ

ඛැන ඟ, අප ගේ පුත්‍රයඟ, අප ගේ මුනුබුරුඟ" යනාදීන් සිතා, ළදරු කුමරුවන් ළඟට කැඳවා, "දරුවෙනි, තෙපි පෙරට පෙරට වැ සිටු සිද්ධාර්ථ කුමාරයන් වඳිවු. අපි තොප හැමට පසු වැ ලා නොඟඟවා වඳුම් ඟ. ; මේ මඟ කා ඟටත් නොදන්වව" යි උගන්වා ලූ ඟ. එ බස් අසා බුදුනට බාල වූ රජ කුමරුවෝ පෙරට වැ සිටු බුදුන් වැඳු මඟලු නැයනට අවකාශ නොදී මැ සිටු ඟත් ඟ.

4. මෙ සේ මඟලු නැයන් තමන් වඟන්සේ නොවැඳු සිටි කල්හි, බුදු රජාණන් වඟන්සේ ඔවුන් ගේ අදහස් දැනැ, "මේ නැයෝ මොවුන් ගේ අභිමානයෙන් මා නොවඳනාඟු යැ. එ බැවින් දැන් මැ මොවුන් ගෙන් වැඳුම් ලබම්" යි සිතා වදුරා, අභිඥ පාදක චතුර්ථ ධ්‍යානයට සම වැද අඟස් කුසට පැනැ නැඟු, ඒ නැයන් ගේ, හිස් මුදුන්හි පස් වගුරුවන්නා සේ ගඟණඩම්බ නම් අඹරුන් මුල්හි දී යමා මඟ පෙළහර පෑවා සේ පෙළහර පෑ වදුල සේකැ. ඒ ආශ්චර්යය දුටු ශුද්ධෝදන රජ්ජුරුවෝ පුතණුවන් වඟන්සේ ගේ ශ්‍රී පාද මූලයට ගොස්, මෙ සේ සැලකල ඟ. "ස්වාමීනි, මම නුඹ වඟන්සේ උපන් දා කාලදේවල නම් ඍෂීන් වදනට එළැඹූ නුඹ වඟන්සේ ගේ ශ්‍රී පතුල් දෙක පෙරැළි ඍෂීන් ගේ මඟනකයෙහි පිහිටියා දැකැ සතුටු වැ වැන්දෙමි. ඒ මා ගේ පළමු වන වැඳීම යැ. තව ද, නුඹ වඟන්සේට පස් මස් වූ කලැ, වප් මඟුල් දා දඹ ගසැ මුලැ දී කළා වූ ප්‍රාතිහාර්යය දැකැ සතුටු වැ වැන්දෙමි. ඒ මා ගේ දෙ වන වැඳීම යැ. දැන් මා විසින් පෙරැ නුදුටු විරූ ආශ්චර්ය වූ පෙළහර දැකැ, නුඹ වඟන්සේ ගේ ශ්‍රී පාදය වඳිමි. මෙ මා ගේ තුන් වන වැඳීම යැ" යි කියා වැන්ද ඟ. සුදොවුන් මඟ රජාණන් වැඳි කල්හි, එක මැ රජ දරුවකුත් නොවැඳු සිටීමට නොපොහොසත් වැ, සියල්ලෝ මැ වැන්ද ඟ.

5. මෙ සේ සියලු ගුරු බුදු රජාණන් වඟන්සේ සියලු නැයන් වඳවා අඟසින් බැසැ, පනවන ලද බුද්ධාසනයෙහි වැඩැ හුන් සේකැ. එ කලැ සියලු බනුහු මැ බිඳුණා වූ මන් ඇති වැ, එකඟ වූ සිත් ඇති වැ බුදුන් සමීපයෙහි

හුන්නාහු යැ. ඉක්බිති අකාල මේඝයක් නැතී පොකුරු වැස්සෙක් වටුයේ යැ. ඒ වැස්සෙහි තඹ වත් දිය රැවු දෙමින් පොළොවෙහි දිවෙයි. ඉන් තෙමෙහු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙහු කැමැත්තන් සිරිරෙහි දිය බිත්දුවෙකුදු නො වැටෙයි. ඒ ආශ්චර්‍යය දැක, විසි දහසක් භික්ෂූහු, "බුදුන් ගේ බන්ධු සමාගමයෙහි මෙ බඳු පොකුරු වැස්සෙක් වටුයේ ඉතා ආශ්චර්‍ය යැ"යි කථාවක් ඉපැදුවුවාහු යැ. බුදු රජාණන් වහන්සේ ඒ කථාව අසා වදාරා, "මහණෙනි, පොකුරු වැසි වටුයේ දැන් මතු නො වෙයි. පෙරත් මා ගේ බන්ධු සමාගමයෙහි මහා මේඝය පොකුරු වැසි වැස්වුයේ මැ වේ දැ"යි වදාරා, ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ සේක්, ඉකුත් වත් දස්වා වදාළ සේක.

2. ඵුසති දේවිය ගේ කථාව.

6. හේ කෙ සේද යත්? යට ගිය දවසැ දඹදිවැ සිවි රටැ, ජයතුරා නම් නුවරෙක් වී යැ. ඒ, මහ මුහුදු මැදැ ඇවිදු කෙළුා යන රළ පඬික්ති සේ නිරන්තරයෙන් දිවෙන්නා වූ අශ්වයන් ගේ හේෂා රවයෙන් හා එ සේ මැ නානා ප්‍රකාර සුවණ් කම්බල අතුළා වූ නොයෙක් රථයන්හි චක්‍ර නාදයෙන් හා ගජයින් ගේ කුඤ්ච නාදයෙන් හා ශඛ නාදයෙන් හා ඒක නිනාද වූ, සත්‍රී පුරුෂයන් ගේ නා නා ප්‍රකාර මඩහලයන්හි ගයන නටන නොයෙක් නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඩහයෙහි ගසන ලද මිහිඟු බෙර ආදියෙහි ගම්භීර නාදයෙන් ශ්‍රවණ රමණීය වූ, ප්‍රවීණ වීණා කාරයන් ගේ වීණා සවරයෙන් හා සප්ත සවරයෙන් ද නා නා ප්‍රකාර වේශයෙන් හා භූෂණයෙන් ද යුක්ත වූ, සම්පත්තියෙන් අනූන වූ, යෞවනයෙන් උද්දම වූ, රූපයෙන් මනෝ හර වූ, කුලයෙන් අනින්දිත වූ, විද්‍යායෙන් පරිශුඛ වූ, සැරැසුම්හි නත් වැසි වූ, ක්‍රීඩායෙහි දක්ෂ වූ, අන්තරඩහ වහිරඩහ කායියෙහි ප්‍රමාදයක් නැත්තා වූ, සත්‍රී පුරුෂයන් ගෙන් ගැවැසී ගත්තා වූ නුවරෙක් වී යැ.

7. මෙ සේ සියලු සම්පත්තියෙන් විශිෂ්ට වූ **ජය-තුරා** නුවරැ **සිවි** නම් මහ රජෙක් රාජ්‍යය කරන්නේ යැ. ඒ රජ හට **සඤ්ජය** නම් පුත්‍රයෙක් උපන්නේ යැ. ඒ **සිවි** මහ රජ තෙමෙ පුත්‍රයා වැනි විය පැමිණි කල්හි, ඔහට **මද්‍ර** රජ දූ **ඵුසති** නම් රාජ කන්‍යාව ගෙන්වා අග මෙහෙසුන් කොටැ රාජ්‍යය පාවා දුන්නේ යැ. ඒ **ඵුසති** දේවි තොමෝ පූර්වයෙහි කරන ලද මහ පින් ඇත්තී යැ.

8. මෙයට ඒකානූ වන කපැ ලොවැ පහළ වූ **විපස්සි** නම් බුදුන් සමයයෙහි මේ **ඵුසති** දේවි තොමෝ රාජ දුහිතෘවක වැ ඉපැද්ද, ඒ **විපස්සි** නම් බුදු රජාණන් වහන්සේට සඳුන් සුනු පූජාවක් කොටැ, "මතු බුදු වන කෙනකුනට මවු වන්නෙමි" යි කරන ලද ප්‍රාර්ථනා ඇත්තී, එයින් චුත වැ, දෙව් මිනිස් දෙ ගතියෙහි සැරි සරා හැසිරෙමින් අවුත්, පසු කලෙකැ **සක්** දෙව් රජ හට අග්‍ර මහේෂිකා වැ උපන්නී යැ. ඉක්බිති ඒ දෙව් ලොවැ ආයු ඇති තාක් සිටැ, පස් පෙර නිමිති පහළ වූ කල්හි, **සක්** දෙව් රජ ඇයගේ ආයු ගෙවුණ බව දැනැ, ඈ කැඳවා, **නඳුන්** වනයට ගොස්, එහි යහනක් සරහා, එහි හොවා, ඇට මෙ සේ කී යැ. "යොඳුර **ඵුසති** දේවිය, තිට වර දසයක් දෙමි. ඒ ගනුව" යි කියා වර දසය කියන්නේ, "පෘථිවියෙහි යම් වස්තුවෙක් තිට ප්‍රිය ද, ඒ ඒ ප්‍රිය වූ වස්තුව දස කොටසක් කොටැ ගනුව" යි කීයේ යැ. ඒ දිව්‍ය සත්‍රිය තමා දෙව් ලොවින් චුත වන බව නො දැනැ කියන්නී, "දෙව් රජ, ඔබ හට නමස්කාර වේ වා! මහා වෘක්ෂයක් පහ කරන මහ පවනක් සෙයින් තොප ගේ මෙ දිව්‍ය ලෝකයෙන් මා පහ කරන්නට මා විසින් කවර අකුශලයෙක් කරන ලද්දේ ද?" යි කිව. එ සඳැ **සක්** දෙව් රජ කියන්නේ, "තොප විසින් පවක් කරන ලද්දේ නො වෙයි. මට නී අප්‍රිය ද නො වෙයි. නී ගේ පින් ද ආයුෂ ද පිරිහිණ. එ සේ හෙයින් කීමි" යි කී යැ.

9. එ සඳෑ ඒ දෙවි දූ කියත්නී, "සියලු දෙවියනට අධිපති වූ සක් දෙවි රජාණෙනි, නුඹ වහන්සේ මට වර දෙන කැමැති සේක් වී නම්, ඒ වර දසය ගනිමි"යි කියා වර දසය ඉල්ලන්නී, "මම මෙයින් චුතව ගොස් මිනිස් ලොව ඉපැද, සිවි රටැ සඳ මහ රජ හට අග මෙහෙසුන් වැ වෙසෙම් වා. එක් හැවිරිදි මුල පොල්ලන් ගේ ඇස් මෙන් නිලුපුල් පෙති පැහැයෙන් යුත් ඇස් ඇති වෙම් වා. දෙවි දුනු මෙන් අති නීල වූ භ්‍රූ ලතා ඇති වෙම් වා. ළිඳකි දේවී යැ යන නමින් මැ යුක්ත වෙම් වා. සියලු දඹ දිව්‍ය දස දහසක් රජුන් විසින් පූජිත වන්නා වූ යශස් කීර්ති පිරිවර ඇති වෙම් වා. අඹ බඹරාදි සොළොස් යාචකයන් ගේ අධ්‍යාශයට යෝග්‍ය වූ, ඉල්ලූ දෙය නොමසුරු වැ දෙන්නා වූ, උත්තම වූ ගුණයන් ගෙන් යුක්ත වූ, රූපයෙන් යශසින් සියලු සතුනට ප්‍රිය වූ, පුතණු කෙනකුන් ලබම් වා. තව ද මා ගර්භිණී වූ කලැ, සම කොටැ හා යෙදූ දුනු මිටක් සේ, මා ගේ මද්ධ්‍ය ප්‍රදේශය තුස් නොමහත් වේ වා. මා ගේ පයෝධරයෝ දෙ දෙන හැම කල්හි මැ නොහී උඩ බලා සිටිත් වා. මා හිසැ නර නොනැගේ වා. සියලු සත්ත්වයනට ප්‍රිය වූ මනවඩන්නා වූ වණීවත් වූ සියුම් සිවි ඇති වෙම් වා. රාජාපරාධ කොටැ වධයට පැමිණියවුන් 'මරණයෙන් ගලවමි' යි සිතූ කලැ, තමන් ගේ බලයෙන් මුදා හරින්නට සමර්ථ වෙම් වා. මොනරුන් කොස් ළිහිණියන් විසින් රැවූ පිළිරැවූ දෙන ලද උත්තම සත්‍රීන් ගෙන් ගැවැසී ගත්, කුරුන් කුදුන් ළදරුවන් හා බලතුන් අරස්කැමියන් කිළිඟුන් හා විසින් වනන ලද, සත් රුවනින් විසිතුරු දෙර කවුළුයෙන් හෙබියා වූ, පසඟ තුරු රැවින් යුතු රාජ මන්දිර ඇති, නොයෙක් මධුරාහාර පානයන් 'කව බොව' යන ඝෝෂායෙන් යුත් මහ ජනයා ඇති, සියලු ගුණයෙන් සමෘද්ධ වූ සිවි රටැ සඳ මහ රජු හට අග මෙහෙසුන් වෙම් වා"යි කියා, ඒ

ළිසකි දේවි මේ දස වරය ගත. එ සඳෑ සක් දෙව රජ කියන්නේ, "සවිඤඤයෙන් හොබනා වූ ළිසකි දේවිය, මා විසින් දුන්නා වූ දස වරය ගෙනෑ, සඳ මහ රජු ගේ සමීපයෙහි වසව" යි සමු දින.

10. ඉක්බිති, ඒ දිව්‍ය සත්‍රී දෙව් ලොවින් සැවැ අවුත් මද්‍ර රටැ ක්‍ෂත්‍රිය කුලයෙහි උපන. ඕ තොමෝ සඳ මඬල වැනි මුහුණු ඇත්තී යැ. නිලුපුල් පෙති වැනි නුවන් ඇත්තී යැ, කොඳ කැකුළු වැනි දත් ඇත්තී යැ. රන් වන් වූ ශරීර ඇත්තී යැ. මනා වූ වට පයෝධර ඇත්තී යැ. මේ ආදීන් වණිනා කරත් කරත් කියා නිමවා ගත නොහැකි රූ ඇත්තී යැ. නව යෞවනයෙන් යුක්ත වූවා යැ. මහත් වූ චෙශ්‍යයී ඇත්තී යැ. "සාරාසඛ්‍ය කල්ප ලක්‍ෂයෙකින් මත්තෙහි දී බුදු කෙනකුට මවු වමි" යි පතා ආවා යැ. මතු මහාමායා දේවි වන්නී යැ. එසින් ගොස් මාතෘ දිව්‍ය පුත්‍ර වැ එහි සිටැ නිවන් පුරා වදනවුන් ගේ ගුණ කවුරු කියා නිමවා ගනිද්ද? මෙ ලෙස ඒ රාජ කුමාරිකාව දෙවගනක මෙන් වැනි විය පැමිණැ වසන කල්හි, සිවි මහ රජාණෝ ඒ බිසොවුන් ගේ රූප ශෝභා අසා, මහත් පෙරහරින් ගෙන්වා පුත්‍ර වූ සඤ්ජය කුමර හට අග මෙහෙසුන් කළ හ.

3. වෙසතුරු කුමරු බිහි වීම.

11. මෙ සේ ඒ දෙ දෙන සුව සේ වසන සමයයෙහි, පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනි වූ මතු බුදු වන මහතාණන්, සියලු ලෝ වැසියන් සසරින් මුදනු සඳහා දෙව් ලොවින් සැවැ අවුත්, ළිසකි දේවින් කුසැ පිළිසඳ ගත් කෙණෙහි මැ, සැට දහසක් පමණ කුමාරයෝ ඒ ඒ අමාත්‍යයන් ගේ ගෙවල්වැ සත්‍රීන් කුසැ පිළිසඳ ගත් හ.

12. මහ බෝ සතාණන් මවු කුසැ පිළිසඳ ගනුත් මැ, දේවිනට මෙ බඳු දෙලෙක් උපන. දවසැ සලක්‍ෂයක් ධන වියදම් කොටැ සඳන් හල් කරවා දිළිඳු වූ යාචකයනට දන් දෙන සේ දෙල උපන. සා වැ ඉපැදූ තමන් සමීපයට ආ යාචකයනට දනට හිනි මැඳව පැනැ ඇඟ මස් පලහා

දුන්නා වූ, සිවි රජ වැ තමන් කරා ඇස් ඉල්ලා ආ ශක්‍ර බ්‍රාහ්මණයාට තිලුපුල් මල් සහළක් වැනි තමන් වහන්සේ ගේ දැස ලෝ වැසියන් හඬවහඬවා තමා සිය අතින් උපුටා දුන්නා වූ, මහතාණන් වහන්සේ දශ පාරමිතා මුදුන් පත් වැ සිටැ මැණියන් කුසැ පිළිසඳ ගත්තවුනට මෙ සේ වූ දෙළක් උපදිති සි යනු කවර ආශ්චර්යයෙක් ද? ඒ හිමියාණන් මවු කුසැ පිළිසඳ ගත් දවස් පටන් දඹ දිවැ නොයෙක් රාජ්‍යයෙහි රජ දරුවන් එවන රන් රුවන් ආදි වූ නොයෙක් පඬුරින් අතුරු නැති වී යැ. සඳ මහ රජාණන් බිසොවුනට උපන් දෙළ අසා, නුවරැ සඳන් හල් කරවා දේවිත් දෙළ නිවා යාචකයන් සිත් නිවා දන් දෙන කල්හි, ක්‍රමයෙන් දස මසෙක් පිරුණේය.

13. එ සඳැ බිසොවුනට නුවර පැදකුණු කරන සිතෙක් උපන. සඳ මහ රජාණෝ එ පවත් අසා, අමාත්‍යයන් කැඳවා නුවර සඳවන්නාහු, කළු වැලි පියා සුදු වැල්ලෙන් තවරා, දෙරැ දෙරැ කෙහෙල් තොරණ, රන් තොරණ, රිදී තොරණ, සත් රුවන් තොරණ, පිළි තොරණ, යනාදි තෝරණ පඬික්තින් හා කෙහෙල්, තැඹිළි, ධජ, පතාකාදින් හා සදවා, තැනැ තැනැ පුන් කළස් තිරිකුඩම් තබා, ඒ පුන් කළසැ රන් පැන රිදී පැන තබා, ඒ වටා පහත් නංවා, මෙ සේ සියලු නුවර දෙව් නුවරක් සේ සදවා, මනා කොටැ රථයක් සරහවා, බිසොවුන් එහි වඩා හිඳුවා මහත් වූ පෙරහරින් රාජ වීථියට බැසැ, ගමන් ගත් හ.

14. සඳට පළමු ගමන් ගත් තරු කැලන් මෙන් සැම මෙහෙ තැන් පෙරට වැ අවුත් පිරිවරා ගත් හ. එ සේ මැ සිටැ සලන සුදු චාමර රන් චාමර රන් තල් වැට රිදී තල් වැටින් වසනතයා සිය වෙසින් ආවසි සිතමි. සරසුන් විසින් ගත් සුදු සේ සතින් එ ද ඒ පුරය දෙව් පුරයක් වැ ගියේ යැ සි සිතමි. කිරි මුහුදු ඔද වැඩී දිවෙන රළ පඬික්ති සේ එ නුවරැ දිවැ සිටින අශ්ව සමූහයෙන් හා හස්ත්‍යලඞ්කාරයෙන් සැරසී සිටිනා පළුන වැනි ඇත් සමූහයෙන් හා රිදීමය වූ පස් වනක් පැහැයෙන්

දිලියෙන ධජ පතාකායෙන් හා විසිතුරු වූ ඇතුන් අසුන්, ගොන් ආදීන් අදනා මන හර රථ පෙළින් හා සත් රුවන්මය ධජ පතාකා පෙළින් හා රන් වන් කලස පෙළින් හා එ නුවර බැලුබැලුවනට අමෘතාස්වාදනයක් වැන්නැ සි සිතමි. ඒ සත් රුවන් මඩුයෙහි සිටැ නටන මන හර යොවුන් පත් සත්‍රින් නටා ගෙනැ එන කලැ, දිව්‍ය සත්‍රින් කැඳවති සි සිතමි.

15. රකවල් බලබලා ඒ ඒ දිගින් දිවෙන කුරුන් පෙළින් හා නපුංසකයන් විසින් හා, පිරිවරන ලද දස මෙහෙ තැන් විසින් මන හර සෙබළුන් විසින් ගසන ලද බලත් හඬින් හා, ඒ ඒ තැනැ මඩුලු බැඳැ ගසන ලද භේරි තූර්‍ය නාදයෙන් හා අසුන් ගේ හේෂා රවයෙන් හා ඇතුන් ගේ කුඤ්ච නාදයෙන් හා ඒ ඒ දිගින් එන ඝෝෂයෙන් හා, මෙ සේ මහත් වූ පෙරහරින් බිසොවුන් නුවර පැදකුණු කරමින් ව්‍යාපාර විපීයට වන් සඳැ, බිසොවුනට විළි පහරනට පටන් ගත. එ පවත් ඇසූ සඳ මහ රජාණෝ එ කෙණෙහි මැ විසිතුරු මඩුවක් කරවා වටැ තිර බඳවා රකවල් ලැවූ කල්හි, ලොවට ඇසක් වැනි වූ යාචකයනට ධන රාශියක් බඳු වූ පිරූ පාරමිතා ඇති අප මහ බෝ සතාණෝ මවු කුසින් බිහි වෙත් මැ, අත දිගු කෙරෙමින්, "මැණියන් වහන්ස, දන් දෙන්නට සුදුස්සෙක් ඇද්ද?" සි කී හ. එ බස් ඇසූ මැණියෝ, දහසින් බැඳි පියල්ලක් මහ බෝ සතාණන් දිස් කළ අතැ තබා වූ හ. භුවනෙක ශේඛර වූ වෙසතුරු කුමාරයන් කී තෙපුල් කවර නම් සත්ත්වයකු ගේ කනට අමා නොවේ ද? කවර නම් සතෙක් මීට සතුරු වේ ද? කාට නම් අප්‍රිය වේ ද?

16. ඒ ආශ්චර්‍ය පුරුෂ වූ මහතාණන් උපත් දා මැ, ඔවුන් පූර්‍වයෙහි කළා වූ කුශල බලයෙන් කෛලාස කූටය සේ රිදී පර්‍වතයක් සේ අති ධවල වූ පණ්ඩර නම් මඟුලැත් පොව්වකු, දෙවියෝ නමත් ගේ අනුභාවයෙන් ඇත් හලැ ලා ගිය හ. බෝධි සත්ත්වයන්

ගේ පිය මහ රජාණේ පුතණුවනට නම් තබන්නාහු, චතුර් වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා, ව්‍යාපාර චීථියෙහි උපන් හෙයින් "**වෙස්සන්තර** කුමාරයෝ" යැ සි නම් තුබූ හ. ඉක්බිති රජ්ජුරුවෝ, "මේ වැනි උත්තම පුරුෂයෙක් හුදෙකලා වැ නූපදනේ යැ" සි ඇමැතියන් කැඳවා, සියලු නුවර පරීක්ෂා කරවා, එක ද උපන් කුමාර වරුන් සැට දහසක් දෙන ගෙන්වා, පුතණුවනට පිරිවර කොටැ පාවා දුන් හ. අතිදීඝාදි දෙමයන් ගෙන් තොර මිහිරි කිරි ඇති ලක්ෂණ සම්පන්න සූසැටක් කිරි මවුන් තෝරා ගෙනැ, උනට සම්පත් තබා දුන් හ.

4. වෙසතුරු රජු ගේ දානාධ්‍යාසය.

17. මෙ සේ සැට දහසක් කුමාර වරුන් පිරිවරා කෙළනා බෝ සතාණන් වහන්සේ, නකත් තරු මැදැ බබළන පුන් සඳක් සේ කුමාරාභරණයෙන් සැදී, රාජ ශ්‍රියෙන් දිලිහිදිලිහී වැඩෙන කලැ, එක් හැවිරිදි අවස්ථායෙහි, තමන් පළඳවා ලූ ලක්ෂයක් වටනා ආභරණ කිරි මවුනට මැ දන් දුන් හ. පිය මහ රජාණේ ඒ පළඳනා දන් දුන් බව අසා සතුටු වැ මහ ඇඟි පළඳනා යවා පළඳවති. බෝ සතාණේ තමන් පැළැඳිච්චි පළඳනා දන් ගන්නා සිඟන්නන් නැත්තෙන්, නව චාරයක් කිරි මවුනට මැ දන් දුන්නා හ. එ සේ වුව ද, ළද බොළඳ වයසින් එක් ඇවිරිදි යැ. මුවින් නොහළ කිරි සුවඳ ඇත්තේ යැ. එ සේ කලැ, මෙ වැනි දානාධ්‍යාශයයක් මුළු ලොවැ කවුරුන් කෙරේ ඇද්ද? මෙ සේ වූ අද්භූතයක් දුටු විරුවෙක් ඇද්ද? මෙ වැනි ආශ්චර්යයක් අසූ විරුවෝ ඇද්ද? මෙ සේ විස්මයයක් කොලෝ ඇද්ද? ඒ මහතාණන් හා එක් වමෝ වා! එ තුමා උපනුපන් තැනැ උපදමෝ වා!! මෙ වැනි අදහසක් සියලු සතුනට වාසනා වේ වා!!!

18. මෙ සේ ළඳ බොළඳ වූ සිටු, දන් දීම කෙළි-කොටු සිතා දන් දෙන්නාහු, අට හැවිරිදි වූ කල්, වෙසතුරු කුමාරයෝ වෙසතුරු ප්‍රාසාදයෙහි ශ්‍රී යහන් මඤ්චකයෙහි පනවන ලද අස්නෙහි පලක් බැඳ හිඳ සිතන සේක්, "මා දන ක්‍රියායෙහි සුව නො විඳ බොහෝ කලක් ඉක්මූ හියේ යැ. ඒ දැන් අට හවුරුද්දෙකැ. තව ද මෙ සේ මූ දවස් යේ දෙහෝ?" සි සිතන්නාහු, "මහ වතුරක් මෙන් මා දෙන රත් රුවන් ආදි වූ දන ප්‍රවාහය කැට කැබිලිති සේ මා සිත් නො පිනවයි. ඉදින් යාචකයෝ ඇවිත් සිටු, මහ රජ, 'ඔබ ගේ නිදුපුල් මල් සඟලක් වැනි අස් උපුටා දෙව' සි. කිවු නම්, ඒ දිගු පුළුල් නිල් නුවන් දෙක තල් ලොදු දෙකක් සේ උපුටා අතැ තබා ලමි. යාචකයෝ අවුත්, 'මහ රජ, ඔබ ගේ හෘදය මාංශය මට දෙව'සි කිවු නම්, තියුණු ශස්ත්‍රයෙන් ළය පලා පියා හදවත දෙමි. එ සේ මූ යමෙක් ලේ ඉල්ලූ නම්, තෙලියත්හි ලා පෙළා ලේ දෙම් මූ යැ. යම් පුරුෂයෙක් ඉස දන් ඉල්ලී නම්, මා ගේ මතුල් කඹුයෙන් ඉස සිඳ දෙම් මූ යැ. යමෙක් අවුත් 'මට ගැති මෙහෙවර කරව'සි කිවු නම්, 'මුළු රටැ වාසිනට මා ගැති බව දනුව' සි අස්වා කියා, ගැති මෙහෙ කෙරෙම් මූ යැ" යි මෙ සේ සිතත් සිතත්, දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ගන කඩ බොල් මහ පොළොව අතේක ගජිනා කෙරෙමින් සතුටු වූ නටන්නට වන. එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් උස ඇති මහාමේරු පර්වතය ද, ඒ මහතාණන් ගේ දැන චේතනා බලයෙන් තමා ගේ කුළ නමැති අත් ඔසවා නටන්නකු මෙන් නටන්නට වන. ඒ මහතාණන් ගේ මහත් වූ දානාධ්‍යාශය බලන්නකු මෙන්, ඒ සප්ත කුල පර්වතයෝ කුල්මතින් නටමින් ඔවුනොවුන් ඇඟැ ගැසෙන්නට වන්හ.

19. මෙ සේ මහ පොළොව ගුගුරුවා දන් දෙන්නා වූ මහතාණෝ, සඳුන් රුක් අතු අඟැ ලෙළෙන කළු වැල්ලියක් සේ තමන් ගේ රූප ශ්‍රී ද්‍රඤ්ජලතායෙන්

හොඬවමින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණෑ, සූ සැට ශිල්පයෙහි හා අෂ්ටාදශ විද්‍යායෙහි ද නිපුණ වූ හ. එ සමයයෙහි පිය මහ රජාණෝ පුතණුවන් ගේ කීර්ති හා යශඃ ශ්‍රී ද බලා, ප්‍රීති නමැති සාගරයා ගේ උත්පාතක වේශයෙන්, "මා ගේ පුතණුවන් ගේ රාජ්‍ය ශ්‍රී මා අැස් හමුයෙහි මා ගේ නුවන් දුරිද්‍රයය හළ මැනැවැ" සි සිතා, **වේතිය** රටැ රජ්ජුරුවන් ගේ දූ ඩු සියලු ස්ත්‍රීන් ගේ රූප ශ්‍රී එක තැනැ කැටි කොටැ මවා ලූ රූපයක් බඳු වූ, රූප ශ්‍රීන් දිලියෙන්නා වූ, මඳුදේවින් ගෙන්වා, මඟුල් පෙරහරින් මහ බෝ සතාණනට අග මෙහෙසුන් කොටැ, පාවා දුන් හ. සඳ මහ රජාණෝ පුතණුවන් වොටුනු පළඳවා තමන් ගේ රාජ්‍ය ශ්‍රිය පාවා දී, පුතණුවන් ගේ රාජ්‍ය ශ්‍රී බල-බලා සතුටු සොමනසින් පිනපිනා වසන කල්හි, බෝධි සත්ත්වයෝ ද සිවු සඟරා වතින් හා දශ රාජ ධර්මයෙන් ද නොවෙන් වැ රාජ්‍ය ශ්‍රී විඳැ, සතතයෙන් මවු පිය දෙ දෙනාට වැඳැ පුදා උපස්ථාන කොටැ, සියලු යාචකයනට සඳන් හල් කරවා, අනේක ප්‍රකාර-යෙන් දන් දී වසන්නා හ. එ සේ වසන කලැ, පුතණු කෙනකුන් හා දියණි කෙනකුන් හා ලදින්, චතුර් වේද-යෙහි නිපුණ බමුණන් ගෙන්වා පුතණුවනට **ජාලි** කුමාරයෝ යැ සි ද දියණියනට **කෘෂ්ණජිනාවෝ** යැ සි ද නම් තබා, මෙ සේ සුවයෙන් රාජ්‍ය ශ්‍රී අනුභව කරන්නා හ.

5. පණ්ඩර ඇතු දන් දීම.

20. **වේතිය** රටැ රජ්ජුරුවන් හා ජයතුරා නුවර රජ්ජුරුවන් හා සතුටු වැ දෙ නුවර වැස්සන් නොවෙනස් වැ වසන කල්හි, කලිඟු රටැ වැසි නැති වැ දුර්භික්ෂයෙක් ඇති වී යැ. ඒ රටැ මනුෂ්‍යයෝ ජීවත් වන්නට නොහැක්කාහු, සොර කම් කරන්නට පටන් ගත්තාහු යැ. දුර්භික්ෂයෙන් පීඩිත වූ දනවු වැස්සෝ, රාජාඞ්ගනයෙහි රැස් වැ මහත් වූ ශබ්ද පැවැත්වූවාහු ය.

රජ්ජුරුවෝ ඒ ශබ්දය අසා, ඔවුන් කැඳවා, "දරුවෙනි, තෙපි කුමක් නිසා ශෝක කරවු දූ?" යි අසූ කලැ, "දේවයන් වහන්ස, වැසි නැත්තෙන් ජන පදය දුර්භික්ෂයට පත් වී යැ. එ හෙයින් මැ සොරුන් ගෙන් පීඩාවට පත් වී යැ" යි සැල කළාහු යැ. රජ්ජුරුවෝ "එ සේ නම් දරුවෙනි, වැසි වස්වත්නෙමි" යි, ඔවුන් යවා, සිල් සමාදන් වැ පෙහෙවස් වසන්නෝ ද, වැසි වස්වන්නට නො හැකි වූවාහු යැ.

21. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ නුවරැ වැසියන් කැඳවා, "දරුවෙනි, මම පෙහෙවස් වැසැ ශීල සම්පන්න වැ ද වැසි වස්වන්නට නො හැකි වීමි. දැන් කුමක් කරමෝ දූ?" යි අසූ හ. අැමැත්තෝ කියන්නාහු, "ඉල්ලූ දෙයක් 'නැතැ' යි නොකියා දන් දෙන්නෝ වෙස්සන්තර රජ්ජුරුවෝ යැ. උනට දෙවියන් විසින් දෙන ලද සවීඩහය ශ්වේත වූ, පණ්ඩර නම්, වැසි වස්වා පියන තරම් මහානුභාව ඇති හැළි අැතෙක් ඇති. අැතු ගෙනාවොත් අප ගේ රට වැසි වැසැ දුර්භික්ෂ භය සන්හිඳෙයි" කී යැ. එ සඳැ රජ්ජුරුවෝ වේදත්‍රයයෙහි නිපුණ වූ බමුණන් අට දෙනකු ගෙන්වා කියන්නාහු, "බ්‍රාහ්මණයෙනි, වෙස්සන්තර රජ්ජුරුවන් ගේ වැසි වස්වන අැළි අැතෙක් ඇති. තෙපි ගොස් ඔහු ඉල්ලා ගෙනැ එව" යි කී හ. බමුණෝ රජ්ජුරුවන් ගෙන් සතු ගෙනැ නො බෝ දවසෙකින් සිවි රටට වන් හ.

22. බුද්ධාඞ්කුර වූ ඒ වෙසතුරැ මහ රජාණෝ, එ දවස්, පෝයැ දන් දෙන්නට සතර දොරැ සතර දන් හල් විචාරන්නට යන්නාහු, සුවඳ පැනින් ඉස් සෝධා නහා, සළු හැඳැ, සුවඳ විලෙවුන් ගල්වා, සූ සැට ආභරණයෙන් සැරසී, දේවේන්ද්‍ර ලීලායෙන් සිටැ, "අැතු සඳ ගෙනෙව" යි කී හ. එ විටැ, අැතු සඳ ගෙනෙන්නෝ, ඔහු සතර පය සාර ලක්ෂයක් වටනා පළඳනායෙන් සඳ, යට බඹ ලක්ෂයක් වටනා පලසෙකින් වසා, පිට රුවන් දුල් මුතු දුල් කිකිණි දුල් මිණි රස් පෙළින් හා මේ ආදි සත් රුවන් පළඳනායෙන් ද සඳ එළැවූ හ. එ සඳැ රන් හිණින්

ඇත් කුඹයට පැනැ නැඟි, දළ පුඩු සේ සත් හිසට කරවා, සත් රැවන් පේවා සල්වා, රජ යුව රජ ඇමැති මඬුදු පිරිවරා, සිවුරඟ සෙනඟ පිරිවරා, ශක්‍ර දේවේන්ද්‍ර ලීලායෙන් නැඟෙන හිරි දිගායෙහි දත් හලට යන රජ්ජුරුවන් බමුණෝ දැකැ, "දනට රැස් වූ සිඟන්නන් බොහෝ දෙනා හෙයින් මෙහි රජ්ජුරුවන් දැකීම උගහට යැ" සි කියා, දකුණු දිගැ දත් හලට යන මඟැ උස් තැනෙකැ සිටියාහු යැ.

23. රජ්ජුරුවෝ දකුණු දිගැ වාසල සමීපයෙහි සිටි බමුණන් අට දෙනා දැකැ, උන් සිටි දිසාවට ඇතු මෙහෙයූ හ. බමුණෝ අට දෙන අත් නඟා, සිටැ, "ජයතු භවං වෙස්සන්තර මහාරාජ" සි ආශීර්වාද කොටැ සිටියා හ. රජ්ජුරුවෝ, "මේ බමුණෝ මඳ දෙයක් නො ඉල්ලති" සි ඇතු ආසන්න කොටැ, "බමුණෙනි, තොප කැමැත්තක් ගනුව" සි කී හ. එ කලැ බමුණෝ කියන්නාහු, "සියලු සත්ත්වයනට මවු පියන් බඳු වූ රජ්ජුරුවෙනි, තොප නැඟි තෙලෙ ඇතු අපට දන් දෙව" සි කී හ.

24. එ ඔස් ඇසූ මහ බෝ සතාණෝ කියන්නාහු, "බමුණෝ මා ගේ ශරීරයෙන් භාගයක් නො ඉල්ලා, 'නිලුපුල් වන් ඇස් උපුටා දෙව'සි නො කියා ඇතු මැ ඉල්ලති" සි කියා, මඳක් දෙමිනස් වැ, "යහ පත බමුණෙනි, තොප කැමැති ඇතු තොපට මැ දන් දෙම් හ" සි සොමිනසින් පින පිනා, දන් දෙනු පිණිස‍ැ නැවැතැ ඇතු සරහවන්නාහු, ලක්‍ෂයක් වටනා රත් පලසෙකින් පිට සැදූවූ හ. ලක්‍ෂයක් වටනා මුතු දුල යැ; ලක්‍ෂයක් වටනා මිණි රැස් දම් පටල යැ; ලක්‍ෂයක් වටනා රන් දුලයැ; ලක්‍ෂයක් වටනා මැණික් දුල යැ; එහි බඳනා මිණි දෙක දෙ ලක්‍ෂයක් වටනේ යැ; කණිහරණ දෙක දෙ ලක්‍ෂයක් වටනේ යැ; වටංසක තුන් තුන් ලක්‍ෂයක් වටනේ යැ; යව බඩ සැදූ පලස ලක්‍ෂයක් වටනේ යැ; කුඹ සැදූ ආභරණය දෙ ලක්‍ෂයක් අගනේ යැ; දෙ දල සැදූ ආභරණ දෙ ලක්‍ෂයක් අගනේ යැ; පය සැදූ

ආභරණ සාර ලක්ෂයෙකැ; වාලබිය සැදූ ආභරණ ලක්ෂයෙකැ; ගෙලෙහි මුතු දැල ලක්ෂයෙකැ; අතු නැගෙන හිණ ලක්ෂයෙකැ; අතු බත් කවන රන් කටාරය ලක්ෂයෙකැ— මෙ සේ අතු සැදූ ආභරණ මැ සුවිසි ලක්ෂ අගනේ යැ. පිට මැණික් යැ, මුදුනෙහි මැණික යැ, අකුස්සෙහි මැණික යැ, කණ්ඨය වෙළන මුතු හරෙහි මැණික යැ යන මේ මැණික් සතර අනඝ්‍ය යැ.

25. මෙ සේ අනඝ්‍යානඝ්‍ය සියලු ආභරණයෙන් අතු සඳ, අත් වෙදුන් අත් රැවියන් අතුළු වූ පන් සියයක් කුල වාසීන් ද, අතු නාවන කවන පොවන ඕහට සියලු කළ මනා මෙහෙයට නිසි පරිවාර ජනයන් ද දී, බමුණනට ප්‍රසාද දී සිත් ගෙනැ, රන් කෙණ්ඩියෙන් අතැ පැන් වත් කොටැ, "ඒකානතයෙන් ලොවුතුරා බුදු වෙමව" සි කියා, අතු දන් දුන් හ. ඒ මහතාණන් අතු දන් දෙත් මැ මහ මෙර නැමී නමස්කාර කෙළේ යැ. මහ පොළොව සතුටු වැ ගුගුළේ යැ.

26. ඉක්බිති ඒ බමුණෝ, දකුණු දෙරැ දී අතු ලදින් අතු පිටැ නැඟී, මහා ජනාකීර්ණ වූ රාජ විථියට බට හ. නුවර වාසී මහා ජනයෝ කියන්නාහු, "එම්බා බ්‍රාහ්මණයෙනි, අප ගේ අතු නැඟී තෙපි කොහි ගෙනැ යෙවු දැ?" සි කීවාහු යැ. බමුණෝ කියන්නාහු, වෙස්සන්තර මහ රජහු විසින් අපට අත් දෙන ලද්දේ යැ. තෙපි කවරහු ද? කෙ සේ වළකවු දැ?" සි හසහ විකාර මුඛ විකාරාදි උසුළු විසුළු කොටැ බැණැ, අතු නැඟී ගෙනැ ගිය හ.

6. නුවර වාසීන් කිපී වෙසතුරැ රජු වංකගිරියට යැවීමට සම්මත කිරීම.

27. එ කල්හි රජ බමුණු වෙලෙඳ ගොවි ආදීන් හා අඩිකාර සෙනෙවිරත් අෑපා මාපා පඤ්ච ප්‍රධාන මාණඩලික ජනයෝ ද, මුළු වැ ගෙනැ තතනමින් පුපුරමින්

දත් කමින් සියලු නුවර අැළැලි ගොස් කිපී, වෙස්සන්තර රජාණන් ගේ පියාණන් සඳ මහ රජාණන් කරා ගොස් හඬා වැලැපැ, "සොම්නි, අප දන්වන්නක් අැසුව මැනැවැ. සූ විසි ලක්ෂයක් අගනා ආභරණයෙන් සැදුණා වූ සියලු හස්තාලඞ්කාරයෙන් බබළන්නා වූ, සවීඩගය අති ධවල වූ, වැසි වස්වා ලන අනුභාව අැති, දෙවියන් විසින් මිනිස් ලොවට දුන්නා වූ, හඤ්ඤ ශ්‍රීයෙන් දිලියෙන අප ගේ අැත් රැවන, නුඹ ගේ පුතණුවෝ කලිඟු රටින් අා බමුණනට දන් දෙමින් අප නැසූ හ. අනේ සොම්නි, ශ්‍රද්ධාව අැතියා නම් තෙසු අැතුත් දන් දී පියැ නො හැක්කේ ද? නොයෙක් රන් රැවන් දී පියැ නො හැකි ද? මෙ සා දුර්ලභ වූ මුළු ලොවට වැඩ සිද්ධ කොටැ දූ අැතු දන් දුන්නේ කුමට ද?" සි කියා කියා හඬන්නට පවන් ගත්තාහු යැ.

28. එ කල්හි සඳ මහ රජාණෝ, "නුවර වාසින් ගේ රැහැණි බලවතැ. කළ මනා කිම් දෙහෝ?" සි සිතා, "බාලයන් විසින් නො කළ මනා දෑ කළ කලැ උනට තොප කැමැති දඬුවමක් කරවන්නමෝ වේ ද?" සි කී හ. එ විටැ නගර වාසිහු මදක් සන්හිඳී කියන්නාහු, "වෙස්සන්තර රජ්ජුරුවන් දහ ගෙයි ලතත් නො පිළිවනැ. දිවි ගනුත් නො පිළිවනැ. අප ගේ රටැ හිදැ රට නැසූ තැනැත්තන් රටින් දුරැ කොටැ වඞ්කගිරි නම් පර්වතයට යවන්නා කැමැත්තම් හ. අද මැ යැවුව මැනැවැ" සි කී හ. එ සඳැ සඳ මහ රජාණෝ, "දැන් මුනට මිහිරි කොටැ කියා යවා, පසු වැ දුටුවක් කරම් හ" සි සිතා, මහා ජනයාට කියන්නාහු, "අඹු දරුවනට සමු දී, හෙට යන පරිද්දෙන් අවකාශ දෙව" සි කී හ. ඒ අැසූ නගර වාසිහු "සොම්නි, නුඹ වහන්සේට හැඟුණක් කළ මැනැවැ" සි වැඳැ සමු ගෙනැ නැඟී හියා හ.

29. එ සඳැ සඳ මහ රජාණෝ, මහා ශෝකී වැ, නුවර වාසින් කිපුණු බව පුතණුවනට කියා යවන්නාහු, කනත නම් අැමැත්තා යැවූ හ. ඒ අැමැති

ගොස් දිව්‍ය විමානයක් මෙන් සැදුණු ප්‍රාසාදයෙහි අැමැතියන් පිරිවරා අැතු දත් දුන් සතුටු සොම්නසින් පිනපිනා ගරත් කාලයෙහි නැඟී පුණ් චන්ද්‍ර මණ්ඩලය පරිද්දෙන් වැඩ හුන් වෙසතුරු මහ රජාණන් දැකැ, වැඳැ ලා, පිය රජ්ජුරුවන් කියා එවූ හසුන් කියන්නට හය වැ, ශ්‍රී පාදය වැඳැ වැඳැ හඬා, නැඟී නො සිටියේ යැ. බෝධි සත්ත්වයෝ අත අල්ලා නහා සිටුවා, "තෝ නො බා කියව" සි වදළ හ. අැමැති තෙමේ කියන්නේ, "ස්වාමීනි, අැළි අැතු දත් දුන් හ සි නගර වාසිහු කිපී බොහෝ දෙනා රැස් වැ නුඹ වහන්සේ ගේ පිය මහ රජාණන් ළඟට පැමිණැ, නුඹ වහන්සේ මේ නුවරින් පහ කොටැ සෙට වඞ්කගිරි නම් පර්වතයට යවන්නට සම්මත කළ හ" සි කී හ.

30. එ බස් අසා වෙස්සන්තර මහ රජාණෝ සිනා පහළ කොටැ වදාරන්නාහු, "මා අතින් අැස් ඉල්ලා එත් නම් මනා මැ යැ. මස් ඉල්ලා එත් නම් මනා මැ යැ. ලේ ඉල්ලා එත් නම් මනා මැ යැ. අැඟින් අඬියක් ඉල්ලූ නම් මා ගේ ශරීරය වෙන් වෙන් කොටැ දෙම් මැ යැ. බාහිර වූ අැතු දත් දුන් හ සි වරද කොටැ සිවි රටැ වාසිහු රැහැණි වූ නම් මැනැවැ. වඞ්කගිරි ගමන මට මැනැවැ. මා දෙන දන් නො නවත්වමි. දුක් බොහෝ වූ ගැලැවෙන්නට දුෂ්කර වූ සසරෙහි උපන්නනට දැන ඵල සුව මිසැ අනෙක් සුවයෙක් නම් නැති. 'පින් නො කට යුතු යැ' සි නගර වාසිහු කියත් නම්, වන වාසයට යන බව ඉතා සිත් කලු යැ. නගර වාසීන් කීවා කරම් හ. උන් කීවා මුදුත් පත් වේ වා. නගර වාසිහු බොහෝ කලක් ජීවත් වෙත් වා. අැසිල්ලකුත් සියලු ජනයාට මා පිණිසැ කලකිරීමෙක් නො වේව" සි වදරා කණ්හ නම් අැමැත්තා ඔලා, "එසක් කියමි. පියාණන් වහන්සේට කියා නුවර වාසීන් කැමැත හොත්, සෙට ෂෂ්ඨි ශතක මහ දන් දී පියා, අන්දා වලව් යනු කැමැත්තෙමි. එ පවත් පියාණන් වහන්සේට කියව" සි වදරා, කණ්හ නම් අමාත්‍යයා යවා, තමන්

වහන්සේ ළඟැ සිටි සෙනෙවිරදුන් කැඳවා කියන්නාහු, "අැතුන් සත් සියයෙකැ, අසුන් සත් සියයෙකැ, රථ සත් සියයෙකැ, සත්‍රීන් සත් සියයෙකැ, දෙනුන් සත් සියයෙකැ, දැසින් සත් සියයෙකැ, දැසයන් සත් සියයෙකැ, යනාදි සියල්ලෙන් සත් සියය බැගින් ද, නා නා ප්‍රකාර වූ ආහාර පානාදිය ද යන දියැ යුතු සියල්ල මැ පිළියෙල කරව" යි අමාත්‍යයනට විධාන කොටැ, ඝනස්තෙන් නැඟී, සිංහ විලාසයෙන් මද්‍රි දේවීන් උන් බිසෝ ගෙට ගොස්, ශ්‍රී යහන් මස්තකයෙහි වැඩැ හිඳැ, බිසොවුන් කැඳැවූ හ. බිසොවු අවුත් ශ්‍රී පාදය වැඳැ සිටියා හ.

31. එ විටැ රන් ලියක් සේ සිටි මද්‍රි දේවීන් බණවා කියන්නාහු, "බිසොවුනි, මා විසින් දුන්නා වූ ද, දෙ මවු පියන් ගෙන් ගෙනාවා වූ ද, නොයෙක් රන් රිදී මුතු මැණික් ආදි සියලු ධනය නිධන් කොටැ තබව" යි කී හ. බිසොවු කියන්නාහු, "ස්වාමීනි, නුඹ වහන්සේ පෙරැ දන් දෙන්නට කියන බව මුත්, නහා තබන්නට නො කියන සේකැ. දැන් කුමක් සඳහා මෙසේ කී සේක් දැ?" යි පිළිවිස්සා හ. වෙස්සන්තර රජ්ජුරුවෝ කියන්නාහු, "සොඳුර, නහා තිබීම නම් දන් දීම යැ. දන් නො දෙන්නාහු, විලිකුත් ඵලය වැලැඳැ ගත් දිමියන් වැන්නා හ. තුමූ ද නො කති, අනුන් ද කැ නො දෙති. එ සේ වූවාහු, පර ලොවට වසඟ නහා නො තබන්නාහු වෙති. එ සේ හෙයින් 'නහා තබව' යි කීයේ නම්, දන් දෙනු සඳහා මැයැ. මනා වූ තපස්වීන් නමැති ක්ෂේත්‍රයෙහි බිජුවට බොහෝ රෝපණය කරන්නට කීයෙමි වේ දැ" යි වදුළ සේකැ. බිසොවු කියන්නාහු, "නුඹ වහන්සේ හා හැම වේලෙහි මැ දන් දීමෙහි සිත් ඇති බව නො දන්නා සේක් ද? යළි අමුතු වැ මෙවැනි බස් කියන්නට කාරණ කිම් දැ?" යි කී හ.

32. එ කල්හි වෙසතුරු මහ රජාණෝ කියන්නාහු, "සොඳුර, අප ඇතු දන් දුන් හ සි දෙම කොටැ, නගර වාසිහු කිපි, අප මෙ රටැ ඉන්නට නො දී, වඞ්කගිරි පර්වතයට යවන්නට සම්මත කළ හ. එ සේ හෙයින් අපි වනයට යෙමි හ. අප ගිය හ සි දළ සෝ දුකින් නො තැවී, සුව සේ ජීවත් වැ, දරු දෙ දෙනා කෙරෙහි දයා ඇති වැ, තොප දිවි රැකුමෙහි සිහි ඇති වව. අප ගිය කලැ, තොප රක්ෂා කරන ස්වාමි කෙනකුන් ඇත, උනට කීකරු වව. අත් පා මෙහෙ කරව. තව ද දරු දෙ බිහින්නන් කෙරෙහි බිය පත් වව" යි කී හ.

7. මද්‍රී දේවිය ගේ හා ඵුසති දේවිය ගේ ද ශෝකය. සප්ත ශතක දනය.

33. එ කලැ කාමරතියට අනඤ්ඤයා බඳු වූ, සරසම්භතියට බ්‍රහ්මයා බඳු වූ වෙසතුරු රජ්ජුරුවන් වහන්සේ මෙ සේ කියත් මැ, රූප ශ්‍රීන් සියලු ස්ත්‍රීන් කෙරෙහි අග්‍ර වූ මද්‍රී බිසොවු ලෙන් නැඟි ශෝකාග්නීන් තැවෙමින් කඳුළු ඉසිමින් සුළඟින් වැනෙන්නා වූ රන් ලියක් සේ වැනෙමින් පැදෙමින් ළය අල්ලා ගෙන, "ස්වාමිනි, මේ කුමන බසෙක් ද? මෙ සේ නො ඉවැසියැ හැක්කෙක් මා කනැ කුමට භිණි ද? නුඹ වහන්සේ ගෙන් වියෝ වැ ජීවත් වීමට වඩා නුඹ වහන්සේ හා කැටි වැ මියැ යෑම උතුමැ. මිනියා රාජ්‍ය ශ්‍රීය කැටි වැ බෙදා වළඳා, නුඹ වහන්සේ කෙරෙහි අග මෙහෙසුන් ශ්‍රී ලදින් ඉඳැ, දැන් ඔබ වලට යා දී අපි මේ නුවරැ ඉඳින්නන් කෙරෙහි ඉඳුමෝ දැ?" යි කියා, "පළමු කොටැ මා ගේ දෙ දරුවන් වඩා ගෙනැ, නුඹට පළමු කොටැ මා වලට යන නියාව නො දන්නේ ද, ස්වාමිනි?" යි කියමින් තමන් ලෙහි ඇවිලැ ගත් ශෝක ගිනි ඒ මහතාණන් හා කැටි වැ යෙමි යන සිත් නමැති විල්හි ගලා නිවන්නාහු, "දැන නමැති සත්‍ය ක්‍රියා දෙමයට කිපි නගර වාසීන් සිත් ගන්නට නො

පිළිවනැ. නුඹ වහන්සේ වනාන්තරයෙහි වැඩැ හිඳීම මැනැවැ" යි බිසොවු වන වණීනාව කරන්නාහු, "රජ්ජුරුවන් වහන්ස, ඒ හිමාලයයෙහි මල් පිපි වැහිරී හිය කලැ, රමණීී මල් යහන් මැඳැ හැලි කඳුරැ හා මුළු බැඳැ සිටුනා මුව දෙනුන්, මද ඔත් රැවූ දිදි දිවෙන වෙහෙල් මුව කැලන් දක්නා වූ අපට රාජ්‍ය ශ්‍රී සඳහන් නොවෙයි. ඒ ඒ තන්හි සෙඛඛුන් මැඳැ බැසැ නැටුම් ගත් මත් මොනරුන් දකුත්, රාජ්‍යය සිහි නොවෙයි. ඇතිනි මුළු පෙරටු කොටැ සතහ සතහා යන මතැතුන් හා, නොයෙක් මල් පල්ලෙන් ගැවැසී ගත් හෝ වැල්ලේ සිටි ළැහැප් වැදී කෙළනා මස් කැලන් හා, එ සේ මැ නොයෙක් වන මල් පැලැඳැ මඛුලු බැඳැ ලිය හී නහා ගායනය කරන ලිය කිඳුරන් මැඳැ නැටුම් ගත් කිම් පුරුෂයන් හා දකුත්, අපට රාජ්‍යය සඳහන් නොවෙයි. පිපි සිටි සල් සප්‍රා පනා සලල අඟරැ දෙව්දුරැ නඳුන් සඳුන් ආදි නොයෙක් රුක් රුස්සුන් දක්නා වූ අපට රාජ්‍යය ශ්‍රීය සඳහන් නොවෙයි. කවර නම් දුකෙක් සඳහන් වේ ද? වන මල් පැලැඳැ රුක් සෙවෙණින් රුක් සෙවණට ගොස් කෙළනා දරු දෙබිහින්නන් දකුත්, අන් කවර නම් දුකෙක් සිහි වේ ද? සැමීනි, නුඹ වහන්සේ පත් සල්හි වඩා හිඳුවා, වන මුල් වන ඵලාඵල කඩා ගෙනැ ඒම මට භාර යැ" යනාදීන් මද්‍රි බිසෝ හිමවතැ වසන කෙනකුන් මෙන් හිමාලය වණීනාව කළ හ.

34. එ කල්හි ජූසති දේවිය පුත්‍රයා ගේ මේ කථුක වූ හස්න අසා, පුතණුවන් කෙරෙහි ගත් ශෝකයෙන් හඬමින් කියන්නාහු, "සෙලින් හී මියෙම් මැ යැ. දිව ඇදී කා මියෙම් මැ යැ. වස කා මියෙම් මැ යැ. ගිනි වැදී මියෙම් මැ යැ. මද වරදකුත් නැති මා ගේ පුතණුවන් දත් දුන් දෙමයට වනයට යවත් නම්, මහ රජ, තොප ගේ මේ නුවරැ යම් තැනෙකැ මී සැදී කලැ මැස්සන් පලා යන්නා සේ සියල්ලන්

සාධාරණ වැ නැසී යන්නේ වේ ද? තෙපි ම පුතණුවන් නොවැළැකූ නම්, මා දිවි නොතිබේ යැ" යි කිවු යැ. මෙ සේ කියා හඬන බිසොවුන් දැකැ සඳ මහ රජාණෝ ශෝකයට පත් වැ, "නගර වාසීන් ගේ ක්‍රෝධ බලවත් හෙයින් තෙපි ශෝක නොකරව. ම පුතණුවන් වනාන්තරයට යවමි. නොබෝ දවසෙකින් වනයට යැවූ ම පුතණුවන් නගර වාසීන් ලවා ගෙන්වා ගනිමි" යි කියා ශෝක සන්සිඳිවූ හ.

35. වෙස්සන්තර රජ්ජුරුවන් දුක් පත් වූවා දැකැ, "මම දුක් පත් බව නොබලමි" යි කියන්නකු මෙන් හිරු සැගැවිණ. මෙ සේ එදා රාත්‍රිය යවා දෙවන දවස් සෙනෙවිරද්දු අවුත් සප්ත ශතක මහා දානය සැරැහූ බව දන්වූ හ. එ බස් ඇසූ මහ බෝ සතාණෝ සිරුරු කිස නිමවා මේ නිමවා රජ ගෙයි රකවල් හරවා, සියලු යාචකයන් රජ ගෙයි මිදුලේ රැස් කරවා, දාන සම්භාර කැටි කොවැ ලා, සවිඩහයෙහි සුවඳ පසඟුල් දෙමින්, සවණිලංකාරයෙන් සරහන ලද්දා වූ, රන් ධජ නඟන ලද්දා වූ, රන් දැලින් වසන ලද්දා වූ, ඇතුන් සත් සියයක් හා, එසේ මැ අසුන් සත් සියයක් හා, අසුන් යොදා සිංහ සම් ඔබා සත් රුවන් කම්මාන්තයෙන් නිමියා වූ රන් ධජ නඟන ලද්දා වූ රථ සත් සියයක් හා, ගොනුන් සත් සියයක් ද, මී දෙනුන් සත් සියයක් ද, කිරි දෙනුන් සත් සියයක් ද, සවිභරණයෙන් සරහන ලද්දා වූ දෙවඟනන් වැනි රාජ කන්‍යාවන් සත් සියයක් ද, සුශික්ෂිතාචාර ඇති දාසීන් සත් සියයක් ද, එ සේ මැ සවිභරණ විභූෂිත වූ දාසයන් සත් සියයක් ද, යනාදි නොයෙක් දෙය, සත් සියය සත් සියය බැගින් සදවා, රුවන් ගබඩාවලැ දොර හරවා, "තොප කැමැති විවරන් වසනු ගනුව" යි නියෝග කළ හ. යාචකයෝ ද සුපිපි පියුම් වනයකට වදනා බඹර කැලන් සේ රන්, රිදී, මුතු, මැණික්, රන් තෝඛු, සංඛලා, තිසර රුවන්, තෝඛු රුවන්, මුදු රුවන්, වලඳු, ආදි වසනු කැමැති කැමැති සේ උකා ගෙනැ යන්නට වන් හ. සමහරු

පට කඩ, පට්ටෝළි, දේවාඩා, පිඩාම්, සළු පිළි, සම් වඩම්, ගෙනැ යන්නෝ සිය දහස් ගණනැ. පාදඬගුලි, පාද කටක, පස් පෙරහර, එක් වැටි, පෑ මුදු, රන් මර-වැඩි, හිණ කෙස් වැළ, දෙ පට වීදැ, අඟුල්, දසරැ බාහු මුතුරැල්, මැණික් මාලා දම, කන පසේඹි, කන් අගා, තුලක, මිණි වොටුණු, ආදි සියලු පළඳනා ද යාචකයනට දන් දුන් හ. මෙ සේ මහ බෝ සතාණන් වහන්සේ සතු සතු මහ දන් දුන් කෙණෙහි, මේ මහ පොළොව ගුගුරා නැංගැ. මේරු පර්වතය සතුටු වැ නටන්නකු මෙන් නටන්නට වනැ. සප්ත කුල පර්වත-යෝ ද හුයා පි වෙයඟ බඩ සේ නැමී වැඳුම් ගත් හ. මද්‍රී දේවි ද තමා ගේ පළඳනා හා ධන ධාන්‍ය හා සියලු යාචකයනට දන් දුන්නා යැ.

8. බෝ සතුන් නුවර හැරැ යෑම.

36. එ දවස් දන් දුන් හෙයින් යා නො හී, දෙ වන දවස් **වෙස්සන්තර** රජ්ජුරුවෝ අඹු දරුවන් කැඳවා ගෙනැ පියාණන් හා මැණියන් හා සමීපයට ගොස් වැඳැ සිටියා හ. බෝධි සත්ත්වයන් ගේ මැණියෝ **මද්‍රී** දේවිනට කියන්නාහු "යෙහෙළණියනි, දන් දුන් දොෂ-යට ම පුතුන් වනයට යා දෙව. නෙපි නො යව" සි කියා "වනාන්තරයෙහි දුක් බොහෝ යැ. **ජාලී** කුමා-රයන් හා **කෘෂ්ණාජිනා**වන් හා තොප හා හිය කලැ මහා ව්‍යසන යැ. දරුවන් රක්ෂා කිරීම ඉතා මැ දුෂ්-කර යැ" සි කී හ, මද්‍රී දේවි කියන්නී, "මා ගේ ස්වාමීන් හා වලැ වසන කලැ, ගමැ ඉන්නාට වඩා පහසු යැ. කැටි වැ හිය කලැ ගෙයි ඉන්නා වැන්නැ" සි කීවා යැ.

37. එ සඳැ, බෝධි සත්ත්වයෝ මද්‍රී දේවීන් මුහුණ බලා කියන්නාහු, "සොඳුර, වලැ වසන කලැ මහත් භය ඇති. **හිමාලය** වනයෙහි දුර පිඹුරෝ යැ යන සත්ත්ව වර්ගයක් තමන් දරණින් යොදුන් දෙ යොදුන් වල් වටී කොටැ ගෙනැ, තමන් මුවට හසුවූ සිංහයන් ව්‍යාඝ්‍රයන් ඇතුන් දක්වා අල්ලා ගෙනැ ගැලැ පියති.

නව ද සොඳුර, ඒ වනාන්තරයෙහි ගල්ගිහි සිදෑ සිංහ නාද කරන සිංහයන් ගේ හඬින් කන් පැළී යන්නා වැන්නෑ. ඒ වෙනෙහි යක්ෂ, රාක්ෂස, භූත ප්‍රේතයන් ගෙන් භය ඇති. සියලු ශරීරය ඇට දක්වා විදෑ ලේ බොන මඳුරුවෝ ඉතා බොහෝ යෑ. ඇස් සතෙකැ දුට ගැලෑවී යා නොදෙන වලසුන් විසින් ගහන යෑ. බොහෝ කොටෑ කීමෙන් කිම ද? ඒ වෙනෙහි සත්‍රීන් වාසය කරන්නට බැරි මෑ යෑ" සි කී හ. එ බසට මද්‍රී දේවී කියන්නී, "ස්වාමීනි, වදුල හැම දුන් ගෙනෑ වෙසෙමි" සි කිවු යෑ. එ සඳෑ බෝධි සත්ත්වයෝ බාල දරුවන් කැට පාෂාණ පිටෑ නොඇවිදුවා, සුව යහන්හි හොත්තවුන් ගල් යහන් පිටෑ නොහොවා, ධවල චාමරයෙන් පවන් වුන්නවුන් අවු සුළං ඇහෑ නොගස්වා, රස භෝජනයෙන් මේ නිමැවුවන් ඵලාඵල අනුභව නොකරවා, ම පියාණන් වහන්සේ කෙරෙහි ඉඳුවා එව" සි කී හ. "ස්වාමීනි, මම නුඹ වහන්සේ නොදැකැ නොහැමෙමි. දරෑ දෙ දෙන මා නොදැකැ නොහැමෙනී" සි කිව.

38. දෙ මහල්ලන් කථා අසූ ළිසති දේවි තොමෝ, වෙනෙහි ගොස් පුතණුවන් ගන්නා දුන් සිතමින් මහත් ශෝකයෙන් තැවෙමින් හඬා පෙරළෙන්නට වන්නී යෑ. සොළොස් දහසක් පුරඟනෝ ද නගර වාසීහු ද ප්‍රවණ්ඩ වාතයෙන් එක පැහැරි පොළොව පිටෑ වැගිරි ගිය මහ සල් වනයක් මෙන් එක පැහැරි හඬා වැකිරි ගිය හ.

39. එ කෙණෙහි ඇමැත්තෝ මන හර කොටෑ රථ–යක් සදා වඩනා කල් දැන්වූ හ. එ සඳෑ මද්‍රී දේවී සමන–නට පළමු කොටෑ දියණියන් වඩා ගෙනෑ, පුතණුවන් ඇඟිල්ල අල්ලා ගෙනෑ පලා ගොස්, රථයට පැනෑ නැංගා යෑ. ඉක්බිති බෝධි සත්ත්වයෝ දෙමවු පියන් වැඳෑ සමු ගෙනෑ, පුර සත්‍රීනට සමු දී සියලු ජන සමූ–හයාට අවවාද කෙරෙමින් ක්ෂමා කෙරෙමින් තමන් දුන් දන්හි පින් අනුමෝදන් කරවමින්, මහා ජනයා

හඬ හඬා සිටියැ දී රථය පැදූ ගෙනැ රාජ විථියට නික්මුණාහු, අා ආවුනට පින් දී, "තෙපි හැම ද පින් කරවු. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම සේ සිතවු. සම්පත් නම්, 'අල පතැ ඔත් දියත්තක් සේ අස්ථිර යැ' සි සිතවු. මරණය තමා කරා එන බව සිහි කරවු. ඔවුනොවුන් හා විවාද නො කරවු. ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරවු. අප කී බිණු දෙයට ක්ෂමා කරවු" සි කියා මෙසේ වූ ප්‍රිය තෙපුලෙන් අවවාද කොටැ, නුවරැ වැස්සනට සමු දී, නුවරින් පිටත් වැ. උතුරැ දිස් බලා වඩනට පටන් ගත් හ.

40. මෙ සේ වඩනා බුද්ධාංකුර වූ මහතාණන්, "නුවර පෙරළා බලමි" සි සිතූ ක්ෂණයෙහි, රථ සක් ප්‍රමාණ තැනැ පොළොව බිඳී පෙරළා රථය නුවර දිශාවට නමා ලී යැ. එ සඳැ බෝධි සත්ත්වයන් තමන් ගේ දෙ මවු පියන් ගේ ප්‍රාසාදාදි සම්පත් බලා සතුටු වැ, මෙසේ වඩනා කල්හි, බෝධි සත්ත්වයන් ගේ මෑණියෝ සිතන්නාහු, "ම පුතණුවෝ වොටුණු මාලාදි රාජාභරණ හා ධන ධාන්‍යාදිය හා අවලොස් වරෙකැ දන් දුන් හ. දැන් ඔදු දේවීන් හා දෙ දෙන හුදෙකලා වැ වනයට යන්නා හ. ඒ යන ගමනේ දන් දෙන්ව" සි සිතා වස්ත්‍රාභරණයෙන් හා සත් රැවනින් හා දහසක් ගැල් පුරා යැවූ හ. මෑණියන් එවූ වසතු බලා සතුටු වැ රථය සිඟන්නන් කරා පදවා, වසතු සිඟන්නනට දන් දෙවා වනාන්තරයට නික්මුණා හ.

9. මඟැ දී දන් දීම. චේතිය රජයෙන් පැවැරීම.

41. එ කල්හි "වෙස්සන්තර රජ්ජුරැවෝ කොයි දූ?" සි විචාරා, බමුණෝ සතර දෙනෙක් අවුත් පිළිවිසැ, වඩන හිරියට යනු නිසා නික්මුණු බව අසා රැහැණි වැ, අත සලා පියා, "යන කලැ ගෙනැ ගිය දෙයෙක් ඇද්දූ?" සි විචාරා, "රථය මුත් අනෙක් ගෙනැ ගිය දෙයෙක්

නැතැ" යි අසා, "එ සේ ද වුවත් යා යුතු යැ" යි දිවැ ගෙනැ ගොස්, ඇස් හමුයෙහි වඩනා බෝධි සත්ත්වයන් දැකැ, "පින්වත් වූ රජ්ජුරුවෙනි, සිටුව" යි හඬ ගැ හ. බෝධි සත්ත්වයෝ ඒ හඬ අසා රථය නැවැත්තූ හ. බමුණෝ ඉදිරියට ගොස් ආශීර්වාද කොටැ සිටිය හ. එ විටැ බෝධි සත්ත්වයෝ, "බමුණෙනි, කුමකට ආවා දැ?" යි විචාළ හ. බමුණෝ කියන්නාහු, "අප පින් මද හෙයින් ඔබ සප්ත ශතක මහා දානයට පැමිණැ දන් ගන්නට නො හැකි වූ මි හ. තෙලෙ රථය අදනා අශ්වයන් අපට දුන මැනැවැ" යි ඉල්ලූ හ. බෝධි සත්ත්වයෝ සතුටු වැ මිදි දේවින් හා දරු දෙ බිසින්නත් හා රථයෙන් බස්වා, සෙනවයන් සතර දෙන බමුණනට දන් දුන් හ. බමුණෝ බෝධි සත්ත්වයනට සතුති කොටැ අසුන් රැගෙනැ ගිය හ.

42. එ සේ අශ්වයන් දුන් කලැ, රථ මන්දිරය අහසෙහි සිටියේ යැ. ශක්‍ර දෙවේන්ද්‍ර තෙමේ ඒ දැකැ දිව්‍ය පුත්‍රයන් සතර දෙනකු කැඳවා කියන්නේ, "වෙස්සන්තර රජ්ජුරුවෝ තපසට යන්නෝ රථාශ්වයන් බමුණනට දන් දී පයින් වඩිති. තෙපි ගොස් රථය අදුව" යි නියෝග කෙළේ යැ. දිව්‍ය පුත්‍රයන් සතර දෙන රෝහිත මෘග වෙස් මවා ගෙනැ, රථයෙහි යෙදී රථය අදනා කල්හි, අනෙක් බමුණෙන් පෙර සේ මැ අවුත්, "වෙස්සන්තර රජ්ජුරුවෙනි, සිටුව" යි හඬ ගැ යැ. ඒ හඬ අසා මහතාණෝ රථය නැවැත්වූ හ. බමුණු ඇවිත් කියන්නේ, "රජ්ජුරුවෙනි, ඉතා වෘද්ධයෙමි, ගමත් විඩායෙන් මිරිකුණෙමි. තෙලෙ රථය දෙව" යි කියා රජ හට ආශීර්වාද කෙළේ යැ. බෝධි සත්ත්වයෝ සතුටු වැ, අඹු දරුවන් රථයෙන් බස්වා බමුණාට රථය දන් දුන් හ. "බිසොවුන් පයින් යා නො හෙති. දරුවන් ද යා නොහෙති" යි නො සිතා, එ ද ඒ මහතාණන් රථය දන් දෙත් මැ රථය අදිමින් සිටි දෙවියෝ අනනුඥාත වූ හ.

43. ඉක්බිති **මද්‍රී** දේවී දරු දෙදෙන අතැ අල්ලා ගෙනැ වතෘන්තරයට නික්මුණා හ. බෝධි සත්ත්වයෝ බිසොවුනට කියන්නාහු, "සොඳුර, **ජාලි** කුමාරයන් මම වඩා ගනිමි. **කෘෂ්ණාජිනාවන්** තෙපි වඩා ගනුව" යි කියා දෙදෙන දරු දෙදෙනා වඩා ගෙනැ, සෙල් බැහැ-වීලි **කටු** පහණ ගල් බොරඳු මඬිමින්, හුණු වැල්ල මඬිමින්, ඇළ දෙළ වැදූ නාමින්, ලිය මඩුයෙහි සිහිල් සෙවණැ සැතැපෙමින් දෙ දෙනා ඔවුනොවුන් සතුටු වැ සෙමෙන් තමන් දුන් දන් සිහි කෙරෙමින්, සතුටු සතුටු වැ වඩනා හ. ඔවුන් දුටුදුටුවන් විසින් ඔවුන් දෙ දෙනා ගේ සියුමැලි කම සිතමින්, "යන්නේ කොයි දැ?" යි විචාළ කලැ, "**වඞ්කගිරි** පර්වතයට යැ" යි කියති. ඒ අසා කම්පා වැ කඳුළු මුසු මුහුණින් යුක්ත වැ හඬන්නා වූ ජනයාට අවවාද කෙරෙමින් වඩනා කල්හි, මහ දෙ පසැ සිටි අඹ දඹ ජම්බීර නා පනා නාරං ආදි වෘක්ෂයන්හි ඵලාඵල දරුවෝ දැකැ, ඊට ඇවිටිලි වැ දෙ අත් ඔසවා "අම්ම පියාණෙනි" යි කිය කියා හඬ-මින් යෙති. ඒ **වෙස්සන්තර** නම් බුද්ධාංකුරෝත්-තමයාණන් වහන්සේ ගේ පුණ්‍ය තේජානුභාවයෙන් වෘක්ෂයෝ තුමූ මැ නැමී ඵලාඵල දරුවන් අත තබති.

44. බෝ සතාණෝ දරුවන් කැමැති කැමැති දෑ දෙමින්, පොකුණු පතැස් විල් තෙරැ සැතැපෙමින්, දේවතානුභාවයෙන් තිස් යොදුන් මඟ ගෙවා, එක දවසින් මැ ගොස් **වේතීය** රටැ නගර ශාලාවට වන් හ. දේවතාවෝ ළඳ බොළඳ සියුමැලි කුමාර වරුන් කෙරෙහි අනුකම්පායෙන් පෘථිවිය හ්‍රස්ව කොටැ නැඟූ හ. මද්‍රී දේවී ශාලාව හැමැඳැ, බෝධි සත්ත්වයනට හිඳුනා අසුන් පනවා වඩා හිඳුවා, පස්ලෙහි වූ ඛුලි පිසැ පියා, දරු දෙ දෙනා ඔවුන් ළඟැ හිඳුවා "නගර වාසීනට පෙනුණ මැනැවැ" යි සිතා, බෝධි සත්ත්වයනට ද පෙනෙන පරිද්-දෙන් නුදුරු වැ සිටියා හ. එසේ ඉන්නට කාරණ කිම් ද යත්? බෝධි සත්ත්වයන්, තමන් ගේ නුවරට ආ හෙයින් 'අප හැරැ ගියා දෙහෝ?' යි සිතුව හොත් හේතු නොවෙති යි සිතා බෝධි සත්ත්වයනට පෙනෙන සේ සිටියා හ.

45. එසේ සිටියා වූ බිසොවුන් යන එන්නෝ දුකැවැදැ නගර වාසීනට කීහ. නගර වාසීහු රැස්වැ **වෙතිය** රජ්ජුරුවනට කියා යැවූහ. එ කලැ **වෙතිය** රජ්ජුරුවන් ඇතුළු වූ සැට දහසක් රජ දරුවෝ අවුත් බෝධිසත්වයන් පා පිටැ හඬා ගුණහ. හඬා නැවැතැ කියන්නාහු, "කිම ද මහ රජ, ඔබට ලෙඩ දුක් නැද්ද? නුඹගේ පියාණන් සඳ මහ රජ්ජුරුවනට දුක් නැද්ද? නුවර වාසීනට පීඩා නැද්ද? මේ නම් කුමන විස්මයයෙක් ද? කවර නම් විපත්තියෙක් ද? මෙසේ වූ අනාථ ගමනෙක් කුමක් නිසා තොපට වී ද? දේවයෙනි, තෙපි නැඟී ආ වාහන කොයි ද?" යි යනාදීන් විචාළහ. බෝසතාණෝ කියන්නාහු, "මා ගේ දෙමවු පියනට ද පීඩා නැති. වැළි එකක් කියමි. කෙලාස කූටය වැනි සව්ඩහය අති ධවල වූ, සුවිසි ලක්ෂයක් පළඳනායෙන් හොබනා වූ, පරිවාර සහිත මා ගේ පණ්ඩර නම් ඇළි ඇතු කලිඟු රටැ බමුණනට දන් දුන් හයි සිවි රටැ ඇත්තෝ ම පියාණනට ද මට ද කිපි, මා රටින් ගියමැනැවැ යි කිවුයැ. එ සේ හෙයින් ආමි" යි කීහ. **වෙතිය** රජ්ජුරුවෝ ඒ අසා, "ආයේ ඉතා යහපතැ යි" සතුටු වැ, "සිවි රටැ ඇත්තන් සතුටු වැ ආරාධනා කොටැ ගෙනැ යන තුරු අප ගේ රටැ රජකම් කළ මැනැවැ සී" **වෙතිය** රජ්ජුරුවන් හා සැට දහසක් රජ දරුවෝ තමන් තමන් ගේ රාජ්‍යයට ආරාධනා කළහ.

46. එ කල්හි මහ බෝසතාණෝ කියන්නාහු, "තොපට රාජ්‍යය නො කෙරෙමි. අප නෙරැ පූ රජ්ජුරුවන් උන් නවතා ගෙනැ රාජ්‍යය කරවති" යි සිවි රටැ වාසීන් තොප කෙරෙහි වෛර බැඳැ උනුන් යුද්ධ කොටැ දෙ රටැ ඇත්තෝ විරෝධ වෙති. එ බැවින් එ සේ නො කෙරෙමි. වංකගිරි පර්වතයට යන බව මැනැවැ. ඒ තැන් විසිමට සුදුසු තැනක් කියව" යි කීහ. "විචාරා කියමි හ. රජ ගෙට වැඩියැ මැනැවැ" යි රජ දරුවෝ කීහ. බෝසතාණන් "නො යමි හ" යි කී කලැ, ඇතුළු නුවරට නො වඩනා හෙයින් ඒ ශාලාව මැ දිව්‍ය විමානයක් සේ සරහා සැට දහසක් රජ දරුවෝ ශාලාව වට කොටැ රකවල්

ගත් හ. බෝධි සත්ත්වයන් සුවඳ පැනින් නාවා සළු පෙරළා සළු හඳවා, රස භෝජනය වළඳවා සතුටු කළ හ. බෝ සතාණන් එ දවස් රැ එහි ලැඟැ, දෙ වන දා "වංකගිරි පව්තයට යම් හ" යි කී සඳැ, රජ්ජුරුවෝ කියන්නාහු, "ඔබ වඩනා කලැ පෙර ගමන් පසු ගමන් කරන්නට බොහෝ දෙන ඇත්තා හ. එ බැවින් වළ හස්වා මහ එළි කරන තෙක් වැඩ හුණ මැනැවැ" යි වළකා සත් දවසක් එහි මැ රඳවා ගත් හ. මහ හෙළි කළ කලැ "වංකගිරි පව්තයට යම් හ" යි බෝධි සත්ත්වයෝ නික්-ඛුණා හ. එ කලැ මේතිය රජ්ජුරුවන් හා සැට දහසක් රජ දරුවෝ බෝධි සත්ත්වයන් සමඟ ගියා හ.

10. වෙසතුරු රජ පවුල තපස් රැකීම.

47. එ සේ ගොස් පසළොස් යොදුන්නක් මඟ ගෙවා, පසළොස් යොදුන්නක් ඉදිරියෙහි තිබියැ දී, මහ වනය සමීපයෙහි සේනාධිපතියකු රකවල් ලවා සිටැ දකුණත ඔසවා මහ කියන්නාහු යැ: "ස්වාමිනි, මෙ තැනැ සිටැ ඉඳුරා දකුණු දික් බලා ගිය කලැ, නහා සිටිවූ නිල් වලා කුළක් සේ තෙලෙ පෙනෙන්නේ ඵලාඵලයෙන් විපුල වූ **විපුල** නම් පව්තය යැ. ඒ පව්ත ප්‍රාන්තයෙහි සිටැ බැලූ කලැ, නොයෙක් සුගන්ධයෙන් යුත් **ගන්ධමාදන** පව්තය පෙනෙන්නේ යැ. ඒ පව්තය වටා නඳුන්, සඳුන්, කළු වැල්, කිහිරි, සපු, පුවඟ, දුනු කේ, වැට කේ, නා, පනා, සල්, සලල, අගරු, දෙව් දුරු, ආදි නොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිත යැ. ඒ සැතැපී, තොප අඹු දරුවන් ඵලාඵල කවා ගිරි උගලින් බට සිහිල් පැන් බී ශරීර ක්ලාන්ත නිවා ගෙනැ, ඉන් ඔබට වැඩි කලැ, මනා වූ තොට පතර අැති නොයෙක් මස් කැස්බන් විසින් ගැවැසී ගත් කේතුමතී නම් මහ ගඟෙක් අැති. ඒ දෙ පාර්ශ්වයෙහි රිදී පටක් හයා ලූවා සේ මනා වූ වැලි තලායෙහි වටින් හමන්නා වූ සිහිල් සුළඟ ඇඟැ ගස්වා සැතැපී ගෙනැ, වැද්දන්හු විසින් දුන් මී හා මස් වළඳා, ඔහු ගේ සාහායය-යෙන් ඒ ගහින් එ තෙර වැ, ඕ හට රන් වොටුන්න තද

කරන ලෂ්‍යයක් අගනා රත්න ඉද්ද දෙවා, ඉන් ඔබට වැඩි කලෑ, ඉන්ද්‍ර නීල මාණික්‍යයන් සේ බබළන සානු නම් පර්වතයෙක් ඇති – ඒ පර්වත ශිඛරයෙහි පිහිටි මහා නුග ගසෙහි වූ අමා ඵල වැනි මධුර රස ඇති නුග ඵල අනුභව කොටෑ, ඒ ගස් මුලෑ සෑතෑපී, ඉන් ඔබට වැඩි කලෑ, සතර– 'භුල් උස ඇති රතිඳුගොව්වන් සහිත නිල් වූ මහත් ජාතණ වනය යෑ – ඒ ගෙවා වඩනේ මුවලිඳු නම් විල් තෙරින් ගොස් පූර්‍වෝත්තර කෝණයට පෑමිණෑ, ඒක පදික මාර්ගයෙන් ගොස් වන ළැහැබට පැමිණි කලෑ, පස් පෑයෙන් යුත් පියුමෙන් හා වැල්ලෙන් හා ගෑවැසී ගත් නිල් වූ දිය සළා– යෙන් යුත් ඉඳු නිල් මිණි අතල පැරැවූ, මී බී මත් බමර ගණන් විසින් ගැවැසී ගත්, හංස ශ්‍රේණීන් ගෙන් විරාජමාන වූ සතරැස් පොකුණෙක් ඇති – ඒ දැකෑ ඒ පොකුණට දකුණු දිග බලා ගිය කලෑ, නොයෙක් ඵලාඵලයෙන් ගැවැසී ගත් අවඛකවූ වංකගිරි පර්වතයයෑ – ඒ පර්වතයේ පත් සල් කොටෑ ගෙනෑ ධ්‍යාන සුවයෙන් දවස් යවමින් අඹු දරුවන් හා සමඟ වාසය කරව" යි කියා නැවැතෑ සැට දහසක් රජ දරුවෝ බෝධි සත්ත්වයන් වැඳෑ සමු ගෙනෑ පෙරැළා තම නුවරවලට මෑ ගිය හ.

48. එදවස් ශක්‍ර දේවෙන්ද්‍ර තෙමේ තමන් ගේ දහසක් නුවණැස් ලා මනුෂ්‍ය ලෝකය බලන්නේ, "අප මහ බෝසතාණන් සත සතු මහ දන් දී, තපස් රක්නට වංකගිරි පර්වතයට නික්මුණු බව දැකෑ, විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳවා කියන්නේ, "වෙස්සන්තර රජ්ජුරුවෝ ද මද්‍රි දෙවි ද තපස් කරන්නට වංකගිරි පර්වතයට යෙත්. තෝ එහි ගොස් පත් සල් දෙකක් හා සක්මන් මළු දෙකක් හා නොයෙක් මල් පල්ලෙන් ගැවැසී ගත් මල් ගස් හා කෙහෙල් වනයක් හා අඳුන් දිවි සම්, රිටි සුඹුළු, කෙණ්ඩි, සැර යටි, පැස්, සාදු, මල් කරෑ, යහුල්, ආදි වූ දෙය මවා, 'තපස් කරන්නවුනට කැප යෑ'යි බිත්තියේ අකුරෑ ලියා, පත් සලට තිස් ගව්වක් මානයේ වගුන් වලසුන් සිංහ ව්‍යාඝ්‍රයන් ආදි සිවුපාවුන් හා යක් බූ පිසසුන් හා භයානක

ශබ්ද ඇති මෘග පක්ෂීන් හා පලවා හැරී එව''යි කියා නියෝග කෙළේ යැ. ඒ විස්කම් දෙව් පුත් සක් දෙව් රජතු ගේ නියෝගය පරිද්දෙන් එකී සියල්ල නිර්මිත කොටැ තබා දෙව් ලොවට මැ ගියේ යැ.

49. බෝධි සත්ත්වයෝ කී සලකුණින් යන්නෝ, සැතැපී නිදමින් සිටිමින් සතරැස් පොකුණට ගොස් පොකුණ විසතර බලා, ''තෙපි මෙ තැනැ සිටුව''යි කියා මද්‍රී දේවී පොකුණු තෙරී සිටුවා, දකුණු දිගැ හසරක් දැකැ, ඒ හසරින් ගොස්, විශ්වකර්මයා මැවූ පන් සල දැකැ, ''ශක්‍රයා අප අා බව දන්නේ වනැ'' යි සිතා, තමන් වහන්සේ අතැ තුබූ රන් කඩුව තබා, පන් සල අැතුළට වැදී, භිත්තියේ තුබූ අකුරැ දැකැ කියවා බලා, තපසට කැප බව දැනැ, එහි හිඳැ, ජටා බැඳැ, හත් සළු ගලවා තබා, වල්කල හැඳැ, අඳුන් දිවි සම් පොරවා, පාත්‍රය ගෙනැ, සැර යටියත් අතින් ගෙනැ, සක්මන් මළුයෙහි සක්මන් කෙරෙමින් සිටියා හ.

50. මද්‍රී දේවී, බෝධි සත්ත්වයන් ලස්සූ හෙයින් සතරැස් පොකුණින් නික්මැ, බෝධි සත්ත්වයන් ගිය හසරින් ගොස්, තපෝ විලාසයෙන් සිටී සමණන් දැකැ, ළය පැළී යන තරම් ශෝකයෙන් හඬා බිමැ හී ''ස්වාමිනි, පෙරැ සිවි රට ආදී දේශයන්හි මිනිසුන් විසින්, නුඹ 'සඳ මහ රජාණන් පුතණුවෝ, වෙස්සන්තර රජ්ජුරුවෝ යැ,' යි කටැ කටැ නුඹගේ රූප ශ්‍රී කියනු අැසීමි. මා ගේ අැසින් ද නුඹ ගේ ඒ රූප ශ්‍රී දිටිමි. දැන් මෙ වැනි තවුස් වේශයක් දිටිමි. පෙරැ නුඹ 'රජ්ජුරුවෝ'යැ යි ප්‍රසිද්ධ වැ දැන් 'තපස්වී'යැ යි යන නම් විසැ. පෙරැ මිණි කොඩොලින් බබළන වොටුනු පලන් තෙලෙ හිස, දැන් දළ මඩුල්ලට සුදුසු වියැ. පෙරැ දළ මුතු හර එකා වැළ පලන් තෙලෙ උරය, දැන් මුව සම් ලන්නට සුදුසු වී යැ. පෙරැ කසී සළු හන් තෙලෙ උකුළ, දැන් නිය සහිත අඳුන් දිවි සම් ලන්නට සුදුසු වියැ. මෙසේ වූ වේශයක් දකින්නට මා ගේ

දැස තුබූ නියා යැ. මෙසේ වූ දෙයක් නුඹ වහන්සේටත් වූයේ වනැ. මෙවැනි විලාසයක් දුටු මා ළය හැම්මෙන නියා යැ"සි හඬා වැලැපැ, ශෝක සන්හිඳුවා ගෙනැ, "සමණන් වහන්සේ ගත් තවුස් වෙස් මාත් ගත ද මැනැවැ"සි සිතා, ජාලි කුමාරයන් හා කෘෂ්ණාජිනාවන් ද කැඳවා ගෙනැ අනෙක් පත් සලට වැදූ, තමත් හත් සළු ගලවා තබා, අඳුන් දිවි සම් රිටි සුඹුළු වල්කල ජටා ධර වැ, ජාලි කුමාරයනට හා කෘෂ්ණාජිනාවනට ද අඳුන් දිවි සම් රිටි සුඹුළු හඳවා, හිස ජටා බඳවා, බෝ සතාණන් කරා ගොස් වැඳැ නැඟී සිටැ, "වහන්ස, නුඹ අතින් මා ගන්නා වරයෙක් ඇතැයි"සි වර ඉල්ලන්නී, "මම වන මුල් වන ඵලාඵල ගෙනෙන්නට යෙමි. ඵලාඵල සොයා යා දී පෙර වරැ නුඹ වහන්සේ දරැ දෙ දෙනා රකෂා කළ මැනැවැ"සි කීවා යැ. මහ බෝ සතාණන් වහන්සේ, "යහ පතැ"සි උනට වර දී කියන්නාහු, "මා විසින් ද තොප ගෙන් ගන්නා වරයෙක් ඇති. වේලේ මුත් නොවේලේ මා ගේ පන් සලට නොවදුව"සි කීහ. උන් අතින් වර ලදින් මෙසේ වසන කල්හි, මද්‍රී දේවීන් වන මුල් වන ඵලාඵල ගෙනැ ඇරැ බෝ සතාණන් වළඳවා අත් පා මෙහෙ කොටැ මසක් පිරුණු සඳැ, බෝධි සත්ත්වයෝ තමන් අතින් දන් ගන්නවුන් නැත්තෙන් දුක් පත් වූවාහු, පරහට සුව දෙන්නට උපන් මහතාණෝ, වන මුල් වන ඵලාඵල ඇත ද දන්මැ මුත් සෙස්සක් නොපතන්නා හ.

11. ජූජක–අමිත්තතාපා අවුල.

51. මෙසේ වසන සමයයෙහි කලිඟු රටැ දන්තිවිඨ නම් බමුණු ගමැ, ජූජක නම් බමුණෙක් බාල කලැ සිටැ සිහත්නේ, වෘද්ධ අවස්ථාව දක්වා සිහා ගෙනැ, කහවණු සියයක් ලදින්, අනාථ එස් බමුණකු කෙරෙහි තබා ගොස් කල් යාමෙකින් අවුත්, "යහළුව, මා ගේ කහවණු දෙව"සි කියා ඉල්ලී යැ. ඒ බමුණු කියන්නේ, "යහළුව, මා අනාථ විසින් තා ගේ කහවණු විකුටැ කා පිමි. තා ගේ කහවණු

නියාවට මාගේ අමිත්තතාපා නම දියණියන් ගෙනෑ යෙව''සි දියණියන් භාර කෙළේ යැ. ඌ ගෙන් අනෙක් ලැබෙන දෙයක් නැත්තෙන්, තමා කාම දුස බැව්න් ඒ බැමිණිය තමා ගේ ගෙ දොරට කැඳවා ගෙනෑ ගොස්, තමාට අඹු කෙළේ යැ. ඒ බැමිණිය ද ඡූජකයා කෙරෙහි මහත් ගෞරවයෙන් උපසත්කාර කෙරෙමින් සිත් සේ වෙසෙයි. එ කලෑ ඒ බමුණු ගම්ෑ සෙසු තරුණ බමුණෝ තමන් තමන්ගේ අඹුවනට රැහැණි වැ කියන්නාහු, ''ජරා දුව්ල වෘද්ධ බමුණාට මෙ වැනි තරුණ සත්‍රියක් ඌ සිත් සේ මෙහෙවර කොටෑ වෙසෙයි. නොප අපට මෙහෙවර කිරීමෙහි ප්‍රමාද වන්නේ කිම දෑ?''සි කියා ගැහැට කෙරෙති.

52. එබස් අසූ බැමිණියෝ, ''ඡූජකයා ගේ හෘදයෙන් අෑ තොර කරම් හ'' සි සම්මත කොටෑ ගෙන, එක් දවසක් අමිත්තතාපා නම් බැමිණිය පැන් නොටෑ දී දූකෑ කියන්නාහු, ''එම්බල පව් කළ නැනැත්තිය, නී දත් හුණු නර මහල්ලකුට මෙහෙ කෙරෙහි ද? මේ කඩ දත් මහල්ලාට නී පාවා දුන් නි ගේ දෙ මවු පියෝ නිට සතුරු වන්නා හ. නි උනට සතුරු වන නියා යැ. අප්‍රිය වන නියා යැ. නී පින් නො කළ නැනැත්තියකැ. නී ඔය ජාතියෙහි නව වක් යාගයෙහි කපුටුවනට දූ බත් පළමු කොටෑ කෑයේ මහදූ කපුටුවෙක් වන. එ සේ හෙයින් වේ ද, නී මේ ජර මහල්ලාට අඹු වූයේ? යෙහෙළිය, මෙ සේ වූ ජර මහල්ලා හා එක් වැ පඤ්ච කාම විෂයයෙහි කවර නම් ඇල්මෙක් ඇද්ද? ඌ කටෑ දත් දල්වා ගෙනෑ සිනා සෙන වේලෙහි නි සිතට කවර නම් සමාධියෙක් ද? කිඹුල් පිටෙකෑ සේ උගේ ශරීරයෙහි ගැටී කවර නම් සමාධියෙක් වේ ද? ඇරඹි සමක් වැනි ඇඟ රැළි ඇති කඩ දත් ඇති කෙළ තොදූ මහදූ බමුණා හා නී ගේ කවර නම් පඤ්ච-කාම සම්පත්තියෙක් ද? සොඳුර, නී ගේ කෝමළ වූ ශරීරය මිරිකා ඒ බමුණු කනාටුවාට මෙහෙ කොටෑ දුක් නො ගෙනෑ නී සේ වූ අභිරූප ළඳරු සැමියකු සොයා ගනෑ''සි කීහ.

53. මෙසේ ඕ තමාහට පරිභව බණින්නා වූ ගැනුත් බලා, හඬා වැලැපෑ මියුඩු ඝුරෑ ලලා, පැනට ගෙනෑ ගිය කළය ගලෑ ගසා බිඳෑ පියා, අත පෙරෙවෑ ගෙනෑ ගෙට අවුත්, ජූජක නම් බමුණහු ගේ රැවුළ තරයේ අල්ලා ගෙනෑ, බමුණු මාල්ලාට තතනමින්, බෙණෙමින්, දත් කමින්, "බමුණු මාල්ල, තා සේ වූ කෙළ තොල්ලන් කෙරෙහි උන් විපාක අද මෑ ලදිමි. යහ පත් සරණෙකෑ යෑ, මා ආයේ! අද මේ ගමෑ දූරියෝ එන් වෑ ගෙනෑ ලා මා හිස බොල් කෙළ ඔත් හ. පැන් තොටෑ දීමට උන් නො කළ පරිභවයෙක් නැති. තා කෙරේ හිඳෑ මෙ යේ වූ බස් අසන්නාට වඩා, කරි වැල් ලා ගෙනෑ මියෑ යෑම යහ පතෑ. සිරිඟි කා මියෑ යෑම යහ පතෑ. වහා පහාස් දූසයකු හෝ දූසියක හෝ ගෙනෑ එව. නැත හොත් තා කෙරෙහි නො හිඳෑ යෙමි"සි කීවා යෑ.

54. එ බස් අසා බමුණු තමා දත් වැහිරි ගියත් අඹු සොඬ හෙයින් කී බසට කම්පා වෑ කියනුයේ, "එම්බා සොඳුර, නුඹ රැහැණි නො වව. මහලු වූ බෑවින් දූසදූසින් ලදත් නො හැකි. මෙ වක් පටත් දරත් මම් මෑ ගෙනෙමි. දියත් මම් මෑ ගෙනෙමි. සෙසු කළ මනා යම් මෑ දෙයක් ඇත් නම් මම් මෑ කෙරෙමි. අද පටන් තෙපි මෙහෙ නො කරව. තෙපි ගෙය රැකෑ ඉඳුව"සි බෑමිණිය අස්වසා කී යෑ. "අහෝ බ්‍රාහ්මණය, සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙකෑ මා උපන්නේ නැති. නපුරු බස් නො කියා දූසියක හෝ දූසයකු හෝ ගෙනෑ එව" සි කිවු යෑ. "සොඳුර, දූස දූසින් කෙ සේ ලබම් දෑ?"සි කී යෑ. "අහෝ මහලු බමුණ, එ විචරකුත් නොදන්නෙහි ද? තට උපායයක් කියමි. මහා යශස් ඇති ගුණ සමපන්න වූ වෙස්සන්තර රජ්ජුරුවෝ ඉවසා දන් දෙති. උන් ගෙත් වසතු ගෙනෑ අනාථයෝ සුව විඳුනෝ යෑ. දූන් ඒ උත්තමයා චංකගිරි පර්වතයෙහි තපස් කෙරෙයි. තෝ ඔබ හොස් මට මෙහෙ කරන වහලක් ගෙනෙයි නම් ඉඳිමි. නැත් නම් මා ගේ දෙ මවු පියන්

ගේ ගමට ගොස් මා සේ මෑ ළදරු දසුන් ඇති අනෙක් බමුණකු කෙරෙහි ඉඳිමි. තා බලබලා සිටියැ දී උඹ හා මා හා කෙළනා කලැ, මහල්ල, තා සිතට සුවයෙක් නම් නැතැ"යි කී යැ.

55. ඒ අසන්නා මැ බමුණා ළය ඉපිලැ හිණ. ළය පිරුණු මහත් ශෝකයෙන් මියුඹු හුරු ලලා කියන්නේ, "සොඳුර, මම ශක්ති නැත්තෙමි, වෘද්ධයෙමි, යා නොහෙමි. **වංකගිරි** පර්වතය ඉතා දුර යැ. ගෙයි වහලකු විසින් කළ මනා යම් මෙහෙවරෙක් ඇත් නම්, ඒ මම මැ කෙරෙමි. තෙපි ඊට අසමාඛ නොවව"යි කී යැ. එබස් අසා බැමිණී කියන්නී, "තෙපි සංග්‍රාම භූමියට නොවැදූ මැ පැරිදි එකකු වැන්නහු ඇ. එම්බල ජඩ කඩ දත් කොර සැඬ තඹවිටි කම්මැලිය, කන්නළුවු නොපිරුවා ගොස්, **වෙස්සන්තර** රජ්ජුරුවන් අනින් කෙල්ලක කොල්ලකු ගෙනෙව"යි කියා බමුණා වෙරි මස් කයි, ඉන්දූ සිටියැ නොදී ඇත මැත ගැසෙමින් හවමින් බෙණෙමින් වෙසෙයි.

56. බමුණු අඹුව කරන ගහට වීදැ ගත නොහී, ඈ කෙරෙහි සයින්, "යහ පතැ සොඳුර, වහලක් ගෙනෙමි" යි ගිවිසැ, අඹුවට වලින් දර ගෙන'වුත් ගෙය පුරවා, දිය ඇදූ වළන් පුරවා, ගෙයි සිසාරා වැට කොටැ, ඈට බත් බුලත් තබා ලා, ඈ විසින් සපයා දුන් අත් සුත්‍රු ආදී මාඝෝපකරණ ද ගෙනැ, ගමනට සැරසී සිටැ, අඹුව පැදකුණු කොටැ තුන් විටක් වැඳැ ලා, පසු බැසැ, සතර තැනෙකැ බැසැ හෙවැ වැඳැ, ඈ කෙරෙහි කළ සයින් හැකිළැ හැකිළැ පාත බැසැ, සිපැ ගෙනැ, **නිකට** ගෙනැ සනහා, ඈට කියන්නේ, "සොඳුර, මම නොලස්වැ එමි. තෙපි බිය නොවව"යි සමු ගෙනැ, වහන් සඟලක් පයැ ලා, කුඩ මහල්ලක් ගෙනැ, කෙණ්ඩියෙකින් පැන් ගෙනැ, ගමනට ගත් උපකරණ පරිභෝග කරට නඟා ගෙනැ, අඹු ළඳුරි කතුන් පෙරැළිපෙරැළි සිටැ බලබලා, **වංකගිරි** පර්වතයට යන මහට ගොස් මඟැ දී සිතන්නේ, "**සිවි** රටට ගොස් නොදිවිමි නම්, පසු වැ **වංකගිරි** පර්වතයට යෙමි"යි

සිතා, සිවි රටට ගොස්, "වෙස්සන්තර රජ්ජුරුවෝ කොයි දැ?"සි විචාළේ යැ. නුවර වාසිහු ඒ අසා කිපී "තවත් දන් ගැන්මෙහි නවතු ද? අප ගේ සාමීන් රටින් යන පරිද්දෙන් කෙළෙහි යැ. තවත් කුමකට පිළිවිසි දැ?"සි පොළු මුගුරු කැට පහණ ගෙනැ ලුහුබඳවා ගත් හ. බමුණු වැවෙමින් පිරිහෙමින් තොල් බොල් සිඳැ බිඳැ ගෙනැ, දණ උතු වැල මිටි ලේ ලා ගෙනැ දිවෙන කලැ, ලුහුබඳවා ගොස් උණ පත්තෙකින් සම පොත්ත උණ පත්තේ ඇලී යන පරිද්දෙන් පැහැරි පියා, "බමුණ, මතු මේ නුවරට අයි නම් දන්නෙහි වේ දැ?"සි භය ගැන්වූ හ.

12. ජූජකයා ගේ වංකගිරි ගමන.

57. බමුණු මරණ භයින් දිවෙන්නේ, උතුරු දික් බලා ගමන් ගත. බමුණා මඟ නොහඳුනන මහයින්, දේවතාවෝ බෝ සතාණන් ගේ දන පාරමිතා පුරනු සඳහා **වංකගිරි** පර්වතයට යන්නට මඟ පෑ හ. බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස්, ඉර මුදුන් වේලෙහි **මේතිය** පුත්‍ර නම් මුව වැද්ද සිටි රකවලට වන. ඒ වැද්ද ගේ කීන බල්ලෝ බමුණා දැකැ සිඟාරා වට කොටැ ගත් හ. බමුණු භයින් මහ හඬින් හඬා සඝල වැ, තමා ගේ තජ්ජණ නම් අත් සුනු පය්‍යත් කුඩයත් සැර යටියත් වහන් සඟලත් හෙළා පියා, හිසැ කේ උදුරා, දිවැ ගෙනැ ගොස් ගසකට නැඟී සිටැ හඬන්නේ, "පඤ්ච මහා ශුඩාවනට සප්ත මහා සාගරය වැනි වූ, වැසි ළිහිණිය-යනට මහා මේඝයක් බඳු වූ, ඝනාන්ධකාරයට ප්‍රදීපා-ලෝකයක් බඳු වූ, සොළොස් ඝාවකයනට කප් රුකක් වැනි වූ, සිතුසිතු දෙය සිද්ධ කැරි දෙන චින්තා-මාණික්‍යයක් බඳු වූ, ගමන් විඩා වූවනට සිහිල් සෙව-ණක් බඳු වූ, හැම සත්ත්වයනට පින් පැන් ශාලාවක් බඳු වූ, ඉල්ලූ දෙයක් නැතැ සි නොකියන්නා වූ, පඤ්ච මහා පද්මයෙන් පිරුණු පොකුණක් බඳු වූ, සියලු සතු-නට මැ ඝිතවත් වූ වෙස්සන්තර රජ්ජුරුවෝ කොහි දැ?"සි හැඬී යැ.

58. ඒ වේතිය පුත්‍ර නම් වැදි තෙමේ බමුණා ගේ හඬ අසා දිවැ අවුත්, බමුණා දැකැ සිතන්නේ, "තමන් ගේ රාජ්‍යය හැරි පියා මේ හිමවතට ආ රජ්ජුරුවන් සොයා ආයේ බිසොවුන් වත් ඉල්ලා දෙහෝ?" සි කිපී පිටි තොල දත් කමින් වටැ පිටැ බලමින් අවුත්, "දුෂ්ට බමුණු මහල්ල, දැන් දැන් තා දිවි ගනිමි" සි දුන්න හයා විෂ පෙවූ හිය දුනු මුඩායේ ලා හයා ගෙනැ, "සොර බමුණ, දැන් තා ගේ හෘදය මාංසය ලේ වම්ම වමමා කපා ගෙනැ පත්ථ සකුණයනට බිලි දෙමි. තා සල්වසල්වා දැන් තා ගේ බඩ වැල් ඇරි ගෙනැ පක්ෂීනට දෙමි. තා ගේ පඤ්ච මධුර මාංසයෙන් හා හෘදය ලෙහෙයෙන් දෙව්යනට බිලි දෙමි. දැන් තා ගේ ඇඟ මස් තෙල බල්ලනට ලා කවමි. වහා ගසින් බසුව" සි කී යැ.

59. බමුණු මරණ භයින් භය පත් වැ, අනෙක් වදනා තැනක් නැත්තෙන්, මහ හඬින් හඬා, "මොරුවක් කියා මා මුන් අතින් ගැලැවුණ මැනැවැ" සි සිතා කියන්නේ, "මා එ සේ මෙ සේ මැරියැ නො හැක්කැ. මම සඳ මහ රජු ගේ දූතයෙක්මි, මඳ වරදකුත් නැත්තෙමි. මා දිවි නොගෙනැ මඳ ඇසිල්ලක් මා ගේ බස් අසව. සඳ මහ රජ්ජුරුවන් හා සිවි රටැ වැස්සන් හා සැදුහැයෙන් වෙස්සන්තර රජ්ජුරුවන් කරා හිය මැනැවැසි කී හෙයින්, එක් වන් බිසොවුන් වලප්නා හෙයින්, මවු පිය දෙ දෙනා ගේ ශෝක බලවත් හෙයින්, 'වංක ගිරි පර්වතයට ගොස් වෙස්සන්තර රජ්ජුරුවන් ගේ සුව දුක් හා සචරූප දන්නා පිණිසැ හා යව'සි සඳ මහ රජ්ජුරුවන් ගේ මෙහෙවරින් ආමි" සි කී යැ.

60. එ බස් අසා වැදි පුත් සතුටු වැ, යමයන් සේ වටැ ලා ගත් බල්ලන් ගස්වලැ බැඳැ, ජූජක බමුණා ගසින් බස්වා ගෙනැ, අතුරෙහි පැලැහැ මස් හා මී හා මිහිරි ආහාර කවා ගමන් ශ්‍රම දුහ නිවා සතප්පා, යන්නට නික්මුණු කලැ, මහට පිරුණා වූ මී ලබුවක්

හා මුව මස් පිඬියක් හා දී, පසු ගමන් කොටැ, දකුණ'ත ඔසවා බෝ සතාණන් වහන්සේ වසන දිශාවට මඟ කියන්නේ, "බමුණ, තෙල දිය වලා කඩක් සේ පෙනෙන්නේ ගඳමඟන් පව්ව යැ. ඒ ගල් පයතැ කිහිරි කුඹුක්, නුග, අැසටු, කෙළිඳ, ගිවුදු, බෙලි, අඹ, දඹ, බක්මී, කොහෙල්, කටු, එරමිණිය, නඳුන්, සඳුන්, හා, පනා, සපුදුනුකේ, සල්, සලළ, අගරු, දෙව් දුරැ ආදි මල් පල්ලෙන් සැදුණේ යැ. හැලි ගසා දිවෙන ගං හෝ ආදියෙන් ගැවැසී ගත්, ලිය කිඳුරනට කුරව් කෙවිල්ලනට ගෙයක් බඳු වූ සිත් කලු වූ ගල් කුළින් රමණීය වූ ඒ වනයෙන් ඵලාඵල කඩා කමින්, ගඩා වැහිරෙන නොයෙක් ඇළ දෙළවලැ සිහිල් දියෙන් නාමින්, පැන් බොමින්, සැතැපෙමින්-එ තැනින් ඔබෙහි හිය කලැ පස් පියුමෙන් සැදුම් ලත් පොකුණෙක් අැති-ඒ පොකුණේ නෙළුම් පත් පිටැ වහුළ මල් රෙහෙණුයේ ශක්‍රයා පරයන පොකුරු මී කමින් ගොස් මඟැ ලැගැ-රාක්ෂසයන් විසින් ගහන වූ විපුල නම් පර්වතයෙක් අැති-ඒ පර්වතයේ අව්චුත නම් තපස්වී කෙනෙක් අැති-ඒ තපස්වීන් වසන පන් සලට වැදූ සැතැපී, උන් ගෙන් මඟැ පිළිවිසැ ගනුව"යි සුළු වනය විස්තර කොවැ මඟ කී යැ.

61. බමුණු උන් කී පරිද්දෙන් මැ ගොස්, තපස්වීන් වසන පන් සලට ගොස්, තපස්වීන් දැකැ, සුව දුක් විචාරන්නේ, "සුව දුක් කෙසේ ද? මැසි මදුරුවන් ගෙන් දුක් නැද්ද? දිවියන් වගුන් වලසුන් සිංහයන් ගෙන් උපද්‍රව නැද්ද? ඵලාඵල ලැබේ ද?"යි විචාරා සිටියේ යැ. එ කලැ තපස්වී කියන්නේ, "තා කී දේවලින් මට කිසි දුකෙක් නැති. ඵලාඵලාදිය ලැබෙයි" කියා, ඔහු ගේ ගමන් ශ්‍රම දහ නිවා, ඵලාඵල කවා, සැතැපී උන් කලැ, "බමුණ, මේ වනාන්තරයට කුමක් සඳහා අවු ද?"යි විචාළේ යැ. බමුණු කියන්නේ, "වෙස්සන්තර රජ්ජුරුවන් කරා ආමි"යි කී යැ. එ විටැ තාපස තෙමේ කියන්නේ, "රාජ්‍යය හැරැ විත් වනයෙහි තපස් කොටැ

වසන **වේස්සන්තර** රජු හට ඛන ධානාදි භෝග සම්පත්තියෙක් නැති. එ බැවින් දුක් පත් වූ රජ්ජුරුවන් කරා තෙපි කුමක් නිසා යවු දැ?"යි අසුයේ යැ. බමුණු කියන්නේ "තාපසයෙනි, වසතු සඳහා ආයෙමි නොවමි. **වෙස්සන්තර** රජ්ජුරුවන් බාල කලැ උන් අකුරු කැරැවීමි. උන් මා නොදන්නේ දැන් සත් මසෙක් වියැ; බලාපියනු සඳහා ආමි"යි කී යැ.

62. මේ සේ කියා, එ දවස් එහි මැ ලැගැ පාන් වූ කලැ, තපස්වී බොරු නොදන්නා හෙයින්, "මූ කීයේ සැබෑ දෙහෝ"යි සිතා මහ පාන්නේ, "බමුණ, මෙ සේ ගිය කලැ, දකුණ'ත් හසරින් **වංකගිරි** පර්වතයට ගොස් සිවුරස් පොකුණට ගිය කලැ, ඒ පොකුණ පස් පියුමෙන් සැදුණේ යැ. ඒ පොකුණ සිසාරා අඹ, දඹ, කීන, කුඹුක් ආදි රුක්වලින් සජ්ජිත යැ. නිල් මහ මෙ නැඟි කලැ වලා කඩක් බබළන්නා වැන්නැ. එ තැනැ සුළඟින් පැහැරී සඳු බිඳි නිබෙන මල් හිස, බමරුන් පිය පහරින් නිති වැහිරෙන මල් මුවරඳින් යුක්ත යැ. මල් සෙසුරු කඩා කට පුරා කා මත් වැ කුල්නා කෙවිල්ලන් අැති, ඒ පර්වත ඝිබරයෙහි ලිය ගී නහා නටන ලිය කිඳුරන් අැති. ඒ ඒ දෙළ හැලි ලිය මඩුයෙහි රිසි සේ හැසිරෙන විදාාධරයන් අැති, රන් ගිරි කුළු මුදුනැ. මුළු මුට්ටු වැ නටනා මත් මොනර කැලන් අැති, පවිතෝපම වූ නොයෙක් අැත් කැල යැ. තොලින් තොල තබා ඔවුනොවුන් සනහසනහා යන නොයෙක් මුව රළ යැ. ඒ ඒ තැනැ විලිස්සැ තිබෙන අැත් දළ සා ගෙඩි අැති කෙහෙල් වනය යැ. මා දිය කළ සා ගෙඩි අැති කොස් වනය යැ. විලිස්සැ වැහිරෙන මී අැති මී අඹ වනය යැ. පුවක් දඹු සා දඹු අැති උක් වනය යැ. බමුණ, තා මේ වනයට වැදී, කැමැති කැමැති ඵලාඵල අනුභව කෙරෙමින් සැතැපෙමින් ගොස්, වංකගිරි පර්වත සමීපයෙහි පන් සලට වැදී **වෙස්සන්තර** රජ්ජුරුවන් දකුව"යි කී හ.

63. බමුණු ඒ අසා සතුටු වෑ, තුන් වටක් තපස්-වීන් වැඳැ සමු ගෙනැ, කී කී ලකුණු බලබලා ගොස්, සතරැස් පොකුණ ද වනය ද දැකැ, ඒ වනයෙහි එක් ගිරි ගුහාවක් දැකැ සිතන්නේ, "මේ වේලෙහි නීසවු වෙසතුරු රජ්ජුරුවන් වන මුල් ඵලාඵල ගෙනැ ඇරැ වළඳවති. සඤ්ඤු නම් දනට බාධා කරන්නාහු යැ. එ හෙයින් කුමාර වරුන් දන් ලබා පියන්නට නො දෙති. එ බැවින් මේ ගුහායෙහි අද ලැගැ, සෙට උදැසනැ මද්‍රී දේවීන් ඵලාඵල සොයා ගිය කලැ, දරුවන් දන් ගනිමි" සි සිතා එ දු රැ ඒ ගුහායෙහි ලැගුම් ගත්තේ යැ.

13. ජූජකයා දරුවන් ඉල්ලීම.

64. එ දවස් මද්‍රී දේවී පාන් වන වේලෙහි නපුරු සුපිනයක් දැකැ භය පත් වැ හිඳැ, "මේ මුළු පොළොවැ වෙසසනතර රජ්ජුරුවන් හා සමාන සුපින දන්නාහු නැතැ" සි සිතා, බෝ සතාණන් වහන්සේ ගේ පස් සල් මළුයෙහි පියවර සත් කොටැ සිටි කලැ, බෝධි සත්වයෝ "දෙරැ කවුරු දැ?" සි විචාළ හ. "වහන්ස, මම යැ" සි කීවා යැ. "දේවිනි, මා කරා නො වේලේ නො එන්නට වර ලද්දෙම් වේ දැ?" සි කී හ. දේවී කියන්නී, "සුවාමීනි, ක්ලේශ වශයෙන් අන්‍යතර සිතෙකින් ආයෙම් නො වමි. මා දුටු සුපිනය කියන්නට ආමි" සි කිව. මහ බෝ සතාණෝ "කියව" සි වදාළ හ. මද්‍රී දේවී කියන්නී, "සුවාමීනි, එක් කළු මිනිසෙක් කසා පිළි දෙකක් හැඳි, දෙ කනැ රත් මල් පැළඳි, ගෙනැ, කඹුවක් ඉස සිසාරමින් මා කරා අවුත්, මට නොයෙක් තුඩ වැඩි බස් බැණැ, මා හිස ජටාව අල්ලා ගෙනැ, ඇදී, උඩු කුරු කොටැ බිම් හෙළා ගෙනැ, මා හඬවහඬවා මා ගේ දැස උදුරා ගෙනැ, දැතත් කපා ගෙනැ, ළය පළා ලේ පෙරපෙරා හෘදය මාංශය උදුරා ගෙනැ ගියේ වනැ" සි කීවා යැ. බෝ සතාණෝ සිනය අසා සිතන්නාහු, "මා ගේ සත් මසක් පිරිහී ගියා වූ දැන පාරමිතාව සම්පූර්ණ වෙති" සි සතුටු වැ, "දරුවන්

දෙන්නා ගෙනැ යන්නට බමුණකු ආයේ වනැ"සි සිතා, බිසොවුනට කියන්නාහු, "දේවිනි, තෙපි මියුරු ආහාර වළඳා සුව යහනැ වැදැ හොතුව. තොප දැන් ඵලාඵල වළඳා සුව යහන් නොලදින් දඩු මැස්සෙහි හෝනෙන් පෙනෙන සීනැ" සි කියා බිසොවුන් සන්හිදුවා යැවූ දා යැ.

65. පාන් වූ කලැ මද්‍රී දේවි මළුව හැමැදැ, දුහැවි පැන් තබා, මල් පුදා, දරු දෙදෙනා කැඳවා වැලැඳැ ගෙනැ මූණෙහි මූණ තබා සිඹැ සනහා, "දරුවෙනි, මා රැ දුටු සිනය නපුරැ, තල බිජුවක් සාත් යහ පතෙක් නැති. තොප පියාණන් අැළයෙන් බැහැරැ නොයව"සි ඔවා දී, බෝ සතාණන් කරා ගොස් වැඳැ නැඟී සිටැ, "සාමිනි, මේ වනයේ මට නැයෝ නම් නුඹ හා මේ දරු දෙ බිහින්නෝ ද යැ. සාමිනි, මම වන ඵලාඵල සොයා යෙමි. මා ගේ දරු දෙ බිහින්නන් කෙරෙහි අප්‍රමාද වුව මැනැවැ. නුඹ වහන්සේත් සිහි අැති වැ හුන මැනැවැ. මා යන බව මුත් මා ගේ ළය මුබැ බව දැනැ වදාළ මැනැවැ"සි කියා, දරු දෙ දෙනා පාවා දී, මල් කරුව හා පෙට්ටිය ද අැරැ ගෙනැ, වන මුල් වන ඵලාඵල සොයා යන්නී, හඬමින් වලපිමින් "වන දෙවියෙනි, මා ගේ දරුවන් රක්‍ෂා කරවු. මා කම් කිළිය ගේ එකලා කම බලව"සි දෙවියන් යදිමින් ගියා යැ.

66. බෝධි සත්ත්වයෝ බිසොවුන් වලට යා දී, සත්මත් මළුයෙහි කෙළවරැ බමුණා එන පෙර මහැ බලබලා උන් හ. දරුවෝ දෙදෙන බෝධි සත්ත්වයන්. ඉදිරියේ වැළී කෙළැ කෙළැ උන් හ. ඉක්බිති බමුණු මද්‍රී දේවීන් ඵලාඵලයට යන වේලා යැ සි උන් වලැ සිටැ නොඑන තුරු ගොස්, "දරුවන් ඉල්ලා ගනිමි"සි සිතා පත් සලට ගියේ යැ. බෝධි සත්ත්වයන් එන්නා වූ බමුණා දුරැ දී මැ දැකැ, "සත් මසක් මුළුල්ලෙහි බහා තබන ලද දැන පාරමිතා නමැති ධුරය නහා සිටුවන්නට මෙන් එන කල්‍යාණ මිත්‍රයෙකැ;

සුළු වනය පසලොස් යොදනක් හා මහ වනය පසලොස් යොදනක් හා ඇතුළු වැ තිස් යොදුන් මඟ ගෙවා බමුණු නිකමට නො එන්නේය. දරුවන් දන් ඉල්ලා ආයේ වනැ'' යි සිතා සතුටු වූ නියාව, දරුවන් කෙරෙහි කළ ප්‍රේමයටත් වැඩි වැ සිටියේ ය.

67. මහ බෝ සතාණෝ ජාලි කුමාරයන් කැඳවා කියන්නාහු, ''කුමාරයෙනි, පෙර මඟට ගොස් බමුණා අතැ කෙණ්ඩිය පිරිකර අැරැ ගෙනැ නඹව''යි කියා ඉදිරියට යැවූ හ. ජාලි කුමාරයෝ සතුටු වැ ගොස් කෙණ්ඩිකාවට අත දික් කළ හ. බමුණු සිතන්නේ, ''මු වෙස්සන්තර රජ්ජුරුවන් මට දන් දෙන දරුවෝ ය'' යි සිතා, ''දැන් මා මුනට මොලොක් වුව මහාත් මතුවට මෙහෙ නො කෙරෙති. දැන් මැ මුන් භය ගන්වා ලමි'' යි සිතා උරණ වැ කුමාරයන් මුහුණ බැලී ය. ජාලි කුමාරයෝ භය ගෙනැ පලා අවුත් බෝධි සත්ත්වයන් ළඟට වන් හ.

68. උන් පසු පස්සෙහි බමුණු ඇවිත්, බෝධි සත්ත්වයන් දැකැ සතුති කොට අසන්නේ, ''ශ්‍රීමත්නි, තොප ශරීරයට සැප ද? මැසි මදුරුවන්, සිංහ ව්‍යාඝ්‍රයන්, යක්ෂ ප්‍රේතයන් ගෙන් දුක් නැද්ද? වන මුල් ඵලාඵල ලැබේ ද? තපසට අන්තරාය නැද්ද? දනට බාධා නැද්ද?'' යි අැසී ය. ඒ අසා බෝධි සත්ත්වයෝ කියන්නාහු, ''බමුණ, තා කී මෙ තෙක් දෙයින් දුක් නැති. තපසට අන්තරාය නැති. දනට බාධා නැති. පින්වත, තා ගේ ශ්‍රම දහ නිවා-තෙල අඹ දඹ කෙහෙල් කටු එරමිණිය මීයේ රස වැන්නැ – ඒ ඵලාඵල කා පැන් බී සැතැපී ඉඳුව'' යි වදාළ හ. බමුණු කී ලෙස මැ ඵලාඵල කා පැන් බී සැතැපී උන් කලට මහ බෝ සතාණෝ, ''තා අා කරුණු කිම් ද?'' යි බමුණා විචාළ හ. බමුණු කියන්නේ, ''මහා පුරුෂය, ඔබ සේ පඬිවු මහා ගංගායෙහි ජල ස්කන්ධය කෙතෙක් දෙන ඇද්ද බී පුවත් සඳ මැ ක්ෂය නො වේ ද; එ මෙන් ශ්‍රද්ධා ජලයෙන් පිරු-

ණා වූ, සියලු යාචකයන් ගේ සිත් පුරන උත්තමයකු වූ, නුඹ වහන්සේ ළඟට අනෙක් වැඩි කට යුත්තකට ආපසුම නොවමි. ඔබ ගේ දරු දෙ දෙනා ඉල්ලා ආමි" සි කී සැ.

69. මෙ සැපැ බුදු වන්නා වූ, ලොවට වැඩක් මැ සිතන්නා වූ ඒ මහතාණන් වහන්සේ බමුණා කී බස් අසා, දරුවන් මුහුණ බලා, බමුණා ගේ ද මුහුණ බලා, වලට හිස බිසොවුන් සිහි කොටැ, සිතැ උපන් දළ සෝ හිනි නිවා වදුරා, දන් දීමෙහි එස් සිත් වූ සේකැ. එ ද එසේ නොසිතූ සේක් නම්, මහ බෝමැඩැ වජ්‍රාසනයෙහි හිදැ මාර සෙනඟ ප්‍රලය කොටැ කෙසේ නම් බුදු වන සේක් ද? මෙ සසර අවුලෙහි බැඳුණු සත්ත්වයෝ කා මුණ බලා ගැලැවෙද්ද? මේ සත්ත්වයන් නිවන් පුර යවන්නෝ කවුරැ ද? එ ද ඒ දරුවන් දන් දීමෙහි පසු බට වූ නම්, බුදු වූ මහතාණන් කරා මෙහෙයා ලූ **හිමේඛල** නම් පරැම ඇත් ශ්‍රී පාදය වැඳැ කෙසේ නම් හොවී ද? ඝෝර වූ යමහු වැනි වූ **ආලවක** නම් යක්ෂයා කුමකට බිදිනැමි ශ්‍රී පාදය වැඳැ ළහාවී ද? එ ද දරුවන් දන් දීමෙහි මසුරු වූ නම්, මිනී මැරූ **අංගුලිමාලයා** දුන් තමන් සස්නෙහි කුමට කුල ගැනි වේ ද? **දේවදත්ත** සාවිරයන් හිසට පෙරැළූ ගල පොළොවින් ගල් දෙකෙක් මැවී කුමට පිළි ගනී ද? තව ද **මහ මේර** සත් දරණ පටෙකින් වෙළා ගෙනැ, තමන් වහන්සේට කිපි විෂ තේජසින් දිලියෙන්නා වූ **නන්දෝපනන්ද** නම් නාග රාජයා කෙසේ නම් හික්මවන සේක් ද? ඒ දරුවනට ස්නේහ ඇති වැ දන් දීමෙහි පමා වූ නම් දෙව් ලොවැ දෙවියනට අධිපති වූ **ශක්‍ර දේවේන්ද්‍රයෝ** තමන් ගේ එස් සිය විසි රියන් ජයතුරා සක තුඩ පොපියන තෙක් කුමකට පිඹී ද? බ්‍රහ්ම තේජසින් දිලියෙන්නා වූ **මහා බ්‍රහ්මයා** සවාමි දරුවන් ගේ මසහකයට තමා ගේ ධවලච්ඡත්‍රය ධරා කුමකට සිටී ද? එ ද "ඒ දරුවන් නොදෙමි" සි ඒ බමුණු යැවූ නම්, පස් වා දහසක් කල් මුළුල්ලෙහි නිවන් පුර දෙර හැරී තබා, තමන්

පිරිනිවන් පෑ දවස් ශ්‍රී ශරීරයෙන් දැ ගිය අස්ථිනට ද, වැළැඳූ පාත්‍රයට ද, පිටි වහල් වූ ශ්‍රී මහා බෝධියට ද, තමන් වදහළ දහමට ද, වැඳැ පිදූ සියලු මිනිසුන් ද දෙව් බඹුන් ද කෙ සේ නම් නිවන් පුර පිහිටුවන සේක් ද? එ සේ වී නම්, මේ සියල්ල මැ නො සිදු වන්නේ යැ, නො හැකි වන්නේ යැ.

14. දරුවන් දන් දීම.

70. මෙ සේ "දරුවන් දන් දෙමි" යි එක් සිත් වූ මහ බෝ සතාණෝ, "දරු දෙ දෙනා ඉල්ලමි" යි කී බමුණා ගේ බසට තම හට "රාජ්‍යය පාවා දී වොටුනු පළඳවමි" යි කී බසට සෙයින් සතුටු වැ කියන්නාහු, "බමුණ, තෝ මට පර ලොවැ අමුත්තෙකැ. තා සේ මට මිත්‍රයෙක් නැති. සෙසු යාචකයෝ ඉල්ලත් නම්, අතකු හෝ ඉල්ලති, අසකු හෝ ඉල්ලති. මේ මහ වලට අවුත් අනෙක් දෙයක් නො ඉල්ලා අප ගේ දරුවන් ඉල්ලූ බව ඉතා යහ පතැ. එය වැළැකීමක් සිහිනෙනුත් නො සිතමි. දරුවන් තට සම සිතින් පාවා දෙමි. බල, එකක් කියමි. බමුණ, මේ ළඳ බොළඳ කුමාරයෝ කිසි දුකක් නො දුටු විරූ යැ. දැන් මැ දරුවන් දෙමි. උන් ගෙනැ ගියෙහි වී නම් සා විඩා වෙති. එ සේ හෙයින් බිසොවුන් වල් ගොස් අවුදින් දරුවන් දෙ දෙනා නාවා, වන මුල් ඵලාඵල කවා වැලැඳැ ගෙනැ, ළඳ බොළඳ සුරතල් බස් අසඅසා ඇවිලෙන ගිනි නිවා සැනැහුණ කලැ, අද රෑ මෙහි ලැගැ, සෙට දරුවන් දෙ දෙනා ගෙනැ යව. තවද ඒ දරුවන් ගේ මෑණියෝ දරුවන් අපට පාවා දී එකලා වැ වල් ගියෝ යැ. ඵලාඵල ගෙන'වුත් දරු දෙ දෙනා නුදුටු නම්, උන් ළය පැළී යෙති යි සිතමි. මා ගේ ඉෂ්ට මිත්‍ර වූ බමුණ, තට ගැති වන් මේ දරුවෝ දෙ දෙන ඉතා සිවුමැල්ලෝ යැ. රජ කුමරුවෝ ගැති මෙහෙයේ නො හසළ විරූ යැ. තදින් මොළොකින් මෙහෙ උගත්වා ගෙනැ ගැති මෙහෙ කම් ගනුව. අද මේ මේ වේලාවට හැමෙව" යි වදළ සේකැ.

71. එ බස් ඇසූ බමුණු කියන්නේ, "රජ්ජුරුවෙනි, සත්‍රිඝ නම් දනට බාධා කරන සුල්ල හ, ගුහ කම්මන්ත නො දනිති. අද මම මෙහි ලඟනට නො පොහොසතිමි. දරුවන් දන් දෙවු නම්, මට කල් නො යවා දැන් මැ දෙව. නො දෙවු නම්, මම නැඟී යෙමි" යි කී යැ. එ බස් අසා බෝධි සත්ත්වයෝ බමුණාට කියන්නාහු, "දරුවන් දෙමි සි කියා ලා නො දෙමි සි නො කියමි. දනට පසු බස්නා සිතෙකින් නො වෙයි. බිසොවුන් එන තුරු නො හැම්මෙහි නම්, මේ සිවු මැලි දරුවන් මහ නළුවනළුවා සතපසතපා අස්වසමින් කැඳවා ගෙනැ සිවි රටට යව. ගොස් මා දරුවන් මුත්තණු වූ සඳ මහ රජ්ජුරුවනට මෙ පවත් කී කලැ, ම පියාණන් වහන්සේ අප කෙරේ කළ ප්‍රේමයෙන් මුනුබුරන් දුටු සතුටින් බවුන් ගේ මිහිරි බස් අසමින් මැ තට කෙළිකොල්ලන් හා බොහෝ වසතු ද දෙති" යි කී හ. එ බස් අසා බමුණු ඉස සලසලා කියන්නේ, "යහ පතැ, අප දිවි ගන්නට සිතූ නියාව? රජ්ජුරුවෙනි, තෙපි මේ උපායය කෙසේ උගතු ද? මුනුබුරන් දුටු සඳ මහ රජ්ජුරුවෝ මට ණයටි කියති. 'බමුණ, තෝ අප මුනුබුරන් ගැනි කොවැ ගෙනැ එසි දැ?' සි කියමින් අත් පා ඇන් නාසා කපා දිවි ගණිති. එහෙල් තබා දිවි රැකැ ගනුත් යහ පතැ. තෙපි දරුවන් දෙවු නම් දෙව, නො දෙවු නම් නො දෙව. තෙල බස් අප රකුත් හොත් නො කියව" සි කීයැ.

72. දරුවෝ බමුණා කියන බස් ද, පිය රජ්ජුරුවන් වහන්සේ තමන් දෙ බිහිත්නන් "එහෙල් කොටැ දෙමි" සි කියන බස් ද අසමින් භය පත් වැ සිටැ ගත නො හී, දිවියන් දැකැ මරණ භයින් දිවෙන මුව පොල්ලන් දෙන්නකු සේ ඉඟි කැරි ලා ඉගිළැ, "බමුණු ලුහුබඳවා එන්නේ යැ" සි ආ පසු බලමින් දිවෙන්නාහු, පන් සල පිටි පස්සේ වැදී, භයින් එ තැනැ ද සිටැ ගත නො හී වන ළැහැබකට වැදී, සැඟවුණාහු යැ. බැලුබැලූ දිශායෙහි බමුණා දිවැ එන්නා සේ පෙනෙන්නේ යැ.

ඒ තැනත් නොසිටැ, "අනේ නගඹ, කුමක් කරමේ ද?" සි කියමින් ඇටු වැලිත් හිරී ගෙනැ, අඬා දිවෙන්නාහු, සතරැස් පොකුණට වැද්ද, "අැපි ඔවුනොවුන් සැඟවුණු තැන් නොපාමි හ" සි බැණැ ගෙනැ, ඔවුනොවුන් අැඟැ එල්බැ ගෙනැ, පොකුණැ කර වටක් දියව බැසැ, නෙළුම් පතින් හිස් වසා ගෙනැ, සැඟැවී සිටැ, කන් දී සොල්මන් අස-අසා, "මැණියන් ද, 'ජයේ රිදුටු සිනය නපුරැ' සි කී ද යැ. මැණියෝ 'පියාණන් හැරි බැහැරකට නොයව' සි කිවු යැ. පියාණනව අප බලන්නට පාවා දී ගියෝ යැ. මැණියෝ අප වැලි කෙළිති සි සිතද්දෝ? මෙ වැනි දුක් වූ බව නොදනිද්දෙහෝ? මේ වනැ දෙවියෙනි, තෙපි අප දෙ දෙනා රැකැ, වහා දිවැ ගොස්, මැණියනට කියවු. මැණියන් දැකැ උන් ද පිටැ සී හඬා පියා, උන් ද කීවා කරම් හ" සි මෙ සේ බැගැ පත් වැ හඬ-හඬා වෙවුලමින් කර වටක් දියෙහි සැඟැවී සිටිය හ.

73. බෝධි සත්ත්වයෝ දරුවන් සැඟැවුණු බව නොදැනැ, "බමුණාට දන් දෙන්නට යැ" සි දරුවන් කැඳැවූ හ. දරුවන් නොබිණූ හෙයින් බමුණු කියන්නේ, "වෙස්සන්තර රජ්ජුරුවෙනි, තොප සේ බොරු දන්නෝ මේ මුළු රටැ නැති. තෙපි දරුවනව ඉඟි ලා ලා සඟවා ලා නොදන්නා වන් වැ හිඳැ, දරුවන් කැඳවා ද? මේ තන් වැසි දන් දෙන තොප සේ වූ බොරු කෙනකුන් හුදුටු විරිමි" සි කී යැ. ඉක්බිති බෝධි සත්ත්වයෝ, "බොරු කීව" සි යන බසට ලජ්ජා වැ කියන්නාහු, "බමුණ මා දන් සොඬ හෙයින් ද, මැණියන් තමන් දෙ දෙනා නොදක්නා හෙයින් ද, නා ගේ රළු කම් සිතා භය පත් වැ පැලැ වන් හ. බමුණ, නා මදක් හැමෙව" සි කියා නැඟී සිටැ, පත් සල පිටි පසට ගොස් වන ලැහැබට බැසැ, එහි නොදැකැ, දරුවන් ගේ පිය සලකුණින් පොකුණට ගොස් වන් බව දැනැ ලා, මෙ කපැ බුදු වන සියලු පොළොවට ශාන්ති එළවන ඒ මහතාණෝ, ළයැ දුක් වාවා ගෙනැ හඬ ගානාහු, "ම පුතණුවෙනි,

ජාලි කුමාරයෙනි'' යි හඬ ගෑ හ. බුදු වන ජාතියෙහි රහල් කුමර වන මහ පින් ඇති ඒ ජාලි කුමාරයෝ පිය රජ්ජුරුවන් හඬ අසමින්, ''බමුණා මා දිවි ගනී වා, මා ඇති කෙරේ වා. ම පියාණන් වහන්සේ හඬ ගෑ හඬ අසා නො සිටිමි'' යි සිතා, ''පියාණෙනි'' යි කියමින් හිස වසා ගෙනැ සිටි නෙළුම් පත් දුනින් පිරා ගෙනැ දිවැ අවුත්, පියාණන් දකුණු පය ගෙනැ හඬන්නට වන් හ.

74. බෝධි සත්ත්වයෝ පුතණුවන් ගේ බැගෑ පත් හඬ අසා කම්පා වැ සිත සන්සිඳුවා ගෙනැ, ''පුත, තොප ගේ නැහණියෝ කොසි ද?'' යි විචාළ හ. ජාලි කුමාරයෝ, ''නො කියමිහ'' යි පළමු දෙන්නා බැණැ ගත් හෙයින්, ''පියාණන් වහන්ස, හයින් පලා යන මෘග ජාතිහු උනුනට කියා පලා යෙද්ද? අපට වූ දැ එ ඔන්දෙක් මැ යැ'' යි කී හ. ඒ අසා බෝධි සත්ත්වයෝ ''මා ගේ දියණියෙනි, කෘෂ්ණාජිනාවෙනි'' යි හඬ ගෑ හ. බුදු වන ජාතියෙහි තමන් සස්නෙහි උපුල්වන් මහා සාවිරි යැ යි ප්‍රසිද්ධ වන මහ පිනැති ඒ දියණියෝ පියාණන් හඬ ගෑ හඬ අසා, ''බමුණා අප දිවි ගනී වා! ම පියාණන් වහන්සේ හඬ ගෑ හඬ අසා සිටිම් ද?'' යි සිතා නෙළුම් පත් හැරී පියා දෙවි දුවක මෙන් අවුත්, බෝධි සත්ත්වයන් වම් පය වැලැඳැ ගෙනැ හඬන්නට පටන් ගත් හ.

75. දරුවන් දෙ දෙනා හඬා වගුළ කඳුළු බෝධි සත්ත්වයන් ගේ පිපි පියුම් වැනි දෙ පත්ලෙහි වැහිරෙයි. බෝ සතාණන් වහන්සේ දරුවන් ගේ දුක් බලා හඬන්නා වූ කඳුළු රන් පිටාටු වැනි දරු දෙ බිහින්නන් පිටැ වැහිරෙයි. මෙ සේ හඬා සැනැසී සිතන්නාහු, ''මා හඬා ශෝක වීමෙන් බුදු බව නො සෑදෙයි. දරුවන් බමුණාට දෙමි'' යි සිතා, හඬමින් හොත් දෙ දරුවන් නහා සිටුවා, ලෙහි හොවා ගෙනැ සිඹැ සනහා පියා, ''මන හර වූ මා ගේ දරුවෙනි, මා දන් සොඬ බව නො දනු ද? මේ සංසාර සාගරයට තොප පසුරු කොටැ

ගෙනෑ, මම එ තෙර වෑ ගොඩ දකිමි. මම ගොඩ දූකෑ, තොප ඇතුළු වූ දෙව් බඹ මිනිසුන් සහිත ලෝකයාට ගොඩ දක්වා ලමි. දරුවෙනි, මා ගේ දූන පාරමිතා-ධ්‍යාශය මඝනක ප්‍රාප්ත කොටෑ වූව මැනැවැ" සි අස්-වසා ලමින්, පුතඬ, තෙපි නිදහස් වනු කැමැත්තහු වූ නම්, බමුණාට නික් දහසක් දෙමින් නිදහස් වුව මැනැවැ. තොප නැඟණියන් නිදහස් කොටෑ ගන්නා කැමැත්තහු වූ නම්, බමුණු හට දාසයන් සියයක් ද, දාසීන් සියයක් ද, ඇතුන් සියයක් ද, අසුන් සියයක් ද, වෘෂභයන් සියයක් ද, නික් සියයක් ද, යනාදියෙන් සියයක් බැගින් දී නිදහස් කොටෑ ගනුව" සි කියා දෙ දෙනා වටනා මිල කොටෑ, පන් සලට කැඳවා ගෙන-'වුත්, බමුණා කැඳවා, කුමාර වරුන් ගේ අත් ගෙනෑ කෙණ්ඩිකායෙන් බමුණා අතැ පැන් වත්කොටෑ, "සිත් කලු මේ දරුවන් දෙ දෙනා දන් දුන් පින් කමින් සවි නේ ගෙවා ලොවුතුරා සම්මා සම්බෝධියට පැමිණෙම් වා" සි කියා ප්‍රාර්ථනා කොටෑ, දරුවන් ගේ අත් ගෙනෑ බමුණා අතැ තබා දන් දුන් හ.

76. මෙ සේ දරුවන් දන් දෙත් මෑ, ලය කකියවා භඬන පඤ්ඤ පාත මිඹියක සේ මහ පොළොව කම්පිත වෑ නටන්නට වනෑ. මහාමේරු පර්වතය ද සප්ත කුල පර්වතයෝ ද දරුවන් දන් දුන් ශෝකයෙන් හඬන්නා සේ ඔවුනොවුන් ඇඟෑ ගැසෙමින් සතුටු වෑ නටන්නට වන් හ. සුවාසූ දහසක් යොදුන් ගම්භීර සාගරය තමා ගේ රළ නමැති අතින් සත් රුවන් ඉසෑ ඉසෑ සොම්නසින් සැලෙන්නට වනෑ. දෙවියෝ සතුටු වෑ සාධු කාර දී මල් වැසි වැස්සූ හ. මහ බෝ සතාණෝ "මා විසින් මන හර දනෙක් දෙන ලද. ඒ ඉතා ආශ්චර්ය" සි ප්‍රීති උපදවා කුමරුවන් බලමින් සිටියා හ.

15. ජාලි – කෘෂ්ණාජිනාවත් ජූජකයා සමඟ යෑම.

77. ජූජක බමුණා ද වන ළැහැබට පිවිසෑ, දතින් වැලස් කඩා ගෙන්වූත්, ජාලි කුමාරයන් ගේ දකුණත ගෙනෑ කුමාරිය ගේ වමත හා එකට බැඳෑ, එමෑ වැල් කෙළවරින් තළමින් ගෙනෑ ගියේ යෑ. ඒ දරුවන් සිරුරුවලෑ ගැසුගැසූ තැනෑ සම් ඉගිලෑ ලේ වැගිරෙයි. බෑයන් පිටෑ ගැසූ පහර නැඟණියෝ පිටෑ ලවා ගනිති. නැඟණියන් පිටෑ ගැසූ පහර බෑයෝ පිට ලවා ගනිති. මෙ සේ දරුවන් රැගෙනෑ යෙමින් සිටි බමුණා සෙලෙකින් බස්නේ සෙලින් පැකිලෑ මුණින් වැටී හිණ.

78. බමුණා නො නැඟී සිටිනා තෙක් මෑ දරුවෝ දෙ දෙන ගැලෑවී දිවෑ ගෙනෑ අවුත් පත් සලට වැදී, බෝධි සත්වයන් දෙ පත්ලෙහි හිස තබා ගෙනෑ හඬා කියන්නාහු, "සාමිනි, අම්මා නපුරු සිනයක් දැකෑ නුඹ වහන්සේට අප පාවා දී එකලා වෑ වල් යන්නවුන් කී බසට නුඹ මෑ දෙස් නො වෙයි ද? පියාණෙනි, ඒ සිහි නැද්ද? අප නුදුටු අම්මා ගේ ළය කෙ සේ නම් වෑවේ ද? අම්මා ආ කලෑ උන් වැඳෑ අඬා අප ගේ දුක් පෑ පියන තුරු අප රැකෑ ගත්තෑ. අපි නුඹ හැරී පියා ගොස් හැම්මියෑ හෙමෝ ද? පියාණෙනි, ඒ අවලක්ෂණ බමුණාට අප දන් නො දී අනෙක් බමුණකුට දෙන්නෑ. මූ ගේ පා බකල යෑ, නිය පිරිති යෑ, යටට හිලිහී ගිය පිණ්ඩික මාංශ ඇත්තේ යෑ, දික් වූ තොල් ඇත්තේ යෑ, කෙළ තොලූ යෑ, දත් බොලූ යෑ, බිඳුණු නාසා ඇත්තේ යෑ, තඹ වත් දැලි රැවුළු ඉසෑ කේ ඇත්තේ යෑ, බඹ මහත යෑ, වමරැසි යෑ, බළල් ඇස් වැනි ඇස් ඇත්තේ යෑ, නෑමුණු කත් කොරි යෑ, ඇඟ රැළි ගැසුණේ යෑ, කළු තල කැළැලින් ගැවැසුණ සිරුරු ඇත්තේ යෑ, නෑමුණු සිරුරු ඇත්තේ යෑ, යන එන කලෑ හඬ නැගෙන අසපි සත්ඛින් යුත් සිරුරු ඇත්තේ යෑ, අමනුෂ්‍යයෙකැ, නො හොත් මිනිස් වෙසින් ආ යක්ෂයෙකැ.

මෙ සේ අවලක්ෂණ වූවකුට අප දෙනා දෙන්නැ. දෙනා වැළැක්කැ අප දෙන්නාහු නම්, මා දන් දෙන්නැ. මා ගේ නැඟණියෝ ඉතා සිවුමැලියෝ යැ. තමන් මොළකැටි හෙයින් මිඹි මෙහෙ නො කළ මහති. මම නැඟණියනට වැඩි මහලු හෙයින්, දුක් ගත හැක්කේ වෙමි. උන් කරන මෙහෙත් මම මැ කෙරෙමි. කෘෂ්ණාජිනාවන් මිඹි වූ කලැ, සිව් මහා රාජ වංශයට පරිභව යැ. නැඟණියන් රැක්කැ, මා උනට ගැති කොටැ දුන මැනැවැ. මැණියනට මා දුන් බව කියා නැඟණියන් පැලා බැණැ අස්වසා මැණියන් රැකැ පියන්නැ" යි කියා හැඬූ හ.

79. බෝධි සත්ත්වයෝ මෙ තෙක් දෑ කියතු දු මුවින් නො බැණැ උන් හ. ජාලි කුමාරයෝ කියන්නාහු, "පියාණන් වහන්ස, මෙ තෙක් දෑ මා කියැ දී මුවින් නො බණන දෑ යැ. තුඹ වහන්සේ ගේ ළය ගලෙක් වූයේ යැ, ය පතෙකින් වැසුණේ වනැ. මේ කුමන වරදෙක් දැඩි කමෙක් දෙහෝ? මුවින් නො බැණැ ඉඳිනට කුමන වරදක් කෙළෙම් ද?" යි කී හ. මෙ සේ කියමින් සිටි තැනට නිෂ්ක්‍රීක වූ ඒ බමුණු නරියා තමා හුණු නැනින් එලිඑලී නැඟී සිටැ, දෙ දණැ වැලි පිසැ, හුණු නැනින් වැහිරෙන ලේ දකිමින් පිටි තොල් දත් කමින් යමයකු සේ අවුත් වැදී හියේ යැ. දරුවෝ උඹ දැකැ, භය පත් වැ වෙවුලන්නට පටන් ගත් හ. මෙ සේ සිටි දෙ දරුවන් බෝධි සත්ත්වයන් බලබලා හින්දී දී අල්ලා ගෙනැ හියේ යැ.

80. රාහු විසින් ගලන ලද ද නො වැළැක්කැ යන හිර සඳ මෙන් යෙමින් සිටි දෙ දරුවෝ පෙරැළි පියාණන් බලමින්, පියුම් පෙති වැනි දත් ඉස් මුදුනේ තබා වඳිමින්, "අප ගේ පිටැ වැහිරෙන ලේ බලන්නැ. අප බැඳි බැම්ම බලන්නැ. පියාණෙනි, මුවින් නො බැණැ හිඳිනේ මෙ යකු අප කා මරා පියන තුරැ ද?

මැණියනව කියන කලැ අප වැඳැ සමු ගත් බව කියන්නැ. අප සුව පත් බව ද, නැවැතැ දුක්මක් නැති බව ද කියන්නැ" යි මෙ සේ කියකියා හඬා යෙමින් සිටිය හ.

81. බෝධි සත්වයෝ දරුවන් දෙදෙනාගේ බැගෑ පත් හඬ අසා ළය කකියවා, "අනේ බමුණකු ඉතා දුඩි නියා යැ. මා ගේ ඇස් හමුයෙහි දී මෙ සේ දුඩිවැ මරන කලැ, ඔබෙහි දී තමා කැමැත්තක් නොකෙරේ ද? එන ද අප දෙදෙනා ඔක්කෙන් ආ දරුවෝ දුන් කදු බැවිලි කටු බොරළුයෙහි කෙ සේ යෙද්දෙහෝ? සසින් විඩා වූ දරුවන් කවුරු සනහා කිරි පොවා ලද්දෙහෝ? පතුල් ඉදිමුණ දරුවන් කවුරු සතපා ලද්දෙහෝ? සීත සුළං කා වෙවුලන දරුවන් කවුරු සනහා නළවා ගනිද්දෙහෝ? මැණියන් නන මැඳැ සැතැපුණු දරුවන් අද රෑ කොතැනෙකැ වැදූ හෙවැ නිදද්දෙහෝ? දරුවන් කෙරෙහි ස්නේහයෙන් මා පිටැ හඬා පෙරැළෙන්නා වූ බිසොවුන් කෙ සේ නම් අස්වසන්නෙම් දෙහොත්?" යි සිතා මහත් වූ ශෝකය ධරා ගන්නට නොහැකි වැ, "බමුණා ලුහුබැඳැ ජීවිතය විනාශ කොටැ දරුවන් ගෙනෙමැ" යි සිතා, නැවැතැ, ඒ ක්ෂණයෙහි සිතන්නාහු, "මනා කොටැ සිත් සතුටින් දන් දී තපස් කරන්නාහු සිත් කලකිරුවා ගනිත් ද? පෙරැ උත්තමයෝ ද පළමු කොටැ දස පෙරුමන් ද, දස උපපැරුමන් ද, දස පරමත් පැරුමන් ද පුරා පසේ මහා පරිත්‍යාගය කොටැ බුදු වූ හ. මම ද එ සේ බුදු වෙමි" යි සිතා මහත් වූ ප්‍රඥා උපදවා ගෙනැ, "මා සිතූ සේ ඉතා නපුරු යැ. බුදු බවට හේතු වූ පාරමිතා නමැති සාගරය පිඟිනා ගොඩ දක්නා සඳහා සිහිල් පොකුණෙකැ දියෙහි ගැලුණු පරිද්දෙන් මා ගේ සිත් වියවුල් කෙරෙම් දැ?" යි සිතා ඒ සිත් දුරු කොටැ, "මුළු ලොවැ කිසි මැ සතකුට නුපුළුවන් මෙ වැනි දරුවන් දන් දිනිමි. ඒකාන්තයෙන් මේ මා දුන් දානයෙන් ලොවුතුරා බුදු වෙම්ව" යි සතුටු වැ පත් සලින් නික්මැ පත් සල් දෙර කඩැ පහණ පුවරුවෙකැ වැඩ හුන් හ.

82. එ වේලෙහි දරු දෙ දෙන යෙමින් සිටු තමන් කෙළු ඇවිදුනා වෘක්ෂ සෙවණලු දැකැ, ගස් සිදුරු ගල් ගුහා මැටියෙන් ඇඹු ඇතුන් අසුන් රථ හොන් පෙතැල්ලන් ගිරවුන් වලි කුකුළන් කුරවි කෙවිල්ලන් වන මෘගයන් කිඳුරන් හා සතරැස් පොකුණු ද දැකැ, ගස් මුල් දැකැ, කියන්නාහු, "මන හර වූ මල් පිපි සිටුනා වෘක්ෂයෙනි, තොප හා පුරුදු වැ, තොප මුල්හි වැලි කෙළු, අදින් වියෝ වූ අපි තොප වැඳැ සමු ගනුම හ. පැහැයෙනුදුල වැලි තලාවෙනි, අප දිය කෙළනා මන හර ගඟුල් හැල්ලෙනි, තොප අතින් සමු ගෙනැ මෙහෙයට යෙම හ. මියුරු ගී නඟා හඬන කුරවි කෙවිල්ලෙනි, අත් තල ගසගසා අප ඉදිරියේ නටා, බස්නා ලිය කින්නරාවෙනි, අප ගේ මෑණියනට අප වැඳැ සමු ගත් බව කියවු. අනේ, මේ වනැ දෙවියෙනි, අප හා පුරුදු ඇත්තෙනි, මෑණියනට අප අතුල් පතුල් ඉදිමැයා නොහෙන බව කියවු. අප විඳුනා සුව කියවු. අප ගේ අම්මා එතොත් මේ මඟ ඔස්සේ දුවවවු" යි කියා මෙසේ හඬමින් වලපිමින්, "කැටි වැ කෙළනා වන මෘගයෙනි, සතරැස් පොකුණෙනි, අද තොප ගෙන් වියෝ වූම් හ" යි කියා සමු දී යෙමින් සිටිය හ. අකුරු මිශ්‍ර මඟැ ගොස් දරුවන් මිරිකුණු බවට මඟැ දෙ පාර්ශ්වයෙහි පිනි ගත් වෘක්ෂ වලප්නා වැන්නැ. වන වෘක්ෂයෝ බොහෝ බර වැ පිපෙන මල් නමැති මුඛ විවෘත කොටැ, මද්‍රී දේවිනට දරුවන් ගිය බව කියන්නාක් වැන්නැ. ඒ වෙනෙහි මෘග පක්ෂීහු "දෙ බිහිත්නත් කෙරෙන් වියෝ වූම් හ" යි ගර්ජනා කළ හ.

16. මද්‍රී දේවිය දරුවන් දන් දුන් බව දැනැ ගැනීම.

83. ඉක්බිති වලට ගිය මද්‍රී දේවි "ජයේ රෑ මම නපුරු සිහිනයක් දිටිමි. මා ගේ දරුවෝ වහන්සේ ළඟින් පන් සලින් පිටත් වූ දෙහොපි ළඟ කකියා එයි. වන මුල් වන ඵලාඵල ගෙනෙන සඳැ, අතැ ඝ ඝුල

වැටී යෙයි, පෙට්ටිය වැටී යෙයි, දකුණැඟැ මස් සැලෙයි, දෙ පය වෙවුලයි, හෘදය කකියයි. මේ පර්වතයේ දෙවියෙනි, මට කිමෙක් වේ දෙහෝ? මේ වනයෙහි නපුරු සිත පෙනෙන්නේ කුමට දෙහොත්?" යි ළය කකියවමින් පත් සලට එන සඳු, ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ දිව්‍ය ප්‍රත්‍රයන් තුන් දෙනකු කැඳවා කියන්නේ, "බෝධි සත්ත්වයෝ දරුවන් දන් දෙමින් සිටිය හ. එ තැනට බ්‍රාහ්මණයෝ නම් නපුරු යැ. තෙපි ගොස් සිංහ ව්‍යාඝ්‍ර වලස් වෙස් මවා ගෙනැ මඟ අවුරා වැදුහොව" යි සම්මත කෙළේ යැ. දෙවියෝ ද එ සේ මැ වෙස් මවා ගෙනැ මඟ අවුරා වැදුහොත් හ.

84. බ්‍රාහ්මණයන් එන්නාහු භයඞ්කර රූප දැකැ කියන්නාහු, "මම යම් දවසෙකැ මේ මඟැ යන එන කලැ මෙ සේ වූ සතුන් නුදුටු විරීමි. මුවන් මොනරුන් වලි කුකුළන් වඳුරන් දකුත් මුත් මෙ සේ වූ සතුන් නුදුටු විරීමි. මේ වෙනෙහි වෘක්ෂ දේවතාවෙනි, පර්වතයන්හි දෙවියෙනි, මොවුත් යවවු. රාමයනට සීතාවන් සේ මා ගේ ස්වාමීනට මම් පති ව්‍රතා වීම් නම්, වහන්ස, කුඩා වරුනි, මඟින් ඉවත් වව" යි මහත් කොටැ හඬ ගසා, නො යන විසින්, අනෙක් යන මඟක් නැත්තෙන්, "පෙර මහට දරුවෝ අවු නම් නපුරෝ" යි සිතා "මා ඒ මඟැ හොත් සතුන් විසින් නො ඇ හෙති යි ළය කකියවා තුමූ මැ නැඟී යෙද්දෙහෝ?" යි සිටැ කියන්නාහු, "දරුවෙනි, මම තොප නැ සිය කොටැ වනාන්තරයට ඇ වෙස්සන්තර රජ්ජුරුවන් ගේ අඹු වෙමි. තොප මුත් මා ගේ නැයෝ නැති. මා නුදුටු දරුවෝ නො හැමෙති. රෑ නො වන තුරු මා නැඟී යා දෙව" යි කී හ. එ සේ කිව ද නො යන විසින්, මහත් කොටැ හඬ නඟා අත් පොළසන් දී, "තොපට කුමන වරදක් කෙළෙමි දෙහොත්?" යි කී හ. පති ව්‍රතාවන් මේ සේ කියත් මැ, මෘග ජාතීහු භය ඇති වැ නිදු පුබුදු වූවන් සේ හඬා, ඔර බට බව දුනැ, නො පෙති හිය හ.

85. මද්‍රී දේවී සඳ රැසින් යුත් රාත්‍රියෙහි වන මුල් වන ඵලාඵල ගෙන'වුත්, "දරුවන් මෙ තැනැ දකිම දෙහෝ?" යි සිතා, එන මහැ නොදුකැ, මා දරුවනට කිමෙක් වී දෙහෝ?" යි සිටැ කියන්නී, "මා ගේ දරුවන් ගෙන් මිහිරි බසෙක් මා කනැ නොඅණ. ළඳ බොළඳ බසක් නොඇසිමි. පිලා සඳක් වැනි මුහුණ නුදුටුයෙමි. පෙරැ කෙළනා රුක් මුලැ නොදක්නෙමි. ජාලි කුමාරයෝ පෙර මහට අවුත්, 'අම්ම, අඹ නැද්දැ?' යි අණ බලති. කණ්හාජිනාවෝ අවුත් තනය ගනිති. මේ නුඹ මුලැ වැලි කැටි කොටැ කෙළනා තැනැ" යි බලමින් ගොස් පන් සලට වැද, තෙනෙහි කිරි ඉසිමින් සියලඟ වෙවුල්වමින් මුව වියළවා ළය කකියවා, "වහන්සේ කෙරෙහි නැත් නු? කොතැනැ නිදි ගැන්වූ දෙහෝ? යම් කිසි රුකක් මුලැ නිදද්දෙහෝ? අැත් කඳ ළිහිණියෝ ගෙනැ ගියෝ දෙහෝ? යක්ෂ භූත ප්‍රේතයෝ ගෙනැ ගියෝ දෙහෝ? ළඳ බොළඳ මියුරැ බසක් කවර විටෙකැ අැසියැ හෙමි දෙහෝ? ළඳ බොළඳ සිනාවක් කවර විටෙකැ අැසියැ හෙමි දෙහෝ? 'මැණියෙනි, පියාණෙනි,' කියන බසක් කවර විටෙකැ අැසියැ හෙමි දෙහෝ?" යි හඬා වැලැපැ, බෝ සතාණන් අසින් විචාරන්නී, "ස්වාමීනි, දරුවන් සිඟන්නනට දන් දුන්නු දැ?" යි විචාළා යැ.

86. බෝ සතාණන් මුවින් නොඛැණැ වැඩැ හුන් හෙයින් බිසොවු කියන්නාහු, "වහන්ස, දරුවන් නොදක්නා ශෝක තබා, නුඹ වහන්සේ මුවින් නොඛණනා ශෝකය බොහෝ යැ" යි කී හ. මෙ සේ කියා හඬතු දු බෝධි සත්ත්වයෝ එක බසකුත් නොකියා මැ වැඩැ හුන් හ. ඉක්බිති බිසොවු කියන්නාහු, "පෙරැ මේ වේලාවට ගිනි දර අැති කොටැ ඔදිනා දැ යැ. අද මුවින් වත් නොඛණන දැ යැ. මා එන තුරැ 'දරුවන් රකිමි' යි මට වර දුන් දැ වේ ද? දරු ස්නේහයෙන් මා අඬා අැවිදුනා තුරැ නොඛැණැ

වැඩෑ හිඳුනා දෑ යෑ. ඔබ ගේ දරුවන් කෑදවා ලා ඵලාඵල වැළෑදෑවුව මැනැවැ. නො බණින දෑ නම් නුඹ කෙරෙන් මා ගේ ජීවිතය තොර කෙරෙමි" යි කී හ.

87. එ සඳෑ බෝධි සත්ත්වයෝ සිතන්නාහු, "මොහු දරුවන් කෙරෙහි ස්නේහ බොහෝ දෑ යෑ. දැන් මා දරුවන් දුන් බව කිම් නම් නපුරැ" යි සිතා, කල් යවා කියන්නාහු, "තෙපි වන මුල් වන ඵලාඵල පිණිසෑ උදැසනැ මෑ ගොස් මෙ වේලේ සඳ පහනේ ආවහු ද? අද මැ දරුවනට ස්නේහ බොහෝ වේ ද? තෙපි පඤ්ච කල්‍යාණයෙන් යුත් රූප සම්පන්නයව. මේ වෙනෙහි වන චරකයෝ ද ඍෂි වරයෝ ද තාපස වරු ද ඇති. මෙ පමණ වේලා තොප කුමක් කළ හ සි කවුරු දනිද්ද? 'මා ගේ දරුවන් ගේ පවත් කෙ සේ ද? සැමිහු ගේ පවත් කෙ සේ දැ?' යි මෙ පමණ සිතෙකුදු නුවූයේ යෑ"යි තර්ජනය කොටෑ කී හ.

88. එ බස් අසා මද්‍රී දේවී, "මා ලස්වූ හෙයින් නො බැණෑ හුන් දෑ වනැ" යි සිතා කියන්නී, "මම වේලේ ආමි. මේ වෙනෙහි පක්ෂි ආදීන් මහත් කොටෑ හැඬූ හඬ අසා, 'මා දරුවනට කිමෙක් වී දෙහෝ?' යි ළය කකියවා එමින් සිටි සඳෑ, මහෑ සිහ වලස් වග තුන් දෙනෙක් මා එනු නො දී මග අවුරා හොත් හ. එ සේ හෙයින් ලස් වීමි" යි කීවා යෑ.

17. මද්‍රී දේවිය ගේ ශෝකය. දේවිය දන් දීම.

89. මෙ සේ බිසෝවුන් කියතු දු නො බැණෑ ඉන්නා විසින්, ළය කකියවා වෙවුලමින් හඬා ගෙනෑ පත් සල පිටි පසට ගොස් හඬ ගානාහු, "මා ගේ ළයක් වැනි ජාලි කුමාරයෙනි, සිවුමැලි කෘෂ්ණාජිනාවෙනි, තොප නාවන්නට වලින් කසා ගෙනාමි. මා ගේ ළය වැනි කුමාරයෙනි, මා කම් කිළිය කරා නො එවූ

දූ?" යි මහත් කොටැ හඬා ලා බසක් නො ලදින්, "මා ගේ දරුවනට නැස්මෙක් වනැ" යි නියත කොටැ සිතා, රාත්‍රියෙහි මහ සෝ දුකින් හඬා ඇවිදුනාහු, "මා ගේ දරුවන් කෙළනා පොකුණ යැ" යි පොකුණ බලා, "දරුවන් එක් වැ කෙළනා මුව පොල්ලෝ යැ" යි මුවන් බලා, "දරුවන් කෙළනා රුක් මුලැ" යි රුක් මුල් බලා නො දූකැ, එ තැනින් ඔබට ගොස්, "මා දරුවන් සමඟ කෙළන නටන මොනරුනැ" යි මොන රුන් බලමින්, "දියණියන් බස් වැනි බස් ඇති කුරවී කෙවිල්ලෝ යැ" යි කුරවී කෙවිල්ලන් බලමින්, "මා ගේ දියණියන් වැනි යහපත් වූ ඇස් ඇති මෘගාඩක-නාවෝ යැ" යි රැලෙහි යන මුවන් හා මුව දෙනුන් හා බලා, දරුවන් හා එක් වැ ඇවිදුනවුන් දකිමින් "මා දරුවන් නො දක්මි" යි මහ හඬින් හඬා, සී සන් නැති වැ වැටී ඕ මඳ විගසෙකින් සී සන් ලදින්, "මා දියණියන් කෙළනා කෙළි වලදැ" යි කෙළි වලන් බලමින්, "දියණියන් කෙළනා මැටි ගිරවු යැ" යි ගිරවුන් බලමින්, බිමැ ඕ නොයෙක් වාරයේ හඬා, රාත්‍රියෙහි ගල වන පහණ ගැසි ඇළ දෙළ කඳු බැවිලි ගං හෝ මේ ආදි සථාන බලබලා, වඞ්කගිරි පර්වතයෙහි පසළොස් ගවුවක් බද මානයේ සඳ පාතේ තුන් විටක් වට කොටැ බලා ඇවිද්දූ හ. බිසොවුන් බලා ඇවිද්දූ දී බෝධි සත්ත්වයෝ ඇසි පිය නො ඔබා නිදි විසෝ වැ හුන් හ. පහන් වැ හිරු නැගෙමින් සිටි වේලෙහි මද්‍රී දේවී බළලකු ගත් කිකිළියක මෙන් වෙවුලා හඬා සී සන් නැති වැ හොත් හ.

90. බෝධි සත්ත්වයෝ මද්‍රී දේවී හොත් විලස් බලා, ළය කකියවා, "මේ වෙනෙහි මා ගේ නෑ කෙනෙක් නැති. තොප ගේ නෑ කෙනෙක් නැති. තෙපි වනාන්තරයෙහි මළහු දූ" යි කියා, සිත් කලඹා ශෝක පත් වැ නුවණින් ශෝක දුරු කොටැ, නෙළුම් පොකුණට ගොස් දිය ගෙන'වුත්, සත් මසක් විසූ බ්‍රහ්ම චර්‍යයෙන් සත්‍ය ක්‍රියා කොටැ, බ්‍රහ්ම චර්‍යයෙහි

අැල්මක් නොකොටැ, මිදී දේවීන් හිස බර පිටැ තබා ගෙනැ, පියුමක් වැනි අත්ලෙන් ළය අත ගගා මුහුණට දිය ඉසැ, අතින් ලෙහි දිය ගසා සිතන්නාහු, "සිවි රටැ හෙවැ මියැ හියෝ නම්, මහත් රජ පෙරහරින් දවන්නා හ. හුදෙකලා වැ මේ වෙනෙහි කුමක් කෙරෙම් දැ?" යි සිතා මහත් වූ ශෝකයෙන් තැවිතැවී හුන් හ. බිසොවු කල් යාමෙකින් සිසන් ලදින් ලජ්ජා වැ, මහ බෝ සතාණන් වැඳැ විචාරන්-නාහු, "වහන්ස, මා දරුවෝ කොයි දැ?" යි විචාළ හ. බෝධි සත්වයෝ කියන්නාහු, "දෙවිනි, ඉතා වයෝ වෘද්ධ වූ බමුණෙක් සැට යොදුන් මහ ගෙවා දන් පිණිසැ ආයේ යැ. ඕ හට දරුවන් දිනිමි" යි කී හ.

91. එ විටැ මහ පොළොව හඬා හුහුළ. සියලු දෙවියෝ සාධු කාර දුන් හ. මහාමේරු පර්වතය ද සප්ත කුල පර්වතයෝ ද රැවුණු පිළිරැවු දිදී නටන්නට වන් හ. "දේවිනි, දැන පාරමිතාවට යම් සිතක් නොසිතා පින් අනුමෝදන් වව" යි වදාළ හ. බිසොවු කියන්නාහු, "ස්වාමීනි, මට මෙසේ නොකියා හඬා අැවිද්දු දී නොබැණැ හුන් දැ යැ" යි කියමින් දෙහොත් මුදුනේ තබා ගෙනැ, "පින් අනුමෝදන් වෙමි" යි කියා සාධු කාර දී පින් අනුමෝදන් වැ ගෙනැ කියන්නාහු, "ස්වාමිනි, දරුවනට වැඩියෙන් දහසින් ලක්ෂයෙන් බුදු බව උත්තම යැ" යි සතුටු වැ සිත් සන්හිඳුවා ගෙනැ, "ස්වාමිනි, මට මැ පින් දෙන දැ ද? මුළු ලොවැ සතුනටත් පින් කම් දුන මැනැවැ" යි පින් දෙවා, සිත් ප්‍රසන්න කොටැ, දැන පාරමිතාව මුදුන් පත් කළ හ. සියලු දෙවියෝ සතුටු වැ සාධු කාර දී පින් අනුමෝදන් වැ මල් වැසි වැස්වූ හ.

92. ඉක්බිත්තෙන් ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ සිතන්-නේ, "බෝධී සත්වයෝ තමන් ගේ දරු දෙදෙනා බමුණාට දුන් හ. බිසොවුහුදු යම් කිසි ඕන පුරුෂ-යක් හට දන් දුන හොත් නපුරැ" යි සිතා, දිව්‍ය

ශරීරය හැරී පියා මහදු බමුණු වෙසක් ගෙනැ අවුදින් කියන්නේ, "ගමන් විඩායෙන් මිරිකුණෙමි. රජ්ජුරුවන් කොතැනෙකැ උන්නා දැ?" යි කියකියා ළඟට අවුත්, බෝ සතාණන් දැකැ කියන්නේ, "රජ්ජුරුවෙනි, ඔබ ගේ සුව දුක් කෙසේ ද? යැපෙන පමණ ආහාර ලැබේ ද? වන මුල් ඵලාඵල ලැබේ ද? මැසි මදුරු ආදීන් ගෙන් උපද්‍රව නැද්දැ?" යි යනාදීන් පුළුවුත් හ. බෝධි සත්ත්වයෝ කියන්නාහු, "තා කී මේ හැම දෙයින් කිසි අඩුවෙක් උපද්‍රවයෙක් නැති. ඒ සියල්ල මැ හොඳින් ලැබෙන්නේ යැ. තා ආ කාර්‍ය්‍ය කිමෙක් දැ?" යි විචාළ හ. බමුණු කියන්නේ, "රජ්ජුරුවෙනි, ඉතා වයෝ වෘද්ධයෙමි. ගමන් විඩායෙන් මිරිකුණෙමි. තොප අතින් රන් රුවන් මුතු මැණික් ඉල්ලා ආයෙමි නොවමි. මා ගේ ගෙයි මෙහෙ කරන වැලක් නැත්තෙමි. තොප ගේ බිසොවුන් මෙහෙ කිරීමට ඉල්ලා ආමි" යි කී හ.

93. බෝධි සත්ත්වයෝ "කළ මනා කිමෙක් දෙහොත්?" යි සිතා බිසොවුන් මුහුණ බැලූ හ. බිසොවු බෝධි සත්ත්වයන් සිතූ අභිප්‍රායය දැනැ කියන්නාහු, "මවු පියෝ නම් සත්‍රුනට දෙස් වැස්ස හ. නැයෝ නම් තමා ගේ ස්වාමි යැ. පින් සඳහා දෙන් මනා මැ යැ. වසතු සඳහා දෙන් මනා මැ යැ. ස්වාමීනට ඉන් වන දෝෂයෙක් නැති. නුඹ වහන්සේ මට අධිපති යැ. එබැවින් යමක් හට දුස ඔවට දෙනු කැමැති සේක් නම්, එසේ දුන මැනැවැ. වස්තුව සඳහා දෙනු කැමැති සේක් නම්, එසේ දුන මැනැවැ. යමක් හට මසින් ප්‍රයෝජන නම්, මස් පිණිසැ දෙනු කැමැති සේක් නම්, එසේ දුන මැනැවැ. තවද නුඹ වහන්සේට අභිමතයක් කළ මැනැවැ" යි කී හ.

94. එසේ කී කලැ, මහ බෝ සතාණෝ සතුටු වැ බ්‍රාහ්මණයා කැඳවා, අතැ පැන් එවැ, පියුමක් බඳු බිසොවුන් ගේ අත ගෙනැ, "ඒකාන්තයෙන් සමෘක් සම්බෝධියට පැමිණැ සියලු ලෝ වැස්සන් නිවන්

පුරයෙහි පිහිටුවා ලියෑ හෙම් ව!" යි පතා ගෙනෑ, බමුණාට දන් දුන් හ. මෙ සේ බිසොවුන් දන් දෙත් මෑ මහ පොළොව සතුටු වෑ ගුගුළ. **මේරු** පර්වතය හා **යුගන්ධරාදි** සප්ත කුල පර්වතයෝ ද සතුටු වෑ. නටමින් සාධු කාර දුන් හ. ස දෙව් ලොවෑ දෙවියෝ ද සතුටු වෑ සාධු කාර දුන් හ.

18. ශක්‍රයා වර අටක් දීම. දරුවන් මුත්තණුවන් වෙත පැමිණීම.

95. බමුණු කියන්නේ, "රජ්ජුරුවෙනි, තොප බිසොවුන් මට දන් දුන් බැවින්, බිසොවු අප සන්තකයෝ යැ. තොප සතු දෙයක් මුත්, අනුන් සතු දෙයක් දන් දියෑ නො හැක්කේ වේ දැ" යි කියා, "මා එන තෙක් බිසොවුන් තොපට පාවා දිනිමි. තෙපි මේ බිසොවුනට සුදුස්සව. තොපට මූ සුදුස්ස හ" යි බෝධිසත්ත්වයනට පාවා දී, **ශක්‍ර** දේවේන්ද්‍ර බව හඟවා, **ශක්‍ර** විලාශයෙන් සිටෑ කියන්නේ, "රජ්ජුරුවෙනි, තොප දරුවන් දන් දුන් විටෑ මෑ, දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ගත කඩ මහ බොල් පොළොව මහ හඬින් හඬා ගුගුළ. එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් උස ඇති **මහාමේරු** පර්වතය ද සප්ත කුල පර්වතයෝ ද සතුටු වෑ නැටුම් ගත් හ. තලාටු බූමාටු දෙවියෝ ද සතුටු වෑ නැටුම් ගත් හ. ස දෙව් ලොවෑ දෙවියෝ ද සොළොස් බඹ තෙලෙහි මහා බ්‍රහ්මයෝ ද සතුටු වෑ නැටුම් ගත් හ. සාධු කාර දුන් හ. එ සේ මෑ තොපට ඒකාන්තයෙන් ලොවුතුරා **බුද්ධඥාන** සිද්ධ වේ ව"යි කියා, "තොප ගේ දරු දෙ දෙනා මුතුන් මිත්තන් කරා බමුණා ගෙනෑ ගියේ යැ. අනෙක් සත් දවසෙකින් තොප කරා දරුවෝ එති. එ බැවින් වර අටක් ගනුව" යි දිව්‍යාත්ම භාවයෙන් දිලියෙන්නේ, ළඟිරු මඬල මෙන් අහසෙහි සිටෑ කීයේ යැ.

96. සක් දෙව් රජාණන් කී වර අට ගන්නා වූ බෝ සතාණෝ වර ඉල්ලන්නාහු, "එසේ වී නම් ශක්‍ර දේවේන්ද්‍රයෙනි, මම මේ වනයෙන් ගොස් සැකීය ගෘහයට පැමිණි කලෑ, මා ගේ පියහු විසින් ද මේ දානය අනුමෝදන් වැ මා කෙරෙහි සතුටු වැ රාජ්‍යයෙන් පවරනු ලබම් වා. කිසිවක් හටත් වධ කිරීමට රුවි නො වන්නෙම්, රාජාපරාධ කළවුන් ද වධයෙන් මුදනු ලබම් වා. ළදරු මහලු මද්ධ්‍යම යන වයස්හි වූ සියලු දෙන මැ මා ගෙන් ජීවත් වනු ලබත් වා. පරදාර කර්මයෙහි නො ඇලුණෙම්, සැකිය භාර්‍යාව හා සතුටු වන්නෙම්, ඒ සත්‍රීන් ගේ වසඟයට නො පැමිණෙම් වා. තව ද ශක්‍ර දේවේන්ද්‍රය, දිළිඳු-ශුෂ්ක වූ දුහැමින් සෙමෙන් ජීවත් වන්නා වූ පුත්‍රයන් ලබම් වා. මෙයින් චුත වැ ගොස් තුසි පුරයෙහි උපන්නෙම්, විශේෂ වූ දිව්‍යාත්ම භාවය ඇති වෙම් වා. දන් දෙන කලෑ, වසතුව ක්ෂය නුවූයෙන්, දන් දී නො තැවෙන්නෙම්, එයට සිත පහදවා ගනිම් වා. ඒ තුසි පුරයෙන් සැවැ, මිනිස් අත් බවට පැමිණියෙම්, නැවැතැ නුපදිම් වා, හෙවත් සර්ව්‍වඥතා ඥානයට පැමිණෑ කෙළවරැ නිවන් දකිම් ව" සි වර ගත් හ. මෙසේ එ දවස් වර දී ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ දෙව් ලොවට මෑ ගියේ යැ.

97. එ කලෑ ජූජක බමුණා ද දරු දෙ බිහින්නන් ගෙනැ සැට යොදුන් මඟට පිළිපන්නේ යැ. දේවතාවෝ කුමරුනට අරක් ගත්තාහු යැ. ජූජකයා හිරු අසතයට ගිය වේලෙහි, දරු දෙ දෙනා ගසැ බැඳැ බිමැ වැදූ හොවා, තමන් වගුත් වලසුත් කෙරෙහි ගත් භයින් රුකකට නැඟී, කඳ වෙළෙප් අතුරෙහි නිදයි. එ කෙණෙහි එක් දිව්‍ය පුත්‍රයෙක් වෙස්සන්තර රජ්ජුරුවන් ගේ වේශයෙන් ද, එක් දෙව් දුවක් මද්‍රී දේවීන් ගේ වේශයෙන් ද අවුත්, කුමරුන් මුදා, සුවඳ පැනින් නාවා පිළි හඳවා, බත් අනුභව කරවා, දිව යහනෙකැ හොවා, බඩ දී ගෙනැ හෙවැ දරුවන් නිදි ගන්වා, පාන් වූ

කලෑ කුමාර වරුන් පළමු බැඳැ ලූ සැරියේ මෑ හොවා, නො පෙණී නැති තිය හ. ඉක්බිති බමුණු පිබිදූ පියා, පාන් වූ බව දැනැ ඔසින් බැසැ, "දරුවන් තමා ගේ රටට ගෙනැ යෙමි" යි සිතන්නේ, දේවතානුභාවයෙන් කලිඟු රටට නො ගොස් ඔවුන් ගේ මුතුන් මිත්තන්ගේ රට වූ ජයතුරා නුවරට පැමිණියේ යැ.

98. එ දවස් වනාහි සඳ මහ රජාණෝ සුපිනයක් දුට හ. තමා මහා විනිශ්චයයෙහි යෙදී හුන් කලෑ, එක් පුරුෂයෙක් පියුම් දෙකක් ගෙන'වුත් තමා අතැ තුබූ-යේ යැ. රජ්ජුරුවෝ එය ගෙනැ දෙ කනැ පැලෑදැ ගත් හ. එහි රේණු හිලිහි රජ්ජුරුවන් ගේ උදරයෙහි වැටුණේ යැ. රජ්ජුරුවෝ පිබිදූ පියා, චතුර් වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා, තමන් දුටු සුපිනය විචා-ළ හ. බමුණෝ කියන්නාහු, "සාමිනි, තොප සිත් ප්‍රිය වන දරු දෙ දෙනකුන් එන්නේ වනැ"යි කීවා-හු යැ. රජ්ජුරුවෝ එ බස් අසා සතුටු වැ, උදැසන්හි මැ නොයෙක් අග්‍ර රසයෙන් යුක්ත වූ භෝජනය අනුභව කොටැ, විනිශ්චයාසනයෙහි වැඩැ හුන් හ.

99. දේවතානුභාවයෙන් බමුණා දරු දෙ දෙන ගෙන'වුත් රාජාඞ්ගනයෙහි සිටුවූයේ යැ. රජ්ජුරුවෝ "ජාලි කුමාරයන් හා කෘෂ්ණාජිනාවන් හා ඇරැ ගෙනැ බමුණෙක් ආයේ වනැ"යි යනු අසා, බමුණා ගෙන්වා දරුවන් දෙ දෙනා දැකැ, සතුටු වැ, "බමුණ, මේ දරු-වන් දෙ දෙනා කොයි සිටැ ගෙනායේ ද?"යි විචාළ හ. ඉක්බිත්තෙන් බමුණා, "බොරුවක් කියා මා මුන් ගෙන් ගැලැවුණ මැනැවැ"යි සිතා, "අනෙක් රජකු නමක් කියමි" යි කට දැල්වූ සඳැ, දේවතානුභාවයෙන් "වෙස්සන්තර රජ්ජුරුවන් මට දුන් හ"යි කියැවිණ. ඉක්බිති, "මේ කවර රටෙක් දෙහොත්?"යි බමුණු සිතන්නේ, සඳ මහ රජාණන් ගේ රට ඔව දැනැ, "මා දිවි නැති. කුමක් කෙරෙමි දෙහොත්?"යි සිතා වෙවුලන්නට වනැ.

19. දරුවන් දස් බැවින් මිදීම.
ජූජකයා ගේ මරණය.

100. සඳ මහ රජාණෝ පුතණුවන් වෙනෙහි හිඳ දන් දුන් බව සිතා, මහත් කොටැ හඬා කඳුළු පිසැ, දරුවන් ආ බව නගර වාසීනට කී හ. නුවර වාසිහු කියන්නාහු, "ස්වාමිනි, දරුවන් දන් දෙන කලැ, ඒ උත්තමයා ගේ ළය ගලෙක් වී ද? ය පතෙකින් වැසිණි ද? බමුණු මාල්ලකුට මෙ වැනි දරුවන් දන් දුන් ඒ ළය කෙසේ වාවා ගෙනැ උන්නේ ද? අපි ඔවුන් 'අැළි අැතු දන් දුන් සේ නපුරැ'සි රැහැණි වැ වඩකගිරි පර්වතයට යැවුම් හ. දැන් මෙ වැනි මන හර ළද බොළඳ සිවුමැලි දරුවන් දන් දුන් හ. මෙ බඳු සිත් අැති ඒ උත්තමයා ගේ ගුණ දැනැ නුගුණ පහ කොටැ හොස් ඔහු ගෙනෙමි හ"සි කී හ.

101. නුවර වාසින් ගේ බස් අසා ජාලි කුමාරයෝ කියන්නාහු, "අප දන් දෙන පියාණෝ බමුණා කෙරෙහි කරුණායෙන් දන් දුන් දැ යැ. කෘෂ්ණාජිනාවන් කී එක වචනය අසා එ කෙණෙහි තඹ වන් අැසින් කඳුළු වගුරුවා මහත් වූ ශෝකයෙන් දන් දුන් දැ යැ. ම පියාණන් වහන්සේ 'ඉතා තදැ යැ' සි කුමට නිසැ කොළෝ ද?"සි කී හ. එ බස් අසා නුවර වාසිහු සතුටු වැ, "ස්වාමි දරුවාණෙනි, සිවුමැලි කුමාරයන් වහන්ස, නුඹ පියාණන් වහන්සේ ගේ අගුණ නො කීම හ. ඒ උත්තමයා 'කිසිවකු විසින් නො කොටැ ගත හැකි තොප බඳු දරුවන් දන් දුන් නියා ඉතා බැරි යැ'සි සතුති කළ බව මුත් නුගුණයකට නො කීම හ. ස්වාමිනි, ඊට කෝප කළ මැනැවැ"සි කියා සිටියා හ.

102. එ කලැ සඳ මහ රජාණෝ අැසින් කඳුළු ගෙනැ කියන්නාහු, "ම පුතුන් ගේ මන හර දරුවෙනි, මා ගේ සිවුමැලි මුනුබුරෙනි, මෙ සේ අවුත් මා ගේ අැකයෙහි හිඳුව"සි කී හ. ජාලි කුමාරයෝ මුත්තණුවන් ගේ බස් අසා කියන්නාහු, "බමුණන් ගේ හැත්තෝත් රජ දරුවන් ඔරැ හිඳින් ද?"සි කී හ. රජ්ජුරුවෝ ද වැලැපැ හිඳැ කියන්නාහු,

"ජාලි කුමාරයෙනි, තොප දනට දෙන කලැ තොප ගේ පියාණෝ කෙතෙක් මිල අගය කොටැ දුන්නෝ ද?" යි ඇසූ හ. ජාලි කුමාරයෝ කියන්නාහු, "දේවයන් වහන්ස, මා දන් දෙන්නා වූ පියාණන් නිසි දහසක් අගය කොටැ දුන් හ. නැහණියන් දන් දෙන්නා වූ පියාණන් ඇත් අස් ආදි සියල්ලෙන් සියය සියය හා බරේ බර වස්තු අගය කොටැ දුන් හ" යි කී හ.

103. සඳ මහ රජාණෝ කුමාරයන් ගේ මිහිරි තෙපුල් අසා සතුටු වැ, ජාලි කුමාරයනට දහසක් දී, කෘෂ්ණාජිනාවනට උන් ගේ භාරයෙන් රන් රුවන් හා බොහෝ වස්තු හා සත් මහල් ප්‍රාසාදයක් ද බමුණාට දී, දෙ බිහින්නන් ගලවා ගත් හ. බමුණාට දෙන ලද පිරිවර ද බොහෝ වූ හ. බමුණු ධනය තැන් පත් කොටැ තබා, ඉස් සෝධා නහා අවුත්, රජ්ජුරුවන් විසින් තමාට පිළියෙළ කරන පරිද්දෙන් පිළියෙළ කරවා දුන් රස භෝජනය අනුභව කොටැ, තම හට දුන් ප්‍රාසාදයට නැඟී මහ යහනෙහි හොත්තේ යැ.

104. රජ්ජුරුවෝ කුමරුවන් ඉස් සෝධා නහවා ඔත් කවා, ජාලි කුමාරයන් රජ්ජුරුවන් ගේ ඇකයෙහි ද කෘෂ්ණාජිනාවන් බිසොවුන් ගේ ඇකයෙහි ද හිඳුවා ගෙනැ සතුටු සතුටු වැ සිඹැ සනහා කියන්නාහු, "ජාලි කුමාරයෙනි, තොප ගේ මැණියන් හා පියාණෝ සුවයෙන් වෙසෙද්ද? ලෙඩ දුක් නැද්ද? මැසි මදුරුවන් ගෙන් හා සිංහ ව්‍යාඝ්‍රාදීන් ගෙන් පීඩා නැද්ද?" යි ඇසූ හ. කුමාරයෝ කියන්නාහු, "මුත්තණුවන් වහන්ස, දෙ දෙන මැතිරෝඟ වැ වෙසෙත්. කියන ලද කිසිවෙකින් පීඩාවෙක් නැත්තේ යැ. පියාණන් වහන්සේ නුඹ කෙරෙන් වියෝ වූ දුකින් හා තපස් කිරීමෙන් හා දවස් හළ දැ යැ. මැණියෝ ඵලාඵල පිණිසැ ගොස් අවු සුළඟින් පැහැරි අතින් පිරිමැදීමෙන් මලානික වැ ගිය පියුමක් මෙන් මලානික වූ මුහුණු ඇති වැ, මහ වනයෙහි හැසිරීමෙන් බමරුන් සේ කළු පැහැ ඇති කේශ කලාපය අතු පතරැ ඇලීමෙන් තැති වැ, දෙ කිසිල්ලෙන් වැහෙන ඛග දියෙන් තෙමී වූ සිරුරු

ඇති වැ දවස් හළ දැ යැ"යි කියා, නැවැතැ මුත්තණුවනට චෝදනා කරන්නෝ, "සියලු සත්ත්වයනට මැ තමන් තමන් ගේ දරු බිලිදෝ ප්‍රිය වන්නා හ. නුඹ වහන්සේ දරුවනට ප්‍රේම කිරීම ඉතා මද යැ"යි කී හ. ඒ ළඳ බොළඳ බස් අසමින් රජ්ජුරුවන් හා නුවර වාසිහු මහත් වූ ශෝකයට පැමිණියා හ.

105. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කුමාරයන් ගේ බස් අසා, "සැබැවැ, කුඩෙනි, කිසි වරදක් නැති මුත්තණුවන් නගර වාසීන් ගේ බස් ගෙනැ නෙරපීමි"යි හඬා වැලැපැ, අමාත්‍යයන් කැඳවා කියන්නාහු, **වඞ්කගිරි** පර්වතයට යනු පිණිස සිවුරඟ සෙනඟ පිළියෙල කරව"යි කී හ. එ විටැ අමාත්‍යයෝ නුවරැ බෙර ලවන්නාහු, "මෙයින් සත් වැනි දවසෙහි, **වඞ්කගිරි** පර්වතයට යනු පිණිස යෝධයෝ සැට දහසක් දෙනා නානා වණ්ණ වස්ත්‍ර හැඳැ පැලඳැ, සන්නාහ සන්නද්ධ වැ, අස් අස් රථ පදික යන සිවුරඟ සෙනඟ පිරිවරා ගෙනැ, දහස් ගණන් අතුන් අසුන් පිටට පැනැ නැඟී එත් ව"යි අණ බෙර ලැවූ හ. ඉක්බිති රජ්ජුරුවෝ "**ජයතුරා** නුවර පටන් **වඞ්කගිරි** පර්වතය දක්වා අට ඉස්බක් පමණ වූ මාර්ගය අලඞ්කාර කරව" යි නියෝග කළ හ. අමාත්‍යයෝ මඟ සරසන්නාහු, කළු වැලි පියා සුදු වැල්ලෙන් තවරා, කෙහෙල් තැඹිලි පුන් කලස ධජ පතාකාදියෙන් මඟ සරසා, ලද පස් මල් ඉසැ, මල් ගඳ විලෙවුන් ගල්වා, උඩු වියන් බැඳැ, එහි මල් දම් එල්ලා, මල් ඇඟෑ රන් ඇඟෑ ආදියෙන් සරසා, පිපාසිත වූවනට බොහු පිණිස රා මස් ආදිය තබවා, පඤ්චාංගික තූර්‍ය ඝෝෂයෙන් යුක්ත කරවා මඟ සැරසූ හ.

106. ජූජකයා ද රාජ භෝජනය පමණ ඉක්මවා අනුභව කිරීමෙන් දිරවා ගත නොහැකි වූයේ එ දවස් මධ්‍යම රාත්‍රියෙහි කළුරිය කෙළේ ය. රජ්ජුරුවෝ ඔහු ගේ සිරුර මහත් පෙරහරින් ගෙනැ ගොස් දවා "බමුණා ගේ නෑ කෙනෙක් ඇත් නම්, මේ වස්තු ගනිත් ව" යි නුවරැ බෙර ලවා, නෑ කෙනකුත් නොදැකැ, ඒ වස්තු රාජ භාණ්ඩාගාරයෙහි මැ තැබූ හ.

20. පිය-පුත් හමුව. පොකුරු වැස්ස.

107. ඉක්බිත්තෙන් සත් වැනි දවසෙහි සඳ මහ රජ-පුරුවෝ සියලු සෙනඟ රැස් කරවා, මහත් පිරිවරින් යුක්ත වැ, ජාලි කුමාරයන් හා කෘෂ්ණාජිනාවන්ද අතු පිටැ නංවා ගෙනැ මාඝී නායක කොටැ තුමූ පසු වැ ලා ඒදැ, ක්‍රමයෙන් ගොස් වේකිය රටට වන්හ. වේකිය රජ්ජුරුවෝ දැකැ සතුටු වැ, උපස්ථාන කොටැ සිවුරඟ සෙනඟ පිරිවරා සඳ මහ රජාණන් හා එක් වැ නික්මුණාහ. අතුන් ගේ කුණ්ඩ නාදයෙන් හා අසුන් ගේ ඝේෂා රවයෙන් හා පඤ්චාඞ්ගික තූර්‍ය ඝෝෂාදියෙන් දියුක්ත වැ, යන්නාහු, සැට යොදුන් මහා මාර්ගය ගෙවා, වෙස්සන්තර රජ්ජුරුවන් වසන්නා වූ වඞ්කගිරි පර්වත ප්‍රදේශයට පැමිණියාහු යැ.

108. ඉක්බිති බෝධි සත්ත්වයෝ භේරී තූර්‍ය ඝෝෂයන් හා සඛ නාද හා අතුන් ගේ කුණ්ඩ නාද හා අසුන් ගේ ඝේෂා රව හා රථයන්හි චක්‍ර නාද හා මෙ සේ මහත් වූ ඝෝෂය අසා මද්‍රී දේවිට කියන්නාහු, "දේවිනි, ම පියාණන් වහන්සේ මහලු විසින් යම් කිසි සතුරු රජෙක් ම පියාණන් මරා, අප මෙහි වාසය කරන බව දැනැ, අප කරා එන්නේ දෙහොත්? සි පරීක්ෂා කරව" සි කී හ. මද්‍රී දේවී වංකගිරි පර්වතයට නැඟී බලා මහත් වූ සේනාව දැක, තමන් ගේ සේනාව විය යුතු යැ සි සිතා, "ස්වාමිනි, නුඹ වහන්සේට කවර නම් සතුරු කෙනෙක් ඇද්ද? නුඹ පියවර මැඩැ පියන සත්ත්ව කෙනෙක් ඇද්ද? ස්වාමිනි, එ දවස් ශක්‍ර දේවේන්ද්‍රයා කියන්නේ, අප ගේ දරුවන් මුතුන් මිත්තන් කරා ගොස් වන්හ, අනෙක් සත් දවදවසෙකින් නුඹ වහන්සේ කරා එති සි කීයේ යැ. නුඹ පියාණන් වහන්සේ එන ගමනෙක් වත්" සි කියා, දෙදෙන මැ තමන් තමන් ගේ පත් සල් දෙර කඩට පැමිණැ සිටියා හ.

109. ඉක්බිති සඳ මහ රජ්ජුරුවෝ තත්ති තත්ති ආරක්ෂා පිණිසැ අතුත් අසුත් අතුළු බල කායය හිඳුවා, චංකගිරි පර්වතයට ආසන්න වැ ගොස්, තමත් අඹණියත් ළඟසිටි දේවිත් කැඳවා කියන්නාහු, "දේවිනි, අප සියලු දෙන මෑ එක් විටැ ගිය කල්හි, දරුවන් හා අප හා එක විටැ දක්නා ශෝක බොහෝ යැ. පළමු මා ගොස් උත් දැකැ ශෝක සන්හිඳුවූ කලැ තෙපි එව" සි කියා රථයකට නැඟී නික්මැ ගොස්, රථය මහැ රඳවා, තුමූ ගොස් පත් සලට වැදුහ, කේශර සිංහයකු සේ වැඩැ හුන් බෝ සතාණන් දුටු හ.

110. බෝධි සත්වයෝ, පියාණන් දැකැ, හුනස්නෙන් නැඟී පෙර ගමන් කොටැ, බැසැ හෙවැ, වැඳැ වැඩැ හිඳුනා අසුන් පනවා වැඩැ හිඳිවූ හ. රජ්ජුරුවන් බෝ සතාණන් සුව දුක් විචාරා හුන් කලට, මද්‍රිදේවී මසිලණුවන් දැකැ බැසැ හෙවැ වැඳැ සුවදුක් විචාරා, "ස්වාමිනි, මා දරුවන් ගෙනැ ගිය බමුණු කොයි දී දුටු දු?" ඇසුවා යැ. සඳ මහ රජ්ජුරුවන්, "යෙහෙළණියෙනි, මා ගේ රට්ඨ දී දැකැ බමුණාට මිල දී ගලවා ගතිමි" සි කියත් මැ බිසොවුනට මහත් වූ සොමනස් උපන.

111. ඉක්බිති බෝධි සත්වයන් ගේ මෑණියෝ මහ පෙරහරින් යුක්ත වැ, බෝධි සත්වයන් වසන පත් සලට වන් හ. බෝ සතාණන් හා මද්‍රි දේවි මෑණියන් වැඳැ අසුන් පනවා වඩා හිඳුවා සුව දුක් විචාරා හුන් කලට, කෘෂ්ණාජිනාවන් ජාලි කුමාරයන් හා අතු පිටැ සංවා පෙරටු කොටැ ලා, මේකිය රජ්ජුරුවන් අතුළු වූ රජ දරුවන් යෝධයන් හා හේරි, තුසි, සඛ නාදයෙන් ද යුක්ත වැ මහ සෙනඟ පිරිවරා එන කලැ, මද්‍රි දේවි කුමාරයන් දැකැ හඬා ඊ පෙර මඟට ගිය හ.

112. මෑණියන් දැ දැකැ දරු දෙ බිඟින්නෝ අතු පිටින් බැසැ, මෑණියන් දෙ පත්ලෙහි හිස තබා ගෙනැ හඬන්නට වන් හ. බිසොවුන් දෙ තනයෙන් ක්ෂීර ධාරා ච්ඡිද දෙ බිඟින්නන් හිස් තෙමී ගියේ යැ. බෝධි සත්වයෝ ද දෙ බිඟින්නන් දැකැ, මහත් වූ ශෝකයෙන් හඬා හුණ හ.

බෝධි සත්ත්වයන් ගේ මවු පිය දෙ දෙන ද මහත් වූ ශෝකයෙන් සි සන් නැති වැ හඬා හුණහ. චේතිය රජ්ජුරුවන් ඇතුළු වූ රජ දරුවෝ ද හඬා හුණහ. ඒ දැකැ, බෝධි සත්ත්වයන් හා සහ ජාත වූ සැට දහසක් යෝධයන් හා මහ සෙනහ, එක හෙළා මහ පවනින් වැතිරී ගිය සල් වනයක් මෙන් මහ හඬින් හඬා හුණහ. එ කෙණෙහි මහා මේරු පර්වතය ආදි පර්වතයෝ ගුගුළහ. මහ මුහුදු කලපාසන මාරුතයෙන් ක්ෂෝභ වූ කලක් මෙන් කැලැඹුණේ යැ. කාමාවචර දිව්‍ය ලෝකයන්හි ඒක කෝලාහල විය.

113. එසඳැ ශක්‍ර දේවේන්ද්‍රයෝ රජ දරුවන් සදෙන පිරිස් සහිත වැ සි සන් නැති වැ හොත්තවුන් දැකැ, එක-කුදු නැඟි සිටැ කිසිවකු ගේ සිරුරෙහි දිය බින්දුවකුදු ඉසින්නට අසමර්ථ බව දැනැ, "පොකුරු වැස්සක් වස්වමි" සි සිතා, ඒ ක්ෂත්‍රිය සමාගමයෙහි පොකුරු වැස්සක් වැස්වූ හ. ඒ වැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති, නො තෙමෙනු කැමැත්තන් ගේ සිරුරෙහි දිය බින්දුවෙකුදු නො වැටෙයි.

114. ඒ පොකුරු වැස්සෙන් තෙමී සියලු ජනයෝ සි සන් ලදින් විස්මයයට පැමිණැ, වෙස්සන්තර රජ්ජුරුවන් ළඟට ගොස් කියන්නාහු, "ස්වාමීනි, නුඹ වහන්සේ ගේ ගුණ නො දනැ නුවරින් නගා පූම් හ. ජට ක්ෂමා කොටැ අප ගේ නුවරට අවුත් වොටුනු පැලැඳැ අප රක්ෂා කළ මැනැවැ"සි යාච්ඤා කළ හ. බෝධි සත්ත්වයෝ ඒ අසා, "රටැ වැසියෙනි, මා වොටුනු පලඳවන්නට තෙපි අදහස් නො කරවු යැ"සි කියා නො ගිවිස්සා හ. නුවර වාසිහු යාච්ඤා කොටැ නො ගිවිස්නා බව දැනැ, රජ්ජුරුවනට කියන්නාහු, "ස්වාමීනි, අප කීවද නො ගිවිස්නා දැ යැ. නුඹ වහන්සේ යාච්ඤා කළ මැනැවැ"සි කී හ. ඉක්බිති සඳ මහ රජ්ජුරුවෝ බෝධි සත්ත්වයනට කියන්නාහු, "පෙරැ මා කියමන් ගෙනැ මේ වනයට ආවා වේද? දැනුත් මා කියමන් ගෙනැ වොටුනු පැලැඳ රාජ්‍යය

කරව. ගුරුන් කීවා කරන බව සත්පුරුෂයනට අසිහි ධර්මයෙකැ. පුත්‍රයන් විසින් ජීවිත පරිත්‍යාගය කොටැ නමුත් මවු පියන් ගේ ශෝක දුරු කට යුතු වන්නේ යැ. එ බැවින් පුත්‍රය, තාපස වේශය හැරැ රජ වෙස් ගනුව"යි කීයැ.

21. වෙසතුරු රජු නැවැතැ ජයතුරා තුවරට පැමිණීම.

115. බෝධි සත්ත්වයෝ "දෙ මවු පියන් ගේ බස් මැඩැ පිම සුදුසු නොවන්නේ වේ ද?"යි සිතා, පියාණන් ගේ ආරාධනාව පිළිගෙනැ පන් සලට වැද, වල්කල අඳුන් දිවි සම් ආදි සෘෂි භාණ්ඩ බහා තබා, පන් සලින් නික්මැ, "මා සත් මසක් මහණ දම් කොටැ පාරමි ධර්මයන් කුළු ගන්වන්නහු විසින් පොළොව කම්පා කරවන ලද තැන යැ" යි සලකා, පන් සල වටා තුන් වරක් ප්‍රදක්ෂිණා කොටැ පසඟ පිහිටුවා වැඳැ අවුත්, සහ ජාත සැට දහසක් යෝධයන් විසින් පිළියෙළ කරන ලද සුවඳ දියෙන් නහා සළු හැඳැ සුසැව ආභරණයෙන් සැරසී, වොටුනු පැලැඳැ, දේවේන්ද්‍ර ලීලායෙන් සිටියහ. සියලු ජනයෝ මහත් වූ සතෙනාශයට පැමිණැ, මද්‍රි දේවීන්ද ඉස් සෝධා නහවා, දිව්‍යාඩහනාවක මෙන් සරහා වොටුනු පැලැඳැවූහ. එ සඳැ මහ බෝ සතාණන් බැලුබැලු තැන කම්පා විය. සියලු තූර්යයෝ මහත් ඝෝෂ පැවැත්වූවාහුය. මහා සාගරය මේඝ ගර්ජනාවක් සෙයින් මහත් ශබ්ද පැවැත්වී යැ.

116. අමාත්‍යයෝ **පණ්ඩර** නම් ඇළි ඇතු සඳ ගෙනා හ. බෝධි සත්ත්වයෝ ඇතු දැකැ රැහැණී වැ සිතන්නාහු, "ම පියාණන් වහන්සේ මා දන් දුන් ඇතු ගෙන්වා ගත් ද වනැ"යි සිතා ලජ්ජා වූහ. ඒ බව දත් නගර වාසීහු, "ස්වාමීනි,, **කලිඟු** රටැ රජ්ජුරුවෝ තමන් රටැ වැසි වැසැ, බත් බුලත් සුලභ වූ හෙයින්, තුමූ මැ ඇතු එවා පූහ. ඇතු පිටැ නැඟී වදුල මැනැවැ"යි කී හ.

බෝධි සත්ත්වයෝ ඇතු පිටැ නැඟී මහත් පෙරහරින් වංකගිරි පර්වතයෙන් නික්මැ, ඒ සමීපයෙහි වූ සඳ මහ රජ්ජුරුවන් ගේ කඳවුරට පැමිණියහ.

117. සඳ මහ රජාණෝ ද මසක් පමණ පිරිවර හා වනයෙහි කෙලැ ඇවිදු කඳවුරට පැමිණ, වෙස්සන්තර රජ්ජුරුවන් හා සේනා වාහන ගෙනැ, ජූජකුරා නුවරට යන අලඞ්කාර කොවැ පිළියෙල කරන ලද සැට යොදුන් මහට පිළිපන්නාහුයැ. මෙසේ මහට පිළිපන් රජ්ජුරුවෝ දෙමසෙකින් ඒ මහ ගෙවා සර්වාලඞ්කාරයෙන් සැරසූ ජූජකුරා නුවරට පැමිණියහ. සියලු නුවර වාසිහු රැස් වැ සතුටු වැ කෙළිමින් නටමින් පිළි හිසැ සිසාරමින් නොයෙක් කුහුලින් ආකුල වැ ඒ වෙසකුරැ රජ්ජුරුවන් රජ ගෙට වඩා ගෙනැ ගියහ.

118. ඉක්බිති "මේ නුවරැ මෙතැන් පටන් වෙස්සන්තර රජ්ජුරුවන් ගේ ආඥාව යැ" යි අණ බෙර ලැවූවාහුයැ. ඒ වෙසකුරැ මහ රජාණෝ යවත් පිරිසෙයින් බලවූත් දක්වා සියලු සත්ත්වයන් ඛණනයෙන් මිදැවූ හ. ඒ රජ්ජුරුවෝ, නුවරට පැමිණි දිනයෙහි මැ අටුයම් කාලයෙහි සිතන්නාහු "පහත් වූ කලැ මා අා ඔව අසා යාචකයෝ පැමිණෙති. ඔවුනට කුමක් දන් දෙන්නෙම් ද?" යි සිතූහ. එ කෙණෙහි සක් දෙව් රජාණන් ගේ පඬුපුල් සලස්නතමන් නොකැමැති සේ උණුසුම් වූයේයැ. හේ තෙමේ ආවජ්නා කොටැ බලන්නේ, ඒ කරුණ දුනැ, රාජ නිවේසනය හා්පසැ කටි ප්‍රදේශය පමණ උසට ඝනවඕවක් මෙන් සත් රුවන් වඕවක් වැස්වූයේයැ. සියලු ජූජකුරා නුවරැ ද දණක් පමණට සත් රුවන් වැසි වටුයේයැ. දෙවැනි දවසෙහි බෝධි සත්ත්වයෝ, නගරයෙහි ඒ ඒ ගෘහ සමීපයෙහි වට ධනය ඔවුනටම දෙවා, අවශේෂ ධනය භාණ්ඩාගාරයෙහි රැස් කරවා, දන් වැට නබවා, සඳන් හල් කරවා, සියලු යාචකයනට දන් දෙමින්, සියලු ජනයා කුසල්හි පිහිටුවමින් දශ රාජ ධර්ම අකෝපය කිරීමෙන් රාජ්‍යය කොටැ, ජීවිතයා ගේ කෙළවරැ සහ පිරිවරින් ගොස් තුසිත පුරි උපන්හ.

23. සමෝධානය.

119. තී ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ ගාථා දහසෙකින් ප්‍රතිමණ්ඩිත වූ මේ වෙස්සන්තර ජාතකය දක්වා වදාරා, පූර්‍වාපර සන්ධි ගළපා, ජාතකය නිමවා වදාළ සේකැ. එ සමයයෙහි ජූජක බමුණා නම්, දැන් දේවදත්ත ස්ථවිරයෝ යැ. අම්තතාපා බැමිණි නම්, චිඤ්චමාණවිකාවෝ යැ. මේතිය පුත්‍ර වැද්දු නම්, ඡන්න අමාත්‍යයා යැ. අවවුත තාපසයෝ නම්, ශාරිපුත්‍ර ස්ථවිරයෝ යැ. ශක්‍රයෝ නම්, අනුරුද්ධ මහා ස්ථවිරයෝ යැ. සඳ මහ රජ්ජුරුවෝ නම්, ශුද්ධෝදන රජ්ජුරුවෝ යැ. ඵුසති දේවි නම්, මහාමායා දේවි යැ. මද්‍රි දේවි නම්, යශෝධරා දේවි යැ. ජාලි කුමාරයෝ නම්, රාහුල ස්ථවිරයෝ යැ. කෘෂ්ණාජිනාවෝ නම්, උත්පලවණ්ණා මහා ස්ථවිරී යැ. සෙසු පෂිත් නම්, බුදු පිරිස යැ. එ කලැ වලට ගොස් සත් මසක් තපස් කොටැ, නැවැතැ රාජ්‍යයට අවුත්, දශ රාජ ධර්‍මයෙන් රාජ්‍යය කොටැ, තුෂිත දිව්‍ය ලෝකයෙහි උපන්නා වූ වෙස්සන්තර රජ්ජුරුවෝ නම්, තී ලෝ ගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම මැ වේ දැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකැ.

4

භූරිදත්ත ජාතක විවරණය

භූරිදත්ත ජාතක
විවරණය

[මෙහි ඇති අංක, පෙළෙහි ඇති ඡේදයන් හා එහි අංක හා සැසැදෙන්නේ ය.]

1. ශාක්‍ය කුල ප්‍රධාන වූ – ශාක්‍ය වංශයට ප්‍රධාන වූ– සිදු හත් කුමරු උපන්නේ ශාක්‍ය වංශයේ ය.

   ති ලෝ ගුරු – තුන් ලෝකයට ආචාර්‍ය වූ. කාම, රූප, අරූප, යනු තුන් ලොව යි.

   සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ – යහ පත් ලෙස සම්පූර්‍ණයෙන් පිබිදුණු උතුමාණන් වහන්සේ.

   සැවැත් නුවර නිසා – සැවැත් නුවර ගොදුරු ගම් කොටු, සැවැත් නුවර ළඟ.

   ජේතවන මහා විහාරය – අනේපිඬු මහ සිටාණන් විසින් ගොඩ නැංවුණු මහ වෙහෙර.

   පෙහෙවස්–උපෝසථය, පොහො දින රක්නා සිල්.

   අරභයා – නිසා.

2. පොහෝ දවස් – උපෝසථ දිනයෙහි.

   ඉටා – අධිෂ්ඨාන කොටු, සමාදන් වූ.

   එකත් පස් වූ – එක් පසකට වී, හෙවත්, ඉදිරිය, පිටි පස, ඉතා දුර, ඉතා ළඟ, උඩු සුළඟ, යටි සුළඟ, ඉහළ, පහළ, යන අට තැන දුරු කොටු.

   ධම් සභා මණ්ඩපයට – ධර්‍මය සාකච්ඡා කරන සභාවට.

   පනවන ලද – පිළියෙළ කරන ලද.

   බුද්ධාසන මස්තකයෙහි – බුදුන් වැඩ හිඳින ආසනය මුදුනෙහි හෙවත් ආසනයෙහි.

සුගන්ධරු - සුගන්ධරය.

මහ මෙර වටා සත් පවුවෙක් වෙයි. යුගන්ධර, ඊශධර, කරවික, සුදර්ශන, නේමින්ධර, විනතක අශ්වකර්ණ යනු ඒ යැ.

සහස්‍ර රශ්මින් - දහසක් රැසින්.

බාලාර්ක මණ්ඩලය = බාල + අර්ක + මණ්ඩලය- තරුණ සූර්ය මණ්ඩලය (= වට කුරු වස්තුව).

පිත - කහ.

ලෝහිත - රතු,

අවදාත - සුදු.

මාඤ්ජිෂ්ඨ - මදටිය පැහැය.

ප්‍රභාස්වර -
යටැ කී වර්ණයන් ගේ මිශ්‍රණය ප්‍රභාස්වර යැ.

ෂඩ් වර්ණ ඝන බුද්ධ රශ්මි මාලාවන් - ෂය වර්ණ- යෙකැ බහල බුදු රැස් මාලා.

සිව් වණක් පර්ෂත්-සතර වැනි පිරිස්.
භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනු මේ පිරිස් සතර යැ.

පූර්ව චරිත ප්‍රතිසංයුක්ත වූ - පෙර ජාති හා සම්බන්ධ වූ.

අවවාද දායක වූ - අවවාද දෙන්නා වූ.

ආශ්චර්ය - පුදුම.

ආචාර්ය වර කෙනකුන් - ගුරු වර කෙනකුන්.

යශස් - ධනය, සම්පත්තිය.

නො බැණු - කථා නො කැරි.

ප්‍රකාශ යැ - ඉදිරියෙහි පෙනෙන්නේ යැ.

ස්ව බුද්ධීන් - තම නුවණින්.

උපෝෂථ – පොහොය දවසෑ රක්නා සිල්.
මේ වචනය සඳෙසි. පාළි 'උපෝසථ' බලා සැදුණු සේයැ.

නියාව – ආකාරය.

භවාන්තර ප්‍රවේශන්න – අන්‍ය භවයෙන් වැසුණු.

ආරාධිත වූවාහු – ආරාධනා කරන ලද්දාහු.

ඉකුත් වත් – පසු ගිය ජාතිය පිළිබඳ කථා වස්තුව.

3. දහැමින් – ධර්මයෙන්.

යුව රජ තනතුර – දෙ වැනි රජ තනතුර.

යස පිරිවර – සම්පත්තිය හා පරිවාර ජනයා ද.

අභිප්‍රාය – ආශාව, කැමැත්ත.

මා ගේ ඇවෑමෙන් – මා ගේ ඉකුත් වීමෙන් හෙවත් මරණයට පසු.

කුල සන්තක වූ – කුලයට අයිති වූ.

ප්‍රතිවචන – පිළිතුරු, උත්තර.

සමු ගෙනැ – අවසර ගෙනැ.

යමුනා –
දැනට 'ජමිනා' යි එයට නමී.

පත් සලක් – කොළ සෙවිලි කරන ලද ගෙයක්.

4. වල්ලභයන් – ස්වාමීන්.

නාග මානවිකාවක් – තරුණ නාග ස්ත්‍රියක්.

කෙලෙස් – සිත කිලුටු කරන දේ.

නාග භවනයෙන් – නාග ලෝකයෙන්.

සමුද්‍ර තීරයෙහි – මුහුදු වෙරළැ.

පියවර සටහන් – පා ලකුණු.

පදානුසාරයෙන් = පද + අනුසාරයෙන් – පද අනුව ගමනින්.

තවුස් පිරිකර – තපස් රකින්නවුනට සුදුසු පරිෂ්කාර හෙවත් වුව මනා දෑ.

සැදැහැයෙන් – ශ්‍රද්ධායෙන්.

නෛෂ්ක්‍රම්‍ය – ගිහි ගෙයින් වෙන් වෑ පැවිදි වීම සඳහා නික්මෑ යාම.

පඤ්ච කාමය – ඇලුම් පස.
එ නම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන මේ යැ.

5. නො-හැමැදෑ – අතු නො ගා.

වසඟ කොටෑ ගන්නට – යටත් කොටෑ ගන්නට.

සක්මන – භාවනා කරමින් ඇවිදිනා මාර්ගය.

6. අසපුවට – ආශ්‍රමයට.

පිළිබඳ වූ සිත් ඇති වෑ – ප්‍රතිබද්ධ වූ හෙවත් ඇලුණා වූ සිත් ඇති වෑ.

සස්වාමිකයෙහි ද, අස්වාමිකයෙහි ද – ස්වාමියකු ඇත්තෙහි ද, ස්වාමියකු නැත්තෙහි ද.

වැන්දඹුයෙමි –

පෙර සිටි ස්වාමියා මළ තැනැත්තිය වැන්දඹුව නමි.

උකටලී වෑ – කළකිරී.

නෙරෝපූ – පලවන ලද.

7. මා ඇඟිවූ – ඉතා අඟනා වූ.

මහාර්ඝ වූ – ඉතා වටනා වූ.

පර්‍යඞ්කයක් – පළඟක්, ආසනයක්.

දරු ගබක් ලැබෑ – දරුවකු කුසෑ පිළිසිඳී.

පියවර නහා – පාද ඔසවා.

8. වන චරකයෙක් – වනයෙකැ හැසිරෙන්නෙක්. වැදි ආදීහු වන චරකයෝ යැ.

කාල ක්‍රියා කළ හ – මරණයට පැමිණිය හ.

ආදාහන කෘත්‍ය කොටැ – මළ සිරුර දවිමේ කට ශ්‍රුත්ත කොටැ.

අරාජක වැ – රජ කෙනකු නොමැති වැ.

ප්‍රස් රථය – රජ කෙනකු තෝරා ගැනීම පිණිස හරින හිස් රථය.

සත්කාර සම්මාන කොටැ – ආදර ගෞරව කොටැ, සැප සාත්තු කොටැ.

මාඡී නායක – මඟ පෙන්වන්නා.

පිළිසඳර කථා – සුව දුක් විචාරීම් වශයෙන් කැරෙන කථා.

රාජ්‍යය පිළිපැද්දූ මැනැවැ සි – රජ කමෙහි යෙදුන මැනැවැ සි.

9. දළ පුඹු සේ සත් – ඇත් දළින් කරන ලද පුඹුවක් (හෙවත් මිටෙහි කරන ලද ගෝලයක්) ඇති ස්වේතචඡත්‍රය හෙවත් සුදු කුඩය.

පුරාඞ්ගනාවනට – පුර ස්ත්‍රීනට.

උග්‍ර වූ විෂ තේජස් – බලවත් වූ විෂ බල.

ක්ෂණ කෝපියම් හ – වහා කිපෙන්නම් හ.

ස්වල්ප මාත්‍ර වූ – ටික ප්‍රමාණ වූ.

කිපෙන සුලු වම් හ – කෝපයට පත් වන ස්වභාවය ඇතියම් හ.

සපත්නී රෝෂයෙන් – සපත්නීන් කෙරෙහි ඇති වන රෝෂයෙන් (=ක්‍රෝධයෙන්).

සමාන පතියක්හු හෙවත් එක ස්වාමි පුරුෂයකු මැ ඇති භාර්‍යාවෝ ඔවුනොවුන් සපත්නී නමු.

බැරෑරුම් – බර.

රඹු මිටක් – වී පොතු මිටක්, දහයියා මිටක්.

සුසු වියුහු වැ – ලොකු කුඩා කැබැලිවලට කැඩී.

10. ස්නේහයෙක් – ආලයෙක්.

පෙම් කොටැ – ආදර කොටැ.

අප්‍රමාද වව – පමා නො වව.

මේ දරැවෝ වූ කලි – මේ දරැවෝ නම්.

දිය බිජු වටින් – ජල බීජයෙන්, දියෙහි ලන ලද බිජුයෙන්.

සිවුමැලියෝ යැ – සුකුමාරයෝ යැ, මොලොක් ප්‍රකෘති ඇත්තෝ යැ.

කණවා – හාරවා.

ගෘහෝද්‍යානයෙහි – ගෙ උයනෙහි.

ජල ක්‍රීඩා – දිය කෙළි.

පැදකුණු කොටැ – ප්‍රදක්ෂිණා කොටැ.
දකුණත යමකු පසින් සිටින සේ වටේ යෑම පැදකුණු කිරීම යි.

ළෙහි හොවා – පපුවෙහි තබා.

අතුරැ දන් වැ – අන්තර්ධාන වැ, නො පෙනී ගොස්.

දෙමිනිස – කනගාටුව.

පිසැ – පහ කොටැ.

11. අභිෂේක කොටැ – මුදුනෙහි දිය වත් කොටැ.
බටුහු පැළැඳැවීමෙහි දී මුදුනෙහි දිය වත්–කිරීම සිරිත යැ.

ගැලකට – බඩු අදිනා රථයකට.

වණී ගන්ධයෙන් යුක්ත වූ – යහ පත් පාවින් හා සුවඳින් හා යුතු.

සොළොස් දහසක් – දහසය දහසක්.

වනිතාවන් – ස්ත්‍රීන්.

මතු මහල් තලයෙහි – මුදුන් තට්ටුවෙහි.
නිරන්තරයෙන් – අතුරක් නොමැති ව.

12. සොරොවුවෙන් – දිය වදිනා නළයෙන්.
භයින් ත්‍රස්ත වැ – භයින් තැති ගැසී.
විධාන කොළෝ යැ – අණ කොළෝ යැ.
බදු ගෙනැ – අල්ලා ගෙනැ.
වධ කොටැ – වධ දී.

13. රාජ ද්‍රෝහියා යැ–රජ හට විරුඬ වූ තැනැත්තේ යැ.
වනැ ලා – වං ගෙඩියෙහි දමා.
සුනු කොටැ – චූණී කොටැ, කුඩු කොටැ.
තුන් පාකයෙකින් පිසැ – පිසීම් තුනෙකින් පිසැ.
පලහා – පුලුස්සා.
ඉදිබු කබලින් –
ඉදිබුවා ගේ පිට කටුව කබල සි.

14. උදක භීරුක වූ – ජලයට භය වූ.
සළා වැටුමකට – සුළියකට.
කම් කට්ටල්ලක් – වදයක්, කම්යෙන් වූ දුකක්.
නියෝග කෙරෙහි ද – නියම කෙරෙහි ද.
චණ්ඩ යැ – නපුරු යැ.

15. ජල ප්‍රවාහයෙහි – දිය පහරෙහි.
මානවකයෝ – තරුණයෝ.
සන්තක වැ – අයත් වැ.
මෙහෙවර ආමි – පණිවුඩ ගෙනැ ආමි.

16. ලාමක – පහත්.
රාජ වල්ලභ වැ – රජුනට විශ්වාසී වැ.
පරිභව – අපහාස.

17. තර කොටෑ ගත්නට – ස්ථිර කොටෑ ගත්නට.
පණ්ත් – පිරිස්.
පාවා ගත මැනැවැ – සරණ කැරී ගත මැනැවැ.

18. ඇඹුල – ඕළු.
උපුල – උත්පල, මහ නිල්.
නෙළඹුල = නෙළඹු + අල – නෙළුම් අල.
නෙළඹු දැළි – නෙළුම් දඬු.
පෙරාතු කොටෑ – පළමු කොටෑ.

19. මුක්තා මාණික්‍යාදි – මුතු මැණික් ආදි.
පඩුරු කොටෑ – තෑග කොටෑ.
පාද පරිචාරිකා කොටෑ – භාර්‍යාව කොටෑ.
තිරශ්චිනයන් – තිරිසනුන්.

20. ඉදින් – යම් හෙයෙකින්.
සේවක වූ – සේවය කරන්නා වූ.
ජනේශ්වර වූ = ජන + ඊශ්වර වූ – මිනිසුනට අධිපති වූ.
හරන ලද මැ යැ - අත් හරින ලද්දේ මැ යැ.
අනුභාව රහිත – අනුභාව නැති.
මහිමයක් –පුදුමයක්.
සෘඞ්මත් වූ – සෘඞ්ධි ඇති.
යස පිරිවර – යශස් හා පරිවාර ද.

21. නායකය හ – ප්‍රධානය හ.
විශිෂ්ට වූ – ඉතා උසස් වූ.
සංවාසයට – එකට විසීමට.
මණ්ඩූක භක්ෂණය කරන්නා වූ – මැඩියන් (ගෙම්–ඔන්) අනුභව කරන.

22. නාසා වාතයෙන් – නාසයෙන් හෙළන ලද වාතයෙන්.

නිෂ්කාරණයේ – කරුණක් නොමැති වැ.

ආක්‍රෝශ පරිභව – රළු බැණුම්.

ජාති මදයෙන් – 'උසස් කුලයෙන් පැවැතෙමි' සි ඇති වන මදයෙන්.

23. මෙර – මහා මේරු පර්වතය.

සතර අනුදිග – සතර දිග අතරැ පිහිටි අනෙක් දිශා සතර – එ නම් : වයඹ, නිරිත, ඉසැන කොන, ඊශාන.

භෂ්ම – අළු.

24. අවශේෂ – ඉතිරි.

වීපී චතුෂ්කයෙහිත් – වීපී සතරෙහිත්.

වෘක්ෂයෙහිත් – ගසෙහිත්.

එලෙවූ – එල්බෙනු, එල්ලෙනු.

ප්‍රාසාදාග්‍රයෙහි – ප්‍රාසාදයෙ මුදුනෙහි.

දැලවරත් = දෙ + අැලවරත් – දෙ පසෙහිත්.

කඹුරු සම් – මසින හම්.

'කඹුරු' යනු සංස්කෘතයෙහි ආ කර්මාර ශබ්දයෙන් බිඳුණෙකි. කර්මාරයන් ගේ හෙවත් ලොහො කම කරුවන් ගේ උදුන කඹුරු උදුන සි. ඔවුන් විසින් ලොහො උණු කිරීම පිණිස ගිනි පිඹීමට ගන්නා සම කඹුරු සම සි.

මඬනා – තද කරන.

වෘද්ධයෝ යැ – මහල්ලෝ යැ.

ගර්භිණීහු යැ – ගබ් ගෙන සිටින්නාහු යැ.

සර්වාඞ්ගයෙන් ධවල වූ – සියලු අැඟින් මැ සුදු වූ.

පෙණ ගහීයෙන් – පෙණ ගැබින්.

ඒකාන්ධකාර කොටැ – එක සේ කළුවර කොටැ,

25. රක්ත නීල ශ්වේතාදි (=ශ්වේත + ආදි) වූ – රතු නිල් සුදු ආදි වූ.

පෑහෑ – ප්‍රභා, වණ්.

මනුෂ්‍යයන් ගේ සංචාරයෙහිත් – මිනිසුන් හැසිරෙන තැනෙහිත්.

සුස්ම සුස්මා – පිඹු පිඹු, සුසුම් හරිමින්.

ඝෝනැස් – පරාළ.

26. පාන් වෑ ඝිය කල්හි – හිරු පෑවූ සඳෙහි.

ආශ්වාස ප්‍රශ්වාසයෙන් – සුස්ම ඇදීමෙන් හා පිට කිරීමෙන් ද.

උපුටෑ පියන කලක් මෙන් – උදුරා දමන කලක් මෙන්.

27. ඟවුවක් – මසිල එකකුත් තුන් කාලක් පමණ දුරක්.

පසු බා ගෙනෑ – පසු බැසෑ ගෙනෑ.

පඬුරෑ – තෑගි.

28. පාවා දී – බාර දී.

සී මැඳුරෑ – සිංහ පඤ්ජර කාවාටය, සිංහ කුඛුවක් මෙන් තැනුණු කවුළුව.

සවී + ආභරණයෙත් – සියලු ආභරණයෙන්, සියලු පළඳනායෙන්.

යානාවෙකෑ – රියෙකෑ, කරත්තයෙකෑ.

දිව යහනෙකෑ – දිව්‍යමය වූ ඇදෙකෑ.

පෙරළා – ආ පසු.

කුරුන් – මිටි මිනිසුන්.

පරිචාරිකාවන් – වැඩ කරුවන්.

අවට කටයුතු උදෙසා හැසිරෙන්නෝ 'පරිචාරක' නමි.

හොත් පමණෙකින් මෑ – නිදා ගත් විගසැ මෑ.

දිව පහස් – දිව්‍ය ස්පර්ශී.

අන්තර්ධාන වෑ – අතුරු දහන් වෑ.

29. මැණික්මය – මාණික්‍යයෙන් සාදන ලද.

උද්‍යාන පුෂ්කරිණීන් – උයන් හා පොකුණු ද.

ස්වාමි පුත්‍රයාණන් වහන්සේ සන්තක – හිමියාට අයිති.

ඓශ්වර්‍යී – ඉසුරු.

30. යොදුන් –

ගව් සතරක් යොදුනෙකි. ඒ නම් මයිල සතක් පමණි.

රාජාඥ – රජහු ගේ අණ.

ප්‍රිය සංවාසයෙන් – කැමැති පරිදි සමඟ වෑ විසීමෙන්.

31. මෑත භාගයෙහි – ළඟ කාලයෙහි.

දරු ගර්භයක් ලැබෑ – දරු ගබක් පිළිටා.

නාග භවනය නියාව – නාග ලෝකය බව.

32. ජීවිත ක්ෂයයට පමුණුවා – ජීවිතයෙහි කෙළවරට හෙවත් මරණයට පමුණුවා.

ක්ෂමා කළ මැනැවැ – කමාව දුන මැනැවි.

විඥ බවට – නුවණැති බවට.

33. බෑයනට – භ්‍රාතෘන්ට, සහෝදරයන්ට.

විසඳූ – විසර්ජනය කොටෑ, තෝරා බේරා,

උපස්ථානයට – සේවයට.

34. ත්‍රයස්ත්‍රිංශත් දිව්‍ය ලෝකය – තව් තිසා දෙව් ලොව. පෙරැ බුදුහු මෙ මානවක සමයයෙහි මානවකයන් තිස් තුන් දෙනකු හා ගොස් උපන් හෙයින් මෙ නම්.

විසර්ජනය කළ හ – විසැඳූ හ.

බෝධි සත්ත්වයනව –
බුදු බව ලබනු සඳහා නොයෙකුත් ජාතියෙහි පැරැම් දම් පුරා එනුයේ බෝධි සත්ත්ව නමි.

විපුල වූ – විශාල වූ
ප්‍රඥයෙන් – නුවණින්.

35. අලඞ්කෘත වූ – අලඞ්කාර කරන ලද.
හාව භාව ලීලා – සිතැ තුළැ වන අදහස් අඟ පසඟින් ප්‍රකාශ කිරීම.
කටාක්ෂ – නෙත් කොනින් බැල්ම.
මන්ද ස්මිතය – මඳ සිනාව.
දිව්‍යාප්සරාවන් – (= දිව්‍ය+අප්සරාවන්) දිව්‍යාඞ්ගනාවන්.
අති මනෝ හර – ඉතා මැත් සිත් ඇද ගන්නා සුලු.
තෘෂ්ණාව – ආශාව.

ශූන්‍ය විමානයෙකැ – සතුන් ගෙන් හිස් තැනෙකැ.
ආරාම + උද්‍යාන + ආදියෙහි – වතු පිටි ආදියෙහි.

36. ආනත + විතත + ආදි වූ පඤ්ච + අඞ්ගික + තූයශී– ආනත, විතත, විතතාතත, ඝන, ශුෂිර යන පස් කොටස් වූ තූයශී.
'ආනත' යනු එකැස් බෙර යැ. 'විතත' යනු දෙ ඇස් බෙර යැ. 'විතතාතත', තුන් ඇස් බෙර යැ. 'ඝන', කංසු තාලම් හෙවත් තාලම් පොට යැ, 'ශුෂිර' යනු හොරණෑ නළා ආදි බඹු යැ.

තූයශී – මිහිරි හඬ නංවන භාණ්ඩ.
මස්තක නො චන්නේ යැ – මුඳුන් නො පැමිණෙන්නේ යැ.
මනුෂ්‍ය පථයට – මිනිසුන් වසන ප්‍රදේශයට.
චතුරඞ්ග සමන්නාගත වූ – අඞ්ග සතරෙකින් යුක්ත වූ.

අරුණු නැහෙන වේලෙහි – ඉර උදා වන වේලෙහි.
සිවු අඟින් – සතර අඬහයෙන්.
නඟුල් + ඉසක් පමණ – නඟුලෙහි හිසක් පමණ.
ඉකුත් වූයේ යැ – ගත වූයේ යැ.

37. වහසල් දෙර – මාළිගා දෙර.
යහුල් බැඳීම යැ – යකඩ උල් සිටුවීම යැ.
මල එලීම යැ – තොන්බු දැමීම යැ.
ශර ප්‍රහාරය – හී පහර.
නඃග්‍රෝධ වෘක්ෂය – නුග ගස.
වෙළෙප් – විටප, අතු බැඳුණු තැන්.

38. මල් අස්නක් – මලින් කළ ආසනයක්.
සපී වේශය අන්තර්ධාන කොටැ – නයි වෙස අතුරුදහන් කොටැ.
ලීලායෙන් – ආකාරයෙන්.
පුෂ්පාසන – මල් ආසන.
භේරි තූර්‍ය ශබ්දය – බෙර හඬ.
ප්‍රවෘත්තිය – ආරංචිය, තොරතුර.
පොබයා – ප්‍රබෝධ කරවා, නින්දෙන් නැඟිටුවා.
වන්නා ව – වන දෙයෙක් වේ වා.
මිරිකුණේ – මහන්සි වූයේ.
එකලා වූ හ – තනි වූ හ.

39. වක්‍ෂ ස්ථල – ළය, පපුව.
සඛණී සෝයුරාභරණයෙන් – රන් වළල්ලෙන්.
දුලන්නා වූ – දිලියෙන්නා වූ.
දර්ශනීය වූ – දැකුම් කට යුතු වූ.
වඟ්නි ස්කන්ධයක් – ගිනි කඳක්.

හිතෙල් වත් කළ හින්න දිලියෙමින් බුර බුරා ඇවිලේ.

තත් වූ පරිද්දෙන් – ඇති සැටියට මැ.

40. අදහන්නේ මැ යැ – විශ්වාස කරන්නේ මැ යැ.

එ තෙකුදු වුවත් – එ සේ වී නමුත්.

41. චණ්ඩ – රෞද්ර.

අහි තුණ්ඩිකයන් – නයින් අල්ලන්නන්.

මෙහි නිවැරැදි වචනය 'අහි තුණ්ඩික' වේ.

සිත් කදුවූ – සිතට ප්‍රිය එලවන.

සළා වැටුම් – දිය සුළි.

සත්පුරුෂ ප්‍රමාණ වූ – සත්පුරුෂයනට යෝග්‍ය වූ

උභය තීරයෙහි – ඉවුරු දෙකෙහි.

වන ළැහැප්වලැ – වන රොදවලැ.

රැව පිළිරැව – රාව ප්‍රතිරාව, නාද අනුනාද.

වැහෙන්නේ යැ – වැගිරෙන්නේ යැ.

ආචාර ශීලය – යහ පත් පැවැත්ම.

ක්ෂේම භූමිය – ආරක්ෂාව ඇති තැන.

අභීත වැ – භය නැති වැ.

වස්තු කාම ස්ලේශ කාමයෙන් ප්‍රදන ලදු වැ – ආශා වස්තුයෙන් හා කැමැති ඉඳුරන් පිනවන දෙයින් ද පූජා කරන ලදු වැ.

42. දිව්‍යාත්ම භාවය – දිව්‍යමය ශරීරය.

උකටලී නො වැ – නො කලකිරී.

43. බණිනාගාරයන් – සිර ගෙයන්.

මල් බැයන් – බාල සහෝදරයන්.

හිවිස්සේ යැ – කැමැති වූයේ යැ.

44. ස්වර්ගී ලෝකෝත්පත්තිය නිසා යැ – දිව්‍ය ලෝක–
යෙහි ඉපැදීම පිණිස යැ.

වෘත්තියෙන් – රක්ෂාවෙන්.

අනුදනිති – අවසර දෙති.

හාත්පසින් (=සිවු+අත්+පසින්) – හතර වටින්.

පෘථිවිය – පොළොව.

තුවරලා – කවිටකුමඤ්ඤල්.

සමන්විත යැ – ගැවැසී ගත්තේ යැ.

රතිඳුගොව්වන් – රතු රෑ බදුල්ලන්.

වන ෂටයෙන් – වන සමූහයෙන්.

ගද් ගද ස්වරයෙන් – 'ගද් ගද' යන හඬින්.

වගුළ – වැගුරුණු, වැටුණු.

කුශල සමෘද්ධියෙන් – පිනෙහි වැඩි බවෙන්.

නිර්මිත වූ – පැන නැඟුණු, සැදුණු.

අටැස් කොටැ – අෂ්ටාග්‍ර (අට කොනක්) ඇති කොටැ.

වෛදූර්‍යමය – වෙරළු මිණියෙන් කරන ලද.

ස්තම්භයෝ – කුළුණු, කණු.

ටැඹින් – කුළුණින්.
ටැම් = කුළුණු, කණු.

රම්‍ය වූ – සිත අලවන.

දෙ දෙව්ලොව – චාතුර්මහා රාජික, ත්‍රයස්ත්‍රිංශත්
(තාවතිංස) යන දිව්‍ය ලෝක දෙක.

යසස් සමෘද්ධිය – සම්පත්ති සමූහය.

වෛජයන්ත ප්‍රාසාදය –
ශක්‍ර දේවේන්ද්‍රයන් ගේ ප්‍රාසාදයට මෙ නම්.

45. නො වටනම් හ – නො අඟනම් හ, නො වටින්න–මෝ යැ.

සතර වරම් මහ රජ දරු කෙනෙක් – ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යනු සතර වරම් රජ දරුවෝ යැ.

වසඟයෙහි – යටතෙහි.

46. අවසරයක් – ඉඩක්.

47. ඉෂ්ටාර්ථ (=ඉෂ්ට+අර්ථ) ප්‍රසවය – කැමැති කැමැති දේ සිද්ධ කිරීම.

අනෂ්– ඉතා වටිනා.

ගව මහිෂ – එළ හරක් හා මී හරක් ද.

සුඛිත මුදිත වන්නේ යැ – සැප ඇති වැ සතුටට පත් වන්නේ යැ.

පුත්‍ර දුරාදීන් – පුතුන් හා භාර්‍යාවන් ද ආදීන්.

පෝෂ්‍ය කොටැ – වඩා.

නිරවද්‍ය යැ – නිවැරැදි යැ.

48. බ්‍රහ්ම චර්‍යා වාසය – ස්ත්‍රී පුරුෂ ආශ්‍රය නොමැති වැ විසීම.

භඞ්ග වන්නේ යැ – බිඳෙන්නේ යැ.

සන්තුෂ්ට වෙමි – සතුටු වෙමි.

49. තෙප් –
'ඉතබ' නම් අනින ආයුධ විශේෂයෙකි.

වලප්නට – වැලැපෙන්නට.

වලැ – වනයෙහි.

50. සන්තර්‍පණය – සැනැප්පවීම.

51. පිට මධ්‍යයේ නළා – පිට මැදට ගසා.

අසි ද? – ආවෙහි ද?

නැති ගැන්වූ යැ – භය ගැන්වූ යැ.

ජීවිකා වෘත්තිය – දිවි පැවැත්ම.

52. දක්ෂිණ මහා සමුද්‍රයෙහි – දකුණු දිගැ මහ මුහුදෙහි.

දිස් හිඹුලේ – දිසා පුදුත් ගසෙහි.
මෙය දකුණු දිසාවෙහි වෙති සි යෙති.

පක්ෂ මාරුතයෙන් – පියා පත් ගසන විට නැඟෙන සුළඟින්.

පණ්ඩර නාග ජාතකය –
පණ්ඩර නා රජු ගෙන් ගුරුළු රජු උගත් දෘඝ් නම් නයින් වලඟින් මිස හිසින් නො ඇල්ලිම සි.
මෙය ජාතක පොතෙහි එයි.

දෙ බේ වැ – දෑ භේද වැ, දෙකට බෙදී.

53. ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් – ඍෂීන් ගේ පැවිදි වීමෙන්.

දිවා විහාර කොටැ – දහවල් කාලය ගත කොට.

පක්ෂ ප්‍රහාරය කොටැ – පියා පත් ගසමින්.

උපුටැ – ඉගිළී.

තත්ත්ව හෙයින් – ඇති තතු පරිද්දෙන්.

54. ප්‍රශ්න ව්‍යාකරණයෙහි – පැන විසැඳීමෙහි.

ආලම්බන මන්ත්‍රයක් – වසඟ කැරැ ගන්නට හැකි මන්ත්‍රයක්.

ඖෂධය - බෙහෙත.

55. තුඩැ වැකි බස් බණන ලද්දේ – තොලැ ගැවුණු වචන කථා කරන ලද්දේ, කටට ආ ආ වචන කියන ලද්දේ.

නිමන්ත්‍රණය කොටැ – අමතා.

රාජාවක් – රිදීමක්.

ව්‍යාජයක් – මායාවක්, බොරුවක්.

මන්ත්‍රය පිරිවමින් – මතුරමින්.

56. පරිචාරිකා වූ – පිරිවර සත්‍රී වූ.
ඡප්සිත + අර්‍ථ + සිද්ධිය කරන්නා වූ – කැමැති අදහස් ඉටු කරන්නා වූ.
ඵල සමෘද්ධියෙක් – මහත් ප්‍රයෝජනයෙක්.

57. වංචා කොටැ – රවටා.
මුවින් නො බැණැ හුන මැනැවැ – කථා නොකළ මැනැවැ.
අභිවෘද්ධි කර වූ – වැඩි දියුණුව ඇති කරන්නා වූ.
අභිමත + අර්‍ථ – කැමැති අදහස්.

58. අවණී ප්‍රකාශ කොටැ – දෙස් දක්වා.
උපචාර – පිදුම්.
මානය කරන්නට – ගෞරව කරන්නට.
බැරීම් – අසිහි කැරැ ගැනීම්.
ඉෂ්ට + අර්‍ථ + ප්‍රසවය – කැමැති වස්තු ගෙනැ දීම.
උපචාර විපන්න වූ – පූජා සත්කාරයා ගේ විපත්ති ඇති.
නුනුවණින් – මෝඩ බැවින්.
නිර් + ආදර වැ – ආදර නැති වැ.
පරිහරණය – පාවිච්චිය.
කළ මනා විධි විධාන – කළ යුතු පැවැතියැ යුතු විධි පිළිවෙළ.

59. ගව + මහිෂ + ආදි – එළ හරක් මී හරක් ආදි.
විකිණී ගත යුතු නො වෙයි – මිල දී ගතැ යුතු නො වෙයි.
ගෙරි හරක් – ගව්‍යන්.
තේජස් වූ – බල සම්පන්න වූ.

මැඩැ පැවැත්තැ නො හැක්කා වූ – යටත් නොකොටැ හැක්කා වූ.

ප්‍රඥා සමාධියෙන් බබළන්නා වූ – සම්පූර්ණ පැහැයෙන් බබළන.

60. බ්‍රාහ්මණ වේශයෙන් – බමුණකු ගේ වෙසින්.

ගෝචරයට සුදුසු වූ – ගොදුරට හෙවත් ආහාරයට සුදුසු වූ.

මා දුටු විරූ වත් නැති – මා කිසි කලෙකැ දැකැ නැති.

සජීයන් මදීනය කිරීම් ඇති – සජීයන් ඉක්මැ – වීමට හැකි.

විෂ + වෛද්‍ය + ආවාසී වූ – විෂයට වෙද කම් කරන ඇදුරෙක් වූ.

උපස්ථම්භක කොටැ – උපකාර හෙවත් පිහිට කොටැ.

61. කෞශික ගෝත්‍ර ඇති – කෞශික නම් ගෝත්‍රයෙහි හෙවත් වංශයට අයත්.

පැවිදි වූ බොහෝ කල් ඇති – මහණ වැ බොහෝ කල් ගිය.

වල්ගි – වනයෙහි.

නිරුත්තර වූ – අන් සියල්ලට මැ වඩා උතුම්.

භාවනා + අභියෝගයෙන් – භාවනායෙහි විශේෂයෙන් යෙදීමෙන්.

පර්වත ප්‍රාන්තයෙහි – පර්වතය බෑවුමෙහි.

නො පමා වැ – ප්‍රමාද නො වැ.

ශීල ව්‍රත සමාදාන – සිල් පද රැකීම් පිළිබඳ පොරොන්දු.

විධි විධාන – ක්‍රම නියමය.

නො බමි – භය නො වෙමි.

විෂ බාන්නට – විෂ බස්වන්නට.

62. ශ්‍රී කාන්තාව – විෂ්ණු ගේ භාර්‍යාව.
මෝහයෙන් ද්‍රෝහ කරන්නට – මුළාවෙන් වරදනට.

63. මූ කළ හෙයින් – මේරූ හෙයින්.
ලෝක ප්‍රවෘත්ති – ලෝකයෙහි පිළිවෙළ.
හසහ ප්‍රාප්ත වූ – අතට පැමිණි.
ඉවත් කොටැ පිම – අහක් කැරැ දැමීම.
මිත්‍ර ද්‍රෝහ – මිතුරාට වරදවන.
විවර වැ – ඇරී.

64. යාග කර්‍මයෙන් පාප ප්‍රවාහය කොටැ පිරිසුදු වෙති – යාග කිරීමෙන් පව් සෝදා හැරීමෙන් පිරිසුදු බවට පැමිණෙත්.
නංවා ගත නොහී-ඒත්තු කරවන්නට නොහැකි වැ.
දේවතා + උජ්ඣානය කොටැ – දෙවියනට පැමිණිලි කොටැ.
පාප කාරී වූ – පව් කරන්නා වූ.
පඤ්ච + අභිඤ්ඤා – පස් උසස් නැණ.
ඉඞ්ඝි විධ (ඍඞ්ධිය), දිබ්බසෝත (දිව කන), පර සිත් දන්නා නුවණ, පෙරැ කළ පිළිවෙළ දන්නා නුවණ, දිවැ'ස– මේ පස යි.
අෂ්ට සමාපත්ති – ප්‍රථම, විතීය, තෘතීය, චතුර්‍ථ යන ධ්‍යාන සතර, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන සමාපත්ති අට.

65. තෙල – මේ.
රතිඳු ගොව්වන් පිටැ පැ සමාන වූ – රකෙතාඳු-ගෝපකයන් ගේ පිටෙහි පාට හා සමාන වූ. ඉඳු ගෝපකයන් එක වර්‍ණයක ගේ පිට පැහැය රතු යැ. අනෙකුත් ගේ සුදු යැ.
පොළන ලද – අවුල් හරින ලද.
ධවල වූ – සුදු වූ.

66. බණබ වන්නේ යැ – කැඩෙන්නේ යැ.
අතුරේ ලා පලහා නමුත් – අතුරේ දමා පුළුස්සා නමුත්.
උලෑ අවුණා නමුත් – උලෑ ගිඳුවා වුවත්.
විෂ ධූමයක් – විෂ වන දුමක්.
විෂ වහ්නියක් – විෂ වන ගින්නක්.
බලා පුයෙම් විම් නම් – බැලුයෙම් විම් නම්.
විෂ තේජසින් – විෂයෙහි බලයෙන්.
රඹු මිටක් – දහයියා මිටක්.

67. මැණික කිසිවක් කොවැත් නො සිතා – මැණික ඉතා සුළු දෙයක් කොටැත් නො සිතා.
නිරාශ වැ – ආශා නැති වැ.
ගිලිහී – ගැලැවී.
නො ගිවිස්සෙම් – එකඟ නො වූයෙමි.

68. ශරීරය වකා ගෙනැ – ඇඟැ තවරා ගෙනැ.
ශරීර + අභ්‍යන්තරයෙන් – ඇඟ ඇතුළින්.
පරිභාවිත කොටැ – මනා වැ පාවිච්චි කොටැ.
පිරැවමින් – මතුරමින්.
තර කොටැ – සීර කොටැ, තද කොටැ.
ඖෂධ සපා – බෙහෙත් ද්‍රව්‍ය විකා.
පවිත්‍ර ශීලී වූ – පිරිසුදු සිල් ඇති.
ශීල භේද භයින් – ශීලය බිඳේ යැ යන භයින්.
හාල් බිස්සක් – හාල් ගොඩක්.
දැතින් මැඹි යැ – අත් දෙකෙන් මිරිකී යැ.
පිළි අපුල්ලන්නාක් මෙන් – රෙදි අපුල්ලන්නාක් මෙන්.

69. විලුඹින් ඇනැ ඇනැ වදවා – විලුඹින් ඇනැ ඇනැ ඇතුළු කොටැ.
පෙළාව – පෙට්ටිය.

70. සතරැස් – චතුරශ්‍ර, සතර පැත්තක් ඇති.
අටැස් – අෂ්ටාශ්‍ර, අට පැති.
මදට වන් – මාෂ්ඨජිෂ්ඨ වණී, මඳවීය පාට.

71. ධරා ගත නුහුණුවා හ – දරා ගැන්මට බැරි වූ හ.
හැරැ නුපුයේ යැ – අත් හැරැ දැමීමේ නැති.

72. කුටුම්බ සණ්ඨාපනය කොටැ – පවුලක් පිහිටුවා.
වාසල් දෙරැ – දෙරටුයෙහි.
අද නුඹ වහන්සේට කෙළවමි – අද නුඹ වහන්සේ ගේ විනෝදය පිණිස ක්‍රීඩා කරවමි.
රාජ + අංගනයෙහි – රජ මිදුලෙහි.

73. සඵනයක් – සිහිනයක්.
කර්‍ෂ වූ – රළු වූ.
උපද්‍රවයෙක් – අනතුරෙක්.
අවශේෂයෝ – ඉතිරි අය.
දෙමනස් වූ හ – දුක් සහ ගත සිතිවිලි ඇති කළ හ.

74. චක්ඛුර් + ආදි + ඉන්‍ද්‍රියයෝ – ඇස්ආදි ඉන්‍ද්‍රියයෝ.
ප්‍රසන්න නො වෙති – පැහැදිලි නො වෙති.
රන් කැඩ සතක් – රන් කන්නාඹියක්.
කෘෂ්ණ වණී වැ – කළු පාට වැ.
පද්මයෙක් – නෙළුම් මලෙක්.
මලානික වැ යේ ද – මැලැවී යයි ද.
නිශ්ශෝභ වූ සේකැ – ශෝභා නැති වූ සේකැ.
බසක් බැණැ නො නැංගා හ – වචනයකුදු කථා නො කළා හ.

75. දැතුරෙහි = දෙ + අතුරෙහි – (මේ) දෙක අතරැ.

76. හාව භාව – අැල්ම අැඟැවීම පිණිසැ කැරෙන අැස්, බැම, මුව ආදියෙහි විකාර.

ලීලා – ආකාර.

කටාක්ෂ – අැස් කොනින් බැල්ම.

මන්ද ස්මිත – මඳ සිනහ.

සබ්බ + ආභරණයෙන් – සියලු අබරණින්.

බඩිග පත්‍රයක් ධරන්නා වූ – [illegible] නා.

බෑයන් – සහෝදරයන්.

77. නිශ්ශංක වැ – සැක නැති වැ.

කැදැල්ලෙකැ – කුඹුවෙකැ.

ශෝක දුඃඛයෙන් – ශෝකය නිසා [illegible]

පිය වගුළ – පියා පත් ගැලැවී ගිය.

සක්වා ලිහිණියක් – චක්‍රවාක කිරිල්ලියක්.

ශෝක + අග්නියෙන් – ශෝකය නමැති ගින්නෙන්.

පැළැඟී – පිළිස්සී.

කඹුරන් ගේ උදුන – යකඩ උණුකරන්නන් ගේ ලිප.

සමුද්‍ර ඝෝෂයක් මෙන් – මුහුදෙහි මහ හඬක් මෙන්.

ඒක නිර්ඝෝෂ වියැ – එක මැ මහත් ඝෝෂාවෙක් වී යැ.

යුග + අන්ත + මාරුතයෙන් – යුගයෙහි කෙළවරැ හමන මහ සුළඟින්.
ලෝකයෙහි ආයුෂය යුග සතරකට බෙදී ඇති. ඒ කෘත, ත්‍රෙතා, ද්වාපර, කලි යනු යි. යුගයෙහි අවසානයෙහි දී හෙවත් විනාශයෙහි දී හමන මහා සැඩ සුළඟ 'යුගාන්ත මාරුත' නමි.

78. අස්වසන්නාහු – සනසන්නාහු.

ච්‍යුති උත්පත්ති – මැරීම ඉපැදීම.

ඒ ඒ දිගැ ගොස් – ඒ ඒ දිශාවන්හි ගොස්.

හිරී දුඃඛී – අමාරුයෙන් යා හැකි පර්වත මාර්ග.

පාලන නියාව – පෙන්වා දෙන ආකාරය.

ප්‍රපඤ්ච වන්නේ යැ – පමා වන්නේ යැ.

පඤ්ච මහා ගංගායෙහි – පස් මහ ගඟෙහි.
ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී, යනු එහි නම්.

79. ස්නේහ – ආදරය.

මැඹි පැරියක – කුඩා මැඹියක.

දළ මඩුල්ල – ජටා මණ්ඩලය,
මෙ නම් පලු ගැසුණු කෙස් වැටිය යි.

80. මසෙකින් මත්තේ - මසකට පෙරැ.

81. සුවඳ විලෙවුන් – සුගන්ධ විලේපනයන්.

පට කඩක් – පට රෙදි කැබෙල්ලක්.

82. ඇතිරියක් – අතුරන ලද වස්ත්‍රයක්.

83. විෂ බැම – විෂ බැස්වීම.

නො බා සිටුව – භය නො වී සිටුව.

84. මට වැඩි නො වෙති – මට වඩා ශ්‍රේෂ්ඨ නො වෙති.

වාසි කියන්නා වූ – වහසි බස් කියන්නා වූ.

කොබෑ සිටෑ – කොහි සිටෑ.
වර්තමානයෙහි "කොයිබ සිව" යනුයෙන් යෙදේ.

වියරු හුණු එකෙක් ද? – විකාරයට පැමිණියෙක් ද?
පිස්සෙක් ද?

ප්‍රභූ වැ – ප්‍රධාන වැ.

85. පරදු කොටෑ – ඔට්ටු කොටෑ.

86. නො ලස් වැ – ප්‍රමාද නො වී, වහා.

87. ගිය ඇසිල්ලෙහි මැ – ගිය විගස මැ.

රාජ කුලූපග – රජු හා විශ්වාසී වූ.

අනුවර්තනය කොටැ – අවනත වැ.
කිසිවක් කොටැත් නො සිතවු – එ සේ මෙ සේ වූ අල්ප සත්ත්වයෙක් යැ කියා නො සිතවු.
දිය බරණකු – දිය නයකු.
අත් සුනු – බදිනා ලද පිටි.
කෙළැවීමෙත් – ස්‍රීඩා කැරැවීමෙත්.
කැලමැ – කිසි කලෙකැ..

88. කඤ්ඤ වූ – රළු වූ.
අඳුන් දිවි සම් – අජින නම් මුවා ගේ සම්.
'දිවි' යි වූවාට මෙ දිවියෙක් නො වේ.
ජටා ධර වූ – ජටා දරන්නා වූ.
උග්‍ර වූ විෂ – ඉතා නපුරු වූ විෂ.
පණු වුල්ලකු – ගැඩැවිල්ලකු.

89. දුයකයෝ – දෙන්නෝ.
නිඃක්ලේශ වූ – කෙලෙස් නැත්තා වූ.
කාය වාක් සංයමය – කය හා වචනයත් හික්මැවීම.
ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයයෙහි – මහණ බමුණනට.

90. දසරූයෙහි – උර හිසැ.

91. ඉසැ පියන තැනත් – ඉසැ දැමීමට සාධනයත්.
තෘණ ලතා – තණ වැල්.
ඖෂධ වෘක්ෂයෝ – බෙහෙත් ගස්.
හිම බිත්දුවක් විචරත් – මිදුණු දිය බිඳක් පමණ වත්.
මස් කැස්බන් – මත්ස්‍යයන් හා කැස්බන් ද.
ප්‍රාණී කෙනෙක් – පණ ඇති සතෙක්.

92. භෛෂජ්‍යයෙත් – බෙහෙදින්.
ගෝමයෙත් – ගොමින්.

ඖෂධයෙන් –
මෙ තැනැ ඖෂධ යනු වැලැ හටගන්නා, බෙහෙතට ගනු ලබන කොළ මුල් ආදියයි.

වහ්නි ජාලාව – ගිනි දැල.

ජවිය - සිවිය, සම.

ඉපිළැ ගෙනැ යියේ යැ – බිබිලි නැහැ යියේ යැ.

ශ්වේත කුෂ්ට – සුදු පාට කුෂ්ට.

රත්න පෙළායෙන් – රුවන් පෙට්ටියෙන්.

විලාසයෙන් – ආකාරයෙන්.

93. මසිලණුවන් වහන්සේ යැ – මාමා යැ.

විස්තර හෙයින් – විස්තර ලෙස.

වටනේ යැ – වටින්නේ යැ, සුදුසු යැ.

94. පිඹිත වැ – පිඬාවට පත් වැ.

බැහැරි – පිටතැ.

බට හ – බැස්සා හ.

කිමිදූ – ගැලී.

95. ගිලන් වැ – අසනීප වැ.

ආයාසයට – වෙහෙසට අමාරුවට.

නාග පළිඳ වළකා ලන්නට – නා පිරිස නැවැත්වීමට.

96. යම් තාක් ඒ පාපය මා කරා නො ඒ නම්, ඊට පළමු කොටැ – ඒ පාපයෙහි විපාක විඳීමට පෙරැ.

පයාග නිඤ්ඤයෙහි – ප්‍රයාග නමැති තොටෙහි.
ගංගා නම් ගඟ යමුනා නම් ගඟ හා සම්බන්ධ වන තැන 'ප්‍රයාග' නමී. වර්තමානයෙහි අල්ලාහබාද් නගරය පිහිටා තිබෙන්නේ මෙ තැනැ යැ. නිඤ්ඤය නම් ගඟක් අසලැ පිහිටි ගුඩ වූ තොටෙකි.

97. පාප කාරි – පවු කරන.

දිවි නො දෙමි – ජීවිත දානය නො කරමි, මරණයට පමුණුවමි.

98. දීඝායුෂ්ක – බොහෝ ආයුෂ ඇති.

මහේශාක්‍ය වූ – මහානුභාව ඇති.

රූප + අග්‍ර ප්‍රාප්ත – රූපයෙන් අග තැන් පැමිණි.

මා මැරීම් කාරණ නො වෙයි – මා මැරීම සැලැකියැ යුතු කට යුත්තෙක් නො වේ.

99. කොල –

අගෞරවාර්ථයෙහි යෙදෙන ආමන්ත්‍රණයෙහි නිපාත පදයෙකි.

වංචා කොටැ – රවටා.

ශර වේගයෙන් – ඊ තලයෙහි වේගයෙන්.

ඝුණුයේ යැ – වැටුණේ යැ.

අරණ්‍ය සංඛ්‍යාත වූ – අරණ්‍ය නම් ඇති. 'අරණ්‍ය' යනු වනයට නමි.

රැවූ පිළිරැවූ – රාව ප්‍රතිරාව, නාද අනුනාද.

ජල නිශ්‍රිත වූ – ජලය ආශ්‍රය කළ.

නිලි ගෙනැ – සැඟැවී ගෙනැ.

පරිණත ඵලයෙන් – ඉදුණු ගෙඩියෙන්.

පිඟු වන් වූ – රන් වන් වූ.

අරළු – කදෙන් එල්ලා වැටෙන්නා වූ මුල්.

නිෂ්කාරණයේ – කරුණක් නැති වැ.

මිත්‍ර ද්‍රෝහ සංඛ්‍යාත වූ – මිතුරාට වරද කිරීම නම් වූ.

දිවි ගලවමි – ජීවිතය අස් කරමි, මරණයට පමුණුවමි.

100. වේද ත්‍රයය – වේද තුන.

බුද්ධ කාලයෙහි දී ඍග්, යජුර්, සාම යන තුන් වේදයට පමණක් ම, ප්‍රධාන ස්ථානය හිමි විය. පසු කලෙකැ දී ඊට අථර්ව වේදයත් එකතු කොට, චතුර් වේදය හැදෑරීමෙහි බ්‍රාහ්මණයෝ නිරත වූ හ.

වේද මන්ත්‍ර පිරුවීම – වේද මන්ත්‍ර ජප කිරීම.

දක්ඛිණාහීය හ – දක්ෂිණාවන් හෙවත් දෙන ලද දෙය පිළිගැනීමට සුදුසු යැ.

තිල තණ්ඩුල මුද්ග + ආදියෙන් – තල, සහල්, මුං ආදියෙන්.

ඝෘත ගුළිප + ආදියෙන් – ගිතෙල් අබ ආදියෙන්.

නරකය – තිරිසනුන් මෙන් සත්ත්වයන් උපදින අපායය.

අපාය සතරෙකි – නරකය, ප්‍රේත යෝනිය, අසුර නිකාය, තිරිසන් අපාය යනු යි.

101. ශංසයට පැමිණුවා – සැකයට පත් වැ.

මල් බෑයන් විචාරා – බාල සහෝදරයන් ගෙන් අසා.

හිමාලය වනය පැහැරී – හිමාලය වනය අද්දරී හෙවත් ඊට ගැවී.

සවී + ආකාරයෙන් – සියලු අයුරින්.

සුණ්ඩිමය – රනින් කළ.

පුරුෂ ශ්‍රේෂ්ඨ වූ – පුරුෂයන් ගෙන් ඉතා උතුම් වූ.

තා ගේ ජීවිතය ඇති – තොප ගේ ජීවිතය බේරෙයි.

102. නාග භවනය නසා පියන්නේ යැ – නාග ලෝකය විනාශ කරන්නේ යැ.

මහත්ත්වය – මහත් බව.

103. අනතුරු භවයෙහි – මේ ආත්ම භාවයට පෙරි ආත්ම භාවයෙහි.

මිථ්‍යා දෘෂ්ටි වූ – වැරැදි විශ්වාසය ඇති වූ.

ලාමක නොවන්නේ යැ – පහත් නොවන්නේ යැ.

104. නිර්මිත කරන ලද – මවන ලද.

බමුණන් ආදි වූ චතුර්වර්ණියන් – බමුණු, රජ, වෙළෙඳ, ශූද්‍ර යන සතර වර්ණියන්.

ආර්‍ය වූ – පිරිසුදු ජාති ඇති.

සම්මත කෙළේ යැ – අනුමත කෙළේ යැ, ලෝක ව්‍යවහාරයෙහි තහවුරු කෙළේ යැ.

පෘථිවියට අනුශාසනය කරව – පොළොව පාලනය කරව.

කෘෂි වණිස් – සී සෑම හා වෙළෙඳුම ද.

විධාන කෙළේ යැ – නියම කෙළේ යැ.

පෘථිවි + ඊශ්වර වූ – පොළොවට අධිපති වූ.

ප්‍රජා පරිපාලනය කොට – වැසියන් රක්‍ෂා කොට.

105. පූර්ව + ආවාසී වරයෝ – පෙරි ගුරු වරයෝ.

ප්‍රතිසන්ධි වශයෙන් ග්‍රහණයක් නැත්තේ යැ – පිළිසිඳ ගැනීම් වශයෙන් හෝ නැවැතැ ඉපැදීම් වශයෙන් හෝ යම් කිසි ස්ථානයක් ගැනීම් නැත්තේ යැ.

වරුණ – මුහුදෙහි දෙවි යැ.

මේ බට හිරට ප්‍රධාන යැ.

කුවේර – යකුන් ගේ දෙවි.

මේ වසකුවට ප්‍රධාන යැ.

සෝම – සඳ දෙවි.

106. භයංකර – භය එලවන.

සහස්‍ර බාහු – දහසක් බාහු ඇති.

දුනුවායන් ගේ – ධනුර්ධරයන් ගේ.

අසදෘශ වූ වික්‍රමයෙන් – අසමාන වූ වික්‍රමයෙන්.

චිත්ති පාරිචරියෙන් – හිති දෙවියාට සේවය කිරීමෙන්.

107. රාජන් වැ –

මෙහි රාජන් යනු බහු වචන දෙ වැනි විඛත් රූප නොවේ. සංස්කෘත ප්‍රකෘතියෙහි වූ 'රාජන්' එ සේ මෑ ප්‍රකෘතියෙන් සිටියේ යැ.

අග්‍ර දක්ෂිණාර්හ වන්නා හ – උසස් මැ පූජාවනට සුදුසු වන්නා හ.

බ්‍රහ්ම ලෝක ප්‍රමාණ වූ දරු සම්භාරයන් – බ්‍රහ්ම ලෝකය දක්වා උස ඇති දර ගොඩන්.

භක්ම කරන හෙයින් – අළු කරන හෙයින්.

භක්‍ෂණය – අනුභවය, ආහාරය.

අලාමක වූ ප්‍රභා ඇති – පහත් නැති පැහැය ඇති.

පිනවන්නට – සතුටු කරවන්නට.

108. අපරියන්ත වූ – සීමාවක් නැති.

ආරෝහ පරිණාහයෙන් – උසට සරිලන මහතින්.

ප්‍රමාණ + අතික්‍රාන්ත වූ – පමණ නොකළැකි.

109. යාග ස්තම්භයන් – යාගය පිළිබඳ කුළුණන්.

පඤ්ඤාතනය - තිරිසන් සතුන් මැරීම.

සුන්දර වූ – මනා ලක්ෂණ ඇති, යහපත් වූ.

110. ගෙරි මිවුන් – එළ හරක් හා මී හරක් ද.

සිවු පසයෙන් –

චීවර, පිණ්ඩපාත, සයනාසන, ගිලාන ප්‍රත්‍යය යනු සිවු පසය හෙවත් චතුර් ප්‍රත්‍යය යි.

කිරි හා දී හා – කිරි හා මුදවාපු කිරි ද.

111. හෝම යාගයෙන් – පූජා භාණ්ඩ ගින්නෙහි ලා කැරෙන දෙවියන් පිදීමෙන්.

පාප මල ප්‍රවාහය – පාප නමැති කුණු සෝදා හැරීම.

112. භාගීරථි – ගඞ්ගා නම් ගඟ.

පුථ්වී භාගයෙහි – පුථ්වියෙහි.

මහිම – අනුභාව.

113. උළින් – ගඩොළින්.

පිඝිකාවෝ – පුටු.

114. නො පියැ හැකි – බොන්නට බැරි.

ලවණ ජලය – ලුණු දිය.

තපෝ නිශ්‍රිත වූ – තපස ආශ්‍රය කරන ලද.

මුහුදු බත් කෙළේ යැ – මුහුදට බිලි කෙළේ යැ, හෙවත් ආහාර කෙළේ යැ.

සස් කෙළේ යැ – ශාප කෙළේ යැ.

115. කුශල ක්ෂේත්‍ර වූ – පිනට කුඹුරක් වැනි වූ.

අග්‍ර දක්ෂිණේය්‍යවූ – උසස් මැ පූජාවට සුදුසු වූ.

116. විද්‍යමාන වන්නා හ – පෙනෙන්නා හ.

ග්ලානෝපස්ථානයට – අසනීපයට උවටැන් කිරීමට.

ග්ලාන ශය්‍යාවෙන් – ලෙඩකු ලෙස නිදීමෙන්.

මිථ්‍යා මාර්ග්‍ය – වැරැදි මඟ.

සම්‍යක් දෘෂ්ටිය – නිවැරැදි අදහස්.

අනිෂ්ට යැ – අයහපත් යැ.

යාඥ වාද භේදයට – යාගය පිළිබඳ වාදය බිඳීමට.

117. පරාජය සංඛ්‍යාත – පැරැදීම් නම්.

අකුශල ග්‍රහණය – පාපයන් ගැනීම.

අඥාන වූ – නුවණ නැති වූ.

මිරිඟු ජලය – කාන්තාරාදියෙහි අවු රැස් කරණ කොටැ ගෙතැ ජලය මෙන් පෙනෙන පටලය.

අවිද්‍යමාන වූ – නො පෙනෙන්නා වූ.

ඝථා ස්වභාවය – ස්වභාවයෙන් ඇති පරිදි.

භූත සංඥායෙන් – ඇත්ත යැ යන සිතින්.

නිරවද්‍ය – නිවැරැදි.

අභිවෘද්ධි කර – වැනි දියුණුව ගෙනැ දෙන.

118. කාය දුශ්චරිත වාග් දුශ්චරිත මනෝ දුශ්චරිත –ශරීරයෙන්, වචනයෙන් හා සිතින් ද කැරෙන වැරැදි.

වර්ජනිය – හින්න.

දහනය කරන්නේ ද – දුවෙන්නේ ද.

වාග්වෝද්ගත කොටැ – වචනයට නගා.

ඉෂ්ට ඵල දායක – යහපත් ප්‍රතිඵල දෙන.

119. දෙ බළ වූ – දෙකට බෙදුණා වූ.

ද්වි රසඤ්ඤු – දිවි දෙකක් ඇති.
රසඤ්ඤු යනු රස දැනැ ගන්නේ යැ යන අර්ථයි– දිවට නමෙකි.

උපභෝග – ආහාරයට ගන්නා දෑ.

පරිභෝග – පාවිච්චියට ගන්නා දෑ.

මුක්තා මාණික්‍යාදි වූ දශ විධ රත්න–
මුක්තා, මාණික්‍ය, වෛදූර්‍ය, ගෝමේද, වජ්‍ර, විද්‍රැම, පද්ම රාග, මරකත, නීල, ප්‍රවාල යන මේවා දශ විධ රත්නයෝ යි. තව ක්‍රමයකට මුක්තා, මාණික්‍ය, ශංඛ, ශිලා, ප්‍රවාල, මසාරගල්ල, රජත, සුවණ්ණ, වෛදූර්‍ය, ලෝහිතාංක යනු දශ විධ රත්න යැ. මෙ තැනැ දෙ වැනි වැ කී අයුරැ මැනැවැ යි සිතේ.

තෘප්තියකට – සෑහීමකට.
අතෘප්ති කර වූ – සෑහීමකට නොං පැමිණෙන.
බහු සඤ්ඤ වූ – බොහෝ දෑ අනුභව කරන.

120. විපරීත ස්වභාවයකව් – වෙනස් ඔවකට.
මෙරමා ගේ – අනුන් ගේ.
අචේතස්ක වූ – සිතක් නැති වූ.
දඬු ගටා – දඬු එකට අතුල්ලා.

121. ප්‍රතාපවත් වූ – තවන්නා වූ.
ධූම ඝිබායෙන් – දුමින් හා දැල්ලෙන් ද.
වහ්නි දේවතාවා – ගිනි දෙවියා.
අඟුරු බැළලයෝ – අඟුරු වැඩ කරන්නෝ.
කකාරා – අවුවෙන් රත් කොටු.
අරක්කැමියෝ – කැම පිසින්නෝ.
සුඹුප්පුලි – මිනී දවන්නෝ.
කලත් –
ධාන්‍ය විශේෂයේකි.
අවශේෂ වූ – ඉතිරි.

122. අමනෝඥ – යහ පත් නොං වූ.
ප්‍රතිකූල ශ්‍රුතිප්‍රසාදකට යුතු–පිළිකුල් නින්දාකට යුතු.
අහි කුණප – සර්පයන් ගේ හෙවත් නසින් ගේ මළ කුණු.
ගෙරි කුණු – හරස් කුණු.
කුණපය – මළ කුණ, කැත දෙය.
මිලේච්ඡ – අශිෂ්ට, වන චර.
අනින්ද්‍රිය ප්‍රතිබද්ධ – ඉන්ද්‍රියයෙහි නොං බැඳුණු.
අචේතස්ක – සිත් පිත් නැති.

123. ජීවිත + අර්ථී වූ - ජීවත් වීමට කැමැති.
මැඩැ පවත්නේ යැ - ඉක්මැ පවත්නේ යැ.
වසඟයෙහි - යටතෙහි.
ස්වයම්භූ වැ - තමා විසින් මැ ඉපිද.

124. මෘෂා වාද - බොරු.
ප්‍රාණ වධයෙන් - පණ නැසීමෙන්, සතුන් මැරීමෙන්.
ලබ්ධ ධර්ම සංඛ්‍යාත වූ - ආගම ධර්මය යැ සි කියන ලද.
ශාන්ති ධර්මය - සෙත ගෙන දෙන ධර්මය.
ස්ව බුද්ධීන් - තමා ගේ මැ නුවණින්.

125. හරයක් නැද්ද - සාරයක් නැද්ද.
බඩ ඇති වූ - බඩ රැකීම පිණිසැ මෙහෙ කරන.
කාරණ + අකාරණ - කළ යුතු නො කළ යුතු දෙය.
සඳෙම යැ - ඳෙම සහිත යැ.

126. කරවුවර - අය බදු.
සේවා කම කොටැ-යුද්ධ සේවායන් ගේ වැඩ කොටැ.
ඇළැලි - කැළැඹී.
තබා වූ ප්‍රමාණ වෘත්තිය - නියම කළ පඬි.
බ්‍රහ්ම නිර්මිතියක් - බ්‍රහ්මයා විසින් මවන ලද්දක්.
උපස්ථායකයන් - උපකාරකයන්.
හූරන් - උරන්.
සල්වසල්වා - සොල්වසොල්වා.

127. යාග ස්තම්භයෙහි - යාග කණුවෙහි.
ගව මහිෂ - එළ හරක් මී හරක්.
යාගාවාටය (=යාග+ආවාටය) -යාගය පිළිබඳ තනන වළ.
මුක්තා - මුතු.
මාණික්‍ය - රතු කැට.

ශංඛ – හක්.

ශිලා – මනඃ ශිලා හෙවත් මනෝ සිල නම් දෙය.

ප්‍රවාල – පබළු.

මසාර ගල්ල – මසාරක නම් ගල් විශේෂය.

රජත – රිදී.

සුවණ්ණ – රන්.

මේ තැනැ රත්න අටෙකි. ඉතුරු දෙක මෙසේ යි: වෛදූර්‍ය, ලෝහිතාඞ්ක.

ශාලි + වීරිහි + ආදි – සහල් වී ආදි.

සප්ත විධ ධාන්‍ය – හත් ආකාර ධාන්‍ය.

සහල් වී හැරැ ඉතිරි ධාන්‍ය පස නම්: යව, තිරිඟු, තණ, වරක, තංගු යන මේවා යි.

අජර + අමර – ජරා හෙවත් වයසට පැමිණීමෙන් ද මරණයෙන් ද මිදුණු.

ඉෂ්ට + අපූ + ප්‍රසවය – කැමැති වස්තු ඉපැදීම.

අසත්‍ය වාදි – බොරු කියන.

යාග සුඵ ස්වභාවය – යාගයෙහි පිහිටීම සුභාවය.

128. ඉස්සරුමත් වූ – ඓශ්වර්‍යයෙහි පිහිටා.

සත්ත්වාඛ්‍යාත (=සත්ව + ආඛ්‍යාත) වූ – 'සත්ත්ව' යන නම් ඇති.

ප්‍රජාවට අධිපති වූ – මිනිසුනට නායක වූ.

129. ප්‍රජා නායක – ප්‍රජාවට අධිපති.

ප්‍රාණ ඝාතය – සතුන් මැරීම.

අදත්ත + ආදානය – නුදුන් දෙය ගැනීම, සොර කම.

කාම මිථ්‍යා+ආචාරය – කාමයෙහි වරදවා හැසිරීම.

මෘෂා වාදය – බොරු කීම.

සුරා පානය – රහ මෙර පීම.

මායා – රැවැටීම.

සාඨෙය්‍ය – කපටි බව.

සඨමභ – මුලාව.

සාරම්භ – සාහසික බව.

ඊර්ෂ්‍යා – අනුන් ගේ සම්පතට නොකැමැත්ත.

මාත්සර්‍ය – මසුරු බව.

මක්ඛ – මහත් ක්‍රෝධය.

පලාස – වෛරය, නපුරු බව.

මාන – මානය, උඩඟුව.

අතිමාන – මහත් උඩඟුව.

මද – මත් බව.

පමාද – ප්‍රමාදය.

ක්ෂුද්‍ර ප්‍රාණීන් – පණ ඇති කුඩා සත්තු.

අනාසී සඩරූප – උතුම් නොවූ.

130. තමා අවිද්‍යමාන කලු – තමා කෙරෙහි මු නැති කලු.

කෛරාටික – කපටි.

නිෂ්කරුණ – කරුණා නොමැති.

වඤ්චක ගුණ – වඤ්චා කරන ගති.

වහ්නි හෝමයෙන් – ගිනි දෙවි පුදෙන්.

සුඛිත මුදිත වන්නේ යැ – සැපයට හා සතුටට හා පත් වන්නේ යැ.

131. ශුව රජ – උපරජ.

ගිනි හල් ගෙවි – දෙවියන් උදෙසා ගිනි පුද කරන ශාලාවට.

දැළි රුවුළු – උඩු රුවුළු හා යටි රුවුළු ද.

රස මසවුළින් (=මස් + අවුළින්) — රසවත් වූ මස් හා අවුළු පතින් හෙවත් කැවිලියෙන් ද.

මුඩු කොටු – හිස බා.

132. නිබද්ද – නිරතුරු.
වධයට නිසි යහ – මැරීමට සුදුසු යහ.

133. නුසුත්නා වූ – සුත් නොවූ.
උත්කෘෂ්ට – ඉතා උතුම්.
දෘෂ්ට ප්‍රත්‍යක්ෂ වූ – දැකීමෙන් ම තහවුරු වූ.
තුච්ඡ – නිස්සාර කට යුතු.
නිෂ්ඵල – ප්‍රයෝජන නැති.

134. නිශ්චල – නොසෙල්වෙන.
ශෛලමය – ගලින් කරන ලද.
චලිතයෝ – නොසෙලවෙන්නෝ.
අය ලෝහ – යකඩ.
තාම්‍ර ලෝහ – තඹ.
කාංස ලෝහ – තඹ හා බෙලෙක් හා මිශ්‍රණය.
වට්ට ලෝහ – කළු ඊයම් හා තඹ හා මිශ්‍රණය.
හාර කූට ලෝහ – පිත්තල.
යාචක යෝගි වූ – යැදීමෙහි නියුක්ත වූ.
වැටුමෙහි – සුළියෙහි.
පූර්වාපර (=පූර්ව + අපර) සන්ධියක් – මූල අග ගැලපීමක්.

135. ද්වයද්වය සමාපත්ති වශයෙන් – දෙ දෙනකු විසින් එක් වීම් වශයෙන්, මෙථුන සේවන වශයෙන්.
මනෝමය වැ – සිතින් මැ කැරැණක් වැ.
චතුර්වර්ණ විභාගයෙක් – වර්ණ හෙවත් ජාති සතරට බෙදීමෙක්.

136. ඝීනයෝ යැ – පහත් යැ.
සටහන් – රූපාකාරය.
ශෞර වීර්යයෙන් – ශූර භාවයෙන් හා වීර්යයෙන් ද.

137. ද්‍රුදෙකලා වැ මැ – තනි වැ මැ.

138. ආඥයෙන් – නියමයෙන්.
අභිප්‍රාශය – කැමැත්ත.
ද්වී ප්‍රකාර වූ – දෙයාකාර වූ.
විභාගය – බෙදුම.

139. චණ්ඩාල – සැඩොල්, රොඩී.
ආත්ම වධය – තමා ගේ නැසීම.
බිලියක් – බිලි කටුවක්.
විපරීත ග්‍රහණයෙහි – වැරැදි දෙය ගැන්මෙහි.

140. ශබ්දාර්ථ (=ශබ්ද + අර්ථ) හෙයින් – ශබ්දයන් ගේ අර්ථ හේතුයෙන්.
අයස – නින්දාව, අප කීර්තිය.
යසස – කීර්තිය.
විනිර්මුක්ත වූ – මිදුණා වූ.
සර්ව සාධාරණ වූ – සියල්ලනට ම පොදු වූ.

141. අනේක ප්‍රකාර – නොයෙක් ආකාර.
කෘෂි – සී සෑම.
ගෝ රක්ෂණ – හරක් රැකීම.
මෝඝි – මෝඩ.
අඞ්ගෝත්තර පඤ්චකයෙහි – ත්‍රි පිටකයට අයත් සූත්‍ර පිටකයෙහි අංගුත්තර නිකායයෙහි පඤ්චක නිපාතයෙහි.

142. මිථ්‍යා වාදයන් – වැරැදි කීම්.
සොම්නසට – සතුටට.

143. ශ්‍රී විභූතීන් හා – ශ්‍රී සමෘද්ධියෙන්.
පණා බෙර – පණව නම් කුඩා බෙර.
මිහිඟු බෙර – මඟුල් බෙර, දෙමළ බෙර.
ගැට බෙර –
බෙර විශේෂයෙකි.
පටහ බෙර –
බෙර විශේෂයෙකි.
සිත්නම් – නළා විශේෂයෙකි.
භේරි තූයී නාද – බෙරයෙන් එන මිහිරි හඬ.
මෙඝ මුඛය – වලා කුළු අද්දරැ හෝ ඉදිරි පසැ හෝ.
ඝියොවුරු – ඝී ලන කොප්ප.
ශුඛ සන්නඛ වැ – ශුඛයට සැරසී.
චාමීකර ස්වණ්මය – ආකරයෙන් ගත් සැටියේ රනින් කරන ලද.
ළහිරු මඬල – බාල සූයී මණ්ඩලය.

144. ගෝනැසින් – පරාලයෙන්.
ජාම්බෝනද ඝවණ්යෙන් – ජම්බූ නම් ගඟින් එන රනින්.
ඛවල + ආතප ත්‍රය – සුදු කුඩය.
ආතපය හෙවත් උෂ්ණය වළක්වන හෙයින් කුඩයට 'ආතප ත්‍ර' නම්.

145. වල් විදුනාවක් – සෙමර පවන් පතක්.
මෙය සෙමර මුවා ගේ වලගින් කැරිණි.
අනවරතයෙන් – නිරතුරු වැ මැ.
තපනීය ඝවණ්යෙන් – තැවියැ හැකි පිරිසුදු රනින්.
දුළයෙහි (=දෙ අැළයෙහි) – දෙ පසැ.
මයූර පිවජ් කලාප – මොනර පිල් කලබ.
කුණ්ඩලාභරණයෝ – කනැ පළඳින අබරණ.

146. කාළණ වණී වූ – කළු පාට වූ.

භුවන් – ඇස්.

දිවි දළින් – දිවියන් ගේ දළින්.

කොඳ, හෙල් මැළි –
මේ රෑට පිපෙන සුදු මල් විශේෂ යැ.

කැකුළු – මොට්ටු.

147. ලාක්ෂා රසයෙන් – ලා කිරියෙන්, ලාකඩයෙන්.

රත් පියුම ගබක් – රත් නෙළුම් පොකුණක්.

බිම්බ ඵලයක් – කෝවක්කා ගෙඩියක්.
මෙය රතු යැ.

අධර ශුගලය – තොල් දෙක.

අධර පල්ලව – තොල් නමැති ලා දළු.

වසන්ත කාලය – බක් වෙසක් මාස ඇතුළත් කාලය.

මථනය කොටැ – ජය ගෙනැ.

කිරිප්පු කොටැ – එල්ලා ගෙනැ.

බඩිග පත්‍රයක් – කඹු පතක්.

වරම් රජ දරුවකු –
ලොව සිවු දිසායෙන් රකින වරම් රජ වරු සිවු දෙනෙකි. මොහු, ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන නම්.

148. සප්ත රත්නයෙන් – රන්, රිදී, මුතු, මැණික්, වෛදූර්‍ය, විදුරු, පබළු යන සත් රුවනින්.

වහන් – පා වහන්, සෙරෙප්පු.

149. සවඹී සඵ වූ හ – සවඹියට වැඩියා හු යැ, මළා හු යැ.

150. ශාසනා වූ – ආවාසී වූ, ගුරු වූ.

ති ලෝ ගුරු – කාම, රූප, අරූප යන තුන් ලොවට ගුරු වූ.

අබුද්ධෝත්පාද කාලය – බුදු කෙනකු නූපදින කාලය.

පූර්‍වාපර (=පූර්‍ව + අපර) සන්ධි ගළපා – මුල අග දෙක එකටෙක සරි ලන සේ ගළපා.

5

වෙස්සන්තර ජාතක විවරණය

වෙස්සන්තර ජාතක

විවරණය.

[මෙහි ඇති අංක පෙළෙහි ඇති ඡේදයන් හා එන අංක හා සැසඳෙන්නේ යැ.]

1. දහමට ළයැනි = දහමට ළය ඇති.
ළය සිතෙහි වාස භූමිය යැ සි පුරාණයෝ යුහු. 'දහමට ළය ඇති' යනුවෙන් හැඟඟනුයේ 'සිත දහම කෙරෙහි යොමු කළ' යනු සි.

කන්හි අමා නමන – කනෙහි මී පැණි වත්කරන. ධර්ම දෙශනායෙහි රසවත් බව විසිතුරු කළ සැටි සි.

මන හර – සිත ඇදූ ගන්නා.

මනෝඥ – සිත් ප්‍රිය කරන.

අද්වය වාදි වූ – දෙකක් නොකියන්නා වූ.

අතුල්‍ය වාදි වූ – අසමාන වාද හෙවත් කියුම් ඇති.

අමෘත වාදි වූ – රසවත් වදන් ඇති, එ සේ නැත හොත් 'අමෘතය' හෙවත් 'නිවන්' ප්‍රකාශ කරන්නා වූ.

විනය වාදි වූ – ශික්ෂාව පිළිබඳ වැ කියන්නා වූ.

විභජ්ජ වාදී වූ – ධර්මය බෙදා කියන්නා වූ. 'විභජ්ජ' නම බෙදීම සි.

ධර්මේශ්වර වූ = ධර්ම + ඊශ්වර වූ – ධර්මයට අධිපති වූ, හෙවත් ස්වාමි වූ.

ධර්ම ලෝචන වූ – ධර්මයට ඇසක් වූ.

ධර්මාමෘත වූ = ධර්ම + අමෘත වූ – ධර්මය නමැති අමරණීය දෙය වූ.

බුදුන් වහන්සේ තමන් වහන්සේම ධර්මාමෘත වූ සේකැ සි යුතු සේ සි.

ශාක්‍ය කේතු වූ – ශාක්‍ය වංශයට කොඩියක් වූ.

ශාක්‍ය කුල තිලක වූ – ශාක්‍ය වංශයට තිලකයක් වූ. 'තිලකය' නම් නලලෙහි තබන තිත යි.

කරුණා මෞලි මාලාලඞ්කෘත (=මාලා+අලඞ්කෘත) වූ –කරුණාව නමැති මුදුන් මලින් අලඞ්කාර කරන ලද.

සමන්ත භද්‍ර වූ – සෑම අතින් මැ යහ පත් වූ.

පර දුඃඛ දුඃඛිත වූ – අනුන් ගේ දුකෙහි දී දුකට පත් වන්නා වූ.

අශරණ ශරණ, ශරණාගත (=ශරණ+ආගත) වජ්‍ර පඤ්ජර වූ – පිහිට නැත්තවුනට පිහිට වන, පිහිට සොයා ආවනට දියමන්තියෙන් කළ මැදිරියක් බඳු වූ.

දියමන්තිය ඉතා තද ය. බාහිර උපද්‍රවයෙකින් බේරෙන්නට ආවුනට දියමන්ති මැදිරියෙක සුරක්ෂිත වැ ඉන්නට හැකි බව යි අද්හස් කැරුණේ. බුදුන් වහන්සේ ගේ පිහිට සොයා ආවුනට උන් වහන්සේ ගේ පිහිට ලැබුණු විට ක්ලේශ නමැති සතුරන් ගේ සතුරු බැවින් මිදෙන්නට හැකි බව පැවැසිණි.

ත්‍රි භුවන චන්ද්‍ර වූ – තුන් ලොවට සඳක් බඳු වූ.

ජගදනන්ද (=ජගත්+ආනන්ද) ලෝචන වූ – ලෝකයා සතුටට පත් කරවන ඇස් ඇති, එ සේ නැත හොත් ලෝකයා සතුටට පත් කරවන ඇස වූ.

දේවාතිදේව වූ = දේව+අතිදේව වූ – දෙවියනටත් වඩා උසස් දෙව් වූ.

වන්දනීයාභිවන්දනීය වූ = වන්දනීය+අභිවන්දනීය වූ – වැඳිය යුත්තන් අතර උසස් මැ වැඳිය යුත්තා වූ.

පූජනීයාභිපූජනීය වූ=පූජනීය+අභිපූජනීය වූ – පිදිය යුත්තන් අතර උසස් මැ පිදිය යුත්තා වූ.

දශ බල ධාරී වූ – බල දශයක් දරන්නා වූ. බුදුන් වහන් සේ කයින් ද නැණින් ද බල දශයක් දරන සේකි.

කයින් දරන බල නම් ජද්දන්ත ඇතුන් දශ දෙනකු ගේ බල දැරීම් යි. නැණින් දරන බල දසය නම්:

කාරණාකාරණ ඤාණ, කම්මනානර විපාකනානර ඤාණ, කම්ම පරිච්ඡේද ඤාණ, ධාතු නානත්ත ඤාණ, අජ්ඣාසය අධිමුත්ති ඤාණ, ඉන්ද්‍රියානං තික්ඛ මුදු භාව ඤාණ, ඣානාදීනං සංකිලේසාදි ඤාණ, පුබ්බේ නිවාස ඤාණ, චුති පටිසන්ධි ඤාණ, සච්ච පරිච්ඡේද ඤාණ, යනු යි.

චතුර්වෛශාරද්‍ය විශාරද වූ–වෛශාරද්‍ය ඥාන (සම්–පූර්ණයෙන් මැ, අඩු පාඩුවක් නැති වැ මැ දැනීම්) සතර කරණ කොටැ ගෙනැ අනීත වූ.

ද්වාත්‍රිංශද් වර මහා පුරුෂ ලක්ෂණානීත්‍ය–නුව්‍යඤ්ජන (=ලක්ෂණ + අශීති + අනුව්‍යඤ්ජන) ඛ්‍යාම ප්‍රභා කෙතු මාලාලඞ්කාරයෙන් (=මාලා+ අලඞ්කාරයෙන්) විරාජමාන වූ – දෙතිස් උතුම් මහ පුරිස් ලකුණින් ද, අසුවක් අනු ලකුණින් ද, බඹයක් දුරට විහිදෙන මුදුන් රැස් මාලාවෙන් වූ අලඞ්කාරයෙන් ද බබලන්නා වූ.

අල්පේච්ඡ වූ = අල්ප + ඉච්ඡ වූ – මදක් කැමැති වන්නා වූ.

අසංසෘෂ්ට විහරණ-පිටතින් වූවන් හා එක් නොවූ වාසය.

ආරබ්ධ වීරිය වූ – පටන් ගන්නා ලද වීරිය ඇති.

වචන ක්ෂම වූ – කීමෙහි දක්ෂ වූ.

පාප ච්ඡෝදක වූ – පාපයට දොස් නගන්නා වූ.

ශික්ෂා කාමි වූ–ශික්ෂණයට, එනම් ශික්ෂාවට කැමැති වූ.

ජීතේන්ද්‍රිය වූ = ජීත + ඉන්ද්‍රිය වූ – දිනන ලද ඉඳුරන් ඇත්තා වූ.

ජීන ක්ලේශ වූ – දිනන ලද ක්ලේශයන් හෙවත් කිලුටු මල ඇත්තා වූ.

ශීල සම්පන්න වූ – ශීලයෙන් හෙවත් ඉන්ද්‍රියයන් හිලෑ කැරැ ගැනීමෙන් යුක්ත වූ.

සමාධි – සිත එකඟ කැරැ ගැනීම.

විමුක්ති – මිදීම.

සව්ඵ (=සව් + අඵ) සිද්ධි ප්‍රසව කර විනතා මාණික්‍ය හද්‍ර ඝට කල්ප ද්‍රැමායමාන වූ – සියලු වුව මනා දැසිදු කිරීම් උපදවා දෙන සිතුපැතු දේ දෙන මැණික යැ, බදුරු කළය යැ, කප් රුක යැ, යන මේ හා සමාන වූ.

මෙහි සඳහන් තුන් දෑ සිතුපැතු සම්පත් දෙන්නේ යැ.

ප්‍රතිපක්ෂ වූ – විපක්ෂ වූ, විරුද්ධ වූ.

හළුවා වූ – ඇරියා වූ.

හිණි පෙති – හිණි මඟෙහි පා තබන්නට බඳිනා ලී කැබෙලි.

වියත් බවිහි – පණ්ඩිත භාවයෙහි.

දුල්වුදුල්වූ – යොමු කළා වූ යොමු කළා වූ.

බහු සමාගමයෙහි – නෑ සමාගමයෙහි.

පොකුරු වැසි – මල් වැසි.

2. පස් මරුන් – පඤ්ච මාරයන්.
දේව පුත්‍ර, ක්ලේශ, අභිසංස්කාර, ස්කන්ධ, මෘත්‍යු –යනු පඤ්ච විධ මාරයෝ යැ.

සව් නේ – සියලු ලෙය හෙවත් දත යුතු ධර්මයන්.

ඉසිපතන – ඍෂිපතන, ඍෂීන් බසින තැන.
හිමාලයයෙන් එන ඍෂීන් බස්නා තැනැ කරන ලද ආරාමය 'ඍෂිපතන' නම්.

දනවු – ජන පද.

සැරි සරා – හැසිරී.
'සැරි' නම් 'හැසිරීම' යි. 'සරා' යනු 'හැසිරී' යනු යි.

හෙමන්ත සෘතුව – ශීත සෘතුව.
මේ උඳු වප් දුරුතු යන දෙ මස යි. 'සීත කරයි උඳු වප් මහ දුරුත්තේ' යනු සිංහල කීමෙකි.

වසන්ත කාලය–ශීත සෘතුව පසු වූ විටැ ඇති වන සෘතුව.
උතුරු දඹදිවැ ශීත කාලයෙහි දී ගස්හි කොළ ආදිය වැටී හිම පතනය ද ඇති වේ. වසන්ත–යෙහි දී ගස්වලැ දලු ලා මල් හට ගන්නව පටන් ගෙනැ මනා දර්ශනීයත්වයෙක් ඇති වෙයි.

ගඳ කිළි – ගඳ කුටි.
බුදුන් වසන කුටියට මෙ නමි.

පිරිවෙන් – සඟුන් වසන විහාර.

3. මාන ජාතික වූ – මානය ඇති ජාතියක් වූ.

අභිමානයෙන් – මහත් වූ මානයෙන්.

කණිටු – බාල.

පෙරට පෙරට වැ – ඉදිරි ඉදිරි වැ.

අවකාශ – ඉඩ.

4. අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට – අභිඥාව නිසා ඇති වන සතර වන ධ්‍යානයට.
'අභිඥාව' නම් උසස් ඥානය යි.

සම වැදූ – පැමිණෙ.

යමා මහ පෙළහර – යමක මහා ප්‍රාතිහාර්ය.
'යමක' නම් 'යුගල' හෙවත් දෙක යි. ශරීරයෙහි එක් එක් රෝම කූපයෙන් දිය කඳ යැ ගිනි කඳ යැ යි යන වශයෙන් එක විටැ කැරෙන විහි ප්‍රාතිහාර්ය මෙ නමි.

එළැවූ – ඉදිරි පත් කළ.

මස්තකයෙහි – මුදුනෙහි.
වප් මඟුල් දෙ – කුඹුරු වපුරන මඟුල් දිනයෙහි.
දඹ ගසැ – ජම්බු ගසැ.

5. අකාල මෙඝයක් – නොකල් වැස්සක්.
තඹ වන් – තඹ පාට.
රැවු දෙමින් – ශබ්ද නංවමින්.
ඉකුත් වත් – පුරාණ වස්තුව හෙවත් කථාව.

6. හේෂා රවයෙන් – 'හේෂා' ශබ්දයෙන්.
'හේෂා' නම් අසුන්ගේ හඬ සි.
සඛී කම්බල – රන් පලස්.
අතුළා වූ – අතුරන ලද.
ශඛ – සඤ්.
ඒක නිනාද වූ – ඒක ඝෝෂ වූ.
නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඞ්ගයෙහි – නැටුම් හී කීම් වැයුම් යනාදි විෂයයෙහි.
මිහිඳු බෙර – මෘදඞ්ග, මඟුල් බෙර.
ගම්භීර නාදයෙන් – ගැඹුරු හඬින්.
ශ්‍රවණ රමණීය වූ – ඇසීමට ඇලුම් උපදවන.
ප්‍රවීණ – දක්ෂ.
ස්වරයෙන් – ශබ්දයෙන්.
සප්ත ස්වරයෙන් – 'ස' 'රි' 'ග' 'ම' 'ප' 'ධ' 'නි' යන 'ස්වර' සතින්.
භූෂණයෙන් – අලඞ්කාරයෙන්.
සම්පත්තියෙන් අනූන වූ – සැපතින් නොඅඩු වූ.
යෞවනයෙන් – තරුණ බැවින්.
උද්දම වූ – ඉතිරී ගිය.
මනෝහර වූ – සිත් ගත්තා වූ.

අනින්දිත වූ – නින්ද නොලත්.

විඤ්ඤෙන් – දැනීම්වලින්, ශාස්ත්‍රයෙන්.

සැරැසුම්හි තත් වැනි වූ – සැරැසීමෙහි දී හෙවත් ඇඳුම් පැළඳුම් ආදිය ලීමෙහි දී නාගරික වූ.

අන්තරඝ වහිරඝ කාසියෙහි – අභ්‍යන්තර බාහිර කට ඝුතු වලැ දී.

7. විසිෂ්ට වූ – ඉතා විශේෂ වූ.

සඤ්ජය –
පසු වැ 'සඳ මහ රජ' නමින් වන්නේ මෙසි.

8. ඒකාන්ත = ඒක+අන්ත–අන්ත එක්.

ව්‍යුත වැ – පිටැ වී, මැරී.

අග්‍ර මහේෂිකා – ප්‍රධාන බිසොව.

පස් පෙර නිමිති – පුවි නිමිති පස. දෙවියන් මැරෙන්නට පළමු පෙර නිමිති පසෙක් උපදී.
මේ පස් පෙර නිමිති නම්:
ශරීරයෙන් ඔහ දිය ගැලීම,
පැලැඳි මල් පරවීම,
ඇඳි රෙදි කිලුටු වීම,
හිඳි ආසනය අප්‍රිය වීම,
පරිවාර ජනයා අප්‍රිය වීම – යනු සි.

9. වර – ප්‍රතිඥා, කැමැති වන දෑ, තෝරා ගත්තා දෑ.

මුව පොල්ලන් ගේ – මුව පැටවුන් ගේ.

භූ ලතා – ඇස් බැම.
දික් වැ නැමී ඇති හෙයින් 'වැල' යන අරුත් ඇති 'ලතා' සි යෙදේ.

පූජිත වන්නා වූ – පුදනු ලබන්නා වූ.

යශස් කීර්ති –
මේ දෙ වදනෙහි මැ අරුත එක යැ.

අනඛ ඛධිරාදි (=ඛධිර+ආදි) – අඳ බිහිරි ආදි.

අධ්‍යාශයට – අදහසට, කැමැත්තට.

නො මසුරු වූ – ලෝභ සිත් නැති වූ.

මද්ධ්‍ය ප්‍රදෙශය – මැද පෙදෙස, ඉඟ.

පයෝධරයෝ දෙ දෙන හැම කල්හි මැ නො හී උඩ බලා සිටිත් වා–

මේ සුන්දර ස්ත්‍රී ලක්ෂණයෙකි. වයස් ගත වන කල පයෝධරයන් වැටී යෑම සුන්දර නොවේ. කිරෝහී ස්ත්‍රීන්ගේ පියොවුරු මධ්‍යම වයසේ ද 'නො හී' හෙවත් නො වැටී සිටිති.

නර – ඉදුණු සෙස්.

සිවි – සම.

වයසට – මරණයට.

බලතුන් – දෙරටු පාලයන්.

අරක්කැමියන් – පිසන්නන්.

කිළිතුන් – දුස විශේෂයෙකි.

පසඟ තුරු රැවින් – අඬ පසින් යුක්ත වූ තුසී ශෝෂයෙන්.

ආතත, විතත, විතතාතත, ඝන, ශුෂිර හෙවත් – එකැස් බෙර, දෙ ඇස් බෙර, තුනැස් බෙර, කංස්‍ය තාලම්, හොරනැ නලා ආදිය-පංචාඩ්ගික තූසී වෙයි.

සර්‍වාඩ්ගයෙන් හොබනා වූ-සියලු අඟින් ශෝභන වූ.

10. සැවැ – වෘත වැ.

ක්ෂත්‍රිය – රජ.

නුවන් – ඇස්.

කොදු කැකුළු – සමන් මල් කැකුළු.

නවයෞවනයෙන්-තරුණ භාවයෙහි මුල් අවධියෙන්.

සාරාසඛ්‍ය කල්ප ලක්ෂයෙකින්-අසඛ්‍ය කල්ප සතර ලක්ෂයෙකින්.

11. පාරමිතා –

බුඩාඩ්කුරයකු විසින් සම්පූණී කළ යුතු පාරමිතා දශයෙකි. දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, විර්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා යනු ඒ සි. එක් එක් පාරමිතාව, උප පාරමිතා, පරමාර්ථ පාරමිතා සි තවත් දෙයාකාරයක් වන හෙයින් එක් එක් පාරමිතාව ත්‍රි විධ ය.

12. දෙළෙක් – කැමැත්තෙක්, ආශාවෙක්.

ගර්භිනී මවු වරුනට ඇති වන නො එක් ආශා වනට 'දෙළ දුක්'සි යෙති.

සදන් හල් – දාන සහිත ශාලා.

පලහා – ප්‍රදුස්සා, දවා.

සඟලක් – දෙකක්.

දෙළ නිවා – ආශාව සනසා.

සිත් නිවා – සිත් සනසා.

13. පැදකුණු කරන – ප්‍රදක්ෂිණා කරන.

ප්‍රදක්ෂිණා කිරීම නම් යම් කිසි දෙයක් හෝ කෙනකු වටේ තමා ගේ දකුණ'ත යෙදෙන සේ යෑම සි.

කළු වැලි පියා – කළු වැලි අස් කොටු.

සුදු වැල්ලෙන් තවරා – සුදු වැලි ඉසා.

සත් රුවන් – රත්න සත.

මුතු, මැණික් (රතු කැට), වෛදූර්‍ය, ගෝමේද, වජ්‍ර (දියමන්ති), පද්මරාග, මරකත යනු සප්ත රත්න යා. එ හෙත් රන්, රිදී, මුතු, මැණික්, පබළු, වෛදූර්‍ය, වජ්‍ර යනු සත් රුවන් සි ද යෙති.

තිරි කුඩම් –

මේ කලස්වගීයෙකැ සි හැඟේ–විමැසියැ යුත්තෙකි.

රන් පැන රිදී පැන – රත් බඳුන්, රිදී බඳුන්.

14. කැලන් – සමූහයන්.

මෙහෙ තැන් – මෙහෙ කරන්නන්.

චාමර – සෙමර මුවන්ගේ වලගින් සාදූ ගත් වල් වීදුනා.

තල් වැට – තල් කොළයෙන් සෑදුණු වටා පත්.

සරසුන් – කුඩ උසුලා සිටින්නවුන්.

ඔද වැඩී – ඉතිරී, සතුට වැඩි.

පස් වනස් පැහැයෙත් – වණ් පසෙක ප්‍රභායෙන්.

අමෘතාඤ්ජනයන් = අමෘත + අඤ්ජනයන් – අමෘත – යෙන් කළ ඇසැ ගැල්වෙන අඳුනන්.

මන හර යොවුන් පත් – සිත අලවන තරුණ භාවයට පත්.

15. මෙහෙ තැන් – මෙහෙ කරුවන්.

සෙබළුන් – සේවා භටයන්.

බලත් හඬින් – බලතුන් ගේ හෙවත් ද්වාර පාල – යන් ගේ හඬින්.

මඩුවු බැඳැ – වළඳු බැඳැ, වටේ සිටැ.

ව්‍යාපාර චීථියට – වෙළෙඳුන් ගේ චීථියට.

වීළි පහරනට වන – දරූ ප්‍රසූතිය සඳහා ඇති වන වේදනාව හට ගත්තේ යැ.

දහසින් බැඳි පියල්ලන් – මසුරන් දහසක් දමා බඳින ලද පසුම්බියන්.

භුවනෙක ශේඛර වූ = භුවන + ඒක + ශේඛර වූ – ලෝකයට එක මැ මුදුන් මල් කඩ වූ.

16. කෛලාස කූටය – ඊශ්වර දෙවියන් ගේ වාස භවනය වන පළිතය.
මෙය වණ්යෙන් ධවල යැ.

පණ්ඩර – එ නම් ඇත් කුලය.

චතුර් වේදයෙහි – වේද සතරෙහි.

ඍග්, යජුර්, සාම, අථර්ව්, යනු චතුර් වේදය යි.

ක්‍ෂුදෙකලා වැ = ක්‍ෂුද්‍ර+එකලා වැ – තනි වැ.

අති දීඝාදි = අති දීඝ+ආදි – ඉතා දික් ආදි.

සුසැටක් = සිවු+සැටක් – හැට හතරක්.

17. නකත් තරු – නක්‍ෂත්‍ර තාරකා, නැකත් ගණන් හැනෙන තරු.

මහ ඇඟි – ඉතා වටිනා.

දුනාධ්‍යාශයයක් – දන් දීම පිළිබඳ අදහසක්.

18. පලක් බැඳැ – බඹ පර්‍යඞ්කයෙන්, අරමිණිය් ගොතා.

මහ වතුරක් – මහා ගං වතුරක්.

'වතුර' යනු ගලනදිය යි.

දුන ප්‍රවාහය – ගං වතුරක් මෙන් දෙන දන.

තල් ලොඳ – තල් ගෙඩි ලොඳ.

නියුණු – නික්ෂ්ණ, මුවහත්.

ශස්ත්‍රයෙන් – ආයුධයෙන්.

තෙලියත්හි – තෛල යන්ත්‍රයෙහි, ඇස්කුවෙහි.

ගැනී මෙහෙවර – දාස මෙහෙවර.

ගත කඩ බොල් මහ පොළොව – ඉතා මැණ විශාල මහා පෘථිවිය.

අතේක ඇජිනා – නොයෙක් ඇඹිද.

කුළු – මුදුන්.

සප්ත කුල පර්‍වතයෝ – මහ මෙර වටා ඇති වටකුරු පර්‍වත සත.

යුගන්ධර, ඊශධර, කරවීක, සුදර්‍ශන, නේමිකර, විනතක, අශ්වකර්ණී යනු මේ සප්ත කුල පර්‍වතයෝය.

කුල්මත් – අධික වූ ප්‍රීතියෙන්.

19. ලෙළෙන – ලෙළ දෙන.

ප්‍රඥා ලතායෙන් – නුවණ නමැති වැලින්.

සූ සැරි ශිල්පයෙහි – ශිල්ප සැට ඝතරෙහි.

අෂ්ටාදශ විද්‍යායෙහි – විද්‍යා දස අටෙහි.

නිපුණ වූ හ – කෙළ පැමිණිය හ.

උත්පාතක – පිටතට ගලා යෑම.

නුවත් දරිද්‍රයය – ඇස්හි දුප්පත් බව.

සිවු සඟරා වතින් – සතර සංග්‍රහ වස්තුයෙන්.
දාන, ප්‍රිය වචන, අර්ථ චර්‍යා, සමානාත්මතා යනු රජ කෙනකු විසින් කළ යුතු සතර සංග්‍රහ වස්තු යැ.

දශ රාජ ධර්මයෙන් – රජකු විසින් පිළි පැදිය යුතු ධර්ම දශයෙන්.
දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු භාවය, මෘදු භාවය, තපෝ ගුණය, අක්‍රෝධය, අවිහිංසාව, ක්ෂාන්තිය, අවිරෝධතාව යනු මේ දශ රාජ ධර්මයෝ සි.

සතතයෙන් – නිරතුරු වැ මැ.

20. දුර්භික්ෂයෙක් – භික්ෂාව භිඟ නොලැබීම්, ආහාර දුර්ලභත්වයෙක්.

රාජාඞ්ගනයෙහි = රාජ+අඞ්ගනයෙහි–රජ මිදුලෙහි.

පෙහෙවස්–'උපෝසථය', පොහොදවසැ රක්නා සිල්.

21. සර්වාඞ්ගය=සර්ව+අඞ්ගය – මුළු අඟ.

ශ්වේත වූ – සුදු වූ.

හැඟී ඇතෙක් – සුදු ඇතෙක්.

වේද ත්‍රයයෙහි – තුන් වේදයෙහි.
පෙරැ වූයේ ඍග්, යජුර්, සාම යන ත්‍රි වෙදය පමණි. පසු කලෙක අථර්වන් වේදය ද එකතු විය.

22. බුද්ධාංකුර වූ = බුද්ධ+අංකුර වූ – බුදු පැළෑටිය වූ, එ නම්, මතු බුදු වන තැනැත්තා වූ.

විවාරන්නට – පරීක්ෂා කරන්නට.

විලෙවුන් – විලේපන, ඇඟ ගල්වන දෑ.

කිකිණි දැල් – කිංකිණි ජාලා.

මිණි – මිණි ගෙඩි, කුඩා සිනු වැල්.

රස් – ගෙජ්ජි වැල්.
කිකිණි, මිණි, රස් ආදිය එක හා සමාන යැ, හඬ එළවන දෑ යැ.

මිණි රස්–'මැණික් රාසි' යන අරුත ද ගත හැකි යැ.

රන් හිණින් – රන් හිණි මඟින්.

සත් රුවන් පේවා සල්වා – සත් රුවනින් කරන ලද පේළි සොලවා.
"පේ" ශබ්දය "පේළි" යන අරුතෙහි වෙයි. ඇතු ඇඟෙහි වූ සත් රුවන් අබරණ පේළි සෙලැවූ හ සි හඟිමු. මෙහි අපි ශූන්‍ය සේ පෙළ දූෂිත වැ ආ හෙයින් බුත්සරණ බලා ඒ අනුවැ වෙනස් කළමු. මේ විමැසියැ යුතු යැ. කුමාරතුංග මුනිදුසයන් ගේ පොතෙහි, මෙ තැනැ "සත් රුවන් වාසල්වලට" යි ඇති. එයින් අරුතක් නො නැඟෙන හෙයින් යැ විද්‍යාචක්‍රවර්තීන් අනුවැ පෙළ සකස් කැරුණේ.

කුඹය – හිස.

දළ පුඩු සේ සත් – දළයෙන් කරන ලද මිටක් ඇති සුදු කුඩය.

සිවුරඟ සෙනඟ – සතර අඟෙකින් යුත් සෙනඟ.
ඇත්, අස්, රිය, පා බල යනු සතර සේනා යැ.

උගහට යැ – දුෂ්කර යැ.

23. 'ජයතු භවං වෙස්සන්තර මහාරාජ'–
මේ පාළියෙහි අදහස නම්:– 'ජය වේ වා, පින්වත් වෙසතුරු මහ රජුනි,' යනු යි.

මේ බමුණෝ මඳ දෙයක් නො ඉල්ලති – මේ බමුණන් ඉල්ලන්නේ සුළු දෙයෙක් නො වේ, (මහත් දෙයෙක් මැ වේ යැ.)

24. දෙමහස් වැ – නො සතුටු වැ.

අැතුළු වඩා මදයක් නො ඉල්ලූ හ යි රජ දෙමහස් වී.

මිණි රිස් දම් පටල – මැණින් රාශියෙන් කරන ලද දම් වැල් පටල හෙවත් පැළැලි.

මිණි දෙක – සිනු දෙක.

කණ්ඨාභරණ = කණ්ඨ + ආභරණ– කනැ පළඳනා ආභරණ.

වටංසක – හස්ත්‍යාභරණ විශේෂයෙකි.

කටාරය – කොරහ, භාජනය, කටාරම, කල්දේරම.

අකුස්ස – අංකුශය, හෙණ්ඩුව.

කණ්ඨය – බෙල්ල.

25. අනඤ්ඤානඤ් = අඤ් + අනඤ් – අගය නිම කළ හැකි හා නිම නො කළ හැකි ද දැ.

අැත් රැවියත් - අැත් රටෙහි ඉන්නවුන්.

ප්‍රසාද – තුටු පඬුරු.

ගුගුලේ යැ – ගජිනය කෙළේ යැ.

26. ජනාකීණ් වූ = ජන+ආකීණ් වූ, ජනයා ගෙන් ගැවැසී ගත්.

හස්ත විකාර – අතින් කැරෙන විසුළු.

මුඛ විකාර – මුඛයින් කැරෙන විසුළු.

බැණැ – කථා කොටැ.

27. අධිකාර – මහ ඇමති.
සෙනෙවිරත් – සේනා නායක.
ඇපා – ආදි පාද.
මාපා – මහා පාද.
පඤ්ච ප්‍රධාන මාණ්ඩලික ජනයෝ – ප්‍රධාන දිශාධිපති පස් දෙන.
මුළු වැ ගෙනැ – එක් රැස් වැ.
තතනමින් – කෙඳිරි ගාමින්.
පුපුරමින් – ක්‍රෝධයෙන් පිපිරෙමින්.
දත් කමින් – දත් මිටි කමින්.
ඇලැලී ගොස් – කැලැඹී ගොස්.
තෙසු – සෙසු, අවශේෂ.

28. රැහැණි – කෝප.
දඟ ගෙයි – සිපිරි ගෙයි, සිර ගෙයි.
දිවි ගනුත් – මරත් හොත්.
හැඟුණත් – අදහස් වූ දුයත්.

29. ශරත් කාලයෙහි නැඟි පූර්ණ චන්ද්‍ර මණ්ඩලය – සරා කලැ සඳ අධික වැ බබලයි. ඒ බව කී සේ යැ.
කනන නම් ඇමැත්තා –
මේ සදෙස් හ සි හඟිමු. බුත්සරණෙහි "කත්තා නම් ඇමැත්ත" සි ඇත්තේ යැ. එ හෙත් 'කත්ත' හෝ 'කනන' හෝ යනු ඇමැතියා ගේ නම යැ සි නො සිතේ. පාළියෙහි ආ 'කත්තා' යන්න වෙසතුරු ද සන්නෙහි විස්තර වී ඇත්තේ මෙ සේ යැ.
"කත්තෙ – කට යුතු කිස කරන ඇමතිය", "සෝ කත්ත – ඒ ඇමති" යනාදි වශයෙනි. මේ සකු "කර්තෘ" හා හෙළු "කතු" හා යන ශබ්ද හා සමාන යැ.
නො බා – බිය නො වැ.
සම්මත කළ හ – නියම කළ හ.

30. මනා මැ යැ – යහ පත් මැ යැ.

බාහිර වූ – පිටස්තර වූ.

වරද කොටැ –(මා) වරදක් කළා යැ යි චෝදනා කොටැ.

ශත්ත ශතක මහ දන් – එක් එක් දියැ යුතු දෙයින් සත් සියය බැගින් දෙන මහා දානය.

අන් දා – අනෙක් දිනයෙහි, අනිද්දා.

විධාන කොටැ – නියම කොටැ.

31. නහා නඹන්නට – රැස් කොටැ තඹන්නට.

පිළිවිස්සා හ – ඇසූ හ.

විලිකුන් – ඉදුණු.

ක්ෂේත්‍රයෙහි – කුඹුරෙහි.

රෝපණය කරන්නට – පැළ කරන්නට.

32. දළ සෝ දුකින් – දැඩි වූ හෙවත් මහත් වූ ශෝක දුඃඛයෙන්.

දරු දෙ බිහිත්නත් – සොහොයුරා හා සොහොයුරිය දැයන දෙ දෙන.

බිය පත් වව – බියෙන් සිටුව, රැකැ ගනුව.

33. කාම රතියට – කාම දේවයා ගේ භාර්‍යාව වූ රති දෙව් දුවට.

සරස්වතියට – බ්‍රහ්මයා ගේ භාර්‍යාවට.

ලෙන් – හදින්.

රත් ලියක් – රනින් කළ වැලක්.

කුමට හිණි ද? – කුමට වැටිණි ද?

මී නියා – මෙ වැනි.

සත්‍ය ක්‍රියා – ඇත්තේ කවැ යුත්ත.

රමණී – සිත් අලවන.

හැලි – ඇලි.

කඳුරු – කඳු අතරින් ගලන කුඩා දිය පහර.

මුළු බැඳැ සිටුනා – රංචු ගැසී සිටින්නා වූ.

වෙහෙල් මුව – මුව විශෙෂයෙකි.

සඳහන් නොවෙයි – සිහි නොවෙයි.

සෙබඹුන් – මොනරා ගේ ගැහැනු සතුන්.

මල් පල්ලෙන් – මලින් හා දළුයෙන් ද.

හෝ – ඔය.

ළැහැප් – කැලය.

'හෝ වැල්ලේ සිරි ළැහැප්' යනුවෙන් 'ඔයෙහි වැල්ලේ වූ කුඩා ගස් අතරැ' යන අරුත් ගැනේ. ඔයේ මසුන් වැල්ලේ ගස් අතරට පැනැ කෙළ්‍රි සැරි මෙහි කියැවේ.

මස් කැලන් – මසුන් සමූහයන්.

මඩුලු බැඳැ – කවාකාර වැ සැදී.

ලිය ගී – ලය (තාලය) අනු වැ ගැයෙන ගීතිකා, මිහිරි ගී.

ලිය කිඳුරන් – කිඳුරු ලියන්.

කිම් පුරුෂයන් – කින්නර පුරුෂයන්.

දකුත් – දකින කලැ.

34. කටුක වූ හස්න – නොමිහිරි වූ පණිවුඩය.

සෙලින් හී මියෙම් මෑ යැ – ගලින් වැටී මැරෙන්නෙමි.

සිතැ උපත් දෙමනසෙහි දී, දුනුදු, මිනිස්සු මෙ වැනි දෑ කියති.

මී සැලූ කලැ මැස්සන් පලා යන්නා සේ – මී කැඩූ විටැ මැස්සන් ඉවතැ යන්නාක් මෙන්.

35. සිරුරු කිස නිමවා – ශරීර කෘත්‍යය කොටැ.

මේ නිමවා – ආහාර අනුභව කොටැ.

දුන සම්භාර කැරී කොටැ ලා – දුන වසතුව එක්-කාසු කොටැ.

සුවඳ පසඳුල් දෙමින් – සුවඳ ඉසැ.

සුඝික්ඛිතාචාර = සුඝික්ඛිත+ආචාර – මනා වැ හික්මුණු පැවැතුම.

විභූසිත – සැරසුණු, අලඬකාර කරන ලද.

කැමැති විචරක් – කැමැති තරමක්.

තෝඩු – කතේ විශාල සිදුරෙකැ දැමෙන කණීාභරණ.

ඝංඛලා..... – මේ ආභරණ වගී යැ.

උකා ගෙනැ – අැරී ගෙනැ.

පට කඩ..... – මේ සළු වගීයන්හි නම් යැ.

පාදඬුලි..... – මේ පාදාභරණ නාම යැ.

හිණ කෙස් වැළ..... – මේ ශරීරාලඬකාරයන්හි නම් යැ.

ඝුයා පි වෙයග (වේ+අග) බඩ සේ – පොතු ගලවා දැමූ වේ වැලෙකැ අග බඩ මෙන්.

36. වාසන යැ – විපත්ති යැ.

37. අැස් සනෙකැ – අක්ෂි සංඥුවෙකැ. අැසට පෙනෙන දුරෙකැ.

කැට පාෂාණ – කුඩා ගල්, ගල් කැට.

පවන් වුන්නවුන් – සුළං විදි තැනැත්තවුන්.

හැම්මෙමි – වැවෙමි, ඉවසමි.

38. ප්‍රචණ්ඩ – ඉතා චණ්ඩ.

39. සමනනට – සඛාමීනට.

සංස්කාර ධර්මයන් – සිතින් සංස්කරණය කැරෙන සියලු දෑ, එ නම් ලොවැ සියලු දෑ මැ.

අනිත්‍ය – නිත්‍ය හෙවත් සදාකාලික නැති.

අනාත්ම – මම යැ මා ගේ යැ සි නො ගතැ හැකි.

අල පතැ – අළ කොළයෙහි.

දියත්තක් – දිය විකක්.

අසීර – සීර නැති.

40. රථ සක් ප්‍රමාණ – රිය (කරත්ත) රෝදයක් පමණ.

41. අත සලා පියා – අත ගසා දමා.

සෛන්‍ධව – 'සින්ද්' නම් දේශයෙහි, එ නම්, සින්ධු නදිය අසල උපන්.

42. රෝහිත මෘග – මෘග විශෙෂයෙකි.

මිරිකුණෙම් – පිඬිතයෙමි.

43. සෙල් – ගල් හෝ ඉහල් හෝ.

බැහැවිලි – බැවුම්.

පහණ – කළු ගල්.

හුණු – උණු.

ලිය මඬුයෙහි – ලතා මණ්ඩපයෙහි, වැලිත් මඬුවක් මෙත් සැදි නැනෙහි.

සියුමැලි කම – සුකුමාර භාවය.

ඇවිටිලි වැ – බලවත් සේ යැදූ.

44. පතැස් – විශාල ළිං.

හ්‍රස්ව කොටැ – කෙටි කොටැ.

හැමැඳැ – පිසැ දමා, අතු ගා.

45. අනාථ – 'නාථ' හෙවත් පිහිට නැති, අශරණ.

කෛලාස කූටය – ශිව දෙවියා ගේ (සුදු) වාස භවනය වූ කඳු මුදුන.

46. සඵ පෙරළා – ඇඳුම් මාරු කොටැ.

වළ හස්වා – වළ ගොඩ කැරැවා..

47. ඉඳුරා – කෙළින් ම.
විපුල වූ – මහත් වූ.
පවිත ප්‍රාන්තයෙහි – සඳු බෑවුමෙහි.
ප්‍රතිමණ්ඩිත යැ – යුක්ත යැ.
ඌලින් – උල්පතින්.
ස්ලාන්ත – වෙහෙස.
තොට – නිවී, තොටු පළ.
පතර – රාශි, සමූහ.
හයා ලුවා සේ – දිග හැරී දැමුවා මෙන්.
සාහාය්‍යයෙන් – මිතුරු බැව්න්, යහළු කමින්.
ඉද්ද – කුර.
ඝිබරයෙහි – මුදුනෙහි.
රතිඳු ගොව්වන් = රත්+ඉඳු ගොව්වන් – රතු පාට වූ ඉන්ද්‍ර ගෝපකයන්, රෑ බදුල්ලන්.
පූර්‍වෝත්තර (=පූර්‍ව+උත්තර) කෝණයට – නැගෙනහිරටත්, උතුරු දෙසටත් අතර කොනට, ඊශාන දිශාවට.
ඒක පදික මාණියෙන් – එකකුට පමණක් යා හැකි මඟින්.
පස් පෑයෙන් – පස් පැහැයෙන්, පස් පාටින්.
දිය සළායෙන් – දිය සුළියෙන්.
අතල – අතුරුවා වූ.
ශ්‍රේණීන් – සමූහයන්.
දහසක් නුවණැස් – ශක්‍රයාට දහසක් නුවණැස් ඇත් හ සි බුදු සමයයෙහි එසි. එ හෙත් භින්දු ධර්‍මයෙහි නම් ශක්‍ර තෙමේ අහල්‍යාව හා වරදවා හැසිරිණි. ඈ සැමියා වූ ගෞතම ඍෂියා ඔහු ඇඟැ "යෝනි ලක්‍ෂණ දහසෙක් වේ වා" සි ශාප කෙළේ යැ. පසු වැ ඒ ඇස්බවට පෙරැළිණි. [වැඩි විසතර ගුත්තිල පැරැඳියේ වගෙහි 88 – 89 පිටුවලැ එසි.]

48. සත සතු – සප්ත ශතක.
විස්තර පෙළේ මෑ පෙර අා යෑ.

අඳුන් දිවි සම – අජින මෘග චර්ම.
මේ 'දිවි සම්' සි තුබුණ ද මුව සම් වෙසෙසෙකි.

රිටි සුඹුලු – ඟස් පොතු.

පැස් – කූඩා.

මල් කරෑ – මල් කඩන කෙකි.

ය හුල් – යකඩ උල්.

වගුන් – ව්‍යාඝ්‍රයන්.

සිංහ ව්‍යාඝ්‍රයන් –
'වගුන්' සි යෙදී අැත ද නැවැතත් 'සිංහ ව්‍යාඝ්‍ර–යන්' සි යෙදී අැති සැටි නො මැනැවි. 'වගුන් වලසුන්' 'සිංහ ව්‍යාඝ්‍රයන්' සි යුගල පද සිංහලයේ අැති. එ සේ එකට අැති යුගල පදයන් වූ සේ මෑ යෙදුණ හ සි හැඟේ.

යක් බූ පිසසුන් – යක්ෂ, භූත, පිශාචයන්.
මේ අමනුෂ්‍ය විශේෂ යෑ.

නිර්මිත කොටෑ – මවා.

49. හඟරක්–පාරක්.

ජටා – හිස මුදුනේ බැඳි කෙස් වැටිය.

හත් සළු – අැඳි සළු.

වල්කල – රිටි සුඹුලින් කළ අැඳුම්.

50. ලස් – පමා.

දළ මඬුල්ල – ජටා මණ්ඩලය.

දළ මුතු හර – මහත් වූ මුතු මාලය.

එකා වැල – තනි හුයෙන් කරන ලද මාලය, සූණ නූල.

හැම්මෙන – ඉවසන.

51. අනාථ විසින් – අශරණ හෙයින්, දුප්පත් නිසා.
කහ වණ්ණ නියාවට – කහ වර්ණ වෙනුවට.
කාම දූස – කාමයට හෙවත් රාගයට දූස.

52. හාදසෙන් – මිත්‍ර භාවයෙන්, ස්නෙහයේන්.
නව වක් යාගයෙහි – නව වක දූ කැරෙන යාගයෙහි.
පඤ්ච කාම විෂයයෙහි – රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාම සම්පත්තියෙහි.
සමාධියෙක් – සිතෙහි සාමයෙක්.
කඩ දත් – කැඩුණු දත්.
කෙළ තොලූ – කෙළ වැහිරෙන තොල් ඇති.
මිරිකා – වෙහෙස කොටැ.
කතාවුවාට – මහල්ලාට.
අභිරූප–උසස් රූප සම්පත්තියක් ඇති.

53. පරිභව – නින්ද.
මියුඛ භුරූ (=මියැ + උඛු භුරූ) ලලා – කට උස්සා හෙවත් උඩ බලා ගෙන ප්‍රශ්වාස කෙරෙමින්.
තතනමින් – කෙඳිරි ගාමින්.
බොල් කෙළ – ඝන වූ කෙළ.
ඔත් හ – දූම්මා හ.
සිරිඝි – විෂ, වස.
පහාස් දූසයකු – ස්පර්ශය කරන දූසයකු, ඇඟ පත අත් කකුල් මිරිකන දූසයකු. (?)

54. අඛු සොඬ – අඛු කෙරෙහි බොහෝ ආශා ඇති.
ඉච්ඡා දන් – (අනුන්) කැමැති දේ දීම.
දසුන් ඇති – දර්ශන ඇති, රූපත්.

55. ඉපිලූ භිණ – නැඟී වැටුණේ යැ.
අසමාධි – නො සතුට.
සඞ්ග්‍රාම භූමියට – යුද බිමට.

ජඹ – සීව.

තඹ විටි–

අපිය දුර්බෝධ සි. විමැසියැ යුත්තෙකි. තරහ–යෙන් යෙදුණු විශේෂණයක් බව පමණක් කියැ හැකි යැ.

නො පිරුවා – නො කියා.

වෙරි – ශරීරයෙහි.

'වෙරි මස් කසි' යනු 'අල්ලා ගෙන ඇහ වීකසි' යනු සි.

ඉන්දූ සිටියැ නො දී – ඉඳින්නට හෝ සිටින්නට හෝ නො දී.

හවමින් – ශාප කෙරෙමින්.

56. ගහට – පිඬාව.

වලින් – වනයෙන්.

සිසාරා – වටේට.

අත් සුනු – පොරි කුඩු, ධානෘයෙන් කළ කුඩු.

මාඝෝපකරණ=මාඝී+උපකරණ–මහට වුව මනා දැ.

පැදකුණු කොට – ප්‍රදක්ෂිණා කොටැ.
මෙය පෙරි විස්තර වුණේ යැ.

නො ලස් වැ – නො පමා වැ.

සමු ගෙනැ – අවසර ගෙනැ.

වහන් සඟලක්,– සෙරෙප්පු දෙකක්.

කුඩ මහල්ලක් – පරණ කුඩයක්.

කෙණ්ඩියෙකින් – පැන් බඳුනෙකින්.

පය්‍ය – එසුම්බිය, මල්ල.

අඹු ළදුරි කතුන් – තරුණ අඹුව.

නොල් බොල් – නොල් හා දත් ද.

සිදෑ බිදෑ ගෙනෑ – කඩා බිදෑ ගෙනෑ.

දණ උතු – දණ හිස්.

ලේ ලා ගෙනෑ – ලේ වගුරුවමින්.

උණ පත්තෙකින් – උණ පතුරෙකින්.

සම පොත්ත – පිට පැත්තේ සම.

පැහැරී - ගසා.

අසි නම – ආහි නම්.

57. මහ පෑ හ – මහ පෙන්වූ හ.

කීන බල්ලෝ – දඩයම් බල්ලෝ, බලු විශෙෂයක්.

සසල වෑ – චංචල වූ, සෙල්වී.

තපිණ – අත් සුඹු පය්යේ නම සි.

පසුව මහා ගංගාව – ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී යන ගංගා පස.

යාචකයනට – සිහන්නනට.

සිහන්නෝ දහ සය වගීයෙකි–කපික, දේශාන්තර ගාමී, පුරාණ කථා කපික, තක්ක කාරක, ගමික, වාද කාරක, චක්‍ර ශාරීරික (නැමුණු අඟ අැති), මූර්ඛ (මෝඩ), බැළ (මෙහෙ කාර), නළු, කොර, අඬ, ඛධිර (බිහිරි), හසනපාදුවශංගත (අත් පා අවසඟ), ගිලන්, දීන, යනු ඒ දහ සය වගීය සි.

පසුව මහා පද්මයෙන් – පස් පියුමින්,

ඕලු, උපුල් (මහ නිල්), හෙල් මැලි (කහ්ලාර) රත් නෙළුම්(පද්ම), හෙළ නෙළුම් යනු පස් පියුම් යැ.

58. පිටි තොල දත් කමින් – තොල දතින් සපමින්.

දුනු මුඩායේ – දුනු හිසැ.

වම්මවම්මා - වගුරුවවගුරුවා.

පන්ථ සකුණයනට – මඟැ යන ලිහිණියනට.

සල්වයල්වා – සොලවසොලවා

පංච මධුර මාංශයෙන් – මිහිරි මස් කොටස් පසින්.

59. මඳ ඇසිල්ලක් – ඉතා සුළු කාලයක්.
සඵරූප – ආරංභ, විස්තර, තොරතුරු.

60. පැලැහු – පිලිස්සූ.
ශ්‍රම – වෙහෙස.
දුහ – දුවිල්ල.
මී ලබුවක් – මී පැණි පිරූ ලබුවක්.
මුව මස් පිඬියක් – මුව ගාතයක්, මුව මස් වැදුල්ලක්.
දිය වලා කඩක් – දිය ඇති කළු වලා කුළු කැබැල්ලක්.
ගඳ මහන් පව්ව – ගන්ධ මාදන පර්වතය.
පයතැ – පසින්තයෙහි, බැවුමෙහි.
මල් පල්ලෙන් – මලින් හා දළුයෙන් ද.
හැලි ගසා දිවෙන – දිය ඇලි නගමින් දිවෙන.
කුරවි කෙවිල්ලනට – කුරවික නම් මිහිරි නද ඇති කෙවිලි විශේෂයකට.
ගල් කුළින් – ගල් මුදුනින්.
ඔකුරා පරයන – සකුරු පරදවන.
පොකුරු මී – පුෂ්කර මධු, නෙළුම් පැණි.

61. අකුරු කැරීවීම් – අකුරු ඉගැන්වීම්.

62. මඟ පාන්නේ – මඟ පෙන්වන්නේ.
දකුණත් (=දකුණු + අත්) හසරින් – දකුණු පසු මඟින්.
සිවුරැස් – සතරැස්.
සජ්ජිත යැ – සැදුණේ යැ.
නිල් මඟ මේ – නිල් වන් මහා මේඝ හෙවත් වැසි වලා කුළු.
සුළඟින් පැහැරී – සුළං වැදී.

කඳු බිඳී තිබෙන මල් හිසැ – උස් පහත් වැ කඳු මෙන් බෙදී තිබෙනා මල්වල මුදුනැ.
යුළඟින් පැහැරී මල් ගොමු කඳු බෙදුණාක් මෙන් බෙදී තිබුණු සැටි විස්තර වෙයි.

පිය පහරින් – පියා පත් පහරින්.

මුවරඳින් – පැණියෙන්, මල් රොනින්.

කෙසුරු – රේණු.

කුල්නා – කූජනය කරන්නා වූ, සතුටු නද කරන්නා වූ.

නිබරයෙහි – මුදුනැ.

විදූ ධරයන් –
මේ දිව්‍ය විශෙෂයෙකි.

මුදුනැ = මුදුන් සැ.

මුළු මුළු වැ – සමූහ සමූහ වැ.

පව්තෝපම = පවිත + උපම – පව්තයනට උපමා කළ හැකි.

විලිස්සැ – ඉදී.

ඇත් දළ සා – ඇත් දළ හා තරම් වූ.

මා දිය කළ – මහ දිය කළ.

63. ගිරි ගුහාවක් – ගල් ලෙනක්.

64. පියවර සත් කොටැ – පාද සංඥ කොටැ, අඩි හපා තමා ඉන්නා බව දන්වා.

ක්ලේශ වශයෙන් – කෙලෙස් මලින් වශඟ ව.

අන්‍යතර – කිසි යම්.

සිසාරමින් – කරකවමින්.

තුඩ වැඩි බස් බැණැ – කට වැඩි බස් කියා, එ නම්–නපුරු වචන කියා.

ජටාව – බැඳුණු කොණ්ඩය.

උඩු කුරු කොටැ – උඩට හරවා.

මියුරු – මධුර, මිහිරි.

යුව යහනෑ – යෑපවත් අැදෙහි.

හෝනෙන් – නිදන හෙයින්.

65. හැමදෑ – අතු ගා.

තල බිජුවක් සාත් – තල අැටයක් තරම් වත්.

පියාණන් අැළයෙන් – පියාණන් ළඟින්.

කෙළනා තැන බිය පත් වව – ක්‍රීඩා කරන තැනට බියෙන් සිටුව.

දෙ බිහින්නෝ යැ – සහෝදර සහෝදරී යන දෙ දෙන යැ.

කම් කිළිය – (පාප) කමී කළ තැනැත්තිය, කරුමක්–කාරිය.

එකලා කම් – තනි බැව්, ගුදෙකලා බැව්.

66. වලට යා දී – වනයට ගිය කලැ.

නො එන තුරු – එන්නට පෙරැ.

කල්‍යාණ මිත්‍රයෙකැ – යහ පත් මිත්‍රයෙක් යැ.

නිකමට – වැඩක් නැති වැ.

67. පිරිකර – පරිෂ්කාර, අැඳුම් ආදි පාරිභෝගික ද්‍ය.
අක්ෂ මාලාව (නව ගුණ වැල වැන්නැ), කුඩය, මන්ත්‍ර පොත, ගුළි පඹය, කෙණ්ඩිකාව, පා වහන් දෙක, හා සක් ගෙඩිය ද බමුණු පිරිකර වෙති.

68. මීයේ රස වැන්නැ – මී පැණියෙහි රස වැනි යැ.

ජල ස්කන්ධය – දිය කඳ.

ක්ෂය නොවේ ද? – අඛු නොවේ ද? ගෙවී නොයා ද?

69. දළ සෝ හිනි – මහත් වූ ශෝක ගින්න.

වජ්‍රාසනයෙහි – විදුරු (දියමන්ති) අසුනෙහි.

ද්‍රලය කොටැ – දමනය කොටැ.

දෙ දෙව් ලොව – චාතුම්හාරාජික, තාවතිංස (ත්‍රයස්ත්‍රිංශද්) යන පහත මැ වූ දිව්‍ය ලෝක දෙක.

තුඩ පොපියන තෙක් – කට ගැහෙන තෙක්.

ඛවලඡත්‍රය = ඛවල + ඡත්‍රය – සුදු කුඩය.

පස් වා දහසක් – වඹී පන් දහසක්.

අස්වීනට ද – ඇටවලට ද.

70. සම සිතින් – උපේක්ෂා සහ ගත සිතින්, මධ්‍යස්ථ චිත්තයෙන්.

සා වීඩා වෙති – බඩ ගිනි හා වෙහෙස ද ඇති වෙති.

ඉෂ්ට මිත්‍ර – කැමැති (ආදරණීය) මිත්‍ර.

ගැනි වන – වහල් වන.

සිවු මැල්ලෝ යැ – සුකුමාර යැ.

නො හසළ විරූ යැ – පුරුදු නැත.

71. ලඟනට – නැවැතීමට.

දිවි ගන්නට – දිවි නැසීමට.

තෙල බස් අප රකුත් හොත් නො කියව – අපා රකීමට නම් ඔ වැනි වචන නො කියව.

72. මුව පොල්ලන් – මුව පැටියන්.

ඉඟි කැරි ලා – සන් කොවැ.

උන්දැ පිටැ ඕ – උන් වහන්සේ පිටැ වැටී.

73. ඉඟි ලා ලා – සංඥ කොටැ.

තන් වැසි – පෞර, නගර වැසි.

පැලෑ – පැනැ ගිය.

වාවා ගෙනැ – ඉවසා ගෙනැ.

74. රන් පිමාවූ – රනින් කළ පිට ඇඳි, රන් පුටු ඇඳී.

පසුරු – පහුරු.

මස්තක ප්‍රාප්ත – මුදුන් පැමිණී.

නික් – නිෂ්ක, එ නම් මිල.

සව් තේ – සව් ඥෙය, දත යුතු සියල්ල.

ලොවුතුරා – ලෝකෝත්තර, ලොව ඉක්මැ පැවැති.

76. මිඩියක – දුසියක.

සුවාසූ = සිවු + අසූ – අසූ සතර.

ගම්භීර – ගැඹුරු.

77. සම් ඉගිලැ – සම් ගැලැවී.

සෙලෙකින් – ගලෙකින්.

78. නෝ නැඟී සිටින තෙක් මැ – නැඟිටින්නට පෙර.

දෙස් – සාක්ෂ්‍ය.

පැ පියන තුරු – පෙන්වන තුරු.

අවලක්ෂණ – කැත.

නිය පිරිති යැ – නිය පිරිත්ත කා ලා යැ.
හරියට නො වැඩී අවලක්ෂණ වැ කැඩි කැඩී එළියට තද වැ එන නිය 'නිය පිරිත්ත කන ලදැ'යි යෙති.

පිණ්ඩික මාංස – මස් පිඬු.

දත් බොදු – දත් බොල්ලැ, ඉදිරියට නෙරා ගිය දත් ඇති.

චම්රැසි = චමර + අැසි – චපර අැස් අැති.

කත් කොරි යැ – ඇදී වූ කත් අැත්තේ යැ.

කළු තල කැලැලින් – කළු තලා වූ කැලැලින්.

අසී සඬින් – අැට හන්දි.

මොළ කැටි – මෘදු.

මිඩි මෙහෙ – දුස වැඩ.

79. මුවින් නො බැණැ – කථා නො කොටැ.

ය පතෙකින් – යකඩ පතුරෙකින්.

නිඃශ්‍රීක වූ – සිරියස් නැත්තා වූ.

80. රාහු විසින් ගලන ලද ද – රාහු ගිලින ලද ද, ඉර සඳ රාහු අැල්ලුව ද.

සමූ ගත් බව – අවසර ගත් බව.

81. දැඩි නියා යැ – තද ආකාර යැ.

මරන කලැ – ගසන කලැ.

ඔබෙහි දී – ඒ පිටැ දී.

කඳු බැව්ලි – කඳු බැවුම.

සසින් – බඩැ හින්නෙන්.

ඒ ක්‍ෂණයෙහි – ඒ මොහොතෙහි.

පඤ්ච මහා පරිත්‍යාගය –
චේතනා පාරිභෝගික (සෙටඨ) ධනය, දරැ, අඹු, රාජ්‍ය, අඞ්ග ප්‍රත්‍යඞ්ග යනු පඤ්චමහා පරිත්‍යාගය යි.

පහණ ප්‍රවරැවෙකැ – ගල් ප්‍රවරැවෙකැ.

82. පෙතැල්ලන් – පෙතැලි රැ, අඹන ලද රූප.

වියෝ වූ – වෙන් වූ.

පැහැයෙනුදුල = පැහැයෙන් + උදුල – පාවින් බබළන.

සමූ දී – අවසර දී.

අකුරැ – ගල්.

පිනි ගත් – පින්නෙන් ගැවැසී ගත්.

83. දකුණැසැ මස් සැලෙසි –
දුකක් වන්නට පෙරැ නිමිති යැ ගැහැනුන්ගේ දකුණු ඇසැ මස් සැලීම. උන්ගේ වමැසැ මස් සැලෙන්නේ සතුටෙහි දී යැ. පිරිමින්ගේ මීට වෙනසි – මෙහි අනෙක් පස යැ.

මහ අවුරා – මහ අහුරා, සරසැ සිටැ.

රාමයනට සීතාවන් සේ –
මේ "රාමායනයෙහි" කථාව පිළිබඳ වැ යැ. සීතා, රාම කුමරැ කෙරෙහි කළ පති භක්තිය

ඉමහත් යැ. පාළි ජාතකයෙහි මෙ තැනැ "රාමං අනුබ්‍රූතා සීතා'ව"යි ඇති හෙයින් රාමායනයට පසු ඒ නම් ක්‍රි: වර්ෂයෙන් පෙර 3 න් වැනි සිය වසරට පසු ජාතක කථාව ලියැවුණ හ යි හඟිමු.

84. පතී ව්‍රතා – පතියා හෙවත් ස්වාමියා දෙව් කොටැ තබා ගෙනැ සිටින, අන් හිමියන් නො පතන.

නො යන විසින් – නො යන නිසා.

ඒ මහැ හොත් සතුන් විසින් – ඒ මහැ නොත් සතුන් නිසා.

රෑ නො වන තුරැ – රෑ වන්නට පෙර.

ඉර බට බව – ඉර බැස්සා වූ බව.

85. පිලා සඳන් – පුංචි හඳන්.

තෙනෙහි කිරි ඉසිමින් – තනයෙන් කිරි විදිමින්.

සියලඟ = සිය + අඟ හෝ සියල් + අඟ හෝ – තමා ගේ ශරීරය හෝ මුළු ශරීරය මැ හෝ.

සිය + අඟ = සියලඟ යැ යි ගත හොත් මැනැ වැ යි සිතමි.

ඇසියැ හෙමි දෝ – අසන්නට හැකි වෙමි දෝ?

86. ශෝක තබා – ශෝකය පසෙකින් තබා.

වර දුන් ද වේ ද? – අවසර දුන් ද වේ ද?

ස්නේහයෙන් – ආදරයෙන්.

87. පඤ්ච කල්‍යාණයෙන් – ගැහැනියකුට සිඹිය යුතු යහ පත් ලකුණු පසින්.

වයඃ කල්‍යාණය හෙවත් වයසට නො ගියාක් මෙන් සෑම කලැ මැ පෙනීම, ඡවි කල්‍යාණය හෙවත් සම රැළි නො ගැසීම, දන්ත කල්‍යාණය හෙවත් මුතු වන් දත් දෙ පෙළක් ඇති වීම, මාංශ කල්‍යාණය හෙවත් සෑම කලැ ම නො වැඟිරෙන මස් පිඬු ඇති වීම, කේශ කල්‍යාණය හෙවත් නිල් වන් දීඝ කේශ කලාපයන් ඇති වීම–යනු පඤ්ච කල්‍යාණය යි.

රූප සම්පන්නයව - රූපයෙන් යුක්තයව.

වන චරකයෝ - වනයෙහි හැසිරෙන්නෝ, වැද්දෝ.

88. ලස් - ප්‍රමාද.
වේලේ ආමි - සුදුසු කාලයෙහි මැ ආමි.

89. නො බැණැ ඉන්නා විසින් - කථා නො කොටැ ඉන්නා හෙයින්.

වලින් - වනයෙන්.

සසා - සහ.

සම් කිළිය - 'කරුමක් කාරිය,' පාප කාරිනිය.

නැස්මෙක් - කරදරයෙක්.

නියත කොටැ - නිශ්චයයෙන්.

මෘගාඩඝනාවෝ = මෘග + අඩඝනාවෝ-මුව දෙන්නු.

සි සත් නැනි වැ වැටී ගි - සිහි සත් නැති වී වැටී හෙවී.

බිමැ ගි - බිමැ වැටී.

ගල - පවිත.

වන - වනය, කැළය.

පහණ - පාෂාණය, කුඩා ගල්.

ගැසි - ගස් අසල.
පාළියෙහි වූ 'රුක්ඛ මූල' යන්නට සමාන යැ. 'ගැසි' සි ශුඛ කැරුණේ යැ. විමසන්නැ.

බැවිලි - බෑවුම්.

90. හොත් විලස් - වැටුණු ආකාර.

බ්‍රහ්ම චරිය - මෛථුන සේවනයෙන් හෙවත් අඹු සැමියන් මෙන් විසිමෙන් වෙන් වීම, උසස් චරිය හෙවත් ජීවිතය.

සත්‍ය ක්‍රියා –

තමා රැකි උසස් ශීලයක් හෝ කළ යහ පත් කට යුත්තක් හෝ ගැන පවසා, ඒ සත්‍යය හේතු කොටැ ගෙනැ, යම් කිසි අභිමතාර්ථයෙක් ඉෂ්ට වේවා'සි පැතීම සත්‍ය ක්‍රියා නමි.

ඔර - අැකය, ඔඩොක්කුව.

සී සන් ලදින් – සිහිය ආවෙන්.

වයෝ වෘද්ධ වූ – වයස නිසා මහලු බවට පැමිණියා වූ.

91. ගුගුල – ගිගිරුවේ ය.

සප්ත කුල පර්වතයෝ – මහ මෙරැ වටා ඇති සුගන්ධර, ඊශධර, කරවීක, සුදර්ශන, නේමින්ධර, විනතක, අශ්ව කර්ණ යන පර්වත සත.

රැවූ පිළිරැවූ – රාව ප්‍රතිරාව.
නිකුත් වූ හඬ 'රාව' යි. එය යම් කිසිවෙකැ හැපී නැවැතැ හඬ නැගීම 'ප්‍රතිරාව' යි.

92. ගිහි පුරුෂයෙන් – පහත් කුලයෙහි වූ පුරුෂයෙන්.

මිරිකුණෙමි – පිඬාවට පත් වීමි.

යැපෙන – සැහෙන.

පුළුවුන් හ – අැසූ හ.

93. අභිප්‍රායය – අදහස.

දෙස් වැස්ස හ – පසු නිය දේශයේ වාසිහු යැ, අත් හැරි අය ය.

දෙත් – දෙත හොත්.

මනා මැයැ – යහ පත් මැයැ.

අධිපති යැ – ස්වාමි යැ.

අභිමතයක් – කැමැත්තක්.

94. පැන් එවැ – දිය වත් කොටැ.
ලියෑ හෙම් ව සි – දමන්නට හැකි වෙම් ව සි.

ස දෙව් ලොව – චාතුම්මහා රාජික, ත්‍රයස්ත්‍රිංශද් (තාවතිංස), යාම, තුෂිත, නිම්මාණරති, පරනිර්මිත - වශවර්ති යනු ස දෙව් ලොව යැ.

95. සුදුස්සව – සුදුසු වුව.
තලාටු බුම්මාටු දෙවියෝ–අහස්හි වැසි පොළොවෙහි වැසි දෙවියෝ.
'තල' නම් අහස සි' 'බුම' නම් පොළොව සි.

දිව්‍යාත්ම භාවයෙන් = දිව්‍ය + ආත්ම භාවයෙන් – දිව්‍ය ශරීරයෙන්.

ළඟිරු මඩල – උදැසන හිරු මඩල.

96. පවරනු ලබම් වා – පිළිගන්වනු ලබම් වා.
පර දර කම්යෙහි – අනුන් ගේ ස්ත්‍රීන් කෙරෙහි ලොල් බැවින්.

වශඟයට – යටත් බවට.

දීඝායුෂ්ක = දීඝ + ආයුෂ්ක – දික් වූ ආයුෂය ඇති.

චුත වැ – පිව වැ, මැරී ගොස්.

සැවැ – චුත වැ.

මිනිස් අත් බැවට – මනුෂ්‍යාත්ම භාවයට, මිනිස් සිරුරක් ඇති බවට.

සම්‍මැතා ඤනය – සියල්ල දන්නා නුවණ.

97. අරක් – ආරක්ෂා.
හිරු අස්තයට ගිය කල්හි – හිරු බැස ගිය වේලෙහි.

වෙලෙප් - විටප, අතු බෙදී ගිය තැන්.

මුදා – බැඳුමෙන් ගලවා.

බඩ දී ගෙනැ – බඩ යහනෙහි ස්පර්ශ වන සේ.

98. ස්වප්නයක් – සිහිනයක්
විනිශ්චයයෙහි – නඩු විසඳීමෙහි.
හිලිහි – ගැලැවී.
චතුර් වේද යෙහි – වේද සතරෙහි.
වේද සතර පෙරැ විස්තර වීණි.
නිපුණ – පුරුදු වූ, හසළ.
අග්‍ර රසයෙන් – ඉතා උතුම් රසයෙන්.

99. රාජාඞ්ගනයෙහි = රාජ+අඞ්ගනයෙහි – රජ මිදුලෙහි.
කට දැල්වූ සඳැ – කට හැරි කලැ.

100. වෙනෙහි – වනයෙහි.
බමුණු මාල්ලකුට – මහලු බමුණකුට.
වාවා ගෙනැ – ඉවසා ගෙනැ, සනසා ගෙනැ.

101. තඹ වන් – තඹ පාට ඇති.
දන් දුන් නියා ඉතා බැරි යැ – දන් දුන් ආකාරය ඉතා බර යැ හෙවත් බර පතළ යැ.

102. ඇකයෙහි – උකුලෙහි.
ගැත්මතෝ – මෙහෙ කරුවෝ.
ඔරැ – උකුලේ.
අගය කොටැ – වටිනා කොටැ.
බරේ බර – බරට බර.

103. භාරයෙන් – බරින්.

104. වියෝ වූ – වෙන් වූ.
දවස් හළ – දවස් ගත කළ.
අවු සුළඟින් පැහැරැ – අවු සුළං වැදී.
අතු පතරැ ඇලීමෙන් – අතු පතරැ ගැවීමෙන්.
ළඳ බොළඳ බස් – සුරතල් වචන.

105. සන්නාහ සන්නඩ වැ – යුද ඇදුම් ඇඳැ.
ඉස්බස් –නිස් පස් බඹයෙකැ පමණ දුරක්.
කළු වැලි පියා – කළු වැලි අස් කොටැ.
සුදු වැල්ලෙන් තවරා – සුදු වැලි ඉසැ.
පුන් කළස – පිරුණු කළස්.
පතාක – කුඩා කොඩි විශේෂ.
ලද පස් මල් - 'ලද' හෙවත් ලාජ (විලඳ, පොරි) පස් වැනි කොට ඇති මල්.

මෙ තැනැ 'මල්' යනු පුෂ්පාඛ්‍යයෙහි නො වේ. ඒ තණ. අබ, සමන් කැකුළු, සුන් සාල්, විලඳ යනු ලද පස් මල් යැ.

විලෙවුන් – ඇඟෙහි ආලේප කරන දෑ.
මල් ඇඟැ – මලින සැරසූ පහන් කණු.
රන් ඇඟැ – රනින් කළ පහන් කණු.

106. කදුරිය කෙළේ යැ – මෙළේ යැ.

107. මාඝී නායක කොටැ.– පාර පෙන්වන්නා කොටැ.
පසු වැ ලා – පසු වී.
කුසඬ නාදයෙන් – ඇතුන් කරන හඬින්.
හේෂා රවයෙන් – අසුන් ගේ නාදයෙන්.

108. චක්‍ර නාද – රථ රෝද පෙරැළීමෙන් වන නාද.
මහලු විසින් – මහලු නිසා.
පියවර මැඩැ පියන – පා සටහන් පසින් මඬින.

109. බල කායය – සේනා සමූහය.
ඇඹිණියන් - අඹුවන්.
කේශර සිංහයකු – පිටෙහි කෙසුරු ඇති ජාතියේ සිංහයකු.

110. අපර ගමන් කොටැ – ඉදිරි ගමන් කොටැ.

බැසැ හෙවැ – බැසැ වැටී.

පනවා – පිළියෙළ කොටැ.

සොමනස් – සතුටු.

111. භේරි – බෙර.

තූසී – මිහිරි හඬ වයන භාණ්ඩයන් ගේ හඬ.

සඞ්ඛ – සක්.

හඩා හි – හඬා වැටී.

112. හඩා ක්‍රුණ හ – හඬා වැටුණ හ.

බෝධි සත්ත්වයන් හා සහ ජාත වූ – බෝධි සත්ත්වයන් හා එකට උපත්.

එක හෙළා – එක් වරැ.

මහ පවනින් වැහිරී ගිය – මහ සුළඟින් ඉදිරි ගිය.

කල්පාන්ත මාරුතයෙන් – කල්පය කෙළවරැ හෙවත් ලොවැ අවසනැ හමන මහ සුළඟින්.

ඤෝභ වූ – කැලැඹුණා වූ.

කාමාවචර = කාම + අවචර – කාමයෙහි හැසිරෙන. ස දෙව් ලෝ වැසි දෙවියෝ පඤ්ච කාමයෙහි හැසිරෙමින් සුව විඳිති.

ඒක කෝලාහල වියැ – ඒක ඝෝෂ වියැ.

113. හොත්තවුන් – වැටී සිටිනවුන්.

පොකුරැ වැස්සක් – මල් වැස්සක්.

ක්ෂත්‍රිය සමාගමයෙහි – රාජ සමාගමයෙහි.

'ක්ෂත්‍රිය' නම් රජ කුලයට නමී. අනෙක් කුල තුන නම්, 'බ්‍රාහ්මණ' 'වෛශ්‍ය' 'ශූද්‍ර' යනු යැ. මේ සිවු කුලයට අයත් නොවූවෝ පඤ්චමයෝ යැ.

114. විස්මයයට – ප්‍රදුමයට.
නුවරින් නහා දුම් හ – නුවරින් පිට කැරීම් හ.
නො නිවිස්සා හ – එකඟ නො වුණා හ.

115. බස් මැඩැ පිම – වචනයට නො කී කරැ වීම.
වල්කල – පට්ටා.
සෘෂි භාණ්ඩ – සෘෂිනට යොගය වූ බඩු.
කුළු ගන්වන්නහු – මුඳුන් පත් කරන්නහු.
පසඟ (=පස් + අඟ) පිහිටුවා වැඳ – දෙ දණ දෙ වැල මීට, හිස යන පස් අඟ බිමැ පිහිටුවා වැඳැ.
දේවේන්ද්‍ර (=දේව + ඉන්ද්‍ර) ලීලාවෙන් – දෙවියන් ගේ ප්‍රධානියා හෙවත් ශක්‍රයා ගේ ආකාරයෙන්.
වේෂ ඥජිනාවක් – ගෙරවිල්ලන්.

116. ඇළි – සුදු.
කදවුර – බල සෙනඟ නවා තැන් ගත් තැන.

117. සෙළැ – ක්‍රීඩා කොටැ.
පිළිපන්නාහු යැ – පැමිණියාහු යැ.
සව්ලඞ්කාරමෙයන් = සව් + අලඞ්කාරයෙන් – සියලු අලඞ්කාරයෙන්.
පිළි හිසැ සිසාරමින් – රෙදි හිස් වටැ කරකවමින්.
කුතුලින් – කුතූහල භාවයෙන් හෙවත් අභිලාෂයෙන්.
ආකුල වැ – අවුල් වැ.
වඩා ගෙනැ ගිය හ – එකතු කැරැවා ගෙන ගිය හ.

118. ආඥව – නියමය.
අණ බෙර – ආඥව දන්වන බෙර.
බඹනයෙන් – බැඳුමෙන්, හිර අඩස්සියෙන්.
පහත් වූ කලැ – එළී වූ විටැ.
යාචකයෝ – සිඟන්නෝ.

පඬුපුල් සලස්න – පාණ්ඩු කම්බල ශෛලාසනය. ශක්‍ර දේවේන්ද්‍රයා ගේ පාණ්ඩු වර්ණ වස්ත්‍රයෙකින් වැසුණු මේ ගල් අසුනෙහි ශක්‍රයා හිඳ කලෑ නැබ දස්වා ගැලෙයි. ඒ ඉතා සුව පහස් දන්නෙකි. එහෙත් බෝ සතුන් ආදි ගුණවතුනට දුකක් වූ කලෑ එය රත් වී ඔහුට ඒ දුක් උපදවතියි බුදුනුවෝ යෙති. එ විට සක් දෙවිඳු තම දහඅත් දිව නෙතින් ලොව බලයි. අන්‍යතර වේශයෙකින් හෙ තෙමේ මනු ලොවට පැමිණෑ දුකට පත්වූවනට පිහිට වන්නේ ය.

ආවජ්ජනා කොටෑ – සිහි කොවෑ.

නිවේසනය – ගෙය.

කටී ප්‍රදේශය පමණ – ඉඟ පෙදෙස පමණ.

ඝන වණ්ඩාවක් – මහ වැස්සක්.

වට්ටයේ යෑ – වැස්සේ යෑ.

වට – වැස්සා වූ, වැටුණු.

දන් වැව – දිගට මෑ දෙන දන.

අකෝපය කිරීමෙන් – නො සිඳීමෙන්.

සහ පිරිවරින් – පිරිවර සහිත වැ.

119. ප්‍රතිමණ්ඩිත වූ – යුක්ත වූ.

පුබ්බාපර (= පුබ්බ + අපර) සන්ධි – මූල හා අග හා යන දෙකෙහි සම්බන්ධය.

පණ්ත් – පිරිස්.

වලව ගොස් – වනයට ගොස්.

නිමි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු